සිළුමිණ

සිළුමිණ The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 36 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ සිංහ රවි 21 භාග අව ජලවක ඉරිදා ■ වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 06 වැනි ඉරිදා මිල රු 70.00

විද්‍යා පීඨ 19කට සිසුන් 4253ක් ඇතුළත් කිරීමේ ගැසට් පත්‍රය

මෙවර සිළුමිණ සමඟ

20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට විපක්ෂ මන්ත්‍රී කණ්ඩායමක සහාය

(තාරක වික්‍රමසේකර)

අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවීමෙන් පසු සැප්තැම්බර් 3 වැනිදා ගැසට් කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී එය වැඩි ඡන්දයෙන් සම්මත කර ගැනීම සඳහා විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමක සහාය හිමිවනු ඇතැයි දේශපාලන ආරංචි මාර්ග ඊයේ අනාවරණය කළේය.

මේ පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරුන් 9 දෙනකු කණ්ඩායම් දෙකක් වශයෙන් සිය සහාය ලබාදීම පිළිබඳව රජයේ ප්‍රබල දේශපාලඥයකුට දැනටමත් දැනුම් දී තිබේ.

නව සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙනුවට පාර්ලිමේන්තු සභාවක් ස්ථාපිත කිරීමට යෝජනා වී ඇති අතර මෙතෙක් පැවැති ඇමැතිවරු 30 සීමාව ඉවත් කර ඇත.

19 වැනි සංශෝධනයෙන් අහිමි කළ විධායක බලතලද යළි ජනපති යටතට පත් කර ඇත.

එමෙන්ම මෙතෙක් පැවැති ස්වාධීන කොමිෂන් සභා එකොළහ වෙනුවට ස්වාධීන කොමිෂන් සභා ගණන හත දක්වා අඩු කර තිබේ.

19 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් තොරතුරු දැන ගැනීමේ පනත, ජනාධිපතිවරයාට දෙවරකට වඩා ජනාධිපතිවරණයට තරග කිරීමට නොහැකි වීම සහ ජනාධිපතිවරයාගේ සහ පාර්ලිමේන්තු නිල කාලය වසර 5කට සීමා කිරීම වැනි දෑ 20 වැනි සංශෝධන කෙටුම්පතට ඇතුළත් කර තිබීම විශේෂත්වයකි.

වසරකින් පවුල් 54,000කට නිරවුල් ඉඩම් ඔප්පු

(ජයසූරිය උඩුකුඹුර)

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩම්වල පදිංචි සිටින නිරවුල් පදිංචිකරුවන් සඳහා ඉදිරි වසරක කාලය තුළ සිත්නක්කර ඔප්පු ලබා දීමට කටයුතු කරන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සභාපති නීතිඥ නිලන්ත විජේසිංහ සිළුමිණට කීය.

මේ අතරින් පවුල් 2500 කට ඉදිරි තෙමස තුළ නිරවුල් ඔප්පු ලබා දීමට දැනටමත් කටයුතු කරමින් සිටින බවද සභාපතිවරයා පෙන්වා දුන්නේය.

ඉඩම් ඔප්පු නොමැතිව ජනතාව අපහසුතාවන්ට පත්ව ඇති බවද ඒ නිසාම සංවර්ධනය පසු බෑමකට ලක්ව ඇති බවද ජනාධිපතිවරයා පසුගියදා පෙන්වා දී තිබුණි. 2 වැනි පිටුවට

මතට ඇබ්බැහිවූවන්ට ආයුර්වේද ප්‍රතිකාර

(තාරක වික්‍රමසේකර)

මත් උවදුරට ඇබ්බැහි වී සිටින 533,338 ක් දෙනා පුනරුත්ථාපනයට දේශීය ඖෂධ ප්‍රතිකාර ලබා දීමේ කඩිනම් ව්‍යාපෘතියක් ඇරඹීමට අදහස් කර ඇතැයි දේශීය වෙදකම් ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි මහතා සිළුමිණට කීය.

මත් උවදුරට ඇබ්බැහි වී සිටින පුද්ගලයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් හඳුනාගෙන ඔවුන් සඳහා නේවාසික ප්‍රතිකාර ලබා දීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කෙරෙන බවත් මේ වන විටත් දේශීය ඖෂධ මගින් ඔවුන්ට ප්‍රතිකාර ලබා දීම සඳහා නාවින්න ආයුර්වේද රෝහලේ විශේෂඥ කණ්ඩායම් කිහිපයක් සමඟ සාකච්ඡා කර ඇති බවද ඇමැතිවරයා කීවේය. 2 වැනි පිටුවට

ලංකාවේ පිහිටි සුන්දරතම වන භූමිය සිංහරාජයයි. සිංහරාජ වනය හෙක්ටයාර 11,187කින් යුක්තය. සිංහරාජය තුළ ගම්මාන 2ක් පිහිටා ඇත. ඒ, වාරුකන්දෙණිය සහ කොළොන්තොටුවය. එමෙන්ම වනාන්තර සීමාවේ පිහිටි ගම්මාන සංඛ්‍යාව 40කි. ලංකාගමද ඊට ඇතුළත්ය. හිනිදුම නෙළුව පෙදෙසින් ලංකාගමට පිවිසිය හැකි පහසුම මාර්ගය දැන් විවර වී ඇත. මේ සේයාරුවේ දැක්වෙන්නේ ගිං ගඟ තරණය කරමින් ලංකාගමට යන වැසියන්ය. ලංකාගම හරහා රක්ෂිතයට හානියක් නොවන පරිදි ඉදිවන නව මාර්ගයෙන් ඔවුනට පමණක් නොව ඒ වටා ඇති ගම්මාන 40ක ජනතාවට හෙට අරුණලු විකසිත වනු ඇත. එම කතා පුවත සඳහා **4 පිටුව** බලන්න.

හොර පාරෙන් එන ගෘනයිට් ගැන පරීක්ෂණයක් ඉල්ලයි

2 වැනි පිටුවට

ප්‍රේමලාල් ගැන තීන්දුවක් 7 වැනිදා

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

මරණ දඬුවම් නියමව සිටින රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතාට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වීමට අවසර දෙනවාද යන්න පිළිබඳ අතුරු නියෝගය ලබන සඳුදා (07) ප්‍රකාශයට පත් කිරීමට අභියාචනාධිකරණය ඉකුත් (04) වැනිදා තීන්දු කළේය.

2 වැනි පිටුවට



'රුවන්පුර' අධිවේගය වසර 3කින් නිම කිරීමට උපදෙස්

රත්නපුර දක්වා ඉදිවන 'රුවන්පුර' අධිවේගී මාර්ගයේ වැඩකටයුතු මේ වසර තුළදීම ආරම්භ කිරීමටත් වසර 3ක් ඇතුළත මාර්ගයේ වැඩ කටයුතු නිම කරන ලෙසත් මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා අදාළ සියලු නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. 2 වැනි පිටුවට

මහනුවර භූ කම්පන ලොකු අනතුරක සේයාවක්!

(නිහාල් පී. අබේසිංහ) 2 වැනි පිටුවට

'මිනිස්සු කියනවා ව්‍යවස්ථාව විතරක් නොවෙයි තව ගොඩක් දේවල් සංශෝධනය වෙන්න ඕන කියලා'

ශ්‍රී ලංකා නැගෙනහිර මුහුදු කලාපයේ නාවික සැතපුම් 38ක් දුර මුහුදේ යාත්‍රා කරමින් තිබූ පැනමාවට අයත් ඉන්ධන ප්‍රවාහන නෞකාවේ ඉකුත් 3 වැනිදා ගෑස් කාන්දුවක් හේතුවෙන් ඇතිවූ ගින්න මැඩ පැවැත්වීමට ශ්‍රී ලංකා-ඉන්දීය ඒකාබද්ධ මෙහෙයුමක් සාර්ථකව දියත් කෙරුණි. මේ ගින්න හටගත් නැවේ දසුනකි. මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක ලිපියක් **3 වැනි පිටුවේ** පළවේ.

හීය

● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

එ.ජා.ප අර්බුදය කාටුන් ශිල්පීන්ට ඉල්ලමක් වෙයි

එක්සත් ජාතික පක්ෂය යනු මෙරට කීර්තිමත් දේශපාලන පක්ෂයකි. වසර 72 කට නොඅඩු ඉතිහාසයක් ඇති එ.ජා.ප.ය අද පත්වී සිටින්නේ දැඩි අර්බුධකාරී තත්ත්වයකය. එ.ජා.ප ය ට අයත් කිසිදු අපේක්ෂකයකුට ඉකුත් මහ මැතිවරණයේදී මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වන්නට නොහැකි වීමෙන් එම පක්ෂය මෙරට ඡන්ද දායකයන් අතර ලබා තිබෙන අප්‍රසාදයේ තරම කොපමණදැයි පැහැදිලි වේ. අපට සිතෙන අන්දමට නම් එය දිගු කලක් තිස්සේ පැවති පරිහානියක අවසන් බේදජනක ප්‍රතිඵලය යි.

එ.ජා.ප ය වැනි දැවැන්ත දේශපාලන පක්ෂයක මෙවැනි අවාසනාවන්ත ඉරණමක් අත්වීමට මුල් වූ හේතු සාධක පිළිබඳව සොයා බැලීමද එක්තරා අන්දමක ජාතික අවශ්‍යතාවකි. අප එසේ කියන්නේ මෙරට පවතින කවර හෝ දේශපාලන පක්ෂයකට වුවද අනාගතයේදී එවැන්නක් සිදු විය හැකි බැවිනි.

එ.ජා.ප.ය. මීට පෙරද යම් යම් අවස්ථාවලදී අන්ත පරාජයන්ට මුහුණ දී තිබේ. 1956 සහ 1970යන වර්ෂ වල පැවැති මහ මැතිවරණ ඒ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය. එ.ජා.ප.ය 1956 දී ආසන 08 ට බැස්සේය. 1970 දී ආසන 16 ට බැස්සේය. එහෙත් එම පරාජයේ සුන්බුන් අතරින් නැගී සිටි ෆිනික්ස් කුරුල්ලා මෙන් යළි ජනතාව අතර ඉතා ශක්තිමත් පදනමක් ගොඩනගා ගැනීමට එ.ජා.ප.ය.ට හැකිවිය.

කෙසේ වෙතත් මෙවර එ.ජා.ප.ය ලබා ඇති අපකීර්තිමත් පරාජය හමුවේ පක්ෂයට එවැනි ප්‍රාතිහාරයක් පෑමට ඇති ඉඩකඩ ඉතාමත් සීමිතය. අප එසේ කියන්නේ 2020 මහ මැතිවරණයෙන් තමන් ලබා ඇති අන්ත පරාජයත් සමඟ පක්ෂයට ලැබී ඇති එකම එක ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට පවා සුදුස්සකු පත් කර ගැනීමට නොහැකිව තිබෙන බැවිනි. එය අතිශයින්ම කනගාටුවට කරුණකි.

එය එසේ වන්නට ඇත්තේ එ. ජා. ප යේ වත්මන් නායක කාරකාදීන්ගේ සිත් තුළ පක්ෂය පිළිබඳව ඇති ඇල්මට වඩා නායකත්වයට ඇති කෑදර කම මුල් තැනක් ගෙන ඇති නිසා විය හැකිය. පක්ෂයට හෙන ගැසී ගියත් පක්ෂ නායකත්වයට රැක ගැනීම එම නායක කාරකාදීන්ගේ අරමුණයි. එය කවරකුට වුවද පෙනෙන පැහැදිලි සත්‍යයකි.

අතීතයේ විසු එ.ජා.ප නායක කාරකාදීන් ගේ අරමුණ වූයේ ජනතාව පක්ෂය වටා ඒකරාශි කරගෙන පක්ෂය දිනවීමය. පක්ෂය දිනූ විට පාක්ෂිකයන්ද ජයග්‍රහණය කරන බව එදා සිටි පක්ෂ නායකයෝ දැන සිටියහ. ඒ ඔවුන් තුළ තිබෙන පක්ෂ හැඟීම නිසාය.

දිවංගත ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල සහ ජේ.ආර්. ජයවර්ධන වැනි කීර්තිමත් නායක කාරකාදීන් ගේ ඒකායන අරමුණ වූයේ පරාජිතව ඇද වැටුණු එ.ජා.ප.ය යළි ඉහළට ඔසවා තැබීමය. පක්ෂය සුරක්ෂිත කරවීම සඳහා ඔවුහු බොහෝ පරිත්‍යාගයන් කර තිබුණහ. එහෙත් වත්මන් එ.ජා.ප නායකයන්ගේ ප්‍රධානතම අරමුණ පක්ෂය දිනවීම නොව තමන්ගේ පක්ෂ නායකත්වය රැක ගැනීමයි.

ඕනෑම දේශපාලන පක්ෂයක් වටා ජනතාව පෙළ ගැසෙන්නේ නායකත්වයේ ඇති ආකර්ෂණය මතය. පක්ෂ නායකත්වය දුර්වල වූ විට හෝ ඔහු කෙරේ ඇති විශ්වාසය පළුදු වූ විට ජනතාව එම පක්ෂය හැර දමා යාම අනිවාර්යෙන්ම සිදු වන්නකි . අතීතයේ දැවැන්ත දේශපාලන පක්ෂයක් වූ එ.ජා.ප.ය වර්තමානයේ මුහුණ දී ඇත්තේ ද ඊට සමාන සිදුවීමකටය. එහෙත් නායක කාරකාදීන්ට ඒ ගැන වගේ වගක් නැත. ඔවුන්ට අවශ්‍ය පක්ෂයට හෙණ ගැසී ගියත් තමන්ගේ නායකත්වය අඛණ්ඩව රැක ගැනීමටයි. ඕනෑම පක්ෂ නායකයෙකු නිරතුරුව උත්සාහ කරන්නේ තම පක්ෂ සාමාජිකයන් සංඛ්‍යාව එකකින් හෝ වැඩි දියුණු කර ගැනීමට වුවද වත්මන් එ.ජා.ප නායකත්වයට එවැනි අවශ්‍යතාවයක් නොමැති වීමද පක්ෂයේ පිරිහීමට මුල් වූ තවත් ප්‍රබල හේතුවකි.

වත්මන් එ.ජා.ප නායකයාට ජාත්‍යන්තර වශයෙන් ඉතා හොඳ සම්බන්ධතා ජාලයක් තිබෙන බව වැඩි දෙනෙකු ගේ පිළිගැනීමයි. අපටද ඒ ගැන කිසිදු සැකයක් නැත. එහෙත් බරපතළම ප්‍රශ්නය වන්නේ එතරම් විශිෂ්ට සම්බන්ධතා ජාලයක් ඇති වත්මන් එ.ජා.ප නායකත්වයට දේශීය ජනතාව සමඟ ඇති සම්බන්ධතාව කෙරෙහි ඇති නොසැලකිල්ලයි.

ඉහත සඳහන් කරුණ මෙතෙක් කලක් පැවතුනේ ඕපාදූපයක් වශයෙනි. එසේ වුවද ඉකුත් මහ මැතිවරණයේ ප්‍රථිඵල ලේඛනය අනුව ඒ බව ප්‍රසිද්ධියේම සනාථ වී තිබේ. ඒ අඩුම වශයෙන් එ.ජා.ප නායකයාටවත් මෙවර පාර්ලිමේන්තුවට තේරී පත්වීමට අවශ්‍ය අවම මනාප සංඛ්‍යාව පවා ලබා ගැනීමට නොහැකි වී ඇති බැවිනි. අනෙක් අතට 2001 මහ මැතිවරණයේදී මෙරට බහුතර ජනතාව එ. ජා. ප. යට ආණ්ඩු බලය ලබා දෙන ලද්දේ මන්ත්‍රී ධුර 109 ක ජයග්‍රහණයක් අත්කර දෙමිනි. එහෙත් මෙරට ජනතව විසින් බන්දේසියක තබා පිරිනමන ලද ආණ්ඩු බලය රැක ගැනීමට එ.ජා.ප නායකත්වයට නොහැකි විය. එ.ජා.ප ආණ්ඩුවට වසර දෙකහමාරක් ගතවීමටත් මත්තෙන් චන්ද්‍රිකා ජනාධිපතිනිය සතු විධායක බලය යොදවා විසුරුවා හැරියාය.

තමන් හමුවේ පවතින අනතුර පිළිබඳව කල්තියා ඉව වැටුණු එස්. බී දිසානායක, රාජිත සේනාරත්න සහ මහින්ද විජේසේකර එම ආණ්ඩුවේ ඇමතිවරුන් චන්ද්‍රිකා ජනාධිපතිනියට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන එන ලෙස කරන ලද යෝජනාවද එ.ජා.ප නායකත්වය විසින් ඉවත දැමුවේය. අන්තිමේදි සිදු වූයේ චන්ද්‍රිකා මැතිනිය තමන් සතු විධායක බලතල යොදා ගනිමින් එ. ජා. ප ආණ්ඩුව විසුරුවා හැරීමය. එලෙස ආණ්ඩුව විසිරුවා හැරීමට පෙර එස්. බීලා සහ රාජිතලා යෝජනා කළ පරිදි චන්ද්‍රිකා ජනාධිපතිනියට එරෙහිව දෝෂාභියෝගයක් ඉදිරිපත් කළා නම් ජනාධිපතිනිය අකර්මණ්‍ය වන අතර එහි ඊළඟ ප්‍රතිඵලය වනුයේ චන්ද්‍රිකා මැතිනියට තම විධායක බලතල ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමයි. එවැනි තත්ත්වයක් ඇති වූවා නම් තමන් සතු ආණ්ඩු බලයද සහිතව 2005 ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට එ.ජා.ප නායකත්වයට ඕනෑ තරම් ඉඩ තිබුණේය. එහෙත් නායකත්වයේ බොළඳ කම නිසා එම අවස්ථාව ගිලිහී ගියේය.

එම සිද්ධියෙන් පවා පැහැදිලි වන්නේ එ.ජා.ප නායකත්වයට ජාත්‍යන්තර සබඳතා කොතෙකුත් තිබුණද මෙරට දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රායෝගික දැනුමක් නැති බවයි. දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වන සුළි කුණාටු සහ විවිධ චලනයන් පිළිබඳව විනිවිද දැකිය හැකි, දැක්මක් සාර්ථක දේහපාලඥයකුට අනිවාර්යෙන්ම තිබිය යුතුය. එබඳු දැක්මක් නොමැති පක්ෂ නායකයකුට සිදුවන්නේ දේශපාලන වැලි කතරේ අතර මංවීමටය. එ.ජා.ප.යේ වර්තමාන නායකත්වයටද සිදු වී ඇත්තේ 1994 සිට මේ දක්වා සිට මේ දක්වා වූ වසර 26 ම එලෙස හසරක් නොදැන වල්මත් වීමට ගතවූ කාලය තුළ සිදුවූ විවිධ හැල හැප්පීම් වලින් ද පැහැදිලි වේ.

එහි ඇති අවාසනාවන්ත තත්ත්වය වන්නේ එ.ජා.ප ය වත්මන් නායකත්වය යටතට පත්ව ගතවූ වසර 26 ක කාලය පුරාම වල්මත් වී සිටීමට සමස්ත එ. ජා. පාක්ෂිකත්වයටම සිදු වීමයි. කලකට ඉහත මේ රටේ දැවැන්ත දේශපාලන පක්ෂය බවට පත්ව තිබූ එ. ජා. ප. ය වර්තමානයේ මුහුණ පා තිබෙන තත්ත්වය අතිශයින් බේදජනකය. වර්තමානයේ එම පක්ෂයට ජාතික ලැයිස්තුවෙන් හිමිවී ඇති එකම එක මන්ත්‍රී ධූරයට පවා සුදුස්සකු පත්කර ගැනීමට නොහැකිව එම පක්ෂයේ නායක කාරකාදින් විසින් කරනු ලබන හෙයින් මාරුවෙන්ම අද එ. ජා. ප ය වැටී ඇති තත්ත්වයේ තරම පැහැදිලි වේ.

මේ වන විට මුළුමනින්ම විහිළුවක් බවට පත් වී ඇති එ.ජා.ප ය නිසා අද සුළු වශයෙන් හෝ ප්‍රයෝජනයක් , යහපතක් සිදුවී ඇත්තේ මෙරට පුවත් පත් වල සේවය කරන කාටූන් ශිල්පීන්ට නැතහොත් විවිධ නම් වලින් හැඳින්වෙන වෙබ් අඩවි සංස්කාරවරුන්ට ය. ඒ මෙරට පමණක් නොව විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ජනතාවගේ පවා හාස්‍ය රසය කුළුගැන්වෙන අන්දමේ රසවත් මාතෘකා ඔවුන්ට එ.ජා.ප ය තුළින් ඕනෑතරම් සපයා ගත හැකි බැවිනි. එ.ජා.ප ය අද පත් වී සිටින මේ අවාසනාවන්ත තත්ත්වය අතීතයේ විසු එ.ජා.ප නායකයන්ගේ ප්‍රෞඩත්වයට පවා බලවත් නිගරුවකි.

වඳුරන් සහ රිලවුන් දඬුකඳේ ගැසීම නිවැරදි ද?

● රසික කොටුදුරගේ

මිනිසා විසින් වනය ආක්‍රමණය කරන්ම වන සතුන් ගම් වැදීම චිරාත්කාලයක පටන් සිදුවන්නකි. එකල ගොවයෝ ඒ සඳහා කෙම්පන් ක්‍රම භාවිතා කළහ. අදට වඩා වනාන්තර ආශ්‍රිතවම ගම්මාන පිහිටියද මෙමඟින් වන සතුන් හා කිසියම් පයුරුපාසනමක් ඇතිව විසීමට ගැමියාට හැකි විය. අද වන සතුන් සම්බන්ධයෙන් ලොකුවට ම කතා කෙරෙන ප්‍රශ්නය වන්නේ 'අලි-මිනිස් ගැටුම' ය. මෙනිසා දශක කීපයක් තිස්සේ මිනිසුන් හා වන අලින් බොහෝමයක් මිය ගොස් ඇති අතර දැනුදු මිය යමින් පවතී. මින් ගොවිජනතාවගේ කෘෂිකාර්මික ජීවන රටාව බරපතළ ලෙස බිඳවැටී ඇති අතර, ඉතාම ගැටලුකාරී වාතාවරණයකට ඔවුන් මුහුණදී ඇත.

මේවන විට ලංකාව මුහුණ පා සිටින වනසතුන් - මිනිස් ගැටුමෙහි අලුත්ම තත්ත්වය වන්නේ වඳුරන්, රිළවුන්, වල් ඌරන්, දඬු ලේනුන්, ඉත්තෑවුන් සහ මොනරුන් ආදී වන සතුන් ගෙන් වන උවදුරුය. ග්‍රාමීය පෙදෙස්වල භව භෝග වගාවන්ට උන් විසින් කරන හානිය සුළුපටු නොවේ. ඇතැම් ප්‍රදේශවල ගම් මට්ටමේ කුඩා වාණිජ ගොවීන්ගේ සියලු අස්වනු මේ සතුන්ට බිලි වන අයුරු දැකිය හැකිය. දැන් දැන් උන් මිනිසුන් පාරිභෝජනය කරන බවබෝගවලට නුරුවීම ඊට හේතුවය. මෙනිසා වනයේ අහාර හිඟ වූ සැනින් උන් ගම් වදිති.

පසුගිය දා නව වැනි පාර්ලිමේන්තු සැසි වාරය අමතමින් හිටපු ජනාධිපති පාර්ලිමේන්තු මන්ත්‍රී මෛත්‍රිපාල සිරිසේන විසින් මෙරට ගොවියන් මුහුණ දී සිටින මෙකී ගැටලු පිළිබඳව සිය අවධානය යොමු කර සිටියේය. එහිදී ඔහු කියා සිටියේ "...ගොවියා ගොඩ ගන්නේ කොහොමද කියන කාරණාවේදී කාගේත් අවධානය යොමු වී තිබෙන කාරණයක් තමයි මේ රටේ සතුන්ගෙන් ආහාරවලට සිද්ධවන හානිය. අවුරුදු පහක් මම කෘෂිකර්ම ඇමැතිවරයා විදිහට ඉන්න කාලේ අපි ඒවායේ සංඛ්‍යාලේඛන ගත්තා. ඒ කියන්නේ 2005-2006-2007 කාලේ. ඒ කාලේ; ලංකාවේ වඳුරන් හා රිලව් සංඛ්‍යාව ලක්ෂ 11ක් විතර. දැන් ඒක කොච්චරවෙලා ද කියන්න මම දන්නෙ නැහැ. වඳුරෝ රිලව් එක දවසකට විනාශ කරන පොල් ගෙඩි සංඛ්‍යාව කොච්චරද? ගරු කතානායකතුමනි, එක වඳුරෙක් රිලවෙක් පොල් ගහකට නැග්ගහම මුළු පොල් වල්ල ම විනාශ කරනවා.

පොල් ගෙඩියක් දෙකක්; ඇට්ටියක් දෙකක් කාලා අනිත් ඔක්කොම අත්දෙකෙන් හූරලා විසි කරනවා. මං මේ කියන්නේ අවුරුදු දහයකට එහා සංඛ්‍යාලේඛන. ඒ විදියට වඳුරෙක් රිලවෙක් නැගලා පොල් ගහකට එක පොල් වල්ලක් විනාශ කලාම ඒ කාලේ පොල් ලක්ෂ දහයක් ඉවරයි. අද ඒ වගේ වඳුරන් - රිලව් දෙගුණ වෙලා ඇති; වුන්ගෙන් වන විනාශය ලක්ෂ විස්සක් විතර වෙලා ඇති. මේ රටේ පොල් නිෂ්පාදනයෙදි හොයන්නේ නැති පැති මං මේ කියන්නෙ. අපි බෞද්ධ රටක් විදිහට මේකට අත තියන්නේ නැහැ. ඒ නිසා අපි පාරේ එහෙ මෙහෙ යනකොට සුනඛයෝ ඉන්නවා; සුනඛයන්ට අත තියන්නේ නැහැ. සුනඛයෝ ආරක්ෂා කරන සුනඛ සංවිධානත් තියෙනවා සභානායකතුමනි. ඉතින් මේ වගේ තත්ත්වයක් උඩ අපි අලි මිනිස් ගැටුම ගැනත් දන්නවා. ඊගාවට මොණරා, ඌරා ඒ වගේ සත්තු රාශියක් නිසා මේ රටේ අහිංසක ගොවීන් රාශියක් නිෂ්පාදනය කරන ආහාරවලින් හතරින් එකක් සත්තු විනාශ කරනවා. මිනිස්සු බඩගින්නේ ඉඳලා සතුන්ට මිනිස්සුන්ගේ ආහාර කන්න දෙන ලෝකෙ එකම රට තමයි ලංකාව. කථානායකතුමනි; ලෝකයේ අනෙක් රටවල්වල ගැන මම හොඳට හොයලා බැලුවා සත්තු ආහාර විනාශ කරනවා නම්; සතුන්ගෙන් මිනිසුන්ට හානියක් තියෙනවා නං ඒ සත්තු විනාශ කරලා දානවා. හැබැයි අපි බෞද්ධ රටක් නිසා අපේ බෞද්ධ සංස්කෘතියත් එක්ක අපි සත්තුන්ට අත තියන්නේ නෑ සභානායකතුමා. ඒක නිසා අපේ ආහාර නිෂ්පාදනයෙන් 4/1ක් වන සත්තු විනාශ කරනවා. වෙළඳපළේ ආහාර හිඟයට මෙයත් එක හේතුවක්.

අලි මිනිස් ගැටුම සතුන්ගෙන් වන හානිය ඔබ අපි හැම කෙනෙක්ම මාධ්‍ය තුළ දකිනවා. ගම්වල මිනිස්සු නිසා අපි දන්නවා. මොණරෙක් වෙලකට ඉගිලිලා ආපුනාම හරියට වතුර බටයකින් උරාගෙන යනවා වගේ තමයි හොට තියලා හිටං වී බුසලක් විතර බඩ ඇතුළට දාගෙන තමයි මොණරා ආපනු ඉගිල්ලිලා යන්නෙ .

	බෝගය	පසු අස්වනු හානිය (% බර)
1. එළවළු	බෝංචි	29
	බණ්ඩක්කා	43
	වම්බටු	29
	ගෝවා	22
	වැටකොළු	28
	කැරට්	27
	මාළුමිරිස්	26
	බීට්රූට්	30
	මෑ	33
	පතෝල	32
	පිපිඤ්ඤා	24
	අමුමිරිස්	23
	කරවිල	25
	තක්කාලි	16
2. පලතුරු	කොසෙල්	31
	පේර	20
	අඹ	39
	පැපොල්	35
	අලිපේර	20-25

මේ විශාල ආහාර ප්‍රමාණය හරියටම රටේ ගොවියා නිෂ්පාදනය කරන ආහාරවලින් 4/1ක්. ඉතින් මේකට පිළියමක් නැහැ. මේවා තමයි ප්‍රශ්න. එන්න එන්න සත්තු වැඩි වෙනවා. අපේ වනජීවී ඇමති තුමා මෙතන ඉන්නවද දන්නෙ නැහැ. ඉතින් සත්තු රකින්නත් ඕන. මගේ ප්‍රතිපත්තිය නම් සත්තුන්ට වැඩිය මිනිසුන්ගේ බඩගින්න ගැන හිතන්න ඕන. මිනිස්සුන්ගේ පෝෂණය ගැන හිතන්න ඕන. "

මහාචාර්ය චාමලී නාහල්ලගේ

මෙරට ගොවීන් විසින් වගා කරන බෝගවලට වන සතුන්ගෙන් සිදු වන හානිය සුළුපටු නොවේ. ඔවුනතින් විනාශයට පත්වන බෝගවල වටිනාකම වසරකට රුපියල් කෝටි 1800 ඉක්මවන බව පසුගියදා පුවත්පත්වල වාර්තා විය.

මීට පිළියමක් වශයෙන් ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ගොවිජන සේවා කොමසාරිස් කාර්යාලයෙන් අප කළ විමසීමේදී වන සතුන්ගෙන් වගාවන්ට සිදුවන හානි පිළිබඳ ගොවීන්ගෙන් තොරතුරු ලබාගැනීමේ වැඩපිළිවෙළක් මේ වන විට ආරම්භ කර ඇති බවත්, මේවනවිට දිවයිනේ සෑම ප්‍රදේශයකින් ම ගොවීන් විසින් ඔවුන්ට සිදුව ඇති වගා හානි පිළිබඳව තොරතුරු කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබා දෙමින් පවතින බව පැවසීය. දැනට ඇති තොරතුරු අනුව වැඩි ම බෝග හානියක් සිදු කරන්නේ, වල් ඌරන්, රිලවුන් සහ වඳුරන් මෙන්ම මොනරුන්, ඉත්තෑවුන් හා වන අලීන් ය. පොළොන්නරු දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල බහුල වශයෙන් හම්බාවන්ගෙන් බෝග හානි සිදුවන බව ගොවීන් විසින් පවසන බවයි.

හෙක්ටර් කොබ්බෑකෙඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනයෙන් කළ විමසීමේදී ඔවුන් කියා සිටියේ වන සතුන්ගෙන් සිදුවන භෝග හානි හේතුවෙන් වාර්ෂිකව 40% කට වැඩි ප්‍රමාණයක් අස්වැන්න රටට අහිමි වන බවය.

වඳුරන්ගෙන් හා රිලව්ගෙන් සිදුවන වගා හානිය සම්බන්ධයෙන් පර්යේෂණයක නිරත වූ මහාචාර්ය චාමලී නහල්ලගේ පවසන්නේ, "වන සතුන්ගෙන් බෝගවගාවට හානි සිදුවන නමුත් එක් සත්ත්ව වර්ගයක් ඉලක්ක කරගෙන චෝදනා නැගීම නිවැරදි නොවන බවයි. වඳුරන් හා රිලවුන් ඉලක්ක කරගෙන මේ චෝදනාව එල්ල වුවද? වැඩි වශයෙන් හානි සිදු වන්නේ රිලවුන්ගෙනි.

එසේ වුවත් ඇතැම් උදවිය සංඛ්‍යා දත්ත මඟින් පෙන්වාදෙන තරම් මේ සතුන්ගෙන් හානියක් සිදු නොවන බව ඇය කියයි. මන්ද යත් මෙතෙක් මේ සතුන් සම්බන්ධයෙන් නිවැරදි ගණනය කිරීමක් සිදු වී නොමැති බව ඇයි පවසයි. එය පූර්ණ කාලීනව විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සිදු කළ යුතු දුෂ්කර කාර්යයකි. තමන් පර්යේෂණ කටයුතු සිදු කරන ගලිගමුව හත්තපිටිය වැනි විශාල ප්‍රදේශයක් ගෙන බැලුවොත් දළ වශයෙන් වඳුරන් සහ රිලවුන් 2500-3000ත් අතර ප්‍රමාණයක් සිටින බව ඇය පවසයි. නමුත් මේ නියැදිය ලංකාවේ සෑම තැනකටම අදාළ නොවේ. එය එහි පවතින පරිසර තත්ත්වය අනුව වෙනස් වේ. පොල්වගාවට වඳුරන්ගෙන් නොව රිලවුන් හා දඬුලේනුන්ගෙන් වැඩි වශයෙන් හානි සිදු වුවත් එක් ප්‍රදේශයක සිදුවන හානිය පදනම් කරගෙන මුලු රටේම එවැනි තත්ත්වයක් පවතින බව නිගමනය කිරීම උචිත නොවන බව ඇගේ අදහසය. මුලින් ම කළ යුත්තේ මේ සතුන් ගේ චර්යා රටාව අධ්‍යනය කිරීම ය.

මෙතුවක් කල් මේ ප්‍රශ්නය මැඩපැවැත්වීමට ගත් ක්‍රියා මාර්ගවලින් නිසි ප්‍රතිඵල අත් නො වුණේ මේකී සත්ත්ව චර්යාව, ආහාර රටා සහ සමාජ සංවිධාන රටා සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් යොමු නොකිරීම නිසාය. මෙරට ඇතැම් පරිසර පද්ධති අනුව මේ සතුන්ගේ ආහාර රටාව වෙනස් වේ. එනිසා නිසි අධ්‍යනයක් කර සිදු කර වගකීමෙන් යුතුව ප්‍රකාශ නිකුත් කිරීම කළ යුතු බව" ඇගේ අදහසය.

2018 වසර දක්වා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය මඟින් සිදු කළ අධ්‍යයනයන්ගෙන් ලබාගත් දත්තයන්ට අනුව 2018 වර්ෂය වන විට ප්‍රධාන බෝගයන් කිහිපයක පසු අස්වනු හානිය පහත පරිදි වේ.(2021 වර්ෂයේදී නැවත අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂිත අතර මේ වනවිට ක්ෂේත්‍රයට හඳුන්වා දී ඇති/භාවිත වන නිවැරදි තාක්ෂණයන් අනුව ඇතැම් බෝගයන්ගේ පසු අස්වනු හානිය මෙයට වඩා අඩු වේ යැයි අපේක්ෂා කෙරේ)

1 වැනි පිටුවෙන්

හොර පාරෙන් එන ග්‍රෑනයිට් ගැන පරීක්ෂණයක් ඉල්ලයි

තාවකාලිකව ආනයනය තහනම් කර ඇති ග්‍රෑනයිට් ශ්‍රී ලංකාවට ගෙන ඒමට සමාගම් පහකට අවසර දී ඇති බවට වාර්තා වී ඇති බවත් ඒ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කරන ලෙස පාරිභෝගික අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරයේ සභාපති රංජිත් විතානගේ නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

යතුරු පැදි ටයර් හා ටියුබ් වැනි සාමාන්‍ය ජනතාවට අවශ්‍ය භාණ්ඩ පවා සීමා කර ඇත්තේ මෙරට මුදල් විදෙස් කරා ඇදී යාම වැළැක්වීම සඳහා වන අතර මෙරටින් විශාල මුදල් සම්භාරයක් විදෙස් කරා ඇදී යන ග්‍රෑනයිට් නැවත ආනයනය කිරීමට අවසර දීම සම්බන්ධයෙන් කඩිනම් පරීක්ෂණයක් පවත්වන්නැයි රජයෙන් ඉල්ලා ඇත.

මහනුවර භූ කම්පන ලොකු අනතුරක සේයාවක්!

මහනුවර අවට පසුගිය සතිය ඇතුළත සිදුවූ සුළු භූ කම්පන හතර ප්‍රදේශය ආශ්‍රිතව සිදුවිය හැකි මීට වඩා විශාල භූ කම්පනයක පෙර නිමිත්තක් වීමට ඉඩ ඇති බවත් වික්ටෝරියා වේල්ල ආශ්‍රිත භූමිකම්පා පිළිබඳව මීට අවුරුදු 25කට පෙර භූ විද්‍යා මහාචාර්ය පී. ඩබ්ලිව්. විතානගේ මහතා මේ ගැන අනතුරු ඇඟවූ බවත් අතුල සේනාරත්න පවසයි.

වික්ටෝරියා වේල්ල හා ජලාශය අසල අනවසරයෙන් හාරන හුණුගල් වළවල් හා අවට සිදුවන බෝර දැමීම් හෝ ජලයේ තෙරපීමක් මෙම භූ කම්පන හතර සඳහා හේතුවිය හැකි බවද ඔහු පෙන්වා දෙයි.

ඒ අනුව මේ ගැටලුව පර්යේෂණ මඟින් නිරාකරණය වන තුරු මහනුවර හා නුවරඑළිය ප්‍රදේශයේ මහවැලි ජලාශ අසල හුණුගල් වළවල් කැණීම් හා කළුගල් කැඩීම් වහාම නැවැත්වීමට අදාළ බලධාරීන් පියවර ගත යුතු බවද මහාචාර්යවරයා රජයට දන්වා සිටී.

රුවන්පුර ...

අමාත්‍යාංශයේදී පසුගිය 3 වැනිදා සියලු නිලධාරීන් කැඳවා පෙර සැලසුම් කර තිබූ පරිදි මාර්ගය කඩිනමින් ඉදි කරන ලෙස දන්වා ඇත. අදියර 3ක් යටතේ ඉදිවන කොළඹ - පැල්මඩුල්ල 'රුවන්පුර' අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කහතුඩුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානයේ සිට ගමන් අරඹනු ඇත.

එහි 1 අදියර යටතේ කහතුඩුව සිට ඉංගිරිය දක්වා කි.මී. 24.3ක් ඉදිකරනු ලබයි. දෙවන අදියර ලෙස ඉංගිරියේ සිට රත්නපුර දක්වා කි.මී.21ක් ඉදිකරන අතර රත්නපුර සිට පැල්මඩුල්ල දක්වා කි.මී.28.6ක් ඉදිකරනු ලබන්නේ ව්‍යාපෘතියේ තුන්වන අදියර ලෙසය.

සමස්ත මාර්ගය කිලෝ මීටර් 73.9ක් වන අතර පළමු අදියරට රුපියල් බිලියන 80ක් වැය වනු ඇත.

මතට ඇබ්බැහිවූවන්..

මත් ද්‍රව්‍ය භාවිතා කර ඇබ්බැහි වූවන්ට ආයුර්වේද ප්‍රතිකාර තුළින් පූර්ණ සුවය ලබා දීමට හැකි බවට ආයුර්වේද වෛද්‍යවරුන් පෙන්වා දී ඇතැයිද කී ඇමැතිවරයා ප්‍රතිකාරවලට අමතරව ශරීරයට අවශ්‍ය යෝග හා භාවනා ක්‍රමද මේ ප්‍රතිකාර සඳහා යොදා ගැනීමට තීරණය කර ඇතැයිද මේ ව්‍යාපෘතිය මේ වසර නිමවීමට පෙර ආරම්භ කරන බවද පැවසීය.

ප්‍රේමලාල්...

මහ මැතිවරණයෙන් තේරී පත්වූ තමාට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගිවීමට අවසර දෙස ලෙසට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා මරණ දඬුවම නියම වී සිටින රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතා ගොනු කළ රිට් පෙත්සම ඉකුත් (04) වැනිදා අභියාචනාධිකරණය සභාපති ඒ.එච්.එම්.ඩී. නවාස් සහ සෝභිත රාජකරුණා යන මහත්වරුන් ගෙන් යුත් ද්වි පුද්ගල අභියාචනාධිකරණ මඬුල්ලක් හමුවේ සලකා බලමින් අභියාචනාධිකරණය මෙම නියෝගය එදිනට කල් තැබිණි.

එසේ ම පෙත්සම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරනවා ද නැද්ද යන තීන්දුව ද එදිනට ප්‍රකාශයට පත් කිරීමට අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල නියම කළේ ය.

වසරකින් පවුල්...

මේ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩම්වල පදිංචි සියලු දෙනාට කඩිනමින් සින්නක්කර ඔප්පු ලබා දීමට පියවර ගෙන ඇත.

මේ සඳහා ඉඩම් ලාභීන් තමන් පදිංචි ඉඩමේ මැනුම් ගාස්තු හා මුද්දර ගාස්තු ඒ ඒ දිස්ත්‍රික්කයේ ඉඩම් කාර්යාලවලට ගෙවිය යුතුවේ.

එමෙන්ම තම තමන් පදිංචි ඉඩම්වල පර්චසයකට අඩු ආදායම්ලාභීන් විසින් රුපියල් 100/= බැගින්ද සෙසු අය රුපියල් 500/= බැගින්ද ගෙවිය යුතුය.

මේ සඳහා මුදල් සපයා ගත නොහැකි අඩු ආදායම්ලාභීන්ට සමෘද්ධි බැංකුව මඟින් ණය මුදලක් ලබා දීම කෙරෙහිද රජයේ අවධානය යොමුව තිබේ.

මේ අතර දිවයින පුරා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩම් අක්කර 18,000ක මැනුම් කටයුතු සිදු කර ඉඩම් කට්ටි 33,101ක් වෙන් කර හඳුනා ගෙන ඇති බවද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සභාපතිවරයා කීවේය.

පිහිටවන්න

ඇළගහවත්ත, යටදොලවත්ත, මතුගම පදිංචි සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරිනියක් වන මොහෙෂා ධනංජනී (30) දියණියකට O වර්ගයේ වකුගඩුවක් ඉක්මනින් බද්ධ කළ යුතුය. පරිත්‍යාගශීලීයකු වෙත්නම් ඉක්මනින් 0714472338/0779025033.

වෙන්නප්පුව, ලුණුවිල දකුණු මිරිස්සන්කොටුව පදිංචි ඩබ්ලිව්.එම්. ජෝර්ජ් ඩික්සන් (53) තිදරු පියාට "ඕ" පොසිටිව් හෝ "ඕ" නෙගටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතුය. වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමති පිංවතකු සිටී නම් පහත දැක්වෙන දුරකථන අංකවලට අමතන්න.

077 - 6865291, 077 - 4199609.

වියළුව, මැදගො

වසර 100ක් පමණ පැරැණි එයිට් ක්ලබ්හි ගොඩනැගිල්ල වත්මනෙහි දිස්වන ආකාරය

කොළඹ, තුම්මුල්ලෙ පිහිටි ක්වින්ස් ක්‍රීඩා සමාජයේ ඉහළින් දිස්වන ආකාරය

අවරට යන කොළඹ ක්‍රීඩා සමාජ

රජයට කෝටි 16කට ආසන්න ණය වී ඇති එයිට් ක්ලබ් සහ ක්වින්ස් ක්‍රීඩා සමාජවල හෙට දවසේ ඉරණම කුමක් ද?

● අමිල මලවිසූරිය

කොළඹ නගරයේ පැරැණි ක්‍රීඩා සමාජ පිළිබඳ පසුගිය දිනවල නැඟුණු හාහූවේ දිගුවක් ලෙස ගෙවී ගිය දින කිහිපයේද තවත් ක්‍රීඩා සමාජ පිළිබඳව කතාබහක් කරළියට ආවේය. ඒ, කොළඹ 07, නිදහස් චතුරස්‍රය ආසන්නයේ නිදහස් මාවතෙහි අංක 25 දරන ස්ථානයේ පිහිටි එයිට් (80) ක්ලබ් සහ ඊට ආසන්නවම මෙට්ලන්ඩ් පෙදෙසේ අංක 31 දරන ස්ථානයේ පිහිටි ජිම්කානා ක්‍රීඩා සමාජය පිළිබඳවයි.

ශ්‍රී ලංකාවේ අබිමානය විදහා දැක්වෙන නිදහස් චතුරස්‍රය ආසන්නයේ පිහිටා තිබෙන එයිට් ක්ලබ් මෙරට තවත් එක් පැරැණිතම සමාජයක් ලෙස සැලැකේ. විසිවන සියවසේ මුල් කාලයේදී පමණ මහනුවර නගරයේදී ආරම්භකර ඇති එයිට් සමාජය 1941 වර්ෂයේදී කොළඹ නගරයේ වර්තමානයේ පිහිටා තිබෙන ස්ථානයට ගෙනැවිත් තිබේ. 1941 වසරේ සිට 60 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් සභාපතිත්වය දරා ඇති එයිට් සමාජයේ 1950 වසරේ සභාපතිත්වයට පත්ව ඇත්තෙ මෙරට දේශපාලනයේ ප්‍රකට චරිතයක් වූ සර් ජෝන් කොතලාවලයි. එසේම දකුණේ දේශපාලනඥයෙක් වූ මොන්ටිගෝ ජයවික්‍රම ද 1962 වර්ෂයේ එයිට් ක්ලබ්හි සභාපතිත්වය දරා තිබේ.

වසර සියයකට අධික පැරැණි ඓතිහාසික ගොඩනැගිල්ලක වර්තමානයේද පවත්වාගෙන යන එයිට් ක්ලබ්හි වත්මනෙහි පැනනැගි ඇති අර්බුදකාරි තත්ත්වය උදාවී තිබෙන්නෙ මෑතකාලීනව එහි පරිපාලනය සපැමිණි බලධරයන්ගේ අවිධිමත් පරිපාලනය නිසා බව එයිට් කල්බ් වෙත පිවිසෙන ඕනෑම අයෙකුට ගම්‍ය වේ. එය මනා ලෙස පසක් වන්නෙ පැරැණි ගොඩනැගිල්ලද අබලන් තත්ත්වයකට පත්ව තිබෙන ආකාරය දුටු විටයි. එහෙත් ගිය වර්ෂයේ සභාපතිත්වයට පත් වත්මන් සභාපති අමල් ද මෙල් ප්‍රමුඛ පරිපාලනය වෙර දරන්නෙ එයිට් ක්ලබ් අතීතයේ පැවැති අභිමානනීය තත්ත්වයට පත්කරලීමටයි. ඒ පිළිබඳව අමල් ද මෙල් මහතා පවසන්නෙ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව පැරැණි ගොඩනැගිල්ල නිසි පරිදි අලුත්වැඩියාකොට එයිට් සමාජය මනා පරිපාලනයකින් යුක්තව ඉදිරියට පවත්වාගෙන යෑමට කටයුතු කරන බවයි.

"අපේ ක්ලබ් එකේ ගොඩනැගිල්ලෙ තියෙන අඩුපාඩු නිසා තමයි රජයේ අවධානය යොමුවෙලා තියෙන්නෙ. අපි ඒ පිළිබඳව ඉදිරි සතියේම නාගරික සංවර්ධන අධිකාරියේ බලධාරින් සමඟ සාකච්ඡාකොට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා."

ටෙනිස්, ස්නුකර් වැනි ක්‍රීඩාවන් සඳහා මේ වන විටත් ඉඩපහසුකම් සහිත එයිට් සමාජය 'ලෝන් බෝල්' නමැති නවමු ක්‍රීඩාවක්ද ක්‍රීඩා සමාජ අතර ප්‍රචලිත කිරීමට ඉදිරි මාසයේදී සූදානම්ව සිටී. කොළඹ නගරයේ මනරම් පරිසරයක පිහිටි පර්චස් 257ක රජයට අයත් භූමියක පිහිටා තිබෙන එයිට් සමාජයේ ඉඩමට අදාළ බදු ගිවිසුමද පසුගිය කාලයේ අවසන්ව ඇත. වත්මන් සභාපතිවරයා පවසන්නෙ,

"ක්ලබ් එක පිහිටි මුළු භූමි ප්‍රමාණය පර්චස් 257ක්. එහි ගොඩනැගිල්ල පිහිටි ඉදිරිපස භූමිය පර්චස් 200යි. පිටුපස පර්චස් 57ක් ලෙස බදු ගිවිසුම් දෙකකින් යුක්තයි. පර්චස් 200 බදු කාලය 2017 අවසන් වුණේ. පර්චස් 57 බදු කාලය 2007 අවසන් වෙලා තියෙන්නෙ. ඒත් අපි පෙර පැවැති බදු මුදල්ම ගෙවමින් සිටින්නෙ. ඉදිරිපස පර්චස් 200ට 2020 දක්වාම බදු ගෙවලා තියෙන්නෙ."

ගොඩනැගිල්ලෙ තිබෙන අඩුපාඩු නිසාවෙන් රජයේ අවධානය යොමු වූවා සේම පර්චස් 57 භූමියට බදු වාරික එක්රැස් වීම නිසාවෙන් මේ වන විට හිඟ බදු වාරික ප්‍රමාණයක්ද එක්රැස්වී ඇති බවයි.

"ගිය වසරේ ඔක්තෝබර්වල මම සභාපති වෙමින් ක්ලබ් එක බාරගන්නා විට මිලියන 27ක පමණ බදු මුදලක් එකතුවෙලා තිබුණා. පස්සෙ වත්මන් ආණ්ඩුකාරතුමා සමඟ පැවැති සාකච්ඡාවකදී හිඟ වාරික ගෙවන්න වසරක සහන කාලයක් දුන්නා. පසුගිය මාස පහක කාලය තුළදී මිලියන 2.7 ගාණේ මාස පහක් ගෙව්වා. ඔය අතරේ තමයි කොවිඩ් වසංගතය ආවේ. ඒක අපිටත් තදින්ම බලපෑවා. ඒ අතරේ නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරලා තිබුණා ගොඩනැගිල්ල අලුත්වැඩියා කළ යුතුයි කියා. අපිට ගෙවන්න තිබෙන ඉතිරි හිඟ වාරික මුදල් 2021 අගෝස්තු මාසය වන විට ගෙවීමට සැලැසුම් කරලා තියෙන්නෙ. ගිය මාසෙත් ලක්ෂ පහක මුදලක් ගෙව්වා. අපි කියන්නෙ අපිට දීලා තියෙන නියමිත කාලයට හිඟ මුදල් ගෙවාගන්න බැරි වුණොත් එයිට් ක්ලබ් භූමිය රජයට පවරාගන්නා ලෙසයි."

මෙලෙස එයිට් ක්ලබ් පිළිබඳ කතිකාවක් සිදුවෙද්දී එයිට් සමාජයට ආසන්නවම පිහිටි ජිම්කානා ක්‍රීඩා සමාජය පිළිබඳවද පසුගිය දිනවල කතාබහක් කරළියට ආවේය. 1863 වසරේ ආරම්භ කර ඇති මෙරට තිබෙන පැරැණිතම ක්‍රීඩා සමාජයක් ලෙස සැලැකෙන ජිම්කානා ක්‍රීඩා සමාජය යනු ක්‍රීඩාවන් කිහිපයකටම අයත් ප්‍රධාන ක්‍රීඩා සමාජ එකතුවකින් සැදුම්ලත් ක්‍රීඩා සමාජයකි. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ සුදු ජාතිකයන්ගේ සුහද හමු සහ ක්‍රීඩා කටයුතු සඳහා එක්රොක් වූ ජිම්කානා නමින් ප්‍රචලිත 'සමාජ' මෙරට පමණක් නොව රටවල් රැසකම පවතී.

කොළඹ 07, මෙට්ලන්ඩ් පෙදෙසේ පිහිටි ජිම්කානා ක්‍රීඩා සමාජයේ ලේකම් ටී. බී. ඩයස් ඇතිවී තිබෙන වත්මන් තත්ත්වය පිළිබඳව අපට මෙලෙස පැහැදිලි කළේය.

"මෙහෙමයි, ඇත්තටම වර්තමානයේ ජිම්කානා ක්‍රීඩා සමාජයට කිසිම ප්‍රශ්නයක් පැන නැගිලා නැහැ. ජිම්කානා ක්‍රීඩා සමාජය පිහිටි භූමියට අදාළ සියලු බදු මුදල් ගෙවලා තියෙන්නෙ. පසුගිය දිනවල පළවූ පුවත් අසත්‍යයි."

ජිම්කානා ක්‍රීඩා සමාජය යනු ක්‍රිකට්වලින් ප්‍රචලිත කලම්බු ක්‍රිකට් ක්ලබ් (සීසීසී), රගර් හා හොකී සඳහා ප්‍රකට සීඑච් ඇන්ඩ් එෆ්සී සහ ටෙනිස් හා ස්කොෂ් ක්‍රීඩා සඳහාම වෙන්වූ කලම්බු ක්වින්ස් සමාජය යන ක්‍රීඩා සමාජ කීපයක එකතුවකි.

ඒ අනුව මේ වන විට යම් ආකාරයක ගැටලුකාරි තත්ත්වයකට මුහුණ දී ඇත්තෙ 1899 වසරේ ආරම්භ කර 1959 වසරේදී ජිම්කානා සමාජයට එක්ව ඇති කොළඹ, තුම්මුල්ල හන්දියේ පිහිටා ඇති ටෙනිස් හා ස්කොෂ් ක්‍රීඩාව සිදු කරන ක්වින්ස් ක්‍රීඩා සමාජයයි. වත්මනෙහි ගැටලුකාරි තත්ත්වයක් ක්වින්ස් ක්‍රීඩා සමාජයට පැන නැගී ඇත්තෙ 2016 වසරේ එවකට පැවැති රජයේ බදු මුදල් ඉහළ නැංවීම නිසාවෙන් බව ජිම්කානා ක්‍රීඩා සමාජයේ ලේකම් ඩයස් පැවැසීය. හෙතෙම වැඩිදුරටත් පවසන්නෙ,

"2016 වසරට පෙර ක්වින්ස් ක්ලබ් එකේ වාර්ෂික බදු මුදල වුණේ රුපියල් හාරලක්ෂ අසූදාහයි. 2017 එහි බදු වාරිකය එක්වරම මිලියන 48ක් දක්වා ඉහළ දැම්මා. මාසයකට ලක්ෂ 40ක් පමණ. හැබැයි ඊට පෙර හාරලක්ෂ අසූදාහයි වර්ෂයකටම ගෙව්වෙ. මොනතරම් අසාධාරණද... එතැනින් තමයි ක්වින්ස් ක්ලබ් එකට බදු ගැටලුව පැන නැගුණේ. අපි ඒ සඳහා පැවැති රජයෙන් කීප වරක්ම ඉල්ලීම් කළා. මෙය ටෙනිස් ක්‍රීඩා කරන ක්ලබ් එකක්... දෙසීයක පමණ සාමාජිකයන් සංඛ්‍යාවක් සිටින්නෙත් කියා. ඒත් වැඩක් වුණේ නෑ. සාමාන්‍යයෙන් මේ ක්ලබ් එකට ලක්ෂ පහකවත් ආදායමක් නැහැ."

අනතුරුව එලෙස බදු මුදල් ඉහළ දැමීම නිසාවෙන් ක්වින්ස් ක්‍රීඩා සමාජයටද ඔටර් ක්‍රීඩා සමාජයට සහ එයිට් ක්ලබ් සඳහා පැන නැගි තිබෙන අර්බුදයට මුහුණ දීමට සිදුව තිබේ.

"ඔය තත්ත්වයත් සමඟ නාගරික සංවර්ධන අධිකාරියෙන් අපටත් දැනුම් දුන්නා ක්වින්ස් ක්‍රීඩා සමාජ භූමියත් පවරා ගන්නවා කියලා. ඔන්න ඔක තමයි සිදුවී තිබෙන තත්ත්වය. නමුත් මාධ්‍යයේ පළවුණේ ජිම්කානා ක්ලබ් ගැනයි. ඇත්තටම එයින් අපි දැඩි අපහසුතාවකට පත්වුණා. අපි දැන් නාගරික සංවර්ධන අධිකාරියේ බලධාරින් සමඟ සාකච්ඡාකොට ටෙනිස් ස්පෝට් ක්ලබ් එකක් ලෙස අපට ගෙවිය හැකි සාධාරණ බදු මුදලක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරනවා" යැයි පවසන ලේකම්වරයා කිසිදු සාධාරණයකින් තොරව ඉහළ දැමූ බදු මුදල පිළිබඳව වත්මන් රජයෙන් සාධාරණයක් බලාපොරොත්තු වන බවයි.

අතීතයේ අක්කර දහයක පමණ භූමියක පිහිටා තිබූ ක්වින්ස් ක්‍රීඩා සමාජය මේ වන විට අක්කර දෙකක පමණ භූමියක පිහිටා ඇත.

අප මේ පිළිබඳව තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් ප්‍රියන්තා දිසානායකගෙන් විමසූ විට, එයිට් ක්ලබ්හි බදු ගිවිසුම් කාලය අවසන්ව ඇති බැවින් ඔවුනට ඉවත් වීමට දැනුම් දුන්නත්, අස්කිරීමේ දැන්වීම නිකුත් කර නොමැති බවයි.

වර්තමානයේ මෙලෙස කොළඹ නගරයේ ක්‍රීඩා සමාජවලට අත්වී තිබෙන ඉරණම පිළිබඳව සර්ව සාධාරණ ලෙස තීන්දු තීරණ ගැනීම වගකිවයුතු පාර්ශ්වවල යුතුකමකි.

එයිට් ක්ලබ්හි වත්මන් සභාපති අමල් ද මෙල්

සර් ජෝන් කොතලාවලද සභාපතිත්වය දැරූ එයිට් සමාජයේ වසර සියයක් පමණ පැරැණි ගොඩනැගිල්ලෙ අබලන් බව රජයේ අවධානයට...

එයිට් ක්ලබ්හි අවන්හල

ඒයාරූප - විපුල අමරසිංහ

ශ්‍රී ලංකා මුහුදේ ගිනි ගත් තෙල් නැව

● සුහාෂිනී ජයරත්න

ශ්‍රී ලංකා නැගෙනහිර මුහුදු කලාපයේ සංගමන් කන්ද තුඩුව සිට නාවුක සැතපුම් 38 ක් දුර මුහුදේ යාත්‍රා කරමින් තිබූ ඉන්දියාවේ විශාලතම තෙල් පිරිපහදු කරන්නෙකු වන ඉන්දියන් ඔයිල් කෝපරේෂන් සමාගමට අයත් බොර තෙල් තොගයක් ප්‍රවාහනය කරමින් සිටි මහා පරිමාන බොර තෙල් ප්‍රවාහකයෙකු වන MT NEW DIAMOND නෞකාව අනතුරට පත්වූයේ පසුගිය 3 වැනිදාය. මෙම නෞකාව අගෝස්තු 23 වන දින කුවේටයේ මීනා අල් අහමඩි සිට පිටත් වූයේ සැප්තැම්බර් 5 වන දින ඉන්දියාවේ ප්‍රදාප් වරායට ළඟා වීමටය.

පැනමා රටට අයත් එම නෞකාව කුවේටයේ මීනා අල් අහමන්ඩි වරායේ සිට ඉන්දියාවේ ප්‍රදාප් වරායට ගමන් කරන අතර මෙම ගින්න හට ගත්තේ මෙහි බොර තෙල් මෙට්රික් ටොන් 270,000ක් හා ඩීසල් මෙට්රික් ටොන් 1,700 ක් ද රැගෙන යමින් සිටියදීය. මෙහි කාර්ය මණ්ඩලයේ පිලිපීන ජාතිකයින් 18 දෙනෙක් සිට ඇති අතර ග්‍රීක ජාතිකයන් 5 දෙනෙක් සිට ඇති අතර මේ සියලු දෙනා ජීවිත අවදානමක් දරමින් අපේ නාවුක හමුදාව විසිනි. මෙම ලිපිය ලියන මොහොත වන විටත් **MT NEW DIAMOND** නම් වූ මෙම නෞකාවේ ගින්න පාලනය කිරීමට හා නැව මුහුද දෙසට ඇඳගෙන යාමට දැඩි පරිශ්‍රමයක යෙදි සිටියි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් එම් අයි 17 වර්ගයේ හෙලිකොප්ටර් යානයක් මේ වන විට ගින්න නිවීම සඳහා ගුවනින් ජලය ඉසිම, පෙණ වර්ග උඩු ගුවනේ සිට පොම්ප කිරීම සිදු කළ අතර ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ඉන්දියානු නාවික හමුදාව හා ඉන්දීය වෙරළ ආරක්ෂක බළකාය ඒකාබද්ධව මෙම මෙහෙයුම දියත් කරනු පසුගිය සති අන්තයේ දක්නට ලැබුණි.

මෙහි බරපතළකම හා පසු විපාක වඩාත්ම තීව්‍ර වන්නේ මේ නැවේ අන්තර්ගත සුවිශාල තෙල් ප්‍රමාණය හා යම් හෙයකින් එම තෙල් සාගරයට මුසු වීමේ අවදානම නිසාවෙනි. පසුගිය මාසයේ මොරිෂස් දූපත්හි මෙවැනිම තෙල් ටොන් 1000 ක් රැගත් නැවක් අනතුරට ලක්වීමෙන් එහි සුන්දර වෙරළ තීර කරා තෙල් ළඟා වී ඇති අතර, කොරල් පර හා වෙනත් දේශීය වන ජීවීන් මෙන්ම රටේ සංචාරක කර්මාන්තයට තර්ජන ඇති කරන්නට විය. මොරිෂස් වෙරළ තීරයේ තෙල් කාන්දු වීම හා පරිසර පද්ධතියට තර්ජනය වළක්වා පිරිසිදු කිරීම් කරන්නට සහාය දෙන බව එදා ඔවුන්ට ජපානය පොරොන්දු විය. අද මේ අවදානම අපට අත්විඳින්නට සිදුව ඇත. යම් හෙයකින් මෙම නැව පුපුරා ගියහොත්, තෙල් ටැංකි ගිනි ගතහොත් නැතිනම් මේ නැව වෙරළ තීරයට පාවී ආවොත් එවැනි තත්ත්වයක් දරන්නට අපේ සුන්දර වෙරළ තීරයට හැකිවේද?

මේ සම්බන්ධ අපිට සුළු අත්දැකීමක් ඇත්තේ 2015 වසරේදි ය. ඒ හික්කඩුව මුහුදු තීරයේදි තෙල් ටොන් 200 ක ගිනි ගැනීමය. මෙම තෙල් නැව ගිනි ගෙන පුරා දිනක් ගත වුවද එහි ගින්න පාලනය කිරීමට යම් ආකාරයකින් අපොහොසත් වීම මෙහි ඇති භයංකරත්වය තීව්‍ර කරවන්නට සමත් වන අතර යම් විනාශයක අවදානම මෙම ලිපිය ලියන මොහොත වන විටත් බැහැර වී තිබුණේ නැත. සිකුරාදා උදැසන වන විටත් මෙම නැව නාවික සැතපුම් 38 ක් දුරින් තිබූ නැව නාවුක සැතපුම් 25 ක් දක්වා ගොඩබිම දෙසට පැමිණ ඇති බව වාර්තා වෙයි.

"අපේ අවධානය මුලින්ම යොමු වන්නේ මේ ගින්න නිවීම කෙරෙහියි. මේ වන විටත් නැවේ ස්ථායිතාවය ගැන ගැටලුවක් මතුවෙනවා. ගින්න නිවුණු පසු නැව අපේ වෙරළ තීරයෙන් ඈත මුහුදු කලාපයට ඇඳ ගෙන යායුතු වෙනවා. මේ වන විටත් මුහුදට තෙල් කාන්දු වීම වළක්වා ගන්න අපි විවිධ ක්‍රියාමාර්ග ගෙන තියෙනවා. මෙය අපට අලුත් අත්දැකීමක් නිසා විදෙස් විශේෂඥ සහය අවශ්‍ය වෙනවා. මෙම නෞකාවේ ඉන්ධන මුහුදු ජලයට කාන්දු වුණොත් සිදුවිය හැකි හානිය විශාලයි. එය සාගර කලාපයට දැඩි බලපෑම් එල්ල කරන්නට පුළුවන්. සමහර විට කාලයත් සමඟ නිසි ක්‍රියාමාර්ග නොගත හොත් ටිකෙන් ටික තෙල් සාගර ජලයට මුසු විය හැකියි. තෙල් කාන්දු වුවහොත් ඒ සඳහා ගත හැකි විවිධ ක්‍රියාමාර්ග අපිට අත් හදා බලන්නට සිදු වෙනවා. සමහර විට බූම් දමා හෝ තෙල් එකතු කරන්නට සිදු වෙනවා. අවම හානි සඳහා වන ක්‍රියා මාර්ග ගැනීමට සිදුවෙනවා. මේ ප්‍රදේශයේ මුහුදු ජීවීන් විශාල ප්‍රමාණයක් ගැවසෙනවා.

තල්මසුන් මෙන්ම ඩොල්ෆින්ලාද විශාල වශයෙන් ගැවසෙන නිසා යම් හෙයකින් තෙල් කාන්දු වුවහොත් මේ ජීවීන් සියල්ල අනතුරේ. ඒ වගේම ලංකාවේ කොරල් පර වලටත් මෙයින් සිදුවන හානිය සුවිශාලයි. වෙරළ කලාපය ආශ්‍රිතව ජීවත් වන ජනතාවට මේ දුම ආඝ්‍රාණය වීම හොඳ නැහැ. මේ තෙල්වලින් පිටවන දුම ඉතා සැරයි. මෙයින් යම් ආකාරයක සමේ රෝග ඇති වීමේ අවදානමක්ද පවතිනවා. අපි ධීවරයින්ට කියන්නේ මේ සමීපයට යන්න එපා. අවම තරමින් කිලෝ මීටර 5-6 ක දුරින් හෝ සිටින්න කියා. මෙයට නිරාවරණය වුවහොත් ජීවිත හානි පවා සිදුවිය හැකියි..."ඒ සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ආචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ටර්නි ප්‍රදිප් කුමාරය.

සමුද්‍ර ජීවී අධිකාරිය පවසන්නේ තෙල් කාන්දුවක් සිදුවුවහොත් මුහුදට මුසුවන බොර තෙල් ඉවත් කිරීමට හා මුහුදු වෙරළ පිරිසුදු කිරීමට යන වියදම මෙන්ම සංචාරක කර්මාන්තයට මෙන්ම ධීවර කර්මාන්තයටත් සිදුවන හානියට අදාළ වන්දි එම නැව අයිති සමාගමෙන් අය කර ගැනීමට සිදුවන බවයි.

" සාගරයට තෙල් මුසු වීමෙන් කොරළ් පර, මාළු වර්ග මෙන්ම වෙරළ සියල්ල විනාශයට පත් වෙනවා. හානිය ඇස්තමේන්තු කරන්න අපහසුයි. මේ වගේ අවස්ථාවක කළ යුත්තේ සිදුවන විනාශය අවම කර ගන්න ක්‍රියා මාර්ග ගැනිමයි. ගිනි ගන්නා නැව වටේටම බෝයා යොදා තෙල් විසිරි නොයන ලෙසට තාවකාලික වැටක් සකස් කළ යුතුයි. එසේම යම් යම් රසායනික ද්‍රව්‍ය ඉසිමින් තෙල් බෝල බවට පත් කර ගැනිමේ ක්‍රමවේද පවතිනවා. ඉන්පසු එය ඉවත් කර ගැනිම පහසු වෙනවා. ලංකාවේ මීට පෙර නැව්වලින් තෙල් ලීක් වූ විට හා නැව් ගිලුණු අවස්ථා වල මේ වගේ දේවල් කළා. කෙසේ වෙතත් ගින්න පාලනය කර ගත හොත් සිදුවිය හැකි හානිය අවම කර ගත හැකියි..."ඒ පරිසර යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ පරිසර විද්‍යාඥ හේමන්ත විතානගේය..

කෙසේ වෙතත් මෙම ලිපිය ලියන මොහොත වන විටත් ගින්න ඇති වීමෙන් පසු සිදුවූ පිපිරීම් වලින් සමඟ නෞකා බඳෙහි ඉරිතැලීම් කිහිපයක් නිරීක්ෂණය වි ඇත. මේ නිසා ඉන්දීය වෙරළාරක්ෂක බළකාය අනුමාන කරන්නේ තෙල් පිපිරීමක් ඕනෑම වේලාවක සිදුවිය හැකි බවය. සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය පවසන්නේ යම් හෙයකින් තෙල් විසිරීමක් සිදුවුවහොත් කල්කුඩා, පාසිකුඩා හා ආරුගම්බේ ප්‍රදේශවලට පමණක් නොව වාකරේ හා ත්‍රිකුණාමලයේ පරෙවි දූපත්වලට හානියක් විය හැකියි. ඊට අමතරව තෙල් පහළට පැමිණියහොත් අනිවාර්යයෙන්ම කිරින්ද ප්‍රදේශය දක්වාම පැතිර යා හැකි බවයි. යම් හෙයකින් තෙල් කාන්දුවක් ඇති වුවහොත් මෙය මේ කලාපයේ ඇතිවූ විශාලම තෙල් කාන්දුව විය හැකි බවට බොහෝ දෙනා අනතුරු අඟවති. තෙල් කාන්දුවක් ඇති වුවහොත් එය වෙරළ කරා ළඟාවීමට පැය තිහක පමණ කාලයක් ගතවන බව ගණන් බලා ඇත.

සිකුරාදා දහවල් වන විටත් ගොඩබිම දෙසට ඇදී එන නැව මුහුද දෙසට ඇඳ ගෙන යාමට කටයුතු කර ඇත.

මේ අතර අනතුරට පත් නෞකාවෙන් මෙරට සමුද්‍රීය පරිසරයට සිදුවිය හැකි හානි වළක්වා ගැනීමට පැය 24 පුරා ක්‍රියාත්මක ඒකාබද්ධ මෙහෙයුමක් ඔස්සේ අවශ්‍ය උපරිම ක්‍රියාමාර්ග ගන්නා ලෙස අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අදාළ බලධාරීන්ට සිකුරාදා උපදෙස් ලබා දුන්නේය.

සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ආචාර්ය ටර්නි ප්‍රදිප් කුමාර

පරිසර යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ

තෙල් කාන්දු වුණොත් වෙරළට එන්න පැය 30ක් පමණ ගත වෙනවා

කලාපයේ ඇතිවූ විශාලම තෙල් කාන්දුවක අවදානමක්

පසුගිය මාසයේ මොරිෂස් දූපතෙන් මෙවැනිම විනාශයක් සිදුවුණා



ගිනිගැනීම - සැප්තැම්බර් 3 සංගමන්කන්ද තුඩුව

නැව ගිනි ගනිමින්

නාවිකයන් බේරාගනිමින්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් ලංකාගම - දෙනියාය මාර්ගය ඉදිකිරීම් පිළිබඳව බලධාරීන්ට උපදෙස් දෙමින්

තිරසර හෙටකට ජනපති නුවණැස

ලංකාගමට ගිය මුල්ම ජනපති ගෙන් ගම් 7ක ජනතාවට සහන් එළියක්

ලංකාගම දුෂ්කර මාර්ගය ප්‍රතිසංස්කරණයට පෙර

පරිසර හිතකාමීව මාස තුනෙන් පාර හදනවා... කැලේ සුරැකීම ඔබේ යුතුකමක්...

- ජනපති

සිංහරාජයට කිසිම හානියක් නොකර පාර හදන හැටි ජනපති පෙන්වයි

● **නිහාල් පී. අබේසිංහ**

"අනේ සර් අපේ ගම් 5 - 6 ක පවුල් 750 ක් හරි පාරක් නැතිකමින් පුදුම දුකක් විඳින්නේ. බේතක් හේතක් ගන්න පුංචි ළමයින් ලොකු පාසලකට යවන්න සැතැප්ම 10 – 12 අපි පයින් යන්න ඕන. අපි විඳින දුක අපේ දරුවන්ටත් විඳින්න දෙන්න එපා. ලංකාගම පාර හදලා බස් එකක් දාලා දෙන්න." මේ පසුගියදා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සිංහරාජයේ නිරීක්ෂණ චාරිකාවකට ගිය මොහොතේ දුප්පත් පියෙක්. තම ළබැඳි පුතණුවන් කරේ හොවාගෙන ජනපතිගෙන් ඉල්ලූ ඉල්ලීමකි. "අපි පාර හදල දෙනවා. හැබැයි සිංහරාජය සුරැකීම ඔයාලාගේ යුතුකමක්. එයට පිළිතුරු ලෙස ජනාධිපතිතුමා පැවසීය.

සිංහරාජය අපේ රටේ වැසි වනාන්තරවල ප්‍රමුඛතම වැසි වනාන්තරයයි. හෙක්ටයාර 11,187 ක් විශාල මෙරට ඉහළතම ජෛව විවිධත්වයක් ඇති එහි සුවිශේෂී බව නිසා ම එතෙර මෙතෙර උද්භිද හා සත්ව විද්‍යාඥයන්ට මෙම සංවේදී පරිසර කලාපය පර්යේෂණ මධ්‍යස්ථානයක් බඳු ය. සිංහරාජ ලෝක උරුම වන භූමියට ආසන්න නගර ලෙස ගාල්ල, නෙළුව, මාතර, දෙනියාය හැඳින්වීමට පුළුවන.

සිංහරාජය මායිමේ වසර ගණනාවක සිට ලංකාගම ඇතුළු ගම්මාන 7ක් පවතී. වතුගල, නිල්වැල්ල, කොලොන්කොටුව, පිටදෙණිය වාරුකන්දෙණිය, කොළොන්තොටුව ඒ ගම්මාන අතර ප්‍රධානවේ. සිංහරාජය තුළ මනරම් දියඇළි 17 ක් ද ඇත.

තම වගා අස්වැන්න නගරයට ගෙන යාමේදී මෙන්ම හදිසියකදී මේ ගම්වල අසනීප වන අයකු නෙළුව උඩුගම හා කරාපිටිය රෝහල් වෙත ගෙන යාමට ද මේ ප්‍රදේශවල ඇති දැඩි මාර්ග දුෂ්කරතාව නිසා ඒ ජනතාව විවිධ අපහසුතාවලට ලක්වෙති. ඒ අනුව ඔවුන්ට ඒ අවස්ථාවල සිදුවූයේ ඉඳහිට හමුවන ට්‍රැක්ටරයක හෝ තේ දලු ගෙන යන ලොරියක නැගී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ය. ඒ මාර්ග අවහිරතා නිසා ඒ ගමනට පැය 2 – 3 ක් ගතවන අවස්ථා ද තිබිණි.

පුරා විද්‍යා පර්යේෂණ අනුව මේ ගම්මාන වලගම්බා රජ දවස දක්වා දිව යන ඉතිහාසයකට උරුමකම් කියයි. සියවසකට අධික කාලයක සිට මේ සිංහරාජය මායිමේ සිටින ජනතාව සිංහරාජයට මායිමේ ඇති මාර්ගය ඔස්සේ දෙනියායට, නෙළුවට තේ දලු ඇතුළු කෘෂි නිපැයුම් රැගෙන යති. ඒ දුර කිලෝමීටර් 18ක් වූ දුෂ්කර මාර්ගයක් ඔස්සේය.

වළවල් හෑරී සෝදා පාළුවට ලක්වී, ගස් පෙරළී තිබූ එම කටුක මාර්ගයේ මෝටර් සයිකලයකවත් යාමට බැරි ස්ථාන ද විය. ඒ සමහර ස්ථානවල ට්‍රැක්ටර් පවා ධාවනය වූයේ ඉතාම අපහසුවෙනි.

ඊට අමතරව දරුවන්ට උසස් අධ්‍යාපනික කටයුතු කරගෙන යාමට නෙළුව හා දෙනියාය නගරවලට යාම ද මාර්ග දුෂ්කරතා නිසා අපහසු විය.

ඒ දරු පරපුර අතර කෙතරම් දක්ෂ දරුවන් සිටියා ද ඔවුන්ට සිදුවූයේ ලංකාගම පාසලෙන් පමණක් උසස් අධ්‍යාපනය අවසන් කර ගැනීමටය.

පසුගිය මහ මැතිවරණ ජනහමු සඳහා ජනාධිපති තුමා නෙළුව නගරයට පැමිණි මොහොතේ මේ ලංකාගම ජනතාව මාර්ග අපහසුතා නිසා තමන් විඳින දුක් ගැහැට ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාට පෙන්වා දුන්නේ ය.

ඒ පිළිබඳව අවධානය යොමු කළ ජනාධිපතිතුමා නෙළුව - ලංකාගම - පිටදෙණිය පැරැණි මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට යුද හමුදාවට බාර කෙරිණි.

ඒ මාර්ගය ඉදිවෙද්දී සිංහරාජය මැදින් දැවැන්ත මාර්ගයක් ඉදිකරන බවටත් එහි සුපිරි හෝටලයක් ඇති බවටත් සමාජ මාධ්‍ය මගින් සමහර පරිසරවේදීහු අදහස් දැක්වූහ. ඊට පසුව ඒ ප්‍රචාරවලට තවත් අත් තටු ලැබිණි. ඒ අනුව තවත් පරිසරවේදීන්ගේ අවධානය ද සිංහරාජය වෙතට යොමු විය.

වැසි වනාන්තර සුරකින්නන්ගේ සංවිධානය ඇතුළු විවිධ පරිසර සංවිධාන සිංහරාජය මැදින් පාරක් කැපීම සිංහරාජයට හානියක් බවට ජනාධිපතිතුමාට ද දැන්වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස ජනපති අණින් ඒ මාර්ගයේ ඉදිකිරීම් අත්හිටුවිය.

මේ සිංහරාජය අවට ගම් 7 ක ජනතාව දිගටම ඉල්ලා සිටියේ තිබෙන පාර ප්‍රතිසංස්කරණය කර මාර්ග දුෂ්කරතාව මග අරවන ලෙසය.

මේ සියලු ප්‍රශ්න පිළිබඳව ජනාධිපතිතුමා වනජීවී වන සංරක්ෂණ නිලධාරීන් හා ප්‍රදේශයේ ජනතා සංවිධාන සමඟ සාකච්ඡා කළේ ය. පසුව එතුමාට ලංකාගමට පැමිණ මේ ගැටලුව පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් කිරීමට තීරණය කළේ ය. ඒ අනුව පසුගිය සතියේ මෙරට ප්‍රථම වරට ලංකාගමට ජනතා හිත සුව පිණිස සුවිශේෂී කටයුත්තක් සඳහා ගිය ප්‍රථම ජනපති ලෙස එතුමා සිංහරාජය ලංකාගම ප්‍රදේශ හොඳින් නිරීක්ෂණය කළේ ය. පසුව මේ ගැටලුවට ලක්වූ පවුල්වල ජනතාව හා සිසු දරු දැරියන් හමු විය. ඔවුන්ගේ අදහස් ද විමසූහ.

වනජීවී හා වන සංරක්ෂණ ඉහළ නිලධාරීන්ගේ අදහස් විමසීය. වන සංරක්ෂණ නිලධාරීන් හා මාර්ග ව්‍යාපෘතියේ නියුක්ත වූ හමුදා ඉංජිනේරු බළකා නිලධාරීන් පෙන්වා දුන්නේ මේ මාර්ගය කිලෝමීටර් 18 ක් දුර වුවද එය සිංහරාජය මායිම ඇතුළෙන් මාර්ගය යන්නේ කිලෝමීටර් 1.2 ක පමණ සුළු දුරක් පමණක් බවයි. පාර අඩි 12 ට පුළුල් කරන්නේ නම් පමණක් එහි ඇති මග ගස් 38 ක් පමණක් ඉවත් කිරීමට සිදුව තිබෙන බව මෙහිදී අනාවරණය කෙරිණි.

ඒ අනුව ඒ සිංහරාජ මායිම් කොටස හැර අන් මාර්ග ප්‍රදේශය යළි පරිසර හිතකාමීව ප්‍රතිසංස්කරණයක් කිරීමට ජනපති උපදෙස් ලැබිණි. ගස් කැපීම ද නතර විය.

මේ අනුව ලංකාගම - දෙනියාය මාර්ගය පරිසර හිතකාමී මාර්ගයක් ලෙස නැවත ප්‍රතිසංස්කරණය කිරීමට ජනපති අනුමැතිය ලැබිණි.

පරිසරයට සිංහරාජයට කිසිම හානියක් නොවන පරිදි මේ මාර්ගය තෙමසක් ඇතුළත ඉදිකිරීමට යුද හමුදාවේ ඉංජිනේරු රෙජිමේන්තුවට බාර කර තිබේ. මෙහිදී ජනාධිපතිතුමා මේ තීරණය ගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ පාරම්පරික පවුල් 750 ක මූලික ගැටලුවක් විසඳීමට ය. ඒ පවුල්වලට ලොකු වගකීමක් ද ජනපති පවරා ඇත. ඒ අඩු ගණනේ පැළ 3 ක් වවා එය සිංහරාජයේ පැවැත්මට දායක කිරීම ය. එය ඔවුන් කරනු ඇතැයි අපි විශ්වාස කරමු. ඒ මක් නිසාද යත් ඔවුන්ට ජලය හා පිරිසුදු වාතය ලැබෙන්නේ මේ සිංහරාජය නිසා බව ඔවුන් පැහැදිලිව දන්නා බැවිනි. ඊට අමතරව විටින් විට සංචාරකයන් ගමට සේන්දු වන්නේත් මේ සුවිශේෂී සිංහරාජය නිසා බව ඒ අවට පදිංචි ජනතාව දනිති.

මාර්ග සංවර්ධන, වනජීවී සහ වන සංරක්ෂණ, පරිසර සහ අදාළ සියලු අමාත්‍යාංශ නිලධාරීන් සමඟ ප්‍රතිසංස්කරණය කෙරෙන මාර්ගය ජනපතිගේ නිරීක්ෂණයට ලක් කිරීමෙන් පසු එයට අවසර ලැබුණි.

මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ යුද හමුදාව පරිසර හිතකාමී ලෙස මාර්ග ප්‍රතිසංස්කරණය භාරව සිටියි. කි.මී. 18 ක දුර ප්‍රමාණය තෙමසක් තුළ නිම කිරීමට උපදෙස් දෙනු ලැබිණ. මාර්ගයේ ප්‍රතිසංස්කරණය නිමවීමෙන් පසු ලංකාගම සිට දෙනියායට යාමට ගතවූ පැය 04 කට ආසන්න කාලය විනාඩි 45 කට කෙටි වේ.

ප්‍රතිසංස්කරණයේදී රක්ෂිතයට හෝ පරිසර පද්ධතියට හෝ හානි නොවිය යුතු බව ජනාධිපතිතුමා තරයේ අවධාරණය කළේ ය.

ප්‍රතිසංස්කරණයෙන් පසු නෙළුව සිට දෙනියායට කුඩා ලංගම බස් රථයක් දෛනිකව ධාවනයට එක් කිරීමට ද තීරණය කෙරිණ.

ලංකාගම ග්‍රාමයේ වැල් පාලම වෙනුවට දිගින් අඩි 120 කින් සහ පළලින් අඩි 06 කින් යුත් පාලමක් ඉදිකිරීම ද සමගාමීව සිදු කෙරේ. වතුගල, ලංකාගම, නිල්වැල්ල, කොළොන්තොටුව, වාරුකන්දෙණිය සහ පිටදෙණිය ගම්මානවල දරුවන්ට පාසලට පැමිණීමට මෙතෙක් පැවැති බාධකය ඉන් ඉවත් කෙරේ.

පවුල් 700 ක් වෙසෙන ලංකාගම ප්‍රදේශයේ සෑම පවුලකටම පැළ 03 බැගින් නොමිලේ දී පැළ 2100 ක් වගා කර ඔවුන් විසින් ම රැකගෙන වන රක්ෂිතයට දායාද කිරීමට ජනාධිපතිතුමා උපදෙස් දුන්නේ ය.

සිංහරාජ වන රක්ෂිතය සහ පරිසර පද්ධතිය පාරම්පරිකව රැකගත් තමන්ට සිය මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට එරෙහිව පරිසරවේදීන් කණ්ඩායමක් කරුණු හරිහැටි නොදැන බලපෑම් කරන බව පවසමින් ප්‍රදේශවාසීහු දැඩි විරෝධය පළ කළහ.

මූලික ජීවන අවශ්‍යතා සපුරාගත නොහැකිව පීඩාවට පත්ව සිටින ප්‍රදේශවාසීන් වෙනුවෙන් මාර්ගයේ ප්‍රතිසංස්කරණයට ජනාධිපතිතුමා ගත් තීරණයට මහා සංඝරත්නය ආශිර්වාද කළහ. දැන් මේ ගැටලුව ජනපතිගේ පූර්ණ මැදිහත්වීමේ ජනපති නුවණැස අනුව විසඳී අවසන් ය. ලංකාගම අවට ජනතාවට දැන් පාර ලැබේ. නමුත් ඔවුන් තවදුරටත් සිංහරාජ අඩවිය සුරැකිය යුතුය. සිංහරාජය අවට පදිංචි ගම්මානවල ජනතාවට පාරක් අවශ්‍යය. නමුත් ඒ පාර හරහා ලංකාගම හා ඒ අවට සුන්දරත්වය නැරඹීමට එන අය වැඩිවීමට පුළුවන.

පොලිතින් වැනි දෑ ඔවුහු ලෝක උරුම සිංහරාජයේ තැන තැන දැමීමට පුළුවන. වෙනත් පරිසර හානි ද සිදුකිරීමට අවස්ථාව තිබේ. ඒ පිළිබඳ පළමු වගකීම ඇත්තේ මේ ගම්වල ජනතාවටයි. ජනපති මේ මාර්ගය ඉදිකිරීමට අවසර දී ඇත්තේ එහි පරිසරය වනසන්නට නොවන බව ජනතාව දැඩි ලෙස අවධාරණය කර ගත යුතු ය. ඒ අනුව කටයුතු කළ යුතු ය. ඒ අනුව මාර්ගයෙන් ප්‍රයෝජනය ගන්නා අතරම දෙපස බලහත්කාරයෙන් අල්ලා ගැනීම ගස් වැල් විනාශ කිරීම කටයුතු නොකළ යුතු ය. ඒ නිසා පාර හැදුණු පසු ගමට වැඩිපුර සංචාරකයන් ගෙන්වීම පාලනය කළ යුතුව ඇත. එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති කටයුත්තකි.

ඔවුන්ට තවත් යුතුකමක් ද ඇත. ඒ පාර ඉදිවුණු පසු යළිත් සිංහරාජයේ මායිම ස්ථිර ලෙසම සකස් කිරීමට ය.

මේ දිනවල සිංහරාජය හරහා පාරක් ඉදිවන බවට අසත්‍ය පතුරන ඇතැම් පරිසර සංවිධාන වලට ද බාර දිය යුතු කටයුත්තක් තිබේ. ඒ මේ ප්‍රදේශයට පැමිණ සිදුවන දේ බලා සිට මාර්ගය ඉදිවන විට සිංහරාජයට බලපෑම් තිබේ නම් එය නිවැරැදි කිරීමට කටයුතු කිරීම ය.

සාමාන්‍යයෙන් අපේ රටේ පරිසර සංවිධානවල විරෝධතා පවතින්නේ අදාළ ව්‍යාපෘතිය ආරම්භ වන තෙක් පමණි. පසුගිය කාලයේ සිදුවූ ඉහළ කොත්මලේ නොරොච්චෝලේ බලාගාර මෙන්ම කණ්ඩලම හෝටලය වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන කාලයේ ඔවුහු කැගැසූහ.

පසුව ඔවුහු නිශ්ශබ්ද වූහ. නමුත් දැන් ඔවුන් කළ යුත්තේ මේ සිංහරාජය පාර ඉදිවන අයුරු අධීක්ෂණය කර ඒ ඉදිකිරීම් පරිසර හිතකාමී දැයි පරීක්ෂණ කිරීමයි. ජනපති අවධාරණය කළේ සිංහරාජයට කිසිම හානියක් සිදු නොවන පරිදි පරිසර හිතකාමීව අදාළ මාර්ගය ඉදිකරන ලෙසයි. ඒ අනුව කටයුතු නොකරන අවස්ථා පිළිබඳව ජනාධිපති කාර්යාලයට දැනුම් දීමට වුවද රාජ්‍ය නොවන පරිසර සංවිධානවලට පුළුවන. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් පවසන පරිදී නව මාර්ගය සිංහරාජ මායිමේ යන කොටස පුළුල් කර ඉදි වූවත් විනාශ වන්නේ සිංහරාජයේ මහ ගස් 38 කි. නමුත් දැන් සිදුවන්නේ ඒවාත් සුරකිමින් කරන මාර්ග ව්‍යාපෘතියකි. මහවැලි ව්‍යාපාරය, මොරගහකන්ද යාන් ඔය යන ව්‍යාපෘතිවලට මෙරට වනාන්තර අක්කර දස දහස් ගණන් විනාශ වී ඇත. නමුත් ඒ ව්‍යාපෘති මගින් ලැබෙන ජල විදුලිය නැත්නම් අපි හැමදාම අඳුරේ ය.



ලංකාගම ඉදිවෙන මාර්ගය

සිංහරාජය සුරකින්න ලංකාගම පවුල් 750ටම පැළ සිටුවන්න ආරාධනා

අලුත් මාර්ගය හරිත මාර්ගයක් කරන්න පරිසර සංවිධාන උදව් කළ යුතුයි

ලංකාගම පාසල් සිසුන් ගිං ගඟ තරණය කරමින් පාසල් යන අයුරු

ලංකාගම වැල් පාලම වෙනුවට අඩි 6 ක් පළල අලුත් පාලමක්

අතීතයේ පරිසර සංවිධාන විරෝධය පළ කළ සුවිශේෂ අවස්ථාවක් වූයේ දඹුල්ල කණ්ඩලම හෝටලය ඉදිකිරීමේ අවස්ථාවයි. හෝටලය ඉදි කළ විට වැවේ ජලය අඩු වී ගොවිතැන කරන්නට බැරි වෙන බවත් වැවට අපද්‍රව්‍ය එන බවටත් ලොකු උද්ඝෝෂණ ඒ දිනවල දඹුල්ල අවට පැවැත්විණි. ඒ ප්‍රදේශයේ ආගමික නායකයෝ ද මේ විරෝධතාවලට නායකත්වය දුන්හ. නමුත් ඒ හෝටලය ඉදිවූයේ උපරිම ලෙස පරිසර හිතකාමීවය. අද හෝටලය වටේට වනාන්තරය වවා ඇත. පැත්තකින් බැලූ විට එහි හෝටලයක් පෙනෙන්නේ නැත. පෙනෙන්නේ කැළයක් පමණි. ඒ නිසාම පරිසර හිතකාමී හෝටලයක් ලෙස එයට සම්මාන පවා ලැබිණි. සිංහරාජ මාර්ගය ඉදිකිරීමට ද මෙය පාඩමක් ලෙස ගත හැකිව තිබේ.

එමෙන්ම අද අපේ රට පත්වී ඇති ආර්ථික ගැටලු හමුවේ අපේ රටේ ගම්මාන දියුණු කිරීමට ගමත් වෙළෙඳ පොළත් එක් කළ යුතුව ඇත. ඊට මේ මහාමාර්ග අත්‍යවශ්‍ය වේ. ඒ මගින් රටේ ආර්ථිකයට ලැබෙන පිටුබලය ඉමහත් ය.

මේ සියලු කරුණු අනුව අපට කිව හැක්කේ ජනපති ගේ නුවණැස ඔස්සේ ලංකාගම අවට ගම්වල අයට ලැබුණු මේ පරිසර හිතකාමී මාර්ගය හරිත මාර්ගයක් කිරීමටත් තිරසර ලෙස කළමනාකරණය කිරීමටත් ඔවුන් මෙන් ම පරිසරයට හිතැති සියලු දෙනා එක්වී කටයුතු කළ යුතු බවයි.

ඇතැම් පරිසර සංවිධාන ලංකාගම මිනිසුන් විඳින දුෂ්කරතා ගැන කතා කරන්නේ නැහැ. මේ ගමේ අය ගත කරන්නේ කටුක ජීවිතයක්. යන්න එන්න පාරක් නැහැ. රෝගියෙක් රෝහලට ගෙනි යන්න සැතපුම් 18 ක් පමණ දුර යන්න ඕනෑ. ඇතැම් මාධ්‍ය හා පරිසර සංවිධාන සිංහරාජය හරහා පාරක් කපන බවට අසත්‍ය ප්‍රචාර ගෙනියනවා. මේ ඉදිකරන මාර්ගයෙන් සිංහරාජයට කිසිදු හානියක් සිදු වන්නේ නැහැ. සිංහරාජයට මේ ගමේ කිසිවෙකුත් හානියක් කර නැහැ. ලංකාගම ගැමියන් විඳින කටුක ජීවිතය දෙස යහපත් ආකල්පයකින් බලනවා නම් එය ඉතා වැදගත්.

ලංකාගම පදිංචි සම්පත් සංජීව

ලංකාගම ප්‍රතිසංස්කරණය කරන මේ පාර පැරණි පාරක්. මෙය 1970-1977 කාලයේ නෙළුවේ සිට රක්වාන දක්වා ලංකාගම හරහා සකස් කළ එකක්. අපි ඉල්ලා සිටින්නේ මේ පාර අපිට සකස් කර දෙන ලෙසයි.

ලංකාගම පදිංචි සුමිත් චන්දන

ඡායාරූප - නෙළුව පියරත්න ජයවික්‍රම

ආනයනය අත්හිටුවීමෙන් වාහන වෙළෙඳපොළ අර්බුදයක

● චන්දිමා එදිරිමාන්න

මෝටර් වාහන ආනයනය අත්හිටුවීම සඳහා රජය ගෙන ඇති තීරණයට අනුව වාහන ආනයනය අත්හිටුවීමේ කාල සීමාව පිළිබඳව පැහැදිලි මග පෙන්වීමක් ලබා දෙන ලෙසට බලයලත් දේශීය අලෙවි නියෝජිතවරුන් මගින් ජාත්‍යන්තර වාහන නිෂ්පාදකයන් හා සෘජු සබඳතා පවත්වන ශ්‍රී ලංකාවේ එකම වාහන ව්‍යාපාරික සංගමය වන, සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමය (CMTA), විසින් රජයෙන් ඉල්ලීමක් කර තිබේ. එසේම රජයේ රෙගුලාසිවලට අනුකූලව, ලියාපදිංචි වාහන ව්‍යාපාරිකයන් මගින් පමණක් වාහන මෙරටට ආනයනය කිරීමේ අවශ්‍යතාවයද එම සංගමය විසින් අවධාරණය කර ඇත.දිවයින පුරා 20,000 කට වැඩි පිරිසකට සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් සැපයූ මෝටර් රථ ක්ෂේත්‍රයේ ව්‍යාපාරික ආයතන රැසක එකමුතුවක් වන සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමයේ එකී සාමාජිකයන් අතර ජාත්‍යන්තර සන්නාමවල මෝටර් රථ, වෙළෙඳ වාහන, යතුරු පැදි හා ත්‍රිරෝද රථ මෙන්ම ටයර් සහ ලිහිසි තෙල් ආනයනය කරන සහ අලෙවි කරන අලෙවි නියෝජිතවරුන් විශාල පිරිසක් වෙති.

සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමයේ සභාපති යසේන්ද්‍ර අමරසිංහ

සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමයේ ජ්‍යේෂ්ඨ උප සභාපති නිරංග පීරිස්

මෙලෙස මෝටර් රථ වාහන ආනයනය අත් හිටුවීම සඳහා රජය විසින් ගෙන ඇති තීරණය සමඟ මෝටර් රථ වාහන අලෙවි ක්ෂේත්‍රය තුළ මේ වන විට මතු වී තිබෙන වාතාවරණය පිළිබඳව වාහන අලෙවිකරුවන් මෙන්ම ආනයනකරුවන්ද දැඩි කනස්සල්ලට පත්ව තිබේ. මේ පිළිබඳව අදහස් දක්වමින් සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමයෙහි සභාපති යසේන්ද්‍ර අමරසිංහ මහතා සඳහන් කළේ මෙලෙස වාහන ආනයනය අත් හිටුවීම ශ්‍රී ලාංකිකයන් දහස් ගණනකට අහිතකර ලෙස බල පා ඇති බවයි. වාහන ව්‍යාපාරිකයන්ට හා ජනතාවට තමන්ගේ කටයුතු කල්තියා සැලසුම් කළ හැකි පරිදි එම අත්හිටුවීම ඉවත් කරන්නේ කවදාදැයි දැනුම් දීම රජයේ වගකීමක් හැටියට තම සංගමය විශ්වාස කරන බවද යසේන්ද්‍ර අමරසිංහ සඳහන් කළේය.

එපමණක් නොව දැනට වාහන ආනයනය නොකිරීම නිසා නොබෝ කලකින්ම දැනට රට තුළ ඇති වාහන තොග අවසන් වී වාහන අලෙවි ව්‍යාපාරිකයන්ට ස්ථිර වශයෙන්ම සිය ආදායම් මාර්ග අහිමි වී යා හැකි බවද පෙන්වා දෙන අමරසිංහ මහතා ආනයන අත් හිටුවීම ඉවත් කිරීම සඳහා මාස කිහිපයක් ගත වන්නේ නම්, ව්‍යාපාරිකයන් හට සිය සේවක හා නඩත්තු වියදම් පියවා ගත හැකි පරිදි ප්‍රමාණවත් සහය ලබා දෙන ලෙසටද රජයෙන් ඉල්ලීමක් කළේය.

"සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමය (CMTA) ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තරය අතර, වාහන නිෂ්පාදකයන් සම්බන්ධ කරන පාලම ලෙස ක්‍රියා කරමින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා. 2019 වසරේදී සංගමය, ශ්‍රී ලංකාවේ අනාගත ප්‍රවාහන සැලැස්මක් ඇතුළත් ප්‍රතිපත්ති නිර්දේශ ලේඛනයක් සකස් කිරීම ඇරඹුවා. එය සකස් කිරීම සඳහා අප සංගමය, ජාත්‍යන්තර ව්‍යවහාරික පර්යේෂණ ආයතන සමග කටයුතු කරමින් සිටින අතර එය අවසන් වූ සැණින් රජයට ඉදිරිපත් කිරීම සංගමයේ බලාපොරොත්තුවයි.

ඒ වගේම වාහන කර්මාන්තය ඉහළ මට්ටමකට ගෙන යාම සඳහා අවශ්‍ය රෙගුලාසි හඳුන්වා දීමට රජය කටයුතු කළ යුතු බවද මේ වන විටත් අප බලධාරීන් හමුවේ අවධාරණය කර තිබෙනවා."

මේ වන විට රටේ ආර්ථිකයට මෙන්ම, විදේශීය සංචිත පවත්වා ගැනීමට ඇති අභියෝග සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමය ඉතා මැනවින් අවබෝධ කර ගෙන ඇති අතර ක්ෂේත්‍රය තුළ දැනට මතු වෙමින් තිබෙන අභියෝගාත්මක වාතාවරණය හමුවේ රැකියා කප්පාදුව අවම කිරීමට හා වැටුප් අඩුකිරීම් අවම කිරීමට සංගමයේ සාමාජිකයින් උපරිම උත්සාහ දරමින් සිටිති. එහෙත් සංගමයේ ප්‍රමුඛතම සාමාජිකයන් පිරිසක් වන වාහන ව්‍යාපාරිකයන් හට සිය වෘත්තීය පැවැත්ම සඳහා ගත හැකි අන් කිසිදු පියවරක් නොමැති බැවින් ඉදිරියේදී දැඩි ක්‍රියාමාර්ග රැසක් ගැනීමට සිදු වනු ඇතැයි මත පළ වී තිබේ.

බලයලත් නියෝජිතයන් වශයෙන් අප සමාගම් පිටරටින් ගෙන්වන්නේ අපේ රටට ගැළපෙන සුදුසු වාහන පමණයි. අලුත් වාහනයක් නිෂ්පාදනය කරන්න මාස 4ක පමණ කාලයක් වැය වෙනවා. අපේ ඉල්ලුම අනුව විදේශයන් විසින් නිෂ්පාදනය කරනු ලබන වාහන නිසි කලට ගෙන්වා ගැනීමේ ගැටලුව වාහන ආනයනය අත්හිටුවීම සඳහා රජය ගෙන ඇති තීරණය සමග දැන් මතුව තිබෙනවා.

සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමයේ ජ්‍යේෂ්ඨ උප සභාපති නිරංග පීරිස් මහතාද ඇති වී ඇති අර්බුදය පිළිබඳව සිය අදහස් දැක්වූ අතර වාහන ආනයනය නියාමනය කිරීමට රජය පියවර ගත යුතු බව තම විශ්වාසය වුවත් වාහන ආනයනය කිරීමේ ගුණාත්මකභාවය හා ප්‍රමාණය පාලනය කිරීම සඳහා වාහන ව්‍යාපාරිකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් රජය විසින් ක්‍රියාත්මක කළ යුතු බවට ඔහු අවධාරණය කළේය.

වාහන ව්‍යාපාරිකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ලොව සෑම රටක්ම පාහේ අනුගමනය කරන ක්‍රමවේදයක් වන අතර, එමගින් පාරිභෝගිකයන්ට විශ්වාසවන්ත ආයතනයක් මගින් වාහනයක් මිල දී ගැනීමට හැකි බවද නිරංග පීරිස් මහතා සඳහන් කළ අතර මේ වන විට, වාහන ආනයනයෙන් 30% ක් පමණ මෙරටට ගෙන්වන්නේ ජාත්‍යන්තර වාහන නිෂ්පාදන සමාගම්වල බලයලත් දේශීය අලෙවි නියෝජිතවරුන් මගින් බවද ඔහු පැවසීය.. වාහන ආනයන රෙගුලාසි, ක්ෂේත්‍රයට හඳුන්වා දීමෙන් ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමටත් වාහන අලෙවි ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමටත් හැකි වන අතර, විදෙස් විනිමය ගලා යාමද සැලකිය යුතු ලෙස අවම කිරීමට රජයට හැකි වන බවත් හෙතෙම පෙන්වා දුන්නේය.

"බලයලත් නියෝජිතයන් වශයෙන් අප සමාගම් පිටරටින් ගෙන්වන්නේ අපේ රටට ගැලපෙන සුදුසු වාහන පමණයි. අලුත් වාහනයක් නිෂ්පාදනය කරන්න මාස 4ක පමණ කාලයක් වැය වෙනවා. අපේ ඉල්ලුම අනුව විදේශයන් විසින් නිෂ්පාදනය කරනු ලබන වාහන නිසි කලට ගෙන්වා ගැනීමේ ගැටලුව අවම කිරීමට රජය කටයුතු කළ යුතු බව මේ වන විටත් අප බලධාරීන් හමුවේ අවධාරණය කර තිබෙනවා. මේ නිසා වාහන රඳවා තබා ගැනීමේ ගාස්තුත් ගෙවන්න සිදු වෙලා."

වාහන ආනයනය අත් හිටුවීම සඳහා රජය විසින් ගනු ලැබූ තීරණය පිළිබඳව තවදුරටත් අවධානය යොමු කර දිගුකාලීන දැක්මක් යටතේ වාහන ආනයනය නියාමනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා වාහන ව්‍යාපාරිකයින් මෙන්ම ආනයනකරුවන්ද රැක ගැනීමට බලධාරීන් නොපමාව කටයුතු කළ යුතු බවද සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමයේ ජ්‍යේෂ්ඨ උප සභාපති නිරංග පීරිස් මහතා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

පැපිලියවල පස් නිවුන් දරුවන්ගේ සැඟවුණු කතාව

● හර්ෂා සුගතදාස

පැපිලියවල ගනිහිගම පදිංචි ප්‍රියදර්ශන ලියනආරච්චිටත් රසාංජලි ජයවර්ධනටත් පසුගිය අගෝස්තු 31 වැනි දිනය ජීවිතයේ වටිනා දිනයක් විය. ඒ, ඔවුන් දෙපළ විවාහ ප්‍රාප්ත වී එදිනට වසර 3ක් සම්පූර්ණ වන නිසාය. එහෙත් මෙවර ඔවුන්ට ඔවුන්ගේ තෙවැනි විවාහ සංවත්සර දිනයේ වටිනාකම පස් ගුණයකින් පමණ වැඩි වී ඉතාමත් සුවිශේෂී දවසක් බවට පත් වූයේ මෙම යුවළ ඊට තෙදිනකට පෙර (28 වැනිදා) බිලිඳියන් පස් දෙනකුගේ මවුපියන් බවට පත් වූ බැවිනි. පසුගිය සිකුරාදා ඔවුන්ට මවුපිය පදවිය උරුම වූයේ එදින සිදු වූ පස් නිවුන් දරු උපතත් සමඟය.

දරුවන්ගේ මව රසාංජලී හා පියා ප්‍රියදර්ශන විවාහ දිනයේදී

තෙවැනි විවාහ සංවත්සරයට ලැබුණු තෑග්ග

අපි රුවන්මැලිසෑයට බාරවෙලා දරුවෝ ගොඩක් ඉල්ලුවා

කොළඹ ද සොයිසා කාන්තා රෝහලේ බිහි වූ පස් නිවුන් දැරියන් මේ වන විට සිටින්නේ එම රෝහලේ නොමේරූ ළදරු ඒකකයේ ය. දැරියන්ගේ මව වන 29 හැවිරිදි රසාංජලි ජයවර්ධන රෝහලේ දැඩි සත්කාර ඒකකයේ නේවාසිකව පසුවෙයි. එක්වරම දියණියන් පස්දෙනකුගේ වගකීම් කර පින්නා ගත් පියා වන ප්‍රියදර්ශන ලියනආරච්චි අපට හමුවූයේ එහිදීය.

"මම පූගොඩ නගරයේ පොඩි සපත්තු සාප්පුවක් කරන කෙනෙක්. මගේ බිරිඳ ගුරුවරියක්. එයාට ගුරු පත්වීම ලැබුණේ අපි විවාහ වුණ අලුතමයි. මුලින්ම පත්වීම ලැබුණේ වව්නියාවේ ගාමිණී විද්‍යාලයට. ඒ කාලේ රසාංජලිට දරු ගැබක් තිබුණා. ඒත් දුෂ්කරය පසුව දරුගැබ නැති වුණා. අපේ කුළුඳුල් දරුවා අහිමි වීම ගැන අපි දෙදෙනාම ගොඩාක් දුකින් හිටියේ. ඒ නිසාම අපි දරුවන් ප්‍රාර්ථනා කරලා රුවන්මැලිසෑයට බාරහාර වුණා. මම නම් දෙවියන්ගෙන් ඉල්ලුවෙම දරුවෙක් නෙමෙයි, දරුවො ගොඩාක්. ඒ නිසාම වෙන්න ඇති මට එකපාරටම දරුවන් පස්දෙනෙක් ලැබුණා." යනුවෙන් පැවසුවේ දරුවන්ගේ පියා ප්‍රියදර්ශන ය.

කිරිකැටියකුගේ සිහිනය සැබෑ කර ගැනීමට ඔවුහු නොවිඳිනා දුක් කන්දරාවකට මුහුණ දුන්හ. ප්‍රථමයෙන්ම සිදු කළේ වව්නියාවේ සිට පූගොඩ ප්‍රදේශයේ පාසලකට මාරුවීමක් ලබා ගැනීමට උත්සාහ කිරීමයි. එහෙත් රසාංජලිට මාරුවීමක් ලැබුණේ පූගොඩ කිට්ටු පාසලකට නොවේ. මීගමුවේ හෝලි රෝසරි පාසලට ය. ඉන් සැනසුණු රසාංජලිත් ප්‍රියදර්ශනත් අනතුරුව, දරුවකු ගැන සිතන්නට වූහ. මේ අතරවාරයේ දී රසාංජලි ගැබ් ගත්තේ ඔවුන්ගේ බලාපොරොත්තු මල්ඵල ගන්වමිනි. එහෙත් ඇයට පෙබරවාරි මාසයේ සිට පාසල් යෑමටවත් හැකි වූයේ නැත. ඊට හේතුව ඇයට දවසකට 15 වතාවක් පමණ වමනය යෑමයි. ප්‍රියදර්ශන සඳහන් කරන්නේ එම කාලයේ රසාංජලි කිසිවක් ගැන හරිහැටි අවබෝධයක්, නින්වක් නැතිව මිය ගිය අයකු සේ කාලය ගත කළ බවයි. රාගම රෝහලේ ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරයකු හමුවීමට ඔවුන් තීරණය කළේ පෙර අත්විඳි අභාග්‍ය සම්පන්න අත්දැකීම නිසාමය.

"මේ කාලයේදි තමයි ස්කෑන් කරලා දැන ගත්තේ දරුවන් හතරදෙනෙක් ලැබෙන්න ඉන්නවා කියලා. පස්සෙ තමයි දරුවෝ පස්දෙනෙක් සිටින බව කිව්වෙ. ඒ වෙලාවේ රසාංජලීව පරීක්ෂා කරපු වෛද්‍යවරයා කිව්වා දරුවෝ පස්දෙනෙක් බිහි කිරීම භාරදූර කාර්යයක්, දරුවන් කුස තුළ දරාගෙන සිටීමෙන් මව ගොඩාක් දුර්වල වෙනවා. අම්මාගේ ජීවිතයට වුණත් අනතුරක් වෙන්න පුළුවන් කියලා. ඒක අහලා ඇත්තටම මමත් භය වුණා. දරුවෝ වටිනවා වුණාට දරුවන්ගේ අම්මාව ඊට වඩා වටිනවානේ. ඒ වෛද්‍යවරයා කිව්වා දරුවො පස්දෙනාගෙන් දෙදෙනකුව අයින් කරන්න කියලා. ලංකාවේ එය නොකරන නිසා ඉන්දියාවේ ගිහින් කරන්න කිව්වා. අපි දෙදෙනාට මුකුත්ම හිතා ගන්න බැරි වුණා. මගේ අයියාගේ බිරිඳත් වෛද්‍යවරියක්. එයාගෙනුත් ඇහුවා. මගේ යාළුවෙකු ඉන්නවා මිලාන් කියලා කරාපිටිය රෝහලේ වෛද්‍යවරයෙක්. මම එයාටත් විස්තරය කිව්වා. මිලාන් මට කිව්වා සොයිසා රෝහලේ මහාචාර්ය ඒකකයේ ප්‍රධානි මහාචාර්ය අතුල කළුආරච්චි වෛද්‍යවරයා හම්බ වෙන්න කියලා. ඊටපස්සේ අපි අතුල කළුආරච්චි විශේෂඥ වෛද්‍යවරයාව හම්බ වෙන්න ගියා." යනුවෙන් ප්‍රියදර්ශන ලියනආරච්චි විස්තර කළේය.

මේ වන විට මාර්තු මාසයට එළැඹී තිබිණි. කොරෝනා වසංගතය හේතුවෙන් රටම වසා දැමූ කාලය විය. ඉන්දියාවේ යෑමට තබා කොළඹට යෑමටවත් නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබිණි. මහාචාර්ය අතුල කළුආරච්චි ඔවුන්ට පැවසුවේ දෛවය විසින් ලබා දී ඇති අභියෝගයට මුහුණදෙන ලෙසටයි. රසාංජලිට ද සොයිසා කාන්තා රෝහලේ සායනයට පැමිණෙන ලෙසට උපදෙස් ලැබිණි. කොළඹ ද සොයිසා කාන්තා රෝහලේ මහාචාර්ය ඒකකය මහාචාර්ය අතුල කළුආරච්චි, ප්‍රබෝධන රණවීර, අසංක ජයවර්ධන, චන්දන ජයසූරිය ඇතුළු ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන් පස්දෙනකුගේ අධීක්ෂණය පවතින ඒකකයකි. රසාංජලිගේ බිය සැක පහව ගොස් දිරිමත් සිතින් මුහුණදීමට ශක්තිය ලැබුණේ එමනිසාය.

දරුවන්ගේ මිත්තනිය

අප්‍රේල් මාසයේදී රසාංජලිට බඩේ කැක්කුමක් ඇති විය. වහාම ක්‍රියාත්මක වූ ප්‍රියදර්ශන ඇයව ද සොයිසා කාන්තා රෝහලට ඇතුළත් කළේ අවදානමක් ගත නොහැකි නිසාය. ස්කෑන් පරීක්ෂණයක් කර, ගර්භයට හානියක් නොමැති බව තහවුරු කර ගනු ලැබූවද ඇයව සතියක් පමණ රෝහල්ගත කර තිබුණත් ඇගේ බඩේ කැක්කුම අඩු වූයේ නැත. ඉන්පසුව වෛද්‍යවරුන්ගේ තීරණය වූයේ උදරය විවෘත කර පරීක්ෂා කළ යුතු බවයි. එය ඉතා ප්‍රවේශමෙන් හා දැඩි අවධානයෙන් සිදු කළ යුතු සැත්කමකි. වෛද්‍යවරු එය ඉතා සාර්ථකව සිදු කළහ. දරුවන් පස්දෙනකු කුස තුළ හොවාගෙන සිටින රසාංජලි නිරතුරුවම වෛද්‍යවරුන්ගේ විශේෂ අවධානයට ලක්විය යුතු බැවින් කුසට සති 18 සම්පූර්ණ වූ දා සිට ඇයව රෝහල්ගත කිරීමට වෛද්‍යවරුන් විසින් තීරණය කෙරිණි. එහෙත් එය ඇයට මානසික පීඩාවක් විය හැකි බැවින් විටින් විට නිවසට ගොස් ආපසු පැමිණීමට ඉඩ ප්‍රස්තා ලබා දී තිබිණි.

"මහාචාර්ය ඒකකයේ දෙවැනියා විදිහට හිටියේ විශේෂඥ වෛද්‍ය ප්‍රබෝධන රණවීර. ඒ වෛද්‍යවරයා රසාංජලිව සැහැල්ලුවෙන් තබා ගන්න එයාගේ බය නැති කළා. එයාත් සැහැල්ලුවෙන් සිටින බව පෙන්නුවා. ඒ වගේම වෛද්‍යවරුන් රසාංජලිට ඇවිදින්න දුන්නේ නැහැ. රෝද පුටුවෙ තියාගෙන උපස්ථායකවරියන් තල්ලු කරගෙන ගියේ. රසාංජලි දරුවන් පස් දෙනෙකු කුස තුළ තබාගෙන පුදුම දුකක් වින්දේ. උදරය විශාල නිසා හැරෙන්න පෙරළෙන්න බැහැ. මට කරන්න තිබුණේ දෙවියන්ට කියන එක තමයි. මම මගේ අතින් ම කිරිපිඬු උයාගෙන හැමදාම කැලණි විහාරයට ඇවිත් කිරි ආහාර පූජා කළා. දවස් 200 ගණනක් බෝධි පූජා තිබ්බා. කිරි වෙහෙරට කප්රුකක් පූජා කළා. මම පින්දහම් කරන විට රසාංජලිත් වේදනාවක්, බියක් නැතිව සිනාමුසුව හිටියේ ඒ ගැන එයාටත් විශ්වාසයක් තිබුණු නිසා." යනුවෙන් තවදුරටත් අදහස් පළ කළේ ප්‍රියදර්ශන ලියනආරච්චි ය.

මහාචාර්ය
අතුල කළුආරච්චි

විශේෂඥ වෛද්‍ය
ප්‍රබෝධන රණවීර

අගෝස්තු 28 වැනි සිකුරාදා පෙරවරුවේ එම අසිරිමත් මොහොත උදාවිය. මහාචාර්ය ඒකකය හෙවත් 3 වැනි වාට්ටුව වෙනුවෙන් විශේෂඥ වෛද්‍ය ප්‍රබෝධන රණවීර, වෛද්‍ය මොහොමඩ් රිෂාඩ් ද සොයිසා කාන්තා රෝහලේ පස් නිවුන් දරු උපත සාර්ථකව සිදු කළහ. මෙම සිසේරියන් සැත්කමට නිර්වින්දන විශේෂඥ වෛද්‍ය සරෝජා ජයසිංහ, නොමේරූ ළදරු ඒකකයේ නව ජන්ම විශේෂඥ වෛද්‍ය නිශානි ලූකස් සහ නලීන් ගමමිතිගේ ඇතුළු හෙද කාර්යය මණ්ඩලය දායක වූහ. විනාඩි 5ක් ඇතුළත බිහිවූ බිලිඳියන් පස්දෙනාගේ බර කිලෝ ග්‍රෑම් 1ට වඩා වැඩි විය. එහෙත් කිලෝග්‍රෑම් 2ට අඩු විය. බිලිඳියන් පස්දෙනා නිරෝගීව උපත ලැබූවත් නොමේරූ ළදරු ඒකකයේ රඳවා සිටින්නේ නිරන්තරයෙන් වෛද්‍යවරුන්ගේ අවධානය බිලිඳියන්ට ලැබිය යුතු නිසාය. මව ද අධික රුධිර වහනය හේතුවෙන් දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබයි. මව සහ දරුවන් පස්දෙනා සාමාන්‍ය වාට්ටුවකට දමන තෙක් ප්‍රියදර්ශන දැරියන්ගේ ජන්ම පත්‍ර සකස් කිරීම කල් දමා තිබේ. ජන්ම පත්‍ර සෑදීම, නම් තැබීම සිදු කෙරෙන්නේ ඊට පසුවය. දියණියන් පස්දෙනකුගේ පියකු වූ ප්‍රියදර්ශන ලියනආරච්චි දැන් සූදානම් වන්නේ නිවසට රැගෙන ආ පසුව කිරිකැටියන් සිය කාමරයේ තබා ගැනීම පිළිබඳවය. ඒ සඳහා නිදන කාමර 2ක් මැද ඇති බිත්තිය කඩා එක් නිදන කාමරයක් වශයෙන් පිළියෙල කර තිබේ.

"දරුවන් පස්දෙනෙක් හදන එක ලොකු අභියෝගයක් තමයි. ඒක මම හොඳින් තේරුම් අරගෙන සතුටින් මුහුණ දෙනවා. මට තියෙන ලොකුම ප්‍රශ්නය තමයි බබාලා පස්දෙනාව රැක බලා ගැනීමට වැඩිහිටි ඥාතින් නොමැති වීම. මගේ අම්මා තාත්තා දෙන්නාම නැහැ. රසාංජලිගේ අම්මා විතරයි ඉන්නේ. දරුවන්ව වඩා ගන්න, කවන්න, නාවන්න වැඩිහිටි ඥාති කෙනෙක් ඉන්නම ඕනෑ. එක්කෙනෙකුට විතරක් දරුවො පස්දෙනෙක් බලා ගන්න බැහැනේ." ප්‍රියදර්ශන තමුන් හමුවේ ඇති ලොකුම ගැටලුව ගෙනහැර පෑවේ එලෙසිනි.

ප්‍රියදර්ශන ලියනආරච්චි සහ රසාංජලි ජයවර්ධන වසරක පමණ කාලයක් ඇසුරු කර දෙපාර්ශ්වයේ ආශීර්වාදය මැද විවාහප්‍රාප්ත වූ යුවළකි. ඔවුන්ගේ ප්‍රේම සම්බන්ධතාව වසරකට සීමා වුවද ඔවුන් දැන හඳුනා ගැනෙන්නේ කුඩා වියේ පටන්ය.

"මට කාගෙන්වත් උදව් ඉල්ලන්න බැහැ. දරුවො ලැබුණේ මගේ වුවමනාවට. කවුරු හරි මට උදව් කළාට කමක් නැහැ. මම එපා කියන්නේ නැහැ. මම මගේ උපරිම ශක්තියෙන් දරුවො පස්දෙනා රැක බලා ගන්නවා." යනුවෙන් ප්‍රියදර්ශන ලියනආරච්චි තිර අදිටනින් පැවසුවේ ලංකාවේ සිවුවැනි පස් නිවුන් දරු උපතේ වාසනාවන්ත පියා වීමේ උද්දාමයෙනි.

මහනුවර භූ කම්පන ලොකු ආපදාවක පෙර නිමිත්තක්?

● නිහාල් පී. අබේසිංහ

ලීට වසර 25කට පෙර 1995 ජූනි 20 වැනි දින වික්ටෝරියා ජලාශය අසල රිච්ටර් මාපකයේ 5 තරම්වූ භූමි කම්පාවක් ඇතිවිය. ඒ පිළිබඳව එකල ජීවත්ව සිටි පේරාදෙණිය සරසවියේ හිටපු උපකුලපති හා භූ විද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා වූ පී.ඩබ්. විතානගේ මහතා දැඩි අවධානය යොමු කළේය.

"කිඹුලන්තොට සිට වික්ටෝරියා වේල්ලේ හතරවැනි කොටස හරහා දිගන වත්තේගම දක්වා කිලෝමීටර් 20ක් පමණ දුරට භූ විද්‍යාත්මක පැල්මක් තිබෙනවා. ඒ නිසා වික්ටෝරියා ජලාශය ඔතන ඉදිකිරීම පිළිබඳව අපි විරුද්ධ වුණා. නමුත් ජලාශය හා වේල්ල මෙහිම ඉදිකළ නිසා මේ ප්‍රදේශයේ නිතර භූ කම්පන සිදුවන්න පුළුවන්.

වික්ටෝරියා ජලාශය හා වේල්ල සුරක්ෂිතයි බයක් ඇති කර ගන්න එපා

- මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ එස්.කේ.ආර්. අරුප්පොළ

"අනාගතයේදී මේ ප්‍රදේශයේ සිදුවන භූ චලනයකදී මේ ගැඹුරු පැල්ම දිගේ යම් චලනයක් සිදු වුවහොත් වික්ටෝරියා වේල්ලට හා ඉන් පහළ ඇති රන්ටැඹේ හා රන්දෙනිගල වේලි වලටත් හානි සිදුවිය හැකියි." මහාචාර්ය විතානගේ මහතා අප සමඟ පැවසුවේ 1995 ජූනි 21 වැනිදා ඒ භූමිකම්පාව පිළිබඳව විමසූ අවස්ථාවේදිය.

එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් මහනුවර දළදා මාළිගාවේ බෝම්බ ගැසූ මොහොතේ ඇතිවූ බලවත් කම්පනයකින් අප හැර ගිය මේ මහාචාර්යවරයා මේ පැල්ම පිළිබඳව අනතුරු ඇඟවූයේ දැනට වසර 25කට පෙරය.

මේ කරුණු අපට මතකයට ආවේ පසුගිය 29 රාත්‍රි හා සැප්තැම්බර් 2 උදේ මහනුවර ප්‍රදේශයේ සිදුවූ භූ කම්පන පිළිබඳව අවධානය යොමු කිරීමේදිය.

අගෝස්තු මස 29 වැනි දා පස්වරු 8.30ට හා 2 වැනිදා පෙරවරු 7.06ට මහනුවර ප්‍රදේශයේ ප්‍රධාන භූ කම්පන දෙකක් සිදුවිය. ඊට අමතරව 29 වැනිදා පස්වරු 2.17ට හා පස්වරු 6.10ට එම ප්‍රදේශයේ තවත් සුළු භූ කම්පන දෙකක් වාර්තා වී ඇත.

29 වැනිදා ඇතිවූ භූ කම්පනය තලාතුඔය අඹකොටේ, අලුත්වත්ත දිගන ගුරුදෙනිය හාරගම අනුරගම මයිලපිටිය කුණ්ඩසාලේ පල්ලේකැලේ ප්‍රදේශවලට ඇතිවී ඇත.

2 වැනිදා පෙරවරු 7.07ට සිදුවූ භූ කම්පනය වැඩිපුර දැනී ඇත්තේ අඹකොටේ අලුත්වත්ත දිගන වැනි ප්‍රදේශවලටය. 2 වැනිදා සිදුවූ භූ කම්පන පල්ලෙකැලේ භූ විද්‍යා මධ්‍යස්ථානය භූ කම්පන මානයේ හා අනුරාධපුර මහකනදරාව භූ කම්පන මානයේ සටහන් වී ඇති බව භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය පවසයි.

"පොළොවේ ඇතිවෙලා තිබෙන තෙරපුමක් සුළු වශයෙන් එළියට ඇවිත්. වික්ටෝරියා ජලාශේ වතුර මට්ටමේ සුළු වෙනස්කම් දක්නට ලැබී තිබෙනවා. එහි ජලය බුබුළු දමා තිබෙනවා. මේ ප්‍රදේශයේ විශාල ලෙස හුණුගල් කැණීම් කරනවා. ඒවායින් මේ කම්පනය ඇති විය හැකියි." මේ ගැන පරීක්ෂණ කරන එහි භූ විද්‍යාඥ නලින්ද සිල්වා මහතා පවසයි.

පසුගිය 29 වැනිදා සිදුවූ භූ කම්පනය හා 2 වැනිදා සිදුවූ භූ කම්පනයේ අපිකේන්ද්‍රය එකම ස්ථානයක සිදුවූ බවට නිරීක්ෂණය වී ඇතැයි භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශ පර්යේෂක කණ්ඩායම් පවසති.

මේ අතර පසුගිය දිනවල මහනුවර සිදුවූ භූ කම්පන පිළිබඳව පරීක්ෂණ කරන භූ විද්‍යාඥයන් හය දෙනකුගෙන් සමන්විත කණ්ඩායම් දෙකක් පවසන්නේ එම කම්පන තත්ත්වයන් ප්‍රධාන භූතල මායිම් ආශ්‍රිතව ඇතිවූ ඒවා නොවන බවයි. කෙසේ වුවත් වික්ටෝරියා ජලාශය ආශ්‍රිතව හටගැනීමට ඉඩකඩ ඇති ප්‍රේරිත භූමිකම්පාවක් හෝ කලාපය තුළ පවතින දුර්වල පාෂාණයක් වන විපරිත නුණුගල් තට්ටු තුළ බිඳවැටීමක් ද යන කරුණු පිළිබඳව භූ පර්යේෂකයන් අවධානය යොමු කර ඇති බවද භූ විද්‍යාඥයෝ පවසති.

අලුත්ම තොරතුරු අනුව රජවැල්ල පල්ලෙකැලේ ගුරුදෙනිය හාරගම ප්‍රදේශවල ත්‍රිකෝණාකාර ප්‍රදේශයක මේ භූ කම්පන සියල්ල සිදුවෙන බවයි.



භූ කම්පන සිදුවූ ත්‍රිකෝණය

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ හිටපු භූ විද්‍යා මහාචාර්ය පී.ඩබ්ලියු. විතානගේ

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූ විද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න

මහවැලි අධිකාරියේ ප්‍රධාන වේලි හා ජලාශ බාර අධ්‍යක්ෂ අරුප්පොළ

භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ සභාපති ඉංජිනේරු අනුර වල්පොල

මහාචාර්ය වී. ඩබ්ලිව් විතානගේ මහතා මීට වසර 25කට පමණ පෙර පෙන්වා දුන් අයුරින් පසුගිය සතියේ මහනුවර ආශ්‍රිතව දිගන ආශ්‍රිතව සිදුවූ භූ කම්පා වික්ටෝරියා ජලාශය හතරවැනි කොටස ආශ්‍රිතව සිදුවූවා නම් අප ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතුය. ඒ අනුව භූ විද්‍යාඥයන් විසින් මේ භූමිකම්පාව සිදුවූ නාභිය සොයා බැලීම් කළ යුතුව ඇත.

මේ පිළිබඳව අපට කරුණු දැක්වූ මහවැලි අධිකාරියේ ප්‍රධාන වේලි හා ජලාශ පිළිබඳ අධ්‍යක්ෂ, ඉංජිනේරු එස්.කේ.ආර්. අරුප්පොළ පවසන්නේ

වික්ටෝරියා වේල්ල යට ලොකු පැල්මක් තිබෙනවා ඒක හෙල්ලුණොත් භයානකයි

- මහාචාර්ය පී.ඩබ්ලිව්. විතානගේ

පසුගියදා මහනුවරට දැනුණ භූ කම්පන නිසා වික්ටෝරියා වේල්ලට හෝ ජලාශයට කිසිම හානියක් සිදුවී නැති බවයි.

මේ භූ කම්පන සිදුවූ පසු අපි වේල්ල පිළිබඳව ඉතා සූක්ෂ්මව පරීක්ෂා කළා. වේල්ලට කිසිම හානියක් ඉරි තැලීමක් නැහැ.

මේ මුල් භූ කම්පන පිළිබඳව දත්ත අපේ වේල්ල අසල සවිකර ඇති භූ කම්පන මානය මඟින් වාර්තාකර තිබුණා. ඒ භූමිකම්පාව රිච්ටර් මාපකයේ 3 ප්‍රමාණයේ කුඩා භූ චලනයක් පමණයි. කෙසේ වුවත් අපි මේ පිළිබඳව ඉතා විමසිලිමත් වෙනවා. අරුප්පොළ මහතා කීය.

මේ පිළිබඳව අපට කරුණු දැක්වූ වික්ටෝරියා ජලාශයේ කාර්ය භාර ඉංජිනේරු වසන්ත ඇහැලපිටිය මහතා පැවසුවේ වික්ටෝරියා වේල්ලේ සිට කිලෝමීටර් 2 - 5 අතර දුරින් ගැඹුරු හුණුගල් වළවල් තිබෙනවා. සමහර ඒවා තියෙන්නේ ජලාශ මායිමේ හා ගඟ අසල. මේවායේ වතුර පිරීමෙන් ඇති වන පීඩනය නිසා හුණුගල් ස්තර පිපිරී ලොකු කම්පනයක් ඇති වෙන්න පුළුවන්.

මුල් කම්පන සිදුවූ දිනයේ සවසම මේ වික්ටෝරියා පැත්තට මහ වැස්සක් වැටුණා. කෙසේ වුවත් අපි මේ පිළිබඳව පේරාදෙණිය සරසවියේ භූ විද්‍යාඥයන් සමඟ දිගටම පරීක්ෂණ කරනවා. ඉංජිනේරු වසන්ත මහතා කීය.

මේ පිළිබඳව කරුණු දක්වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයේ සභාපති අනුර වල්පොල මහතා පවසන්නේ මේ කම්පන පොළොව තුළ සිදුවූ භූ තැටි තල්ලු වීමක් නොව බාහිර ක්‍රියාවක් නිසා සිදුවූ කම්පනයක් බවයි.

මහවැලි මහා ජලාශ අවට හුණුගල් හා කළුගල් කැණීම් වහා නැවැත්විය යුතුයි

- මහාචාර්ය අතුල සේනාරත්න

මේ පිළිබඳව අදහස් දක්වන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න මහතා පැවසුවේ මෙම භූ කම්පනය සිදුවීමට හේතු කීපයක් තිබිය හැකි වුවත් මේ ප්‍රදේශයේ තිබෙන අඩි 60 - 70 ගැඹුරු හුණුගල් වළවල් වලට ජලය පිරීම නිසා මෙවැනි කම්පනයක් සිදුවීමට බොහෝ ඉඩකඩ තිබෙන බවයි. මේ ප්‍රදේශයේ පාෂාණ තට්ටුවල තිබෙන කැණීම් බහුලයි. විශේෂයෙන් මේ වික්ටෝරියා වේල්ලට කිලෝමීටර් 2 - 3 ක් දුරින් අඩි 70- - 80 ගැඹුරු හුණුගල් වළවල් කැණීම් කරලා තිබෙනවා. සමහරක් ඒවා තිබෙන්නේ වික්ටෝරියා ජලාශය ඇතුළේ. ඒවා වතුරෙන් පිරිලා තිබෙනවා. මේ සමහර හුණුගල් වළවල් හාරන්න ගල් වෙඩිත් දමනවා. ඒ නිසා ඒ පොළොව යට පැළීම් හා භූ ස්තර විභේධනය වීම් ඇතිවෙන්න පුළුවන්.

ඒ සමඟම හුණුගල් වළවල් පතුලෙත් මේ අය පිපිරවීම් කරනවා. හුණුගල් තට්ටු වැඩිපුර කඩාගෙන වැටෙනවා. ආවාට වගේ ඒවා ඇතිවෙන්න පුළුවන්. මේ ස්ථානවලට අධික වැස්ස නිසා අඩි 70 - 80 උසට ජලකඳක් ඉහළින් එක්වූ විට පහළ භූ ස්තරවල පීඩන මට්ටම් වෙනස්වී කම්පන ඇතිවෙන්න පුළුවන්. ඒ නිසා තිබෙන භූ පැළීම් විශාල වී විශාල භූ කම්පන ඇතිවෙන්න පුළුවන්. මේ පිළිබඳව මහවැලි හා පරිසර බලධාරීන් සමඟ දැඩි අවධානය යොමු කළ යුතුයි.

මේ නිසා මේ කම්පන සිදුවීමට ඉඩ ඇති මහවැලි ජලාශ පද්ධතිය ආසන්නව තිබෙන ප්‍රදේශවල මේ හුණුගල් හා කළුගල් කැණීම් වහාම නවත්වන ලෙස මම වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ කැණීම් හා ගල්වෙඩි නිසා ඇතිවෙන පැළීම් ජලාශ හරහා යන්න පුළුවන්. එවිට සමහර අවස්ථාවකදි මේ පැළීම් ඇතුළතට ජලය ගොස් ජලාශය හිඳෙන්න පුළුවන්. ඒ වතුර ටික වෙන කොහෙන් හරි මතු වෙන්න පුළුවන්.

ඒ අනුව මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්ක ඇතුළත මහවැලි මහ ජලාශ අසල ගල් බෝර දැමීම හා හුණුගල් වළවල් කැණීම් වහාම නතර කළ යුතු බවද ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න අවධාරණය කරයි.

මේ අතර මේ භූ කම්පනය පිළිබඳව පරීක්ෂණ කිරීමට එහි ගොස් සිටින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ භූ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ උදය ද සිල්වා මහතා පවසන්නේ මේ කම්පන වීමට හේතු විය හැකි කරුණු 3ක් පිළිබඳව පරීක්ෂණ කරන බවයි.

මහනුවර සිදුවූ කම්පන හතරම ප්‍රධාන භූතලවල සිදුවූ ඒවා නොවේ

භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශය

ඒ අනුව ප්‍රදේශයේ සිදුවන හුණුගල් වළක ස්තර කඩා වැටීමක්, ප්‍රදේශයේ සිදුවූ බලවත් ගල් බෝර දැමීමක් නිසා මෙය සිදුවිය හැකි බව ඔහු කියයි.

ඊට අමතරව වික්ටෝරියා ආදි ජලාශවල සිදුවන හෝ ඒ අවට පස් ඇතුළත සිදුවන අධික ජල තෙරපුමක් නිසාද මේ කම්පනය සිදුවීමට ඉඩ ඇතැයි උදය ද සිල්වා මහතා පවසයි.

කෙසේ වුවත් මේ කම්පනයට හේතු වූ ස්ථිර විද්‍යාත්මක හේතුවක් තවම නැත. එහෙත් මහවැලි අධිකාරියේ නිලධාරීන්ගේ හා මහනුවර අවට භූ විද්‍යාඥයන්ගේ අවධානය මහනුවර හා නුවරඑළිය ප්‍රදේශවල ඉවක් බවක් නැතිව සිදුවන හුණුගල් වළවල් කැණීම් හා ගල් බෝර දැමීම කෙරෙහි තවදුරටත් යොමුවිය යුතු බව අපි අවධාරණය කරමු. ඒ සමඟම මෙරට විශාලතම අභය භූමිය පිහිටි මේ ප්‍රදේශය සුරැකීමට වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් මීට වඩා අවධානය යොමු කළ යුතුව ඇත.

1985 දී ප්‍රතිමා පැවති ආකාරය

බුදුපටුන්ගල සම්බන්ධව පල වූ දෙස් විදෙස් මාධ්‍ය වාර්තා

වත්මන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ගවේෂණ කණ්ඩායම සමග... (ජපන් ජාතිකයන් දෙදෙනා මැද වාඩිවී)

අලුතින් හොයාගත් බව කී
බුදුපටුන්ගල ප්‍රතිමාවල සත්‍ය කතාව

● ජානක ලියනආරච්චි

බිනර පොහොය යෙදී තිබුණු පසුගිය අඟහරුවාදා ප්‍රධාන රූපවාහිනී මාධ්‍යය කීපයක් ස්වකීය ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ කාලයෙන් සැලකිය යුතු ඉඩක් වෙන් කර අපූරු පුවතක් පළ කළේය. ඒ නැගෙනහිර පළාතේ කුඩුම්බිගල අභයභූමියේ උතුරු සීමාවට වන්නට ඇති දැවැන්ත වන පියස මධ්‍යයේ පිහිටි මරනම් ඓතිහාසික ප්‍රතිමා වහන්සේ තුන් නමක් සහිත පුරා විද්‍යා භූමියක් කැලණි විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව සහ කැලණිය පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාර්ථයින් පිරිසක් විසින් ගවේෂණයකින් අනතුරුව සොයා ගැනීමක් පිළිබඳවය.

එය උත්කර්ෂවත් රූප රාමු පෙළකින් යුක්ත දර්ශනයක් විය. මහාචාර්යවරයා ඇතුළු විද්‍යාර්ථයෝ කැලෑව මැදින් එති. දුර්ග ගමන කෙළවර මේ විශිෂ්ට ප්‍රතිමා වහන්සේලා දකිති. මහා සංඝයා වහන්සේත් කණ්ඩායම සමග වැඩම කරනු පෙනේ. අනතුරුව ප්‍රතිමා වහන්සේලා අසල ආගමික පූජා පවත්වති. මහැදුරු සෝමදේවයෝ අනතුරුව ප්‍රතිමා වහන්සේලා පිළිබඳව අර්ථ පූර්ණ හැඳින්වීමක් කරති.

ප්‍රවෘත්තිය පෙළ ගැසෙන්නේ වන දහන මැද හුදකලාව අත්හැරී ලෝකයෙන් මග හැරුණු, විරල කලාකෘති බඳු ප්‍රතිමාවහන්සේලා තෙනමක් සහිත ඓතිහාසික පුදබිමක් අනාවරණය කරගැනීමේ උත්කර්ෂවත් අවස්ථාවක් රටට දක්වමිනි. දැන් අප ඉදිරියේ ඇත්තේ නුදු මේ රට තුළ සිදුවන ගවේෂණයක්ම නොවේ. ලෝක අවධානයට යොමුවන අතිශය අපූර්ව ශාස්ත්‍රීය අනාවරණයකි.

පිපිරී යෑම

එහෙත් මේ ගවේෂණ කණ්ඩායම සොයා ගත්තේ බුදු පටුන්ගල නැමැති ඓතිහාසික ස්ථානය බව ඒ මාධ්‍යය තුළම වාර්තාවත්ම ශාස්ත්‍රීය ලෝකය මවිතයට පත් වුණේය.

මුල්ම ප්‍රතිචාරය ලැබුණේ ජපානයේ හොසෙයි සරවියේ ටොකයි අධ්‍යාපන පර්යේෂණ ආතයනයේ ජ්‍යෙෂ්ඨ ගවේෂකයෙක් වූ තකාෂි ඔකමුරාගෙනි. ඔහු සමාජ මාධ්‍යය ඔස්සේ මහාචාර්ය රාජ් සෝමදේව විමසා සිටියේය. එහි මෙසේ සඳහන්ව තිබිණි.

"ශ්‍රී ලංකාවේ මිතුරන්ට... වර්ෂ 1985 දී අපි විසින් සොයා ගන්නා ලද සහ වර්ෂ 1993 දී නැවත සොයාගත් නටබුන් පිළිබඳ දැන් ගැටලුවක් තිබේ ද?. වර්ෂ 1993 දී ආචාර්ය සෙනරත දිසානායක මා සමග සිටියේය. මහාචාර්ය රාජ් සෝමදේව මෑතක දී මෙය සොයාගත් බව ප්‍රකාශ කළා ද? එසේ නම් එය වැරැද්දකි. අපට දැනගැනීමට අවශ්‍යයි."

ඔහු මේ සටහන එවා තිබුණේ අලුතින් සොයා ගත් බව කී බුදු පටුන සම්බන්ධව වර්ෂ 1990, වර්ෂ 1999 හා වර්ෂ 2015 දී පළ කළ පර්යේෂණ පත්‍රිකාවල උදෘත දක්වමිනි.

මේ අතර ජපන් ගවේෂකයන් වසර තිස්පහකට පෙර කුඹුක්කන් ඔය නිම්නයේ කළ ගවේෂණයේ ශාස්ත්‍රීය විපුලත්වය සම්බන්ධව ක්ෂේත්‍රයේ ප්‍රමාණිකයෝ සංවාදයට එක් වූහ. වර්ෂ 1985 ගවේෂණයේ දී එම ප්‍රතිමා සම්බන්ධ නිවැරදි මිනුම් සහිතව වාර්තා කර තිබූ පූර්ණ ආකාරය, පසුව සිදුවන ප්‍රතිමා විනාශයෙන් අනතුරුව ප්‍රතිමා සම්බන්ධ අදහසක් ලබා ගැනීමට එම වාර්තාකරණය ඉවහල් වූ ආකාරය ඉන් කියැවිණි.

මහාචාර්ය රාජ් සෝමදේව

අයෙක් ඒ දුෂ්කර ගමනේ මතකයන් ලීවේය. මීට වසර තිස් පහකට පෙර මේ ගවේෂණයට එක් වූ, බුදුපටුන්ගලට කිලෝමීටර 15ක් එපිටින් පැවති ආසන්නම ගම වන කොටියාගල වැසියන්ගේ කෘතවේදී මතක ගැන අයෙක් සිහි කළේය.

මේ අතර අතීතය සිහිකරමින් ජපන් ගවේෂක තකාෂි ඔකමුරා තැබූ සටහන සංවේදි එකක් විය.

" වර්ෂ 1985 දි අපි මේ පුරාවිද්‍යා භූමිය සොයාගෙන ඒ සම්බන්ධව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වාර්තා කර නැවත ජපානයට ආවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අපගේ සොයාගැනීම් නිවේදනය කළා. පසුව ඒ ගවේෂණ දත්ත සනාථ කරගැනීම සඳහා පර්යේෂණ කරගෙන ගියා. කෙසේ වෙතත් අවස්ථා ගණනාවක දී ගවේෂණ කණ්ඩායම් යළි යොමු කළ නමුත් ඔවුන්ට නටබුන් සොයාගත නොහැකි වුණා.

ඒ නිසා අවුරුදු අටකට පසු නටබුන් යළි සොයා ගැනීම සඳහා එකාබද්ධ පරීක්ෂණයක් යෝජනා කළා. ඒ අනුව අප එකට ගොස් නැවත නටබුන් සහිත භූමිය සොයා ගත්තා. ඒ වනවිට නටබුන් විනාශ වී ගොස් තිබුණා. ඒ වසර අට තුළ සිවිල් යුද්ධය පැතිරී ගිහින්. කොටියාගල ගම එල්.ටී.ටී.ඊ ඉලක්කයක් වෙලා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පර්යේෂණ කටයුතු සඳහා මුදලක් වෙන් වෙලා නැහැ. ". ජපන් ගවේෂකයෝ උක්ත ගවේෂණ කාර්යයේ යෙදී තිබුණු ගර්හිත වටපිටාව අපට සිහි කැඳවූහ.

බැලූ බැල්මටම පෙළ ගැසෙමින් තිබුණේ ශාස්ත්‍රීය ලෝකය තුළ පූර්ණ ගර්භාවට ලක්වන අකටයුත්තකි. ගැටලුව තිබුණේ එය මාධ්‍යය විසින් වාර්තා කළ ආකරයේය. මාධ්‍ය අනුව බුදු පටුන්ගල පසුගිය දා සොයා ගන්නේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව ප්‍රමුඛ කැලණි සරසවියේ පශ්චාත් උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන්ය.

අකටයුත්ත

එහෙත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේවයන් ප්‍රමුඛ විද්‍යාර්ථීන් කණ්ඩායම සොයා ගත් බවට මාධ්‍ය වාර්තා කළ බුදු පටුන්ගල පුද බිම වර්ෂ 1985 දී හොසෙයි සරසවියේ ගවේෂණ කණ්ඩායමක් විසින් සොයාගෙන, වර්ෂ 1993 දී නැවත ස්ථානීය ගවේෂණයකට පූර්ණ ගවේෂණ වාර්තාවක් සකස් කර පර්යේෂණ පත්‍රිකා තුනක් ප්‍රකාශයට පත් කළ පුරාවිද්‍යා ස්ථානයක් විය.

මුලින්ම මේ පුරාවස්තු සංහාරය පිළිබඳ ප්‍රවෘත්තිය සිංහල පුවත් පතක පළවන්නේ 1993 අගෝස්තු මස 23 දිනය. ඒ ලංකාදීප පුවත්පතේය. ජපන් පුරාවිද්‍යාඥයන් සොයාගත් ඉපැරණි බුදු පිළිම නිදන් හොරු වනසා දමලා" ලෙස එම වාර්තාව සකසා තිබුණේ රත්නපුරේ ජයන්ත විජේරත්න බණ්ඩාරය. අනතුරුව ඔහු මේ සම්බන්ධව විස්තරතාමක පුවත්පත් වාර්තාවක් පුරාවස්තු සංහාරකයන් විසින් ව්‍යසනයට ලක් කරන ලද ප්‍රතිමාවන්හි ඡායා රූප ද සහිතව " හඬා වැටෙති කඳුළු සලා බුදු රූ වන අරණේ" නමින් වර්ෂ 1993 සැප්තැම්බර් 23 වැනිදා එම පුවත්පතටම සකස් කරන්නේය.

පසුවත් අවස්ථා ගණනක දී මෙම ස්ථානය සම්බන්ධව අවධානය යොමුවන වාර්තාකරණයන් සිදු වන්නේය.

සෝමදේව මාධ්‍යයට කී කතාව

රාජ් සෝමදේව ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා මේ ඉතිහාසය මැනවින් දන්නේය. ඔහු මේ ගමන සංවිධානය කරන්නේ ඒ පූර්ව දැනුවත් බවිනි. තමන් මේ භූමිය සොයාගත් බව ඔහු කිසිවිටෙකත් කියන්නේ නැත. ඔහු කියන්නේ මීට පෙර අවස්ථා කීපයක දී උනන්දු සහගත ගවේෂකයන් විසින් මේ ස්ථානය ඉතා කෙටියෙන් වාර්තා කර තිබුණු බවය. ඌව වෙල්ලස්ස සංඝදය මගින් සංවිධානය කළ ගවේෂණ මාලාවේ ප්‍රතිඵලයක් ලෙස මේ ස්ථානය නරඹන්න පැමිණි බවය.

එහෙත් මහාචාර්ය සෝමදේව හැරුණු විට ක්ෂේත්‍ර පුරාවිද්‍යාවේ ප්‍රාමාණිකයෝ තවත් වෙති. ඔවුහු සෝමදේවයන් හා එකඟ නොවෙති. ඔවුන්ට අනුව ජපන් පර්යේක්ෂකයන්ගේ වාර්තාකරණය ශාස්ත්‍රීයව ගුණාත්මක එකකි. මෙවැනි තත්ත්වයන් තුළ මහැදුරු සෝමදේවයන්ගෙන් විදග්ධ ශාස්ත්‍රීය හැසිරීමක් සමාජය ලෝකය අපේක්ෂා කරයි. අනුන්ගේ පර්යේෂණ දත්ත ඔවුන්ට ලැබිය යුතු ගෞරවනීය අයිතිය නොදී උදුරා ගැනීම ශාස්ත්‍රීය සම්ප්‍රදාය නොවේ. ජපන් ගවේෂණ කණ්ඩායම ඔහු කරන ප්‍රකාශ සම්බන්ධව යළි යළිත් විමසමින් ඉතා උනන්දු සහගත වන්නේ එබැවිනි.

ගැටලුව වන්නේ ඒ සම්බන්ධව සෑහීමකටක පත්විය හැකි ප්‍රතිචාරයක් තවමත් ඔහුගෙන් නොලැබීමය.

දේශීයත්වයෙන් ඉහළට යන 'නෙළුම'

● තාරක වික්‍රමසේකර

දකුණු ආසියාවේ උසම කුලුන ලෙසින් නෙළුම් කුලුන පසුගිය වසරේ විවෘත කෙරුණද එය බලාපොරොත්තු වූ ආකාරයේ සන්නිවේදන අංශයේ හෝ විනෝදාස්වාද සඳහා භාවිතයට ගත හැකි තත්ත්වයේ නොවීය.

එහෙත් ගෝඨාභය රාජපක්ෂයන් ජනාධිපතිවරයා ලෙස පත් වීමෙන් පසුව එහි අඩුපාඩු සොයා බලා සකස් කිරීමට අවශ්‍ය කටයුතු යොදන ලදී. ඒ අනුව නෙළුම් කුලුන ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් විශ්‍රාමික මේජර් ජනරාල් ප්‍රසාද් සමරසිංහයන් පත් කරන ලදී. ඔහු විදුලි සංදේශ නියාමන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග එක්ව එහි සන්නිවේදන අංශයන්ගේ සිදුවිය යුතු වෙනස්කම් මෙන්ම නෙළුම් කුලුනේ සිදුවිය යුතු වෙනස්කම් ගැන සොයා බැලුවේය. නෙළුම් කුලුනේ ඉදි කිරීම් භාරව කටයුතු කළ චීන සමාගම විසින් තවමත් වැඩ අවසන් කර එය භාර දී නොමැති නිසා ඔහු විදුලි සංදේශ නියාමන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග එක්ව සන්නිවේදන අංශයන්ගේ සිදුවිය යුතු වෙනස්කම් මෙන්ම නෙලුම් කුලුනේ සිදුවිය යුතු වෙනස්කම් ගැන සොයා බැලුවේය. නෙලුම් කුලුනේ ඉදි කිරීම් භාරව කටයුතු කළ චීන සමාගම විසින් එය භාර දී නොමැති නිසා එහි කිසිදු වෙනස්කමක් කළ නොහැකි තත්ත්වයක පවතී.

ප්‍රධාන අඩුපාඩු 20ක්

සිළුමිණ මේ සම්බන්ධයෙන් මේජර් ජනරාල් ප්‍රසාද් සමරසිංහයන්ගෙන් තොරතුරු විමසීමු.

''නෙලුම් කුලුනේ වැඩ කටයුතු අවසන් කරන්න පෙර විවෘත කරල තියෙන්නෙ. මේ කුලුනෙන් බලාපොරොත්තු වුණු බහුකාර්ය සන්නිවේදන කටයුතු වඩාත් ඉහළ මට්ටමින් හා පුළුල් ආකාරයෙන් කරන්න අපි මේ වන විට සැලසුම් කර තිබෙන්නෙ. ඒත් ඒකට තිබෙන ලොකුම බාධාව තමයි ඉදි කිරීම් භාරව කටයුතු කරපු චීන සමාගම තවමත් කුලුන බාර නොදීම. ඉදිකිරීම්වල බරපතළ මට්ටමේ අඩුපාඩු 20ක් තියෙනවා. ඒ වගේම තවත් සුළු සුළු අඩුපාඩු තියෙනවා. බරපතළ අඩුපාඩු 20ක් තියෙන මේ වගේ ව්‍යාපෘතියක් නිල වශයෙක් බාර දෙන තුරු එහි වෙනස්කම් කරන්න අපට බැහැ.

තාක්ෂණික වශයෙන් ඉහළ මට්ටමකට නෙළුම් කුලුන ගෙන ඒම අපේ අපේක්ෂාවයි. ඒ අනුව 5 ජී තාක්ෂණය ඇතුළු නවීනතම තාක්ෂණයෙන් එය සන්නද්ධ කරනවා'

ඒ වගේම චීන සමාගම කුලුන අපිට බාර දීමෙන් පසුව මෙහි වෙනස්කම් ගොඩක් කරන්න තියෙනවා. උදාහරණයක් හැටියට බැන්ක්වට් ශාලාවල විවාහ උත්සවයක් ගත්තොත් මනාල යුවල ජේන්නෙ ඉදිරි ජේලි කිහිපයකට පමණයි. ඒ තත්ත්වය වෙනස් කරන්න අප කටයුතු කරනවා. ඒ වගේම කැරකෙන අවන්හලේ යොදා ඇත්තේ බාහිරින් ගෙන්වා ගත් ආසන. ඒ සියල්ල වෙනස් කර සුදුසු පරිදි සියල්ල වෙනස් කළ යුතු වෙනවා. ඉහළ නැරඹුම් කුටියේ දුර බලන කණ්ණාඩි පවා සවි කර නැහැ. අපි ඒ බාහිර කටයුතු කරමින් ඉන්නෙ.

දිය සංදර්ශන

ඒ වගේම බේරේ වැව ආසන්නයේ තියෙන මේ කුලුනින් උපරිම ප්‍රයෝජන ගැනීමටයි ජනාධිපතිතුමා අපට උපදෙස් දීලා තියෙන්නෙ. ඒ අනුව බේරේ වැවේ දිය සංදර්ශන පැවැත්වීම වැනි ජලයෙන් ලබා ගත හැකි උපරිම ප්‍රයෝජනත් කුලුන හා ආශ්‍රිතව ස්ථාපිත කරන්න අපි කටයුතු කරනවා. මේ වන විටත් අපි අවශ්‍ය සියල්ල ඇණවුම් කර තිබෙන්නේ. නමුත් එකම ගැටලුව චීන සමාගම බාර දී නොතිබීමයි. එම නිසා අපට කුලුනේ කිසිම වෙනසක් කරන්න බැහැ. ඇතැම් තැන්වල ජලය පවා කාන්දු වෙනවා. ඒ සියල්ල අදාළ චීන සමගාම විසින් නිවැරැදි කර දිය යුතුයි.

ඒ වගේම ඉදිරියේදී ප්‍රසංග පැවැත්වීමට හැකි වන ලෙසින් මෙන්ම අධ්‍යාපනික, විනෝදාස්වාද ඇතුළු පැමිණෙන ඕනෑම තරාතිරමක අයකුට යම් ආකාරයක වින්දනයක්, හෝ දැනුමක් හෝ ලබා ගත හැකි ලෙසින් මේ සංකල්පය අලුත් කිරීම සිදු වෙනවා. පනුගිය වසර 5 තුළ කිසිදු වෙනස්කමක් අලුත් යමක් මෙහි සිදු කර නොමැති නිසයි මේ සියල්ල කල් ගියේ. කොහොමත් මාසයක් වගේ කාලයකින් චීන සමාගම අපට කුලුන බාර දෙයි කියල විශ්වාස කරනවා.

මේ වන විට ඉදිරි කටයුතු කරන්න දේශීය කණ්ඩායම් රැසක්ම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා ඉන්නෙ. ඒක ලොකු හයියක්. ඒ වගේම ඉදිරියේදී සිදු කරන සියලු වෙනස්කම් දේශීය සමාගම් හා එක්වයි සිදු කරන්නේ. 'දියසෙන්' කුමරුගේ පැමිණීම එහි එක් අංගයක් පමණයි. එයත් රටට හයියක්. එමෙන්ම ව්‍යාපාරික මධ්‍යස්ථාන පවා මෙහි ස්ථාපිත කිරීමට කටයුතු කර තිබෙනවා.' ප්‍රධාන විධායක නිලධාරි විශ්‍රාමික මේජර් ජනරාල් ප්‍රසාද් සමරසිංහයන් එසේ පවසන්නේය.

ඒ අනුව අපට මීට පෙර කියැවුණු සුපිරි පෙළෙන්තියට සීමා වන්නට ඉඩ තිබුණුනෙළුම් කුළුනට වඩා වෙනස් නෙලුම් කුලුනක් අපට දැක ගන්නට හැකි වේවි. සන්නිවේදන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අමතරව අග නගරයට පැමිණෙන ඕනෑම අයකුට යම්කිසි මුදලක් ගෙවා පැමිණ තමන්ට විනෝද වන්නට හෝ යමක් ඉගෙන ගන්නට හැකි ස්ථානයක් ලෙසින් එය ස්ථාපිත කෙරෙනු ඇත.

කැරකෙන අවන්හල

නෙළුම් කුලුනේ මේ ලෙසින් නවතම සංකල්ප ගොඩ නැගෙද්දී එහි රාජකාරි කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පළමු මානවරූපී අධිතාක්ෂණික රොබෝවරයාද පැමිණියේය. ඒ 'දියසෙන්' කුමරුය. කුලුන වෙත පැමිණෙන අමුත්තන් පිළිගැනීම, ප්‍රවේශපත් මිලදී ගැනීමේදී සහාය දැක්වීම මඟ පෙන්වීම ආදිය දියසෙන් කුමරු විසින් සිදු කරන අතර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ඇතුළු භාෂා කිහිපයකින් කතා කරන්නට දියසෙන් කුමරුට හැකියාව තිබේ.

දකුණු ආසියාවේ පළමු මානවරූපී රොබෝ යන්ත්‍රය මෙසේ නිපදවන්නට ශ්‍රී ලාංකික ඇරිමැක් ආයතනය පියවර ගත්තේය. දියසෙන් කුමරු හරහා නෙලුම් කුලුනේ කාර්යයන්ට සක්‍රිය දායකත්වයක් ලබාදීමට බලාපොරොත්තු වෙයි.

නවීන තාක්ෂණික දැනුම භාවිත කරමින් ඇරිමැක් ආයතනය නිෂ්පාදනය කළ මානවරූපී අධිතාක්ෂණික රොබෝ යන්ත්‍රයට වසර තුනක කාලයක් ගතව තිබේ. දියසෙන් කුමරුට ශ්‍රී ලංකාවේ ඕනෑම තැනෙකට ගමන් කිරීමේ හැකියාව තිබීම අතිවිශේෂිතය. උස අඩි 4ක් හා අඟල් 6ක් ලෙසින් සාමාන්‍ය මිනිස් උසකට සමාන ලෙසින් දියසෙන් කුමරු ඉපිද තිබේ. පළමුව හමු වූ පාරිභෝගිකයකු දෙවන වර මුණ ගැසීමේ දී ඔහු නමින් ආමන්ත්‍රණය කරන්නට දියසෙන්ට හැකියාව තිබේ.

දියසෙන් යනු දේශීය නිපැයුමකි. ඒ ලෙසින්ම නෙලුම් කුලුනේ තවත් බොහෝ දේ වෙනුවෙන් දේශීයත්වයට මුල් තැන දෙන්නට ඉදිරියේදී කටයුතු කරනු ඇත. මීටර් 356.3ත උසකින් යුත් කුලුන මුදුනට ටොන් 180ක් බර ඇන්ටෙනාව ගෙව යාමට භාවිත කර ඇත්තේද දේශීය තාක්ෂණයයි. අධික බර නිසා හෙලිකොප්ටරයකින් පවා එය ගෙන යාම අවදානම බව තහවුරු වුණා. එසේම තද සුළඟ නිසා ඇන්ටෙනාව පැද්දීමට පත් වී කුලුනේ ගැටීමකට පවා ලක් විය හැකිව තිබුණා.

එම නිසා එම අවදානම් හමුවේ කුලුනේ ඉහළ සිට පහළට මැදින් සිදුරක් සකස් කරේද ඉතාම ප්‍රවේශම් සහිතවය. සිදුර ඇන්ටෙනාවේ වට ප්‍රමාණයට වඩා අගල් දෙක තුනක් පමණක් විශාල වන්නට සිදුර විදින ලදී.

'ජැක්' 4ක් ආධාරයෙන් එක් ජැක් යන්ත්‍රයකට කේබල් 18ක් බැගින් යොදවා ක්‍රමයෙන් එම ඇන්ටෙනාව සිදුරු කළ කුහරය හරහා ඉහළට ඔසවා ගන්නට කටයුතු කරන ලදී. එයද එක එල්ලේ කරන්නට හැකියාවක් නොවීය.

මිලිමීටර් 250ක් (අගල් 10ක්) පමණ ඔසවා ස්වල්ප වේලාවක් නවතා තබා පසුව තවත් ටිකක් ඉහළට ඔසවන ලදී. එලෙසින් ඇන්ටෙනාව පහළ සිට ඉහළට ගෙන යාමට සති දෙකක කාලයක් ගත විය. එය නිසි ලෙසින් සවි කරන්නට තවත් සති දෙකක කාලයක් ගත විය.

භූමිකම්පාවන්ටත් ඔරොත්තුයි

භූමි කම්පාවකට පවා ඔරොත්තු දෙන ආකාරයෙන් මේ කුලුන ගොඩ නංවා ඇත්තේ. එම කම්පන දරා ගත හැකි ආකාරයෙනි. එමෙන්ම ශ්‍රී ලංකාවේ ගොඩනැගිල්ලක ඇති වේගවත්ම විදුලි සෝපාන පද්ධතිය ස්ථාපිතව ඇත්තේද නෙළුම් කුලුනේය. එම සෝපානයක් තත්ත්පරයට මීටර් 7ක් ගමන් කළ හැකි අධික වේගයෙන් ගමන් කරයි. තත්පරයකදී මීටර් 7ක් ඉහළ නගින විදුලි සෝපාන ඔස්සේ තත්පර 37 කදී කුලුන මුදුනටම ළඟා විය හැකිය. එහි විදුලි සෝපාන 8ක් ස්ථාපිත කර ඇත. එයින් සෝපාන 3ක් කුලුනේ පාදමේ ඇති මහල් කරා ගමන් කිරීමටය.

පළමු මහල් 4න් 3ක් වෙන් වන්නේ සාප්පු සංකීර්ණයන් වෙනුවෙනි. ඒ සඳහා ස්වයංක්‍රීය පඩිපෙළද සමන්විතය.

නෙළුම් කුලුනේ මධ්‍යයේ ගමන් කර ඉහළට ගිය විට හමුවන පොහොට්ටුවේ පළමු මහල් දෙක වෙන්වන්නේ විදුලි සංදේශ හා සන්නිවේදන අංශ වෙනුවෙන්ය. එය සාමාන්‍ය ජනතාවට නැරඹිය නොහැකි විශේෂ ආරක්ෂිත කලාපයකි.

3 වැනි මහල හා 4 වැනි මහල් වෙන්ව ඇත්තේ විශේෂ උත්සව හෝ සම්මන්ත්‍රණ පැවැත්විය හැකි 'බැන්ක්වට් හෝල්' දෙකක් වෙනුවෙනි. ඒ එක් උත්සව ශාලාවක 300කට පහසුවෙන් අසුන් ගත හැකිය.

5 වන මහල වෙන් වන්නේ කැරකෙන අවන්හලටය. එහි ද එකවර 300 දෙනකුට අසුන් ගත හැකිය. එය එක තැනක අසුන් ගෙන ශ්‍රී ලංකාවේ කොළඹ නගරය හතර වටේටම එකවර නැරඹිය හැකි එකම ස්ථානය වේ. සෙමෙන් කැරකැවෙන මේ සුපිරි භෝජනාගාරයේ අසුන් ගත් අයකුට එම භෝජනාගාරයේ තමා අසුන්ගෙන සිටින ප්‍රදේශය සෙමෙන් කැරකැවෙන බවක් කිසිසේත්ම නොදැනේ. එය පැය එකහමාරක කාලයකදී එක් වටයක් ගොස් පැමිණේ.

කුලුනේ 6 වැනි මහල වෙන් වන්නේ සුපිරි හෝටල් කාමර වෙනුවෙනි. එය විශේෂිත සුපිරි කාමර 2ක් හා සුපිරි කාමර 4කින් සමන්විතය. 7 වෙනි මහල නිදහසේ කොළඹ නගරය නැරඹිය හැකි නැරඹුම් ප්‍රදේශයයි. එහි නිදහසේ ගමන්කරමින් නගරය වටේටම නැරඹිය හැකිය.

ඡායාරූප - දුෂ්මන්ත මායාදුන්නෙ

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2020ක් වූ සැප්තැම්බර් මස 06 වැනිදා ඉරිදා

නව මඟක පුරවැසි වගකීම

අප දුප්පතකුව ඉපැදීම අපගේ වරදක් නොවේ. එහෙත් අප මිය යන්නේ දුප්පතකු ලෙස නම් එය අපගේ වරදකි යැයි ප්‍රකට කියමනක් තිබේ. මෙතෙක් පත්වූ බොහෝ ආණ්ඩු සහ ඒ ආණ්ඩුවල ක්‍රියාකාරිත්වය විග්‍රහ කිරීමට සහ විනිශ්චය කිරීමට සිටින බොහෝ මාධ්‍ය ක්‍රියා කළේ දුප්පතා සැමදා දුප්පතකු කිරීමට මාර්ගය සෑදීම විනා අන් යමක් නොවේ. වෙනත් වචන වලින් කියන්නේ නම් කන්නට මාළුවා දුන්නා මිස මාළු අල්ලන්නට බිලී පිත්තක් දුන්නේ නැත. දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් ගණනාවක් නිදහසින් පසුව ක්‍රියාත්මක වී ඇත. මූලික වශයෙන් ගත් කල ඒවා දේශපාලනික වැඩසටහන්ය. දිළිඳුකම පිටුදැකීමේ මූලධර්ම එම වැඩසටහන්හි නොපැවැතිණි. දිළිඳුකම පිටුදැකීමේ පළමු උපාය මාර්ගය වන්නේ දිළින්දන් සෘජු ලෙස නිෂ්පාදන ක්‍රියාවලියට හවුල් කර ගැනීම හා ඔවුනට මුදල් හා වටිනාකම් ලැබෙන ක්‍රමවේද සැකසීමය. එහෙත් සිදු වී ඇත්තේ දිළිඳුකම පිටුදැකීම සඳහා ආධාර බෙදා දීමය. ආධාර කේන්ද්‍රගත වන්නේ පරිභෝජනය දෙසටය; අවශ්‍ය වන්නේ ආයෝජන ප්‍රවර්ධනය කිරීමය. රැකියාවක් යනු ආයෝජනයකි. එයින් මුළු ජීවිතයේම හැඩය වෙනස් කර ගත හැකිය; ඉන් නොනැවතී පවුලේ හැඩය ද වෙනස් කර ගත හැකිය. මෙතෙක් ඉතිහාසයේ වැඩිම පිරිසක් එනම් 161,000 ක් මෙවර රාජ්‍ය සේවයට එක් කර ගන්නේ මෙකී ආයෝජනයේ ඵල බලාපොරොත්තුවෙනි.

රැකියාලාභීන් වෙත ද බරපතළ වගකීමක් ඇති බව සිහිපත් කළ යුතුය. අප මුලින් සඳහන් කළ කාර්යබහුල වෙළෙඳපොළ හෝ වැඩ බිම හෝ නිර්මාණය කිරීම සඳහා ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලැබිය යුතුය. දියුණු රටවල වෘත්තිකයා පළමුව අවධානය යොමු කරන්නේ ස්වකීය රට ගැනය. දෙවනුව අවධානය යොමු කරන්නේ තමන්ගේ ආයතනය ගැනය; තමන් ගැන හැර් බලන්නේ තෙවනුවටය. අප හුරු වී ඇත්තේ පළමුව අප ගැන සිතන්නටය. ඒ ක්‍රමය වෙනස් කිරීමට කාලය පැමිණ තිබේ.

ජනමාධ්‍ය යනු දෙපැත්ත කැපෙන තියුණු ආයුධයක් යැයි කියමනක් තිබේ. එහි වැදගත් ම අදහස වන්නේ ජනමාධ්‍ය පරෙස්සමෙන් භාවිත කළ යුතු බව ය. ජනමාධ්‍යයේ භූමිකාව ගුරුවරයකුගේ භූමිකාවට සමාන යැයි තවත් කියමනක් තිබේ. ජනමාධ්‍ය මුරකරුවකු හෙවත් ආරක්ෂක සුනඛයකුගේ භූමිකාව රඟ දැක්විය යුතු යැයි තවත් අදහසක් තිබේ. එහි අර්ථය වන්නේ ජනමාධ්‍ය නිරන්තර අවදියකින් සිටිය යුතු බව ය. මේවා තරමක් පරණ නිර්වචන වන්නේ වුව ඒවායෙහි අර්ථ හා ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය අතර යම් ගැළපීමක් තිබේ.

ජනමාධ්‍යයේ වගකීම ගැන ඔබ සැම දන්නා උදාහරණයක් මෙහි උදෘත කර දක්වන්නට සිතුවෙමු.

1954 සූර්යග්‍රහණය අවස්ථාවේ වද කහ ශරීරගත කිරීමෙන් රූපත් වන බවට එක්තරා පුවත්පතක් ප්‍රචාරය කළේය. ඒ බෙහෙත් වට්ටෝරුව අප්‍රකට පුද්ගලයකු ගෙන් ලබාගත් එකකි. මේ නිසා ලස්සන වීමට වදකහ පානය කළ විශාල පිරිසක් රෝහල් ගත කෙරිණ. සත්‍ය වශයෙන්ම මේ ප්‍රවෘත්තියෙන් අපේක්ෂා කළේ පුවත්පතේ අලෙවිය වැඩි කර ගැනීමය. එහෙත් එයින් වූයේ බලාපොරොත්තු වූ දෙය නොවේ; ඉස්පිරිතාල වදකහ සුදිය බී අසනීප වූවන්ගෙන් පිරී යෑමය. එනිසා මාධ්‍ය සතු ප්‍රචාරණයේ වගකීම ගැන දැනුම්වත් වීම අත්‍යවශ්‍යය ය. අපේ රටේ ජනයා දරිද්‍රතාවේ තබන ප්‍රධාන සාධක දෙකක් තිබේ. ඒ, අන්ධ භක්තිය හා මිථ්‍යා විශ්වාසයි. මාධ්‍ය කෙරෙහි පවතින අන්ධ භක්තියත් මිථ්‍යා විශ්වාසත් විසින් තවදුරටත් මාධ්‍ය සංස්කෘතියේ බලපෑමට අප වැනි රටවල් යටත් කරනු ඇත.

අපට ජීවත්වීමට සිදු වී ඇති ලෝකය මෙයයි; දිනෙන් දින අර්බුද මතුවන ව්‍යසනකාරී ලෝකයකි. ගිය වසරේ පාස්කු ප්‍රහාරය සිදු වූයේය; මේ වසරේ කොරෝනා බැට දුන්නේය. ඒවා සෘජුව මූණ ගැසෙන ගැටලුය. එහෙත් අවධානය යොමු නොකරන අර්බුද සිය ගණනක අප පැටලී ඇත. දිනකට පිළිකා රෝගීන් 64 ක් අලුතින් හඳුනා ගැනීම අඩුවෙන් තක්සේරු කළ නොහැකිය. දිනෙන් දින පාරිසරික අර්බුදයේ අප හිලීයමින් සිටිමු. වෙළෙඳපොළ ධනවාදය අපට උරුම කළ ලෝකය මේ බව තේරුම් ගන්නට අපි පමා වී යුතු නැත. "ක්‍රමයේ වෙනසක් - නැතිනම් මරණය" එය පරම සත්‍ය ලෙස පිළිගන්නට සිදුවී තිබේ.

නව වෙනස්කම් කරද්දී ඇතමුන් හඬ නැඟීම දැන් සාමාන්‍ය තත්ත්වයකි. එය ඉතිහාසය පුරාම සිදු වූවකි. රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කරන්නට හදන හැම විටකම බොහෝ දෙනා විවිධ බිල්ලන් මැවූහ. ඒත් රාජ්‍ය යාන්ත්‍රණයේ ශක්තිය හා උපයෝගීතාව තේරෙන්නට කොරෝනාව පමණක් වුව ද ප්‍රමාණවත් ය. මේ කරන්නට යන බොහෝ දේට බොහෝ බාධා පැමිණීම සාමාන්‍ය ය. එය මේ රටේ පමණක් නොව ලෝකයේ ම හැටි ය. වෙනස්කම, නව්‍යතාව ඉදිරියේ බිය වන්නාට ඉදිරි පැවැත්මක් නැත. අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනඟී... කුමාරතුංගයන් කියූ වදන සිහිපත් වෙන්නේ මේ වැනි අවස්ථාවල ය. රජය මේ තනන්නේ නව මඟක නව චින්තනයක් දල්වා ඉදිරිය පැහැබර කරන්නට ය. මාධ්‍ය ඇතුළු සියල්ලේ වගකීම වන්නේ ඒ පැහැබර ඉදිරියට අවහිර නොකර ආශීර්වාද කරන්නට ය; සිරස්තලයක් අල්ලාගෙන කෑගසනවා වෙනුවට වැඩ වෙනුවෙන් පෙළ ගැසෙන්නට ය.

කොළඹ සීත කළ කාමරවල සිට අහස අල්ලන්නට සැලසුම් ගසනවා වෙනුවට ගමේ මිනිසුන්ගේ දහඩිය කඳුළු විඳ ඒ මතින් සංවර්ධන ඉලක්ක වෙත යෑමේ වැඩපිළිවෙළක් දැන් ක්‍රියාත්මක වේ. නෙළුව, ලංකාගම නිරීක්ෂණ චාරිකා සඳහා ජනපතිවරයා ම සහභාගී වන්නේ මේ අරමුණ පෙරදැරිව ය. අගමැතිවරයාගේ වදනින්ම කියන්නේ නම් එතුමා ගමේ මිනිසෙකි. ඒ ආඩම්බරකාර එළැඹුමකි. ජනපතිවරයාට මෙන්ම රටට ද ඕනෑ වන්නේ වැඩ කරන මහජන නියෝජිතයන් ය; වැඩ කරන රාජ්‍ය සේවකයන් ය. උපාධිධාරීහු පනස් එක් දහස් හැත්තෑ හතක් රාජ්‍ය සේවයට පසුගියදා බඳවා ගැනිණි. ඉතිහාසයේ වැඩි ම පිරිසක් එකවර බඳවා ගත් ප්‍රථම අවස්ථාව මෙයයි. තමන් ලබන වැටුපට සාධාරණයක් ඉෂ්ට කරන්නැයි ජනාධිපතිතුමා මේ පත්වීම් ප්‍රදානය කරමින් මේ උපාධිධාරීන්ගෙන් ඉල්ලා සිටියේය. ඔවුහු මේ අනුව සේවයට එක සිතින් කැපවිය යුතු වෙති.

මේ ඒ සියල්ලට පුරවැසි සහභාගීත්වය හා ආශීර්වාදය අවැසි යුගයකි.

'අපේ බලාපොරොත්තුව ජනතා හිතවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්'

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ

● සුහදා දේශප්‍රිය

මේවන විට මේ රටේ ප්‍රධාන සමාජ කතිකාව බවට පත්ව ඇත්තේ විසිවැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි. විසිවැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පසුගිය දිනක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එයට කැබිනට් අනුමැතිය හිමි විය. 2015 ආණ්ඩුව මඟින් 19 වැනි සංශෝධනය හඳුන්වා දීමේදී එම සංශෝධනය සිදු කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහාය ලබා ගත්තේ 20 වැනි සංශෝධනයෙන් මැතිවරණ ක්‍රමය සංශෝධනය කරනවා යන සංකල්පය මතය.

2015දී මැතිවරණ ක්‍රමයක් වෙනස් කිරීමේ සංකල්පය මත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහාය ලබාගත් නමුත් ඒ ආණ්ඩුව එම කර්තව්‍ය ඉටු කළේ නැත

මැතිවරණ ක්‍රමය රටේ ආණ්ඩු කරන ක්‍රමය සඳහා ඉතා වැදගත් වෙයි. විශේෂයෙන් ජනාධිපති බලතල වැඩියෙන් පවතින අවස්ථාවල වඩා යෝග්‍ය වන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමයයි. නමුත් යම් කිසි ආකාරයකට ජනාධිපතිවරයාගේ බලතල අඩුවන්නේ නම් එහිදි අනිවාර්යෙන් සමානුපාතික ඡන්ද ක්‍රමයෙන් වෙනත් සුවිශේෂී ඡන්ද ක්‍රමයකට යා යුතුය. එයට හේතුව සමානුපාතික ඡන්ද ක්‍රමයෙන් සාමාන්‍යයන් බොහෝ අවස්ථාවලදී ලැබෙනුයේ ස්ථාවර ආණ්ඩු නොවීමයි. මෙරට බොහෝ විට බිහි වූයේ සරල බහුතරය ලබා ගත් ආණ්ඩුය. නමුත් ඒ ක්‍රමවේදයේ වෙනසක් 2010 සහ 2020 මැතිවරණයේදී දුටුවද නැවත අපට එවැනි සුවිශේෂ අවස්ථා උදාවෙතැයි විශ්වාස කිරීමට අපහසුය. 2015දී මැතිවරණ ක්‍රමයක් වෙනස් කිරීමේ සංකල්පය මත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහාය ලබාගත් නමුත් ඒ ආණ්ඩුව එම කර්තව්‍ය ඉටු කළේ නැත. එම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සහ ඊට සහාය දුන් අය පිළිබඳ විශාල අර්බුදයක් නිර්මාණය වී තිබිණි. ව්‍යවස්ථා සංශෝධනයේ සිදුවූ දුර්වල ම සංශෝධනය 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය බව මගේ අදහසයි. එම සංශෝධනය ගෙනා පිරිස එම සංශෝධනය කරනු ලැබුවේ රටේ අවශ්‍යතාවට වඩා ඔවුන් තුළ තිබූ ද්වේෂයකින් බව ඉතා පැහැදිලිය. මේ සංශෝධනයේ හොඳ ලක්ෂණ නැතුවාම නොවෙයි. සාමාන්‍ය දේශපාලනික තත්ත්වයන් යටතේදී ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට එම සංශෝධනය කර ඇත. මේ නිසා මෙය අසාර්ථක සංශෝධනයක් ලෙස හැඳින්විය හැකිය.

2020 මැතිවරණ ව්‍යාපාරයේදී දිගටම වත්මන් ජනාධිපතිවරයා මෙන්ම පොදු ජන එක්සත් පෙරමුණ විසින් මතු කළ කාරණාවක් නම් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කළ යුතු බවයි. 19 වැනි ව්‍යවස්ථාවේ ඇතැම් ලක්ෂණ එනම්, ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර පහක් වීම සහ දෙවතාවක් පමණක් ඡන්දයට ඉදිරිපත් වීමට හැකි වීම වැනි කාරණා සම්බන්ධයෙන් කතා කිරීමේදී සාපේක්ෂ වශයෙන් හොඳ ලක්ෂණයක් ලෙස දැකිය හැකිය. විශේෂයෙන් ම දෙවතාවකට වඩා ජනාධිපතිවරයකු පත්වීම සුබදායී නොවේ. ජනාධිපතිවරයා වෙනස් වන විට ආණ්ඩු ක්‍රමයද යම් තරමකට වෙනස් වෙයි. ඉතිහාසයේ අපි එවැනි අත්දැකීම් විඳ ඇත. ඒ නිසා දෙවතාවකට සීමා කිරීම වැදගත් කරුණකි. නමුත් ධූර කාලය වසර පහද හයද කියන කාරණාව තවදුරටත් සාකච්ඡාවට ලක්කළ යුතුයි. සමහර විට ලංකාව වැනි රටකට වසර පහක් හෝ හයක් වැදගත් යැයි විශ්වාසයක් ඇත. නමුත් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ඇති ස්වාධීන කොමිෂන් සභා පහ ඉතා වැදගත් වන අතර ඒවා පත් කළ පුද්ගලයන් ස්වාධීන නොවීම ගැටලුවකි. ආණ්ඩුකරණයට හිතෛෂී නොවී කටයුතු නොකර ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක වීමේදී අර්බුද ඇතිවන අවස්ථා ඇත. අද පොලිස්පතිවරයා සිරගතව සිටින අතර ව්‍යවස්ථා අර්බුදය නිසා පොලිස්පතිවරයකු පත් කරගැනීමට නොහැකිය. ව්‍යවස්ථාවේ එවැනි තාක්ෂණික අර්බුද ඇත. මේ නව සංශෝධනවලදී ඒවා නිවැරදි කළ යුතුය. 18 වැනි සංශෝධනය මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේදී සිදු විය. ඒ, 18 වැනි සංශෝධනය හරහා යම් යම් ගැටලු මතු වූ අවස්ථාද විය. සමහර විට පරාජයට එක්තරා හේතුවක් ලෙස 18 වැනි සංශෝධනය සඳහන් කළ හැකි බව ඇතැමුන්ගේ අදහසයි. එවැනි අවස්ථාවලදී ආණ්ඩුවක් විචාරශීලීව මේ සම්බන්ධයෙන් සලකා බැලිය යුතුය. 2015 ජනතාව අපට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ ඇයි යන කරුණ පිළිබඳව විමසිලිමත් විය යුතුය. ඒ ගැනත් යම් කිසි අවධානයකින් සංශෝධනයක් ගෙන එන්නේ නම් මෙය අති විශිෂ්ට සංශෝධනයක් බවට පත්වේ. ඒ සමගම මෙය කාලීන සංශෝධනයක් විය යුතුය. තොරතුරු දැනගැනීමේ පනත අහෝසි නොකළ යුතුයි යන්න ඇතැමුන්ගේ මතයයි. නමුත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ හැම තොරතුරක්ම ඉල්ලීමට ජනතාව පෙළඹී ඇත. අතිශයින්ම පෞද්ගලික සහ රහස්‍ය තොරතුරු ලබාදීම අපහසු කරුණක් මෙන්ම ඒවා ලබා දීම එතරම් යෝග්‍ය නොවේ. තොරතුරු ලබා ගැනීමේ පනතේ සඳහන් වන කරුණක් නම් විභාග ප්‍රතිඵල ඉල්ලුම් කළ නොහැකි බවයි. එසේ තිබියදීත් ඇතැම් පුද්ගලයන් තොරතුරු දැනගැනීම යටතේ ඒවා ලබා ගැනීමට උත්සාහ කරයි. තොරතුරු දැනගැනීමේ පනත වැදගත් නමුත් යම් තාක් දුරට විවිධ අවස්ථා යම් ආවරණයකට යටත්ව කළ යුතුය. එබැවින් මගේ අදහස ඒ පිළිබඳව වඩා සැලකිලිමත් විය යුතුයි යන්නයි.

ජනතාවගේ පහසුව සඳහා කරන සංශෝධන සඳහා ජනමත විමසුමක් අවශ්‍ය නොවේ. අවශ්‍ය වෙන්නේ 2/3 පාර්ලිමේන්තු බහුතරයකි

විශේෂයෙන් පාර්ලිමේන්තු විවාදයක් අනිවාර්යෙන්ම මේ සම්බන්ධයෙන් ඇතිවෙයි. මේ සම්බන්ධයෙන් කරුණු විවාදයට ලක්වීම නිසාද යම් කිසි වෙනස්වීම් නව සංශෝධනයේදී සිදු විය හැකියි. එවැනි වෙනස්වීම්වලින් අනතුරුවද පාර්ලිමේන්තු කාරක සභාව අවස්ථාවලදී විවිධ වෙනස්වීම් සිදු විය හැකිය. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේදී හදිසි පනත් ලෙස පනත් ගෙන ආ නොහැකිය. ඒ නිසා අනිවාර්යෙන්ම පාර්ලිමේන්තු විවාදයට ලක් කළ යුතුය. ඒ සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ට යම් කාලයක් ලබාදීමද සිදු වෙයි. ඒ විරෝධතාවන්ට ඇහුම්කන්දීම මෙන්ම ඒ සම්බන්ධයෙන් පුද්ගලයන්ට ශ්‍රේෂ්ඨාධිකරණයටද යා හැකිය. ඒ ක්‍රියාදාමය අවසානයේ ගෙන එන පනත 2/3 ජන්දයෙන් සම්මත වූ පසු රට තුළ ක්‍රියාත්මක වේ.

මෙරට කිහිප වතාවක් ව්‍යවස්ථා සංශෝධනය වුවත් ජනමත විමසුමක් අවශ්‍ය වූයේ නැත. ඒ අනුව 1978 ව්‍යවස්ථාවෙහි පැහැදිලිව සඳහන් වන කරුණක් නම් ජනමත විචාරයක් අවශ්‍ය වන්නේ ජනතාවගේ පරමාධිපත්‍ය පිළිබඳ ගැටලුවක් ඇතිවූ අවස්ථාවලදී පමණයි. ජනතාවගේ පහසුව සඳහා කරන සංශෝධන සඳහා ජනමත විමසුමක් අවශ්‍ය නොවේ. අවශ්‍ය වෙන්නේ 2/3 පාර්ලිමේන්තු බහුතරයකි. ජනමත විමසුමක් අවශ්‍ය වන්නේ ව්‍යවස්ථා සංශෝධනවලදී පමණි. අපේ රටේ කවදාවත් එය අවශ්‍ය වී නැත. තුනෙන් දෙකේ බලයක් ලබා ගැනීමට මේ ව්‍යවස්ථා සංශෝධනයට අපහසු කරුණක් නොවේ. ඒ බලය පහසුවෙන් ලබා ගැනීමට මේ පනත සංශෝධනය කළ හැකියි. එහෙත් නිවැරදි ලෙස මේ පනතේ සංශෝධන දෙස නොබැලුවහොත් සිවිල් ක්‍රියාකාරීන් අනවශ්‍ය ලෙස පිබිදීමක් ඇතිවිය හැකිය. රටට හිතකර ව්‍යවස්ථා සංශෝධනයක් සිදු වෙතැයි යන්න අපේ විශ්වාසයයි.

ඒ සමගම පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් දැනට අක්‍රිය වී ඇති පනත සක්‍රිය කොට ඡන්දයක් ඉක්මනින් පවත්වා ගතහැකි ආකාරයට සංශෝධනය විය යුතුය. පළාත් සභා තවදුරටත් පවත්වාගෙන යන්නේ නම් එය කඩිනමින් කළ යුතුය. දැනට පළාත් සභා අක්‍රියව පවතින්නේ මේ අර්බුදය නිසාවෙනි. එබැවින් මේ සම්බන්ධයෙන් ආණ්ඩුව යම් ප්‍රතිපත්තිමය තීන්දුවකට පැමිණිය යුතුය. තවදුරටත් පළාත් සභා පවත්වාගෙන යන්නේ නම් කඩිනමින් කළ යුතුයි. එමෙන්ම මේවනවිට රොමේෂ් සිල්වා ජනාධිපති නිතිඥවරයාගේ ප්‍රධානත්වයෙන් ඒ පිළිබඳ කමිටුවක් පිහිටුවා ඇත. මෙරටට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය නම් මේ සියලු ජනතා අවශ්‍යතා එකවර සිතා බැලිය යුතුය. ඒ අනුව නව ව්‍යවස්ථාව එකවර සංශෝධනය කළ හැකිය. ඒ පිළිබඳ සමාජ කතිකාවක් ගොඩනැගිය යුතුය. ඒ පිළිබඳ බලධාරීන් නැවත කියවා බැලිය යුතුය. කෙසේවෙතත් ඒ අලුත් ව්‍යවස්ථා සංශෝධන සිදුවන තෙක් දහනව වැනි ව්‍යවස්ථාව සංශෝධනය සිදු කළ යුතුය. එසේ නොවන්නට 2/3 බලයක් තියෙන වැඩි ජන්දයෙන් 19 වැනි ව්‍යවස්ථාව හරහා ජයග්‍රහණය කළ ජනාධිපතිවරයාට රටට වඩා හිතකර ආකාරයේ පාලනයක් කරගෙන යෑමේ නොහැකියාවක් මතුවී තිබිණි. මේ තත්ත්වය වෙනස් කළ යුතු බැවින් අනිවාර්යෙන්ම 19 වැනි ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය. විශේෂයෙන් ඇමැති මණ්ඩලය පත් කිරීම සම්බන්ධයෙන් බලතල සම්බන්ධයෙන් අගමැතිවරයාගේ උපදෙස් විමසිය යුතු නැති අතර අවශ්‍ය අවස්ථාවලදී පමණක් අදහස් විමසීම සම්බන්ධයෙන් සංශෝධනයේ සඳහන් කරුණු ගැන කතා කළ විට එය 1978 ව්‍යවස්ථාවේ අඩංගු වූ කරුණු ලෙස ගත හැකිය. නමුත් රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ යහපාලන රජය යටතේ ඇති කළ සංශෝධන අනුව ජනාධිපතිවරයාගේ වැඩි බලතල ප්‍රමාණයක් පාර්ලිමේන්තුවට පවරා ගැනීම සිදු විය. 19 වැනි සංශෝධනය ඉදිරිපත් කළ අවස්ථාවේ සමහර කොටස් ජනමත විචාරණයකින් තොරව වෙනස් කළ නොහැකි බවට හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන ලබා දුන් පොරොන්දු අනුව එවකට සිටි ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ජනමත විමසුමකට තුඩු නොදෙන සංශෝධන පමණක් සංශෝධනයට ලක්කිරීමට සිදු විය. ඒ නිසා රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ බටහිර ගැති පිරිසට එකතු වී කළ සංශෝධනයේදී ඔවුන්ට ඔවුන් අපෙක්ෂා කළ දේ සිදු නොවීය. ජනාධිපතිවරයා නිකම්ම නිකන් ජනාධිපතිවරයෙක් බවට පත්කර සමස්ත බලය පාර්ලිමේන්තුවට ලබාගැනීමේ උපක්‍රමය ඉටුකරගත නොහැකි විය. මේ ව්‍යවස්ථා විකෘතිය සිදු වූයේ ඒ අනුවය. 19 වැනි සංශෝධනය අනුව මෛත්‍රීපාල ජනාධිපතිවරයාට එතුමාට අවශ්‍ය අමාත්‍ය ධූර තබා ගැනීමට හැකි විය. කෙසේ වෙතත් ජනාධිපතිවරයාට නිශ්චිත අමාත්‍යාංශ කිහිපයක් තිබීම සහ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රමාණය වැනි කරුණු ජනාධිපතිවරයා සතුව තබාගැනීම ඉතා වැදගත් වේ. ඒ අනුව ඇමැති ධූර 104 දක්වා වැඩි වූ අවස්ථාද වෙයි. එහෙත් මේ රජයේ ඇමැති මණ්ඩලය තිහකට සීමා වීම සහ විද්‍යානුකූල ක්‍රමයට අමත්‍යාංශ පත් කිරීම සම්බන්ධයෙන් ජනතාවද සතුටට පත් විය. විෂය පථයන් වෙනස් කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් නොවේ. ජනාධිපතිවරයාගේ සංශෝධනය අනුව ජනාධිපතිවරයාට එම බලතල හිමිවීම වඩා යෝග්‍ය වන්නේ යම් කිසි දිනයක ජනාධිපතිවරයා, අගමැතිවරයා පක්ෂ දෙකක් නියෝජනය කිරීමෙන් තේරී පත්වුවහොත් අර්බුදකාරී තත්ත්වයට පත්වීමට හැකිවෙයි. නොඑසේ නම් ජනාධිපතිවරයාට මේ බලතල පාර්ලිමේන්තුව තුළ තිබීම ඉතා වැදගත් වෙයි. ජනාධිපතිවරයා මත මේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැවතීම ගැටලුවක් නොවෙයි. එහි ගැටලුව මතුවන්නේ ජනාධිපතිවරයෙක් දැඩි අත්තනෝමතික ආකාරයකින් හැසිරුණහොත් පමණි. එය පුද්ගලයන් මත තීන්දු වන කාරණාවකි. ජනතාව ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය බලාපොරොත්තු වන්නේ ජනාධිපතිවරයා මතයි. ඒ නිසා පත්කිරීම් කිරීමේදී ස්වාධීන පුද්ගලයන් කොමිෂන් සභාවලටත් පත්වන්නේ නම් ඉතා වැදගත් වේ. 2020 වැනි සංශෝධනය සිදු වූයේ මේ පවතින අවශ්‍යතා අනුව සංශෝධන කිරීමටයි. මෙය තාවකාලික සංශෝධනයකි. ජනතාව මෙන්ම රජයේද අපේක්ෂාව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමයි. එය ජනතා හිතවාදී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් බවට පත් කරගැනීමට අප වගබලා ගත යුතුය.



කඩවුණු පොරොන්දු යළිත් කරළියට

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉකුත් සතියේ සුවිශේෂී කටයුතු රැසකට සම්බන්ධ විය. පොපි මල් දිනය යෙදී තිබුණේ ඉකුත් 28 දාමය. එදින පෙරවරුවේ ජනාධිපති හමු වූ සේවා මුක්ත භට සංගමයේ සභාපති මේජර් ජනරාල් උපුල් පෙරේරා පළමු පොපි මල ජනාධිපතිවරයාට පැලඳවීය. ඒ අතරේ උපුල් පෙරේරා තම සංගමය වෙනුවෙන් කොවිඩ් අරමුදලට රුපියල් මිලියනයක්ද එදිනම ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව ඩොලර් පන්ලක්ෂයක් (රුපියල් මිලියන 92.5) කොවිඩ් අරමුදලට පරිත්‍යාග කළා.

ලංකාගම සිංහරාජ වනය විනාශ කරමින් දැවැන්ත පාරක් ඉදිකරන බවට සමාජ මාධ්‍ය ජාලවල පළවූ ප්‍රවෘත්තියේ සත්‍ය සොයා ගෙන ජනපති ලංකාගමට ගියේ ඉකුත් සෙනසුරාදාය. එහි ගිය ජනපති දුටු දෙයින් ප්‍රවෘත්තිය බොරු මවාපෑමක් බව පසක් කර ගත්තේය. ඔහු එගම මිනිසුන් සමඟද සාකච්ඡා කර අලුතින් ඉදිකරන මාර්ගය ඉදිකර ගෙන යන්නට උපදෙස් දුන්නා පමණක් නොව ලංකාගම මැදින් ගලා යන ගිංගඟට ඉහළින් ඇති වැල් පාලම වෙනුවට ස්ථිර පාලමක් හදා දෙන්නට ද පොරොන්දු විය.

“සර් අපි ජීවත් වෙන්නෙ අමාරුවෙන්. ලෙඩෙක් අරන් රෝහලට යන්න පාරක් නෑ. මේ ගම වළගම්බා රජ දවස සිට පැවැත එන ගමක්. අපේ තේවතුවල තේ දලු ප්‍රවාහනය කර ගන්න පහසුකම් නෑ. පාසැල් දරුවන් විඳින්නේ මහ දුකක්” ලංකාගම ගැමියෝ ජනපතිට කීවෝය. ඒ අතර පුංචි දරුවෙකු තමන් ඇඳපු චිත්‍රයක් අතැතිව ජනාධිපතිවරයා ඉදිරියේ සිට ගත්තේ ඒ චිත්‍රය ජනාධිපතිට දෙන්නටය.

“මොකක්ද පුතේ ඔය චිත්‍රය” ජනාධිපති පුංචි පුතා ළඟට කැඳවා විමසීය.

දරුවා මොකුත් නොකියා චිත්‍රය ජනපති අතට පත් කළේය.

“ආ... ඔයා ඇඳලා තියෙන්නෙ මගෙ පොඩි කාලේ චිත්‍රයක්නෙ.” යැයි කියූ ජනපති දරුවාගේ හිස අත ගා ආශිර්වාද කෙළේය.

ජීවන වියදම් පිළිබඳ අනුකාරක සභාව පැවැත්වුණේ ඉකුත් සතියේ ජනපතිගේ ප්‍රධානත්වයෙනි. “කහ හා තවත් කෘෂි බෝග කීපයක් ආනයනය සීමා කිරීමෙන් ඒවායේ මිල ඉහළ ගිය බව ඇත්ත. එහෙම කියල නැවත මේවා ආනයනය කරන්න ඉඩ දෙන්න බෑ. අපේ රටේ කෘෂි බෝගවලට හොඳ මිලක් ලබා දී ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් ගත් මේ තීරණ වෙනස් කරන්න බෑ” ජනාධිපති සිටි ස්ථාවරය එහිදී කීවේය.

“ඔව් සර්, දැන් කව්පී, උඳු, රටකජු, තල, කුරක්කන් සහ ලූනු වගාවන් දැන් සාර්ථක වී තිබෙනවා. ඒවත් ආනයනය කරන්න අවශ්‍ය වෙන්නෙ නෑ.” නිලධාරීන් ජනාධිපතිවරයාට පෙන්වා දුන්නා.

සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඉකුත් සතියේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු මූලස්ථානයට ගියේ එහි කටයුතු සොයා බලන්නටය.

“අපේ ගැමි ජනතාව ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලට ණය වෙන්නෙ රජයේ බැංකු සාමාන්‍ය ජනතාවට සමීපව කටයුතු කරන්නෙ නැති නිසයි. ප්‍රාදේශීය බැංකුවලට පුළුවන් ජනතාවට සමීප වෙන්න. ගැමි ජනතාව ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලෙන් බේරා ගන්න ප්‍රාදේශීය බැංකුව ගැමියාට සමීපව ඔවුන් ගේ අවශ්‍යතා හොඳින් හඳුනා ගන්න. ඔවුන්ගේ ආර්ථික කටයුතුවලට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හොඳ මඟ පෙන්වන්නෙක් වෙන්න.”

රාජ්‍ය අමාත්‍යවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය. ෂෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යවරයා ඉකුත් තුන්වැනිදා මාලදිවයිනේ මහ කොමසාරිස් හමු වූයේ කොළඹ පිහිටි ඔහුගේ කාර්යාලයේදීය. දෙරට අතර පවතින සුහද සබඳතාව තවදුරටත් ශක්තිමත් කර ගැනීම මෙම හමුවේ අපේක්ෂාව විය.

ශ්‍රී ලංකාවේ සිටින මාලදිවයින් වැසියන් ගේ සුබ සාධන කටයුතු පිළිබඳ අවධානය යොමු කරන ලෙසද දෙරටම පොදු ධීවර, සංචාරක කටයුතු ප්‍රවර්ධනයට හැකි සෑම සහයක්ම ලබා දෙන බව මාලදිවයින් මහ කොමසාරිස් ඕමාර් අබ්දුල් රෂාක් රාජ්‍ය අමාත්‍යවරයාට කීවේය.

අගමැති මහින්ද රාජපක්ෂ ඉකුත් දෙවනදා හදිසියේම ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් නිල නිවසට ගියේය. ඒ අභාවප්‍රාප්ත හිටපු ඉන්දියානු ජනාධිපති ප්‍රතාබ් මුකර්ජි වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්නටය. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අද පවතින දැඩි මිත්‍රත්වයට එක් හේතුවක් වූයේ හිටපු ජනාධිපති ප්‍රතාබ් මුකර්ජි බව පෙන්වා දුන් අගමැතිවරයා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් නිල නිවසේ ඇති අමුත්තන්ගේ සටහන් පොතේ මුකර්ජි හිටපු ජනාධිපතිවරයා සම්බන්ධයෙන් විශේෂ සටහනක් තැබීය.

මේ අතර මෛදිනම ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අකිරා සුගියාමා අරලිය ගහ මැදුරේදී අගමැති මහින්ද රාජපක්ෂ හමු විය. මැතිවරණ ජයග්‍රහණයත් නැවත අගමැති ධුරයට පත්වීම ගැනත් තානාපතිවරයා අගමැතිවරයාට සුබ පැතීය. මෙරටේ යටිතල පහසුකම්, ජල අවශ්‍යතාව, අපජල කළමනාකරණය, කෘෂි කර්මාන්තය, මානව සම්පත් සංවර්ධනය හා ත්‍රස්තවාදය පිටු දැකීම සඳහා අවශ්‍ය වන පරිදි ආධාර සැපයිය හැකි බව ජපාන තානාපතිවරයා මෙහිදී අවධාරණය කෙළේය.

“කොවිඩ් වසංගත අවධානම දුරු වූ විට ජපාන සංචාරකයන් ශ්‍රී ලංකාවට යොමු කිරීමට අපි මැදිහත් වෙනවා. දිගුකලක් දෙරටේ පවතින මිතු දම නව මානයකින් ඉහළට ගෙන යාමට නව රජය සමඟ එක්ව කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.” යැයි ජපාන තානාපති සුගියාමා සඳහන් කෙළේය.

ජනාධිපති ඉකුත් සතියේ ඉඩම් කළමනාකරණ රාජ්‍ය ව්‍යාපාර, ඉඩම් හා රාජ්‍ය දේපළ රාජ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් කැඳවා තිබුණි. අමාත්‍යවරු මෙන්ම අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් ඊට සහභාගි වී සිටියහ.

“මම රට පුරාම චාරිකා කරලා ඒ හැම ප්‍රදේශයකම ජනතාව සමඟ සාකච්ඡා කළා. නුඟක් මිනිස්සු තමන් පදිංචි ඉඩමට ඔප්පුවක් නැතිව පීඩාවට පත්වෙලා ඉන්නෙ. සමහර අයට වගා කරන ඉඩමට නිරවුල් ඔප්පු නෑ. මේ ගැටලුව වහා විසඳිය යුතුයි. නිරවුල් ඉඩම්වලට මාස තුනක් ඇතුළත ඔප්පු ලබා දෙන්න කටයුතු කරන්න ඕනේ” ජනාධිපති එහිදී අවධාරණය කෙළේය. ආයතන ප්‍රධානීන් ලෙස ජනාධිපතිවරයා පත් කර ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් ඉකුත් සතියේ විවිධ විවේචන එල්ල වෙමින් තිබුණි. ඇතැම් ආයතන ප්‍රධානීන් වෙනස් කර ලෙස ජනාධිපතිවරයාට බලපෑම් කෙරෙමින් තිබුණි.

“මේ පත්වීම් මම සිදු කළේ රටේ ස්වෛරීභාවය ජාතික ආරක්ෂාව සහ “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කිරීමට වැනි සුවිශේෂී කරුණු සලකා බලලයි. ගැඹුරින් සිතා බලා සිදු කර ඇති මෙම පත්වීම් වෙනස් කොකරන බවද එවැනි බලපෑමක් කරන්නට කටයුතු නොකරන ලෙසද නිවේදනයක් නිකුත් කරමින් ඉල්ලීමක් ද කර තිබුණේය.

තම ගෙදර බල්බයේ ස්විචය හා ටිප් ස්විචය ගැන පමණක් දන්නා බව කියූ විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම ඉකුත්දා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ හමු වූයේ මෙරට විදුලි ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා මූල්‍ය හා තාක්ෂණ සහය ලබා ගැනීම සඳහාය. විදුලිබල අමාත්‍යාංශයේදී පැවැති මෙම හමුවේදී දෛනිකව ඉහළ යන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ස්ථාවර පිළියම් යෙදීමේ අවශ්‍යතාව අමාත්‍යවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

“පැය 24ම අඛණ්ඩවම විදුලිය සපයන දකුණු ආසියාවේ රටවල් අතර ප්‍රමුඛයා ශ්‍රී ලංකාවයි. ශ්‍රී ලංකාවේ විදුලි ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ඉන්දියාවේ මූල්‍ය හා තාක්ෂණ සහය ලබා දෙනවා. ඒ වාගේම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් තම රටේ ඉංජිනේරු ඥානයද ආයෝජකයන්ද යොමු කරන බව” ශ්‍රී ලංකාවේ ඉන්දීය කොමසාරිස් මෙහිදී සඳහන් කෙළේය.

අමාත්‍ය ආචාර්ය බන්ධුල ගුණවර්ධනයන්ට මෙවර හිමි වී ඇත්තේ වෙළඳ අමාත්‍යාංශයයි. එහෙත් ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයට දක්වන්නේ ඇල්මකි. තමන් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විදියට තාක්ෂණ ආයතන යේදී ආරම්භ කළ ව්‍යාපෘතියක් නිසා සියයට සීයක්ම දේශීයව නිෂ්පාදනය කළ බැටරියක් ඉකුත්දා පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමට රැගෙන ආවේ එහි අගය ගැන ඇමැතිවරුන්ට කියන්නටය.

“මේ බැටරිය 100% දේශීය නිෂ්පාදනයක්. මේක නැවත නැවත ආරෝපණය කරලා පාවිච්චි කරන්න පුළුවන්. ආරෝපණය කරන්නේ සූර්ය ශක්තියෙන්. අවුරුදු හයක වගකීමක් එක්ක මේ බැටරිය දැන් මිලදී ගන්න පුළුවන්. විදේශීය බැටරිවල මිලෙන් 50%කට අඩුවෙන් මේ බැටරිය දෙන්න පුළුවන්.” යනුවෙන් බන්ධුල අමාත්‍යවරයා බැටරිය ගැන පුරාජේරුව ඇමැතිවරුන්ට කීවේය.

“වෙළඳ පොළට නිකුත් කරන්න පෙර ඇමැතිවරු මේ බැටරිය පාවිච්චි කරන්න. එතකොට ඇමැතිවරුන්ගේ ගෙවල්වල විදුලිය විසන්ධි වීම් නැති වෙයි.” ජනාධිපතිවරයා කීවේය.

මිරිජ්ජවිල උද්භිත උද්‍යානය බලන්න සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග ඉකුත්දා හම්බන්තොට ගියේ ඔහුගේ රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක සමඟය.

“මේක ලස්සන තැනක්. මේ තැන ගැන හොඳ ප්‍රචාරයක් දෙන්න.” ප්‍රසන්න එහිදී නිලධාරීන්ට කීවේය.

“අපේ රටේ මිනිස්සු මේ වගේ ලස්සන තැන් බලන්න රස විඳින්න කැමතියි. ඩී.වී. චානක කීවේ ප්‍රසන්න අමාත්‍යවරයා ගේ ප්‍රකාශයට සහය පළ කරමින්ය.

සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස ඉකුත් සතියේ වැඩි කාලයක් ගත කළේ තමන්ට මැතිවරණයේදී සහය දුන් ජනතාවට කෘතඥතාව පළ කිරීමටය.

“මේ ආණ්ඩුව බලයට ආවේ පොරොන්දු මල්ලක් දීලානෙ. මේ පොරොන්දු ඉටු කරන්න අපි ආණ්ඩුවට කල් දී බලාගෙන ඉන්නවා” සජිත් තමන්ට සහය දුන්නු අය සමඟ කීවේය.

“මේ ආණ්ඩුව කියපු තරම් දේවල් කරන්නෙ නැනේ.” මරික්කාර් සජිත්ට කීවේය.

විපක්ෂ නායක කාර්යාලයේ සෑම පෝය දිනකම ධර්ම දේශනාවක් පැවැත්වීමට තීරණය කර ඉකුත් පෝදා ද ධර්ම දේශනය පැවැත්විණි. ඊට සහභාගි වී සිටි අශෝක අබේසිංහ කීවේ “ඔබතුමා විපක්ෂ නායක කාර්යාලයට බදාදා එනවා කියල තමයි පත්‍රවල තිබුණේ” කියලයි. “ජනතාවට සේවය කරන්න නැකත් බලන්න බෑ. මම ඒකයි මට පුළුවන් මුල්ම දවසේ විපක්ෂ නායක කාර්යාලයේ වැඩ පටන් ගත්තේ” සජිත් කීවේය.

“හැම පැත්තෙන්ම පරිසරය විනාශ කරනවා. සිංහරාජය විනාශ කරනවා. වගුරු බිම් ගොඩ කරනවා” ජේ. සී. අලවතුවල සජිත්ට කීවේය.

“මේ ආණ්ඩුව ඉස්සෝ වගාවට කියල ආනවිලුන්දාව තෙත් බිම් ගොඩ කරනවා” හේෂා විතානගේද කතාවට හවුල් විය.

“අන්තිමට ඩෝසර් ඩැයිවර් කෙනෙක්ට වරද පටවලා වගකිව යුතු අය බේරෙන්නයි හදන්නේ” අශෝක අබේසිංහ කීවේ සිනාසෙමින්ය.

මේ කතා අහගෙන සිටි සජිත් “පරිසරය විනාශ කරලා රටක් හදන්න බෑ” යැයි කීවේය.

වෙබ් මාධ්‍යවේදී චතුරංග ඩෙස්මන් අල්විස් පොලිසිය අත්අඩංගුවට ගත්තේ අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ලක් අනුවය. සජිත් ඩෙස්මන් වෙනුවෙන් නීතිඥ සහය ලබා දීමට කටයුතු කර ඩෙස්මන්ගේ නිවසට දුරකථනයෙන් කතා කළේය. “අපි චතුරංග වෙනුවෙන් පෙනී සිටිනවා. මම චතුරංග වෙනුවෙන් අධිකරණයේ පෙනී ඉන්න නීතිඥ කණ්ඩායමක් සූදානම් කළා” යැයි සජිත් චතුරංග ගේ බිරිඳට කීවේය.

සමගි ජන බලවේගයේ හරින් ප්‍රනාන්දුට ද ඉකුත් සතියේදී අලුත් වගකීමක් පැවරුණේය.

“හරින් දැන් අපි ගමට බහින්න ඕනේ. රට වටේ ගමින් ගම ගිහිල්ල ප්‍රාදේශීය මට්ටමින් පක්ෂය ශක්තිමත් කරන යාන්ත්‍රණය හදන්න.” සජිත් හරින්ට කීවේය.

“මට ඒක කරන්න පුළුවන් බිම් මට්ටමේ ඉඳලා. පක්ෂය ශක්තිමත් කරන වැඩපිළිවෙළක් මට තිබෙනවා.” හරින් සජිත්ට උත්තර දෙමින් අලුත් වගකීම බාර ගත්තේය.

එජාප නායකත්වය ගැන ඉකුත් සතියේද දැඩි කතාබහක් ඇති වූයේ රනිල් වික්‍රමසිංහ හා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයන් අතරය. රනිල්ට හිතවත් මේ පිරිස එජාප නායකත්වය අපේක්ෂා කරන නව දෙනෙකු ගැන ඔවුන්ගේ නම් කියමින් එකිනෙකා විවේචනය කළේය.

“කරු ඉස්සරහට තල්ලු කරන්නේ මීට කලින් නායකත්වය ඉල්ලපු කොළඹ ප්‍රබලයෙක්ලු නේද? දැන් රුවන් විජේවර්ධනත් නායකත්වය ඉල්ලනවා.’ අයෙක් කීවේය.

රුවනුත් අනෙක් අය වගේ නායකත්වය ඉල්ලා ගෙන කැම්පේන් කරනවා ඇති. ඒකට එයාටත් අයිතියක් තියෙනවානේ” රනිල් ඊට පිළිතුරු දෙමින් කීවේය.

“රුවන් නායක්වයට පත් වුණොත් ඔහුට වඩා වයසින් වැඩි අයට අභියෝගයක් වෙයි කියල සමහරු කියනවා”

“රුවන්, අකිල දෙන්නාම එක වයසේ අයයි. ඔවුන්ට වඩා වයස වැඩි අයට පක්ෂයේ නායකත්වයට පත් වෙන්න බැරි නම් පක්ෂයේ ඉහළ තනතුරක් ලබා ගන්න උත්සාහ කරන්න ඕනේ.” රනිල් වික්‍රමසිංහ කීවේ තම කැමැත්ත රුවන් හෝ අකිලට තිබෙන බවට ඉඟියක්ද කරමින්ය.

“එජාප ව්‍යවස්ථාව අනුව පක්ෂයේ නායකත්වයට එන්න පුළුවන් වෙන්නේ බෞද්ධයකුට විතරද?” තවත් ප්‍රශ්නයක් රනිල්ට යොමු විය.

“නෑ එහෙම එකක් නෑ. පක්ෂයේ සාමාජිකයෙක් නම් පක්ෂ නායකත්වයට පත්වෙන්න ඔහු සුදුස්සෙක් වෙනවා.” රනිල් කීවේය.

සජිත් හරින් උස්සා තබයි

බැංකුවට; ගමට යන්නැයි ෂෙහාන් ගෙන් උපදෙස්



බැටරියක් රැගෙන ඇමැති මණ්ඩල රැස්වීමට ආ බන්දුල



එජාපයේ නායකත්වයට අකිල, රුවන් සුදුසු බවට රනිල්ගෙන් ඉඟියක්

සිලෝන් ටීවල දසාව හොඳ කළ තේ වෙන්දේසිය

කළමනාකරණ අධ්‍යක්ෂ
අනුර අතුකෝරල

අප කම්හලේ තේ නිෂ්පාදන වෙක් ජනරජය, මැලේසියාව, චීනය, ජපානය යන රටවල්වලට අපනයනය කරනවා. අගය එකතු කළ තේ වර්ග සඳහා හොඳ මිලක් මෙන්ම ඉල්ලුමක්ද තියෙනවා.

● ලලිත් චාමින්ද

සිලෝන් ටී ගැන කියු විට ලෝකයේ නොදන්නා රටක් නොමැති තරම් ය. කොටින්ම කිවහොත් සිලෝන් ටීවල රසයට විදේශිකයන් වහ වැටුණේ අතීතයේ සිටම ය. අපේ රටේ තේවල රසය, ප්‍රමිතිය මෙන්ම ගුණාත්මක බව නිසාම තේ සඳහා වර්තමානයේද ඇත්තේ ඉහළ ඉල්ලුමකි. තේ දලු කිලෝවක් සඳහාද වෙනත් කිසිදු කාලයක නොලැබූ මිලක් තේ වතුහිමියන්ට ලැබී ඇත. එපමණක් නොව ලංකා තේ වෙන්දේසියේදී ඉහළ මිල ගණන්වලට අලෙවි වන්නේය. කොටින්ම කිවහොත් තේ කර්මාන්තයට හිමිවී ඇත්තේ හොඳ කළ දසාවකි. අපි මේ කියන්නට යන්නේ සිලෝන් ටී නාමය ලෝකයා ඉදිරියේ බැබළවීම සඳහා කටයුතු කරන තේ කම්හල් හිමියකු ගැනය. ඔහු අනුර අතුකෝරල ය. අනුර අතුකෝරල පිටිගල අතුකෝරල සමූහ ව්‍යාපාරයට අයත් අතුකෝරල තේ කර්මාන්ත ශාලාවේ කළමනාකරණ අධ්‍යක්ෂවරයාය.

අගෝස්තු මස 26 වැනි දින කොළඹ පැවති තේ වෙන්දේසියේදී අතුකෝරල ගෘප් සුපර් වෙළෙඳ නාමය යටතේ OPA තේ කිලෝවක් සඳහා රුපියල් 920ක උපරිම මිලක් වාර්තා කිරීමට අතුකෝරල තේ කාර්මාන්ත ශාලාවට හැකිවිය.

ප්‍රමිතියෙන් හා ගුණාත්මක බවින් යුතු තේ නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් අතුකෝරල තේ කර්මාන්ත ශාලාව සඳහා සුවිශේෂී සම්මාන රැසක් හිමිවී ඇත. එපමණක් නොව ජාත්‍යන්තර තේ අලෙවියේ ජයග්‍රහණ රැසක්ද හිමිකරගෙන ඇත. අයි.එස්. ඕ. 22000,2005 එච්.ඒ.සී.සී.පි යන ජාත්‍යන්තර තත්ත්ව සහතිකයන්ට අනුකූලව පවත්වාගෙන යන මෙම තේ කර්මාන්ත ශාලාවේ තේ වර්ග ගණනාවක් නිෂ්පාදනය කරනු ලබයි.

මෙරට පහතරට තේ නිෂ්පාදනයෙන් සියයට 40ක් පමණ නිෂ්පාදනය කරනු ලබන්නේ OPA ශ්‍රේණියේ තේ ය. මේ නිසා මෙකී තේ කිලෝවක් සඳහා තේ වෙන්දේසියේදී උපරිම මිලක් ලැබීම පහතරට තේ නිෂ්පාදකයන් ලැබූ ජයග්‍රහණයකි. එමෙන්ම මෙය රටේ විදේශ විනිමය වැඩිවීමටද හේතුවකි. පසුගිය කාලයේ OPA ශ්‍රේණියේ තේ කිලෝවක් සඳහා තේ වෙන්දේසියේදී ලබා ගැනීමට හැකි වූයේ රුපියල් 500ක 600ක මුදලකි. එහෙත් අනුර අතුකෝරල වැනි තේ කම්හල් හිමියන් නිසා මෙකී තේ වර්ගයට තේ වෙන්දේසියේදී උපරිම මිලක් ලැබී ඇත. එය අහඹු සිදුවීමක්ද නොවේ.

නියමිත ප්‍රමිතිය හා ගුණාත්මක බවින් යුතුව තේ නිෂ්පාදනය කිරීම ඊට හේතුවයි.

අනුර අතුකෝරල මහතා සිය නිෂ්පාදන කටයුතු කරගෙන යන්නේ තේ ටුවරිසම් නැමති සංකල්පය යටතේය. කොටින්ම කිවහොත් අතුකෝරල තේ කර්මාන්ත ශාලාව තේ සම්බන්ධ විවිධ පර්යේෂණය කරන පුද්ගලයන්ට විශ්වවිද්‍යාලයක් වැනිය. මෙකී තේ කම්හල් පරිශ්‍රය තේ පැළ තවානක්, තේ වත්තක්, තේ කර්මාන්තශාලාවක් හා තේ අලෙවි මධ්‍යස්ථානයකින් සමන්විත වේ.

තේ අලෙවි මධ්‍යස්ථානය විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත් ස්ථානයකි. කොරෝනා වසංගතයට පෙර එනම් මෙකී වර්ෂයේ මාර්තු 17 වැනි දින වනතෙක්ම විදේශීය සංචාරකයන් පිටිගල පිහිටි මෙකී තේ අලෙවි මධ්‍යස්ථානය වෙත පැමිණියහ. විශේෂයෙන්ම අතුකෝරල තේ කම්හලේ තේ නිෂ්පාදනවල ප්‍රමිතිය මෙන්ම අගය එකතුකළ තේ වෙන්දේසිය තේ නිෂ්පාදන නිසා උපරිම මිලක් ලැබී ඇත.

තේ වෙන්දේසියේදී අතුකෝරල ගෘප් සුපර් OPA තේ කිලෝවකට රුපියල් 920ක උපරිම මිලක්

අතුකෝරල තේ කර්මාන්ත ශාලාවේ කළමනාකරණ අධ්‍යක්ෂක අනුර අතුකෝරල මහතා ඒ පිළිබඳ මෙසේ අදහස් දැක්වීය.

"තේ නිෂ්පාදනය සඳහා අපි යොදා ගන්නේ ගුණාත්මක බවින් උසස් අමු තේ දලු. අපේ වතුවලින් සියයට 20ක් විතර අමු තේ දලු සපයා ගන්නවා. ඉතිරි සියයට 80 පිටිගල අවට පෞද්ගලික වතුවලින් සපයා ගන්නවා. අපේ කම්හලට තේ දලු සපයන පුද්ගලයන් 1200ක් විතර ඉන්නවා. තේවලට දැන් හොඳ ඉල්ලුමක් ඇතිවෙලා තියෙනවා. පසුගිය කාලයේ නොයෙකුත් හේතු නිසා සිලෝන් ටී නාමයට කැළලක් ඇතිවෙලා තිබුණා. නමුත් මගේ බලාපොරොත්තුව වුණේ තේ නිෂ්පාදනයේදී ප්‍රමිතිය වැඩි දියුණු කරගැනීමයි. එහිදී විශේෂයෙන් අගය එකතුකළ තේ නිෂ්පාදනය කිරීම සඳහා කුරුඳු

ඉඟුරු, දොඩම් ආදිය අපේ වතුවල වගා කරනවා. ඒ නිසා ඒවායේ ප්‍රමිතිය ගැන ගැටලුවක් නැහැ. කාබනික තේ, නිෂ්පාදනය කරනවා. තේවල ප්‍රමිතිය හා ගුණාත්මක භාවය තමයි තේ වෙන්දේසියේදී ගැනුම්කරුවන්

සහතික පත්‍රයක්

සලකා බලන්නේ. ඒ නිසා තමයි මෙවර තේ වෙන්දේසියේදී OPA ශ්‍රේණියේ තේ වර්ගය සඳහා උපරිම මිලක් ලැබුණේ"

තේ මිල වැඩි වීම සඳහා කොරෝනා සමයේ හඳුන්වා දුන් ඔන්ලයින් තේ වෙන්දේසියද රුකුලක් වී තිබේ. මේ නිසා විදේශිකයන්ට පවා තේ මිලදී ගැනීමට හැකිවී ඇත.

පහත රට තේ කම්හල් හිමියන් විසින් ශ්‍රේණි 18කට අයත් තේ නිෂ්පාදනය කරනු ලබන අතර අතුකෝරල තේ කර්මාන්ත ශාලාව මගින් මාසයකට තේ කිලෝ 50000ක් 60000ක් නිෂ්පාදනය කරයි. අනුර අතුකෝරල තේ කර්මාන්තයට යොමු වී ඇත්තේ රබර් වගාව අත්හැරීමෙනි. ඒ ගැන ඔහු මෙසේ කීවේය.

" ඒ කාලයේ අපි රබර් වගාව තමයි කළේ. රබර් මිල අඩුවීමත් සමග මේ ප්‍රදේශයේ ගොඩක් අය රබර් ගලවලා තේ වගාව සඳහා යොමු වුණා. මීට වසර 30කට කලින් තමයි නවීන පන්නයේ තේ කර්මාන්තශාලාවක් අපි පිටිගල ආරම්භ කළේ. ඒක තමයි අපේ ව්‍යාපාරවල හැරවුම් ලක්ෂය වුණේ. මගේ තාත්තා ඩී. ඩබ්ලිව් අතුකෝරල. තාත්තා සහ මම එකතුවෙලා තේ කර්මාන්ත ශාලාව ආරම්භ කළා. මීට වසර 09කට පෙර තාත්තා අභාවප්‍රාප්ත වුණා. මට අවශ්‍ය වුණේ අපේ කම්හලේ තේ නිෂ්පාදන ජාත්‍යන්තරයට ගෙනියන්නයි. අපේ තේවල රසය ලෝකයා ඉදිරියට ගෙනියන්නයි. ඒ වෙනුවෙන් මම කැප වුණා. පසුව අපේ තේ නිෂ්පාදන සෘජුව අප සමාගම විසින්ම අපනයනය කිරීමට කටයුතු කළා. දැනට අප කම්හලේ තේ නිෂ්පාදන වෙක් ජනරජය, මැලේසියාව, චීනය, ජපානය යන රටවල්වලට අපනයනය කරනවා. අගය එකතු කළ තේ වර්ග සඳහා හොඳ මිලක් මෙන්ම ඉල්ලුමක්ද තියෙනවා. ඒ විතරක් නෙවෙයි අපේ තේ අලෙවි මධ්‍යස්ථානයට පැමිණෙන විදේශිකයන් සිය රටවලට ගොස් ඔන්ලයින් මගින් අපේ තේ නිෂ්පාදන මිලදී ගැනිමට කටයුතු කරනවා "

අතුකෝරල තේ කර්මාන්ත ශාලාව ඔවුන්ගේ තේ නිෂ්පාදන වෙනුවෙන් ලබා තිබෙන විවිධ තත්ත්ව සම්මාන සහ සහතිකවලට එම තේ ප්‍රමිතියෙන් හා උසස් ගුණාත්මක බවෙන් යුතු වීමයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් ලබා දෙන C.Q.C. තනි තරුව තත්ත්ව සහතිකය, මතුගම කලාපයේ හොඳම තේ කර්මාන්ත ශාලාව, දකුණු පළාතේ විශාල ව්‍යාපාර අංශයේ රන් සම්මානය, ජාතික මට්ටමේ නිෂ්පාදන සඳහා ලෝකඩ හා කුසලතා සම්මාන, ජාතික පලදායිතා විශේෂ කුසලතා සම්මානය, කම්කරු දෙපාර්තමේන්තුවේ සමාජ කථිකාවත විශිෂ්ටතා රන් සම්මානය යන සම්මාන හා තත්ත්ව සහතික අතුකෝරල තේ කර්මාන්ත ශාලාව වෙත පසුගිය කාලයේදී හිමි විය. එපමණක් නොව මෙකී තේ කර්මාන්ත ශාලාව ගාල්ල දිස්ත්‍රික්කයේ ආදර්ශමත් තේ කම්හල ලෙස තේ මණ්ඩලය විසින් තෝරාගෙන තිබේ. "ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් පාර්ලිමේන්තුවේ 9 වැනි සැසිවාරය විවෘත කරමින් පැවැත්වූ කතාවේදීද සිලෝන් ටී නාමය රැකගෙන නිෂ්පාදන කටයුතු කළ යුතු බව පැවසුවා.

අපි මුල සිටම ප්‍රමිතියෙන් ගුණාත්මක භාවයෙන් යුතුව තේ නිෂ්පාදනය කළා. ඒ නිසා අපේ රටේ තේවලට ඉහළ මිලක් ලැබී තිබෙනවා.

දැන් ඇමෙරිකාවෙන් කතා කරලා අපේ තේ මිලදී ගන්නා තත්ත්වයක් ඇතිවෙලා තියෙනවා. වත්මන් රජයේ ජනාධිපතිතුමා, අගමැතිතුමා, වැවිලි කර්මාන්ත ඇමති දොස්තර රමේෂ් පතිරණ යන මහත්වරු තේ කර්මාන්තය සඳහා රජයේ විශේෂ අනුග්‍රහය ලබාදී තිබෙනවා.තේ කර්මාන්තයේ දියුණුවට රජය විශාල කාර්යභාරයක් කරනවා. ඔන්ලයින් තේ වෙන්දේසිය ඉතා සාර්ථක වීමට එයත් හේතුවක්" අනුර අතුකොරල වැඩිදුරටත් එසේද පැවසීය

හතර වටේ GOසිIP

● භක්ති මෙන්ඩිස් විසිනි
bakthid@gmail.com

ගිනි ඇවිළෙන ඇමැති සටන්



රටේ පාලකතුමන් එසේත් නැත්නම් රජතුමන් රට යහපත් කිරීම සඳහා ඉතා හොඳ තීරණ ගනිමින් සිටින බව ජනතාව අතරින් නිතර කියවෙනවා කියන්නේ. නමුත් මැති ඇමැති ගොල්ලන්ගේ සමහර ක්‍රියා කලාපයන් ජනතාව දැඩි විවේචනයට ලක් කරන බව මුහුණු පොතේ සඳහන් වෙනවා.

ඇමැතිවරුන් කණ්ඩායම් දෙකකට පත් කර සිටීම නිසා දැන් දැන් ඔවුන් අතර නොයෙක් සටන් ආරම්භ වෙලයි කියලයි කියන්නේ. රාජ්‍ය අමාත්‍යවරුන්ට ඔවුන්ට අයිති විෂය රජතුමන් විසින් වෙන් කර ඇතත් ඊට අදාළ කැබිනට් ඇමැතිවරුන් සමග රාජ්‍ය ඇමැතිවරුන් ගැටුම් ආරම්භ කර ඇති බව කනින් කොණින් ආරංචියි.නිල් පාටියේ ඉඳල කොළ පාටියට ගිහිල්ලා නැවතත් නිල් පාටියට එකතුවෙලා ඉන්න කුරුණෑගල සහ ගම්පහ පළාතේ දෙදෙනකු සැරටම පංගු බේරනවා කියලයි කියන්නේ.

අතර මෙන්ම දේශපාලන නායකයන් අතරට පැමිණෙන්නේ නැතැයි කියලත් ආරංචියි.

රූප පෙට්ටිම හොයන ගාල්ලේ දියවන්නා හාදයා

දියවන්නාවට පැන ගන්න තමන්ගේ ප්‍රතිපත්තිය මෙන් ම තමන් නියෝජනය කළ පාටිය කිහිප සැරයක්ම මාරු කළ හාදයන් ගැන ජනතාවට හොඳ මතකයක් තියෙනවලු. මේ ආකාරයට අත්තෙන් අත්තට පනිමින් මෙවර මහ මැතිවරණයෙන් ද දියවන්නාවට පැනගත්ත හාදයන් කිහිප දෙනෙක් ම ඉන්නවනේ. නිල් පාටියෙන් කොළ පාටියට පැනලා කොළ පාටියෙන් පුතාණෝගේ පාටියට පැනගත්ත ගාල්ලේ හාදයා ගැන අමුතු අමුතු කතා බහ මේ දිනවල කියවෙනවා නේ.

රජතුමන්, යුව රජතුමන් සහ වර්තමාන රජය දැඩි ලෙස විවේචනය කරන්නට අමුතුම ගේමක් මේ හාදයා ගහනවා කියලයි ආරංචිය. දියවන්නාවට මෙවර බොහොම අමාරුවෙන් පැනගත්ත මෙතුමන් මේ දිනවල දිනපතාම මාධ්‍ය ඉදිරියට එන්න පටන් අරගෙනලු.

ඔහු යන යන සෑම තැනකටම රූපවාහිනි නාළිකාවල ලෝගෝ සහිත මයික්‍රෆෝන් කිහිපයක්ම රැගෙන යනව කියලයි කියන්නේ.

කටකාරි හැඩකාරි සද්දේ දාලා අනුනවයෙන් දිවි බේරේ

පුතාණෝගේ පාටියෙන් දියවන්නාවට තරග කර පරාජය ලැබූ කිහිප දෙනකුම මේ දිනවල අමුතුම කතා කියනවා කියලයි ආරංචිය. තමන්ට මනාප ලබාදුන් ජනතාවට ස්තුති කිරීම සඳහා මේ අයගෙන් බොහෝ දෙනකු ජනහමු පවත්වනවා කියන්නේ.

මේ ජනහමුවලට පුතාණෝට ආරාධනා නොලැබීම පිළිබඳවත් පාටිය අතර අවුලක් තියනවා කියලයි ආරංචිය.

පුතාණෝගේ පාටියෙන් කොළඹට තරග කළ අලි පාටියෙන් පැනගත්ත රූමත් කාන්තාව බොහෝ දෙනාට අමතකයි කියලයි කියන්නේ.

ගිය සතියේ දිනක මේ කාන්තාව කොළඹ නගර ආසන්නයේ පැවැති ජන හමුවකදී ගුටි නොකා බේරුණේ නූලෙන් කියලයි කියන්නේ.

පොහොට්ටු පාටියට මනාපය ලබාදුන්නේ මනස විකෘති පුද්ගලයන් යැයි ජනහමුවක් අමතා මෙම කාන්තාව ප්‍රකාශ කිරීමත් සමග ජනහමුවේ සිටි වැඩි පිරිසක් ඇයට විරුද්ධ වී ජනහමුව නතර කරාලු.

නායකයාට පිදේනි දෙන කොළ පාටියේ පස්දෙනා

කොළ පාටියේ නායකයා සහ ගෝල නායකයන් අතර නොයෙක් නොයෙක් ගැටුම් ඇති වෙනවා කියලයි ආරංචිය. මේ පාටියේ ඇත්තන් බොහොමයකට ම ගම් බිම්වලට යන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙනවා කියලත් කියන්නේ. කොළ පාටියේ නායකතුමන් නායකත්වය වෙන අයකුට බාර දෙනවා කියල ප්‍රකාශ කිරීමත් සමඟ කොළ පාටියේ මූලස්ථානය පැත්තෙන් රස කතා ඇසෙනවලු.

අනාගත නායකත්වයට තරග කරන පස් දෙනෙක් හරි හරි වැඩ කරනවා කියලයි ආරංචිය.

මොවුන් පස් දෙනාගෙන් දෙදෙනකු නායකතුමන්ට නිදා ගන්නවත් ඉඩක් ලබාදෙන්නේ නැතිලු.

මහ රැට දුරකතන ඇමැතුම් ලබාදෙමින් ආණ්ඩු පක්ෂයේ නොයෙක් නොයෙක් වැරදි කියනව කියලයි කියන්නේ.

නායකත්වයට පොර අල්ලන අම්පාර පැත්තේ හාදයෙක් නායකතුමන්ව විනෝද චාරිකාවකට සහභාගි කරවගන්න මහ උනන්දුවකින් ඉන්නවා කියලත් ආරංචියි. මේ අතරින් තවත් දෙදෙනකු නායකතුමන් සහභාගි වන ජනතා හමු සියල්ලටම ආරාධනා නැතිවම සහභාගි වෙනවලු.

හලෝ ගොළුවූ දියවන්නා සාමාජිකයා

පරිසරය එක්ක නිතර නිතර ගැටෙන දියවන්නා සාමාජිකයකු වයඹ පැත්තේ හරිම ප්‍රසිද්ධයි කියලයි ආරංචිය. පොහොට්ටු පාටියෙන් මෙවර දියවන්නාව නියෝජනය කරන මොහුට පරිසරවේදීන්ගෙන් දැඩි විරෝධතාවයක් එල්ල වෙලයි කියලයි කියන්නේ.

ජනමාධ්‍යවේදීන් සහ පරිසරවේදීන් අවස්ථා කිහිපයකදීම මොහුව දුරකතනයෙන් සම්බන්ධ කර ගැනීමට උත්සහ කළත් ඔහු නිහඬව සිටිනවා කියල ආරංචියි. මොහුට මුහුණුපොත මෙන් ම සමාජ මාධ්‍යවලින් කාලයක් දැඩි විරෝධතාවයක් එල්ල වුණා කියලත් කියවනවා.

කොහොම නමුදු දියවන්නා සාමාජිකයා ජනතාව

රතු පාටියේ කණ්ඩායමක් වෙනම ගමනක

රතු පාටියේ නායකයන් කිහිප දෙනෙකුම මේ දිනවල වැඩි කතා බහ නැතැයි කියන්නේ.

රතු පාටියේ නායකතුමන් සමග කරට කර සිටින තවත් ප්‍රබලයින් දෙදෙනකු නිතර නිතර මත ගැටුම් ඇති කරගන්නවා කියලත් කනින් කොණින් ආරංචියි.

කොහොම නමුදු රතු පාටියේ සාමාජිකයින් මෙවර මැතිවරණ පරාජය පිළිබඳව දැඩි කනස්සල්ලකින් පසුවනවා කියලත් කියන්නේ.

කොළඹ සහ ගම්පහ ප්‍රදේශවලදී රතු පාටියේ කණ්ඩායමක් නායකයාට හොරෙන් සාකච්ඡාවක් පැවැත්වූවා කියලත් කියනවා. රතු පාටියේ අනාගතය තීරණය කිරීම සඳහා මේ කණ්ඩායම එකතු වුණා කියලයි ආරංචිය.

‘13 සම්පූර්ණයෙන් ඉවත් කරන්න මම එකඟ නෑ’

සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග

● ජයසූරිය උඩුකුඹුර

■ ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එහි නායකත්වය සමඟ අර්බුදයක් හදාගෙන තිබුණා. දැන් එය නිම වෙලාද?

මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක කිසිම අර්බුදයක් නෑ. එහි නායක මෛත්‍රීපාල සිරිසේන සමඟ පමණයි මට අර්බුදයක් තිබුණේ. ඒක තවමත් නිම වී නෑ. රටට බොරු කියල බලය ලබා ගෙන රට විනාශ කරපු නායකයෙක් විදියට සිරිසේන පිළිබඳව මට තිබෙන්නෙ පිළිකුලක්. 2015 ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමේ සිට මෙවර ජනාධිපතිවරණය දක්වා ම ඔහු කළ කී දේ පිළිබඳව ඉවසා ගන්න බැරුව තමයි ඔහුට ගෑවුණ අයකුටවත් ඡන්දයක් දෙන්න එපා කියල මම කීවේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරපු අපිට ඒ පක්ෂය සමඟ ප්‍රශ්නයක් නෑ. දැන් එහි බොහෝ පිරිසක් අපිත් එක්ක සුහදව කටයුතු කරනවා. අතීත අත්දැකීම් අනුව අනාගතයේ ඇති විය හැකි තත්ත්වයන් ගැන හිතලයි මම සිරිසේන හිටපු ජනාධිපතිවරයා සම්බන්ධයෙන් යම් යම් ප්‍රකාශ සිදු කළේ.

■ හිටපු ජනාධිපතිවරයෙක් පාර්ලිමේන්තුවේ සාමාන්‍ය මන්ත්‍රීවරයකු වීම ඔබ දකින්නෙ කොහොමද?

මහින්ද රාජපක්ෂයන් මේ විදියටම පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂයේ කාර්යභාරය මැනවින් සිද්ධ කළා. සිරිසේන මහතාටත් දැන් ආණ්ඩු පක්ෂයත් සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න පුළුවන්. කොන්දේසි නොදා පාවාදීම් නොකර ඔහු කටයුතු කරයි කියල අපි විශ්වාසයෙන් බලාගෙන ඉන්නවා.

■ තුනෙන් දෙකේ බලයක් ඉල්ලාගෙන ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය වෙනුවට 20 වැනි සංශෝධනය ගෙනෙන්න සූදානම් වෙන්නෙ හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ පාර්ලිමේන්තුවට ගෙන එන්න කියන කතාව ඇත්තද?

ඔය කතාව විපක්ෂය හදපු අමූලික බොරුවක්. ඒ අය ජනතාවට බොරු කියල 19 වන සංශෝධනය ඉවත් කිරීම වළක්වා ගන්නයි ඔවුන් කටයුතු කරන්නෙ. 19 තිබුණොත් ඒ ආණ්ඩුවේ අගමැති හා ජනපති අතර ගැටුම් ඇතිවෙන බව මෛත්‍රී, රනිල් ගෙන් ඒ අය දන්නවා. ඒ විදියට අර්බුදයක් අපේ ආණ්ඩුවෙන් හැදෙනවාට ඔවුන් කැමතියි. 19 තිබ්බත් නැතත් අපේ ආණ්ඩුවේ එහෙම අගමැති ජනපති අතර අර්බුදයක් ඇති වෙන්නෙ නෑ. රටේ ජාතික ආරක්ෂාව ජනාධිපති යටතේ තිබෙන්න ඕනේ. නමුත් 19 වන සංශෝධනයෙන් ඒක ඉවත් කරලා. එදා යහපාලන රජයේ ජනාධිපති ව්‍යවස්ථා විරෝධීව අමාත්‍යාංශ දෙකක් තබාගෙන හිටියා. අපේ ජනාධිපති ව්‍යවස්ථා විරෝධීව කටයුතු කරන්න සූදානම් නෑ. ඒකයි ව්‍යවස්ථාව සංශෝධනය කරන්න හදන්නෙ. ඔබ සඳහන් කළ ආකාරයට බැසිල් රාජපක්ෂයන්ට පාර්ලිමේන්තු එන්න ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරු ඕනෑ කෙනෙක් ඉවත් වෙන්න සූදානම්. නමුත් එතුමා තිරය පිටුපස සිට රාජ්‍ය යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය හදන්නෙ එතුමායි. එතුමා කරන ඒ සුවිශේෂ කාර්ය අප අගය කරන්න ඕනේ. එතුමාට පාර්ලිමේන්තුවට එන්න ඕනේ නම් 19 තිබුණත් නැතත් එන්න පුළුවන්.

■ ඔබත් බස්නාහිර පළාත් සභාවේ මහ ඇමැති ලෙස කටයුතු කළා. දැන් ඔබේ විපක්ෂයේ සමහරු කියනවා 13 වන ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරන්න කියලා ඔබත් ඊට එකඟද?

මම කියන්නෙ 13 වන සංශෝධනයෙන් ස්ථාපිත කළ පළාත් සභා තියෙන්න ඕනෑ කියලයි. පළාත් සභා සුදු අලියෙක් වෙන්න වැඩ කරන්න බැරි මහ ඇමැතිවරු පත්වුණොත් විතරයි. අදටත් මට මිනිස්සු කතා කරන්නෙ මහ ඇමැති කියලා. මම ඒ ධුරය දරන කාලයේ තමයි ජනතාවට සමීපව විශාල වැඩක් කරලා තිබෙන්නෙ. සුදු අලියෙක් කියන එක මධ්‍යම

> **අවස්ථා දෙකකදි මහ මැතිවරණ වලින් ලක්ෂ තුනකට වඩා පිට පිටම ඡන්ද ලබා ගන්න පුළුවන් වුණේ මහින්ද අගමැතිතුමාටත් මටත් පමණයි**

රජයටත් වලංගුයි. 2015 - 2019 දක්වා පැවැති යහපාලන ආණ්ඩුවත් සුදු අලියෙක්. 13 න් නිර්දේශිත රාජ්‍ය පරිපාලනයට අදාළ බලය බෙදන්න ඕනේ. දේශපාලනිකව බලය බෙදා හැරීමට මගේ එකඟතාවක් නෑ. ඒ කියන්නේ රාජ්‍ය පාලන බලය නොබෙදා රාජ්‍ය පරිපාලන බලය බෙදන්න ඕනේ. මිනිස්සුන් ගේ හැම ප්‍රශ්නයම කොළඹ එනවට වඩා ඒ ප්‍රශ්නවලට ඒ ප්‍රදේශවලදීම විසඳුම් ලබාගත හැකි ක්‍රමයක් තිබෙන්න ඕනේ. මේ නිසා 13ට සංශෝධන එකතු කළාට කමක් නෑ. එය සම්පූර්ණයෙන් අහෝසි කරනවාට මම එකඟ නෑ.

■ මහ මැතිවරණයට පෙර බරපතළ අමාත්‍යංශයක වගකීම් පැවැරී තිබුණ ඔබට මැතිවරණයෙන් පසුව තවු කපාපු අමාත්‍යාංශයක් ද ලැබුණෙ?

නෑ මට තිබුණ අමාත්‍යාංශය එහෙමම තිබෙනවා. සංචාරක ගුවන් සේවා ආයෝජන පරිපාලන ආදි විෂයයන්ට අමතරව තවත් විෂයයක් මට වැඩිපුර දීලා. අමාත්‍යාංශයේ නම සංචාරක කියල කෙටි කරලා තිබුණත් මහ මැතිවරණයට පෙර තිබූ අමාත්‍යාංශයටත් වඩා වැඩි වගකීම් ඒ නව අමාත්‍යාංශ්‍ය යටතේ මට පැවරිලා. ඩී. වී. චානක මන්ත්‍රීවරයා මගේ රාජ්‍ය අමාත්‍යවරයා ලෙස පත් කරලා. අප දෙන්නා එකතුව හොඳින් වැඩ කරනවා. මැතිවරණයට පෙරත් මට නියෝජ්‍ය අමාත්‍යවරයෙක් හිටියා; කෙහෙළිය රඹුක්වැල්ල. එතුමා වෙනුවට මෙවර චානක පත් කරලා.

■ රටක ආර්ථිකයේ විශාල වගකීමක් සංචාරක විෂයයට පැවරෙනවා. ඒ අනුව ආර්ථිකය දියුණු කරන්න සංචාරක කර්මාන්තයේ ඉදිරි සැලසුම් මොනවාද?

පාස්කු ප්‍රහාරයත් කෝවිඩ් වසංගතයත් සමඟ සංචාරක ව්‍යාපාරය කඩා වැටිලා තිබුණා. රට සාමාන්‍ය තත්වයට පත්වූ පසු සංචාර ව්‍යාපාරය රටට රටේ ආර්ථිකයට ගැළපෙන ආකාරයට ක්‍රියාත්මක කළ යුතු ආකාරය වෙන් වෙන්ව හඳුනාගෙන තිබෙනවා. ඒ පිළිබඳව මම අමාත්‍ය මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව රටට අහිතකර විදියට එකවර ගුවන් තොටුපළවල් ඇරලා සංචාරක ව්‍යාපාරය දියුණු කරනවා වෙනුවට විවිධ කාර්යයන්ගෙන් කාර්යයට සංචාරකයන් කණ්ඩායම් ලෙස ලංකාවට ගෙන්වා ගන්න අපේක්ෂා කරනවා. කණ්ඩායම් ක්‍රමයට සංචාරකයින් ගෙන්වා ගැනීමෙන් සෞඛ්‍යයට හානියක් නොවන ආකාරයට ඔවුන්ව පාලනය කරන්න පුළුවන්. නිරතුරුව කොවිඩ් කමිටුව සමඟ සෞඛ්‍යය බලධාරින් සමඟ සාකච්ඡා කරමින් ඔවුන්ගේ උපදෙස් අනුව ක්‍රම ක්‍රමයෙන් රට සංචාරකයින්ට සම්පූර්ණයෙන්ම විවෘත කරන්න කටයුතු කරනවා.

■ මීට පෙර පැවැති මැතිවරණවලදී ඔබ ගම්පහ දිසාවේ පළමු තැනට පත් වුණා. මේ මැතිවරණයේදී දෙවැනි තැන හිමි වුණේ ඇයි?

මගේ මැතිවරණ ව්‍යාපාරය දියත් කළේ මට ගම්පහ පළමු තැන ගන්න නොවෙයි. ගම්පහින් මන්ත්‍රීවරු 13 දෙනෙකු පත් කර ගන්නයි මම උත්සාහ කළේ. යුද්ධය ජයගත්තත් කිසිම මැතිවරණයකින් අපට මන්ත්‍රීවරු 13 දෙනෙකු ගම්පහින් පත් කරගන්න බැරි වුණා. ගම්පහින් ලක්ෂ පහක වැඩි ඡන්ද ගන්න මන්ත්‍රීවරු 13ක් පත්කර ගන්න හා තුනෙන් දෙකේ බලයක් සහිත මැතිවරණ ජයක් ගන්න තමයි මම මගේ මැතිවරණ ව්‍යාපාරය දියත් කළේ. මම කිසිම වේලාවක මට මනාපයක් ඉල්ලුවේ නෑ. මගේ කණ්ඩායම දිනවන්න කියලයි මම කීවේ. අවස්ථා දෙකකදි මහ මැතිවරණ වලින් ලක්ෂ තුනකට වඩා පිට පිටම ඡන්ද ලබා ගන්න පුළුවන් වුණේ මටත් මහින්ද රාජපක්ෂ අගමැතිතුමාටත් පමණයි. මගේ තැන එකද දෙක ද නොවෙයි. මගේ කණ්ඩායමේ වැඩි පිරිසක් පාර්ලිමේන්තුවට පැමිණීම තමයි මගේ සතුට.

■ තුනෙන් දෙකේ බලයක් තිබුණත් ආණ්ඩුවට එකතුව ඉන්න කණ්ඩායම් නොසතුටින්ද? ඔවුන් ගේ නොසතුට අළුයට ගිනිපුපුරු මෙන් කොයි හෝ මොහොතක මතු වෙයිද?

නෑ. එහෙම කිසිම දෙයක් නෑ. අපි දැන් එක කණ්ඩායමක් ලෙස එකට වැඩ කරගෙන යනවා. නාලක ගොඩහේවා ඇමැතිවරයත් මට වඩා ඡන්ද ගත්තා. එතුමත් මට නිරතුරුව කතා කරලා එකට වැඩ කරනවා. සමහරු ආණ්ඩුවට පිටින් ඉඳගෙන විවිධ මතවාද හදන්න උත්සහ කළත් ආණ්ඩුව එක කණ්ඩායමක් විදියට කටයුතු කරගෙන යනවා.

> **සජිත්ට තමන්ගේ තනතුර බේරා ගෙන කටයුතු කරන්න මහන්සි ගන්න වෙනවා**

■ ජනාධිපතිවරයා අපේක්ෂා කරන ජනතා කේන්ද්‍රීය ආර්ථිකය ගොඩ නඟන්න අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය නිවැරදියි ප්‍රමාණවත් කියල ඔබ හිතනවාද?

ඔව් අනිවාර්යයෙන් ම මේ අමාත්‍ය මණ්ඩලය හරහා මෙරටේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයකට ශක්තිමත් අත්තිවාරමක් දාන්න පුළුවන්. අපේ සම්පත්වලින් අපේම දේවල් නිපදවන්න ජනතාව පෙලඹුණේ කොවිඩ් 19 වසංගතය සමඟයි. එදා සිරිමාවෝ මැතිනිය ගේ වගා සංග්‍රාමය වැනි වැඩසටහන් දිගටම ක්‍රියාත්මක වුණා නම් අපිට අද මෙහෙම වෙන්නෙ නෑ. කොවිඩ් වසංගතය නිසා ඒ ක්‍රමය යළි රට තුළ ගොඩ නැගුණා. ඒ ගොඩනැගුණ ජනතා කේන්ද්‍රීය ආර්ථික වැඩපිළිවෙළ ශක්තිමත් කරන්න ඊට අවශ්‍ය පහසුකම් හදන්න පුළුවන් අමාත්‍ය මණ්ඩලයක් තමයි දැන් හදලා තිබෙන්නෙ. පිටරටින් ප්ලාස්ටික් ගෙනල්ලා අපේ පරිසරය විනාශ කරනවාට වඩා අපේ රටේ මැටිවලින් හදන පිඟන් කෝප්ප හැලි වළං භාජන අපි ප්‍රයෝජනයට ගන්න පුරුදු වුණොත් අපේ පරිසරය රැකෙනවා වාගේම අපේ මැටි කර්මාන්තය දියුණු වෙනවා. ඒ විදියටම බුලත්, කරාබුනැටි, කුරුඳු වගා කරන ගොවියෝ දැන් ඉස්සරට වඩා 500%ක උනන්දුවෙන් තම තමන්ගේ වගා බිම් සකස් කරනවා.

■ අලුත් ඇමැතිවරු පත් වුණාට ආයතන ප්‍රධානීන් අලුත් කරලා නෑ. සම්ප්‍රදාය නම් ඇමැතිවරයා අලුත් වෙන කොට ආයතන ප්‍රධානීනුත් අලුත් වෙන එකයි. මේක ඔබ කොහොමද දකින්නෙ?

සමහර ඇමැතිවරුන්ට ඔය කාරණය අර්බුදයක් ගැටලුවක් වෙන්න පුළුවන්. මට නම් එහෙම ගැටලුවක් නෑ. මතවාද ප්‍රශ්න ඇති වුණත් මම ඇමැතිවරයා විදියට ඒ ඒ අය ලවා රජයේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. ආයතන ප්‍රධානීන් ඇමැතිවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම අනුව රජයේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනේ. එහෙම වැඩ කරන්න බැරි නම් වැඩ කරන්න බැරි හේතුව ඒ අය කියන්න ඕනේ.

■ සමගි ජන බලවේගය පාර්ලිමේන්තුවේ විපක්ෂ කාර්යභාර ඉටු කරනවා. ඒ ගැන සෑහීමකට පත් වෙන්න පුළුවන්ද?

විපක්ෂ නායක ලෙස සජිත් ප්‍රේමදාස පත්ව ඔහුගේ කණ්ඩායම සමඟ විපක්ෂයේ කාර්ය අවංකව හොඳින් කරයි කියලා අපිත් බලාගෙන ඉන්නවා. නමුත් දැන් එතුමාටත් අභියෝග තිබෙනවා. තමන්ගේ දේශපාලන ගමනට උපකාරි වූ අයව තල්ලු කරපු පිරිසක් තමයි සජිත් වටා ඉන්නෙ. කොයි මොහොතක හෝ සජිත්වත් ඔතනින් එළියට දාලා බලය ආක්‍රමණය කරන්න ඒ අයට බැරි කමක් නෑ ඒ නිසා සජිත්ට තමන්ගේ තනතුර බේරා ගෙන කටයුතු කරන්න මහන්සි ගන්න වෙනවා.

‘පුළුවන් නම් පළාත් සභා අහෝසි කරන්න’

හිටපු ඇමැති චම්පික රණවක අභියෝග කරයි

● ජයසූරිය උඩුකුඹුර

■ මෙවර මහ මැතිවරණයේ පරාජය පිළිබඳව ඔබ මොනවද හිතන්නෙ?

ඇත්තට මේ පරාජයට හේතුව යහපාලන රජයට එරෙහිව පැති කීපයකින් ම එල්ල වී තිබූ චෝදනා කියලයි මම හිතන්නෙ. විශේෂයෙන් ජනාධිපති, අගමැති ලෙස එවක මෛත්‍රීපාල හා රනිල් අතර ඇතිව තිබූ කඹ ඇඳිල්ලෙන් රට අරාජික තත්ත්වයට ඇද වැටුණා කියල ජනතාව තුළ යම් මතයක් ගොඩනැගුණා. ඒ වගේ ම ඇතැම් මාධ්‍ය ආයතන ආගමික හා ජාතික වශයෙන් වෛරී සංකල්ප ජනගත කරමින් ඒ පිළිබඳ චෝදනා යහපාලන රජයට එල්ල කරමින් සංවිධානාත්මක වැඩපිළිවෙළක් දියත් කර තිබුණා. විශේෂයෙන් සහරාන්ගේ ප්‍රහාරය පාදක කරගෙන යුද සමයේදීවත් රටේ ඇති නොවූ ආගමික වෛරයක් රට තුළ නිර්මාණය කළා. මෙවැනි තත්ත්වයන් තුළ යහපාලන රජය රාජ්‍ය සේවකයාට මෙන් ම රටේ සමස්ත ජනතාව වෙනුවෙන් දියත් කර තිබූ සියලු යහපත් ක්‍රියාදාම අමතක කර ජනතාව යහපාලන රජය නියෝජනය කළ සියලු දෙනාට එරෙහිව පෙළ ගැසුණා.

■ අපේ පැරැණි කියමනක් තිබෙනවා වැපුරූ තරමට තමයි අස්වැන්න කියලා. මේ ප්‍රතිඵලයත් ඔබලා වැපුරූ දෙයට ලැබුණ ප්‍රතිඵලයක් කියල පිළිගන්නෙ නැද්ද?

මේ මැතිවරණයේදී අපේ පරාජය ඒ විදියට විග්‍රහ කරන්න බෑ. මොකද අපි තමයි රාජ්‍ය සේවක වැටුප් ඉහළ දැම්මෙ. සමෘද්ධි සහනාධාර ඉහළ දැම්මෙ. රට බංකොළොත් නොවී ආර්ථිකය 2015 තිබුණට වඩා දෙගුණයක් දක්වා දියුණු කළේ. අධ්‍යාපන, සෞඛ්‍යය යන ක්ෂේත්‍රවල වැදගත් වෙනස්කම් ඇති කළේ යහපාලනයේ සිටිය අපියි. එහෙම නම් වැපිරූ දේ අනුව ප්‍රතිඵල ලැබෙනවා නම් අපිට ජය ගන්න තිබුණා. නමුත් මෙවර මැතිවරණයේදී සිද්ධ වුණේ මාධ්‍ය ආයතන කීපයක් සංවිධානාත්මකව යහපාලනය නියෝජනය කළ සියලු දෙනාට එළව එළවා පහර දීමත් නිර්දය ලෙස විවේචනය කිරීමත් නිසා ජනතාව යහපාලනයට හවුල් වූ සියලු දෙනාට වෛර කරන්නට පෙලඹවීමයි. කුරුණෑගල රාජ සභා මණ්ඩපය ඩෝසර් කිරීම වැනි දෙයක් යහපාලන රජයෙන් සිදුවූවා නම් රජය පෙරළා දමන තත්ත්වයට රට තුළ උණුසුම්කාරී තත්ත්වයක් නිර්මාණය කරනවා. නමුත් ඉකුත් මාස නවය තුළ මේ රජය කළ කී දේ සම්බන්ධයෙන් ජන මනස අවදි කරන්නට කිසිවකු ඉදිරිපත් වුණේ නෑ. මේ නිසා ඉදිරියේදී මේ දේවල ප්‍රතික්‍රියාවන්ට මේ රජයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

■ ඇයි ඔබ පිළිගන්නෙ නැත්තේ එදා ඔබ නියෝජනය කළ යහපාලන ආණ්ඩුවේ ඇතැම් ඇමැතිවරු මහ සංඝරත්නයට බෞද්ධාගමට කළ අපහාස අවලාද ඔබලාට මේ ප්‍රතිඵලය ලබාගන්න හේතු වුණා කියලා?

ඔබ ඔය කියන විදියට සමහර ඇමැතිවරු නොවෙයිනෙ ආණ්ඩුව කියන්නෙ. රණවිරුවන් විදුලි පුටුවට ගෙන යනවා කීවා. එහෙම දෙයක් වුණාද? මේ විදියට මේ රටේ ඇතැම් මාධ්‍ය විවිධ කතා ගොතලා ජනතාව තුළ කම්පනයක් නිර්මාණය කළා. මේක එක්තරා විදියක සංවිධානාත්මක මාධ්‍ය කුට නාටකයක්. ඒ කුට නාටකයටම මේ ආණ්ඩුවටත් මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේ ආණ්ඩුවට බලය අරන් දෙන්න කැපවූ ජාතිකවාදී බලවේග දැන් කියනවා පළාත් සභා අහෝසි කරන්න ඕනේ කියලා. මම කියන්නේ රජයට ඒක කරන්න බෑ. තනි සිංහල ආණ්ඩුවක් හදන්න මේ අයට පුළුවන්ද? බෑනේ. මේ නිසා ආණ්ඩුව තුළම මතවාද ගැටීමෙන් මේ රජයටත් අපිට මුහුණ දෙන්න සිද්ධ වූ කුට නාටකයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. පරිසරය සම්බන්ධයෙන් මහ ආන්දෝලනයක් ඇති කළ මේ ආණ්ඩුව දැන් සංවර්ධන උපාය මාර්ග ලෙස විශාල වශයෙන් පරිසර පද්ධති විනාශ කරනවා. ආණ්ඩුව පළමු මාස කීපයට ඩොලර් මිලියන දහසක ණය අරන්. මොනවද කරල තියෙන්නෙ. කිසිම දෙයක් කරලා නෑ. දැන් රටේ ආර්ථිකය ඍණ අගයක පවතින්නෙ. මේ විදියට අපිට චෝදනා එල්ල කළ රජයට මේ චෝදනාවලටම මුහුණ දීලා ජනතාව ගෙන් ඉතා කෙටි කාලයක් තුළ ප්‍රතික්ෂේප වෙන්න සිද්ධ වේවි.

■ ජනතාව මේ රජයට තුනෙන් දෙකේ බලයක් ලබාදී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කර අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනයට අනුමැතිය ලබා දීම ඔබ දකින්නෙ කොහොමද?

මේ අය ජනතාවට කිව්වට ව්‍යවස්ථා සංශෝධනයක් වෙනවා කියල කවදාවත් අලුත් ව්‍යවස්ථාවක් හදන්නෙ නෑ. රාජපක්ෂවරුන්ගේ වුවමනා ඉටු කර ගන්න 19 සංශෝධනය වෙනස් කරල 20 වැනි සංශෝධනයක් ගෙනල්ලා සම්මත කර ගනියි. හැබැයි අලුත් ව්‍යවස්ථාවක් හදන්නෙ නෑ.

■ ඔබ එවැනි නිගමනයකට එළඹෙන්නෙ කුමන සාධක පදනම් කරගෙනද?

ඔබ දන්නවා 2012 දිත් මේ අයට තුනෙන් දෙකේ බලයක් පාර්ලිමේන්තුවේ ලබාගන්න පුළුවන්කම තිබුණා. ඒ කාලෙත් ව්‍යවස්ථාව වෙනස් කරනවා කියල කීවා. නමුත් කළාද? එදත් ඔය කට්ටිය කීවේ පළාත් සභා අහෝසි කරනවා කියලා. විධායක ජනාධිපති ධුරයත් අහෝසි කරනවා කීවා. නමුත් මොනවද කළේ. 18 වැනි සංශෝධනය ගෙනල්ලා තවත් අවුරුදු පහකට බලය ඉල්ලන්න අවස්ථාව හදා ගන්න එක විතරයි. මෙවරත් ඒ ටිකම කියනවා. ඔය කියන විදියට පුළුවන් නම් පළාත් සභා අහෝසි කරන්න කියන්න. මම කියන්නේ මේ අයට ඒක කරන්න බෑ කියලයි. ජාතිකවාදී බලවේග මේ වාගේ සුරංගනා කතා කියමින් තමනුත් රැවටෙන ගමන් ජනතාවත් රවටනවා.

■ ඔබ කියන්නේ ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය තවදුරටත් ක්‍රියාත්මක විය යුතුයි කියලද?

මම කියන්නෙ නෑ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය තවදුරටත් ක්‍රියාත්මක වෙන්න ඕනේ කියලා. දැන් යෝජනා වෙලා තියෙන්නෙත් ඒක අහෝසි කරන්න ඕනෑ කියලනෙ. මමත් කියන්නේ එය අහෝසි කරන්න කියලයි. නමුත් මේ ආණ්ඩුව ඒක අහෝසි කරන්නෙ නෑ. ආණ්ඩුවට ඒක කරන්නත් බෑ.

■ මහජන ඡන්දයකින් එකම නියෝජිතයෙකුවත් පත් කර ගන්න බැරි වූ එජාපයේ නායකත්වයට ඔබටත් යෝජනා ලැබුණා කියල ආරංචියි?

අනේ නෑ. ඒක පට්ටපල් බොරුවක්. එජාපය තවදුරටත් නායකයන් මාරු කරල ගොඩදාන්න පුළුවන් පක්ෂයක් නොවෙයි. නායකයෝ අලුතින් පත් වුණා කියලා පක්ෂය පුනර්ජීවනය වෙන්නෙ නැනේ. දැන් එජාපය දේශපාලන වශයෙන් අවසන් ගමන් යන්න සූදානමින් ඉන්නෙ. ඒක වළක්වා ගන්න ඔය මොන දේ කළත් වැඩක් නෑ.

> **අපි මේ රජය කරන හොඳ දේට සහාය දෙනවා**

■ සමඟි ජන බලවේගය ආක්‍රමණය කරල එය ඔබලා යටත් කර ගන්න හදනවා කියල ඔබේම පක්ෂයේ අය කියනවා. ඒක බොරුවක්ද?

එජාපය නාමිකව වෙනම තරග කළත් එජාප පාක්ෂිකයින් 95% ක් ඡන්දය දුන්නෙ සමඟි ජන බලවේගයටයි. ඒ නිසා ජනතාවගේ පැත්තෙන් තවදුරටත් එජාපයක් අපේක්ෂා කරන්නෙ නෑ. ඒක රනිල් වික්‍රමසිංහ මහතා සමඟ අහෝසි වෙලා තිබෙන්නෙ. මින් ඉදිරියට එජාපය මැතිවරණ දේශපාලනයේ නෑ. එජාපය දේශපාලන වශයෙන් පරාජය වුණා නොවෙයි. ඒක නායයාමක්. ඒ නිසා නැවත එජාපය ගොඩ එයි කියල හිතන්න බෑ. කොයි මොහොතක හෝ එජාපය සමඟි ජන බලවේගයේ සාමාජික පක්ෂයක් විදිහට කටයුතු කරන ඉල්ලීමක් ඉදිරිපත් වුණොත් ඒ ගැන ඒ වෙලාවේ හැටියට කතා කරලා සලකා බලන්න පුළුවන්. එජාපයට මේ ඉරණමට මුහුණ දෙන්න සිද්ධ වුණේ රනිල් වික්‍රමසිංහ මහතා නිසයි. ඔහු ඊට වගකිවයුතුයි. එවැනි නායකයින් සමඟි ජන බලවේගයට සම්බන්ධ කර ගන්න අපි සූදානම් නෑ. නමුත් පාක්ෂිකයින් සියලු දෙනාම අපි එකතු කර ගන්න කටයුතු කරනවා.

■ හෙළ උරුමය තමයි මේ රටේ ජාතිකවාදී දේශපාලනයට ආරම්භයක් දුන්නේ. එහෙම කළ ඔබලා මේ මැතිවරණවලදී ජාතිකවාදීව කටයුතු කරල ජයග්‍රහණය කළා යැයි ආණ්ඩුවට දොස් කියන්නෙ ඇයි?

අපි ජාතිකවාදී දේශපාලනය වැරදියි කියන්නෙ නෑ. අපි කියන්නෙ ඒ සඳහා තෝරාගෙන තිබෙන පුද්ගලයෝ ජාතිකවාදී නෑ. ඔවුන් සිංහලකමට හෝ බෞද්ධකමට අවංක නෑ. තව කෙටි කාලයකදී ජනතාව මේ සත්‍යය තේරුම් ගනිවි.

■ ජාතිකවාදී දේශපාලනයෙන් ඔබලට ජය ගන්න බැරි වුණේ ඇයි?

කවුද කියන්නෙ අපි ජයගත්තේ නෑ කියලා. ප්‍රභාකරන් පරාජය කරන්න මුල් වුණේ කාගේ දේශපාලනය ද? අපි ජාතිකවාදී දේශපාලනය මෙරට තුළ ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ ඇත්ත අනතුරක තියෙන වේලාවකයි. කාලතුවක්කුවෙන් රට කඩල වෙන් කරන බලවත් අනතුරක් තිබෙන වේලාවක ජාතිකවාදී දේශපාලනය නිසා අපිට පුළුවන් වුණා ජනතාව තුළ මේ සිංහල අපේ රට කියන මතය ගොඩ නඟන්න. රණවිරුවන්ට ශක්තියක් වුණේ ඒක. ඒ ජාතිකවාදී දේශපාලනයේ ප්‍රතිඵලය තමයි අද වෙන කොට මෙරට සිංහල බෞද්ධ රටක් කියන මතවාදය ලෝක පූජිතව තිබෙන්නෙ. එදා අපේ ජාතිකවාදයයි. දැන් ජාතිකවාදය කරපින්නා ගත් අයගේ ක්‍රියාකාරකමුයි සංසන්දනය කරන්න බෑ. නමුත් පොහොට්ටුව ජාතිකවාදී රැල්ලක් නිර්මාණය කළා. නමුත් ඒක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න බෑ. පුළුවන් නම් 13 වැනි සංශෝධනය අහෝසි කරන්න කියලයි මම කියන්නෙ. එහෙම කරනවා නම් අපිත් ඒකට සහය දෙනවා.

■ ජාතිකවාදී දේශපාලනයේ යථාර්ථය විදියට ඔබ පෙන්වා දෙන්නේ මොනවාද?

ජාතිකවාදී දේශපාලනය අපේ රටේ විටින් විට මතුවන ඇතැම් කරුණු පරාජය කරන්න හේතු වෙනවා. ප්‍රභාකරන් පරාජය කරන මානසිකත්වය වර්ධනය වුණේ ජාතිකවාදී දේශපාලනය නිසයි. අපේ රට පෙඩරල් රටක් බවට පත් කරන්න තිබූ ඇත්ත අනතුර එමගින් විනාශ වුණා. ජාතිකවාදී දේශපාලනය තුළ වුවත් අපේ රටේ වෙනත් ජාතීන් හෝ ආගමිකයන් කොන් කිරීම සාධාරණ නෑ. ජවිපෙ කොන් කළාම ඔවුන් කැලෑ වැදිලා සටන් කළා. ඒ වාගේ මුස්ලිම් දෙමළ මේ කොයි ජාතිය කොන් කළත් අවසානයේ අරගල ඇති වෙන්න පුළුවන්.

■ ජනතා කේන්ද්‍රීය ආර්ථික රටාවක් සඳහා ආණ්ඩුව අලුතින් පත් කරපු ඇමැති මණ්ඩලය ශක්තිමත් කියල ඔබ හිතනවාද?

මේ ආණ්ඩුවේ ඇමැති මණ්ඩලය පත් කර තිබෙන ආකාරය පිළිබඳව අපිට හිනා යනවා. අලි වැට හා අගල් ඇමැති, මැටි ඇමැති වැනි මේ විදියේ ඇමැති මණ්ඩලයක් පත් කරලා ආණ්ඩුව ඇත්ත ප්‍රශ්නය යට කරලා ජනතාව රවට්ටන්න හදනවා. ඉස්සරත් අනෙකුත් අමාත්‍යාංශ හරහා ඔය දේවල් කෙරුණා. මීට පෙර තඹ කර්මාන්තය, වේවැල් කර්මාන්තය, මැටි කර්මාන්තය කෙරුණේ නැද්ද? එදා රජයේ ඇමැතිවරයෙක් විදියට මම ‘ගජ මිතුරෝ’ කියල සංවිධානයක් බිහි කළා. එමගින් තමයි ඔය අලි වැටවල් අගල් කැපිලි සකස් කළේ. ඒ කටයුතු වනජීවී අමාත්‍යාංශය යටතේ කෙරුණා. ඒකට වෙනම ඇමැතිකමක් අවශ්‍ය වුණේ නෑ. එදා අමාත්‍යාංශ යටතේ තිබුණ ආයතන නමින් අද අමාත්‍යාංශ පිහිටුවලා. බලගතු අමාත්‍යාංශ සුළු පිරිසක් අතට අරගෙන අනෙක් අය සන්තෝෂ කරන්න මේ පුංචි පුංචි විෂයයන්ට ඇමැති කම් දීලා. මේ කිසිම කෙනෙක් තමන්ට ලැබුණු අමාත්‍යාංශයේ නමවත් තමන් ගේ ඡන්ද දායකයාට කියන්න ලජ්ජා වෙන තත්ත්වයකයි ඉන්නෙ. මේකෙන් ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනගනවාට වඩා ජනතා නියෝජිතයින් අවධානයකට පත් කර තිබෙන බව සඳහන් කරන්න ඕනේ.

■ පක්ෂ දේශපාලනයෙන් ඔබ්බට ගොස් ජාතික දේශපාලනය ගැන කතා කරද්දී කවදාද මේ දේශපාලන කඹ ඇදීම නැතිව රට ගැන හිතන දේශපාලනඥයින් බිහි කරන්නෙ?

යහපාලන රජය ඔබ කියන ජාතික දේශපාලනය මෙරටේ ස්ථාපිත කරන්න විශාල උත්සාහයක් ගත්තා. ශ්‍රීලනිප හා එජාප එකතුව ඒක කරන්න මග හදා ගත්තා. නමුත් ජනපති අගමැති අතර ඇතිවූ මතබේද දිග් ගැසීමෙන් මේ රටේ ජාතික දේශපාලනය වෙනුවට පක්ෂ දේශපාලනය සඳහා තවත් අලුත් පක්ෂයක් බිහි වුණා. ඒ තමයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ. අපි මේ රජය කරන හොඳ දේට සහය දෙනවා. අතුරු සම්මත ගිණුම අනුමත කරන්නත් අපි සහය දුන්නා. අපි කියන්නේ ජනතාවාදී රටට හිතැති ඕනෑම දේකට අපි රජයට සහය දෙන්න සූදානම් කියලයි.

අධ්‍යාපන අමාත්‍යාංශය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
(SLIATE)

2020 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම

2019 වර්ෂයේ හෝ ඊට පෙර අ.පො.ස. උසස් පෙළ විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරන පිළිවෙළ

අයදුම්කරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා apply.sliate.ac.lk වෙබ් අඩවිය ඔස්සේ පමණක් මාර්ගගතව අයදුම් කළ යුතුය. වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ. Z ලකුණු මත සහ SLIATE විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ විභාගයක ලකුණු මත යනුවෙන් HND පාඨමාලා සඳහා තෝරාගැනීමේ කාණ්ඩ දෙකක් ඇත.

Z ලකුණු මත පදනම් වූ SLIATE පාඨමාලා කාණ්ඩ - 1	HNDA, HNDBA, HNDBF, HNDE (CIVIL), HNDE (MECHANICAL), HNDE (ELECTRICAL & ELECTRONICS), HNDQS, HNDBSE, HNDT (Agri)
තෝරාගැනීමේ විභාගයේ ලකුණු මත පදනම් වූ SLIATE පාඨමාලා කාණ්ඩ - 2	HND in English, HNDIT, HNDM, HNDPM, HNDTHM, HNDFT, HNDCSPT

සුදුසුකම්ලත් අපේක්ෂක apply.sliate.ac.lk වෙබ් අඩවිය ඔස්සේ අයදුම්කළ යුතුය.

HND පාඨමාලා සඳහා වන ප්‍රවේශක සුදුසුකම් A කොටසේ සහ ATI පිළිබඳ විස්තර B කොටසේ බලන්න.

සුදුසුකම්ලත් අපේක්ෂකයින්ට එක් කාණ්ඩයකින් පාඨමාලා පහක උපරිමයක් අයදුම්කළ හැක. එක් කාණ්ඩයකින් අයදුම්පත් එකක් පමණක් පිළිගනු ලබන අතර, එක් කාණ්ඩයක් සඳහා උපරිම ගාස්තුව රුපියල් 500 වේ.

- අයදුම්කරු කාණ්ඩ දෙකටම ඉල්ලුම් කරන්නේනම් රු. 500 බැගින් වෙන වෙනම සෘජුවම බැංකුවට ගෙවිය යුතු වේ. මාර්ගගත ගෙවීම් නොකළ යුතුවේ.
- බැංකු ලදුපතෙහි සඳහන් මුදල් හුවමාරු අංකය TRN අංකය මාර්ගගත අයදුම්පතෙහි සඳහන් කළ යුතු වේ.

2020 ඔක්තෝබර් 06 වෙනි දින හෝ ඊට පෙර මහජන බැංකුවේ කොළඹ 02, හයිඩ් පාර්ක් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 025-2-001-1-3397613 දරණ SLIATE ගිණුමට එම ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ මහජන බැංකු ඕනෑම ශාඛාවක් මගින් ගෙවීම් සිදු කළ හැකිය.

මාර්ගගත අයදුම්පත ලැබුණු බවට තහවුරු වූ විගස පද්ධතිය විසින් උත්පාදිත අයදුම්පතේ මුද්‍රිත හා අත්සන් තබන ලද පිටපත සහ ගෙවීම් සිදු කිරීම මත ලබාගත් ලදුපත ලියාපදිංචි තැපැල් මගින් 2020 ඔක්තෝබර් 06 වෙනි දින හෝ ඊට පෙර පළමු ප්‍රමුඛතාවය ලබා දී ඇති උසස් තාක්ෂණ ආයතනය (ATI) වෙත යැවිය යුතුය.

මාර්ගගත පද්ධතිය විසින් උත්පාදනය කළ යොමු අංකය ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

මෙම ක්‍රියාවලිය තුළදී සහ ඉන්පසුව අයදුම්පතේ තත්ත්වය කුමක්දැයි ලබාදී ඇති විද්‍යුත් තැපැල්, ජංගම දුරකථනය ඔස්සේ හෝ තැපැල් මගින් දන්වනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන 2020 ඔක්තෝබර් 06 වෙනි දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

පාඨමාලා පවත්වනු ලබන ක්‍රමය :

පූර්ණ කාලීන පාඨමාලා
අර්ධ කාලීන පාඨමාලා (සති අන්තයේ)
මාධ්‍යය - ඉංග්‍රීසි

අර්ධ කාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයන්හි රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා පවත්වනු ලැබේ.

පාඨමාලා ගාස්තු

පූර්ණ කාලීන පාඨමාලා ගාස්තු - නොමිලේ

එක් අධ්‍යයන වාරයක් වෙනුවෙන් අර්ධ කාලීන පාඨමාලා ගාස්තු පහත සඳහන් පරිදි වේ.

උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDA) - රු. 7,500/-

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English) - රු. 12,000/-

උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා HNDIT - රු. 18,000/-

ලියාපදිංචිය

ලියාපදිංචිය අවස්ථාවේදී අවශ්‍ය ලිපිලේඛනවල මුල්පිටපත සහ සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

නේවාසිකාගාර පහසුකම්

පහත සඳහන් උසස් තාක්ෂණ ආයතනවල පමණක් පූර්ණ කාලීන සිසුන් සීමිත ප්‍රමාණයකට නේවාසිකාගාර පහසුකම් ලබා දිය හැකිය.

දෙහිවල සහ ගම්පහ උ. තා. ආයතන - සිසුවියන් සඳහා පමණක්

අම්පාර සහ කොළඹ උ. තා. ආයතන - සිසුන් සහ සිසුවියන් සඳහා

"A" කොටස

පාඨමාලාව සඳහා ප්‍රවේශක සුදුසුකම්

01. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDA)

01.1 පූර්ණ කාලීන - වසර 4 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ආර්ථික විද්‍යාව සහ ගිණුම්කරණය සඳහා සම්මානයක් සහිතව එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

01.2 අර්ධ කාලීන - වසර 4 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ආර්ථික විද්‍යාව සහ ගිණුම්කරණය සඳහා සම්මානයක් සහිතව එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

හෝ

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන පහත සඳහන් ඕනෑම සහතික පාඨමාලාවක්

අ. ගණක ශිල්පය පිළිබඳ ජාතික සහතිකය සම්පූර්ණකර තිබීම

ආ. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය සම්පූර්ණ කර තිබීම

ඇ. ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සම්පූර්ණ කර තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායකයක / පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයකු) නිරතව සිටීම.

පහත සඳහන් සුදුසුකම් සතු HNDA අර්ධ කාලීන අයදුම්කරුවන් 1 වෙනි වසරෙන් මුක්ත කොට අනෙකුත් ප්‍රවේශක අවශ්‍යතාවයන් සපුරා තිබීම සහ උසස් තාක්ෂණ ආයතනයන්හි අවස්ථා ඇති පරිදි 2 වන වසර සඳහා බඳවා ගනු ලැබේ.

i. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර මූල්‍ය කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සමත්ව තිබීම

ii. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන උසස් ජාතික වාණිජ්‍යය ඩිප්ලෝමාවේ දෙවන වසර සමත්ව තිබීම

iii. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් පවත්වනු ලබන විධායක මට්ටමේ හෝ CAB I සහ CAB II හෝ පදනම් සහ අන්තර් මධ්‍යම හෝ බලපත්‍රලාභී I සහ II කොටස සමත්ව තිබීම.

iv. කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ (CIMA - UK) I වන සහ II වන කොටස සමත්ව තිබීම

v. ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමය (AAT) විභාගය සමත්ව තිබීම

vi. සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය (CMA - Sri Lanka) විසින් පවත්වනු ලබන ආශ්‍රිත සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ විභාගය (ACMA) සමත්ව තිබීම

සටහන : බඳවා ගැනීම සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් පිළිගන්වනු ලබන වාණිජ විද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියට (සාමාන්‍ය සාමාර්ථයක්) විකල්ප සුදුසුකමක් ලෙස උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව පිළිගැනීමට අංක 46/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව නිර්දේශ වී ඇත.

02. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය ඩිප්ලෝමා පාඨමාලාව (HNDBA)

පූර්ණ කාලීන - වසර 2 1/2 ක්

03. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (HNDBF)

පූර්ණ කාලීන - වසර 2 1/2 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) වාණිජ විෂය ධාරාව යටතේ එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

04. උසස් ජාතික පාරිභෝගික විද්‍යා සහ නිපැයුම් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDCSPT)

පූර්ණ කාලීන - වසර 3 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) විෂයක් ලෙස ගෘහ විද්‍යාව / ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළුව ඕනෑම විෂය ධාරාවක එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

05. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) HNDE (Civil) - පූර්ණ කාලීන - වසර 3 1/2 ක්

06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (විදුලි හා විද්‍යුත්) HNDE (Electrical and Electronics) - පූර්ණ කාලීන - වසර 3 1/2 ක්

07. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (යාන්ත්‍රික) HNDE (Mechanical) - පූර්ණ කාලීන වසර 3 1/2 ක්

08. උසස් ජාතික ප්‍රමාණ හා මිණුම් ඩිප්ලෝමා පාඨමාලාව HNDQS - පූර්ණ කාලීන - වසර 2 1/2 ක්

09. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව HNDBSE - පූර්ණ කාලීන - වසර 3 1/2 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (රසායනික විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය) එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

10. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)

10.1 පූර්ණ කාලීන - වසර 2 1/2 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක්

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම

හෝ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි සාහිත්‍ය කෘතීන් ඇගයීම යන විෂයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම

10.2 අර්ධ කාලීන - වසර 2 1/2 ක්

10.1 හි සඳහන් සුදුසුකම්වලට අමතරව රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායකයක / පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම.

11. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDFT)

පූර්ණ කාලීන වසර 2 1/2 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ජීව විද්‍යා හෝ භෞතික විද්‍යා ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව හා ගණිතය විෂයන්ට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

12. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDIT)

12.1 පූර්ණ කාලීන - වසර 2 1/2 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව හා ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

12.2. අර්ධ කාලීන - වසර 2 1/2 ක්

12.1 හි සඳහන් සුදුසුකම්වලට අමතරව අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායකයක / පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම.

13. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDM)

පූර්ණ කාලීන - වසර 3 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.

හෝ

(ii) ගිණුම්කරණ ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය හෝ තාක්ෂණ අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන (රාජ්‍ය පරිපාලන / අලෙවිකරණය) පිළිබඳ ජාතික සහතිකය

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම

14. උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDPM)

පූර්ණ කාලීන - වසර 2 1/2 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

ඕනෑම විෂය ධාරාවකින් එකවරකදී අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ලබා තිබීම.

15. උසස් ජාතික තාක්ෂණ කෘෂිකර්මය ඩිප්ලෝමා පාඨමාලාව (HNDT - Agriculture)

පූර්ණ කාලීන - වසර 3 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් (මෙම විෂයන්ගෙන් තුනක් ඇතුළුව, රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, ජීව විද්‍යාව සහ භෞතික විද්‍යාව) එකවරකදී අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව හා ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම

16. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)

පූර්ණ කාලීන - වසර 3 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

"B" කොටස

උසස් තාක්ෂණ ආයතනවල (ATls) නම්, ලිපිනයන්, දුරකථන අංක සහ
උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා [Full Time (FT) & Part Time (PT)]

	උසස් තාක්ෂණ ආයතනයේ නම	ලිපිනය	දුරකථන අංක	පවත්වනු ලබන පාඨමාලා
01	හාඩ් උසස් තාක්ෂණ ආයතනය - අම්පාර	මහාචාර්ය එවන් ඒ හාඩ් මාවත, අම්පාර.	063-2222056 063-2223035	HNDT (Agri)(FT), HNDA(FT), HNDM(FT),HNDIT(FT), HNDTHM(FT), HND in English (FT), HNDA(PT), HND in English (PT)
02	උසස් තාක්ෂණ ආයතනය - අනුරාධපුරය	අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම, අනුරාධපුරය.	025-2234417	HNDIT(FT), HNDA(FT), HND in English (FT), HNDTHM(FT), HNDIT(PT), HNDA(PT), HND in English(PT)
03	උසස් තාක්ෂණ ආයතනය - බදුල්ල	ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල	055-2230218 055-2223818	HNDIT(FT),HNDA(FT), HNDM(FT), HND in English (FT), HNDTHM(FT), HNDIT(PT), HNDA(PT), HND in English(PT)
04	උසස් තාක්ෂණ ආයතනය - මඩකලපුව	කෙළින් වීදිය, කෝවිල් කුලම් තැගෙනහිර, ආරයම්පදි, මඩකලපුව.	065-2247519 065-2247470	HNDIT(FT), HNDA(FT), HND in English(FT), HNDTHM(FT), HNDA(PT), HND in English (PT)
05	උසස් තාක්ෂණ ආයතනය - කොළඹ	අංක 42, රොඩ්රිගෝ පෙදෙස, කොළඹ 15	011-2521152 011-2521282	(All Full Time) HNDE (Civil), HNDE (Mechanical), HNDE (Electrical & Electronics), HNDQS, HNDBSE.
06	උසස් තාක්ෂණ ආයතනය - දෙහිවල	අංක 51, වෛද්‍ය පාර, දෙහිවල.	011-2738349	HNDIT (FT), HNDA (FT) , HNDM (FT), HNDBA (FT), HND in English (FT), HNDB F(FT), HNDTHM (FT), HNDTHM (FT), HNDA (PT), HND in English (PT)
07	උසස් තාක්ෂණ ආයතනය - ගාල්ල	සිරිධම්ම මාවත, ලබ්බූවව, අක්මීමන, ගාල්ල	091-2246179	HNDE(Civil) (FT), HNDE (Mechanical) (FT), HNDE (Electrical & Electronics) (FT), HNDIT(FT) HNDT(Agri) (FT), HNDA(FT), HNDM (FT), HNDTHM(FT) HNDBA(FT), HND in English (FT), HNDQS (FT), HNDA (PT), HNDIT (PT), HND in English (PT)
08	උසස් තාක්ෂණ ආයතනය - ගම්පහ	නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ.	033-2287519 033-2292544	HNDT(Agri) (FT), HNDIT(FT), HNDFT(FT) HNDCSPT(FT), HNDA(FT), HNDA(PT), HNDIT(PT)
09	උසස් තාක්ෂණ ආයතනය - යාපනය	අංක 665/2, වෙරළ පාර, ගුරුනගර්, යාපනය.	021-2222595 021-2229803	HNDE(civil)(FT), HNDE(Electrical & Electronics) (FT), HNDA (FT), HND in English(FT), HNDTHM(FT), HNDQS (FT), HNDM(FT), HNDIT(FT), HND in English(FT), HNDTHM (FT), HNDQS(FT) HNDIT(PT), HNDA (PT), HND in English(PT)
10	උසස් තාක්ෂණ ආයතනය - මහනුවර	අංක 16, කැප්පෙට්පොල මාවත, මහනුවර.	081-2232097 081-2226644	HNDIT(FT), HNDA(FT), HNDM(FT), HNDBA(FT), HNDA in English(FT), HNDTHM(FT), HNDA(PT), HND in English(PT)
11	උසස් තාක්ෂණ ආයතනය - කෑගල්ල	බණ්ඩාරනායක මාවත, කෑගල්ල.	035-2221297 035-2221713	HNDIT(FT), HNDA(FT), HND in English(FT), HNDPM(FT), HNDA(PT), HND in English (PT)
12	උසස් තාක්ෂණ ආයතනය - කුරුණෑගල	අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල.	037-2229583 037-2224911	HNDIT(FT), HNDA(FT), HNDM(FT) HND in English(FT), HNDTHM(FT), HNDIT(PT), HNDA(PT), HND in English(PT)
13	උසස් තාක්ෂණ ආයතනය - මන්නාරම	අංක 201, පළාත් ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානය, තලේමන්නාරම පාර, මන්නාරම.	023-3122555	HND in English(FT), HNDTHM(FT), HNDIT(FT)
14	උසස් තාක්ෂණ ආයතනය - නාවලපිටිය	අංක 154/6, ගම්පොල පාර, (බ්ලැක් ස්ටීව්) ආශ්වර්යා ශාලාව, 4 වන මහල, නාවලපිටිය.	054-2050634	HNDTHM(FT), HNDM(FT), HND in English(FT), HND in English (PT)
15	උසස් තාක්ෂණ ආයතනය - රත්නපුරය	නව නගරය, රත්නපුරය.	045-2231492 045-2231493	HNDIT(FT), HNDA (FT), HND in English (FT) HNDA(PT), HNDIT(PT), HND in English (PT)
16	උසස් තාක්ෂණ ආයතනය - සමන්තුරේ	උසස් තාක්ෂණ ආයතන මාවත, සමන්තුරේ	067-2261304	HNDIT(FT) , HNDA (FT), HND in English (FT), HNDM(FT), HNDA(PT), HND in English(PT), HNDIT(PT),
17	උසස් තාක්ෂණ ආයතනය - තංගල්ල	යායවත්ත, නැටොල්පිටිය, තංගල්ල	047-2241845 047-2241846	HNDIT(FT), HNDA(FT), HND in English(FT), HNDA (PT), HND in English (PT)
18	උසස් තාක්ෂණ ආයතනය - ත්‍රිකුණාමලය	කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය.	026-2223232 026-2050617	HNDIT(FT), HNDA (FT), HND in English(FT), HNDTHM(FT), HNDA(PT), HNDIT(PT), HND in English(PT)
19	උසස් තාක්ෂණ ආයතනය - වවුනියාව	ඒ 9 පාරෙන් හැරී, වේප්පන්කුලම, ඕමන්තායි, වවුනියාව.	024-2052733	HNDA(FT), HNDIT (FT), HND in English (FT) HNDA(PT), HND in English(PT)

සටහන :

01. අයදුම්කරු අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය ප්‍රවේශක සුදුසුකම් සපුරා තිබිය යුතුය.
02. උසස් ජාතික ඩිප්ලෝමා පූර්ණ කාලීන පාඨමාලා සඳහා අපොස (උ/පෙළ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට තිබිය යුතු අවම ලකුණු ප්‍රමාණය 25 කි. අයදුම්කරු උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුය.
03. කාණ්ඩ දෙක සඳහන් HND පාඨමාලා සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීම පොදු ලිඛිත විභාගයක් හරහා ආයතනික වශයෙන් සිදු කෙරේ.
04. වයස අවුරුදු 23 ට අඩු පූර්ණ කාලීන සිසුන් සඳහා ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.
05. යම් උසස් තාක්ෂණ ආයතනයක නියමිත පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා එම අධ්‍යයන පාඨමාලාව සඳහා අවම වශයෙන් සිසුන් 50ක් ලියාපදිංචි විය යුතුය.
06. සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා වන සිසුන් සතියේ දිනවල සහ අවශ්‍ය වුවහොත් සති අන්තවල දේශන සඳහා සහභාගි විය යුතුය.
07. අර්ධ කාලීන පාඨමාලා සති අන්තයේ පවත්වනු ලැබේ.
08. පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා සඳහා දේශනශාලාගතව, මාර්ගගතව හෝ දෙයාකාරයටම අවශ්‍යතාවය මත පැවැත්වේ.
09. HNDA (පූර්ණ කාලීන) වැඩසටහනේ පළමුවන හා දෙවන වසරවල් සතියේ දිනවලදී පමණක් පවත්වනු ලැබේ. මෙම අධ්‍යයන පාඨමාලාවේ තුන්වන හා හතරවන වසර සඳහා වන දේශන සති අන්තයේදී පැවැත්වේ.
10. HNDM වැඩසටහන්වල පළමු හා දෙවන වසර සඳහා වන දේශන සතියේ දිනවලදී පැවැත්වේ. මෙම අධ්‍යයන පාඨමාලාවේ තුන්වෙනි වසරේ දේශන සති අන්තයේ පවත්වනු ලැබේ.
11. පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් අවම වශයෙන් මාස 06 ක කාලයක් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව ලබාගත යුතුය.
12. අර්ධ කාලීන අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටිය යුතුය.
13. යම් උසස් තාක්ෂණ ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවකට තෝරාගැනීමෙන් පසුව වෙනත් උසස් තාක්ෂණ ආයතනයකට කිසිදු සිසුවෙක් හෝ සිසුවියක් කුමන් හේතුවක් මත මාරුවීම් සිදුකරනු නොලැබේ.
14. යම් HND පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් අදාළ ආයතනය විසින් ලබා දී ඇති ලියාපදිංචිය සඳහා වන අවසාන දිනයේ සිට දින 60 ක් ඇතුළතදී ස්වකීය ලියාපදිංචිය අවලංගු කරගැනීමට අවසර දෙනු ලැබේ.
15. දින 60 කට පසුව ස්වකීය ලියාපදිංචිය අවලංගු කරන සිසුන් වෙතින් ලියාපදිංචි දිනයේ සිට මසකට රු. 5,000.00 බැගින් අය කරනු ලැබේ. (අභ්‍යන්තර චක්‍රලේඛ (විභාග) 04/2019,12.07.2019)
16. පූර්ණ කාලීන සහ අර්ධ කාලීන සිසුන් සඳහා වන විභාග සතියේ දිනවල හා සති අන්තයේ පවත්වනු ලැබේ.
17. ශාස්ත්‍රීය කමිටු රැස්වීම විසින් නිර්දේශ කොට පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් ඕනෑම සුදුසුකමක්, පාඨමාලා ප්‍රවේශය සඳහා සලකා බලනු ලැබේ.
18. අ.පො.ස. (උ/පෙළ) සහ අ.පො.ස. (සා/පෙළ) විභාග පාලනය වී තිබිය යුත්තේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙනි.
19. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කොට ඇති ඕනෑම අයදුම්කරුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
20. 2020 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතන වෙත සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් SLIATE අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.
21. වැඩිදුර තොරතුරු සඳහා www.sliate.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් භාරගන්නා වූ අවසාන දිනය 2020.10.06 දින වේ. **(වැඩි විස්තර සඳහා 2020.09.04 දින ගැසට් පත්‍රය බලන්න)**

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE).

‘සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් කිරීම අපේ මන්ත්‍රීවරුන්ගේ එකම අරමුණයි’

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක

● ජයසූරිය උඩුකුඹුර

● මෙවර මැතිවරණයේ දී පැරණි දේශ-පාලනඥයන් පරදවා අලුත් අය පාර්ලි-මේන්තුවට පත් කර තිබෙනවා. මේ ගැන මොනවද හිතන්නේ?

ඇත්තටම සාම්ප්‍රදායික දේශපාලනය වෙනස් කරන්න ජනතාව තුළ ලොකු උනන්දුවක් තිබුණා.ඒ සඳහා ජනතාවට අවස්ථාව ලැබුණේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ වැඩපිළිවෙල නිසයි. මොකද එතුමා වියත්මඟ සංවිධානය හරහා උගත් තරුණ කණ්ඩායමක් දේශ-පාලනයට හඳුන්වා දුන්නා. ඒ පිරිස අපේ ජනතාව ආදරෙන් පිළිගත්තා. ඒ නිසයි සමහර දිස්ත්‍රික්කවල පැරණි ප්‍රබලයන් පෙරලා ගෙන මේ අලුත් පිරිස වැඩි මනාප ලබා ගෙන තිබෙන්නේ. රට ගැන අලුතින් හිතන්න ජවයක් ඇතිව වැඩ කරන්න නිර්මාණාත්මකව වැඩ කරන්න මේ තරුණ මන්ත්‍රීවරුන්ට පුළුවන්. අපේ පැරණි දේශපාලනඥයන් අලුත් කණ්ඩා-යමට හොඳ මඟ පෙන්වීමක් කළොත් රට සීඝ්‍රයෙන් ගොඩ නඟන්න පුළුවන් වෙයි.

● ඔබේ ජයග්‍රහණය ගැන ඔබ සතුටින්ද?

ඇත්තටම ඔව්. මොකද අපේ පළා-තට මන්ත්‍රීවරයෙක් හිටියේ නෑ. දැන් මම ඉන්නවා. මට පුළුවන් මේ ප්‍රදේශයේ ජනතාව සමඟ ඔවුන් ගේ ප්‍රශ්න විසඳා ගන්න උදව් කරන්න. මමත් අලුතින්ම තමයි පාර්ලිමේන්තුවට පත් වුණේ. ඒ නිසා අපිට අලුතින් හිතල අලුත් දෙයක් ජනතාව හා රට වෙනුවෙන් කරන්න පුළුවන් කියල මම හිතනවා.

● අලුත් මුහුණු පාර්ලිමේන්තුවට ගියා කියල රටේත් ජනතාවගේත් ප්‍රශ්න සම්පූ-ර්ණයෙන්ම විසඳන්න පුළුවන්ද?

නෑ එහෙම කරන්න බෑ. අ පිට පැව-රුණ වගකීම අපි ඉටු කරන ආකාරය අනුව තමයි රටේත් ජනතාවගෙත් ප්‍රශ්න විසඳන්න පුළුවන් වෙන්නෙ. අනෙක මොන දේ කරන්නත් අපි හැමදෙනාම එකතුවෙලා රටේ ආර්ථිකය ගොඩ නඟන්න ඕන. ඒ සඳහා අපි හැමෝටම වගකීමක් තිබෙනවා. පළමු වටයේදී රටේ ජනතාවත් හවුල් කර ගෙන ආර්ථික සංවර්ධනය සඳහා අපි කැප වෙන්න ඕනෑ.

කවුරු හරි තමන් ගේ ගෙවත්තේ පැලයක් හිට-වනවා නම් ඒකත් රටේ ආර්ථික සංවර්ධනයට බලපානවා. එහෙම හිතල මුළු රටම එකම වැඩ බිමක් සේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න තම තමන් ඉන්න තැන්වල ඉඳගෙන හැකි අයුරින් දායක වෙන්න ඕන.

● අලුත් ආණ්ඩුවට තුනෙන් දෙකේ බලයක් තිබෙන එක අනර්ථ-කාරි වෙන්න පුළුවන් කියල මතයක් තිබෙනවා. ඔබ මොනවද ඒ ගැන කියන්නේ?

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා අගමැති මහින්ද රාජපක්ෂ සමඟ අපි මෙවර මැතිවරණයේ දී තුනෙන් දෙකේ බලයක් ඉල්ලුවේ අනර්ථකාරී 19 වන ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරන්නයි. ජනතාව අපේ ඉල්ලීමට තමයි මේ ප්‍රතිචාර දක්වා තිබෙන්නේ. ජනතාව දන්නවා රාජපක්ෂවරු කවදාවත් බලය යොදා ගෙන ජනතාවට අනර්ථයක් කරන්නේ නෑ කියල. ඔබට මතකද එදා ජේ.ආර්.ජයවර්ධන හයෙන් පහක බලයක් ලබා ගෙන රටට කරපු විනා-ශය.අදටත් අපිට ඒ විනාශය නවත්වා ගන්න බැරිවෙලා තියෙනවා.එවැනි රටට අහිතකර ජනතාවට හානිකර කිසි දෙයක් අපේ ආණ්ඩුව කරන්නේ නෑ කියල අපිට විශ්වාසයි.

● අලුත් අමාත්‍යංශ සංයුතිය පිළිබඳව ඔබ මොනවද හිතන්නේ?

ඇත්තටම කාලෙකට පස්සේ අපේ ඇමති මණ්ඩලයට ශ්‍රී ලාංකේය පදනමක් දැම්මා කියලයි මට නම් හිතෙන්නේ. දේශීය නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු කර අපේ නව අමාත්‍ය මණ්ඩලය පත් කරල තියෙ-නවා. ඒ හැම දෙනාටම ඉලක්ක ගත වැඩ පිළිවෙළකුත් ලබා දීල තිබෙනවා. ඒ අනුව මේ ඇමැති මණ්ඩලය කට-යුතු කළොත් අපිට අපේ රට කෙටි කාලයක් තුල ලෝකයේ නමක් දිනා ගත් රටක් බවට පත් කරන්න පුළු-වන්. ජනාධිපති දුන්නු ඉලක්කය සපුරා ගන්න නොහැකි වුණොත් ඒ තනතුරු ආපසු ගන්න පසුබට වෙන්නෙ නෑ කියලත් ජනාධිපති කියල තියෙනවා. ඒ නිසා ඉස්සර වාගේ ඇමතිකම් අර ගෙන රට සවාරි යන්න ලැබෙන්නෙ නෑ.

● ගෝඨාභය රාජපක්ෂ ජනපති ඇතුලු රාජපක්ෂවරු පස්දෙනෙක් අමාත්‍ය තනතුරු දරනවා. ඒ ගැනත් විවිධ චෝදනා එල්ල වෙනවා. ඔබ මොනවද මේ ගැන කියන්නේ?

ඔබ කියන විදියට රාජපක්ෂවරු තනතුරු දරන්නේ ගෙදර නිදා ගෙන ඉදලා නින්දෙන් නැගිටලා ඇවිත් නොවෙයි නේ. මෙරටේ පැවැති තිස් අවුරුදු යුද්ධය නිම කර රටට සාමය උදාකර දුන් මහින්ද රාජපක්ෂ හා ගෝඨාභය රාජපක්ෂ ලෝක ඉතිහා-සයට එක්ව ඇති වීරයෝ. ඔවුන් දැන් මෙරටේ රජ පවුලක්. හැබැයි ඒ රජකම උරුමයට ලැබුණ එකක නොවෙයි; මේ රටට ආදරය කරන නිසා ජන-තාව දුන්නු රජකමක්. 2015 දී ජනතාව නොමඟ යවලා මහින්ද රාජපක්ෂ ගෙදර යවපු අය; පාර්ලිමේන්තුවේ පස්සට දාල රාජපක්ෂ පවුල පාර්ලි-මේන්තුවේ ඉස්සරහට ගන්න ශක්තිය දුන්නේ ජනතාව. ඒ නිසා ජනතා බලයට චෝදනා කරන්න බෑ. ජනතා කැමත්ත තියෙන තාක්කල් රාජපක්ෂ පවුල මේ රටේ නායකකම් කරන එක නවත්වන්න කාටවත් බෑ.

පිළිතුරු සැපයීම :- කායික රෝග විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක

දියණියගේ සැරපරුෂ බව ගැටලුවක්

ප්‍රශ්නය :- මගේ දියණිය 26 හැවිරිදි අවිවාහක තරුණියකි. ඇ කාර්යාලයක පරිගණක අංශයේ රැකියාවක නිරත වී සිටියි. මෑතක සිට ඇයට නිවසේ අය රුස්සන්නේ නැත. විශේෂයෙන් මම සහ මගේ බාල දියණිය සමග නිතරම අඬදබර කරයි. සැමියා සමග නම් ඒ තරමටම රණ්ඩුවට යන්නේ නැත. අපි කෑම කන්න කීවත් වැරදිය. නොකීවත් වැරදිය. අප දන්නා පරිදි ඇයට ප්‍රේම සම්බන්ධයක් ද නැත. අප විවාහ යෝජනා ද ගෙනෙන නමුත් තවමත් යෝජනාවක් ස්ථිර වී නැත. දියණිය ඇගේ නැඟණිය සහ මා සමග කලහකාරී ලෙස හැසිරෙන නිසා දියණියව මනෝ වෛද්‍යවරයකුට යොමු කිරීමට සිතුවත් ඇ පිටස්තරයන් හා මිතුරියන් සමග ඉතා විනෝදයෙන්, සහයෝගයෙන් කල් ගෙවන නිසා ඊට මඳක් පසුබා සිටිමි. දියණියගේ දබරය තිබෙන්නේ බාල දියණිය සහ මා සමග පමණි. මා කළ යුත්තේ කුමක්ද? උපදෙසක් බලාපොරොත්තු වෙමි.

කයිකාවල - සුභාෂිණී යශෝධා ලබුතලේ

පිළිතුර :- ඔබේ දියණියට තිබෙන්නේ මනෝ වෛද්‍ය ප්‍රතිකාර ගත යුතු රෝගයක් නොවේ. නිවසේ සමීපතමයන් සමග ඇති ගැටලුවකි. ප්‍රථමයෙන් ඔබේ දියණියට ඔබ හා බාල දියණිය සමග ඇති ගැටලුව හඳුනාගත යුතුය. එය කතා කර දැන ගැනීමට අපහසු නම් ඔබේ සැමියා මාර්ගයෙන් දියණියගෙන් දැනගන්න. එසේ දැන ගැනීමට නොහැකි නම් හොඳම මිතුරියකගෙන් දැනගෙන ගැටලුව විසඳාගන්න.

ඇඳේ සිටීමට සිදුවේදැයි බියෙන්

ප්‍රශ්නය :- මම 68 හැවිරිදි කාන්තාවක්මි. අධි රුධිර පීඩනය සහ ඔස්ටියෝපොරොසිස් රෝගවලින් පෙළෙමි. මීට වසර 5කට පමණ පෙර මගේ වම් තට්ටම් ප්‍රදේශයෙන් කැක්කුම හට ගෙන ඇවිද ගැනීමට අපහසු විය. එය දරුණු වූ විට MRI ස්කෑනින් පරීක්ෂණයකට වෛද්‍යවරයා විසින් මා යොමු කරනු ලැබීය. එහෙත් මගේ දරුවන් සහ මා ශල්‍යකර්මයක් සිදු කිරීමට කැමති නැත. ඉන්පසුව මට ප්‍රතිකාර කළ රක්තවේද හා පුනරුත්ථාපන විශේෂඥ වෛද්‍යවරයා මා ව්‍යායාම සඳහා යොමු කළේය. ඉඳහිට කකුලේ වේදනාවක් ඇති වුවද සාමාන්‍ය තත්ත්වයෙන් මම කාලය ගත කරමි. එහෙත් මගේ වම් කකුල ක්‍රමක්‍රමයෙන් සිහින් වේ. කකුලේ පැහැය ද වෙනස් වී ඇත. පය බිම තබා ඇවිදින්නේ අමාරුවෙනි. කොඳු ඇට ජෙළියේ සැත්කම සිදු නොකළොත් මට ඇවිදීමට නොහැකිව ඇඳට වී සිටින්නට සිදු වේදැයි බියෙන් පසුවෙමි. මා කළ යුත්තේ කුමක්ද? වෛද්‍ය උපදෙසක් බලාපොරොත්තු වෙමි.

තලංගම - රෝහිණී සෝමලතා

පිළිතුර :- සපයා ඇති විස්තරය අනුව ස්නායු තෙරපුමක් නිසා රෝගි තත්ත්වයන් උත්සන්න වී ඇති බව පෙනේ. එය නිට්ටාවට සුව කර ගත හැක්කේ ශල්‍යකර්මයක් මගිනි. වෛද්‍යවරයා සැත්කමට භාජනය කළ යුතු බව ඔබට දන්වා ඇත්තේ එමනිසාය. ඔබේ ස්නායු තෙරපුමෙන් රුධිර සැපයුම අඩු වී කකුලේ පේශි දියවීම, පාදයේ පැහැය වෙනස් වීම ඇතිවේ. කකුලේ වේදනාව සහ හිරි වැටීම ඇතිවේ. කාලයත් සමග ඔබේ රෝගි තත්ත්වය උත්සන්න වී ඇත. ශල්‍යකර්මය සිදු නොකිරීමෙන් ඔබට ඇඳට වී සිටින්නට සිදු වේ දැයි නිශ්චිතව පැවසීමට නම් ඔබව පරීක්ෂා කළ යුතුය. ඔබේ රෝගි තත්ත්වයේ ඔබ පසුවන අවධිය කුමක්දැයි නිශ්චිතව හඳුනා ගත යුතුය. එබැවින් ඔබේ ප්‍රශ්නයට පුවත්පතින් පිළිතුරු දිය නොහැකිය. එහෙත් ඔබේ රෝග ලක්ෂණ සමනය කර සහනදායි ආකාරයට ජීවත්වීමට යම් යම් ක්‍රමවේදයන් වෛද්‍ය විද්‍යාවේ පවතී. වේදනා නාශක ඖෂධ භාවිතය, ව්‍යායාම කිරීම වැනි ක්‍රමවේද ගණනාවක් තිබේ. ඒ මගින් ඔබට පීඩාකාරී තත්ත්වය පාලනය කර ගත හැකිය. කෙසේ නමුදු ඔබ ප්‍රතිකාර ගෙන තිබෙන්නේ රක්තවේද හා පුනරුත්ථාපන විශේෂඥ වෛද්‍යවරයකුගෙන් නිසා ඔබ ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු හමු වී උපදෙස් ගැනීම අත්‍යවශ්‍ය දෙයකි.

පීනස දරුණු වීමෙන් ගැටලු රැසක්

ප්‍රශ්නය :- මම 52 හැවිරිදි විවාහක පිරිමියෙක්මි. කාර්යාලයක පරිපාලන අංශයේ නිලධාරියකු ලෙස සේවය කරමි. මා කුඩා වියේ පටන් සෙම රෝගයෙන් පෙළුණෙමි. වයස අවු: 16, 17 වන විට පීනස් රෝගයට ගොදුරු වූවෙමි. ඊට ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලැබුවෙමි. නැවතත් වයස අවු: 30 ඉක්මවූ විට පීනස දරුණු විය. මට නාසයෙන් සොටු දියර ගැලීම හෝ කිවිසුම් යෑම නැත. මට තිබෙන්නේ නළල දෙපස සමග හිස කැක්කුම සහ උගුරේ සෙම ඇති වීමයි. කතා කරන විට උගුර පාදා සෙම බුරුල් කර කතා කිරීමට සිදුවේ. සමහර දිනවල මුහුණ තඩිස්සි වේ. මේ දිනවල නැවතත් මගේ සෙම තත්ත්වය වැඩි වී හිස කැක්කුම ඇති වේ. කන් දෙපස, බෙල්ල පිටුපස හා උරහිස්වල වේදනාව පවතී. වාෂ්ප ඇල්ලූ විට හිස කැක්කුම අඩු වුවත් කන් දෙපස, බෙල්ල පිටුපස කැක්කුම විටින් විට ඇති වේ. කාර්යාලයේ වායු සමීකරණ යන්ත්‍රය ද මීට හේතුවක් විය හැකි බව මම අනුමාන කරමි. සමහරවිට සමබරතාව නැති වී හිසේ කරකැවිල්ල පවා ඇති වේ. මගේ සෙම තත්ත්වය නිට්ටාවට සුව කළ නොහැකිද? වෛද්‍ය උපදෙසක් බලාපොරොත්තු වෙමි.

හෙයියන්තුඩුව - සංජය මාධව ගුණසිංහ

පිළිතුර :- ඔබ කෝඨරක ප්‍රදාහයෙන් පෙළෙන බව පෙනේ. කෝඨරක ප්‍රදාහයන් එක් ස්ථානයක හෝ ස්ථාන 2ක පමණක් නොව ස්ථාන කීපයක ඇති බව ඔබ එවා ඇති විස්තර අනුව අනුමාන කළ හැකිය. එය කාලයක් මුළුල්ලේ පවතින රෝගි තත්ත්වයක් නිසා කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ලබා ගත යුතුය. ඇතැම්විට ප්‍රතිජීවක ඖෂධ පවා භාවිත කිරීමට සිදු විය හැකිය. ඔබ ආහාර සහ චර්යා රටාවන් අනුව රෝගය පාලනය කර ගැනීමට උත්සාහ කිරීම වරදක් නැත. එහෙත් කෝඨරක ප්‍රදාහයේ ඖෂධ ගැනීමේ තත්ත්වයේ ඔබ සිටින නිසා ප්‍රතිකාර ගැනීම අනිවාර්යයෙන් කළ යුතුය. මෙය සුළු කොට සැලකීමෙන් ආසාදන තත්ත්වයන් වැනි අතුරු ආබාධ ඇති වී තත්ත්වය දරුණු විය හැකිය. ඔබේ කන පිටුපස සහ උගුරේ ද සෙම ඇති බව පවසන හෙයින් ළඟම පිහිටි රජයේ රෝහලේ උගුර - කන - නාසය සම්බන්ධ සායනයට ගොස් වෛද්‍යවරයකු හමුවීම සුදුසුය.

නායකත්වයෙන් ඉවත් වුණේ පසු පෙළට අවස්ථාව දෙන්න!



මහ බැංකු බැඳුම්කර මගඩිය ප්‍රථමයෙන්ම හෙළි කළේ මමයි. එතකොට මම කෝප් කමිටුවේ සභාපති

ප්‍රවීණ දේශපාලනඥ ඩිව් ගුණසේකර

● **හර්ෂා සුගතදාස**

ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ධුරය හෙබවූ ඩිව් ගුණසේකර මහතා එම තනතුරෙන් ඉවත් වන බව 30 වැනි ඉරිදා පක්ෂයේ මධ්‍යම කාරක සභාවට දැනුම් දී තිබේ. ඒ වෙනුවට විශේෂඥ වෛද්‍ය ජී. වීරසිංහ මහතා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නව ලේකම් ලෙස පත් වී සිටියි. 1958 දී ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය ලැබීමෙන් පසුව කොළඹ දිස්ත්‍රික් ලේකම් වශයෙන් පත් වූ ඩිව් ගුණසේකර මහතා, 1972 දී මධ්‍යම කාරක සභාවට පත් විය. ඉන් අනතුරුව පක්ෂයේ භාණ්ඩාගාරික, ජාත්‍යන්තර ලේකම්, උප සභාපති, සභාපති වශයෙන් තනතුරු ගණනාවක් දැරූ ඔහු 2004 සිට ප්‍රධාන ලේකම් ධුරය හෙබවිය. ඊට අමතරව පාර්ලිමේන්තු කැබිනට් අමාත්‍ය, රූපවාහිනී සංස්ථාවේ සභාපති, කෝප් කමිටු සභාපති, පෙත්සම් කාරක සභාවේ සභාපති යනාදී වශයෙන් තනතුරු ගණනාවක් ඉසිලූ ඩිව් ගුණසේකර මහතා දේශපාලන අත්දැකීම් සම්භාරයක් ඇති කෘතහස්ත දේශපාලනඥයෙකි. ඔහුගේ දේශපාලන දිවියේ රසබර අත්දැකීම් සහ ඔහු මුහුණ දුන් අභියෝග අළලා මෙම ලිපිය සැකසිණි.

දොන් එඩ්වින් වීරසිංහ (ඩිව්) ගුණසේකර යන දේශපාලන නායකයා ගැන ඇසූ කිසිවකු මේ රටේ නැති බව කිවහොත් එය පුදුමයට කාරණයක් නොවේ. එහෙත් ඩිව් ගුණසේකර යන දේශපාලන නායකයා ගැන නොඇසූ කෙනෙකු නම් මේ දිවයිනේ නොමැත. දොන් එඩ්වින් වීරසිංහ ගුණසේකරගේ නමේ මුල'කුරුවලින්, එනම් DEW යන අකුරු තුනෙන් නිර්මාණය වූ "ඩිව්" නාමයෙන් ඔහු භෞතිස්ම වීම ද අපූරු කතාවකි.

"මම 5 වැනි පන්තියේ ඉගෙන ගනිද්දි නාම ලේඛනයේ සඳහන් වී තිබුණේ DEW ගුණසේකර කියලා. නම් ලකුණු කරපු ගුරුවරයා කිව්වා ඩිව් කියන්නේ පිනිදිය කියලා. ඔහු මට ඩිව් කියලා අඬගහන්න පටන් ගත්තා. ඒ නම හැමෝම අතර ජනප්‍රිය කළේ රංජිත් ධීරරත්න ශිෂ්‍යයා. ඊට පස්සේ හැමෝම මට කතා කළේ ඩිව් කියලා." ඩිව් නම නිර්මාණය වූ ආකාරය ඔහු විස්තර කළේ එලෙසිනි.

මාතර ඉපදී, මාතර රාහුල විද්‍යාලයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය තෙක් අධ්‍යාපනය ලැබූ ඩිව් ගුණසේකර කොළඹ නගරයට සේන්දු වූයේ රැකියාවක් ලැබීමෙනි. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරි, තක්සේරු නිලධාරි තනතුරු දැරූ ඔහු 1958 දී ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගන්නේ කුඩා වියේ පටන් කොමියුනිස්ට් පක්ෂය කෙරෙහි කැමැත්තක් තිබූ නිසාය.

"මම 5වැනි පන්තියේ ඉන්න කාලේ ගුරු - ශිෂ්‍ය - දෙමාපිය විරෝධතා රැස්වීමකට ගියා. ඒ කාලේත් වාමාංශික අදහස් තිබුණා. අනික මම පාසල් යන කාලයේ නැවතිලා හිටියේ උයන්වත්ත පිට්ටනිය ඉදිරිපිට ඥාති ගෙදරක. ඒ කාලේ කොමියුනිස්ට් පක්ෂයේ රැස්වීම් පැවැත්වුණේ උයන්වත්ත පිට්ටනියේ. ඒ රැස්වීම්වලට ආපු පීටර් කෙනමන්, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහගේ කතා ඒ කාලේ අපි කට පාඩම් කරගෙන හිටියේ. ඒ දවස්වලම මම කොමියුනිස්ට් පක්ෂයට ආශක්ත වුණා. දැනුම් තේරුම් කාලේ කොමියුනිස්ට් දේශපාලනයට තිබුණු කැමැත්ත නිසා පක්ෂයට බැඳුණා." ඔහු සිය දේශපාලන ගමන්මගේ මුල් පියවර කීපය ගැන තොරතුරු අනාවරණය කළේය.

එහෙත් ඔහුට හොර රහසින් දේශපාලනයේ යෙදෙන්නට සිදු වූයේ ඔහු රජයේ රැකියාවක නිරත අයකු වූ නිසාය. එදවස අද මෙන් රජයේ රැකියාවක නිරත වූවන්ට දේශපාලනයේ යෙදෙන්නට අවසරයක් තිබුණේ නැත. වරක් ඔහු බොරැල්ලේ වයි.එම්.බී.ඒ. ශාලාවේ පැවැති පීටර් කෙනමන්ගේ ශාස්ත්‍රීය දේශනයකට සවන් දීමට ගියේය. එහි පරිවර්තකයා ලෙස කටයුතු කිරීම ප්‍රේමලාල් කුමාරසිරිට භාර වී තිබුණත් එදින ඔහු නොපැමිණි බැවින් එම කටයුත්ත ඩිව් ගුණසේකරට භාර විය. වේදිකාවේ සිට පීටර් කෙනමන්ගේ දේශනය පරිවර්තනය කරන ඩිව්ට හීන් දාඩිය දැම්මේ තුන් භාර සියයක සෙනඟ අතරේ ඔහුගේ කාර්යාලයේ ඉහළ නිලධාරියකු ද සිටින බව ඔහු දුටු විටදීය. වැඩ තහනමකට ලක්වීමේ අවදානමට සූදානම් වී ඩිව් පසුදින රැකියාවට ගියේය. එහෙත් එවැනි දඬුවමක් ඔහුට හිමි වූයේ නැත. 1964 දී ආරම්භ කළ "ඇත්ත" පත්‍රයට උදව් කිරීමට ගිය අවස්ථාවේදී නම් ඩිව් ගුණසේකර සිය රැකියාව බේරා ගත්තේ අනුනවයෙනි.



ඩිව් තරුණ වියේදී

"ඇත්ත පත්තරේට උදව් කරන්න කියලා කිව්වාම මම පාන්දර 1.00ට බයිසිකලය පැදගෙන බොරැල්ලෙ කොටා පාරේ කාර්යාලයට එනවා. ලිපි ලියලා, සෝදුපත් බලලා, පිටු මුද්‍රණයට භාර දීලා හැමදේම කරලා උදේ 7.30ට විතර බෝඩිමට ගිහින් හැඳ පැලඳගෙන මම ආපහු කාර්යාලයට යනවා. කොහොමහරි මම පත්තරේට ලියනවා, මම කොමියුනිස්ට්කාරයෙක් කියලා සී.අයි.ඩී. වාර්තාවක් ගිහින් තිබුණා. අන්තිමට මට අපේ පක්ෂයෙන් හොයලා දුන්නා මගේ මුල් අකුරු තියෙන ගුණසේකර නම තියෙන කෙනෙක්. ඔහු ඩොනල්ඩ් ස්ටුඩියෝ එකේ වැඩ කළේ. එයා තමයි පත්තරේට ලියන්නේ කියලා මම බේරුණා. කොහොම වුණත් අපේ කොමසාරිස් මාව ඉවත් කරන්න සූදානම් වුණේ නැහැ. ඒ නිසා රස්සාව බේරුණා." ඔහු සිය අත්දැකීම විස්තර කළේය.

1970 දී බලයට පත් වූ සමගි පෙරමුණ රජයේ නිවාස ඇමති වූ පීටර් කෙනමන්ගේ පෞද්ගලික ලේකම් තනතුර හෙබවූයේ ඩිව් ගුණසේකරය. ඒ කාලේ අද මෙන් මැති ඇමතිවරුන්ගේ පවුලේ ඥාතීන් නොව රජයේ ඉහළ තනතුරු දැරූ නිලධාරීන් පෞද්ගලික ලේකම් තනතුරට බඳවා ගැනීම විශේෂත්වයක් බව පැවසීමට ඩිව් ගුණසේකර මහතා අමතක කළේ නැත. 1977දී ඇති වූ ආණ්ඩු පෙරළියත් සමග පෞද්ගලික ලේකම් තනතුර ඔහුට අහිමි විය. එහෙත් ඔහු රජයේ රැකියාවෙන් ඉවත් වූයේ 1977 මහ මැතිවරණයට තංගල්ල ආසනයෙන් තරග වැදුණු නිසාය. අවසානයේදී ඔහුට රජයේ රැකියාවත් පෞද්ගලික ලේකම් තනතුරත් දෙකම නැති විය. තනතුර අහිමි වුවද ඔහු දේශපාලනය අත් හැරියේ නැත. ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරි සාමාජිකයකු ලෙස රටේ වැදගත් භූමිකාවලට ඔහු දායක විය. 1982 ජනාධිපතිවරණයේ ජනාධිපති අපේක්ෂක හෙක්ටර් කොබ්බෑකඩුව මහතාට සහය දක්වමින් කටයුතු කිරීම ඊට එක් නිදසුනකි. 83 කළු ජූලියත් සමග මීගමුව බන්ධනාගාරයේ රිමාන්ඩ් සිරකරුවකු ලෙස තුන් මාසයක් සිටින්නට සිදු වූයේ ද ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරි සාමාජිකයකු වූ නිසාය.

ඩිව් ගුණසේකර පාර්ලිමේන්තුවට පැමිණියේ 1986 දීය. ඒ, කලවාන ආසනයේ මන්ත්‍රී සරත් මුත්තෙට්ටුවේගම හදිසි අනතුරකින් මිය ගිය බැවින් හිස් වූ ආසනයට කොමියුනිස්ට් පක්ෂයෙන් මන්ත්‍රී ධුරයට නම් කළේ ඩිව් ගුණසේකර නිසාය.

88-89 කාලෙ අවස්ථා ගණනක දී කැරැලිකරුවන් මාව මරන්න ආවා...

ඩිව් කලවාන මන්ත්‍රී වූ අවස්ථාවේදී විජයානන්ද දහනායක සමඟ

"මම පාර්ලිමේන්තුවට ඇවිත් මංගල කතාව කරපු දවසේ Fine speech - Daha කියලා දම්පාට තීන්තෙන් ලියපු තුණ්ඩුවක් ලැබුණා. එය එවලා තිබුණේ දහනායක මහත්තයා. පිළිතුරු කතාව කළේ ලලිත් ඇතුළත්මුදලි. එදා ලලිත් ඇතුළත්මුදලි කිව්වා මංගල කථාව නිසා මුකුත් කියන්නේ නැහැ. අපට හොඳ කොමියුනිස්ට්කාරයෙක් ලැබිලා තියෙනවා කියලා කිව්වා. ඒත් අද නවක මන්ත්‍රීවරයකුට කතාවක් කරන්න පුළුවන්ද? නැගිට්ට ගමන් හූ කියනවා. එදා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව හොඳ කතාවක් කියලා අගය කරලා තුණ්ඩු කෑලි එව්වා. මගේ කතා අගය කරලා ලලිත් ඇතුළත්මුදලි, ගාමිණී දිසානායක, නිශ්ශංක විජේරත්න යන අය එවපු තුණ්ඩු මා ළඟ තිබෙනවා. දැන් පාර්ලිමේන්තුවේ එහෙම සංස්කෘතියක් නැහැ." යනුවෙන් ඩිව් ගුණසේකර සඳහන් කළේ කනගාටුවෙනි.

88 - 89 භීෂණ සමයේදී ඩිව් ගුණසේකරගේ පිටුපසින් මාරයා පැමිණියේ වරක් දෙවරක් නොවේ. බොහෝ වාරයක් මාරයා ඔහු සොයා ගෙන ආවේය. ඊට හේතුව ලෙස ඔහු සඳහන් කරන්නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට ඔහු පක්ෂව ඡන්දය දීමයි. 13 වැනි සංශෝධනයෙන් සිදු කෙරුණේ පළාත් සභා ස්ථාපිත කිරීමය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ සහ යූඇන්පීයෙන් පිල් මාරු කළ මන්ත්‍රීවරුන් දෙදෙනකු ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන විට ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කළ එකම පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිව් ගුණසේකර ඊට පක්ෂව ඡන්දය දුන්නේය. ඔහු ඊට පක්ෂව ඡන්දය දී තිබුණේ දෙමළ ජාතිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණෙනි.

"එක දවසක් රෑ 10ට විතර කළු රෙදිවලින් මුහුණ වහ ගත් තරුණයන් කණ්ඩායමක් මගේ ගෙදරට කඩා වැදුණා. ඒ වෙලාවේ මට බේරෙන්න තිබුණේ මොළය පාවිච්චි කිරීමෙන් විතරයි. මම ටක් ගාලා ගෙදර Main switch එක off කළා. මුළු ගෙදරම කළුවර වුණාම ඒ අය පැනලා ගියා. එක් අවස්ථාවක මම මරණයෙන් බේරුණේ මහින්ද රාජපක්ෂ මහත්තයා ඔත්තුව දීපු නිසා. මම නැවතිලා හිටපු නැදෑ ගෙදර කාමරයක පිරිමි කීපදෙනෙක් බෝඩිම් වෙලා හිටියා. ඒ අය අතර හිටපු නීතිඥවරයෙක් මාව මරන්න ඔත්තු බලමින් ඉඳලා. මගේ ඥාතිවරිය මට ඒ බව දැනුම් දීපු නිසා මම මරණයෙන් බේරුණා. ඒ කාලේ මට මරණ තර්ජන වැඩි වන විට පොලිස්පති පොලිස් භටයන් හයදෙනකු මට දුන්නා. ඒ හයදෙනාගෙන් එක්කෙනෙක් අපේ ගම් පළාතේ ජේ.වී.පී. එකට සම්බන්ධ කෙනෙක්. මම පොලිස්පතිට කිව්වා පොලිස් ආරක්ෂාව ඉවත් කරන්න කියලා. මට පක්ෂයේ සහෝදරවරු ආරක්ෂාව දුන්නා." ඔහු මරණයෙන් ගැලවුණු අයුරු විස්තර කළේ එසේය.

1989න් පසුව ඔහු නැවතත් පාර්ලිමේන්තුවට පැමිණියේ 2004 දීය. එහෙත් ඊට පෙර 1994 - 2000 වකවානුව ඔහු ස්වාධීන රූපවාහිනියේ සහ ජාතික රූපවාහිනියේ සභාපතිත්වය දැරූ යුගයක් ලෙස සටහන් වී තිබේ. යුද්ධය පැවති කාලයක මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම තුලනාත්මකව පවත්වා ගනිමින් මාධ්‍ය හැසිරවීම ඔහු ලැබූ සුවිශාල අභියෝගයක් විය. ඔහු සඳහන් කරන්නේ ඔහුගේ ජීවිතයේ වැඩිම පීඩනයකින් කටයුතු කළ කාලය එම වකවානුව බවයි.

2004 දී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පැමිණි ඩිව් ගුණසේකර මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා ඇමති ලෙස කටයුතු කළ අතර 2010 දීද ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පැමිණි ඔහුට හිමි වූයේ පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමති ධුරයයි. 2007 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවයට එක්වන සෑම නිලධාරියකුටම සිංහල හා දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම අනිවාර්ය කරනු ලැබුවේ ඔහු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා ලෙස කටයුතු කළ සමයේ ය. එමෙන්ම 2010 සිට සෑම මැතිවරණයකදීම ජාතික හැඳුනුම්පත අනිවාර්ය වූයේ ඩිව් ගුණසේකර අමාත්‍යවරයාගේ නොපසුබට අරගලයක ප්‍රතිඵලයක් වශයෙනි. මීට අමතරව මන්ත්‍රීවරුන්ගේ විනය පාලක තේරීම් කමිටුවෙත් පෙත්සම් කාරක සභාවේත් කෝප් කමිටුවෙත් සභාපති තනතුරු දැරුවේ ඩිව් ගුණසේකර මහතාය. කුප්‍රකට මහ බැංකු බැඳුම්කර වංචාව ප්‍රථම වතාවට හෙළිදරව් කර ගැනීමට හැකි වූයේ ඔහුගේ සභාපතිත්වයෙන් යුක්තව පැවැති කෝප් කමිටුවේදීය. මාසයක් මුළුල්ලේ ගැඹුරින් විමර්ශනය කරමින් පිටු 450ක වාචික සාක්ෂි වාර්තාවක් සම්පාදනය කර, පසුදින උදෑසන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම්ව තිබියදී මධ්‍යම රාත්‍රියේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා ඔහුගේ කෝප් කමිටු වාර්තාවට නෛතික වලංගුභාවයක් හිමි වූයේ නැත.

"මම කෝප් කමිටු වාර්තාවෙන් අනාවරණය කළා මහ බැංකු බැඳුම්කර මගඩිය. ඒත් අන්තිමට දඬුවම් ලැබුණේ මට. හොරුන්ට නොවෙයි. මොකද මගේ හෙළිදරව්වත් එක්ක මගේ නම ජාතික ලැයිස්තුවට ඇතුළත් කළේ නැහැ." යනුවෙන් ඩිව් ගුණසේකර සඳහන් කළේ දේශපාලනයේ ජරාජීර්ණ බව පැහැදිලි කරමිනි.

නිදහස් ශ්‍රී ලංකාවේ පළමු රාජ්‍ය නායකයාගේ සිට වර්තමාන රාජ්‍ය නායකයා දක්වා සිටි සියලුම රාජ්‍ය නායකයන් මුණගැසී කතාබහ කළ එකම පුද්ගලයා ඩිව් ගුණසේකර විය හැකිය. ඔහුට ඩී.ඇස්. සේනානායක අග්‍රාමාත්‍යවරයා සමග කතාබහ කිරීමට අවස්ථාවක් ලැබී තිබුණේ පාසල් වියේදීය. එකල මාතර රාහුල විදුහලේ ත්‍යාග ප්‍රදානෝත්සවයක ආරාධිත අමුත්තා ලෙස පැමිණි ඩී.ඇස්. සේනානායක අගමැතිවරයාට සංග්‍රහ කිරීමේ රාජකාරිය පැවරී තිබුණේ ශිෂ්‍ය නායකයකුව සිටි ඩිව් ගුණසේකරටය. එදා සිට අද දක්වාම සිටි රාජ්‍ය නායකයන් අතරින් ඔහුගේ ප්‍රියතම රාජ්‍ය නායකයා වන්නේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි.

"සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය හරිම විනය ගරුකයි. කියන්න තියෙන දේ මුහුණට කියනවා. මට මතකයි 70 - 77 කාලේ ඇන්.ඇම්. පෙරේරා ඇමතිවරයාගේ පෞද්ගලික ලේකම්ට ඇමති ඉස්සරහදිම බැන්නා. ඒ වගේම එතුමිය වෙලාවට වැඩ කරන කෙනෙක්. 94 දී මට විදේශ නියෝජිතයන් පිරිසක් අරං හවස 5.00ට බණ්ඩාරනායක මැතිනිය හමුවෙන්න යන්න තිබුණා. ඒ කාලේ එතුමිය අගමැතිනිය. මම හවස 5.00ට යනකොට රටේ අගමැතිනිය 4.53ට ඇවිල්ලා. ඒ කාලේ ජනාධිපතිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය. සිරිමාවෝ මැඩම් මට කියනවා ඩිව් හිතුවද මමත් ඔයාගේ නායිකාව වගේ කියලා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කියපු කතාවක් තමයි චන්ද්‍රිකා මැඩම් ඉස්කෝලේ යන කාලේදිත් වෙලාවට යන්නෙ නැහැ කියලා. සපත්තු ජෝඩුව අතේ අරං කාර් එකට දුවනවා." යනුවෙන් අපූරු කතාවක් අනාවරණය කළේ ඩිව් ගුණසේකර මහතාය.

ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වී විපක්ෂයේ සිටියදී 13 වැනි සංශෝධනයට පක්ෂ වූවා සේ ම ආණ්ඩු පක්ෂයේ කැබිනට් ඇමතිවරයකුව සිටියදී ආණ්ඩුවට විරුද්ධව කටයුතු කළ අවස්ථා ද තිබේ. ශිරාණි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට එරෙහිව දෝෂාභියෝගයක් ඉදිරිපත් කළ අවස්ථාවේ ඇ වරදක් කර තිබේ නම් දඬුවම් දීම සාධාරණ නමුත් ඇයව ඉවත් කිරීමට අනුගමනය කළ ක්‍රමවේදය කෙරෙහි දැඩි විරෝධයක් දක්වා තිබීම එක් අවස්ථාවකි. 13 වැනි සංශෝධනයට තවත් සංශෝධනයක් එක් කිරීමට සූදානම් වූ අවස්ථාවේ දැඩි විරෝධය පාමින් එය නතර කරවනු ලැබුවේ ඩිව් ගුණසේකර අමාත්‍යවරයාය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනයට විරෝධය පාමින් "තියාගන්න මගේ ඇමතිකමයි මන්ත්‍රිකමයි දෙකම" යනුවෙන් පැවසීමට තරම් ඔහු එඩිතර විය.

මේ වන විට 85 වැනි වියේ පසු වන ඩිව් ගුණසේකර ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ධුරයෙන් ඉවත් වූයේ පක්ෂයේ පසුපෙළට අවස්ථාව දිය යුතු නිසාය. බල ලෝභයෙන් තනතුරු බදාගෙන සිටින ඇතැම් දේශපාලන නායකයන්ට ඔහු ආදර්ශවත් චරිතයකි. ඔහු තනතුර අත් හැරිය නමුදු දේශපාලනයෙන් සමුගෙන නැත.

විජේදාස ලියනාරච්චි ඝාතනයේ සුලමුල

● ධර්මන් වික්‍රමරත්න

විජේදාස ලියනාරච්චි උපන්නේ 1951 ජනවාරි 14 වීරකැටිය බුද්ධියගමය. කෘෂි ව්‍යාප්ති නිලධාරියකු වූ ඔහුගේ පියා ලියනාරච්චිගේ දොන් ජුවානිස් අප්පුහාමිය. මව විදානගමගේ දොන් සිසිලියානාය. 14 දෙනකු ගෙන් යුත් පවුලේ 7වැනියා වූ විජේදාස වීරකැටිය මධ්‍ය විද්‍යාලයෙන් පාසැල් අධ්‍යාපනය ලැබීය. අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත්වූ හෙතෙම 1969 දී ගාල්ල රිච්මන්ඩ් විදුහලට ඇතුළු වූයේ උසස් පෙළ හැදෑරීමටය.



නීතිඥ විජේදාස ඝාතනයට විරෝධය පළකරමින් 1988 සැප්තැම්බර් 05 අලුත්කඩේ අධිකරණ සංකීර්ණයේ පැවති විරෝධතාවයේදී නීතිඥයන් දෙදෙනෙක් අධිකරණ ගොඩනැගිල්ලක පත්‍රිකා අලවන අයුරු.

නීතිඥ විජේදාස ලියනාරච්චි ගේ ඉළ ඇට 19ක් කැඩී ඇති බවත් සිරුරේ අභ්‍යන්තර තුවාල සියයකට අධික ගණනක් තිබූ බවට මරණ පරීක්ෂණයේදී හෙළි වෙයි.

විජේදාස මිය යෑමෙන් පසුව ඔහුට ජවිපෙ විසින් මධ්‍යම කමිටුවේ ගරු සමාජිකත්වය පිරිනමයි.

ජවිපෙ 2වැනි කැරැල්ලේදී නීතිඥයන් 15ක් ඝාතනය වූ අතර ඉන් 8 දෙනකු ආරක්ෂක අංශ සහ එමඟින් මෙහෙයවූ අතුරු හමුදා කණ්ඩායම් මඟින්ද, 7 දෙනෙකු කැරලිකරුවන් විසින්ද ඝාතනය කරන ලදී.

විජේදාස වාමාංශික දේශපාලනයට ප්‍රවේශ වූයේ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ශිෂ්‍ය සංගමය වන ලංකා ජාතික ශිෂ්‍ය සංගමය හරහා 1968 දී ය. පසුව ඔහු එහි වීරකැටිය ශාඛාවේ ලේකම් විය. විජේදාසව කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලනයට එක්කර ගනු ලැබුවේ එවකට කොමියුනිස්ට් පක්ෂ ශිෂ්‍ය සංවිධානයේ හම්බන්තොට දිසා ලේකම් මද්දුම පටබැදිගේ චන්ද්‍රපාලය. ජවිපෙ දේශපාලනයට විජේදාස ලියනාරච්චි 1970 මාර්තු යොමු වූයේ රිච්මන්ඩ් විදුහලේ ඉගෙන ගන්නා කාලයේදීය. ඒ ජවිපෙ බද්දේගම නායකයකු වූ 1950 ජූනි 05 උපන් තෙලිකඩ පල්ලියගුරුගේ ගුණපාල විසින් දංගෙදර විහාරයේ දී පවත්වන ලද ජවිපෙ පන්ති හරහාය.

ඒ වන විටද ඔහුගේ සහෝදරියක් ජවිපෙ දේශපාලනයට සම්බන්ධවී සිටි අතර ඇය 71 කැරැල්ලේ දී අත්අඩංගුවටද පත්වූවා ය. ජවිපෙ දේශපාලනය තුළ විජේදාස යළි සක්‍රිය චරිතයක් වන්නේ හම්බන්තොට විජිත රණවීර ගේ මැදිහත්වීමෙනි. ඒ 1976දීය. විජේදාස ලියනාරච්චි ගේ සහෝදරිය විවාහ වී සිටියේ දකුණු පළාතේ හුංගම සැම්සන් සමඟය. 71 අප්‍රේල් කැරැල්ලටද සම්බන්ධ වූ හුංගම සැම්සන් පසුව ජවිපෙන් ඉවත්වී ජවිපෙ විරෝධී ස්ථාවරයක් ගැනීම නිසා ජවිපෙ 2වැනි කැරලි සමයේ දී කැරලිකරුවන් විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී.

වසර 1977 මහ මැතිවරණයේ දී ජවිපෙ නමින් තරග නොකළ ද ශ්‍රීලනිපයට සහ එජාපයට එරෙහිව තංගල්ල ඇතුළු රටපුරා ආසන 4කට ස්වාධීන අපේක්ෂකයන් වශයෙන් තරග කළේය. එහි ජනප්‍රිය කථිකයෙක් වූයේ විජේදාසය. සංවර්ධන සභා මැතිවරණය 1981 ජූලි 04 පැවැති අවස්ථාවේ දී හම්බන්තොට දිස්ත්‍රික්කයට තරග කරන ලද්දේ පියසේන රාමනායක, විජේදාස ලියනාරච්චි, ගුණපාල සතරසිංහ ආරච්චිගේ සහ ජේ. ආර්. ඩී. සිරිපාලය. ඉන් පියසේන රාමනායක පමණක් සංවර්ධන සභා මන්ත්‍රීවරයකු වශයෙන් පත්විය.

විජේදාස ගුරු වෘත්තිය ආරම්භ කළේ හම්බන්තොට අලුත්වෙල මහා විද්‍යාලයෙනි. පසුව දෙනිය පිංගම මහා විද්‍යාලයටද අනතුරුව මන්නාරමටද මාරුවක් ලැබීය. වෘත්තීය ජීවිතයේ සටන්කාමියෙක් වීමේ වරදට මාස 6කින් පසු වැඩ තහනමකට ලක්විය. විජේදාස පසුව ගුරු වෘත්තියට සමු දී කටුබැද්ද තාක්ෂණික විද්‍යාලයේ ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවක්ද හැදෑරීය. ඉන් සමත්වූ ඔහුට මහවැලි ව්‍යාපාරයේ රත්කිඳ ව්‍යාපෘතියේ කාර්මික සහකාරවරයකු ලෙස රැකියාවක් හිමි විය.

උපන් ගමේ තරුණයන් සමඟ එක්ව ඔහු 'තරුණ මිතුරු හවුල' සංවිධානය මගින් බොහෝ ක්‍රියාකාරකම් කළේය. වීරකැටියේ කලා සහ ක්‍රීඩා සමාජය බිහිවූයේද ඔහුගේ පුරෝගාමීත්වයෙනි. වික්ටර් රත්නායක සහ සනත් නන්දසිරි කලාකරුවන්ද ගෙන්වා ප්‍රසංගයක් පැවැත්වීමට විජේදාස සමත්විය. කලා සංගමය මගින් සමාජ අසාධාරණයට එරෙහිව නිපදවූ 'නින්දගමක රුසියෝ' නම් නාට්‍යය රාජ්‍ය නාට්‍ය උලෙළේ දෙවන ස්ථානය ලබා ගත්තේය. ඔහු ජවිපෙ වෘත්තිය සමිති සහ අධ්‍යාපන අංශයන්හි ඉහළ තලයේ භූමිකාවක්ද ඉටු කළේය

රැකියාවේ නිරතව සිටියදීම උසස් පෙළ විභාගයට කලා අංශයෙන් පෞද්ගලිකව පෙනී සිටීමට තීරණය කළ ඔහු ඉන් සමත්වන්නේ අධි සාමාර්ථ 3ක් සමඟය. වසර 1984 දී නීති විද්‍යාලයට ඇතුළු වූ හෙතෙම නීතිඥයකු ලෙස දිවුරුම් දුන්නේ 1987දීය. විජේදාස ජනාධිපති නිතිඥ රංජිත් අබේසූරිය(1932-2014) ගේ කණිටු නීතිඥයෙකි. එමෙන්ම ජ්‍යෙෂ්ඨ නිතිඥයින් වන ගෝමින් දයාසිරි සහ ප්‍රින්ස් ගුණසේකර සමඟද කටයුතු කළේය. ප්‍රකට පුවත්පත් කලාවේදියකු වූ ලසන්ත වික්‍රමතුංගද ඔහුගේ සමකාලීන නීතිඥවරයෙකි. හෙබියස්කෝපූස් නඩුවල දී විජේදාස ඒවා බොහොමයක් ඉදිරිපත්කර තිබුණේ සිංහල භාෂාවෙන්ය.

කොළඹ පුරවැසි කමිටුවේ මූලස්ථානය රොස්මීඩ් පෙදෙසේ නිතිඥ ප්‍රින්ස් ගුණසේකර ගේ නිවසේ ඔහුගේ ප්‍රධානත්වයෙන් 1988/89 ක්‍රියාත්මක විය. එහි දී ඉදිරිපත් වූ නඩු බොහෝමයකටම විජේදාස මැදිහත් විය. කතුවරයා කොළඹ දිස්ත්‍රික් පුරවැසි කමිටුවේ සංවිධායක වූ අතර එහි සම ලේකම්වරුන් වූ නීතිඥයන් වන චරිත ලංකාපුර 1989 ජූලි 7 සහ කාංචන අබේපාල 1989 අගෝස්තු 28ද ප්‍රා සංවිධානය මගින් ඝාතනය කරන ලදී.

නීතිඥ විජේදාස උසාවි කටයුතු අවසන් වීමෙන් පසු නුගේගොඩ ගංගොඩවිල දී තංගල්ලෙන් පැමිණි පොලිස් කණ්ඩායමක් විසින් පැහැරගනු ලැබුවේ 1988 අගෝස්තු 25 පස්වරු 4ට පමණය. ඊට පසුදා එනම් අගෝස්තු 26 සිකුරාදා පෝය නිවාඩුවක් යෙදී තිබූ බැවින් අගෝස්තු 25 රාත්‍රී ගමේ නිවස බලා යෑම ඔහුගේ අරමුණ විය. පැහැරගනු ලැබුවේ තංගල්ල පොලිස් අධිකාරි කරවිටගේ ධර්මදාස ගේ උපදෙස් අනුව සිවිල් ඇඳුමෙන් සැරසී සිටි පිරිසකි. කරවිටගේ ධර්මදාස ගේ පියා කාන්තන් ධර්මදාසන්ය. විජේදාස එතැනින් මාතරටද පසුව තංගල්ල පොලීසියටද ගෙන ගියේය. තංගල්ල පොලිස් අධිකාරි ධර්මදාස ගේ තංගල්ලේ පිහිටි නිල නිවසේ විජේදාස තබාගත් අතර එහි දී තිරස්චීන වධබන්ධනවලට ලක්වූ බව කියති.

විජේදාස පැහැරගෙන ගිය රථයේම කොළඹ රාජකීය විදුහලේ සිසුවකු වූ සුසන්තද සිටි අතර ඔහු පානදුර ප්‍රදේශයේ දී අත්හරින ලදී. එම සිසුවා විසින් විජේදාස ගේ පැහැරගැනීම දැනුම් නොදෙන්නට මෙම සිද්ධිය සදාකාලික අභිරහසක් වන්නට තිබිණි. තංගල්ලට ගෙනගිය ලියනාරච්චිට පහරදීම පිළිබඳව චෝදනා එල්ල වූයේ උප පොලිස් පරීක්ෂක බී. එච්. මෙන්ඩිස් ඇතුළු පිරිසක් විසිනි. විජේවීර ඝාතනයෙන් පසු ජවිපෙ විසින් එකළ බිත්තිවල 'පරවුණු මල් නැවත පිපේ' යනුවෙන් සටන් පාඨයක් ලියා තිබූ අතර එයට පිළිතුරක් ලෙස එම වැකි පහළින් ලියන ලද 'පරණ ටයර් තවත් තිබේ' යන වචනයේ නිර්මාපකයාද උප පොලිස් පරීක්ෂක මෙන්ඩිස්ය.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය වහා ඉදිරිපත් වී නීතිඥ විජේදාස ගේ අයිතීන් වෙනුවෙන් රජයේ පාර්ශ්ව සමඟ කටයුතු කළේය. ඒ අතර ජනාධිපති ආර්. ප්‍රේමදාස සහ ආරක්ෂක අමාත්‍ය රන්ජන් විජේරත්නද විය. විජේදාස ගේ බාප්පා වන නුගේගොඩ ගැමුණු තිස්ස දහනායක විසින් විජේදාස අධිකරණය හමුවට ගෙන එන ලෙස ඉල්ලමින් ශ්‍රේෂ්ඨාධිකරණයට හෙබායාස්කෝපුස් පෙත්සමක් 1988 සැප්තැම්බර් 1 ඉදිරිපත් කළේය. ඒ පිළිබඳ සලකා බැලූ අධිකරණය 1988 සැප්තැම්බර් 7 බදාදා උදේ 10.00ට නීතිඥ විජේදාස ලියනාරච්චි අධිකරණයට පමුණුවන ලෙස පොලිස්පති අර්නස්ට් පෙරේරාට නියෝග කළේය. වග උත්තරකරුවකුට සිතාසි නිකුත් නොකොට පුද්ගලයා අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කරනු ලැබූ ප්‍රථම අධිකරණ නියෝගය එය විය.

විජේදාස 1968 කොමියුනිස්ට් පක්ෂයේ ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ වීරකැටියේ ශාඛාවේ ලේකම් ලෙස වාම දේශපාලනයට ගෙන ආ කොමියුනිස්ට් ශිෂ්‍ය සංගමයේ එවකට හම්බන්තොට දිස්ත්‍රික් සංවිධායක තංගල්ලේ මද්දුම පටබැදිගේ චන්ද්‍රපාල හෙවත් එම්. පී. චන්ද්‍රපාල, විජේදාසට 1970දී ජවිපෙ පන්ති පැවැත්වූ තෙලිකඩ පල්ලියගුරුගේ ගුණපාල, 1988 අගෝස්තු 25 විජේදාස පැහැරගැනීම පිළිබඳව චෝදනා ලැබූ තංගල්ල පොලිස් අධිකාරි කරවිටගේ ධර්මදාස, විජේදාස ගේ ජ්‍යෙෂ්ඨ නීතිඥ වූ ජනාධිපති නීතිඥ රංජිත් අබේසූරිය සහ පැහැරගැනීමට එරෙහිව සටනට නායකත්වය දුන් එවකට නීතිඥ සංගමයේ සභාපති ජනාධිපති නීතිඥ එච්. එල්. ද. සිල්වා වමේ සිටය.

වමේ සිට ප්‍රථම ඡායාරූප තුන නීතිඥ විජේදාස ලියනාරච්චි ගේ ජීවිතයේ විවිධ අවස්ථාවන්ය.
සිවුවන සහ පස්වන ඡායාරූපයේ සිටින්නේ විජේදාස ගේ පියා ජුවානිස් අප්පුහාමි සහ මව සිසිලියානාය.

ඝාතනය සිදුවී සැප්තැම්බර් 3 දාට වසර 32යි

නීතිඥ විජේදාස ගේ ඉළ ඇට 19ක් කැඩී ඇති බවත් සිරුරේ අභ්‍යන්තර තුවාල සියයකට අධික ගණනක් තිබූ බවට මරණ පරීක්ෂණයේදී හෙළි වෙයි. එමෙන්ම මොට්ට ආයුධයකින් පහරදීම හේතුකොටගෙන හිස් කබලට සහ මාංශපේශීන්ට සිදුවූ තුවාල නිසා ඇතිවූ කම්පනය සහ අධික ලේ ගැලීම හේතුකොට ගෙන මරණය සිදුවූ බව අධිකරණ වෛද්‍ය නිලධාරීන් ප්‍රකාශ කළහ. මහේස්ත්‍රාත් පරීක්ෂණය මාලිගාකන්ද වැඩබලන මහේස්ත්‍රාත්වරයා විසින් පවත්වන ලදී.

නීතිඥ විජේදාස ගේ මළසිරුර ඔහුගේ පියාට බාරදෙන ලෙස මහේස්ත්‍රාත් විසින් නියම කළ අතර කළුබෝවිල අවමංගල ශාලාවෙන් දේහය බලහත්කාරයෙන් ලබාගත් ආරක්ෂක අංශ එය වීරකැටියට හෙළිකොප්ටරයකින් ගෙන ගොස් ඥාතීන්ට බාරදෙන ලදී. මියයන විට අවිවාහකයකු වූ ඔහු 37 හැවිරිදිය.

මානව හිමිකම් නීතිඥවරයකුගේ මෙම මරණයට එරෙහිව ශ්‍රී ලංකා නීතිඥ සංගමය සුවිශේෂී වැඩ කොටසක් ඉටු කළේය. ඒ අනුව 1988 සැප්තැම්බර් 7 දිවයින පුරා උසාවිවල සේවය කරන නීතිඥයෝ වර්ජනයක නිරත වූහ. එමෙන්ම කොළඹ උසාවිවල නීතිඥයෝ උසාවි වර්ජනය කර නීති ශිෂ්‍යයන් සමඟ එක්ව විරෝධතා පෙළපාළිවලද නිරත විය. ශ්‍රී ලංකා නීතිඥ සංගමය මෙම ඝාතනයට විරෝධය දක්වමින් හෙබෙයාස්කෝපූස් නඩුවල දී පොලිසියේ සහ ආරක්ෂක හමුදාවල සාමාජිකයන් වෙනුවෙන් පෙනී සිටීමෙන් වැළකී සිටීමටද තීරණය කළේය. එකල ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ 1987/89 දක්වා සභාපති වූයේ එච්. එල්. ද සිල්වාය; උපාලි ගුණරත්න ලේකම්ය; පාලිත මැතිව් භාණ්ඩාගාරිකය.

රාජ්‍ය මාධ්‍ය මගින් 1988 සැප්තැම්බර් 3 සිට දැවැන්ත ප්‍රචාරයක් කරමින් කියා සිටියේ නීතිඥ විජේදාස ලියනාරච්චි දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ කැලෑ උසාවියේ නායකයකු බව ද මහජන පක්ෂයේ නායක විජය කුමාරතුංග සහ එජාප සභාපති හර්ෂ අබේවර්ධන යන අය මරාදැමීමට නියෝග කළේ ඔහු බවත්ය. විජේදාස 1976 සිට ජවිපෙ ක්‍රියාකාරි සාමාජිකයකු වශයෙන් කටයුතු කළේය. තිස්සමහාරාමයට රවිය; බෙලිඅත්තට රනිල්ය; කොළඹට මංජුය. ඔහු මියයන විට ජවිපෙ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයකු නොවීය. එයට හේතුවූයේ එහි සාමාජිකත්වය දැරිය හැකි වන්නේ පක්ෂයේ පූර්ණකාලීනයකුට පමණක් බැවිනි. එහෙත් විජේදාස මියයෑමෙන් පසුව ඔහුට ජවිපෙ විසින් මධ්‍යම කමිටුවේ ගරු සමාජිකත්වය පිරිනමන ලදී.

දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය මගින් 1988 සැප්තැම්බර් 10 නිකුත් කරනු ලැබූ නියෝගයකින් කියා සිටියේ 1988 සැප්තැම්බර් 12 'මව්බිම වෙනුවෙන් දිවිපිදූ දේශප්‍රේමී නීතිඥ' විජේදාස ලියනාරච්චි ඝාතනයට එරෙහිව ජාතික ශෝක දිනයක් පවත්වන බවය. එබැවින් ඒ සඳහා ක්‍රියාකළ යුතු බවට ජනතාවට නියෝග කළේය. ඒ අනුව උතුරු නැගෙනහිර හැර සියලුම පළාත් සඳහා ජවිපෙ ඇඳිරි නීතිය පැනවීමෙන් එදින කටයුතු අඩාළ විය. විජේදාසගේ සිරුර මිහිදන් කළේ වීරකැටියේ ඔහුගේ පවුලේ සුසාන භූමියේදීය. ඉන් වසරකට එපිට මියගිය ඔහුගේ මැණියන් ගේ සිරුරද ඒ අසලම විය. පියා වූ ජුවානිස් අප්පුහාමි වසර 95ක් ආයු වලඳා 2006 වසරේ සමුගත් අතර ඔහුගේ දේහයද එම ස්ථානයේම පසුව තැන්පත් කරනු ලැබීය.

විජේදාස ගේ ඝාතනය පිළිබඳව නඩු විභාගය 1989 දෙසැම්බර් ආරම්භ වූයේ මහාධිකරණ විනිසුරුවන් තිදෙනකු ගෙන් සැදුම්ලත් ජූරි සභාවක් ඉදිරියේය. නඩු විභාගය අවසානයේ තීන්දුව 1991 ප්‍රකාශයට පෙර අනපේක්ෂිත ලෙසින් තමන් ලියනාරච්චි පැහැරගෙන යාම සහ අයුතු ලෙස සිරකිරීම සම්බන්ධයෙන් වරදකරුවන් බව චූදිතයන් කියා සිටියහ. ඔවුන්ට නියම කරන ලද්දේ අත්හිටුවූ සිරදඬුවම් පමණි. රහසිගත ස්ථානයක දී මියයන තෙක් විජේදාසට වධහිංසා පමුණුවා ඇති බව හෙළිවිය. ඔහුට පහර දුන්නේ තංගල්ලේදිද සපුගස්කන්දේද යන ප්‍රශ්නයට උත්තර දිය හැක්කේ අදාළ සාපරාධී ක්‍රියාවට වගකිවයුතු පුද්ගලයන්ට පමණක් බව පසුව පත්කළ බටලන්ද ජනාධිපති කොමිසමේ මතය විය.

නීතිඥ ලියනාරච්චි ගේ ඝාතනයෙන් පසු ඇතිවූ ජාතික සහ ජාත්‍යන්තර උද්ඝෝෂණයන්ගෙන් අනතුරුව තංගල්ල පොලිස් අධිකාරි කරවිටගේ ධර්මදාස ගේ වැඩ තහනම් කිරීමට රජයට සිදුවිය. එහෙත් ඔහුට කොම්පඤ්ඤවීදියේ පොලිස් නිල නිවාසයන්හි නිවසක්ද, ආරක්ෂාවට පොලිස් භටයන්ද, පිත්තෝලයක්ද ලබා දී තිබිණි. නියෝජ්‍ය පොලිස්පති බෙනට් පෙරේරා විසින් ලබාදුන් පොලිසියේ 504 මෝටර් රථයක්ද ඔහු වැඩ තහනම් කාලයේ පරිහරණය කළේය. පවුලේ අය නුවර පදිංචිව සිටි අතර පසුව රජය මගින් ඔහුගේ බිරිය සහ දියණිය බ්‍රිතාන්‍යයට යැවීම සඳහා දිරිදෙන ලදී. කරවිටගේ ධර්මදාස පුංචි බොරැල්ලේ කාර් සේල් අලෙවිසැලක දී එක් දහවලක දී සිය පිස්තෝලයෙන් හිසට වෙඩි තබා ගෙන අවසානයේ මියගොස් තිබිණි.

ජවිපෙ 2වැනි කැරලි සමය තුළ රටේ නීතිය වල්වැදී තිබූ අතර තරුණයන් ඇතුළු විශාල පිරිසක් ඝාතනයට ලක්විය. තවත් පිරිසක් අතුරුදහන් විය. එමෙන්ම අත්අඩංගුවට පත්වූ පිරිසද සුළුපටු නොවේ. මේ සියල්ල වෙනුවෙන් පුරවැසි කමිටු සහ මානව හිමිකම් ක්‍රියාකාරිකයන් ගේ මඟ පෙන්වීම යටතේ නීතිඥයන් විසින් හබයාකෝපුස් නඩු විශාල ප්‍රමාණයක් අධිකරණයට ඉදිරිපත් කර තිබිණි. වසර 1987 ජූලි 27 සිට 1989 මාර්තු 15 වන විට උතුරු නැගෙනහිර පළාත් හැර රටේ සෙසු පළාත්වල පැහැරගැනීම්වලට එරෙහිව ඉදිරිපත්වූ නඩු සංඛ්‍යාව 661කි. මින් සියයට 95ක් ඉදිරිපත්කර තිබුණේ මානව හිමිකම් අගයන විජේදාස ලියනාරච්චි ඇතුළු නීතිඥයන් කිහිපදෙනකු විසිනි. ජවිපෙ 2වැනි කැරැල්ලේ දී නීතිඥයන් 15ක් ඝාතනයට පත්විය. ඉන් 8 දෙනකු ආරක්ෂක අංශ සහ එමගින් මෙහෙයවූ අතුරු හමුදා කණ්ඩායම් මගින්ද 7 දෙනකු කැරලිකරුවන් විසින්ද ඝාතනය කරන ලදී.

ජවිපෙ 2වැනි කැරැල්ලේ දී කැරලිකරුවන් විසින් නිල නොවන උසාවි දිස්ත්‍රික්ක 3ක 1989 මැද භාගයේ දී නියමු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කරන ලදී. ඒවා ඇරඹුවේ හම්බන්තොට, කෑගල්ල සහ මොනරාගලය. කැරලිකරුවන් ගේ මෙම උසාවි සංකල්පයේ නිර්මාතෘවරයා ලෙස ආරක්ෂක අංශ චෝදනා කළේ ඝාතනයට ලක්වූ නීතිඥ විජේදාස ලියනාරච්චිටය.

හම්බන්තොට කුඩාවැල්ල උසාවිය කුඩාවැල්ල ජයවික්‍රම මහා විද්‍යාලීය ශාලාව් දී සතියකට දෙවරක් සවස 4 සිට 7 දක්වා පැවැත්විණි. මෙය නැරඹීමටද 50කට ආසන්න පිරිසක් එක් රැස්විය. පැමිණිලි ලැබූ අදාළ පාර්ශ්වයන් සතියකට පසු කැරලිකරුවන් ගේ උසාවියට කැඳවන අතර එහි දී නඩු අසා වැරදිකරුවන්ට දඬුවම් පමුණුවන ලදී.

ඒ අනුව වැරදිකරුවන් පොල්කටු මාල පැලඳ ප්‍රසිද්ධ ස්ථානයක පැය කිහිපයක් ඇවිදීම, නැවත එම වැරදි නොකරන බවට පුවරු අල්ලාගෙන සිටීම, හිස මුඩු කිරීම, නිවෙස් ඉදිරිපිට සමාව ඉල්ලා බැනර් ප්‍රදර්ශනය කිරීම, සිදුකළ වරද කියමින් ලයිට් කණුවක බැඳ තැබීම, පාර දිගේ ටික දුරක් දණගාගෙන යෑම ඇතුළු දඬුවම් ගණනාවක් අයත් විය. දික්කසාදයක් ඉල්ලූ කාන්තාවකට කැරලිකරුවන් ගේ උසාවිය එම ඉල්ලීමට ඉඩනොදුන් අතර යළි එක්වීමට දෙපාර්ශ්වයටම නියෝග කරන ලදී. නියෝගය කඩ කළ කාන්තාව පසුව ඝාතනයට ලක්වූවාය.

හම්බන්තොට කුඩාවැල්ල 'කැරලිකරුවන් ගේ උසාවියේ' ප්‍රධානියා ලෙස කටයුතු කළේ විලියම් හෙට්ටිහේවාය. ගුරුවරයකු වූ ඔහු 71 කැරැල්ලටද සම්බන්ධය. ඔහු කැරැල්ලේ දී හම්බන්තොට දිස්ත්‍රික්කයේ හුංගම කොට්ඨාසයේ දේශපාලන අංශයේ නායකයා ලෙස කටයුතු කළ ජගත් හෙට්ටිගේ ගේ පියාය. කැරැල්ලේ පරාජයෙන් පසු 1990 අවසානයේ දී ත්‍රිකුණාමලයේ දී අත්අඩංගුවට පත් ජගත් තංගල්ල පොලිසියට ගෙන ඒමෙන් පසු වධබන්ධනවලට ලක්ව 1991 දී රැකව දී ඝාතනයට පත්විය. හුංගම විජයබා විද්‍යාලයේ සිසුවකු වන විලියම් හෙට්ටිහේවා ගේ පුත්‍රයකුද කැරැල්ලේ දී ආරක්ෂක අංශ මගින් ඝාතනයට ලක්විය.එම කුඩාවැල්ල උසාවියේ කැරලිකරුවන් වෙනුවෙන් පෙනී සිටියේ උපසේන සමරවීරය. ධීවර ව්‍යාපාරිකයකු වූ ඔහුද වසර 1971 අප්‍රේල් කැරැල්ලට සම්බන්ධව සිටි අයෙකි. පසු කලෙක උපසේන එජාප ක්‍රියාකාරිකයකු විය.

කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ආසනයේ කැරලිකරුවන් ගේ උසාවිය පවත්වාගෙන ගියේ දෙහිඕවිට අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි පන්නිල වීරසිංහ විද්‍යාලයේය. එහි විදුහල්පති කාරියවසම් වූ අතර ගුරුවරුන් 15ක් සහ සිසුන් 100ක් පමණ අධ්‍යාපනය හැදෑරූ මිශ්‍ර පාසැලකි. පාසැල අවට ගම්මාන වූයේ දිද්දෙණිය, අම්බලන්පිටිය, බැබිල, හිඟුරල කන්ද ඇතුළු ස්ථානයන්ය. කැරලිකරුවන් ගේ උසාවිය එහි ප්‍රධාන ශාලාවේ දී සතියේ සෑම අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනකම පැය 4ක් පැවැත්විණි.

එහි ප්‍රධානියා වූයේ ඉඹුල්පිටිය ගොඩගම්පල උපන් චන්ද්‍රසිරිය. එම උසාවිය මගින් දුන් එක් දඬුවමක් වූයේ අම්බලම්පිටිය බස්නැවතුම්පොළේ තේ කඩයක් හිමි අයිරාංගනී ඝාතනය කිරීමය. චෝදනාව වූයේ ආරක්ෂක අංශ සාමාජිකයන්ට පානය සඳහා තේ ලබා දීමය. මාස 3ක් කැරලිකරුවන් ගේ උසාවිය පැවැති අතර 1989 සැප්තැම්බර් 18 ආරක්ෂක අංශ එල්ලකළ ප්‍රහාරයකින් පසු එය නතර විය. උසාවියේ සම්බන්ධීකරණ කටයුතු කළ කැරලිකරුවන් 5ක්ද එහි දී ඝාතනය විය.

නීතිඥ විජේදාස ඝාතනයට එරෙහිව ජවිපෙ 1988 සැප්තැම්බර් 12 රටපුරා පැවැත්වූ ජාතික ශෝක දිනය සහ විරෝධතා දිනයේදී කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිට එදින දහවල් දිස්වූයේ මෙසේය.

ආනවිලුන්දාව විනාශ කළ අයට වැඩ වරදී

සිළුමිණ ග්‍රැෆික්: මහේෂ් විදානපතිරණ

● රජිත බස්නායක

විවිධාකාර වූ පරිසර පද්ධතීන් තුළ වාසය කරන මිනිසා තම අසීමිත අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කරන්නේ සීමිත වූ භූමි ප්‍රමාණයෙනි. පරිසර පද්ධතීන් තුළ එකිනෙකට සමාන නොවන විවිධ හැඩතල යටතේ පවතින භූමි හමු වේ. ඒ අතුරින් තෙත්බිම් සුවිශේෂී වන්නේ රටක පාරිසරික මට්ටමින් වූ සමතුලිතතාව රැක ගැනීමෙහිලා තෙත්බිම් මනා කාර්යභාරයක් ඉටු කරන හෙයිනි. ලංකාවේ පවතින තෙත් බිම් අතුරින් මේ මොහොතේ වඩාත් කතාබහට ලක්ව ඇති තෙත් බිමක් වන්නේ ආනවිලුන්දාවයි. රැම්සා තෙත් බිමක් ලෙසින් නම් කරන ලද අභය භූමියක් වන ආනවිලුන්දාව පසුගිය දිනක අක්කර ගණනාවක් ඩෝසර් කිරීම එයට හේතුවයි.

මෙරට දෙවැනි රැම්සා තෙත්බිම ආනවිලුන්දාවයි

පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වන ආනවිලුන්දාව ගම්මානයේ පුත්තලම මීගමුව මාර්ගයට යාබදව මෙම තෙත් බිම පිහිටා තිබේ. ආනවිලුන්දාව රැම්සා තෙත් බිමක් ලෙසින් නම් කරනු ලැබුවේ 2001 වසරේ අගෝස්තු මස 03 වැනිදාය. ඒ මෙරට දෙවැනි තෙත්බිම ලෙසිනි. මෙහි වැව් හතක් දක්නට ලැබෙන අතර එල්ලංගා වැව් පද්ධතිය ලෙසින් කෘෂි කර්මාන්තයටද ඉමහත් සේවාවක් ඉටු කරනු ලබන අතර පූර්ණ තෙත් බිමක් ලෙසින් නම් කර තිබේ. හෙක්ටයාර 1397 ක පමණ විශාලත්වයකින් යුතු ආනවිලුන්දාව අභයභූමියක් ලෙසින් නම් කරනු ලැබුවේ 1997 ජුනි මස 11 වැනිදාය. ආනවිලුන්දාව ජෛව සම්පත සම්බන්ධයෙන් සලකා බැලීමේදී එය මේ ආකාරයෙන් දැක්විය හැක. දැනට වාර්තා වී ඇති අන්දමට පෘෂ්ඨවංශී විශේෂ 274 ක් ,දේශීය පෘෂ්ඨ වංශී විශේෂ 237ක් වාසය කරනු ලබයි. එමෙන්ම පක්ෂි විශේෂ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී දේශීය පක්ෂි විශේෂ 131ක්, පර්වත පක්ෂී විශේෂ 37ක්, ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන 10ක්, විශේෂ තර්ජනයට ලක් වූ පක්ෂි විශේෂ 19 ක් වශයෙන් දැක්විය හැක. තවද මිරිදිය මත්ස්‍ය විශේෂ 9ක්, කිවුල්දිය මත්ස්‍ය විශේෂ 18ක්, දක්නට ලැබෙන අතර උරග ජීවී විශේෂ 9ක් උරග විශේෂ 30ක්, ක්ෂීරපායින් 20ක් මෙන්ම සමනල විශේෂ 74ක් ද සිටින බව වාර්තා වේ. මේ අතර අනෙක් රැම්සා තෙත් බිම් හතර ලෙස නම් කර ඇත්තේ පානම අභය භූමිය, විල්පත්තුව අභයභූමිය, මාඳුගඟ අභය භූමිය හා වන්කාලෙයි අභය භූමියයි. තෙත් භූමිවල පරිසරය පැලෑටි, පඳුරු මෙන් ම ගස්වලින්ද සමන්විත වේ. එමෙන්ම එහි පාංශු සැකැස්ම නිරීක්ෂණය කිරීමේදී පෙනී යන කරුණ වන්නේ එහි ජලය ගලා යෑමක් දක්නට නොලැබෙන නිසා භූමිය තුළ නිතර ජලය රැඳී තිබීමයි. මේ වන විට ශ්‍රී ලංකාව තුළ වර්ග කිලෝමීටර 2740 ක් පුරා ව්‍යාප්තව තෙත් බිම 41 ට ආසන්න ප්‍රමාණයක් පවතින අතර තෙත් බිම් පරිසර පද්ධති හයක් හෙක්ටයාර 198,172ක් පුරා රැම්සා තෙත් බිම් ලෙස නම් කර ඇත. මෙම පරිසර පද්ධතීන් හය තෙත්බිම් කාණ්ඩ තුනක් යටතේ නම් කර ඇත්තේ වැව්, ජලාශ, කුඹුරු ඇතුළත් කෘතිම තෙත් බිම් ද කඩොලාන, කලපු, කොරල්පර, මෝය, මුහුදු තෘණ බිම් ඇතුළත්ව කරදිය තෙත් බිම් ද ඇළ, දොළ ,ගංගා මිරිදිය වනාන්තර ද ඇතුළත් මිරිදිය තෙත්බිම් ඇතුළත් වන පරිදිය.

රැම්සා සම්මුතිය

රැම්සා සම්මුතිය පවත්වනු ලැබූයේ ජාතීන් 18ක ගේ ප්‍රධානත්වයෙන් 1971 පෙබරවාරි මස දෙවැනිදා ය. මෙදින ලෝකය පුරා පවතින තෙත්බිම් ආරක්ෂා කිරීම සඳහා අන්තර්ජාතික සම්මුතියට අත්සන් තබන ලද අතර එය පැවතියේ ඉරානයේ රැම්සා අගනුවරයි. එනිසා මෙම සම්මුතිය රැම්සා සම්මුතිය යනුවෙන් හැඳින්වීමට කටයුතු කළහ. 1971 දී අත්සන් තබන ලද මෙම සම්මුතිය ප්‍රායෝගික ලෙසින් ක්‍රියාත්මක වනු ලැබුවේ 1975 වසරේදීය. රටවල් 160 කට වඩා අත්සන් තබා ඇති මෙම ගිවිසුමට ලංකාව පාර්ශ්වකරුවකු වශයෙන් සම්බන්ධව ඇත්තේ 1990 වසරේ ජුනි මස 22 දා සිටය. මේ ආකාරයෙන් ගත්කල රැම්සා සම්මුතියේ මූලික අරමුණු වන්නේ ලෝකය පුරා විහිද තිබෙන තෙත්බිම් ආරක්ෂා කිරීමත් ජෛව විවිධත්වයට අනුව හැඩගැසුනු සතුන් මෙන්ම සංචාරක කුරුල්ලන් ලෙසින් හඳුන්වනු ලබන සංක්‍රමණික පක්ෂීන් රැක ගැනීමයි.

නමුත් මේ සියල්ල අභියෝගයට ලක් කරමින් මෙතෙක් තෙත් බිමක් ලෙසින් සුරැකී ආනවිලුන්දාව අභයභූමියේ අක්කර කිහිපයක් මේ වනවිටත් ඩෝසර් කර දැමීමට කවරකු හෝ කටයුතු කර තිබේ. මේ පිළිබඳ ප්‍රවෘත්තිමය අනාවරණයක් සිදු වූයේ පසුගිය මස 25 වැනි දා ය. එම ප්‍රවෘත්තියට අනුව එය ඩෝසර් කර තිබුණා යැයි සඳහන් වන්නේ ඉස්සන් ගොවිපලක් ඉදිකිරීමට ය. මීට ප්‍රථමද මේ අවට ඉස්සන් ගොවිපොළ පවත්වාගෙන ගොස් තිබුණි. මේ ආකාරයට මෙම අභය භූමිය ඉස්සන් ගොවිපොළක් සඳහා ඩෝසර් කිරීමෙන් ගම්‍ය වන්නේ රැම්සා ප්‍රතිපත්තිය හෝ අනෙකුත් පාරිසරික නියමයන් කිසිවක් සම්බන්ධයෙන් මේ සඳහා මුල් වූ කිසිවකු සොයා බැලීමක් නොකර ඇති බවය. ආනවිලුන්දාව අභය භූමිය අන් අභය භූමිවලට වඩා සුවිශේෂී බවක් පෙන්නුම් කරයි. එනම් එකිනෙකට සමීපව පිහිටි වෙනස් පරිසර පද්ධතීන් තුනක් සමග පවතින සබඳියාව හේතුවෙනි. කඩොලාන පද්ධතිය, වෙරළ හා මිරිදිය පොකුණු මෙකී වෙනස් තත්වයකින් යුත් පාරිසරික පද්ධති කිහිපයක් නිර්මාණය කිරීමට මුල් ව තිබේ. මෙම අභය භූමියේ කොටසක් ඩෝසර් කිරීමත් සමග සිදුව ඇති බරපතළම තත්ත්වය වන්නේ නැවතත් යම්කිසි අයුරකින් ගොඩනැගෙමින් තිබූ කඩොලාන කලාපය විනාශ වී යෑමයි.

මෙම භූමියේ බටහිර ප්‍රදේශයට සමීපව කඩොලාන පද්ධතීන් විනාශ කිරීමට ලක්ව පැවති නිසා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විශ්වවිද්‍යාල සිසුන්ගේද සහාය ඇතිව කඩොලාන ප්‍රසංස්කරණ කටයුතුද සිදු කරමින් පැවතිණි. නමුත් ඒ සියල්ලත් ඉතිරිව තිබූ කඩොලාන පද්ධති විනාශ මුඛයට ගෙන යෑමට මෙවුන් ක්‍රියාත්මකව තිබීමත් ඉතාම කණගාටුවට කරුණකි. පෙර සඳහන් කළාක් මෙන් මෙය රැම්සා සම්මුතිය උල්ලංඝනය කර ඇතිවාක් මෙන්ම එහි ජීවත් වන සතුන් පිළිබඳවද අවධානය යොමු කර නැත.

අභය භූමිය ඩෝසර් කිරීම

මෙම සිදුවීමත් සමග බොහෝ දෙනකු අතර කතාබහට ලක්වූ මාතෘකාවක් වූයේ ආනවිලුන්දාව අභය භූමිය ඩෝසර් කිරීම පිටුපස ප්‍රදේශයේ ප්‍රබල දේශපාලනඥයෙකු සිටිනා බවය. බහුතරයක් දෙනා ඔහු සම්බන්ධව නාමික වශයෙන් වුව සඳහන් කිරීමට මැලිකමක් නොදක්වයි. එයට වඩාත් ආසන්නතම හේතුව මීට පෙරද මෙවැනි ආකාරයේ සිදුවීමක් වීමය. එයද කඩොලාන විනාශ කිරීමක් සම්බන්ධව ඇති වූ කතා බහකි.

මේ සම්බන්ධයෙන් මුල්ම විවෘත ප්‍රකාශය කරනු ලැබුවේ පසුගිය 27 වන දා පාර්ලිමේන්තුවේදී විමල් වීරවංශ අමාත්‍යවරයාය. අමාත්‍යවරයා පැවැසූ ආකාරයට ජනතාව පසුගිය පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී තුනෙන් දෙකක ඡන්ද බලය ආණ්ඩුව වෙත ලබාදුන්නේ මෙවන් අපරාධ වැළැක්වීමට බවත් මීට වගකිව යුතු අය සොයා බලා ආණ්ඩු පක්ෂයේ වුවත් විරුද්ධ පක්ෂයේ වුවත් දඬුවම් කළ යුතු බව ය.

ආනවිලුන්දාව තෙත් බිම විනාශ කිරීම සම්බන්ධව වැරදිකරුවන්ට උපරිම නීතිමය පියවරක් ගැනීමට වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය සී. බී. රත්නායක කටයුතු කරමින් සිටී. පසුගිය 29 වනදා හානියට පත් අභය භූමියේ නිරීක්ෂණයට ගිය ඇමතිවරයා මේ සම්බන්ධව සියලු සිද්ධීන් විමර්ශනය කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ මූලිකත්වයෙන් සිවු පුද්ගල කමිටුවක් පිහිටුවීමටද කටයුතු කළ අමාත්‍යවරයා පවසා සිටියේ සති දෙකක් ඇතුළත මේ පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙසය.

ඒ සමග පසුගිය 29 වැනිදා ආරච්චිකට්ටුව පොලිසිය විසින් ඩෝසරයත් එහි රියදුරුත් අත්අඩංගුවට ගැනීමට සමත් විය. මෙම ඩෝසරයේ රියදුරු උඩප්පුව පොලිස් වසමට අයත් කිරියන්කල්ලිය ප්‍රදේශයේ පදිංචි කරුවෙකි. ඔහු සඳහන් කර ඇති ආකාරයට ඉස්සන් ව්‍යාපාරිකයකුගේ උපදෙස් මත එම ස්ථානය ඩෝසර් කිරීමේ කටයුතු කර ඇති බවත් එහි සිදු වූ කාර්මික දෝෂයක් නිසා එම කාර්යය නවතා දැමීමට සිදු වූ බවත්ය.

රියදුරු ගේ ප්‍රකාශයට අනුව මෙම ඉස්සන් ව්‍යාපාරිකයා අත්අඩංගුවට ගැනීමට පොලිසිය විසින් සමත් වූ අතර ඔවුන් දෙදෙනාම හලාවත අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මහේස්ත්‍රාත් වරයා නියෝග කරනු ලැබුවේ සැකකරුවන් දෙදෙනා සැප්තැම්බර් මස 18 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙසයි.

මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණු දේශපාලනඥයකුගේ නමක් ද මේ හා සම්බන්ධව තිබෙන අතර අභය භූමිය ඩෝසර් කිරීම සම්බන්ධ සැකකරුවන් දෙදෙනා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව මේ වන විට එම දේශපාලකයාගේ සොහොයුරාද අත් අඩංගුවට ගැනීමේ මෙහෙයුමක් පොලිස් කණ්ඩායම් තුනක් විසින් ආරම්භ කර තිබේ. ආධාර හා අනුබල දීම ඔහු වෙත එල්ල වී ඇති චෝදනාවයි. මේ වන තුරු එම පුද්ගලයා සැඟව සිටින අතර මෙම පොලිස් කණ්ඩායම් තුනට ඔහුව සොයා ගැනීමේ හැකියාවක් තවම ලැබී නැත.

තෙත්බිම විනාශ කිරීම

නමුත් ජනමාධ්‍ය තුළ මේ ආකාරයට ආනවිලුන්දාව සිද්ධිය සම්බන්ධයෙන් නොයෙකුත් කලඹගැනි මතුව පැමිණෙද්දී පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා පවසන්නේ පැවති ඉස්සන් කොටුවක රොන්මඩ ඉවත්කර සුද්ධ පවිත්‍ර කිරීමක් කර ඇති බවත් අභයභූමිය තුළ ස්ථානයක් අලුතින් එළිපෙහෙළි කිරීමකට ලක්ව නැති බවත්ය.

ආනවිලුන්දාව අභය භූමියක් කිරීමට පෙර සිටම මෙම ප්‍රදේශය ආසන්නව ඉස්සන් කොටු පැවති අතර 90 දශකයේ ඉස්සන් වගාව සඳහා හානිකර අයුරින් වයිරසයක් පැතිර යෑ ම හේතුවෙන් එම ප්‍රදේශවල ඉස්සන් වගාව අත්හැර දැමීමට සිදුවිය. නමුත් ඒ වන විටද එහි කඩොලාන පද්ධතියට දැඩි හානිගෙන දෙමින් විනාශ මුඛයට පත්ව තිබිණි. ඒ ආශ්‍රිතව හලාවත කලපුව ආසන්න කඩොලාන භූමිය 57%ක් පමණ විනාශ මුඛයට පත්ව තිබිණි. මේ ආකාරයට පරිසර පද්ධතියට සිදුවන හානිය සලකා බලමින් 2003 වසරේදී කැබිනට් තීන්දුවක් ගනු ලැබූවේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ වළවල් හාරා ඉස්සන් වගාව නතර කර දැමීමේ අරමුණෙනි. කෙසේ වෙතත් ආනවිලුන්දාව රැම්සා තෙත්බිම් විනාශ කිරීම සම්බන්ධයෙන් මේ මොහොතේ වැරදිකරුවන්ට ගනු ලබන පියවර පිළිබඳව මහජනතාව වඩාත් විමසිල්ලෙන් සිටින බවද කිව යුතුය.

සාහිත වසන්තයේ සම්මාන

ස්වර්ණ පුස්තක උලෙළ 19 දා

ගොඩගේ සම්මාන 10 දා

● ඉනෝකා සමරවික්‍රම

එක් සාහිත්‍ය සම්මාන උලෙළක් අවසන් විය . ඒ විදෝදය සාහිත්‍ය සම්මාන උලෙළයි. ඒ සමඟම නවකතාවට කෙටිකතාවට සම්මාන හිමිවීමත් සමඟ සාහිත්‍ය ගැන යළිත් සමාජ කතාබහ උණුසුම් වී ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන විදේ යෝදය සාහිතය සම්මාන හිමි වූයේ පහත සඳහන් අයුරිනි. හොඳම නවකතාව ලෙසින් සම්මාන ලැබුවේ එරික් ඉලයප්පආරච්චිගේ 'ජේත' නවකතාව වන අතර හොඳම කෙටිකතා සංග්‍රහය ලෙසින් තේරුණේද ඔහුගේම 'විශ්‍රාමික පෙම්වතිය' කෙටිකතා සංග්‍රහයයි. හොඳම තීරු ලිපි සංග්‍රහ ලෙස යසවර්ධන රුදුගු ගේ යසයාගේ වාක්‍ය, අනුර සිරි හෙට්ටිගේගේ කොළඹ කවි සම සම්මාන ලැබූහ. අජිත් තිලකසේනයන්ගේ මොනතරම් අවුලකත් ද කාව්‍ය සංග්‍රහය කොහොද කාව්‍ය සංග්‍රහය ලෙසින් තේරිණි.

විදෝදය සාහිත්‍ය සම්මාන ලාභියෝ වමේ සිට අනුරසිරි හෙට්ටිගේ, යසවර්ධන රොදිගු, එරික් ඉලයප්පආරච්චි, අජිත් තිලකසේන

එමෙන්ම ගොඩගේ ජාතික සාහිත්‍ය මහෝත්සවය මේ මස දහවැනිදා සවස 3.00 ට කොළඹ 07 ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වේ. මෙම සම්මාන උලෙළ සඳහා නිර්දේශිත සාහිත්‍ය කෘති පසුගිය දා නම් කරන ලදි. වසර විසි දෙකක් තිස්සේ ගොඩගේ පොත් සමාගම විසින් පවත්වාගෙන යනු ලබන මෙම සාහිත්‍ය සම්මාන උලෙළ පිළිබඳ අදහස් දක්වමින් එහි ප්‍රධාන සංවිධායක අනුරසිරි හෙට්ටිගේ මෙසේ පැවැසීය.

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍ය ත්‍රිත්වයෙන් ලියැවුණ කෘති සඳහා අප සම්මාන දෙනවා. පළවෙනි වටයෙන් පසු අප සම්මාන දීම සඳහා අවසන් වටයට කෘති පහක් තෝරා ගනු ලබනවා. මේ වන විට තෝරාගෙන තිබෙන මේ නවකතා අතරින් එකක් තමයි හොඳම නවකතාව ලෙස සම්මාන ලබන්නේ. අපේ සමීක්ෂකයෝ පොත් තෝරාගෙන අවසානයේ ඔවුන් අතර සිදුවන ශාස්ත්‍රීය කතිකාවකින් පසුව තමයි හොඳම කෘතිය තෝරා ගනු ලබන්නේ.

කුමර කොබෙයි - ශමෙල් ජයකොඩි, කොට තුවක්කු - ප්‍රියන්ත ලියනගේ, තීහාතා - සුරත්ද මැල්, නිෂ්ක්‍රාන්තිය - සුනේත්‍රා රාජකරුණානායක, පිටකොටුවේ රැයක් - රෝෂන් නිශාන්ත විජේසිංහ, පේන- එරික් ඉලයප්පආරච්චි, පොල් බට්ටා - ප්‍රේමකීර්ති රණතුංග, බලන් පුරසිරි නෙත්වසා - රූපා ශ්‍රියානි ඒකනායක,

රතු ඉරි ඇදි අත - ලියනගේ අමරකීර්ති, රුදු රොන් සුනු - කීර්ති වැලිසරගේ, වෑ දිය මංකඩ - විරාජ් දුමින්ද රණසිංහ

විනිවිදිමි තීර්ථය - යසේන්ද්‍ර රණවක මෙවර සම්මානය සඳහා නිර්දේශත නවකතා අතර වනවා. රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලට විකල්පයක් ලෙසින් තමයි ගොඩගේ සම්මාන උලළෙ ආරම්භ කෙරුණේ. මුලින්ම ගොඩගේ ආයතනයෙන් නිකුත් වූ කෘති සඳහා සම්මාන දුන්නත් පසුව එය වෙනස් වුණා. ආරම්භක සම්මාන උලළේ පටන්ම මේ දක්වාම නවකතා, කෙටිකතා, කාව්‍ය, තීරු ලිපි සංග්‍රහ යන අංශ වෙනුවෙන් සම්මාන ලබන්නන්ට මුදල් ත්‍යාගත් පිරිනමනු ලබනවා."

ගොඩගේ සම්මාන උලෙළ හැරුණ විට ලේඛකයන් මෙන්ම පාඨකයන් ද වැඩිමනත් බලාපොරොත්තු තබාගෙන සිටින්නේ ස්වර්ණ පුස්තක සම්මාන උලෙළ දෙසය. මෙවර ස්වර්ණ පුස්තක සම්මාන උළෙලට සමගාමීව පැවැත්වෙන රජත පුස්තක සම්මානය කාව්‍ය අංශයෙන් හිමි වූයේ අනුරාධා නිල්මිණි ලියූ රිඳුම් පිරිමැඳුම් කාව්‍ය සංග්‍රහයට. එමෙන්ම ප්‍රශස්ථම කෙටි කතාව වශයෙන් තේරුණේ අනුරසිරි හෙට්ටිගේ රචනා කළ මැරින් ඩ්‍රයිව් කෙටිකතා සංග්‍රහයට. ප්‍රශස්තම යොවුන් සාහිත්‍ය කෘතිය ලෙසින් තේරුණේ සුජාතා අලහකෝන් ලියූ 'ඒත් අපි පියාඹමු' කෘතියයි.

"මෙවර ස්වර්ණ පුස්තක සම්මාන උලෙළ පැවැත්වෙන්නේ මේ මස 19දා සවස 3.00 බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදීය. මේ සම්බන්ධව පොත් ප්‍රකාශකයින්ගේ සංගමයේ සභාපති ප්‍රවීණ ලේඛක උපාලි වනිගසූරිය මෙසේ පැවසීය. 'කොවිඩ්-19' සමඟ අපට වෙනදාට පවත්වන සම්මාන උලෙළට වඩා වෙනස් එකක් තමයි මෙවර පවත්වන්නට සිදුවෙන්නේ. මෙවර පසුගිය වසරවලට වඩා සම්මාන උලෙළට සහභාගි කරවන පිරිස අඩුකරන්නට වී තිබෙනවා. රජයේ සෞඛ්‍ය බලධාරින්ගේ නීතිවලට මුල්තැන දෙමින් උත්සවය පැවැත්වෙන්නේ. මෙවර අපේ සමීක්ෂක මණ්ඩලයේ සභාපති ධුරය හොඹවන්නේ ආචාර්ය සරත් අමුණුගම මහතා'

පොත් ප්‍රකාශකයන්ගේ සංගමය මෙම සම්මාන උලෙළ ආරම්භ කිරීමේ මූලික පරමාර්ථය වුණේ ප්‍රශස්ථම නවකතා අපේ පාඨකයන් අතරට යැවීමයි. අප 2008 සම්මාන උලෙළ පවත්වද්දි 2007 වසරේ ප්‍රකාශ කළ නවකතා 68 ක් පමණයි ඉදිරිපත් වී තිබුණේ. නමුත් වසරින් වසර ඒ ප්‍රමාණය වැඩි වුණා. මේ වසරේ නවකතා පොත් 200 ආසන්න ප්‍රමාණයක් සමීක්ෂණය සඳහා ලැබී තිබුණා. 2008 සිට මේ දක්වා බලන විට අපේ සංගමයට සතුටක් තිබෙනවා. හොඳ නවකතා ලිවීමට ලේඛකයන් උනන්දු වීමත් පාඨකයා ඒ පොත් ගැන ඉස්සරට වඩා උනන්දු වීමක් පෙනෙන්නට තිබෙන නිසා."

ස්වර්ණ පුස්තක සම්මාන උලෙළට දින වේලා නියම වී තිබුණ ද රාජ්‍ය සාහිත්‍ය සම්මාන පවත්වනු ලබන්නේ කවදා දැයි තවමත් දින නිර්ණය කර නැත. නමුදු මේ වන විටත් අදාළ පොත් සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතින බව දැන ගන්නට ලැබී ඇත.

සුරුට්ටු 500ක් අරන් මැති සබයට ආ මන්ත්‍රී

22 පිටුව

ඇතුවත් බැරි නැතුවත් බැරි ලුණු

23 පිටුව

දිනකට පස්දෙනෙක් මහ මඟට බිලි

27 පිටුව

අබේ වෙනුවට සුගා ජපානයට

ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වූ ජපාන අගමැති ශින්සො අබේ වෙනුවට යොෂිහිදෙ සුගා අගමැති ධූරයට පත් වනු ඇතැයි ජපාන ආරංචි මාර්ග සඳහන් කරයි. සුගා හිටපු අගමැති අබේගේ 'දකුණු අත' යනුවෙන්ද හඳුන්වනු ලැබේ.

සුගා වැඩි ජනප්‍රියත්වක් ලබා සිටින්නේ තිරයෙන් පිටුපස වැඩි බර උසුලන්නකු වශයෙනි. එමෙන්ම නායකයකු සතු කැරිස්මා බලයක් ඔහුට නැතැයිද පැවසේ.

තම සෞඛ්‍ය තත්ත්වය යහපත් නොවන බව පවසමින් ජපානයේ අග්‍රමාත්‍ය ශින්සෝ අබේ පසුගියදා තමා ධූරයෙන් ඉල්ලා අස්වන බව පවසා සිටියේය. මේ වන විට ඔහු වසර අටක කාලයක් ජපානයට නායකත්වය දී තිබුණු අතර, වැඩි උච්චාවචනයන්ගෙන් තොරව එරට පාලනය කිරීමේ හැකියාවද ලබා ගත්තේය. ඔහුගේ පාලනයේ ශක්තිමත් බව කොතෙක්ද යත් මේ වන විට ඉතිහාසයේ වැඩිම කළක් ජපානය පාලනය කළ අග්‍රාමාත්‍යවරයා වන්නේද අබේ ය. කෙසේ වුවද ශක්තිමත් ආණ්ඩුවක් සමඟ පාලනය ඉදිරියට ගෙන යා හැකිව තිබියදී මෙසේ සෞඛ්‍ය හේතූන් මත ඉල්ලා අස්වීමට ඔහු තීරණය කර ඇති නමුත් ඔහු පවසා ඇත්තේ තමන් පාර්ලිමේන්තු සාමාජිකයකු ලෙස දිගටම සේවයේ යෙදෙන බවයි. ඇතැම් විට මෙසේ කිරීමට හේතුව තමාගෙන පසු ඉදිරියේදී අගමැති ධූරය සඳහා තවත් අයෙකුට අත්දැකීම් ලබා දීමද විය හැකිය. මැතිවරණයට පෙර අගමැදි ධූරයේ කටයුතු කිරීමෙන් අත්දැකීම් ලබාගත් පුද්ගලයකු අගමැති ධූරාපේක්ෂකයා ලෙස පක්ෂයට නායකත්වය දීම ජනතාවගේ විශ්වාසයද දිනා ගැනීමට පහසු මගක් වේ.

කෙසේ වුවද ජපාන වාර්තා පවසා සිටින්නේ අගමැතිවරයා තම ඉල්ලා අස්වීම ප්‍රකාශ කළ පසු ජපානය කම්පනයට පත්වූ බවයි. තම අනුප්‍රාප්තිකයා පත්වන තුරු අබේ අග්‍රමාත්‍යවරයා ධූරයේ රැඳී සිටින බවද ප්‍රකාශ කර තිබේ.

කෙසේ වුවද ජපාන මාධ්‍ය වාර්තා වැඩිදුරටත් පෙන්වා දෙන්නේ මීළඟ අගමැතිවරයා සඳහා පාලක ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂය අභ්‍යන්තරයේ කණ්ඩායම් කිහිපයක තරඟයක්ද නිර්මාණය වී ඇති බවයි. ඒ කණ්ඩායම්වල කිහිපදෙනෙක් අගමැති ධූරය බලාපොරොත්තුව සිටින නමුදු විශාලතම කණ්ඩායම යොෂිහිදෙ සුගා වටා එකතු වී සිටින බවද ජපාන මාධ්‍ය වාර්තා කර තිබේ.

අබේගේ මේ ක්ෂණික ඉල්ලා අස්වීම සමඟ ජපාන දේශපාලන ක්‍රියාකාරිත්වය විග්‍රහ කරන කොලොම්බියා විශ්ව විද්‍යාලයේ ජපාන දේශපාලනය පිළිබඳ මහාචාර්ය ජෙරල්ඩ් කර්ටිස් පෙන්වා දෙන්නේ අබේගේ මේ 'කල් තබා විශ්‍රාම ගැනීම' සුගාට මැතිවරණ ජයකින් අගමැති පුටුවට යෑමට පාර කැපීමක් බවයි. අබේ වෙනුවට අගමැති ධූරයට පැමිණෙන සුගා මාස කිහිපයකින් ජනතා හඳ බැඳ ගැනීමට කටයුතු කරණු ඇති බවත්, ටික කලකින්ම 'ඔහු කොවිඩ් වසංගතය මර්දනය කර රට සාමාන්‍ය අතට ගෙන ඒමට සමත් වූ ශ්‍රේෂ්ඨ පාලකයකු යැයි ජනතාව කියනු ඇතැයිද' කර්ටිස් පෙන්වා දී තිබේ. මේ සියල්ලේ අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ සුගා මීළඟ මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීමය.

මෙවැනි අනාවැකි පළ වුවද මේ දක්වා අගමැති අබේ ස්වකීය අනුප්‍රාප්තිකයා පත් කර නැත. එමෙන්ම මේ අනාවැකි සියල්ල ජපාන ජනතාවගේ ජනමතය අනුව තීරණය වීමටද නියමිතය.

හැරී සමඟ ආදරණීය අම්මා

මියගොස් වසර 23ක් ගතවූ නමුත්

ඩයනාගේ මරණයේ හෙළි නොවූ අභිරහස

ජනතාවගේ කුමරිය යනුවෙන් විරුදාවලි ලැබූ මහා බ්‍රිතාන්‍යයේ වේල්සයේ කුමරිය ඩයනා ස්පෙන්සර් ප්‍රංශයේදී සිදුවූ හදිසි අනතුරක් හේතුවෙන් මියගොස් පසුගිය අගෝස්තු 31වැනිදාට වසර 23ක් සම්පූර්ණ වේ. එහෙත් ඇයගේ මරණයට හේතුවූ අනතුර සිදුවීමට නිශ්චිත හේතුව කුමක්දැයි තවමත් ලොවට හෙළිදරව් වී නොමැත.

ඇය මුහුණ දුන් මරණීය අනතුර සිදුවූ 1997 වසර වන විට ඇය බ්‍රිතාන්‍යයේ ඔටුන්න හිමි චාල්ස් කුමරුගෙන් දික්කසාද වී සිටියාය. ඒ වන විට ඇයගේ පෙම්වතා වූයේ යුරෝපයේ රටවල් රැසකම ව්‍යාපාර හිමිව තිබූ ධන කුබේරයකු වන මොහොමඩ් අල් ෆායිඩ්ගේ පුත් ඩෝඩි අල් ෆායිඩ් ය.

අනතුර සිදුවූ 1997 අගෝස්තු 30 දා රාත්‍රියේ ඇය ඩෝඩි සමඟ ප්‍රංශයේ පැරිස් නුවර රිට්ස් හෝටලයේ නවාතැන් ගෙන සිටියාය. මේ රිට්ස් හෝටලයේ හිමිකරු වූයේද ඩෝඩිගේ පියා වන මොහොමඩ් අල් ෆායිඩ් ය. ඊට පෙර දිනයේ ඔවුන් සාර්ඩිනියා දූපතේ සිට අල් ෆායිඩ්වරුන්ට අයත් යොට් යාත්‍රාවකින් ප්‍රංශයට පැමිණ තිබිණි. ඔවුන් එදින රාත්‍රියේ හෝටලයෙන් පිටව ලන්ඩන් බලා ගමන් කිරීමට නියමිත වී තිබිණි. එහෙත් කෙතරම් රහසිගතව සැලසුම් කළද අගෝස්තු 30 දින රාත්‍රිය වන විට රිට්ස් හෝටලයේ ඉදිරිපස පැපරාසීන් ලෙස හැඳින්වෙන ඡායාරූප ශිල්පීන් 30ක් පමණ රැස්ව සිටි බව වාර්තාවල සඳහන්ය.

ඔවුන් මඟ හැරීමට ඩයනා වඩාත් උනන්දු වූයේ ඩෝඩි සමඟ පැවති සබඳතාව රහසක් ලෙස තබා ගැනීම අරමුණු කර ගනිමින් බව පැවසෙන නමුත් පැපරාසීන්ගෙන් දුරස්ව සිටීමට ඩයනා උත්සාහ ගත්තේ ඉන් බොහෝ කලකට පෙරදීබව ලොවට රහසක් නොවේ.

කෙසේ වුවද එදින රාත්‍රී දොළහ පසුවී මිනිත්තු 20ක් ගතවූ පසු හෝටලයේ පසුපස දොරෙන් රහසිගතව නික්මුණු ඩයනා සහ ඩෝඩි මර්සිඩීස් බෙන්ස් W -140 වර්ගයේ රථයකට ගොඩ වැදුණේ ඔවුන්ගේ ශරීරාරක්ෂක ට්‍රෙවර් රීච් ජෝන්ස් සහ හෝටලයෙන් ලබා දුන් රියැදුරු හෙන්රි පෝල් ද සමඟිනි. ලන්ඩන් බලා යෑමට පෙර පැරිසියේ ධනවතුන්ගේ වාසස්ථාන පිහිටා ඇති ශම්ස් එලිසේ ප්‍රදේශය ආසන්නයේ ඇති අල් ෆායිඩ්වරුන්ට හිමි තවත් නිවසක් බලා යෑම ඔවුන්ගේ අරමුණ වී තිබිණි. මර්සිඩීස් බෙන්ස් රථයද ඔවුන් ලබාගෙන තිබුණේ කුලී පදනම මතය.

හරියටම රාත්‍රී දොළහ පසුවී විනාඩි විස්සට හෝටලයෙන් නික්මුණු බෙන්ස් රථය පැරිසියේ වූ උමං මාර්ගයක් වෙත පිවිසුණේ ඊට විනාඩි තුනකට පසුවය. බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය යන දෙරට විසින්ම ඩයනා කුමරියගේ මරණය සම්බන්ධව පවත්වන්ට යෙදුණු පරීක්ෂණ මගින් තහවුරු කෙරුණේ රථය උමං මාර්ගයට පිවිසෙනවාත් සමගම රියැදුරුගේ පාලනයෙන් ගිලිහුණු බවයි. උමං මාර්ග ප්‍රවිශ්ටයේ කැමරා සවිකර නොතිබුණු අතර අද මෙන් ඔවුන් ගමන් කළ 1993 නිෂ්පාදිත බෙන්ස් රථයේද කැමරා සවි කර තිබී නැත.

අනතුරට හේතු ලෙස අනුමාන 20ක්

ඩයනාගේ දේහය

ඩයනාගේ අවසන් ඡායාරූප

ඩයනාගේ දේහය මත කුඩා හැරී කුමරු තබා තිබූ 'අම්මා' නම් වූ සටහන

සක්වළගල

● විරෝනි වෑවලගේ

පසුගියදා පැරිස් නුවර ඩයනාගේ නොනිල ස්මාරකය අභියස ජනතා සැමරුම්

අනතුර සිදුවී විනාඩි කිහිපයකින් පසු

එබැවින් මෙතැන් සිට සියල්ල අනුමාන සහ අනතුර සිදු වී සුළු වේලාවකින් එතැනට ළඟා වූ ඇසින්දුටු සාක්ෂිකරුවන් පැවසූ තොරතුරු මත පදනම්ය. ඔවුන්ගේම ආරක්ෂාව පදනම් කර ගනිමින් නිශ්චිතව ලොවට හෙළි නොකළ ඩයනා කුමරියගේ අනතුර ඇසින් දුටු ප්‍රංශ ජාතිකයන් කිහිප දෙනෙකි. ඔවුන් අනතුර සිදුවූ අවස්ථාවේ අනතුරට ලක්වූවන්ට උදවු කිරීමේ අරමුණෙන් ඒ වෙත පැමිණි අයයි. ඔවුන් පවසා ඇති පරිදි උඩුකුරුව පෙරළුණු රථයේ සිරවී සිටි කුමරිය ඔවුන් එහි ළඟා වන විට සිටියේ හොඳ සිහියෙනි. ඇය සිටියේ නොනවත්වා Oh my God .... යනුවෙන් පවසමිනි. ඔවුන් එක්ව ඇය මෝටර් රථයෙන් ඉවතට ගෙන මාර්ගයේ පසෙකින් තබා තිබේ. ඇයගේ සිරුරේ බාහිර තුවාල කිසිවක් තිබී නොමැත. ඒ වන විට රථය ඇතුළත රියැදුරු හෙන්රි පෝල් සහ ඩෝඩි මියගොස් සිටියහ. ඩයනාගේ ශරීරාරක්ෂකයා මුහුණ ද ඇතුළුව දරුණු තුවාල ලබා සිට තිබේ.

රථය අනතුරට ලක් වනවාත් සමගම එතැනින් සුදු පැහැති ෆියට් ඌනෝ රථයක් වේගයෙන් ගමන් කළ බව ඇසින් දුටුවන් පවසා තිබේ. මේ රථයේ හිමිකරු ලෙස පුද්ගලයන් දෙදෙනෙකු වෙත සැකය එල්ල වූ අතර ඒ අතරින් එක් අයෙකු ඡායාරූප ශිල්පියෙකු විය. ඔහු 2000 වසරේදී සිය දිවි නසා ගත්තේ බරපතළ සැකයක් ඉතිරි කරමිනි. මේ අතර සුදු පැහැ ෆියට් ඌනෝ රථ බ්‍රිතාන්‍යයේ නිල ඔත්තු සේවය වන M16 සේවය විශාල ලෙස භාවිත කරන බවටද ප්‍රකාශ විය.

කෙසේ වුවද අනතුර සිදුවී විනාඩි කිහිපයකින් එතැනට කුමරිය ලුහුබැඳ පැමිණි පැපරාසීන් ළඟා වී ඇති අතර ඔවුන් දිගට හරහට ඡායාරූප ගැනීමට පටන් ගෙන තිබේ. අනතුර සිදුවී විනාඩි දහයක් ගත වන විට සිද්ධිය වූ ස්ථානයට පොලීසිය පැමිණ තිබේ. පොලීසිය සහ සාමාන්‍ය ජනතාව එක්ව පැපරාසීන් එතනින් ඉවත් කිරීමට කටයුතු කළ අතර එක් පැපරාසියකු පහර කෑමටද ලක්ව තිබේ. ඒ වන විට මාර්ගයේ පසෙක සිටි ඩයනා කුමරිය නොනවත්වා Leave me alone ..

යනුවෙන් පවසමින් සිටි බව ඇසින් දුටු සාක්ෂිකරුවන් පවසා තිබේ. පොලීසියත් සමගම ගිලන් රථයක්ද එතනට පැමිණි නමුත් ඩයනා කුමරිය රෝහල කරා ගෙන යෑමට විනාඩි විස්සක කාලයක් ගතවී තිබේ. බොහෝ දෙනා පෙන්වා දෙන්නේ මෙය සැකයට තුඩු දෙන කරුණක් බවයි.

රෝහල් ගත කළ ඩයනා කුමරියට ප්‍රතිකර්ම කළ වෛද්‍යවරුන් ලබා දුන් සාක්ෂිවලට අනුව ඇයගේ සිරුරේ බාහිර තුවාළ කිසිවක් නොතිබූ නමුත් අභ්‍යන්තරව සිරුරට දැඩි හානි සිදුවී තිබේ. ඇයගේ හෘදය ශරීරයේ දකුණු පැත්තට විසිවී තිබූ අතර පුප්පුසීය ශිරාවට දැඩි හානි සිදුවී තිබිණි. කෙසේවුවද ඇය මියගිය බව සැප්තැම්බර් පළමු වැනිදා උදෑසන 6ට රෝහල මගින් නිල වශයෙන් දැනුම් දී තිබේ.

ලොවක් ආදරය කළ සුන්දර, අවිහිංසක කාන්තාවක්, රාජකීය කුමරියක්, සිතින් වැළපුණු බිරියක්, දයාබර මවක් එළෙස මෙලොව හැරදා ගියාය. එහෙත් ඇයගේ අනතුරට හේතුව මේ දක්වා නිශ්චිතව පැවසීමට කිසිවකුට හැකියාවක් ලැබී නැත. එම අනතුර සම්බන්ධව ප්‍රංශය සහ බ්‍රිතාන්‍යය වෙන් වෙන්ව පරීක්ෂණ දෙකක් සිදුකළ නමුදු ඒ කිසිවකින් සාධනීය ප්‍රතිඵලයක් ලැබී නැත. රියදුරුගේ බීමත්කම, රථයේ අධික වේගය, පැපරාසීන්ගේ බාධාවන්, අනතුර වූ ස්ථානයෙන් එම මොහොතේම වේගයෙන් ගමන් කළ අබිරහස් ෆියට් ඌනෝ රථයේ කිසියම් බලපෑමක් යනාදී වශයෙන් හේතු විස්සක් ඉදිරිපත් වී තිබේ. එහෙත් ඒ අතරින් එකක් හෝ තහවුරු වී නැත.

සුන්දර ඩයනා මෙලෙස ලොවක් හඬවා අවසන් ගමන් ගිය නමුදු ඇය පිළිබඳ මතකය නම් කිසිදා අවසන් ගමන් නොයන බව පසුගිය 31 වැනිදා පැරිස් නුවර ඇය සිහිපත් කිරීම වෙනුවෙන් වන නොනිල ස්මාරකය අවට ජනයා තැබූ මල් පොකුරුවලින් තහවුරු වන්නේය.

අප්‍රිකාව පෝලියෝ එළවයි

මුළු ලෝකයම මේ දිනවල පසුවන්නේ වයිරස් භීතිකාවෙනි. සතුන්ගෙන් මිනිසාට ආසාදනය වන කොරෝනා වර්ගයේ වයිරසය ලොව පුරා පැතිරෙමින් පැවතීම ඊට හේතුවයි. එමෙන්ම එම වයිරසය මර්දනය කිරීමට සමත් එන්නතක් තවමත් සොයාගෙන නොමැති වීමද තවත් ප්‍රධාන හේතුවක් වේ.

එහෙත් මේ අතර මිනිසා අතර පැතිර යමින් තිබූ තවත් වයිරසයක් සාර්ථකව මර්දනය කළ බවට වන සතුටුදායක පුවතක්ද අසන්නට ලැබී තිබේ. ඒ අනුව අප්‍රිකා මහාද්වීපයෙන් සම්පූර්ණයෙන් පෝලියෝ වයිරසය තුරන් කළ බව පසුගියදා ලෝක සෞඛ්‍ය සංවිධානය ලෝකයට දැනුම් දුන්නේය.

පෝලියෝ වයිරසය හෙවත් පෝලියෝමයිලිටිස් වයිරසය පැතිරෙන්නේ අපිරිසිදු ජලයෙනි. එමෙන්ම වඩාත් භයානක ලෙස එය මිනිසාගෙන් මිනිසාටද බෝ වීමේ හැකියාව පවතියි.

පෝලියෝ වයිරසය ආසාදනය වූ විට උණ, හිසරදය, වමනය වැනි රෝග ලක්ෂණ මතු වන අතර ප්‍රතිකාර නොලැබුණු විට එය ශරීරයේ ස්නායු පද්ධතියට ද පහර දී අකර්මන්‍ය කර දමයි. මරණය වුවද ඇති කළ හැකි තරම් දරුණු වුවද පෝලියෝ වයිරසය ලබා දෙන දරුණුම දඬුවම වන්නේ ජීවිත කාලයක් අර්ධ අකර්මන්‍ය ශරීරයක් සහිතව ජීවත් වීමය.

පෝලියෝ වයිරසය ආසාදනය වන්නේ වයස අවුරුදු පහට අඩු දරුවන්ට වීම තවත් ඛේදවාචකයකි.

පෝලියෝ වයිරසය ලොව පුරා පැතිර යෑම ඇරඹුණු 1900 යුගයේදී ශීඝ්‍රයෙන් දරුවන් එයට ගොදුරු වන විට ඒ සඳහා එන්නතක් සොයා ගැනීම ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධානතම අරමුණ විය. එය සම කළ හැකි වන්නේ මේ වන විට කොවිඩ් - 19 සඳහා එන්නතක් සොයා ගැනීමට දරන උත්සාහයටය.

එහෙත් එම උත්සාහය ඵල දරන්නේ ඉන් දශක පහක් පමණ ගත වූ පසුවය. ඒ වන විට ලොව පුරා මිලියන ගණනක් දරුවන් පෝලියෝ රෝගයේ ගොදුරු බවට පත්ව අවසන්ය. 1952 වසරේදී අමෙරිකානු ජාතික වෛද්‍ය ජොනාස් සාක් පෝලියෝ සඳහා එන්නතක් සොයා ගැනීමට සමත් වීමත් සමඟ මිනිස් වර්ගයාට තම නිරෝගී අනාගත පරපුරක් සම්බන්ධව බලාපොරොත්තු තබා ගැනීමට හැකි විය. එහෙත් එම එන්නත් වඩාත් සාර්ථක වූයේ 1961 වසරේදී ඇල්බට් සැබින් විසින් එය මුඛ මාර්ගයෙන් ලබා දෙන එන්නතක් බවට පත් කිරීමත් සමඟිනි.

එතැන් සිට මේ දක්වා ලොව පුරා දරුවන්ට එක්තරා වයස් බාණ්ඩයකදී පෝලියෝ එන්නත් ලබා දෙන අතර එමගින් මේ දක්වා ලෝකයේ බොහෝ ප්‍රදේශවලින් පෝලියෝ තුරන් කිරීමට හැකියාව ලැබී තිබේ. උතුරු අමෙරිකාව, දකුණු අමෙරිකාව, යුරෝපය වැනි ප්‍රදේශවලින් පෝලියෝ තුරන් කිරීමට හැකියාව ලැබුණද අප්‍රිකාවෙන් පෝලියෝ තුරන් කිරීම පහසු කටයුත්තක් වූයේ නැත. එසේ වීමට හේතු කිහිපයක්ම විය. ඒ අතරින් ප්‍රධාන වූයේ අප්‍රිකාවේ බොහෝ රටවල පැවති අභ්‍යන්තර ගැටුම්ය. එහෙත් මේ ගැටුම් අතරින්, අප්‍රතිහත ධෛර්යයනේ යුතුව කටයුතු කරමින් පැමිණ ගමනක සාර්ථක අවසානය පසුගියදා මෙසේ ලොවට දැනුම් දීමට ලෝක සෞඛ්‍ය සංවිධානයට හැකි විය.

වෛද්‍ය ජොනාස් සාක් පෝලියෝ එන්නත ලබා දෙමින්

අප්‍රිකාවෙන් පෝලියෝ තුරන් කිරීමට දකුණු අප්‍රිකාවේ හිටපු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා ගෙන ගිය දැවැන්ත ව්‍යාපාරයද මෙහිලා සඳහන් කළ යුතුමය. ඊට අමතරව රටින් රට දැරූ මහා වෑයම හමුවේ මේ වන විට පෝලියෝ වයිරසය අප්‍රිකා මහාද්වීපයද හැර දමා ගොස් තිබේ.

අප්‍රිකාවේ අවසන්වරට පෝලියෝ ආසාදිතයකු හමු වී ඇත්තේ නයිජීරියාවෙනි. නයිජීරියාවෙන් පෝලියෝ තුරන් කිරීමට 2000 වසරේ සිට මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර එය වඩාත් අභියෝගාත්මක උත්සාහයක් බවට පත් කරන ලද්දේ එරට තුළ ක්‍රියාත්මක වූ බොකෝ හරාම් ත්‍රස්තවාදීන් ක්‍රියාත්මකව පැවති ප්‍රදේශවල මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවසර නොලැබුණු බැවිනි. 2010ට පෙර නයිජීරියාවේ බොහෝ ප්‍රදේශවලින් පෝලියෝ ආසාදිතයන් වාර්තා වුවද අවසානයේ වයිරසය එරට බෝනෝ ප්‍රදේශයට පමණක් සීමා කිරීමට සෞඛ්‍ය සේවකයන්ට සහ ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයන්ට හැකියාව ලැබිණි.

බෝනෝ ප්‍රදේශයේ බොකෝ හරාම් ත්‍රස්තවාදීන් දැඩි ලෙස ක්‍රියාත්මක පැවති අතර දරුවන්ට එන්නත් ලබා දීමට ගිය සෞඛ්‍ය සේවිකාවන් පිරිසකට වෙඩි තබා මරා දැමීම්ද වාර්තා වී තිබිණි. බොහෝ අප්‍රිකානු රටවල පෝලියෝ එන්නතට විරුද්ධ ප්‍රසිද්ධ මතයක් විය. එනම්, මේ එන්නත මුස්ලිම් දරුවන් වඳ කිරීමේ අමෙරිකානු උප්පරවැට්ටියක් බවයි. එබැවින් මේ එන්නත් ලබා දීමට දුෂ්කර ගම්මානවලට, අන්තවාදී සටන්කාමීන් ක්‍රියාත්මක ප්‍රදේශවලට යන සෞඛ්‍ය සේවකයන්ට බොහෝ තර්ජනවලට මුහුණ දීමට සිදුවිය. පසුව එන්නත අප්‍රිකා කලාපයේ පිළිගත් විද්‍යාගාර තුළදී පර්යේෂණවලට ලක් කිරීමෙන් ඒ වෙත එල්ල වූ චෝදනා අභව්‍ය බව සහතික කිරීමට කටයුතු යෙදීමටද අප්‍රිකා කලාපීය නායකයන්ට සිදුවිය. එහෙත් ජනමතය වෙනස් කිරීමේ අභියෝගයට සෞඛ්‍ය සේවකයන්ට දිගින් දිගටම මුහුණ දීමට සිදුවිය. ඔවුන් පෝලියෝ අප්‍රිකාවෙන් තුරන් කිරීමේ අභියෝගය ජයගත්තේ මේ සියලු දුෂ්කරතා මධ්‍යයේ වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මේ අනුව ලෝකයේ අඳුරු මහාද්වීපය හෙවත් අප්‍රිකාවද පෝලියෝ සහමුලින් තුරන් කර දැමූවද ආසියාතික අපට නම් එම සැනසිල්ල හිමි නැත. විශේෂයෙන් දකුණු ආසියානු රටවලට පෝලියෝ තර්ජනය තවමත් එළෙසින්ම පවතින්නේය. එයට හේතුව තවමත් ලෝකයේ එක ලෙසට පෝලියෝ රෝගීන් වාර්තා වන රටවල් දෙක ලෙස ඇෆ්ගනිස්ථානය සහ පකිස්තානය ඉතිරිව පැවතීමය.

මෙහි ඇති භයානක කරුණ වන්නේ පෝලියෝ සම්පූර්ණයෙන් තුරන් කළ රටක් තුළ වුවද වයිරසය යළි පැතිරීමේ හැකියාව පැවතීමය. බොහෝ විට මෙය සිදුවන්නේ සංචාරකයන් මාර්ගයෙනි. ඒ අනුව වයිරසය ඉතා පහසුවෙන් රටකට ඇතුළු විය හැකි අතර රට පුරා පැතිරීමටද හැකිය. එබැවින්ම දකුණු ආසියාතික රටවල් විශේෂයෙන් පෝලියෝ එන්නත් දිගින් දිගටම පවත්වා ගනිමින් අවධානයෙන් සිටිය යුතුය. තමන් පෝලියෝ සහමුලින් තුරන් කළේ යැයි සැනසුම් සුසුම් හෙළීමට අප්‍රිකාවටද නොහැකිය. එහෙත් දුෂ්කරතා රැසක් හමුවේ අභියෝග ජයගත්විට අත්විඳිය හැකි සැනසුම් අත්විඳීමට නම් ඔවුන් සුදුසුකම් සපුරා අවසන්ය.

> 1952 වසරේදී අමෙරිකානු ජාතික වෛද්‍ය ජොනාස් සාක් පෝලියෝ සඳහා එන්නතක් සොයා ගැනීමට සමත් වීමත් සමඟ මිනිස් වර්ගයාට තම නිරෝගී අනාගත පරපුරක් සම්බන්ධව බලාපොරොත්තු තබා ගැනීමට හැකි විය. එහෙත් එම එන්නත් වඩාත් සාර්ථක වූයේ 1961 වසරේදී ඇල්බට් සැබින් විසින් එය මුඛ මාර්ගයෙන් ලබා දෙන එන්නතක් බවට පත් කිරීමත් සමඟිනි

සක්වළගල

● විරෝනි වෑවලගේ

ඉන්දියාව කොවිඩ් ලැයිස්තුවේ දෙවැනි තැනට එයිද?

පසුගිය මාර්තු මාසයේ කොවිඩ් - 19 ස්වකීය ලෝක ව්‍යප්තිය ඇරඹූ අවස්ථාවේදී අප අනුමාන කළ පරිද්දෙන්ම මේ වන විට ඉන්දියාව වසංගතයේ අති බිහිසුණු අත්දැකීම්වලට මුහුණ දෙමින් සිටින්නේ ඉතා අවාසනාවන්ත අන්දමිනි. ඉන්දියාවේ පාරිසරික සහ සමාජ තත්ත්වය අනුව වයිරසයක ව්‍යප්තිය පාලනය කිරීම ඉතා අසීරු බව මාර්තු මාසයේදීම අනාවැකි ලෙස ප්‍රකාශ කිරීම අපහසු කරුණක් නොවිය.

මාසයකට වැඩි කාලයක් පුරා රට වසා දැමීමට අගමැති මෝදි කටයුතු කළද ඉතා පහසුවෙන් ව්‍යප්ත වන කොවිඩ් වැනි වයිරසයක් පාලනය කිරීමට අධික ජනගහණයකින් යුතු, ඉතා අවිධිමත් ජන ව්‍යප්තියකින් යුතු ඉන්දියාවට අපහසු විය. මේ වන විට ඉන්දියාව ලෝකයේ වැඩිම කොවිඩ් ආසාදිතයන් සහිත රටවල් අතර තුන්වැනි තැන රැඳී සිටින්නේ මේ ලියන මොහොත වන විට ආසාදිතයන් ලක්ෂ 37කට වඩා වාර්තා කරමිනි.

එමෙන්ම මේ වන විට ලෝකයේ වැඩිම දෛනික ආසාදිතයන් සංඛ්‍යාව වාර්තා වන්නේද ඉන්දියාවෙනි. එය දිනකට 75,000කට ආසන්න සංඛ්‍යාවකි. මේ වන විට ඉන්දියාවේ කොවිඩ් හේතුවෙන් මිය ගොස් ඇති සංඛ්‍යාව 66,000 ඉක්මවා තිබේ. දෛනික ආසාදිතයන් ඉහළ යෑම යනු ඉදිරියේදී මරණ සංඛ්‍යාව ඉහළ යෑමය. එබැවින් ඉන්දියාව තවමත් ස්වකීය අභියෝගයේ මැදට හෝ පැමිණ නැති බව පැහැදිලිය.

පසුගිය සතියේ හිටපු ඉන්දීය ජනාධිපතිවරයකු වූ ප්‍රනාබ් මුඛර්ජි මියගිය අතර මිය යන විට ඔහු 83 හැවිරිදි වියේ පසුවිය. ඔහු වෙනුවෙන් ලෝක නායකයන් ශෝක පණිවිඩ එවමින් පවසා සිටියේ ඉන්දීය දේශපාලනඥයන් සතුව පැවති තියුණු අන්තර්ජාතික සබඳතා පවත්වා ගැනීමේ හැකියාව සම්බන්ධවය. බොහෝ දුර දිග දකිනා ඥානයෙන් යුක්ත පාලකයන් ඉන්දියාව සතු වුවද එරට ජන සමාජයේ ජීවන රටාව වෙනස් කිරීම මේ බොහෝ නායකයන්ට අත තැබීමට හෝ නොහැකි වූ ක්ෂේත්‍රයක් විය. පෞද්ගලික පිරිසිදුකම පිළිබඳ ගැඹුරෙන් සිතීමට ජනයා පෙලඹීමට මහත්මා ගාන්ධිතුමාට මහත් වෙහෙසක් දැරීමට සිදුවීම මේ සඳහා හොඳම උදාහරණයකි.

කෙසේවුවද වසංගතයේ උච්චතම අවස්ථාවේ වුවද සාමාන්‍ය ජනජීවිතය හැකිතාක් දුරට පවත්වා ගනිමින්, ආර්ථිකය බිඳ වට්ටා නොගනිමින් ඉන්දියාව මේ මොහොතේ යන ගමන අගය කළ යුතුය.

මේ අතර ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන්නේ වයිරසයේ ව්‍යප්තියේ කිසිඳු අඩුවක් දක්නට නොමැති නමුත් වාර්තා වන මරණ සංඛ්‍යාව අඩුවෙමින් පවතින බවයි. තවමත් ඇමරිකාව ලෝකයේ වැඩිම කොවිඩ් ආසාදිතයන් වාර්තා කරමින් සිටින අතර එය මේ වන විට ලක්ෂ 62 ඉක්මවා තිබේ. බ්‍රසීලය දෙවැනි ස්ථානයේ පසුවුවද ඉක්මනින්ම ඉන්දියාවට එම ස්ථානය ලබා දීමට සිදුවනු ඇති බවට ලකුණු දක්නට ලැබෙමින් තිබේ.

ඕස්ට්‍රේලියානු රජය ෆේස්බුක් ගූගල් සමඟ ගැටෙයි

ඕස්ට්‍රේලියානු රජය විසින් පනවා ඇති නව නීතියකට විරෝධය දක්වමින් ඉදිරියේදී එරට කිසිදු ප්‍රවෘත්තියක් තම සමාජ ජාලයේ පළවීමට ඉඩ නොදෙන බව ෆේස්බුක් ජාලය පවසා තිබේ. ඕස්ට්‍රේලියා රජය පැනවීමට නියමිතව ඇති නව නීතියට අනුව එරට දේශීය මාධ්‍යවලින් උපුටා ගනිමින් තම වෙබ් අඩවිවල සහ සමාජ ජාලවල පළ කරන ප්‍රවෘත්ති සඳහා එම ආයතන වසින් නිශ්චිත මුදලක් එම ප්‍රවෘත්තියේ මුල් අයිතිය සහිත දේශීය මාධ්‍ය ආයතන වෙත ලබා දිය යුතුය. මේ නීතිය මූලිකව පැනවීමට නියමිතව ඇත්තේ ෆේස්බුක් සහ ගූගල් ආයතන සම්බන්ධයෙනි.

මේ නීතිය සම්බන්ධව තම මතය දක්වමින් ෆේස්බුක් සමාජ ජාලය පවසා ඇත්තේ තම සමාජ ජාලයේ පළ කරන ප්‍රවෘත්තිවලට මුදල් ගෙවීමට තමන්ට නියම කරන්නේ නම් තමන් කිසිදු ඕස්ට්‍රේලියානු ප්‍රවෘත්තියක් තම සමාජ ජාලයේ පළ කිරීමට ඉඩ නොදෙන බවයි.

මේ සම්බන්ධව ආයතනයේ මතය මාධ්‍ය වෙත ගෙන එමින් ෆේස්බුක් සමාගමේ ඕස්ට්‍රේලියා සහ නවසීලන්ත දෙරටේ කළමනාකාර අධ්‍යක්ෂක විල් ඊස්ටන් පවසා ඇත්තේ තම සමාගම දේශීය මාධ්‍යවල පළවන ප්‍රවෘත්ති උපුටා නොදක්වන බවත් බොහෝවිට සිදුවන්නේ එම මාධ්‍ය ආයතන තම සමාජ ජාලයේ තමන්ගේ ප්‍රවෘත්ති පළ කරමින් ඒවා ජනප්‍රිය කර ගැනීමට උත්සාහ දරන බවත්ය. ඒ අනුව රජය විසින් පැනවීමට නියමිත මේ නව නීතිය තනිකරම අනවබෝධය මත පදනම් වූ එකක් බවද ඔහු පවසා තිබේ.

ප්‍රවෘත්ති පළ කරනවා නම් සල්ලි ගෙවන්න - රජය කියයි

අපි කරන්නේ නොමිලේ සේවයක් - ෆේස්බුක් කියයි

අන්තර්ජාලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව ඕස්ට්‍රේලියානු රජයට නිශ්චිත දැනුමක් නොමැති බවත්, මේ නීතිය පනවන්නේ නම් තම සමාජ ජාලයේ මින් ඉදිරියට කිසිදු ඕස්ට්‍රේලියානු ප්‍රවෘත්තියක් පළ නොකරන බවත්, ඒවා උපුටා දැක්වීමට හෝ කිසිවකුට අවකාශ ලබා නොදෙන බවත් විල් ඊස්ටන් පවසා ඇත. ඒ අනුව මේ නීතියෙන් වැඩි හානිය තමන්ට නොව ඕස්ට්‍රේලියානු මාධ්‍ය ආයතනවලටම බවද ඔහු පෙන්වා දී තිබේ.

විල් ඊස්ටන් තවදුරටත් පෙන්වා දී ඇත්තේ ඕස්ට්‍රේලියානු නීති සම්පාදනයේදී සහය දක්වන ඕස්ට්‍රේලියානු තරගකාරී සහ පාරිභෝගික කොමිසම මේ සම්බන්ධව නිසි අධ්‍යයනයක් කර නොමැති බවයි. එමෙන්ම ඔවුන් ඉතා වැදගත් කරුණු නොසලකා හැර ඇති බවයි. ඔහු මේ සඳහා උදාහරණ ලෙස මේ වසරේ ගත වූ මාස පහක කාලය ඇතුළත ඕස්ට්‍රේලියානු පුවත් වෙබ් අඩවිවලට ෆේස් බුක් ඔස්සේ ලැබී තිබුණු ප්‍රවිෂ්ටයන් සංඛ්‍යාව පෙන්වා දේ. ගත වූ මාස පහක කාලය තුළ එම ප්‍රවිෂ්ටයන් සංඛ්‍යාව බිලියන 2.3කි. ඒ අනුව ෆේස් බුක් හි ප්‍රවෘත්ති පළ කිරීම සැබවින්ම වාසිදායක වන්නේ කාටද යන්න අමුතුවෙන් පැවසිය යුතු නොවන බව ඔහුගේ අදහසයි.

මේ සම්බන්ධයෙන් ගූගල් සමාගමද පවසා ඇත්තේ 'ඕස්ට්‍රේලියානුවන්ගේ ගූගල් භාවිතය අනතුරේ' බවයි.



ලක්දිව පුරාණ කෘෂිකාර්මික සමාජය

● රුක්ෂිලා වෙත්තමුණි

මිනිසා ශිෂ්ටාචාරවත් ජීවිතයකට යොමු කරවීමට හේතුවූයේ කෘෂිකර්මය සොයා ගැනීම බව යැයි අද ලොව පිළිගත් සම්මත අදහසක් බවට පත්ව ඇත. සතුන් හා ශාක හීලෑ කිරීමෙන් අනතුරුව වනගත ජීවිතයෙන් මිදී ග්‍රාමීය සංස්කෘතියකට අවතීර්ණ වී කෘෂිකාර්මික දිවියකට මිනිසා පෙලඹීම ලොවම වෙනස් කළ හේතු කාරණාවක් විය.

ආචාර්ය ශිරාන් දැරණියගලයන්ගේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණවලින් දක්වන පරිදි අදින් වසර 125, 000 පමණ පෙර සිටම ලංකාව මිනිස් වාසභූමියකි. වසර 13, 000 ක් ඉක්මවන මූලික කෘෂිකර්මාන්තය බටහිර ආසියාවේ බොහෝ පෙදෙස්හි ආරම්භව ලොව පුරා ව්‍යාප්ත වූ බව විද්වතුන්ගේ මතයයි. සිරියාව, ජෝර්දානය, ඉරාකය, තුර්කිය, පලස්තීනය හා ලෙබනනය ආදි පෙදෙස්හි පෞරාණිකත්වය ඉස්මතු වීමට ඉවහල් වූයේ එම රටවල් හිමිකර ගෙන තිබූ කෘෂිකාර්මික දියුණුවයි. ලොව සිදු වූ අති විශාල විප්ලවයක් ලෙස කෘෂිකර්මය සොයා ගැනීම පිළිබඳව විවිධ සාධක මගින් සනාථ වී ඇත. නව ශිලා යුගයේ විප්ලවය ලෙස එය හඳුන්වනු ලබයි.

බටහිර ආසියාවට පමණක් සීමා නොවුණු මෙම නව ශිලා යුගයේ විපල්වීය අදහස නැගෙනහිර ආසියාවේ චීනය, අග්නිදිග ආසියාවේ ඉන්දුනීසියාව, තායිලන්තය හා පැපුවානිව්ගිනියාව ආදි ප්‍රදේශ වලටද ව්‍යාප්ත විය. චීනයේ යැංසි ගංගා ද්‍රෝණියෙහි අදින් වසර 14, 000 කට පෙර වී වගාව ඉතා දියුණු තත්ත්වකය තිබී ඇති බව පර්යේෂණවලින් සොයාගෙන ඇති අතර එය ලොව දැනට පවතින පැරණිතම කෘෂිකාර්මික සාක්ෂියයි. එමෙන්ම පුරාවිද්‍යාත්මක සාධක අනුව දකුණු ආසියාවේ කෘෂිකාර්මික ජනාවාස අදින් වසර 10, 000 ඉක්මවයි.

බාර්ලි, තිරිඟු වගාව මෙන්ම හීලෑ කරන ලද එළුවා, බැටළුවා සහ ගවයා යනාදිය දකුණු ආසියානු කලාපයේ මූලික කෘෂිකර්මය සඳහා උපයෝගි කරගත් සාධකයන්ය. පරාග විශ්ලේෂණය නම් වූ ක්‍රමවේදය ඔස්සේ මෙවැනි වටිනා තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි වී ඇත. අදින් වසර 13, 000 කට පෙර ධාන්‍ය වගාව ආරම්භ කර දඩයම මූලික වූ වනචාරී ජීවිතයෙන් ක්‍රමයෙන් ඇත්ව යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ගංගා ද්‍රෝණි ආශ්‍රිතව ශිෂ්ටාචාරයක් ලෙස ගොඩ නැගුණු මෙසපොතේමියානුවේ ජීවත් වූ මිනිසා හඳුන්වා දිය හැකිය. කෘෂිකර්මයේ ආරම්භය ලෙස ලොව මහා හිම අවධිය (ප්ලයිස්ටෝසීනය) පිළිබඳව සාධක සොයාගෙන ඇති අතර වසර 15, 000- 10, 000 අතර කාලවකවානුවේ දී ලොව පුරා විවිධ ස්ථානවල ඇතිවුණු පරිසර වෙනස්වීම් තත්ත්වය හා දේශගුණ විපර්යාසය එසේ කෘෂිකර්මයේ ආරම්භයට හේතුවිය. නවීන පර්යේෂණ වාර්තා අනුව බටහිර ආසියාතික, දකුණු ආසියාතික හා නැගෙනහිර ආසියාතික පෙදෙස්වල සතුන් හීලෑ කිරීම හරහා කෘෂිකාර්මික ජීවන රටාවක් ආරම්භ කොට එය වර්ධනය වූ බව පෙන්වා දෙයි.

ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක හා සෙනෙවි එපිටවත්ත විසින් රචිත පරාග විද්‍යාව (හෝර්ටන් තැන්න හා දකුණු ආසියාවේ අති පුරාණ කෘෂිකාර්මික පරිසරය) නම් ග්‍රන්ථයේ ශ්‍රී ලංකාවේ පුරාණ කෘෂිකර්මය පිළිබඳ නව අදහසක් ඉදිරිපත් කොට ඇත. එනම් පුරාණ ලංකාවේ ජීවත් වූ මිනිසා අදින් වසර 17, 500 කට පමණ පෙර ප්‍රාග් මූලික කෘෂිකර්මය ආරම්භ කර ඇති බව පරාග විද්‍යා පර්යේෂණ තොරතුරු මගින් තහවුරු කර ඇත.

වනාන්තර ගිනි දමා පුලුස්සා හේන් සකස් කිරීමේ මූලික සංස්කෘතියකට (පැරණිතම හේන් වගාව) මෙරට අතීත මිනිසා අයත්ය. හෝර්ටන් තැන්නේ සිදු කළ පර්යේෂණ අනුව ඒ බව සනාථ වේ. ලංකාවේ අඩි 7000 ට වඩා ඉහළ පිහිටි භූමි ප්‍රදේශවල මීට වසර 13, 000 කට පෙර මූලික කෘෂිබිම් ව්‍යාප්තව තිබුණු බව සඳහන්ය. ඒ බැව් පොසිල පරාග විශ්ලේෂණයෙන් තහවුරු විය

යව හා බාර්ලි (ධාන්‍ය) වගාව ලංකාවේ මූලික කෘෂිකර්මයේ ප්‍රධානතම බෝග වර්ග දෙක බව ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක හෝර්ටන් තැන්නේ මීටර් 6 ක් පමණ ගැඹුරින් ලබාගත් පීට් නිධි අතරින් හමු වූ පොසිල වාර්තා අනුව ප්‍රකාශ කරයි. මේ අනුව ලංකාවේ කෘෂිසංස්කෘතික සභ්‍යත්වයේ මූලාරම්භය අනුරාධපුර යුගයටත් වඩා බොහෝ ඈතට දිව යව බව ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලකයන්ගේ අදහසයි. මෙම මූලික බෝග වර්ග දෙක වසර 13, 000 කට පෙර මෙරට ඉහළ කඳුකර බිම් ප්‍රදේශවල වගාකරමින් යම් ආකාරයක ප්‍රාදේශීය ධාන්‍ය සභ්‍යත්වයක් ගොඩ නැංවීමට එකළ ලාංකික ජනයා යෙදූ උත්සාහය සුළුපටු නොවන බව ඔහුගේ මතයයි.

ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක සඳහන් කරන්නේ දැනට සිදුකොට ඇති පර්යේෂණවලට අනුව කෘෂිකර්මයේ ආරම්භය (නවශිලා යුගයේ විප්ලවය) හා සම්බන්ධ තොරතුරු ලංකාවේ මෙතෙක් හමු වී ඇත්තේ ඉතා අඩු ප්‍රමාණයක් බවය. ඒ අනුව බොහෝ දෙනා විශ්වාස කළේ මෙරට ජීවත් වූ අතීත මිනිසා මධ්‍යශිලා යුගයේ (ගල් යුගයේ) සිට එක්වරම යකඩ භාවිත වූ කාල වකවානුවට අවතීර්ණ වූ බවය.

මානව වංශ උද්භිද විද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයේ සිදුවන පරාග විශ්ලේෂණ කටයුතුවලට මෙන් ම පෞරාණික ජීව විද්‍යා පර්යේෂණ කටයුතු හා පුරාවිද්‍යා පර්යේෂණවලට ද නවීන පර්යේෂණ අතර ප්‍රමුඛත්වයක් හිමිව තිබේ. ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලයේ චාතුර්රථක භූ ගර්භ විද්‍යා පර්යේෂණ ආයතනය, ස්වභාවික විද්‍යා කෞතුකාගාරය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඒකාබද්ධව වසර 15 ක් වැනි කාලයක් තිස්සේ හෝර්ටන්තැන්න සහ ඒ තදාසන්නයේ සිදු කරනු ලැබූ පර්යේෂණවලින් නවතම තොරතුරු අනාවරණය කර ගැනීමට හැකිවී ඇත. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ ඉන්දියානු සාගර කලාපයේ පහළ ප්‍රදේශවල සිට හමා එන මෝසම් සුළංවල ඇති වීම, ඒවායේ වර්ධනය, ඒවා මගින් මිනිසා සහ පරිසරය මත ඇති කරන බලපෑම් කොපමණ දැයි පරීක්ෂා කිරීම බව ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලකගේ අදහසයි.

පාරිසරික භූ චුම්බක වාර්තා මගින් පෙන්වා දෙන මානව භූ බාදන ක්‍රියාකාරිත්වයන් ද ලංකාවේ උස්බිම් කලාපයට අයත් මහඵළිය ප්‍රදේශයේ දී මානව ක්‍රියාකාරකම් සිදු වූ බව පෙන්වා දෙන තවත් සාක්ෂියකි. අදින් වසර 17, 500කට පමණ පෙර තණබිම් හා ලඳු කැලෑ ගිනි දමා පුළුස්සා විනාශ කිරීමේ ලක්ෂණ විශාල ප්‍රමාණයක් ක්ෂුද්‍ර අඟුරු විශ්ලේෂණය, පරාග වාර්තා, ෆයිටොලිත වාර්තා හා පොළොව අභ්‍යන්තරයේ භූ චුම්භණ ගතිගුණ විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදය හරහා අනාවරණය විය. මිනිස් ක්‍රියාකාරකම් නිසා හෝර්ටන් තැන්නේ බොහෝ බෑවුම් බාදනයට ලක් වී ඇති අයුරු තේරුම් ගැනීම සඳහා ද මේ වාර්තා තවදුරටත් වැදගත් වනු ඇත.

හෝර්ටන් තැන්න භූ ගර්භයෙන් ලබා ගත් පස්, අවසාදිත වර්ග හා පීට් නියැදිවල තිබූ පොසිල වාර්තා සහ පුරාණ පරිසර තත්ත්ව වාර්තා මගින් වසර දහස් ගණනකට පෙර පැවැති මෝසම් රටාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හා ලංකාවේ පැවැති පැරණි ධාන්‍ය සභ්‍යත්වය සම්බන්ධව කරුණු අනාවරණය කර ගැනීමට පර්යේෂකයන්ට හැකිවිය.

මානවවිද්‍යාඥ ආචාර්ය පී.ඊ.පී. දැරණියගල විසින් මෙරට සංස්කෘතික ඉතිහාසයට අයත් සුවිශේෂී අවදියක් පවතින බව උඩුපියන්ගල්ගේ නමින් හැඳින් වූ බලංගොඩ කල්තොට ප්‍රදේශයේ දියවින්න විහාර පරිශ්‍රයේ පිහිටි ස්වභාවික ගල්ගුහාවක සිදු කළ කැණීම අනුසාරයෙන් ප්‍රකාශ කරන ලදී. මෙම කැණීමේ දී ගල්මෙවලම්, පුරාතන වළං සහ සෝගම් ධාන්‍ය ඇට සොයා ගනු ලැබීය. 1936 දී ආචාර්ය පී.ඊ.පී. දැරණියගල විසින් මෙම ගුහාව ආශ්‍රිතව සොයා ගත් ධාන්‍ය ඇට හා 2016 දි සිදුකළ කැණීමේ දී මතුකර ගත් ස්වල්ප ලෙස පිළිස්සුණු ධාන්‍ය ඇට මගින් තහවුරු වනුයේ රට අභ්‍යන්තරයේ කඳුකර පළාත්වල ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන් මීට වසර 9000 කට පෙර සිටම දඩයක්කාර ජීවන රටාවකට සමාන්තරව ශාක ආහාර කෙරෙහි නැඹුරුවක් පැවැති බවය.

1991 ආචාර්ය ඩබ්ලියු.එච්. විජයපාලගේ මැදිහත් වීමෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ආසන්නයේ එබිඳිගල ග්‍රාමයේ පිහිටි දොරවක කන්ද ලෙනෙහි සිදුකළ කැණීමේ දී ශිලා මෙවලම්, අතින් හා සකපුවරුවේ නිපද වූ මැටි බඳුන්, එක් යකඩ උපකරණයක් හා ධාන්‍ය හමු විය. පාංශු ස්ථර 9 ක් යටතේ කැණීමට ලක් වූ දොරවක ලෙනෙහි පස් තට්ටු සම්බන්ධව අනාවරණය වී ඇති සංස්කෘතික නිදර්ශක ලෙස පළමු ස්ථරයෙන් පාෂාණත්, දෙවන ස්ථරය ලෙස ඉතා කුඩා අඟුරු කොටස්, කැකුණ ඇට, මැටි බඳුන් කොටස්, ගල් මෙවලම් අඟුරු හා ධාන්‍යත්, තෙවන ස්ථරය ලෙස ශිලා මෙවලම්, ධාන්‍ය, මැටි බඳුන්, අඟුරු හා කැකුණ ඇටත්, සිව්වන ස්ථරය ලෙස මැටි බඳුන්, ශිලා උපකරණ, ධාන්‍ය, අඟුරු හා කැකුණ ඇටත්, පස්වන ස්ථරය ලෙස අඟුරු, ශිලා මෙවලම්, තිරුවාණා, හෙමටයිටුත්, හයවන ස්ථරය ලෙස ශිලා මෙවලම්, මැටි බඳුන් අළු හා අඟුරුත්, හත්වන ස්ථරය ලෙස තිරුවාණා පතුරු, ශිලා මෙවලම්, මැටි බඳුන් හා අඟුරුත්, අටවන ස්ථරය ලෙස ශිලා මෙවලම්, මැටි බඳුන්, ග්‍රැනයිට් හා අඟුරුත් හා නවවන ස්ථරය ලෙස ශිලා මෙවලම්, මැටි බඳුන්, ග්‍රැනයිට් හා අඟුරුත් දැක්විය හැකිය.

නවශිලා යුගයේ ඇඹරුම් ගලක්

1936 දී ආචාර්ය පී.ඊ.පී. දැරණියගල විසින් මෙම ගුහාව ආශ්‍රිතව සොයා ගත් ධාන්‍ය ඇට හා 2016 දි සිදුකළ කැණීමේ දී මතුකර ගත් ස්වල්ප ලෙස පිළිස්සුණු ධාන්‍ය ඇට මගින් තහවුරු වනුයේ රට අභ්‍යන්තරයේ කඳුකර පළාත්වල ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන් මීට වසර 9000 කට පෙර සිටම දඩයක්කාර ජීවන රටාවකට සමාන්තරව ශාක ආහාර කෙරෙහි නැඹුරුවක් පැවැති බවයි

එකළ ගොවීන් වසරකට කන්න දෙකක් හෝ තුනක් වී වගා කර ඇත. වසරකට කන්න දෙකක් වී වගා කිරීම සාමාන්‍ය සිරිත වුව ද ඇතැම් කාලවල දී කන්න තුනම වී වගා කළ බවට සාධක හමුවේ. තෝනිගල පර්වත ලිපියෙහි වී වගා කළ කන්න පිළිබඳව දක්වා තිබේ. මෙම සෙල්ලිපිය සිරි මේඝවර්ණ රාජ්‍ය කාලයට (ක්‍රි.ව. 301-328) අයත් වන අතර සෙනරත් පරණවිතානයන් එහි ''පිට දඩ හස''(මහ කන්නය) ''මදෙ හස''(මැද කන්නය) ''අකළ හස'' (යල කන්නය) නම් වූ ශෂ්‍ය (සංස්කෘත) වාර තුනක් පිළිබඳව සඳහන් කර ඇත. දැනට මහ කන්නය හා යල කන්නය නමින් හඳුන්වන ප්‍රධාන කන්න දෙක පිළිවෙළින් ''පිට දඩ හස'' ''අකළ හස'' නමිනුත් එම කන්න දෙක අතරතුර වපුරන ලද තෙවැනි කන්නය ''මදෙ හස'' හෙවත් මැද හස යනුවෙන් දක්වා තිබේ. සෙල්ලිපිය අනුව රජරට කලාපයේ වැව් ජලය උපයෝගී කොට ගෙන කන්න තුනක් වගා කළ බව පැහැදිලිය. මේ අනුව වැව් ජලයෙන් වසරකට කුඹුරු අස්වැන්න තුන්වරක් ගත් බව සනාථ වේ. මෙම සෙල්ලිපිය පිහිටුවන කාල වකවානුව වන විට උතුරු නැගෙනහිර පළාත්වල ක්‍රමවත් වැව් පද්ධතියක් පවතින්නට ඇතැයි යන්න අවබෝධ වේ. තෝනිගල ලිපියෙහි සඳහන් උඳු, මුං වැනි හේන්වල වගා කරන ධාන්‍ය ගැන සඳහන් ව තිබීම හේතුවෙන් ඇතැම් විට අතර මැද කන්නයේ මෙකී ධාන්‍ය වර්ගයන් වගා කරන්නට ඇත. මෙම ලිපියෙහි දී කිරි සහ බුන තෙල් හෙවත් දුන් තෙල් සම්බන්ධව සඳහන්ව තිබීමෙන් අවබෝධ වන්නේ මී ගව සම්පත තත්කාලීන සමාජයේ පවතින්නට ඇති බවය.

මේ අනුව තෝනිගල සෙල්ලිපියෙහි අන්තර්ගත කෘෂි ආර්ථිකය හා සම්බන්ධ තොරතුරුවලට අනුව එකළ ලක්දිව හතරවන සියවසේ රජරට පසෙහි සාරවත් බව, වර්ෂාපතනය, ජල සම්පාදන ක්‍රම සහ පැරණි සිංහල ගොවීන්ගේ ක්‍රියා කලාපය යනාදිය ඇතුළත් වැදගත් වාර්තාවක් ලෙස දැක්විය හැකිය.

සුමංගල විලාසනියෙහි එකළ වගා කෙරුණු මඩ වී හා හැල් වීවලට අමතරව තවත් ධාන්‍ය වර්ග පහක් පිළිබඳව දක්වා ඇත. එනම් ගොධුම, යව, කංගු, වරක හා කුදුරුසක ලෙසය. එම ධාන්‍ය සිබවළඳ විනිසෙහි දක්වන්නේ ගොධුම (තිරිඟු), යව (බාර්ලි), හමු, තණහාල් හා වරා ලෙසය.

1969 දි අනුරාධපුර ඇතුළු නගරයේ පිහිටි ගෙඩිගේ කළ කැණීමේ දී තහවුරු වූයේ ප්‍රාග් ඓතිහාසික ගල්යුගය, ලෝහ තාක්ෂණය හඳුනා ගත් කෘෂිකාර්මික ජීවන රටාවකට අයත් සංස්කෘතියකට පරිවර්තනය වූ බවය.

හෝර්ටන් තැනිතලාව

2020ක් වූ සැප්තැම්බර් 06 සිට 12 දක්වා

මේෂ - යහපත් මානසික සුවය

මේෂ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 01 - 02 - 03 යන ස්ථානවල ගමන් කරමින් ඔබගේ යහපත් මානසිකත්වය සතිය ආරම්භයේ පටන්ම ඔබට ලබාදෙන අතර සතිය මැද භාගයේ සුවිශේෂි මුදල් ලාභයක් සමඟ කිසියම් උරුමයක පෙර ලකුණු මතු කරයි. විශේෂයෙන් නීතියෙන් පැවත තිබූ අවහිරතාවක් ලිහිල් වන ලකුණු පෙනේ. තම සොහොයුරකු වෙතින් ආර්ථික ලාභයක් හිමි වන ලකුණු පෙනේ. තම අභිවෘද්ධියට විවිධ ඇප උපකාර ලැබෙනු ඇත.

වෘෂභ - ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මකයි

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 12 - 01 - 02 යන ස්ථානවල ගමන් කරමින් පිටරට සම්බන්ධ කටයුත්තකදි යහපත්කම් මතු කෙරේ. යම් හෙයකින් ව්‍යාපාරයක සැලසුම් සකස් කරමින් සිටින ඔබට ඒවා ක්‍රියාවට නැංවීමට අවස්ථාව උදාවේ. ධනය පිළිබඳ සතුටු විය හැකි සතියකි. ආදරය, ආලය පිළිබඳ කරුණුවලදී බාධා අවහිරතා ඉවත් වේ.

මිථුන - ආර්ථික ලාභයක්

මිථුන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 11 - 12 - 01 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආරම්භයේදීම හදිසි ආදායම් මාර්ගයකට ඉඩ සැලසේ. විශේෂයෙන් කලක් අතහැර දමා තිබූ ව්‍යාපාරික ස්ථානයක් යළි ආරම්භ කිරීමට ඔබට අවස්ථාව උදාවෙන අතර කිසියම් ආහාරයක සතුරු කරදර කීපයක් නිසා ඔබට ඔබගේ කටයුතු කෙරේ. බාධක එල්ලවේ. අධිෂ්ඨානය ඇතොත් එළැඹෙන බාධක ලිහිල් වනු ඇත.

කටක - රැකියා උසස් වීමක්

කටක ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව ව්‍යාපාරික රැකියාමය ප්‍රතිලාභයක් පෙනෙන්නට තිබේ. දණහිසට අගුණ වුවද ප්‍රවේශම් වුවහොත් එම උවදුරුද අවමකර ගත හැකිය. මෙම සතියේ චන්ද්‍රයා ඔබගේ කේන්ද්‍රයට අනුව 10, 11, 12 යන ස්ථානවල ගමන් කිරීම නිසා මෙසේ වාසි සහගත වන අතර වාහන ලාභ, ඉඩම් හා නිවාස ලාභ ගෙන එන සතියකි. තමා කලක් බලාපොරොත්තුව සිටි රැකියාවක් තමාට හිමි වන ලකුණු පෙනේ.

සිංහ - උෂ්ණාධික රෝග

සිංහ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 09 - 10 - 11 යන ස්ථානවල ගමන් කරමින් ඔබට යටපත්වූ උරුමයක හිමිකම ආර්ථික ප්‍රතිලාභ හිමිකම යන කරුණු තුළින් ඔබට යහපත උදාවේ. කෙසේ හෝ උෂ්ණාධික බව නිසා හටගන්නා රෝග පිළිබඳව අනතුරු හැඟවේ. භාෂා ඥානය කලා කුසලතා මෙන්ම ජන්මයෙන් උරුමවූ කිසියම් නිපුණතාවක් නිසා සමාජයේ කැපී පෙනෙන ආකාරයක් දක්නට ලැබේ.

කන්‍යා - අධික වෙහෙසකාරි බවක්

කන්‍යා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 08 - 09 - 10 යන ස්ථානවල ගමන් කරන අතර හදිසි අනතුරු ආපදා තුනටිය ආශ්‍රිත උවදුරු පෙනෙන්නට තිබේ. කළබල නොවීම තුළින් ඒ සඳහා සහනය උදාකරගත හැකිය. ශරීරය වෙහෙසකාරි වන සතියකි. කිසියම් ආර්ථික පාඩුවකට හේතු වනු ඇත. ගනුදෙනු කිරීමකදි ලියවිල්ලකට අත්සන් කිරීමකදි කල්පනාකාරි වන්න. ඇස් රෝග - සෙම් රෝග පළවන සතියකි.

තුලා - සතුට සැනසුම උතුරා යයි

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 07 - 08 - 09 යන ස්ථානවල ගමන් කිරීම නිසා සතිය ආරම්භයේදි කිසියම් මංගල කරුණකට හේතු මතු කෙරේ. ආදරය, ආලය පිළිබඳ කටයුත්තකදි සවිමත් සහ සම්බන්ධතාද අවිවාහක අයට විවාහ යෝජනා සම්මත වීමද සිදුවනු ඇත. කොටින්ම කියනවා නම් සිතේ සතුට සැනසුම උතුරා යන සතියකි.

වෘශ්චික - ආසාදිත තත්ත්වයක්

වෘශ්චික ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 06 - 07 - 08 යන ස්ථානවල ගමන් කිරීම නිසා සතිය ආරම්භයේ යටි බඩ ආශ්‍රිත කිසියම් ආසාදිත තත්ත්වයක් හේතු කොටගෙන පරීක්ෂණ වලට භාජනය වීමට ඔබට සිදු වේ. වතුර හීනතාව නිසා මුත්‍ර පිටවීම අවම කෙරේ. ඒ නිසා යටි බඩේ කොරවීම් ස්වභාවයක් මතු කිරීමට පුළුවන.

ධනු - නව නිවසක පදිංචිය

ධනු ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 05 - 06 - 07 යන ස්ථානවල ගමන් කිරීම යහපත් වෙයි. විශේෂයෙන් දරු සම්පත් අපේක්ෂා කරන අයට දරු සම්පත්ද ආර්ථික ප්‍රතිලාභද මතු කෙරෙනු ඇත. දුරබැහැර සිටින මිතුරකුගේ පැමිණීම නිසා ඔබට ආර්ථික වාසි රැසක් උදාකර ගැනීමට හේතු වේ. පෙර දිනක ඔබ ඔබේ මිතුරකු වෙනුවෙන් කළ උපකාරයකට ප්‍රතිඋපකාර උදාවීමෙන් වාසි සහගත යමක් ඔබට ලැබෙනු ඇත. වාහන ලාභයකට අලුත් නිවසක පදිංචියට යෑමට ඔබට හැකි වේ.

මකර - පපුවේ අධික සෙම ගතිය

මකර ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මේ සතියේ චන්ද්‍රයා 04 - 05 - 06 යන ස්ථානවල ගමන් කිරීම නිසා ආර්ථික වාසි දේපළ ඉඩකඩම් හිමි වන සතියක් වන අතර රැකියා ප්‍රතිලාභ ඇති වීමටද හේතු වෙයි. පපුවේ අධික සෙම ගතිය ඇතිවන සතියකි. පිටස්තර ස්ථානවලදි නුහුරු නුපුරුදු ස්ථානවල ජලාශ, වැව්, අමුණ ඇළ දොළ ගංගාවල බැස ස්නානය කිරීම බොහෝ අනතුරු සහගත වෙයි. කල්පනාකාරි වන්න.

කුම්භ - භෞතික සම්පත් උරුමයක්

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 03 - 04 - 05 යන ස්ථානවල ගමන් කිරීම නිසා සතිය ආරම්භයේදීම කිසියම් භෞතික සම්පතක උරුමය ඔබට හිමිවේ. ඉඩමක්, නිවසක් හෝ වෙනත් උරුමයක් උදාකර දේ. නමුත් කලක් පැවතුණු නීති ගැටලුවකින් මිදුණ ද යළි එබඳු උවදුරකට බොහෝවිට ඉඩ ඇති නිසා කල්පනාකාරි වන්න. මිත්‍ර සංගම් තුළින් උවදුරු එළඹෙන නිසා ඒ අය ඇසුරු කිරීමේදි කල්පනාකාරි වන්න. උඩ නැගීම් වාහන වලින් අධික වේගයෙන් ගමන් කිරීමෙන් වැළකී සිටින්න.

මීන - චෝදනා එල්ලවේ

මීන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 02 - 03 - 04 යන ස්ථානවල ගමන් කරන නිසා සතිය ආරම්භයේදීම මුදල් නාස්තියක් ඇතිවීමට බොහෝ දුරට ඉඩ ඇති නිසා කල්පනාකාරි වන්න. මිත්‍ර වේශයෙන් ඔබකරා එන සතුරන් තුළින් පාඩු සිදුවන කරුණු කාරණා යෙදේ. නමුත් සතිය මැද සතිය අවසානය ඔබට අභිවෘද්ධියට කරුණු යෙදේ. වැඩිහිටි පාර්ශ්ව තුළින් ඔබට චෝදනා ගර්ජනා එල්ලවීමට බොහෝ දුරට ඉඩ ඇති නිසා කල්පනාකාරි වන්න. ඇල්වතුර පානය, අධික සීතල වතුර ස්නානය අවම කරන්න.

පළාත් සභා ගැන අධ්‍යයනයක් සිදු කරනවා

පළාත් සභා, පළාත් පාලන කටයුතු රාජ්‍ය ඇමැති විශ්‍රාමික රියර් අද්මිරාල් **සරත් වීරසේකර**

පසුගිය රජය කාලයේ පළාත් සභා මැතිරණය පැවැත්වූයේ නැහැ. පරණ ක්‍රමයට ඡන්දය පැවැත්වීමට නම් දැනට පවතින පනත සංශෝධනය කරන්නට සිදුවෙනවා . එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර වෙනස් කළ යුතුයි.

වර්තමාන පනතට අනුව නම් මිශ්‍ර ක්‍රමය යටතේ දැනට මැතිවරණය පැවැත්විය යුතුයි. එහෙත් එම ක්‍රමවේදය වෙනස් කිරීමට මේ වනවිට කටයුතු සිදු කරමින් පවතිනවා. මිශ්‍ර ක්‍රමයට ඡන්දය පවත්වන්නේ නම් නැවත සීමා නිර්ණය පාර්ලිමේන්තුවේ සම්මත කරගත යුතුයි.

පසුගිය රජය කාලයේ සීමා නිර්ණය සම්බන්ධයෙන් කළ වාර්තාව පාර්ලිමේන්තුවේ අනුමත වූයේ නැහැ.

කෙසේ වුවත් පළාත්සභාවලින් වන සේවාව සම්බන්ධව මේ වන විට අධ්‍යයනය කරමින් සිටින්නේ. මේ මැතිවරණයට අතිවිශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළ යුතු වෙනවා.

මේ පළාත් සභාවල කාර්යය භාරය කුමක්ද? කාර්යක්ෂමතාවය කුමක් ද? යන කරුණ සම්බන්ධයෙන් අපි සැලකිලිමත් විය යුතුයි. ඇත්තෙන්ම පළාත් සභාවෙන් ජනතාවට සේවාවක් වෙනවා ද කියන කාරණාව මේ වන විට අධ්‍යයනය කරනවා. උදාහරණයක් ලෙස කෘෂිකර්මාන්ත ඇමැතිවරුන් දහයක් හිටියා එසේ නම් ඒ කෘෂිකර්මාන්ත දියුණුවෙලා තියෙනවා ද? අනෙක් ක්ෂේත්‍ර දියුණු වෙලා තියනවා ද කියන කරුණ සම්බන්ධයෙන් මේ වනවිටත් සොයා බලනවා. ඒ පිළිබඳ අධ්‍යයනය කර රජයට නිර්දේශයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. උතුරු නැගෙනහිර ගැටලු තියනවා ඒ ගැන සොයා බැලිය යුතුයි. දැනට ඇති ගැටලු සම්බන්ධයෙන් අපි වඩාත් සැලකිලිමත් විය යුතුයි. ඒ අනුව පැරණි සමානුපාතික ක්‍රමයට මැතිවරණය පැවැත්වීම සුදුසු බවයි මා සිතන්නේ. කෙසේ හෝ ඉක්මනින් මැතිවරණය පැවැත්වීම සුදුසු බවත් මම පවසනවා.

පළාත් සභා ප්‍රජාතන්ත්‍රවාදයට ශක්තියක්

මුස්ලිම් කොංග්‍රස් නායක පාර්ලිමේන්තු මන්ත්‍රී **රවූෆ් හකීම්**

පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය මම දකින්නේ එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ තමන්ටම අටවගත්ත උගුලක් ලෙසයි. පනත ඉදිරිපත් කළ ඇමතිතුමාම පනතේ තිබුණු සීමා නිර්ණය සම්බන්ධව ගැටලුවේදී විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා.

මුළු පාර්ලිමේන්තුවම සීමා නිර්ණය කොමිසමේ වාර්තාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා. එය විශාල අවුල් ජාලයක්. පළාත් පාලන මැතිවරණයේදීත් අපි තවත් අවුල් ජාලාවක් ඇති කර ගත්තා.

දැනට පළාත් පාලන ආයතනවලත් ස්ථාවරත්වයක් නැහැ. කලින් පැවතුණු සමානුපාතික ක්‍රමය යටතේ නැවත ඉතා ඉක්මනින් මැතිවරණයට යාම සඳහා සංශෝධනයක් හරහා කළ හැකියි.

ඒ තුළින් කෙටි කාලයකින් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අවකාශය ලැබෙනවා. පළමුව මැතිවරණය පවත්වා ඉන්පසුව මෙය මුළුමනින්ම සමාලෝචනය කිරීමට ලක් කළ හැකියි.

මෙය නැවත සංශෝධනය කිරීමට යෑම පහසු වැඩක් නොවෙයි. පළාත් සභා ඡන්ද ක්‍රමයේ අවුල් ජාලය නිසා ඡන්දය පැවැත්වීමට අවකාශ නැති වුණා.

ඒ අනුව පළාත් සභා මැතිවරණය අවුලෙන් අවුලට පත් වුණා. මේ තත්ත්වය මගහරවා ගතයුතුයි. කාන්තා නියෝජනය සම්බන්ධව පමණක් සාධාරණයක් සිද්ධ වුණා.

කාන්තා නියෝජනය සියයට 25ක් තහවුරු කිරීමට ඉඩ අවකාශ ලැබුණා. පළාත් පාලන ආයතන පද්ධතිය මේ වගේ අවුල් ජාලයක් බවට පත්වීම ජනතාවට අහිතකරයි.

මනාප ක්‍රමයේ තියෙන නොයෙකුත් අඩුපාඩුකම් තියෙනවා නම් අවම කරගන්න පුළුවන්. වෙනත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පසුව සොයා බැලිය යුතුයි. මේ මනාප ක්‍රමය පිළිබඳ විවේචන තියෙනවා. නමුත් පාර්ලිමේන්තු මැතිවරණයේදී එය අසත්‍යයක් බවට තහවුරු වුණා.

මැතිවරණ ක්‍රමය අනුව ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවීමට අපහසුයි. 'තුනෙන් දෙකක බලය ගැනීමට අපහසුයි', 'එක පක්ෂයකට ඡන්දෙ ගත නොහැකි' යි වැනි කාරණා මතු කළා. ජයග්‍රහණයට නම් සුළුජාතීන්ගේ ඡන්දය අවශ්‍යයි. සුළුජාතීන්ගේ ජන්ද කේවල් කිරීමක් සිද්ධ වෙනවා.

නමුත් ඒ කතාව සම්පූර්ණයෙන් පදනම් විරහිතයි කියන කාරණාව පසු ගිය මහමැතිවරණයේදී ඔප්පු වුණා. මේ ක්‍රමය වෙනස් කරන අවශ්‍යතාවයක් නැහැ.

මනාප ක්‍රමය පිළිබඳව තියෙන විවේචනය මඟහරවා ගන්න යම් පිළියමක් යොදන්න පුළුවන්. ඒ සඳහා ක්‍රමවේදයන් තියෙනවා. මම කියන්නේ පරණ ක්‍රමයට නැවත ඡන්දයට යාමයි.

එක්සත් ජාතික පක්ෂය කල් මර මර මැතිවරණ කල් දමමින් එයින් තමන්ටම උගුලක් අටවා ගත්තා එහි ඵල විපාක ඒ අයට ලැබුණා. හැම කෙනෙක්ම සතුටු කරන්න ගියාම කවදාවත් එකඟත්වයකට එන්න බැහැ. තමන්ට අතිබහුතරයක් ඡන්ද ලැබුණු පලියටම සියලු දේ වෙනස් කිරීමට යාම සුදුසු නැහැ. මෑතකදී මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ගිහිල්ලා සෑම පක්ෂයකටම එය අර්බුදයක් බවට පත් වුණා. පළාත් සභා මැතිවරණය කල් නොමරා නියමාකාරයෙන් පැවැත්විය යුතුයි.

දැනට පවතින ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයක් තුළ බහුපක්ෂ බහුවාර්ගිකයන් නියෝජනය කෙරෙන මැතිවරණයක් පැවැත්වීම තුළ ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් වෙනවා.

බලතල ඇති ප්‍රතිපාදන මදි

සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී **එස්. එම්. මරික්කාර්**

අපි පක්ෂයක් විදිහට පළාත් සභා ඡන්දය සම්බන්ධයෙන් තවම සාකච්ඡා කර නැහැ. යෝජනාව පාර්ලිමේන්තුවට ගෙන ආ විට ඒ ගැන සාකච්ඡා කළ යුතුයි. පළාත් සභා දිගටම පවත්වාගෙන යන්නේ නම් මැතිවරණය පැවැත්විය යුතුයි. එසේ නොමැතිව පළාත් සභා අහෝසි කරනවා නම් එය වෙනම සාකච්ඡා කළ යුතුයි.

මැතිවරණය පවත්වන්නේ නම් පැරණි ක්‍රමයටම පැවැත්විය යුතුයි.

පරණ ක්‍රමයට පවත්වන්නේ නම් අවුල් වියවුල් නුගක් අඩුවෙන් මැතිවරණය පැවැත්විය හැකි බවයි මගේ පෞද්ගලික මතය වන්නේ. මැතිවරණය දැනටමත් බොහෝ කල් ගිහින් තියෙන්නේ. මැතිවරණය පවත්වන්න උත්සාහ කරනවා නම් අපි රජයට සහය දෙනවා.

යළිත් පනත් ගෙනල්ලා සංශෝධන ගෙනැවිත් කටයුතු කරන්න සැලකිය යුතු කාලයක් යයි. මැතිවරණය ඉක්මනින් පැවැත්විය යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නේ. විශේෂයෙන්ම පළාත් සභා ක්‍රමය පවත්වාගෙන යනවා නම් මීට වඩා මුදල් ප්‍රතිපාදන ලබා දිය යුතුයි.

බලතල ලබාදී තිබුණත් ඒ බලතල ක්‍රියාත්මක කරන්න ප්‍රතිපාදන අවශ්‍යයි. උදාහරණයක් ලෙස පාසල් දහදහස් ගණනක් තියෙන රටේ මධ්‍යම රජය යටතේ තියෙන්නේ තුන්සියයක් පමණයි. එසේ නම් එය පාසල් හොඳ මට්ටමින් පවත්වා ගන්නට නම් මුදල් ලබා දිය යුතුයි. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය දියුණු කිරීමට නම් ප්‍රතිපාදන තිබිය යුතුයි. රෝහල්වල තත්ත්වයත් ඒ වගේමයි.

අදාළ බලතල ක්‍රියාත්මක කරන්න යාන්ත්‍රණයක් සකස් කරන්න ඕන. එසේ නොහැකි නම් පළාත් සභා අහෝසි කළ යුතුයි.

බොරුවට පළාත් සභා පවත්වාගෙන ගිහින් ඒ යටතේ පවතින ආයතන නිසි නඩත්තුවක් කරගැනීමට නොහැකි නම් පළාත් සභා තිබීමෙන් ඵලක් නැහැ.

අපි මෙහිදී මතු කළ යුතු කාරණාව වන්නේ සියලු දෙනාම ශ්‍රී ලාංකිකයන් බවත්, ඒ සියලු දෙනාට ගැලපෙන ආකාරයට හැම පුරවැසියෙකුටම සේවය ලැබෙන්නේ කුමනාකාරයෙන්ද යන්න විමසා බැලීමයි.

පාර්ලිමේන්තුවෙන් කරන කාර්යයභාරය, පළාත්සභා නගර සභා පළාත් පාලන ආයතනවලට අයිති කාර්යය භාරය කිරීමට අවශ්‍යයි. ඒ අදාළ කාර්යයභාරය කිරීමට ප්‍රතිපාදන තිබිය යුතුයි.

මූලිකව ඒ කාර්යය සඳහා ප්‍රතිපාදන ලබා දියයුතුයි. මැතිවරණ තියලා නියෝජිතයන් පත් කරලා ඒ මහජන නියෝජිතයන් නඩත්තු කරලා වැඩක් නැහැ, ඒ නියෝජිතයන් හරහා අදාළ කාර්යය ඉටුවිය යුතුයි. බලතල ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන අවශ්‍ය යි. අරමුණක් වෙනුවෙන් යමක් කරන්න ඕන.

සුභද්‍රා දේශප්‍රිය

පළාත් සභා සුදු අලියෙක්ද ජාතික ප්‍රශ්නයට විසඳුමක්ද ?

පළාත් සභා මැතිවරණය සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ම පැවැත්වීම සඳහා පළාත් සභා මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමට රජය කටයුතු කරමින් සිටී. මිශ්‍ර මැතිවරණ ක්‍රමය යටතේ පළාත් සභා ඡන්දය පැවැත්වීම ගැන පසුගිය රජය සමයේ කතාබහට ලක් විණි. එහෙත් සීමානිර්ණය සම්බන්ධ නීති ගැටලු නිසා එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පරාජයට පත්විය. නැවත සීමා නිර්ණය සමාලෝචනයට ලක්විය. එමෙන්ම පළාත් සභා ඡන්ද ක්‍රමයේදී මන්ත්‍රීවරුන් තෝරාපත් කරගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන්ද දැඩි විවේචනද එල්ල විය. පසුගිය රජය යටතේ සම්මත කරගත් පනත අනුව සභිකයන් සියයට පනහක ප්‍රතිශතයක් ඡන්දයෙන්ද සියයට පනහක් සභිකයන් ලැයිස්තුවෙන්ද තෝරාපත් කරගතයුතු බව එහි සඳහන් වෙයි. මේ සංශෝධනයන් අනෙකුත් දේශපාලනික පක්ෂවල දැඩි විවේචනයට ලක්විය. සමස්ත පළාත් සභා ක්‍රමවේදයටම විරුද්ධව ඇතැම් දේශපාලඥයෝ අදහස් පළ කරති. පළාත් සභා ප්‍රතිපාදන අනුව ජනතාවට සේවයක් වන්නේ ද යන්න ඔවුන්ගේ මතයයි. ඇතැමුන් සඳහන් කරන්නේ පළාත් සභාවලට ලබා දී ඇති බලතලවලට අදාළව ප්‍රතිපාදන වෙන් කර නැති බවයි. පළාත් සභා ක්‍රමය සුළු ජාතීන්ට ඔවුන්ගේ ජාතිකත්වය නියෝජනයවීම සඳහා ලැබුණු වරප්‍රසාදයක් නිසා කුමන ක්‍රමයකට හෝ 'පළාත් සභාව' යන ආයතනයන් පැවැත්විය යුතු බව ඇතැමුන්ගේ අදහසයි. පළාත් සභා මැතිවරණය කුමන මැතිවරණ ක්‍රමයක් යටතේ පවත්වන්නේ ද එසේත් නැත්නම් පළාත් සභා අහෝසි විය යුතුද යන සංවාදය අවසන් විය යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදීව බව ඇතැමුන්ගේ අදහසයි. කුමනාකාරයේ මැතිවරණ ක්‍රමවේදයක් යටතේ හෝ ඡන්දය පැවැත්විය යුතුයැයි තවත් බොහෝ පිරිසක් අවධාරණය කරති.

දේශපාලන බලය කුමන පාර්ශ්වයකට හිමි වුවත් ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතා පරමාධිපත්‍ය බලය උරගා බැලීමට ඇති එකම මඟ සර්වජන ඡන්ද බලයයි.

කල් දමා ඇති පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ නියෝජිතයන් හය දෙනකු දැක්වූ අදහස් මෙසේය.

අලුත් පනතින් කුඩා පක්ෂ අකර්මන්‍ය වනවා

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් **දුමින්ද නාගමුව**

මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් කෙරෙන සාකච්ඡා වලදී දක්නට ලැබෙන කාරණාවක් තමයි යම් මට්ටමක හෝ නියෝජනයක් සැකසීමක් ඇත්නම්, විවිධ මතවාදයක් තිබේ නම් ඒ මතවාදවලට ඉඩ නොදී මඟ අහුරණ යෝජනාවන් ගෙන ඒම.

දැනට තියෙන නිර්නායක අනුව ප්‍රධාන පක්ෂ දෙකට පමණයි මෙයින් වාසි සැලසෙන්නේ. ඉතුරු දේශපාලන පක්ෂ අකර්මන්‍ය කරන ආකාරයටයි මේ අලුත් පනත සකස් කර තියෙන්නේ.

පළාත් සභා සම්බන්ධයෙන් සාකච්ඡා මූලික වශයෙන් ගත් විට සමානුපතික සහ කේවල ක්‍රමය යන ක්‍රමයන්ගෙන් පැනනැගුණත් ඒක අත්හිටුවන්න සිදුවුණේ සීමානිර්ණය සාධාරණ විදිහට සිදුනොවුණ නිසයි. දෙවැනි කාරණාව පහුගිය යහපාලන ආණ්ඩුවට මැතිවරණ නොතියා ඉන්න වුවමනාවක් තිබුණා. ඒ නිසා මැතිවරණ වළක්වා ගන්නයි ඒ අයට වුවමනා වුණේ.

පළාත් සභා ගැන යෝජනා දෙකක් තියනවා පළාත් සභා අහෝසි කිරීම සහ පරණ ක්‍රමයට මැතිවරණයක් පවත්වන්ට අවශ්‍යයි කියන කාරණාව. අලුත් ක්‍රමයට තියෙනවා ද කියලත් මත ගොඩනැඟී තියෙනවා. මේ කුමන මතවාදය ජයග්‍රහණය කළත් පළාත් සභා කියන්නේ අර්බුදයකට විසඳුමක් ලෙස ගෙන ආ දේශපාලන ව්‍යුහයක්. ඒ අර්බුදයට විසඳුමක් නිසි ලෙස නොලැබුණා වගේම පළාත් සභා අතිවිශාල වියදමක් බවට පත් වුණා විතරයි.

විශාල පුනරාවර්තන වියදමක් සහිතව පවත්වාගෙන ගිය පළාත් සභා අහෝසි වුණොත් උතුරු නැගෙනහිර ජනතාවගේ ජාතිකත්වය නියෝජනය නැතිවීම සම්බන්ධයෙන් යම් කිසි අර්බුදයක් මතු වියහැකියි. ඔවුන්ගේ යම් ආයතනයක් වේ නම් ඒ ආයතන දුර්වල වුණා කියන දේශපාලන සංඥාව උතුරු නැගෙනහිරින් ඇතිවිය හැකියි.

කෙසේ වෙතත් මහජනතාවට තමන්ගේ සාධාරණ නියෝජනයන් ශක්තිමත් වන ව්‍යුහයක් අවශ්‍යයි. එහි එක ව්‍යුහයක් පළාත් පාලන ආයතන වන අතර අනෙත් ව්‍යුහය පාර්ලිමේන්තුව විය යුතුයි. එහි අතරමැද දිස්ත්‍රික් පළාත් සභා ව්‍යුහයක් අවශ්‍ය බවට මහජනතාවගේ මතයක් ගොඩනැඟී තියෙනවා. අපි කුමන මතවාද ඉදිරිපත් කළත් සමානුපාතික ද කේවලද මිශ්‍ර ද මැතිවරණ ක්‍රමයන්ගෙන් කුමන එකද කියලා අවසානයේදී එය තීරණය කරන්නේ ආණ්ඩුවයි. ඒ තමන්ගේ මතවාදය ජයග්‍රහණය බලය ශක්තිමත් කිරීම උදෙසායි.

තුනෙන් දෙකක බලය තියන නිසා කුමක් වුවත් ඔවුන්ට කළ හැකියි. මේ මැතිවරණය කෙසේ කළ යුතුයිද කියන සංවාදයට අපි එකතු වුණත් මැතිවරණය අවසන් වන්නේ මහජන හිතවාදී ලෙසින් නෙමෙයි. ඉන්න පාලකයන් ශක්තිමත් කිරීමටයි මෙය ගෙන එන්නේ .

කුමන ක්‍රමයෙන් හෝ ඡන්දය ඕනෑ

ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී **විජිත හේරත්**

කුමන ක්‍රමයට හෝ පළාත් සභා ඡන්දය පවත්වනවා නම් . ඒ පැවැත්වීමේදී දේශපාලන පක්ෂයක් හැටියට අදාළ මැදිහත්වීම අපේ පැත්තෙන් සිදුවෙනවා. පළාත් සභා ඡන්දය කල් දැමීම පිළිබඳව අපි විරුද්ධ වුණා.

අලුත් ක්‍රමයෙන් මැතිවරණ පැවැත්වීම ප්‍රමාද වන්නේ නම් පැවැති ඡන්ද ක්‍රමයට හෝ ඡන්දය පවත්වන්න කියන තර්කය අප දිගින් දිගටම ගොඩනැඟුවා.

පළාත් සභා ක්‍රමයක් දැනට සම්මත වෙලා තියෙනවා. ආණ්ඩුව කියනවා නම් ඒ ක්‍රමය වෙනස් කරලා පරණ එකට යනවා කියලා, ඒ ගැන අපේ වාද විවාද නැහැ, කුමන ක්‍රමයට හෝ මැතිවරණය පැවැත්වීමයි අපේ ඉල්ලීම වන්නේ.

ආණ්ඩුවේම සමහර අය කියනවා පළාත් සභා වෙනස් කළ යුතුයි කියන කාරණාව.

මැතිවරණ පනත සංශෝධනය කිරීම හදිසියේ කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. ඒ නිසා ඡන්දය අලුත් ක්‍රමයට හෝ පරණ ක්‍රමයට පැවැත්විය යුතුයි.

අලුත් ක්‍රමයට යනවා නම් සීමා නිර්ණ, කොමිෂන් සභාවේ සම්මත කරන්න ඕන.

එය ඉක්මනින් කරන්න බැහැ කොමිෂන් සභා වාර්තා ගැටලු තියෙනවා කියලා පාර්ලිමේන්තුවේ කිසිම මන්ත්‍රීවරයෙක් ඡන්දෙ දුන්නෙ නැහැ. පනත ගෙනාපු ඇමතිවරයාවත් ඡන්දෙ දුන්නෙ නැහැ.

ඒ නිසා සමානුපාතික ක්‍රමයට හෝ මැතිවරණයට යන එකයි කළ යුතු වන්නේ.

පක්ෂයක් ලෙස අනිවාර්යෙන් ඡන්දෙට අපි සූදානම්. අපි ඡන්දෙට ඉදිරිපත් වෙනවා. ජන්ද ක්‍රමය සම්බන්ධ වාද කර කර හිටියොත් පළාත් සභා මැතිවරණය යළිත් කල් යාමයි සිද්ධ වෙන්නේ.

ඒ නිසා වාද කර කර ඉන්නවට වඩා පරණ ක්‍රමයට ඡන්දෙ පවත්වන එක හොඳයි.

සීමා නිර්ණය සම්මත කරන්න, පනට පනහ සභිකයන් නියෝජනය වෙනස් කරන්න ගියාම කල් ගතවෙනවා . ඒ නිසා නව මැතිවරණ ක්‍රමයට වඩා ඒ සම්බන්ධව වඩා පුරුදු ක්‍රමයට යාම ගැටලු අවම කරගෙන මැතිවරණයකට යන්න පුළුවන්.

ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද? ඒ සියලු ස්ථාවරයන්ට අනුව මැතිවරණයට ඉදිරිපත්වීමට පක්ෂයක් ලෙස අපි සූදානම්.

බලය විමධ්‍යගත කිරීම ඉතා වැදගත්

එක්සත් සමාජවාදී පක්ෂයේ නායක **සිරිතුංග ජයසූරිය**

පළාත් සභා මැතිවරණය අනිවාර්යෙන්ම පැවැත්විය යුතුයි. වඩා හොඳ මැතිවරණ ක්‍රමයක් යටතේ පවත්වන්නයි පසුගිය රජය සංශෝධන ගෙනාවේ. නමුත් කෙසේ හෝ පළාත් සභා කල් දැමුණා. නිසි ක්‍රමවේදයක් නැතුව මැතිවරණය අතරමැද නතර වෙලා තියෙන්නෙ.

අපි කියන්නේ පළාත් සභා පැවැත්විය යුතුයි කියන කාරණාව පමණයි. පළාත් සභා විශාල අරගලයක් කර ලබා ගත්ත දේශපාලන ව්‍යුහයක්.

විශේෂයෙන්ම සුළු ජාතීන්ට ලැබුණු අයිතියක්. ඒ නිසා කුමන ක්‍රමයකට හෝ පළාත් සභා පැවැත්විය යුතුයි. ඇතැම් පළාත්වල, විශේෂයෙන් දකුණේ ආවේණික විරෝධතාවයක් තියෙනවා පළාත් සභා කියන්නේ සුදු අලියෙක් කියල. පළාත් සභාවලින් වෙච්ච දෙයක් නැහැ කියනවා. පළාත් සභා නඩත්තුවට විශාල මුදලක් වෙන් කරන්න වෙනවා කියනවා. ඇතැම් අය තර්ක කරනවා.

අවුරුදු දෙකක් තුනක් තිස්සේ පළාත් සභා නැතුව මේ රට කරගෙන ගියා කියලා.

පාර්ලිමේන්තුවක් නැතුව මාස 5ක් ඔක්කොම වැඩ කරගෙන ගියා නේ. මොකටද පාර්ලිමේන්තුවක් පත් කරන්නේ කියලා තර්කයක් ගොඩ නගන්නත් පුළුවන්. පොඩි පොඩි විවේචන තිබුණ තමයි ඒ මාස පහ ගැන නමුත් රට හොඳට පවත්වාගෙන ගියානේ. ඉතිහාසයේ පළවෙනි වතාවට පාර්ලිමේන්තුවක් නැතුව මේ රට පවත්වාගෙන ගියේ. 1948න් පස්සෙ.

තව කෙනෙකුට තර්ක කරන්න පුළුවන් ජනාධිපති කෙනෙක් විතරක් හිටියා ම ඇති කියලා. මේ ඔක්කොම පදනම් විරහිත තර්ක.

මම හිතන්නේ කිසිම හේතු සහතිකයක් නැතුව තමන්ගේ මනෝමූල සාධක මත ගොඩනඟා ගත්තු තර්ක. පළාත් සභා ක්‍රමයට විරුද්ධව අන්තවාදී ජනකොටසක් මේ රටේ ඉන්නවා.

ඒ අය මේ රට ඉදිරියට ගෙන යන්න සූදානම් කට්ටිය නෙමෙයි.

බලය විමධ්‍යගත කිරීම ඉතා වැදගත් කාරණාවක්. ඉදිරියට තියපු අඩිය ක්‍රියාත්මක කළ යුතුයි කියන කාරණාව තමයි අපි මතු කරන්නේ පළාත් සභා ඉක්මනින් පැවැත්විය යුතුයි.

ධම්මානන්ද හිමියන් අපවත්වී දස වසරක් පිරීම නිමිත්තෙන් පැවැත්වූ ප්‍රදර්ශනයක මලයානු චීන බෞද්ධ දරුවන්ගේ රංගනයක් (ඔවුන්ට පිටුපසින් පෙනෙන්නේ ධම්මානන්ද හිමියන්ගේ රූපයකි)

● ජානක පෙරේරා

මීට වසර හැට අටකට පෙර 1952 ජනවාරි පස් වැනිදා කොළඹින් පිටත් වූ මගී නැවක් දින තුනක ගමනකින් පසු මලයාවේ (වත්මන් මැලේසියාව) පීනැං වරායට සේන්දු විය. එම නැවෙන් ගොඩබට මගීන් අතර තිස්තුන් හැවිරිදි ආචාර්ය කිරින්දේ ධම්මානන්ද හිමියෝද වූහ. උන් වහන්සේ පැමිණියේ මලයාවේ පැරණිම බෞද්ධ සංගමය වූ ශාසන අභිවෘධි වර්ධන සමිතිය විසින් එවකට විද්‍යාලංකාර පිරිවෙනේ අධිපති වූ කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර හිමියන්ගෙන් කරන ලද ඉල්ලීමකට අනුවය. භික්ෂූන් හාරසියයක් අතුරෙන් උන්වහන්සේ ඒ සඳහා තෝරාගත්තේ ධම්මානන්ද හිමියන්ය. නවසිය පණහේ දශකයේදී මලයාවේ තිබූ ථෙරවාදී බෞද්ධ විහාර සුළු ගණනකි. ධම්මානන්ද හිමියන් එරටට යැවීමේ මූලික අරමුණ වූයේ 19 සියවසේ මැද භාගයේ පමණ සිට එරට පදිංචි වී සිටි සිංහල බෞද්ධයන්ගේ අවශ්‍යතාවයන් පිරිමැසීමය. චීන (මහායාන) සහ තායි විහාර සියගණනක් එරට පැවති නමුත් ඒවායින් වැඩිවශයෙන් කෙරුනේ හුදු පුද පූජා සහ චාරිත්‍ර විධි පැවැත්වීම සහ පිරිත් සජ්ජායනය කිරීම් පමණි. ඒ පන්සල් වල වැඳුම් පිදුම් කළ වැඩි දෙනෙක් නමින් බෞද්ධ වුවද පැටලී සිටියේ මිත්‍යා විශ්වාසයන්වලය.

පීනැං නුවර කේ. ගුණරතන හිමියන්ගේ අධිපතිත්වය යටතේ එරට පැවති මහින්දාරාම විහාරයේ ටික දිනක් නැවතී සිටීමෙන් පසු ධම්මානන්ද හිමියෝ ක්වාලාලම්පූර් නුවර වසර 1894 පිහිටුවන ලද බ්‍රික් ෆීල්ඩ්ස් (Brickfields) මහා විහාරයට වැඩම කර එහි අධිපතිත්වය භාරගත්හ. (මලයාවේ මුල්වරට බෞද්ධ විහාරයක් පිහිටුවන ලද්දේ එරට ටායිපිං නුවර 1892දීය).

ධම්මානන්ද හිමියන් මලයාවට වඩින විට එරට හටගෙන තිබූ රාජ්‍ය-විරෝධී කැරැල්ලක් හේතුවෙන් අලුතින් සම්මත කරගත් ත්‍රස්ත විරෝධී නීතියක් ඉතා තදින් ක්‍රියාත්මක වෙමින් පැවතින. උන්වහන්සේ පැමිණීමට පෙර වසරේ එනම් 1951 ඔක්තෝබර් 6 වැනි දා කැරලි කරුවෝ එරට බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් හෙන්රි ගර්නි ඝාතනය කළහ. කැරැල්ල නිසා එරට දුම්රිය ගමනාගමනය අවහිර වී තිබූ බැවින් උන්වහන්සේ පීනැං සිට ක්වාලාලම්පූර් නුවරට පැමිණියේ ගුවන් මගින්ය.

බ්‍රික් ෆීල්ඩ්ස් විහාරයට උන්වහන්සේ වැඩම කළ විට එවකට එහි සිටි පඤ්ඤාසිරි මහ තෙරුන් විසින් ඉතා උණුසුම් ලෙස පිළිගනු ලැබීය. පඤ්ඤාසිරි හිමියන් කලින් ධම්මානන්ද හිමියන් සමඟ විද්‍යාලංකාර පිරිවෙනේ වැඩ සිටි හිමි නමකි. ඉන්පසු ධම්මානන්ද හිමියෝ නොපමාව විහාරයේ කටයුතු ප්‍රතිසංවිධානය කරන්නට පටන් ගත්හ. බ්‍රික් ෆීල්ඩ්ස් විහාරය කවදත් එරට ශ්‍රී ලාංකික සම්භවයක් ඇති බෞද්ධයන්ගේ කටයුතු වල මුල් තැනක් ගත්තේය.

ධම්මානන්ද හිමියන් බ්‍රික් ෆීල්ඩ්ස් විහාරයේ අධිපතිත්වය බාර ගැනීමෙන් තුන්මසකට පසු මලයාවේ නව බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ලෙස පත්වූ සෙන්පති ෆීල්ඩ් මාෂල් ජෙරල්ඩ් ටෙම්ප්ල උන්වහන්සේ බැහැදැකීමට පැමිණියේය. ටික වේලාවක් සතුටු සාමීචියේ යෙදීමෙන් පසු ටෙම්ප්ල තමා ධම්මානන්ද හිමියන් හමුවීමට ආ සැබෑ කාරණය හෙළි කළේය. එනම් බුදු දහමත් කොමියුනිස්ට් වාදයත් අතර යම් සම්බන්ධයක් තිබේද යන්නය.

ඔහු එසේ ඇසුවේ ඇයි? ඊට පිළිතුර මේ ලිපියෙනි.

එවකට මලයාව සහ සිංගප්පූරුව යන දෙරටම තනි බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවතියද 1945 අවසන් වූ දෙවන ලෝක යුද්ධයෙන් ඇති වූ දැඩි ආර්ථික සහ දේශපාලන බලපෑම් නිසා වැඩි කලක් යන්නට පෙර ඒ දෙරටටම නිදහස දීමට සිදුවන බව බ්‍රිතාන්‍ය පාලකයන්ට අවබෝධ විය. ඒවන විට ඉන්දියාව, පකිස්ථානය, ලංකාව, සහ බුරුමය (වත්මන් මියන්මාරය) බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වී තිබිණ.

තත්ත්වය එසේ වුවද මලයාවේ ආර්ථික බිඳවැටීම් නිසා රට පුරා පැන නැඟ තිබූ කම්කරු අරගල සහ වැඩ වර්ජන බ්‍රිතාන්‍ය පාලකයෝ දරුණු ලෙස මර්දනය කරන්නට පටන් ගත්හ. මෙය රජය පෙරළීම සඳහා අවස්ථාව කරගනිමින් එරට කොමියුනිස්ට් පක්ෂය 1948 අප්‍රේල් - ජූනි අතරතුර මලයානු චීන ජාතික චිං පෙං ගේ නායකත්වය යටතේ 'මලයානු ජාතික විමුක්ති හමුදාව' (Malayan National Liberation Army) නමින් සන්නද්ධ කැරැල්ලක් දියත් කළහ. ඔවුන් වැඩි දෙනා මලයාවේ දෙවැනි ජනවර්ගය වූ චීනුන් අතරින් බිහිවූ කොමියුනිස්ට්වාදීන් වූහ. එරට ප්‍රධාන ස්වදේශිකයන් වූ මැලේ ජාතිකයන් කැරැල්ලට පක්ෂ වූයේ ඉතා අල්ප වශයෙනි. ඉන්දියානු සහ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති එරට අනෙකුත් වැසියන්ගේද ඊට සම්බන්ධයක් නොවීය.

දෙවන ලෝක යුද්ධයේදී ජපන් හමුදා මලයාව ආක්‍රමණය කළවිට මලයානු චීන කොමියුනිස්ට් ගරිල්ලෝ ජපනුන්ට විරුද්ධව බ්‍රිතාන්‍යයන්ට සහාය දුන්හ. එහෙත් යුද්ධයෙන් පසු මලයාව නිදහස කරා යන ගමනේදී මලයානු කොමියුනිස්ට් වාදීන්ට අවශ්‍ය වූයේ එය තමන්ගේ අරමුණු කරා යොමු කරවීමය. මලයාවේ ඇතිව තිබූ ආර්ථික අර්බුදය ඊට මග ලෙස ඔවුන්ට පෙනින. අධිරාජ්‍ය-විරෝධී විමුක්තිකාමීන් ලෙස මේ කොමියුනිස්ට් වරු පෙනී සිටියද ඔවුන්ගේ අමානුෂික කෘර ක්‍රියා නිසා රජයේ නිලධාරීන් පමණක් නොව සාමාන්‍ය ජනතාවද බියෙන් තැති ගත්හ.

වසර 1948 ජූනි 16 දා උදෑසන මලයාවේ එල්ෆිල් රබර් වතුයායට පාපැදි වලින් පැමිණි චීන තරුණයන් දෙදෙනෙක් එහි යුරෝපීය අධිකාරි පනස් හැවිරිදි ආත වෝක මහතා සහ ඊට සැතපුම් කීපයක් ඇතින් පිහිටි රබර් වත්තක යුරෝපීය කළමනාකාර ජේ. ඇලිසන් යන අය පුටු වලට බැඳ වෙඩි තබා ඝාතනය කළහ. මීට අමතරව තවත් වතුපාලකයෙකුද කැරලිකරුවන් අතින් මරණයට පත් විය. ත්‍රස්ත විරෝධී නීතිය ක්‍රියාත්මක වන්නට පටන් ගත්තේ මේ ඝාතනවලින් පසුවය.



කිරින්දේ ශ්‍රී ධම්මානන්ද හිමි

මහ කොමසාරිස් ජෙරල්ඩ් ටෙම්පල

මලයානු චීන කොමියුනිස්ට් කැරලි නායක චිං පෙං

ඝාතනය කෙරුණු මහ කොමසාරිස් හෙන්රි ගර්නි

චීන බෞද්ධයන් විපතකින් මුදාගත් සිංහල හාමුදුරුවෝ

බ්‍රික් ෆීල්ඩ්ස් බෞද්ධ මහා විහාරය

සුද්දන් හැරුනු කොට කැරලිකරුවන් මැරුම් කෑ අනෙකුත් අය අතර සිංහලයෙක්ද විය. ඒ ජොහෝර් පළාතේ රබර් වත්තක කළමනාකරු ලෙස සේවය කළ ඩේවිඩ් සමරවික්‍රමය. කැරලිකරුවන් එම වතුයායේ රබර් ගුදමකට ගිනි තබන විට එතනට ගිය සමරවික්‍රම අල්ලාගත් ඔවුහු ගිනි ගෙන දැවෙන ගබඩාවට තුළට ඔහු වීසි කළහ. මේ අතර වෙනත් සිංහලයන් කිහිපදෙනෙක් කැරැල්ල මැඩලීමේ යෙදුනු පොලිසියට සහ යුද හමුදාවට අනුයුක්තව සේවය කළහ. (Sinhalese Immigrants in Malaysia and Singapore 1860-1990)

එළිපිටම කළ ඝාතන වලින් කැරලි කරුවන් තැත් කළේ ඒවා "අධිරාජ්‍ය විරෝධී අරගලයේ" කොටසක් ලෙස ජනතාවට එත්තු ගන්වන්නටය. එම මිනීමැරුම් දෙස තැති ගැන්මෙන් බලා සිටි අවට ජනයාට කැරලිකරුවෝ එහි 'වැදගත්කම' ගැන දේශනද පැවැත්වූහ, එහෙත් එහි අනිවාර්ය ප්‍රතිපලය වූයේ වුයේ වැඩිකලක් යන්නට පෙර ඒවා කැරලි කරුවන්ටම පාරා වළල්ලක් වී රජයට වාසිදායක වීමය.

ඒ අනුව ත්‍රස්ත විරෝධී නීතිය යටතේ මලයානු කොමියුනිස්ට් පක්ෂය සහ අනෙකුත් වාමාංශික පක්ෂ තහනම් කරන ලදුව කැරලි කරුවන්ට ආධාර දීම පිළිබඳව සැකයට පාත්‍ර වූ සියලු දෙනාම කිසිදු නඩු විභාගයකින් තොරව සිරගත කිරීමට පොලිසියට බලය පවරන ලදී. මලයානු පොලිසිය සහ හමුදාවට අමතරව බ්‍රිතාන්‍යය, ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩල රටවල කිහිපයකම හමුදා කැරැල්ල දැඩි ලෙස මර්දනය කිරීමෙහි යෙදී සිටියහ. කොමියුනිස්ට් ගරිල්ලන්ට ආහාර සැපයෙන මාර්ග අවහිර කර ඔවුන් සාගින්නේ තබන්නටද උත්සාහ ගැනිණ. මේ මර්දන ක්‍රියාවලදී අහිංසකයන්ටද නොයෙකුත් පීඩනවලට ලක්වීමට සහ මැරුම් කෑමටද සිදුවිය. මේ අතරින් දරුණුම අපරාධය වූයේ 1948 දෙසැම්බරයේ සෙලන්ගෝ පළාතේ බටං කාලි ගම්මානයේය. ගම්මානයේ රබර් වත්තක් වැටලූ හමුදා භටයෝ එහි ගැමියන් 24 දෙනෙකු මරා ගම්මානයද ගිනිබත් කළහ. කැරලිකරුවන් මැඩලීම සඳහා ගුවන් ප්‍රහාරද එල්ල කරන ලදී.

මෙහිදී මහ කොමසාරිස් ටෙම්ප්ලට ගැටලුවක් වූයේ කැරලිකාර චීනුන් සියලු දෙනාම පාහේ කොන්ෆියුසියානු පසුබිමක් සහිත බෞද්ධ පවුල් වල උපන් අය වීමය. ඒ පිළිබඳව ඔහුට ඉතා හොඳින් කරුණු පැහැදිලි කළ ධම්මානන්ද හිමියෝ බුදු දහම සහ කොමියුනිස්ට් දේශපාලනයේ සන්නද්ධ විප්ලවය අතර කිසිදු සම්බන්ධයක් නැති බව පෙන්වා දී මහ කොමසාරිස් වරයාගේ පදනම් විරහිත සැක බිය තුරන් කිරීමට සමත් වූහ. කැරලි කරුවන් සහ ඔවුන්ගේ පවුල්වල අය කලක් තිස්සේ බෞද්ධ ආභාසයෙන් ඇත්වී සිටීම ඔවුන්ගෙන් සමහරු මෙවැනි කැරැල්ලක් වෙත ඇදීයාමට හේතුව බව ධම්මානන්ද හිමියෝ තව දුරටත් පෙන්වා දුන්හ.

ධම්මානන්ද හිමියන්ගේ චතුර ඉංග්‍රීසි කථිකත්වය සහ බෞද්ධ ග්‍රන්ථ වලින් කරුණු පැහැදිලි කළ ආකාරය ගැන ඔහු කෙතරම් පැහැදුනේද යත්, කැරලිකරුවන්ගේ ග්‍රහණයට හසු වී සිටි චීන ගැමියන්ගේ සිත් දිනාගෙන ඔවුන් ඉන් මුදවාගැනීමට උන්වහන්සේගේ සහාය පැතීය. ඒ සඳහා අවශ්‍ය වාහන සහ වෙනත් පහසුකම් සැපයීමටද මහකොමසාරිස්වරයා පොරොන්දු විය. එහෙත් එසේ රජයේ අනුග්‍රහය යටතේ එවන් කටයුත්තක යෙදීම කැරලිකරුවන් අතින් තමාට මැරුම් කෑමට පාර කපා ගැනීමක් බව උන්වහන්සේට අවබෝධ විය. එබැවින් රජයේ සහාය ප්‍රතික්ෂේප කළ ධම්මානන්ද හිමියෝ තමා තනිවම එම සාම කටයුත්තේ යෙදෙමින් රජයේ අරමුණට දායක වීමට පොරොන්දු විය. මෙය මලයාවේ සහ සිංගප්පූරුවේ බුදු දහම යළි නගාසිටුවීමට කදිම අවස්ථාවක් බව උන්වහන්සේට වැටහින.

කරවටක් දියේ ගිලී කැරලිකරුවන් සොයායන භට පිරිසක්

අවි බලයෙන් කැරැල්ල මැඩලීමට අමතරව ජනතාවගේ සිත් දිනාගැනීමේ වැදගත්කම ඒ වනවිට ටෙම්ප්ල ඇතුළු මලයාවේ බ්‍රිතාන්‍ය පාලකයන්ටද වැටහී තිබිණ. ඒ නිසා එරට රජයෙන් 'හදවත් මෙහෙයුමක්' (Hearts and Minds Operation) දියත් කරන ලදී. ධම්මානන්ද හිමියන්ගේ සාම කටයුත්තද ඊට සාමාන්තරව ක්‍රියාත්මක විය.

රජය විසින් පන්ලක්ෂයක් පමණ ගැහැනු, පිරිමි සහ ළමුන් ඔවුන්ගේ නිවෙස් වලින් ඉවත්කර වෙනත් ස්ථාන වල පදිංචි කරවන ලදී. 'උපක්‍රමික ගම්මාන' (Strategic Hamlets) ලෙස හැඳින්වුණු මේ නව ගම්මාන වලට කැරලි කරුවන් ඇතුළු වීම වැළැක්වීමට සහ ඒ ගම් වැසියන් කැරලිකරුවන්ගේ බලපෑමට හසුවීම වැළැක්වීමට ඒවාට දිවා රාත්‍රී පොලිස් සහ යුද හමුදා මුර සේවා යෙදවිණ.

පඤ්ඤාසිරි හිමියන්ගේ සහායෙන් සිය සත්කාරය ආරම්භ කළ ධම්මානන්ද හිමියෝ එම කටයුත්තේදී චීන භාෂා පරිවර්තකයන් සමඟ මේ අලුත් ගම් 40 ආවරණය කළහ. ඒවායේ වැසියන් විසින් උන්වහන්සේව පිළිගනු ලැබුවේ කිසිදු පැකිලීමක් නැතිවය. සැබෑ විමුක්තිය ඇත්තේ අවිදරාගත් විප්ලවයන් තුළ නොව ආධ්‍යාත්මික අවබෝධය තුළ බව ඔවුන්ට පෙන්වා දුන් උන්වහන්සේගේ ප්‍රධාන අරමුණ වූයේ සත්‍ය බුදු දහම යනු හුදු චාරිත්‍ර විධි සහ පුද පූජා ඉක්මවා ගිය ජීවන පැවැත්මක් බව පැහැදිලි කිරීමයි.

ධම්මානන්ද හිමියෝ සිය කටයුත්තේදී දහම් දෙසීම, පිරිත් කීම යනාදියේ දෙවසරක් පමණ යෙදුනාහ. සිය පාරම්පරික බෞද්ධ පසුබිම ඔවුන්ට නිවැරදිව අවබෝධ කරවීමට උන්වහන්සේ ඉතා ඉවසිලි වන්තව පිහිට වූහ. එහි ප්‍රතිපලයක් වශයෙන් ක්‍රම ක්‍රමයෙන් චීන ගැමියන් කැරලි ව්‍යාපාරය වෙත ආදීයාම වැළැක්වීමට ධම්මානන්ද හිමියන්ට හැකි වූවා පමණක් නොව ඔවුන් අන්‍යාගම් කරණයට ලක්වීමද නවතාගත හැකි විය. ඒ කාලයේ ඉස්ලාම් භක්තික මැලේ ජාතිකයන් හැර එරට සිටි ඉන්දීය සහ චීන වැසියෝ අන්තවාදී කිතුනු කල්ලිවල ග්‍රහණයට ලක්වෙමින් සිටියහ. මැලේ මුස්ලිම් නායකයන්ගේ දැඩි බලපෑම නිසා මැලේ ජාතිකයන් වෙනත් ආගම් වෙත හරවා ගැනීම නීතියන් තහනම් කර තිබිණ.

අන්‍යාගම් කරණයට විරුද්ධව ධම්මානන්ද හිමියන් සටන් කළේ තනිවමය. මේ සඳහා උන්වහන්සේ කළේ බුදුදහම ඉතා තර්කානු කූල, ප්‍රායෝගික දර්ශනයක් ලෙස හැකිතරම් සම්ප්‍රදායයන්ගෙන් සහ වත් පිළිවෙත් වලින් තොරව ඉදිරිපත් කිරීමයි. උන්වහන්සේ ගේ මේ පිළිවෙත නිසා සියලු ආගම් වලින් ඇත්වී සිටි එරට චීන බුද්ධිමතුන්ද බුදුදහම වෙත යළි නැඹුරු වන්නට පටන් ගත්හ. වැඩි කලක් යන්නට මත්තෙන් උන්වහන්සේ එරට චීන බෞද්ධයන්ගේ ගුරුවරයා සහ උපදේශකයා බවට පත්වූහ (ධම්මානන්ද හිමියන් අපවත්වන තෙක්ම උන්වහන්සේගේ ප්‍රධාන දායක පිරිස වූයේ මැලේසියාවේ සහ සිංගප්පූරුවේ චීන බෞද්ධයන්ය).

අගමැති තුන්කු අබ්දුල් රහමන් යටතේ 1957 අගෝස්තු 31 දා මලයාව නිදහස ලබන විට කැරලිකරුවන්ගේ බල බිඳී තිබිණ. ඔවුන්ට තව දුරටත් සිය කැරැල්ල අධිරාජ්‍ය විරෝධී අරගලයක් ලෙස හැඳින්විය නොහැකි විය. කැරැල්ල පැවති දස වසරක කාල සීමාවේදී ආරක්ෂක හමුදා කැරලි කරුවන් 6,710 ක් මරා දමා 1,287ක් අත්අඩංගුවට ගත් අතර තවත් 3,200 ක් පමණ අවි බිම දමා යටත් වූහ. සටන් වල දී මියගිය මලයානු පොලිස්, යුද හමුදා සහ පොදුරාජ්‍ය මණ්ඩල (බ්‍රිතාන්‍ය ඇතුළු) යුද භටයන් ගණන 1,864කි. සිවිල් වැසියන් 2,478ක්ද මියගිය අතර 810ක් අතුරුදහන් වූ ලෙසට වාර්තා විය. ඊළඟ වසර එනම් 1958 අවසන් වන විට මලයානු කොමියුනිස්ට් කැරලි කරුවන් සියලු දෙනාම නිරර්ථක 'විමුක්ති අරගලයකින්' පසු දකුණු තායිලන්තයට පසුබැස ගොස් සිටියහ. කැරැල්ල පටන් ගෙන දොළොස් වසරකට පසු 1960 ජූලි 31 වැනිදා නිදහස් මැලේසියාවේ හදිසි අවස්ථා නීති නිල වශයෙන් ඉවත් කරන ලදී.

එහෙත් කැරලි කරුවෝ එම පරාජයෙන් පාඩමක් ඉගෙන නොගත්හ. පසු කලෙක ලංකාවේ ජනතා විමුක්ති පෙරමුණ කළාක් මෙන් මේ කැරලි කරුවෝ දෙවන වරටත් චිං පෙං ගේ ගේ නායකත්වය යටතේ 1968 දී සන්නද්ධ අරගලයක් පටන් ගත්හ. නවසිය හැටේ දශකය අවසන් වූ දෙවසරේ සිට අසුව දශකයේ අවසානය තෙක්ම ඔවුහු මැලේසියාවේ සහ සිංගප්පූරුවේ බෝම්බ පිපිරවීම්, වෙඩි තැබීම් ගිනි තැබීම් සහ ඝාතන රැසක්ම සිදු කළහ. එහෙත් එයද සාර්ථක ලෙස මැඩලන ලදුව 1989 දෙසැම්බර් 2 දා තායිලන්තයේ දී අත්සන් කළ ගිවිසුමක කොන්දේසි වලට එකඟව කැරලි කරුවන්ට පරාජය පිළිගන්නට සිදුවිය. මැලේසියාවට සහ සිංගප්පූරුවට දෙපැත්තකින් භීෂණය ළඟා කරවීමට තුඩුදුන් 'ජාතික විමුක්ති' ත්‍රස්තවාදය වසර හතළිස් එකකට පසු සහමුලින්ම අතුගා දැමුනේ එදාය.

චිං පෙං ට ජීවිත හානියක් නොවූ නමුත් ඔහුට නැවතත් මැලේසියාවට එන්නට නොහැකි විය. වසර 88ක දිවි ගමනකින් පසු චිං පෙං තායිලන්තයේ දී 2013 සැප්තැම්බර 16 දා මියගියේය. (ඒ අතින් ඔහු ඊට 24 වසරකට පෙර මැරුම් කෑ රෝහණ විජේවීරට වඩා වාසනාවන්ත විය).

ධම්මානන්ද හිමියන් විසින් කරන ලද මහඟු සමාජ සේවයට සැලකීමක් වශයෙන් මැලේසියානු රජය වසර 1991 ජූනි මසදී එරට උසස් ගෞරව සම්මානයක් වන JSM සම්මානයෙන් උන්වහන්සේ පුදනු ලැබීය. මෙය වැදගත් වන්නේ මැලේසියාවේ වැඩි දෙනෙක් ඉස්ලාම් භක්තිකයන් වන හෙයිනි. ඊට පෙරාතුව 1965 දී ශ්‍රී ලංකාවේ සියම් මහා නිකායේ මල්වතු පාර්ශ්වය මගින් උන්වහන්සේ මැලේසියාවේ ප්‍රධාන සංඝ නායක පදවියට පත්කරන ලදී. වසර පනහකට වැඩි කලක් තිස්සේ මැලේසියාවේ සහ සිංගප්පූරුවේ බුදු දහම ප්‍රචලිත වීමේ නිරත වී බෞද්ධ පොත්පත් රැසක් ඉංගිරීසියෙන් ලියා පළ කිරීම නිසා උන්වහන්සේ ජාත්‍යන්තර කීර්තියට පත්වූහ. ධම්මානන්ද හිමියන් අසූහත් වසරක් ආයු වලඳා 2006 අගෝස්තු 31 දා මැලේසියාවේදී මිය යන විට සහ සිංගප්පූරුව යන දෙරටේම සංඝරාජ පදවිය දරමින් සිටියහ.

මැලේසියානු බෞද්ධයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ උන්වහන්සේ අපවත් වූ දිනය ඔවුන්ට තවත් ලෙසකින් වැදගත් වන්නේ එදින එරටේ ජාතික දිනයද (අගෝස්තු 31) වීම නිසාය. වසර 1919 මාර්තු 18 වැනි දා උපන් ධම්මානන්ද හිමියන්ගේ ජන්ම ශත සංවත්සරය පසු ගිය වසරේ මාර්තුවේදී උත්සවාකාරයෙන් මැලේසියාවේ සමරන ලදී.

මන්ත්‍රී කෙනෙක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට අවේ
හාල් මිටියයි සුරුට්ටු 500 අරගෙන

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක

සර් ජෝන් කොතලාවල

ඩී. ඒ. රාජපක්ෂ

ඩී. ඇම්. රාජපක්ෂ

● නන්දසේන සූරියආරච්චි

අද සහ එදා පැවති පාර්ලිමේන්තුවල යුග දෙක අතර සිදුවූ සිද්ධීන්වල අපූරු වෙනස්කම් රාශියක් විය. එදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රැස්වීම් සඳහා පැමිණීමට අගනුවර ප්‍රදේශයේ ස්ථිර නිවාස නොතිබුණි. ගාලු මුවදොර පිහිටි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේම එක් කුටියක ඇඳන් දමා සමහර මන්ත්‍රීවරුන්ට විවේක ගැනීමට අවස්ථාව ලැබුණි. මෑතක් වනතුරුම කොළඹ පිහිටි මන්ත්‍රී නිල නිවාසය ලෙස පැවති ශ්‍රාවස්තිය ආරම්භ වූයේ පළමු පාර්ලිමේන්තු වාරයෙන් පසුවය. රාජ්‍ය මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලේම ඇඳන් දමා සකස්කර තිබූ කුටිය මන්ත්‍රීවරුන්ට - ඇඳුම් ඇඳීමට වෙන්කර තිබූ තැන පිහිටා තිබුණි.

එදා මන්ත්‍රීවරු රටේ සිටි ඉහළම කොටස නියෝජනය කළ පිරිසක් වූයෙන් බොහෝ දෙනකුට නවාතැන් අවශ්‍ය නොවීය. බොහෝ දෙනෙකුට කොළඹ හෝ ඒ අවට ප්‍රදේශවල නිවාස ඉඩකඩම් තිබුණි. මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලේ නවාතැන් ගත් මන්ත්‍රීවරු ගණන පහක් හෝ හයක් පමණි. දිනක් මේ සභා ගර්භය පිහිටි තැන නවාතැන් ගැනීමට රුපියල් දෙකක් පමණ ගෙවීමට මන්ත්‍රීවරුන්ට සිදුවිය.

දිනපතාම මෙහි නතරව සිටි මඩකලපුව සිට පැමිණි ධර්මරත්නම් නම් ද්‍රවිඩ මන්ත්‍රීවරයකු විය. මේ මන්ත්‍රීවරයා කලක් තිස්සේ මඩකලපුව ආසනය නියෝජනය කළත් එක් දිනක් හෝ පාර්ලිමේන්තුවේ කතා කර නැත. කිසිම වාද විවාදයකට ද සහභාගි නොවීය. මේ මන්ත්‍රී වරයා කළ එකම කථාව 'ඔව්' හෝ 'නෑ' කීම පමණි.

මන්ත්‍රණ සභා රැස්වීම පටන්ගන්නා විට ඔහු මඩකලපුවේ සිට එන්නේ ටික දිනකට සෑහෙන්න හාල් මිටියක් හා සුරුට්ටු 500 ක තොගයක් රැගෙනය. එදා යුද්ධ කාලය වූ නිසා කොළඹ ප්‍රදේශයට මෙන් ම මන්ත්‍රණ සභාවට ද සහල්වල ප්‍රශ්නයක් විය. සහල් ප්‍රවාහනය ද තහනම් වී තිබිණ. මන්ත්‍රීවරයකු සහල් ටිකක් ගෙන ආ විට කිසිවකු ඒ ගැන සොයා නොබලන නිසා තමා නවාතැන්ගෙන සිටින කාලයට සෑහෙන්න සහල් ගෙන එයි. මන්ත්‍රණ සභා කැන්ටීමේ සේවය කළ චාලි අයියාට සහල් ටික දී වෙනම බතක් උයවාගන කෑම මේ මන්ත්‍රීවරයාගේ සිරිතයි.

මන්ත්‍රී සභා ගොඩනැගිල්ලේම නවාතැන ගෙන සිටි මන්ත්‍රීවරයකු වූයේ, ඩී.එම්. රාජපක්ෂ මහතා ය. ඩී.එම්. රාජපක්ෂ මහතා අසනීප වී රෝහලට ඇතුළත් කළේ ද මේ නවාතැනේ සිටියදී ය. ඩී.එම්. රාජපක්ෂ මහතාගෙන් පසුව හම්බන්තොට මන්ත්‍රීවරයා ලෙස පත්ව ආයේ ඩී.ඒ. රාජපක්ෂ මහතා ය. මන්ත්‍රණ සභාවේ එදා සිටි ඉහළම නිලධාරීන් වූයේ, මහලේකම්, මුදල් ලේකම් හා නීති ලේකම් ය. කලක් එතෙර ගොස් සිටි නීති ලේකම් ආපසු පැමිණි දින සියලුම මන්ත්‍රීවරු හමුවී අතට අත දී සුබ පැතුවේ ය. ඩී.එම්. රාජපක්ෂ මහතා වෙනුවට පැමිණි ඩී.ඒ. රාජපක්ෂ මහතාට ද අතට අත දී සුබ පැතීය. සුද්දා තමා හොඳින් හඳුනන ලෙස කළ මේ පිළිගැනීම වැරදීමක් බව ඩී.ඒ. රාජපක්ෂට දැනිණ.

"උඹ හිතා ඉන්නේ මාව කවුරු කියලද" රාජපක්ෂ සුද්දාගෙන් ඇසුවේය.

"මම අඳුරන්නෙ නැද්ද ඩී.එම්. රාජපක්ෂ" සුද්දා සිනා සෙමින් පැවැසීය.

"උඹට වැරදිලා. ඩී.එම්. මැරිලා, මම ඩී.ඒ. රාජපක්ෂ."

සුද්දා තමාට වූ වැරදීම ගැන සමාව ඉල්ලීය.

එදා අද මෙන් කැබිනට් රැස්වීම් පැවැත්වීම සඳහා වෙන්වූ ස්ථානයක් නොවීය. කැබිනට් රැස්වීම් තිබුණේ මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ ය. කැබිනට් ඇමැතිවරු උඩ තට්ටුවට ගිය විට වරුවකටත් වැඩි කාලයක් ගතවෙයි. මේ කාලයේ ඇමැති රියදුරන්ට ද එක්වී විනෝදවීම සඳහා හොඳ වෙලාවක් වෙන්වීය. කෙළින් ම මේ අය පිටකොටුවේ මල්වත්ත පාරේ රා කඩයට ගොස් හොඳට පදව් වී පැමිණෙති. මේ අය පාර්ලිමේන්තු ගැලරියට ඇතුළුවන තැන තිබූ දොර වසාගෙන යන්නේ කිසිවෙකුටත් නොපෙනෙන්නට බූරුවා ගසන්නටය.

මේ කාලයේ මන්ත්‍රණ සභාවේ සිටි එක් නිලධාරියෙක් රියදුරන් සමඟ නිරන්තරයෙන් ම වෛර බැඳගෙන තිබුණි. මේ නිලධාරියා තමාට ඉහළින් සිටින ඇමැති රියදුරන් සමඟ කේන්තියෙන් සිටියේ ය. එදා ඇමැති රියදුරුකුට මන්ත්‍රණ සභාවේ ඉහළ නිලධාරියකුට වඩා ඇතැම් විට ලොකු හයියක් විය.

ගැලරියට ඇතුළුවන තැන දොර වසා හොඳට රා බී පදම් වූ රියදුරන් බූරුවා ගසන බව දුටු මේ නිලධාරියා මෙම නීති විරෝධී ක්‍රියාව ගැන පොලීසියට දැනුම් දුන්නේ ය. මන්ත්‍රණ සභාවෙන් ලැබුණ පණිවිඩය අනුව පොලිස් බළකායක් පැමිණ බූරුවා ගසමින් මන්ත්‍රණ සභාව තුළ සිටි මේ පිරිස අල්ලා ගෙන ගියහ.

කැබිනට් රැස්වීම අවසන් වී ඇමැතිවරු ගෙවල් බලා යාමට සැරසුණත් කිසිම ඇමැතිවරයකුට යාමට නොහැකි විය.

ඇමැතිවරු සියලු දෙනාගේම රියදුරන් පොලිස් අත්අඩංගුවට ගෙන ඇති බව දැනගන්ට ලැබිණ. එදා ස්වදේශ කටයුතු භාරව සිටියේ, ඒ, මහදේව ඇමැතිවරයා ය. පොලිසිය භාර මේ ඇමැතිවරයා ළඟ අනෙක් ඇමැතිවරු රොක් වී සිටියහ.

"ඇමැතිතුමා අපි කාටවත් ගෙදර යන්න විධියක් නැනේ. පොලීසියට කියා අපේ ඩ්‍රයිවර්ල ගෙන්වා දෙන්න" යයි. මහදේව ඇමැතිතුමාට ඇමැතිවරු කීහ. මහා දේව පොලිස්පතිට ටෙලිෆෝන් කළේ ය.

"මොකද මේ පොලිසිය කරල තියෙන්නෙ.

අපිට ගෙවල්වලට යන්න විදියක් නෑ. ඔක්කොම ඇමැති ඩ්‍රයිවර්ල පොලිසියට අරන් ගිහින්. ඉක්මනට ආපසු එවන්න යයි මහාදේව පොලිස්පතිට කීය. මොහොතක් ගතවිය. රා බී වෙරි මතින් සිටි රියදුරන් මන්ත්‍රණ සභා ගොඩනැගිල්ල ඉදිරියට ගෙනැත් දැමීය.

බණ්ඩාරනායක මහතා සහ කොතලාවල මහතා අතර නිතර නිතර මත ගැටුම් විය. කොතලාවල හා බණ්ඩාරනායක මහතුන්ගේ රියදුරන් ද මේ බව දනිති. අර දෙන්නා අතර මත ගැටුම් ඇතිවීමට හේතුවක් තිබුණ ද මේ දෙන්නා අතර තිබුණේ එක්තරා අන්දමක වෛරයකි.

"අපේ සර් එක්ක මූ තරහයි"

"මූට - හොඳ පාඩමක් උගන්වනවා"

රියදුරන් දෙදෙනාම නිතර උනුන් දෙස බැලුවේ එබඳු අදහස් සිතේ තබා ගෙන ය. එක් දිනක් රියදුරන් දෙදෙනා ගෝරියකට පැටළුණි. කොතලාවල මහතාගේ රියදුරා ගෙන් පහරක් කෑමට බණ්ඩාරනායක මහතාගේ රියදුරාට නොහැකි විය. හොඳ කනේ පාරක් කෑ බණ්ඩාරනායක මහතාගේ රියදුරා වහාම තම ස්වාමියාට තමන් මුහුණදුන් සිද්ධිය හඬමින් කියන්නට විය.

බණ්ඩාරනායක මහතාට හොඳට කේන්ති ගොස් තිබිණ. මගේ ඩ්‍රයිවර්ට කොතලාවලගෙ ඩ්‍රයිවර් ගහලා කියමින් කෑ ගැසූ බණ්ඩාරනායක මහතා මේ බව කථානායක තුමාට ද පැමිණිලි කළේ ය. රියදුරන් දෙදෙනාම තමා ළඟට කැඳවූ කථානායක තුමා මින් ඉදිරියට රණ්ඩු නොවන ලෙස අවවාද කළේ ය.

එදා මන්ත්‍රණ සභාවට පත් කළ මන්ත්‍රීවරු පස් දෙනෙක් විය. මේ පත් කළ මන්ත්‍රීවරු අතර අගලවත්තෙන් පැමිණි වතු අයිති සුදු ජාතික මන්ත්‍රීවරයකු ද විය. මේ මන්ත්‍රීවරයා විනෝදකාමී අයෙකි. යුද්ධ කාලය වූ ඒ අවධිය නිසා යුද්ධ හමුදාවේ සභායට සිටි සුදු ජාතික හමුදා කාන්තා පිරිසක් ද වූහ. මේ මන්ත්‍රීවරයා හමුදා කාන්තා නිලධාරීන් විසි පහක්, තිහක් වටකර ගෙන හැමදාම මන්ත්‍රණ සභාවට පැමිණියේ පාර්ලිමේන්තු කටයුතුවලට සම්බන්ධ වනවාට වඩා මොහුගේ කැමැත්ත වූයේ, ගැලරියේ රඳවාගන සිටි අර කාන්තාවනට කේක් තේ දෙමින් ඔවුන් සමඟ විනෝදයෙන් ගත කිරීමට ය.

එදා අවිස්සාවේල්ල මන්ත්‍රීවරයා වූයේ පසු කාලයේ හෝමාගම මන්ත්‍රී ධුරය ඉසිලූ ගාමණී ජයසූරිය ඇමතිවරයාගේ පියා ය. ඔහුගේ නම බර්නාඩ් ජයසූරියය. බර්නාඩ් ජයසූරිය මහතා ද, කොතලාවල හා බණ්ඩාරනායක මෙන් ඉක්මනින් කේන්ති යන සහ කේන්ති නිවී යන පුද්ගලයෙකි. ජයසූරිය මහතා මන්ත්‍රණ සභා රැස්වීම් පැවැත්වෙන දිනවල නැවතී සිටින්නේ ගාලු මුව දොර හෝටලයේ ය. එතැන සිට රික්ෂෝවක නැගී මන්ත්‍රණ සභාවට ඒම ජයසූරිය මහතාගේ සිරිතය.

එදා සිටි රික්ෂෝ කාරයන් ද අමුතුම මිනිස් කොටසකි. රුපියලක ගමනකට රුපියල් දෙකක් දුන්නත්, පහක් දුන්නත් මදි - මදි කීම සිරිතය. කියක් දුන්නත් මදි - මදි කියා ගැනීම ඔවුන් පුරුදු වූ කථාවකි.

ජයසූරිය මහතා එක් දිනක් ගාලු මුවදොර හෝටලයේ සිට මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලට ආයේ, බේරේ වැව පැත්තේ දොරටුවෙනි. රික්ෂෝව මැති සබය ඉදිරියේ නතර විය. රික්ෂෝ කරු මදි - මදි කියන හැටි මන්ත්‍රණ සභා සියලු දෙනාටම දැකගත හැකි විය. ජයසූරිය මහතාට හොඳට ම කේන්ති මොනවාදෝ හයියෙන් කෑ ගසා කියූ රික්ෂෝ කරුට පයින් පහරක් දුන්නේ ය.

"ෂාමි... ෂාමි... ගහන්න එපා" කියා රික්ෂෝ කරු පැන දිවීය. ඈතට වී සැඟවී සිටි ඔහු නැවත රික්ෂෝව ගෙන යාමට ආවේ ජයසූරිය මහතා මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලට ඇතුළුවී විනාඩි කිහිපයකට පසුවය.

එදා මන්ත්‍රණ සභාවට පැමිණ සිටි මන්ත්‍රීවරුනට වැටුපක් ලෙස ලැබුණේ රුපියල් පන්සීයක් පමණි. රියදුරන් වෙනුවෙන් හෝ ලිපිකරුවන් වෙනුවෙන් හෝ කාර්ය මණ්ඩලයක් වෙනුවෙන් ද දීමනා නොවීය. ලැබී තිබුණු එකම පහසුකම වූයේ නිල මුද්‍රාව තැබූ ලියුම් තැපැල් කිරීමේ බලයයි. සමහර මන්ත්‍රීන්ට දුරකථන පහසුකම් ද නොවීය. විශේෂයෙන් ඈත දුර බැහැර මන්ත්‍රීවරුන්ට වැඩි වියදම් දරන දුරකථන පහසුකම් දීමට ද රජය උනන්දු නොවීය.

මාසිකව ලැබෙන මේ රුපියල් පන්සියයෙන් කළ යුතු වැඩ රාශියකි. කොළඹ නතර වී සිටීමට වඩා ගම් පළාත් ජනතාවගේ වුවමනා පිරිමැසීමට මේ වැටුප ප්‍රමාණ නොවී ගමක කොටහලු මඟුලකට ද දුවගෙන එන්නෙ මන්ත්‍රීතුමා ළඟට ය. මළ ගෙදරක් වූ විට ඇතැම් විටෙක මිනී පෙට්ටිය රැගෙන දීමට වන්නේ ද මන්ත්‍රීතුමාට ය. මේ නිසා සමහර මන්ත්‍රීවරු අපහසු ජීවිත ගත කළහ.

එක් දින ඩී.ඒ. රාජපක්ෂ මහතා සිය මන්ත්‍රීවරු සමඟ මෙසේ කියා තිබුණි.

"ඊයේ මම කොළඹ ආවෙ, ගෙදර තිබුණු අන්තිම වී කුරුණි හයත් ගෙදරට ආපු කෙනකුට දීල."

අසල් වැසි ගැමියකුගේ මඟුල් වී ටිකක් ඉල්ලා ගන්න ඔහු මන්ත්‍රීතුමා හමුවී ඇත. එදා මේ තත්ත්වය කොතෙක් කැපී පෙනුණු සිද්ධියක් ද යත්, ඇතැම් මන්ත්‍රීවරු හමුවීමට වැටුප් ගන්නා දිනයේ ණයකාරයෝ මන්ත්‍රණ සභා ගොඩනැගිල්ල අවට රැස් වෙති. රුපියල් පන්සීය ලැබෙන්නේ ද නියමිත දින ගණන මන්ත්‍රණ සභා රැස්වීමට පැමිණියහොත් පමණි.

නොපැමිණෙන එක් දිනකදී අර රුපියල් පන්සියයෙන් රුපියල් පණහක් අඩු කරයි. එසේ නොකරන්නට නම් පාර්ලිමේන්තු ලේකම්වරයාට තමා නොපැමිණියේ අසනීපවූ නිසා යයි දැනුම් දිය යුතු විය. මෙයට ද මන්ත්‍රීවරු උපක්‍රමයක් යොදාගන තිබුණි. රුපියලක් දෙකක් ගෙවූ පසුව හොර වෛද්‍ය සහතික ලබාදීමට ඇප කැපව සිටි වෛද්‍යවරු පිරිසක් ද පාර්ලිමේන්තු අසල කාර්යාල පවත්වාගන යමින් තිබිණි. ඇතැම් මන්ත්‍රීවරු හෙට්ටිත්ගෙන් ණය ගැනීම පුරුද්දක් කොට ගනී. මෙසේ හෙට්ටීන්ට ණය ගෙවීමට බැරි වූ විට නඩු මග බසිති. අවස්ථා කීපයකදී මන්ත්‍රීවරු කීප දෙනකුගේ වැටුප් උසාවියට යැවීමට ද නියම කෙරිණි.

දිවි රැක ගන්න බඩඉරිඟු සමඟ
මහමග ගෙවෙන ජීවිත

දනුෂ්ක දිල්ශාන්

ඒ. කේ. දමයන්ති

පී. සිරිල්

ආශා උපමාලී

● තඹුත්තේගම විශේෂ - ඩබ්ලිව්. ප්‍රදීප්

මිනිස්සු ජීවත් වීමට නොකරන දෙයක් නැත. කිසිවෙකුටත් අතනොපා පුළුවන් විදිහට කුලියක්මලියක් කර ජීවිත ගැට ගහ ගන්න මිනිසුන් අතර ගහක වැලක හැදෙන ගොඩියක් කරලක් එළොළුවක් විකුණා දිවි රඑක ගන්නෝද වෙති. දුර බැහැර ගම් වල පමණක් නොව දැන් ඕනෑම ප්‍රධාන පාරක් අසල වුවද අපට රටේ කොයි ඉසව්වෙනුත් මෙවන් අය දැකිය හැකිය. ඒ බඩඉරිඟු වෙළෙන්දන්ය. ළපටි බඩඉරිඟු තම්බා, පුලුස්සා වෙළෙදාමේ නියැළෙන්නෝ බොහෝය.

ඒ.කේ. දමයන්ති අපට හමු වුයේ අනුරාධපුර, තලාව, මොරගොඩ ආසන්නයේ පාර අයිනේ බඩඉරිඟු වෙළෙදාමේ නියැලෙමින් සිටියදීයදීය.

"මට ළමයි තුන්දෙනෙක් ඉන්නවා. මහත්තයාටත් හරිහමන් රස්සාවක් නෑ. මේකෙන් තමයි දරුවෝ ජීවත් කරවන්නේ. සමහර දවස් වලට හොඳ වෙළෙදාමක් තියෙනවා. සමහර දවස් වලට තම්බන කරල් ටිකත් අහක දාන්ඩ වෙන වෙනවා. වන්දනා කාලයට නම් අතට ගානක් හොයා ගන්න පුළුවන්. පහුගිය කාලෙ නම් අපි හරිම අමාරුවක තමයි වැටුණේ. ඒත් වෙන ජීවත් වෙන්න ක්‍රමයක් නැති නිසා මේ රස්සාව කරනවා."

කලක් හොඳ අළෙවියක් තිබූ බඩඉරිඟු වෙළෙදාමට කණකොකා ඇඳුවේ ඉකුත් සමයේ ඇති වූ සේනා දළඹුවා බෝවීමත් සමඟය. හානියට ලක්වූ බඩඉරිඟු ආහාරයට ගැනීම සෞඛ්‍යාරක්ෂිත නොවන බවට කතා සමාජ ගතවීමත් සමඟ මහ මඟ බඩඉරිඟු කෑම බොහෝ දෙනෙකු අතහැරියේය. එය බඩඉරිඟු වෙළෙඳුන් කබලෙන් ළිපට ඇද දමන්නක් විය. වසර ගණනාවක් තිස්සේ බඩඉරිඟු තම්බා දවස සරිකළ ඔවුනට විකල්ප ක්‍රම සොයන්නට සිදුවිය. බඩඉරිඟු තම්බනු වෙනුවට පුලුස්සා අළෙවි කිරීමට සමහරෙකු පෙළඹෙනුයේ ඒ අනුවය. තලාව, තඹුත්තේගම, මහ ගල්කඩවල, ශ්‍රාවස්තිපුර ආදි ප්‍රදේශවල දී මේ අලුත් වෙළෙදාමේ නියැලෙන්නන් දැකගත හැකිය

පුච්චන ලැබූ බඩඉරිඟු නොකැඩෙන කෝටුවක රඳවා මහ මඟ යන්නවුන් වෙත දික්කරන වෙළෙන්දෝ මහජනයාගේ අවධානය තමන් වෙත ගැනීමට උත්සාහ දරති. අමු බඩඉරිඟු කරලක් රුපියල් විසිපහකි. තැම්බූ විට හතළිහකි. කරලක් පුච්චන ලද බඩඉරිඟු කරලක් හතළිස් පහකි. තලාව දුම්රිය ස්ථානය ආසන්නයට වී සිය බිරිඳ ආශා උපමාලි හා එක්ව වෙළෙදාමේ නියැලෙන තිස්පස් වියැති ධනුෂ්ක සම්පත් දිවි රැක ගන්නේ පුච්චන ලද බඩඉරිඟු විකිණීමෙනි.

"දළඹු වසංගතේ තිබ්බ කාලේ මිනිස්සු තම්බපු බඩඉරිඟු කන එක සම්පූර්ණයෙන්ම අතඇරියා. හිතා ගන්න බැරි වුණා අපි මොනවා කරන්නද කියලා. මං තමයි ඉස්සෙල්ලම මෙතැන නෝනත් එක්ක එකතුවෙලා බඩඉරිඟු පුච්චන්ඩ ගත්තේ. දැන් හැමෝම කරනවා. පුදුමේ කියන්නේ තම්බපු බඩඉරිඟු කන්නැති මිනිස්සු පුච්චපු බඩ ඉරිඟු කන්න පුරුදු වෙලා.."

වියළි හා අතරමැදි කලාපවල බඩඉරිඟු වගාව යහමින් සිදුවේ. අනුරාධපුරය, අම්පාර, මොණරාගල, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කවල ප්‍රධාන වශයෙන් අක්කර දහස් ගණනක් පුරා බඩඉරිඟු වගාව ව්‍යාප්තව පවතී. එම ප්‍රමාණය දිවයිනේ සමස්ත බඩඉරිඟු වගා බිම් ප්‍රමාණයෙන් 75 % ඉක්මවයි. දැනට වාර්ෂිකව වගා කෙරෙන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 40000 ත් 50000 ත් අතර වේ. කිරි ඉරිඟු නිෂ්පාදනය සඳහා ජල සම්පාදන පහසුකම් සහිත ප්‍රදේශ වල වසරක් තුළ එකම භූමියේ තුන් වරක් පමණ බඩඉරිඟු වගා කිරීම සිදුවන බැවින් නිවැරදි වගාබිම් ප්‍රමාණය මෙයට ඉහළ අගයක් ගනියි. අනුරාධපුරයේ, ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ පමණක් හේන් ආශ්‍රිතව යල, මහ දෙකන්නයේ අක්කර දසසහසක පමණ බඩඉරිඟු වගා කිරීමට ගොවීන් උත්සුක වේ.

ත්‍රිපෝෂ හා සත්ව ආහාර සහ වෙනත් අතුරු නිෂ්පාදන සඳහා මෙරට බඩඉරිඟු අවශ්‍යතාවය වසරකට මෙට්‍රික් ටොන් ලක්ෂ තුනකට ආසන්නව පවතී. කුඹුරු සහ විශේෂයෙන් හේන් ආශ්‍රිතව කෙරෙන දේශීය වගාවන්ගෙන් මෙට්‍රික් ටොන් ලක්ෂය ඉක්මවන නිෂ්පාදනයක් ජාතික අවශ්‍යතාවය සඳහා එකතු කිරීමට මෙරට ගොවීන් සමත්ව සිටිති. එහෙත් මෙරට සමස්ත බඩඉරිඟු අවශ්‍යතාවය සපුරනු සඳහා මෙට්‍රික් ටොන් 125,000 ක් පමණ වාර්ෂිකව පිටරටින් ආනයනය කරනුයේ රට තුළදී එම අවශ්‍යතාවය සපුරාගැනීමේ හැකියාව තිබියදී වීම අභාග්‍යයකි.

ඉස්සර විකුණුවේ තම්බලා. දැන් විකුණන්නේ පුච්චලා

වසර කිහිපයකට ඉහතින් මහ කන්නයේ හේන් වගාවක් ලෙස පැවතුණු බඩඉරිඟු වගාව වර්තමානයේ වසර පුරා සිදුවන වගාවක් බවට පත්ව ඇත. එහෙයින්ම වසර පුරාම මහ මඟදී බඩඉරිඟු රස බැලීමේ ඉඩකඩ ද උදාව ඇත.

තලාව නගර මායිමේදී මුණගැසුණු ධනුෂ්ක දිල්ශාන්ත ද බඩඉරිඟු වෙළෙදාමේ යෙදෙන්නෙකි

"බඩඉරිඟු තම්බනවා තරම් පුච්චන එක ලේසි නෑ. දුමයි, ගින්දරයි එක්ක මුහුණ කලුවෙනවා. කදුළු එනවා. හැබැයි පුච්චපු බඩඉරිඟු රහයි. අපි ගෙවල්වල බඩඉරිඟු පුච්චලා කෑවට මහ පාරේ විකුණන එක කෙරුවේ නෑ. දළඹු ප්‍රශ්නේ ආවට පස්සේ තමයි මේ විදිහට පුච්චලා විකුණන්ඩ ගත්තේ. වැඩේ ටිකක් අමාරු වුණත් පාඩුවක් නෑ. රාස්පානකට වතුර දාලා පියන වහලා ළිප උඩ තියනවා. වතුර රත්වේගෙන එනකොට පියන උඩ තියලා බඩඉරිඟු පුච්චා ගන්නවා. "

වැඩි ඉල්ලුම් තියෙන්නේ පුච්චපු බඩඉරිඟු වලට

ළපටි කරල් තම්බා කෑමට ගැනීම හැරුණු විට ලාංකිකයින් වැඩි වශයෙන් බඩඉරිඟු ආහාරයට ගන්නේ, රොටී, පිට්ටු, විළඳ, කිරිබත් ආදි විවිධ ක්‍රම වලට සකසා ගැනීම මඟිනි. කැඳ, තලප, සුප් ලෙස ආහාරයට ගැනීම ද පිටරටවල බහුලව සිදුවන බවට තොරතුරු හමුවේ. සත්ත්ව හා මනුෂ්‍ය ආහාරයට අමතරව කාර්මික නිෂ්පාදන විශාල සංඛ්‍යාවකට ද බඩඉරිඟු ප්‍රයෝජනයට ගැනේ. මේ අතර මධ්‍යසාර, ඩයි හා තීන්ත නිෂ්පාදනයේදී ද භාවිත වේ. ලංකාවේ සාම්ප්‍රදායිකව බඩඉරිඟු වගා කෙරෙන බින්තැන්න ප්‍රදේශයේ අම්පාර ගම්මැදි වලත්, වෙල්ලස්සේ මොණරාගල ප්‍රදේශයේ සහ රජරට ප්‍රදේශයේ අනුරාධපුරයේ ගම්මැදි වලත් ගැමියන් බඩඉරිඟු මඟින් විවිධ සාම්ප්‍රදායික ආහාර වර්ග සකස් කොට ආහාරයට ගනි.

තලාව, වරාගොඩ ප්‍රදේශයේ දී මහ මඟ රැදෙමින් ඉරිඟු විකුණා කියක් හෝ උපයා දවස සරි කිරීමට වෙහෙසෙන හැත්තෑ නව වියැති "පී. සිරිල්" පැවසුවේ මෙවැනි කතාවකි. "අව්වේ පිච්චි පිච්චී වැස්සට තෙමී තෙමී මේ කරන්නේ යුද්ධයක්. දහදෙනෙකුට බඩඉරිඟු කරල් දික්කෙරුවහම නවත්තන්නේ එක්කෙනයි නැත්නම් දෙන්නයි. සමහර වෙලාවට එක්කෙනෙක්වත් නෑ. වෙලාවකට එපාවෙනවා. ඒත් රෑ වෙනකොට නිකංම ගෙදර යන්ඩ බෑනේ. මං දරුවන්ට කරදර කරන්ඩ කැමැති නෑ. පුලුවන් කාලයක් මේ විදිහට ජීවත් වෙනවා" ඔශු පවසන්නට වුයේ පාරේ යන වාහනයක් නතර කර ගන්නට මාන බලමිනි. බඩඉරිඟු කරලින් මහ මඟ ජීවිතය සොයන ඔවුන්ගේ ජීවිත බඩඉරිඟු තරම් රහ නැත. නොකියමනාය.

නිවසේ සුරතලාටත් ගෞරවනීය සමුදීමක්

● රජිත බස්නායක

මිනිසා හා සුනඛයා අතර ඇති සම්බන්ධතාවය අද ඊයේ ඇති වූවක් නොවේ. එය සියවස් ගණනාවක් පුරා අතීතයට දිව යන්නකි. සරලව කිවහොත් මිනිසාගේ විශ්වාසදායී ම මිතුරා වන තරමටම එය ශක්තිමත් බැඳීමක් ව පවතී. කොවිඩ් වසංගතය පැතිර ඇති අවධියේ දිවයිනම ලොක්ඩවුන් තත්ත්වයේ පැවතිය ද මාවත්වල සැරිසරන සුනඛයන්ට පවා ආහාර පාන ලබා දී ඔවුන් රැකබලා ගැනීමට තරම් කාරුණික සිත් ඇති මිනිසුන් සිටි බව කිව යුතුමය. නමුත් මේ කතාව ජීවත්ව සිටිනා තම සුරතලුන් රැකබලා ගැනීම සම්බන්ධයෙන් ලියැවෙන ලිපියක් නොවේ. ආදරයෙන් නිවසේ රැකබලාගන්නා තම සුරතලා මිය ගිය පසු ඔවුනට ගෞරවණීය අවසානයක් ලබා දීමට තරම් අවස්ථාවක් සලසා දෙන තරුණ ව්‍යවසායකයකු ආරම්භ කරනලද නව ආයතනයක් සම්බන්ධ කතාවකි.

ලංකාවේ පිහිටවූ මුල්ම සත්ත්ව අවමංගල්‍ය ආයතනය වන Boocat memorial service ජයවර්ධනපුර සරසවියේ හොඳම තරුණ ව්‍යවසායකයාට හිමි සම්මාන ලබාගත් ශිෂ්‍යයා විසින් ආරම්භ කර තිබීම ය. ඔහු නමින් කණිෂ්ක අසේල විදානගේ ය. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ ඉගෙනුම ලබන කණිෂ්ක නාරාහේන්පිට ඩඩ්ලි සේනානායක විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ අතර ද්විතික අධ්‍යාපනය ලැබුවේ කොළඹ ලුම්බිණි විද්‍යාලයෙනි. නව සංකල්පයක් යටතේ ලංකාවට ආගන්තුක වූ මෙවන් ව්‍යාපාරික ආයතනයක් පිහිටුවීම සම්බන්ධයෙන් කණිෂ්ක පවසන්නේ මෙවැන්නකි.

"මම පුංචි කාලේ ඉඳලා සුරතල් සතුන්ට ආදරෙයි. අපේ ගෙදරත් බල්ලෙක් ඉන්නවා. මට අනිත් අය කරනවා වගේ ව්‍යාපාර කරන්න කිසිම උවමනාවක් තිබ්බෙ නෑ. මට ඕන වුණේ අලුත් දෙයක් කරන්න. මේ ඉන්න අතර වාරේ හාමුදුරුනමක් සුරතල් සතෙකුට පාංශුකූලේ දෙන ඡායාරූපයක් මම අන්තර්ජාලයේ දැක්කා. එදා ඉඳලා තමයි මට මේ අදහස ඇති වුණේ"

ඒ ඔහුගේ ව්‍යාපාරයේ ආරම්භක සිතිවිල්ලයි ඇති වූ අයුරුයි. ශ්‍රී ලංකාවේ පිහිටවූ ප්‍රථම සත්ත්ව අවමංගල්‍ය ආයතනය වන මෙය දැනට සීමාවී ඇත්තේ බස්නාහිර පළාතට පමණි. පසුගිය මාර්තු මාසයේ ආරම්භ කළ මෙම සේවාවෙන් මියගිය සුනඛයින් 65 ක ගේ පමණ අවමංගල උත්සව පැවැත්වීමට කටයුතු කර තිබේ. බළලුන් හා සුනඛයින්

සුනඛ අවමංගල්‍ය ආයතන ආරම්භ කළේ ජපුර විශ්වවිද්‍යාලයේ තරුණයෙක්

සඳහා පමණක් මේ වන විට මෙම Boocat ආයතනයේ සේවාවන් සීමා වුවද එය තවදුරටත් ව්‍යාප්ත කිරීම කණිෂ්කගේ අදහසයි. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් වසරක් පාසා පවත්වනු ලබන හොඳම ව්‍යවසායකයා සඳහා සම්මානය කණිෂ්ක ලබා ගත්තා මෙන්ම හොඳම නවෝත්පාදන අංශයේ දෙවන ස්ථානය ද ලැබුණේ කණිෂ්ක ගේ Boocat memorial service ආයතනයට ය.

මෙය ආරම්භ කරනු ලබන අවධියේදී කණිෂ්ක මුලින් කටයුතු කරනු ලැබුවේ වෛද්‍යවරුන් සමගිනි. ආයතනය ආරම්භ කිරීමට පෙර වෛද්‍යවරුන් 150 කට වඩා පිරිසක් මුණ ගැසීතම අදහස පිළිබඳ සාකච්ඡා කර ඇත. කණිෂ්ක පවසන්නේ එහිදි ඔහුට යහපත් ප්‍රතිචාර ලැබිණි. සුරතල් සතුන්ගේ අවමංගල්‍ය කටයුතු සිදුකිරීමේදී මිනිසුන් විසින් සිදු කරනු ලබන අවමංගල්‍ය කටයුතු සේම ඔවුන්ගේ කටයුතු ඉටුකර දීමටද කණිෂ්ක විසින් තම ආයතනය මගින් කටයුතු සලසා තිබේ. සාමාන්‍යයන් අවමංගල්‍යකදි මෘත දේහය තැබීමට භාවිතා කරන කාපට්, දේහයන් රඳවනයන්, වියන්, සේසත් ආදී සියලුම දෑ ආයතනය සතුය. සුරතලාගේ හිමිකරුවාගේ අභිමතය පරිදි මේ සියල්ල භාවිතා කෙරේ. එමෙන්ම සුරතලාගේ හිමිකරුවාගේ කැමැත්ත මත ආදාහනය කිරීම හෝ භූමිදානය සිදුකරනු ලබයි. දේහය ආදාහනය කිරීම සඳහා ඔවුන්ගේම භූමියක් ඇති අතර අවශ්‍ය නම් සුරතලුන් ගේ දේහයන් එහි භූමිදානය කිරීමේ හැකියාවක්ද පවතී. භූමිය ඇත්තේ කළුඅග්ගලය. මෙහි තවත් විශේෂත්වයක් වන්නේ මියගිය සුරතල් සතුන් වෙනුවෙන් මරණ සහතිකයක් ද ආයතනය ඉදිරිපත් කිරීමය. හිමිකරුවන්ගේ ඉල්ලීම මත ඔවුන්ගේ පාසලකුණක් ලබාගෙන එය මැටි රඳවනයන තබා ඡායාරූපයක් මෙන් රාමු කර දීමද ආයතනයෙන් සිදු කරන තවත් සේවාවකි.

මාස හයට මියගිය සුනඛයින් 65ක ගේ අවමංගල්‍ය උත්සව පවත්වලා

කෙනෙකුට මේ තොරතුරු හාස්‍යක් වන්නට පුළුවන. නමුදු ඇතැමුන්ගේ කැමැත්ත ඇතිවද තවකෙක්ගේ අකමැත්තෙන්ද කණිෂ්ක මේ කාර්යයට අතගැසුවේ දෙගිඩියාවෙනි.

"මුලින්ම මම මේ වගේ දෙයක් කරන්න අදහස් කරනකොට මගේ යාළුවො විතරක් නෙවෙයි පවුලේ අයගෙන් පවා කැමැත්තක් තිබුනෙ නෑ. සමහරු ඇහුවා ඉගෙන ගෙන ඉවර වෙලා මේ වගේ දෙයක් පටන් ගන්න පිස්සුද කියලා. ඒත් යොහාන් කියන මගේ යාළුවෙක් මේක හොඳ දෙයක් වැඩේ පටන්ගන්න කියලා මාව උනන්දු කරා"

කණිෂ්ක අසේල

මේ ආකාරයට සියලු පහසුකම් සහිතව සුරතල් සතුන්ගේ අවමංගල්‍ය කටයුතු කිරීම සඳහා මෙවැනි ආයතනයක් ආරම්භ කර තිබුණද බහුතරයක් දෙනාට ඒ පිළිබඳ අවබෝධයක් නොමැති ආකාරය ද පෙන්නුම් කරයි. කනිෂ්ක පවසන පරිද්දෙන් තමා විසින් සියලු ආකාරයේ පහසුකම් සහිතව මෙවැනි සේවාවක් ආරම්භ කර තිබුණද හිමිකරුවන් විසින් තමා ඇති දැඩි කරන සුරතල් සතුන්ට ගෞරවනීය අවසානයක් ලබා දිය යුතුයි කියන ආකල්පය ඇත්තේ කිහිප දෙනකු මත බව පමණක් පවසයි. මේ ආකාරයට ලෝකයේ බොහෝ රටවල මෙවන් ආයතනය තිබුණද මෙවන්නක් ලංකාවේ ආරම්භ කරන ලද මුල්ම අවස්ථාව මෙයයි. මෙම මොහොතේ කණිෂ්ක ගේ ව්‍යාපාරය ව්‍යාප්ත ව පවතින්නේ බස්නාහිර පළාත තුළ පමණි. ඉඩකඩ සීමිත නාගරීකරණය වැඩි වශයෙන් සිදු වූ පළාත් වලට මෙය ඉතා පහසු දායක කටයුත්තකි. තමාගේ ව්‍යාපාරය පවත්වාගෙන යන අතරතුරදීම ඔහුගේ තවත් එක් බලාපොරොත්තුවක් පවතී . එනම් Boocat charity නමින් සුරතල් සතුන්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් අරමුදලක් පිහිටුවීමයි. මෙම අරමුදල මගින් සුරතල් සතුන් සම්බන්ධයෙන් මිනිසුන් තුළ ඇති යහපත් ආකල්ප වැඩි දියුණු කිරීමටත් මිනිසාට මෙන්ම අනෙකුත් සතුන්ට ද ඔවුනට හිමි නිසි තැන ලබා දීමට කටයුතු කිරීමට අදහස් කරමින් සිටී. එමෙන්ම මේ ඔස්සේ සුරතල් සතුන් වෙනුවෙන් වෙන් වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම සුසාන භූමිය ඉදිකිරීමත් කණිෂ්කගේ බලාපොරොත්තුවයි.

කැමති නම් ආදාහනය කරන්නත් පුළුවන්

කුස්සියේ හිතවතිය මෙන්ම රසවතිය ද ඇයයි. ඈ අප පිනවන බැවින් අපට නැතිවාම බැරිය. එහෙත් අනවශ්‍ය තරමින් ඇය ළංකර ගැන්ම නම් අප ජීවිතයට මරු කැඳවන්නකි.

ඇතිවත් බැරි නැතිවත් බැරි කුස්සියේ මනමාලි

'ඈ' අන් කිසිවකු නොව; කුස්සිය මුල්ලේ පොල්කටුවක හිඳ; අපේ දිව පිනවන්නට තම ජීවිතය කෙමෙන් දිය කර හරින 'ලුණු' ය.

හරි පදමට හොඳි මාළු පිනිවලට ලුණු දමා ගැන්මට නොදත් ගැහැනිය පෙර සමාජයේ නම් සැලකුයේ 'කිසි වැද ගැම්මකට නැති' ගැහැනියක ලෙසිනි.

විවාහයක දී 'බිරියක්' සොයන විට අද මෙන් ඇගේ අධ්‍යාපන සුදුසුකම්, යාන වාහන, රැකියාව බැලුවේ නැත. මේ සියල්ලට වඩා අගය කෙරුණේ ලුණු ඇඟුල් පදමට දමා රසවත්ව ආහාර පිළියෙල කර ගැන්මට ඇයට ඇති හැකියාවය.

හරි හැටි පදමට ලුණු දමා බතක්, මාළුවක් පිස ගැන්මට තම බිරින්දෑ අපොහොසත් වීම ඇතැමුන්ට තම දීගය හමාර කරන්නට තරම් එකළ බරපතළ කාරණාවක් වූ අවස්ථාවත් තිබිණි.

අනෙක් අතට හොඳි මාළු පිනි ඉඳුල් වන බැවින් 'ලුණු' නොබැලුවද; හොඳ රසට පන්සලේ හීල් දානයට බත් මාළු පිසින තම බිරින්දෑ අතින් හදිසි අතපසුවීමකින් හෝ මාළු පින්නකට ලුණු මදවීම; ස්වාමි පුරුෂයන් නොසන්සුන් කරන සිද්ධියක් විය.

අතීතයේදී ලුණු ඉතා වටිනා ලෙස සැලකූ අතර අද මෙන් ලුණු සුලභ නොවිණි. රෝම අධිරාජ්‍ය සමයේ රෝම සොල්දාදුවන්ට වැටුප් ගෙවූයේ මුදලින් නොව, ලුණු වලිනි. තුර්කි ජාතිකයින් අතර යම් කිසි දෙයක් 'වටිනා කියන' දෙයක් බැව් හඟවන්නට SALTY (ලුණුමය) යන වචනය භාවිතා කරනු දක්නට හැකිය.

ලුණු පිළිබඳව බොහෝ දෙනෙකු දැන සිටින්නේ එය ආහාර රසගන්වන රසකාරයක් ලෙසින් වුවත්, ඉතිහාසය පිළිබඳව විමසිලිමත් වූවහොත්; ලුණු පුරාවෘත, ආගම, මෙන්ම යුද්ධය දක්වා බලපෑම් කළ අවස්ථාවන් තිබේ. ලුණු මස් හා වෙනත් ආහාරකල් තබා ගැන්මට විශේෂ මෙහෙවරක් ඉටු කර තිබිණ.

දහනව වැනි සියවසේ දී 'පිරිපහදු කිරීම' යන සංකල්පය කෙරෙහි ඇති වූ උනන්දුව ලුණුවල කීර්තියට සෘජුවම බලපෑ කාරණයක් විය. එමෙන්ම; අතින් සාදන ලුණුවලට වඩා; වැඩි අගයකින් යුතුව සැලකුයේ යන්ත්‍රයෙන් සකසනු ලැබූ ලුණුවලටය.

මෙතෙක් ඔබ දැක තිබුණේ කුස්සිය මුල්ලේ 'ලුණු පොල්කටටෙහි' වූ ලුණු කැට පමණක් වුවද ලුණු වර්ග කිහිපයෙකි.

මුහුදු ලුණු, Rock salt හෙවත් කඳුකරයෙන් ලබා ගන්නා ලුණු, කෑම රසගන්වන දුම් ලුණු, ජපානයෙහි ෂියෝ ලුණු, හිමාලයානු රෝස ලුණු ආදි ලෙසින් ලුණු වර්ග කිහිපයකි.

ආයුර්වේදයට අනුව ලුණු යනු පස් වර්ගයකි. සෛන්ධව හෙවත් සහිඳ ලුණු, සූවස ලුණු (Black salt) බළල් ලුණු, උත්තාරිකා (උද්හිද) ලුණු සහ මුහුදු ලුණු වශයෙනි.

මේ අතරින් සහිඳ ලුණු 'කෑම රුචිය' ඇති කරවන අතර බඩගින්න වඩවයි.

සූවස ලුණු දිරවීමට පහසු වූවත් උෂ්ණාධික ගුණයෙන් යුතුය. එමෙන්ම සුවඳක් ඇති බැවින් කුසගින්න වඩවයි.

මොනතරම් හොද්දට ලුණු දැම්මත් "අපෝ ..... මෙලෝ රහක් නැහැ. හොද්දට ලුණු පෙන්නලවත් නැහැ." ඇතැමුන් ආඩපාළි කියනු ඔබත් අසා තිබෙන්නට පුළුවන. නමුදු අධික ලෙස, පමණට වඩා 'ලුණු' කෑම ශරීර සෞඛ්‍යයට කිසිසේත්ම හිතකර නොවන බැව් වෛද්‍ය මතය වේ. ඔවුන් පෙන්වා දෙන්නේ ලුණු වැඩියෙන් කෑමට පුරුදු වී සිටින අයෙක් නම් එය ඔහුගේ හෝ ඇගේ රුධිර පීඩනය වැඩිවීමට හේතු වන්න බවය.

එපමණක් නොව, අධික ලෙස ලුණු ආහාරයට ගැනීම විශේෂයෙන් හදවත් රෝග; හදවතේ ක්‍රියාකාරීත්වය දුර්වල වීම, වකුගඩු රෝග, සිරුරෙහි ජලය තැන්පත් වීම, ඩිමෙන්ෂියා, වැනි තත්වයන්ට පවා හේතුවෙයි.

"කොච්චර වතුර බිවුවත් තිබහ යන්නෙ නැහැනේ" ඇතැම්හු පවසති. මෙවැනි අධික පිපාසය, (BLOATING) ඉදිමුව, තාවකාලිකව රුධිර පීඩනය වැඩිවීම, අධික ලෙස ලුණු ආහාරයට ගැනීමේ කෙටිකාලීන බලපෑම් වන අතර ඇතැම් බරපතළ අවස්ථාවන් ලෙස 'HYPERNATREMIA' ඇතිවිය හැකිය. මෙම තත්වයට ප්‍රතිකාර නොගැනීමෙන් මරණයට පවා පත්වීමට ඉඩ ඇත.

අප දන්නා මේස ලුණු වර්ග දෙකකි. එනම් අයඩීන් අඩංගු කරන ලද සහ අයඩීන් අඩංගු නොකළ යනුවෙනි.

අප ආහාරයට ගන්නා බොහෝ මේස ලුණුවලට පවා තෙරොයිඩ් ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යාවශ්‍ය පෝෂකයක් වන අයඩීන් අඩංගුය.

දිනකට වැඩිහිටියෙකුගේ ශරීරයට අවශ්‍ය ලුණු ප්‍රමාණය ග්‍රෑම් හතරේ සිට ග්‍රෑම් හය දක්වා වෙයි. ශරීරයට ජලය රඳවා ගැන්මට මෙන්ම මාංශපේශී හා ස්නායු ක්‍රියාකාරීත්වයට ලුණු අවශ්‍යය. අයඩීන් එකතු කිරීම සඳහා මේස ලුණුවලට පොටෑසියම් අයඩයිඩ් ද භාවිතා කරයි. එහෙත් ඒ සැකසූ ඒවා බැවින්, මෙම ලුණු වර්ග තවදුරටත් නිර්දේශ කරනුයේ නැත.

'ලුණු' මෙසේ ශරීරයට විවිධ කාර්යයන් ඉටුකරද්දී, 'ලුණු' පිළිබඳව පොතපත ලියන්නට පෙළඹුනවුන් පවා සිටිති.

'ආහාර' පිළිබඳ ලේඛනයෙහි නියුතුවූවෙකු මෙන්ම; ලුණු අලෙවිසැලක හිමිකරුවකු වන Mark Bitterman සැකසූ ලුණු භාවිතය ගැන අපූර්වත්වයෙන් යුතුව තම කෘතියෙහි සඳහන් කොට ඇත.

"විවෘත හදවත් සැත්කමක් ගැන ඔබ සිතන්නේ මොන ආකාරයෙන්ද? ඒ ආකාරයටම කාර්මික ලුණු ගැනත් සිතන්න. එය මත ඔබේ ජීවිතය රඳා පවතින විටදී පමණක්; එය භාවිතයට ගන්න."

අපේ ආහාරයට බොහෝවිට සෝඩියම් එකතු වන්නේ පිසීමේදී ආහාරය රසගන්වන්නට එකතු කරනු ලබන 'ලුණු' වශයෙනි.

ඇමරිකානුවන් ලුණු කන්නට ඉතා හපනුන්ය. බොහෝ ඇමරිකානුවන් ආහාරය සඳහා අනුමත කර ඇති ලුණු ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ආහාරයට එකතු කර ගනිති. ඔනෑවට වඩා ලුණු ආහාරයට ගැන්මෙන් ඇතිවිය හැකි අවදානම් සහගත තත්වයන් පිළිබඳව ඔවුන් නොසිතුවා වන්නට ඇත.

ඒ කියන්නේ ලුණු කෑම සම්පූර්ණයෙන්ම නතර කරන්න ඕනෙ කියලද?....අධික ලෙස ලුණු කෑමෙන් සිදුවිය හැකි හානි පිළිබඳව කල්පනා කරන විට යමෙකු තුළ කුකුසක් හටගන්නට ඉඩ ඇත.

එහෙත් සරල පිළිතුර "නැහැ.... කොහෙත්ම නැහැ" යන්නයි.

ලුණු අධිකව ආහාරයට ගැන්ම තරමටම ලුණු අඩුවෙන් ආහාරයට ගැන්මද භයානක වන්නේ එයින් ශරීරයට අවශ්‍ය ලුණු ප්‍රමාණය නොලැබීයාම හේතුවෙනි. හොඳටම ලුණු අඩුවූ විට මස් පිඬු පෙරළීම, වමනය, ඔක්කාරය" (Dizzinness) කරකැවිල්ල, කම්පනය, කෝමා තත්වයන් මෙන්ම මරණයට පත්වීමට පවා ඉඩ ඇත.

එහෙයින් සිරුරේ මස් පිඬු පෙරලීම, හිස කැක්කුම, ඔක්කාරය, මානසික අවපීඩනය Dippiession, වැනි අසීරුතාවන් ඇතිවන අවස්ථාවන්හි ඒ පිළිබඳ කල්පනාකාරී විය යුත්තේ එය ඔබේ සිරුරේ ලුණු මද බවට නිකුත් කරන සංඥාවක් ද වීමට ඉඩ ඇති බැවිනි.

මිනිස් ජීවිතය පවත්වාගෙන යාමට ශරීරයට සෝඩියම් අත්‍යවශ්‍ය වන අතර; කැරට්, මස්, නිවිති, බීට් වැනි ආහාරයන්ගේ සෝඩියම් බහුලව අඩංගුය.

ඔබ මේද රහිත කිරි කෝප්පයක් පානය කිරීමෙන් ශරීරයට එකතුවන සෝඩියම් ප්‍රමාණය මිලිග්‍රෑම් සියයකි. වැඩිහියන්ට මෙන්ම දරුවන්ට ද 'ලුණු' අවශ්‍යය. මාස දොළහක් පමණ වන තුරු දරුවකුට අවශ්‍ය වන්නේ දිනකට ග්‍රෑම් එකකටත් වඩා අඩු ප්‍රමාණයි. එය අවුරුදු එකේ සිට තුන දක්වා අතරතුර දරුවකුට නම් ග්‍රෑම් දෙකකි.

අධික ලෙස ලුණු කෑමෙන් දරුවන්ට ද නුස්ම ගැන්මේ අපහසුතාවය, ඔක්කාරය, වකුගඩුවලට හානි වීම ආදි තත්වයන් මෙන්ම 'මරණය' පවා සිදුවීමට ද ඉඩකඩ ඇත.

ඕනෑම දෙයක් දැනගෙන කරන විට එයින් සිදුවන හානි, අතුරු විපාකයන් මඟ හරවා ගැන්මට පුළුවන. වැරදි ආකාරයට ලුණු භාවිතා කිරීම, එනම්; එළකිරි ලුණු මිශ්‍ර කොට ආහාරයට ගැන්ම, අධික ලුණු සහිත මස් අනුභව කිරීමෙන් අකාලයේ හිසකෙස් ගැලවීයාම, හිසකෙස් සුදු පැහැගැන්වීම පමණක් නොව සිරුරෙහි හම රැළි වැටීමෙන් අකලට 'මහළු පෙනුමක්' ඇතිවීමේ හැකියාව පිළිබඳව ආයුර්වේදයෙහි සඳහන් වෙයි.

නිලංකා ජයසූරිය (මිගමුව දි ආශ්‍රම ආයුර්වේද රෝහලෙහි වෛද්‍ය දමයන්ති මහත්මිය සමඟ සාකච්ඡා කොට ලබාගන්නා ලදි.)

තරංග

මිතුරු පටුර

● කමල් පෙරේරා

මේ කඳුළු නුඹ වෙනුවෙන් නෙවේ

ආගම් දහම් වලින් අපේක්ෂා කෙරෙනුයේ මිනිස් සිත් නිවා සන්සුන් කිරීමයි. තතු එසේ වුවද මානව ශිෂ්ඨාචාරයේ ගමන් මග දෙස ආපසු හැරී බලන විට පසක් වන කරුණක් වනුයේ ආගම් දහම් දඩමීමා කරගෙන යුද ගැටුම් හා ජීවිත විනාශයන් රැසක් අප ජීවත් වන මහිකත මත සිදුවී ඇති බවකි. පසුගිය වසරේද එවැනි ඛේදවාචක කිහිපයකින් ලොවම කම්පා විණි. අභාග්‍යයකට මෙන් ඉන් එකක් හට ගත්තේ දහම් දිවයින නම් විරුදාවලිය දරන අපේ පුංචි ලංකාවේය. ආගමික උන්මාදයෙන් මුසපත් වූ අනත්වාදි කල්ලියක් විසින් ඒ මහා අපරාධය සිදු කරන ලද බව දැන් පැහැදිලිය.

කිසියම් උමතුවකින් වියරු වැටුණු තනි මිනිසකුට වුව කළ හැකි විනාශය අති මහත්ය. 2019 අවුරුද්දේ නවසීලන්තයේ සිදු වූ ක්‍රයිස්ට් චර්ච් සමූහ ඝාතනය ඊට කදිම නිදසුනකි. එකම වසරේ අසන්නට ලැබුණු ලංකාවේ පාස්කු ප්‍රහාරය හා නවසීලන්තයේ ක්‍රයිස්ට් චර්ච් ශෝකාන්තරයන් අතර එකිනෙකට ප්‍රතිවිරෝධි වූ අපූරු සහසම්බන්ධයක්ද තිබේ. එනම් ලංකාවේ ප්‍රහාරය මරාගෙන මැරෙන මුස්ලිම් අන්තවාදීන් විසින් එල්ල කෙරුණු එකක් වන විට නවසීලන්ත ප්‍රහාරය මුස්ලිම් බැතිමතුන් ඉලක්ක කරගෙන වෙනත් දහමක අන්තවාදියකු විසින් කරනු ලැබූ වෙඩි හරඹයක් වීමයි.

මේ වේදාකාරී සිදුවීම් දෙකෙන්ම පෙන්නුම් කරනුයේ කවර වර්ගයේ හෝ අන්තවාදයකින් වුව මානව සමාජයේ ඉදිරි ගමනට සිදු කරනුයේ මහත් හානියක් බවය. මෙවැනි අපරාධකරුවන්ට උපරිම දඬුවම් දියු යුතු බවට විවාදයක් නැත. එසේ වුවද ඉපැරණි නීති ග්‍රන්ථවල කියැවෙන ආකාරයේ ඇසට-ඇසක්, දතට-දතක් වැනි දඬුවම් අදට ගැළපේද යන්නත් විමසා බැලිය යුතුය. මන්දයත් මේ අපරාධවලට මුල්වන තරුණ ජනයා බෙහෝ විට වැරදි දර්ශනයන්ට වසඟවී නොමග ගියවුන් නිසාවෙනි.

ක්‍රයිස්ට් චර්ච් පුද බිමේදී බැතිමතුන් 51 දෙනකුට වෙඩිතබා අමු අමුවේ මරා දැමූ වෙඩික්කරුවාට දඬුවම් නියමු වූ අවස්ථාවේ නවසීලන්ත අධිකරණයට එක්රැස් වූ වින්දිතයන්ගේ නෑ හිතවතුන් දැක්වූ ප්‍රතිචාර අපට කදිම පාඩමක් කියා දෙයි. ඔවුන් 21 හැවිරිද ඕස්ට්‍රේලියානු ජාතික තරුණ ඝාතකයා වන බ්‍රෙන්ටන් දෙස බැලුවේ වෛරය හෝ පළිගැනීම පිරුණු ඇස් වලින් නොවේ. නවසීලන්තය මරණ දණ්ඩනය ක්‍රියාත්මක නොකරන රටක් නිසා දිවි ඇති තෙක් සිරගත වීමේ උපරිම දඬුවමකට තරුණයා යටත් කෙරිණ. එසේම නවසිලන්ත ඉතිහාසයේ ත්‍රස්තවාදී ක්‍රියාවකට පුද්ගලයකු වරදකරු වූ ප්‍රථම අවස්ථාවද මෙයයි.

එසේ වී නමුත් අධිකරණ ශාලාව කඳුළින් නහවමින් සිටි ජනයා මේ සියලු සුවිශේෂතා පසෙක ලා ප්‍රකෘති මනසින් අපරාධකරුවා දෙස බැලීමට දැරූ උත්සාහය මානව ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කළේය. ඔවුන්ගේ අත්වල රැඳුණේ මියගියවුන්ගේ ඡායාරූප හා විවිධ සෝ වැකි ලියූ පුවරුය. ඔවුන්ගේ මුවින් නික්මුණේ ශුද්ධවූ කුරාණයේ යාතිකා පාඨය.

ප්‍රහාරයටට ලක් වූ හමීයා කුයාන් නම් එක්දරු පියා අවසන් සුසුම් හෙළුවේ දින 48කට පසුවය. ඔහුගේ බිරිඳ සොකාරියා මු`ළු අධිකරණ ශාලාවම සෝ සුසුම්න් පුරවමින් අපරාධකරුට පැවසූ වදන් ජාත්‍යන්තර මාධ්‍යයේ දැඩි අවධානයට ලක් විය.

"නුඹේ හිතක් පපුවක් නැති වෙඩි උණ්ඩ වලට ගොදුරු වුණ අහිංසකයන් අතර මගෙ සැමියත් හිටිය. ඔහු සදහටම ඇස් පියා ගත්තේ උඹ ඒ මහා අපරාධය කළාට දවස් 48කට පස්සෙ... එයා තමා මට හිටපු ආරක්ෂකයා... මගේ හොඳම මිත්‍රයා... අපේ පුංචි පුතා අහනවා අම්මේ ඒ මිනිහා මගේ බාබව මැරුවෙ ඇයි කියලා... මං මොනවද එයාට කියන්නෙ...පුතේ ඔයාගෙ මොන්ටිසෝරියෙත් ඉන්නව නේද අනිත් අයත් එක්ක එකතු වෙලා සෙල්ලන් කරන්ඩ දන්නෙ නැති නිසා ඔයගොල්ලන්ට ගහන ළමයි...ඒ මනුස්සයත් අන්න ඒ වගේ කෙනෙක් කියලයි මම දරුවට කරුණු පැහැදිලි කරල දුන්නෙ..."

සොකාරියාගේ ඒ දුක්ගැනවිල්ලෙන් පමණක් එහි රැස්ව සිටියවුන්ගේ හැඟීම් නතර වූයේ නැත. සෝ සුසුම් හා කඳුළු බිඳු හෙළීමෙන් මිනීමරුවාගේ සිත සසල කළ නොහැකි බව ඔවුහු තේරුම් ගෙන සිටියහ. සැබවින්ම බ්‍රෙන්ටන් ටැරන්ට් තිගැස්සුණේ අවසානයේ, ඔහුගේ වයසේම වගේ සිටි තරුණියක වන සාරා ත්වාසම්ගේ මුවට නැඟි මේ වදන් වලිනි.

"අබ්දෙල්ෆාටා ත්වාසම්..ඒ මගේ ආදරණිය පියතුමා...ඔහු තාරකාවක් වගේ බැබළෙමින් හිටපු මිනිහෙක්..." එක්වරම කඩා වැටුණු කඳුළු පොකරු පාලනය කරගැනීමට ඇයට නොහැකි විය. කඳුළු පිසදා ගත් ඇය යළිත් කතා කළාය.

"හිතන්නෙපා නුඹ දිනුව කියල.. මේ කඳුළු නුඹ වෙනුවෙන් නොවන බව හොඳට මතක තියා ගනින්.. අපි නෙවෙයි දැන් නුඹයි වින්දිතයා..."

තරංග

රහසුන

වේදනාවක්...

සුර දූතයන් විසින් ගයන ලද ගීතිකා ලෙස අප සලකන කෘති ඇත්ත වශයෙන් ම ලියා ඇත්තේ නිරයෙහි පතුලෙහි ජීවත් වූ පුද්ගයන් විසින් ය කියා ප්‍රාන්ස් කෆ්කා කළ ප්‍රකාශයක් මා මතකයට නැගේ. ඒ කියමන කෙතරම් සර්ව සාධාරණදැයි දැනෙන්නේ නිර්මාණකරුවා නිර්මාණයක් බිහි කිරීමට ප්‍රථම කෙතරම් වෙහෙසෙන්නේ දැයි කල්පනා කරන විට ය. ඉතා තියුණු සංවේදී හැඟීම් වලින් යුතු කලාකරුවෝ ලෝකයේ රළු බව දරා ගැනීමට නොහැකි ව තමන් විසින් නිර්මාණය කර ගන්නා ලෝකයක හුදෙකලා ජීවිතයක් ගෙවන්නන් බවට පත් වෙති. ඒ සොබාදහමේ නියමයයි. අතිශය සංවේදී තියුණු මනසක් නැති වූවකුට ආශ්චර්යවත් කලා නිර්මාණයක් බිහි කළ නොහැකිය. කලාකරුවන් ජීවත්වීමේ ශක්තිය ලබා ගන්නේ ඒ අසීමිත සංවේදී බව නිර්මාණයක් ව සහෘදයාට තිළිණ කිරීමෙනි.

කලා කෘතියක් ඇත්තට ම එක් අතකින් ගුප්ත ය. එය තවත් විටෙක ප්‍රහේලිකාවකි. මිනිස් වර්ගයාට ජීවත්වීමේ අරුත, සදා සතුට, ප්‍රමෝදය ලබාදෙන කෘති කලාකරුවන් නිම වන්නේ කෙසේද? ඔබ සිතනවාද දැන උගත්කම විසින් කලාකරුවකු නිර්මාණය කළ හැකියි කියා. පොතපතේ දැනුම ආභරණයක් විනා එමගින් අපට කලාත්මක කුසලතා ජනිත කරන්නේ නැත. කලාකරුවන් කිසිවිටෙක සිය නිර්මාණ විකිණීමේ හෝ ඒ නිර්මාණ මතින් කීර්තිය, ප්‍රශංසාව වඩා ගැනීමේ ආධ්‍යාශයෙන් යුතු වූවෝ නොවෙති.

මා මේ සියල්ල ම ඔබට කියන්නට සිතුවේ කලාකරුවාගේ භූමිකාව මෙකල්හි වඩාත් ප්‍රශ්න කිරීමකට නතුව තිබෙන නිසා ය. කෙසේ වෙතත් අප කියවන, බලන, අහන සැම දෙයක ම ගැබ්වී ඇති චමත්කාරය යටින් ඇත්තේ ඒ චමත්කාරය මවන්නට වෙහෙසුණු දුක්බර දෙනෙතක් සහ විඩාබර හදවතක් යැයි මට සිතේ. ඒ සියල්ලෙන් ම අපට දැනෙන කාරණය වන්නේ නිර්මාණය හෘදය අභ්‍යන්තරයෙන් ම පැන නගින්නක් විනා බාහිර සාටෝපයක් නොවන බව ය. නිර්මාණකරණයට අතපොත් තබන අප වටහාගත යුතු කාරණය වන්නේ එයයි. ඔබට වඩාත් හොඳින් ලිවිය හැක්කේ, ඔබට වඩාත් හොඳින් රූප රචනය කළ හැක්කේ හෘදය සංවේදී වීමෙන් හා ඒ කරුණ, වස්තුබීජය ඔබට කොතරම් දැනෙන්නේ ද යන කාරණය මත යැයි මා කිවහොත් ඔබ එකඟ ද?

ඇනා කැරනිනා නවකතාවේ ලෙවින්ගේ චරිතය තම ආත්ම ප්‍රකාශනයක් බවට තෝල්ස්තෝයි කරන ප්‍රකාශය ඔබ අසා තිබේද? එහිදී තෝල්ස්තෝයි සිය ආධ්‍යාත්මයෙන් ප්‍රශ්න 6ක් අසයි. මා ජීවත්වන්නේ මන්ද? ; මගේ හා අනන්‍යයන්ගේ ජීවිතයෙහි පැවැත්මට තුඩුදුන් හේතු සාධක කවරේද?; අප ජීවත්වන්නේ කවර අරමුණක් සඳහා ද?; හොඳ නරක වශයෙන් මා තුළ ඇති භේදයෙන් අදහස් වන්නේ කුමක් ද?; එවන් භේදයක් පවතින්නේ මන්ද?; මා මෙසේ ජීවත් විය යුතුද?; මරණය යනු කුමක්ද?; ඒ තෝල්ස්තෝයි තමාගෙන් අසා දැනගත් ප්‍රශ්න 6 යි.

තෝල්ස්තෝයි තම ජීවිතයේ ඉදිරි තිස්වස ගතකොට ඇත්තේ මේ ප්‍රශ්න වලට පිළියම් සෙවීම සඳහා ය. ඔහුගේ හෘදය සාක්ෂියේ අසීමිත හඬගැමේ අවසානය වූයේ කුඩා දුම්රිය පොළකදී දැඩි ශීතල හේතුවෙන් නිව්මෝනියාව සෑදී මිය යෑම යි. ' පිස්සකුගේ මතක සටහන්' කෙටිකතාවට පාදක වන්නේ එකී උමතුවයි; වස්තු බීජය වන්නේ එයයි.

පුෂ්කින්ගේ ඛේදජනක මරණයෙන් පසු රුසියානු සාහිත්‍යයේ නායකත්වය ගැනීමට සිටි නිකොලොයි ගොගොල් ආගමික භක්තියේ උන්මාදයෙන් පෙළීම නිසා තම පොත්පත්, ලිපිලේඛන හා අත්පිටපත් සියල්ල ගිනිතබා රෝගාතුර ව මිය ගියේය.

දොස්තයෙව්ස්කිගේ අසාමාන්‍ය ආධ්‍යාත්මික විපර්යාසය අදහාගත නොහැක්කක් ය. ඔහු නිර්මාණය කරන ලද චරිතවල උමතුභාවය ඔහුගේ චරිතයෙහි ද විය. ඔහුගේ මනසේ වූ විලාපය සිය නිර්මාණ වල ද ප්‍රකට විය. දුකට, අසහනයට පත් චරිත වටකොට රචිත ඔහුගේ නවකතා ද ජීවිතයේ දුක කියන අඳෝනා වැනි ය. දෙබිඩි ජීවිතයක් ගත කළ මිනිසකු යැයි ඔහුට නැගෙන චෝදනාවේ ඇතුළු පැත්ත මේ ආධ්‍යාත්මික වේදනාවේ බාහිර ස්වරූපයයි.

ගී ද මෝපසාං, ලූ ශුන් වැනි නිර්මාණකරුවන් ද තම ආධ්‍යාත්මයේ පැන නැගි වේදනාවෙන් අපමණ දුක් විඳ ඔවුන්ගේ නිර්මාණය වූ නිර්මාණ අප අතට පත්කොට ඒ වේදනාවෙන් මිදීමට නොහැකිව ජීවිතයෙන් වන්දි ගෙවූවෝ ය.

කලාකරුවකුට කලා නිර්මාණයක් බිහි කිරීමට කුමන සාධක, කුමන දේ හේතුවන්නේදැයි කිව නොහැකි ය. නිර්මාණවේශය අවුළුවන යම් යම් දෑ තිබෙන්නට පුළුවන. එහෙත් අවසන නිමවූ කලාකෘතිය ආශ්චර්යයක් ම ය. නිර්මාණය කෙදිනකවත් කාටවත් ඉගැන්විය හැක්කක් නොවෙයි. ලොව පුරා විශ්වවිද්‍යාල කෙතරම් මුදල් සම්භාර වැය කර නිර්මාණකරණය උගැන්වුව ද ඒ එකකින්වත් තෝල්ස්තෝයි, මෝපසාං වැනි නිර්මාණකරුවකු බිහිකර ගත හැකි වීද? එබැවින් නිර්මාණකරුවකු බිහිවීම ආශ්චර්යයක් ය. මිනිස් මනස පිළිබඳ සිග්මන් ෆොයිඩ් පර්යේෂණ කර මොන දේ සොයා ගත්තත් නිර්මාණ බිහිවීමට බලපාන සූත්‍රය නම් ඔහුට හමුනොවන බව සහතික ය. එය වෙන කිසිවකුටවත් අහුවන්නේ ද නැත.

එක ම දෙය ඔබ, ඔබට අවංක වීමයි. ඒ අවංක බව විසින් නිර්මාණය උපද්දවා ඔබේ හෘදය අභ්‍යන්තරය ඔබට පෙරළා විවර කර දෙනු ඇත.

sumudu.chathurani@lakehouse.lk



ලොව සමාජ දේශපාලන පෙරළිවලට මුල් වූ ප්‍රංශ මහා විප්ලවය

● **අනුර බී. සෙනවිරත්න**

ලෝක ඉතිහාසය යනු ශ්‍රේෂ්ඨ විප්ලවවලින් පිරි ඉතිහාසයකි. දරුණු ආඥාදායකයන්ගේ කුරිරු පීඩනයෙන් ගැලවීම පිණිස දියත් වූ ඒ සෑම විප්ලවයක දී ම බොහෝ ප්‍රගතිශීලීහු තම ජීවිත පූජා කළහ. එම අසහාය ජීවිත පූජාවන්ගෙන් අලෝකවත් වූයේ එම විප්ලව දියත් වූ රටවල පීඩිත ජනතාවගේ ජීවිත පමණක් නොවේ. එම විප්ලවීය ජයග්‍රහණවලින් ආශ්වාදය ලැබූ බොහෝ රටවල පීඩිත ජනතාවගේ ජීවිත ද එමගින් ආලෝකවත් වූයේය.

ක්‍රි.ව. 1789 සිට 1799 දක්වා වසර 10ක් පුරා පැවති ප්‍රංශ විප්ලවය ද එවැනි සමාජ හා දේශපාලන පෙරළියක් ඇතිකළ ශ්‍රේෂ්ඨ විප්ලවයකි. එහි ආරම්භක වසර තුන තුළ දී එරට වැඩවසම් ක්‍රමය, රදළ පංතියේ ආධිපත්‍යය හා ක්‍රිස්තියානි පල්ලියේ වරප්‍රසාද ඇතුළු බොහෝ සම්ප්‍රදායන් බුද්ධි විචාරමය යුගයේ අදහස්වලින් මෙන් ම, වාමාංශික අදහස් ඇති දේශපාලන කණ්ඩායම් අතින් මහත් වෙනසකට භාජනය විය.

මාරි ඇන්ටොනෙට් රැජින

වෝල්ටෙයාර්

මැක්සිමිලියන් රොබෙස්පියෙර්

නැපෝලියන් බොනපාට්

16 වන ලුවී රජු

වර්ෂ 1756 සිට 1763 දක්වා පැවති අධිරාජ්‍යවාදී යුද්ධ නිසා ප්‍රංශ භාණ්ඩාගාරයේ මුදල් හිඟ වෙන්නට පටන් ගත්තේ ය. රජු සහ රජුට පාක්ෂික අමාත්‍යවරු හිඟවන භාණ්ඩාගාරය පුරවන්නට අධිකරණ සහ පරිපාලන තනතුරු රදළයන්ට විකිණීමට පටන් ගත්හ. ඒ නිසා, රටේ අල්ලස හා දූෂණය වැඩි විය. එසේ මුදල් ගෙවා තනතුරු ලබාගත් රදළ පවුල් හාරදහසක් පමණ වූයේය.

ධනයට හිමිකම් කියූවත්, බුද්ධි විචාරමය යුගයේ අදහස්වලින් පෝෂණය වූ රදළයන් මෙන්ම, පල්ලියටත්, ආණ්ඩුවටත් බදු ගෙවීමෙන් බදු බරෙන් පීඩිතව සිටි එරට මධ්‍යම පාංතිකයන් සහ ගම්වැසියන් විප්ලවයේ හවුල්කාරයෝ වූහ. ඔවුන් සටන් වැදුණේ බදු එකතු කිරීමේ අයිතිය හිමි රදළ පංතියට, රාජාණ්ඩුවට හා පල්ලියට එරෙහිව ය.

වර්ෂ 1793 සිට 1794 දක්වා ප්‍රංශයේ පැතිර ගිය භීෂණ පාලන සමයේ නායකත්වය දැරුවේ ප්‍රංශ විප්ලවයේ පුරෝගාමියෙකු වූ මැක්සිමිලියන් රොබෙස්පියෙර් නමැත්තා ය. ජනතා විරෝධීන් යනුවෙන් හඳුන්වන ලද 16,000ක්, 40,000 ක් අතර ජනතාවක් මේ සමයේ දී මරණයට පත්කොට තිබේ. ප්‍රංශ යුද ඉතිහාසයේ පැවති යුද්ධවලින් කැපී පෙනුණු හමුදා නායකයෙක් වූයේ නැපෝලියන් බොනපාට් ය. ප්‍රංශ දේශ සීමාවන් තුළ කැඩී බිඳී ගොස් තිබුණු නීතිය නැවතත් ස්ථාපිත කිරීම සඳහා ජනතාව විසින් ඔහු එරට අධිරාජයා වශයෙන් පත්කර ගන්නා ලදී.

වර්ෂ 1774 වනවිට යුරෝපයේ ජනගහණයෙන් වැඩි ම, සමෘද්ධිමත් ම රාජ්‍යය වූයේ ප්‍රංශයයි. එහි ජනගහණය මිලියන 25 ක් පමණ වූ අතර, අගනුවර වූ පැරිසිය යුරෝපයේ විශාලතම නගරය විය. පැරිසියේ පමණක් 650,000 ක ජනගහණයක් වාසය කළෝය. මුළු ප්‍රංශයේ මහජනතාව පූජකයන්, රදළයන් සහ සාමාන්‍ය ජනතාව ලෙස පංති තුනකට අයත් වූහ. තෙවැනි පංතිය වූ සාමාන්‍ය ජනයා තරමක ආර්ථික වර්ධනයක් අත්කරගෙන සිටියද, ඊට සරිලන දේශපාලන බලයක් හා සමාජයීය වැදගත්කමක් ඔවුනට නොතිබිණි. ඉහළ තනතුරු දරන පූජ්‍ය පක්ෂය අයත් වූයේ, ධනවත් රදළ පන්තියටය. ආගමික සංස්ථාවේ දුප්පතුන් වූයේ, ඉහළ තනතුරු නැති බහුතර පූජකවරුන් හා පල්ලි භාරකරුවන්ය. එකී දුප්පත් පූජ්‍ය පක්ෂය සිය ආගමික නායකයන්ට එරෙහිව සමතැන් ඉල්ලා විප්ලවයේ දී විප්ලවකාරීන් හා එකතු වූහ.

ආර්ථිකයෙන් ශක්තිමත්, උගත් සාහිත්‍ය කල්ලි මුණගැසෙන අවන්හල් පැරිසියේ ගහණ විය. ප්‍රංශයේ දාර්ශනික හා සාහිත්‍ය හමු පැවැත්වූයේ ඒවායෙහිය. රදළ නොවූ එහෙත් ධනවත් හා උගත් පිරිස් "නිදහස, සමානාත්මතාවය හා සහෝදරත්වය" ඉල්ලා සිටියේ, තමන්ට ඉහළින් වූ අය හා සමානවීමට මිස තමන්ට පහළින් වූ අයට තමන් හා සමානවන්නට ඉඩකඩ සලසා දීමට නොවේ.

රටේ සදාචාර වර්ධනයට පල්ලිවල සහාය අපේක්ෂා කළ එරට පාලකයෝ දිගින් දිගටම ජනතාවගේ බදු මුදලින් පල්ලිය නඩත්තු කළෝය. මේ හේතුවෙන් ආගමික භක්තියන් 200,000 ක් පමණ රට හැර ගිය හ. ඒ, ප්‍රංශය හැරගිය පළමු සංක්‍රමණික කණ්ඩායමය. ප්‍රංශයේ දහසය වැනි ලුවී රජ රටක් පාලනය කරන අපේක්ෂාවෙන් සිටි කෙනෙකු නොවේ. වයස 20 දී ඔහුට ප්‍රංශයේ ඔටුන්න හිමි වූයේ, 1765 දී සිදු වූ සිය පියාගේ හදිසි අභාවයත්, 1774 දී සිදු වූ තම සීයාගේ අභාවයත් නිසා ය.

ඔහු ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන ප්‍රාදේශීය සභාවන් පිහිටුවා රජයත්, ජනතාවත් අතර පැවති ගැටලු විසඳන්නට උත්සාහයක් ගත්තේය. තමන් යටතේ සිටි වහලුන් නිදහස් කළේය. එහෙත්, රදළයන්ට හා පූජ්‍ය පක්ෂයට වහල් සේවකයන් තබාගන්නට හැකිව තිබූ අයිතිය අහිමි නොකළේය. සාක්කිකරුවන්ට හා අපරාධකරුවන්ට වදහිංසා කිරීම තහනම් කළේ ය. දුප්පතුන්ට 3% පොලියට ණය ලබා ගැනීමට හැකි ස්ථාන ආරම්භ කළේ ය.

මේ අතර, බොහෝ රදළ පිරිස් වෝල්ටෙයාර් වැන්නන් කියන්නේ කුමක් දැයි වටහා නොගත්හ. වෝල්ටෙයාර් යනු ආගම හා රජය වෙන්කළ යුතු යැයි කී දාර්ශනිකයෙකි. සියල්ලන්ගේම නිදහස් අයිතීන් සුරැකිය යුතු යැයිද, කැමති ආගමක් අදහන්නට ඉඩක් තිබිය යුතු යැයිද, අදහස් ප්‍රකාශනයට අවසරය තිබිය යුතු යැයිද ප්‍රකාශ කළ විද්වතෙකි.

ජෝශප් මාටින්-ඩවුච්

1789 ගිම්හානයේ දී ප්‍රංශයට උදාවූයේ, නීතියක් නැති භීෂණ සමයකි. ආහාර මංකොල්ලකරුවන් නිසා අධික ලෙස බියට පත්ව සිටි එරට වැසියෝ අවි ආයුධ අතට ගත්හ. මාස හයක් තුළ තුවක්කු 400,000 ක් පුරවැසියන් සතු විණි. තුවක්කු, මිට දිග මුල්ලු, හා දැකැති අවි සේ අමෝරා ගත් පුරවැසියෝ, බදු එකතු කරන්නන්, වැඩවසම් රදළයන් ඇතුළු ඒකාධිකාරීන් යැයි තමන් සිතූ සියල්ලන්ට ම පහර දෙන්නටත්, කඩ සාප්පු හා ගෙවල් ගිනි තබන්නටත් පටන් ගත් හ.

ප්‍රංශ විප්ලවයේ පළමු අදියර වන්නේ රදළයන් දහසය වැනි ලුවී රජුට බදු ගෙවීම පැහැර හැරීමය. එහි දෙවැනි අදියර යනු රජුගේ බලතල සීමා කරන්නට 1789 ජූනි 20 වැනි දා 'ටෙනිස් පිටියේ ගිවිසුම' ප්‍රකාශයට පත්කර සම්මත කරගැනීමය. එදින රැස් වූ තෙවැනි තලයේ සාමාජිකයන් 577 දෙනාගෙන් 576 ක් ඊට අත්සන් තැබූ අතර, ඊට අත්සන් නොතැබූ එකම පුද්ගලයා වූයේ ජෝශප් මාටින්-ඩවුච් නැමැත්තාය.

බැස්ටීලය යනු පැරිසියේ රාජාඥාව යටතේ දේශපාලන විරුද්ධවාදීන් හා අපරාධකරුවන් සිරගත කළ කුප්‍රකට සිරකඳවුරය. බැස්ටිලය තුළ අවි ආයුධ ගබඩා කර ඇතැයි දැනගන්නට ලැබීමෙන් පසු ජනතාව විසින් පිහිටුවා ගන්නා ලද ජාතික ආරක්ෂක හමුදාව ඒවා අයිති කරගන්නට සැලසුම් කළේය. ඇමරියා කැහිලා නම් විප්ලවවාදියා ප්‍රමුඛ පිරිසක් ඊට පෙර 'ඉන්වාලයිඩ්ස්' හෝටලයට කඩා පැන එහි තිබූ මස්කට් තුවක්කු 29,000ක්, 32,000 ක් අතර ප්‍රමාණයක් එකතු කරගෙන සිටිය හ. ඔවුන්ගේ අභිප්‍රාය වූයේ බැස්ටිලයේ ගබඩා කර තිබුණු කිලෝග්‍රෑම් 13,600 ක් පමණ වූ වෙඩිබෙහෙත් තොගයක් පැහැර ගැනීම ය.

1789 ජූලි 14 වැනිදා උදෑසන බැස්ටීලයට මෙම විප්ලවකරුවන් කඩා වදිද්දී එහි සිටියේ සිරකරුවන් හත්දෙනෙකු පමණි. 16 වැනි ලුවී රජු අනිත් සියල්ලෝ ම නිදහස් කර යවා තිබිණි. බැස්ටීලය කඩා වැටෙද්දී දහසය වැනි ලුවී රජුගේ බාල සහෝදරයා සිය භාර්යාවත්, අනියම් බිරිඳත් රැගෙන රටින් පිටවූ අතර, තවත් බොහෝ රදළයෝ ඔහු අනුගමනය කළෝය. එය ප්‍රංශ විප්ලවයේ තෙවැනි අදියර සේ සැලකේ.

1789 අගෝස්තු 27 දා එළිදුටු මිනිස් හා පුරවැසි අයිතීන් පිළිබඳ ප්‍රකාශනයට චන්දය ප්‍රකාශ කරන්නට සහ නිලතලවලට පත්වන්නට අවසර ලැබුණේ කොටසකට පමණි. නළුවන්ට, පොතෙස්තන්ත්‍ර හා යුදෙව් ආගමිකයන්ට සිවිල් අයිතීන් අහිමි විය. නැවතත් දරුණු පාන් හිඟයක් ප්‍රංශය පුරා පැතිර ගියේ මේ අතරය. ප්‍රංශ කාන්තාවෝ පාරට බැස්සෝය. උරණ වූ පැරිස් වැසියෝ රජ

ගිල්බට් ඩු මෝටියේර් නොහොත් ලාෆායෙට්

මාලිගයේ මුර සෙබළුන්ගේ හිස් ගසා දමා ඒවා උල්වල ගසාගෙන ගියෝය.

1790 දී ස්ථාපිත කරගත් 'විප්ලවීය ව්‍යවස්ථාවෙන්' රජුගේ බලය අවම කළ ද, උපතින් හිමිවන ඔටුන්න ඔවුන් අහෝසි කළේ නැත. බංකොළොත් වූ භාණ්ඩාගාරය පුරවන්නට පල්ලිය වෙත හැරුණු ඔවුහු, ෆෑන්ක් බිලියන තුනක් වටිනා පල්ලියේ බූදලය රාජ සන්තක කළ හ. 1793 දී රටේ අභ්‍යන්තර පොලීසිය පාලනය වූයේ මහජන ආරක්ෂක කමිටුවක් මගිනි. මැක්සිමිලියන් රොබෙස්පියෙර් එහි සාමාජිකයෙක් වී ය. ඔහුගේ පිළිවෙත වූයේ භීෂණය යි. විප්ලවීය ආණ්ඩුවකට භීෂණය අත්‍යවශ්‍ය බවත්, එය ප්‍රශංසනීය හා මග හැරිය නොහැකි දෙයක් බවත් කියා සිටි රොබෙස්පියර්, සද්ගුණවත් ජනරජයක් බිහිකිරීම සඳහා සියලු වැරදිකරුවන්ගේ හිස් ගසා දැමීම අනුමත කළේ ය.

ආඥාදායකත්වයෙන් ඉවත්වන්නට උත්සාහ දරමින් ප්‍රබුද්ධ චොල්ටෙයාර්ගේ අදහස්වලට සවන් දෙන්නට පටන්ගෙන සිටි අවුරුදු 20 දී ඔටුනු පැළඳි දහසය වැනි ලුවී රජුගේ හිස අවුරුදු 38 දී ගිලටිනයෙන් අහිමි කළ විප්ලවවාදීහු ඊට ටික දිනකට පසු මාරි ඇන්ටොනෙට් රැජින ද ගිලටිනයට යැවූහ. අනතුරුව ඔවුහු සියලු ප්‍රභූන් මරා දැමීමට පටන් ගත්තෝය.

ඒ වකවානුව භීෂණයෙන් රට පාලනය වූ සමයකි. අසම්පූර්ණ හා අසාධාරණ නඩු තීන්දු මගින් මරණීය දඬුවම් 25,000 ක් පමණ සිදු විය. මහජන ආරක්ෂක කමිටුවල බලය අවම කළ මැක්සිමිලියන් රොබෙස්පියර් එරට ආඥාදායකයා විය. ඉන්පසුව ඔහුගේ අදහස් පිළිනොගන්නා හැම කෙනෙකුගේම හිස් ගසා දැමුණි. 1793 සැප්තැම්බර් 5 සිට 1794 ජූලි 28 දා දක්වා ප්‍රංශයේ පැවතියේ භීෂණ පාලනයකි. ඒම කාලය තුළ පැරිසියේ 2,639 ක් ඇතුළුව මුළු ප්‍රංශයේ ම 16,594 ක් මිනිස් ජීවිත ගිලටිනයෙන් ඝාතනය කර තිබේ. සියලු ප්‍රචණ්ඩ ක්‍රියාවලින් හෙළිදරව් වූයේ රදළයන් වෙත තිබූ අප්‍රසාදය සහ විරෝධයයි.

ඇමෙරිකන් නිදහස් අරගලයට සහාය දුන් ගිල්බට් ඩු මෝටියේර් නොහොත්, ලාෆායෙට් වැනි රදළයන් ද ප්‍රංශ නිදහස් අරගලයට දායක වූහ. එවැනි පුද්ගලයන් ද ගිලටිනයට හා සිරබාරයට ගැනෙද්දී ලාෆායෙට් ඔස්ට්‍රියාවට පැන ගියේය. මහජන ආරක්ෂා කමිටුවට ඉහළින් ගිය මැක්සිමිලියන් රොබෙස්පියර් නව නීති පනතක් සම්මත කර ගත්තේය. එම පනත මගින් කිසියම් පුරවැසියෙක් විප්ලවයට විරෝධී යැයි සිතූ පමණින් වැඩි නඩු විභාගයකින් තොරව මරණයට පත් කළ හැකි විය. ඒ නිසා ජනතා ආණ්ඩුවෙන් මරණයට පත් වූ අය දෙගුණයකින් වැඩි විය. පසු කලෙක රොබෙස්පියර් ද ජනරජයට එරෙහි වූ කුමන්ත්‍රණකරුවෙකු ලෙසින් 1794 ජූලි 28 වැනිදා නඩු විභාගයක් නොමැතිවම ගිලටිනයට නියම වී ය.

ප්‍රාදේශීය වෙනස්කම් සහිත බලසම්පන්න මධ්‍යම ආණ්ඩුවක් පිහිටුවා ගැනීමටත්, ප්‍රංශ වැඩවසම් ක්‍රමය නැතිවීම හා සමාජ සමානාත්මතාව ඇතිවීමටත් ප්‍රංශ විප්ලවය හේතු පාදක විය. පැරණි අසාධාරණ බදු ක්‍රමය නැති වී සෑම අයකුම තම ආදායමට අනුව බද්දක් ගෙවන ලදී. රදළයින් හා පූජකයන් සතුවූ ඉඩම් සාමාන්‍ය ජනතාවට ලැබීම නිසා සුළු ඉඩම් හිමි මධ්‍යම පාන්තික ගොවි පන්තියක් බිහිවීම ද ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵලයක් විය. උපත මත නොව තම ධනය හා හැකියාව මත තත්ත්වය තීරණය වන සමාජ ක්‍රමයක් කරා ප්‍රංශය යොමු විණි.

විප්ලවයට පසු ප්‍රංශයේ ධනවාදී ආර්ථික ක්‍රමයක් ඇතිවීම නිසා කාර්මික හා න්‍යාය ක්‍රම සංවර්ධනය වී කර්මාන්ත, වෙළඳාම, බැංකු ක්‍රමවල දියුණුවක් ද ඇති වී යහපත් මුදල් තත්වයක් ද ඇති විය. තව ද, 'සහෝදරත්වය' යන විප්ලවීය සටන් පාඨයට අනුව ජාතියක් වශයෙන් නැගී සිටීමට ද ප්‍රංශයේ කීර්තිය නංවාලීමට ද විප්ලවය හේතු විය.

ප්‍රංශ විප්ලවයේ තේමාව වූ 'නිදහස සහ සමානාත්මතාවය' යන සටන් පාඨයට අනුව නූතන ලිබරල් හා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ලක්ෂණ පෝෂණය වූ බව කිව හැකිය. යුරෝපයේ මෙන්ම ආසියාවේද ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත් අනුගමනය කිරීමට පටන් ගත්තේ ප්‍රංශ විප්ලවයෙන් පසුවය. ප්‍රංශ විප්ලවයෙන් ඉස්මතු වූ ඉතා වැදගත් අදහස වන්නේ ජනතා ස්වාධිපත්‍යයය. එනම්, දේව වරම හෝ උපත අනුව නොව, ජනතාවට තමන් කැමති පාලකයකු තෝරාගැනීමේ අයිතිය මහජනතාවට ලැබීමය. ප්‍රංශ විප්ලවය යුරෝපය පුරා ඇතිවුණු බුද්ධි ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් මෙන්ම, රජුන්ගේ අත්තනෝමතික හා අදූරදර්ශී පාලනය නිසා පීඩා විඳි පොදු ජනතාව විසින් සම්පූර්ණ පාලන ක්‍රමයම වෙනස් කර තමන් කැමති පාලන රටාවක් සකසා ගැනීමට වසර දහයක් පුරා කළ විප්ලවයක් ලෙසද ප්‍රචලිත ය.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි. ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ජායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි. සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ. සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී

ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවෙන් COVID- 19 අරමුදලට කෝටි 9ක්

ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව ඉටුකම COVID- 19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදලට ඇමරිකානු ඩොලර් 500,000ක (රුපියල් මිලියන 92.5) මුදලක් පරිත්‍යාග කරයි. ස්ටෑන්ඩර්ටඩ් චාර්ටඩ් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි බිඟුමමාල් තෙවරතන්ත්‍රි ඊට අදාළ චෙක්පත අගෝස්තු 28 පස්වරුවේ ජනාධිපති කාර්යාලයේ දී සංකේතාත්මකව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ට පිළිගැන්වීය.

ශ්‍රී ලංකාසේ COVID- 19ට එරෙහි සටනට සිය දායකත්වය ලබාදෙමින් ශ්‍රී ලංකා රතුකුරුස සංගමය මගින් බැංකුව පරිත්‍යාගය සිදු කර තිබේ. ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් පීඑල්සී මගින් ලබා දුන් ඇමරිකානු ඩොලර් 300,000 සමකට ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව ලබාදුන් ඇමරිකානු ඩොලර් 200,000කින් මේ මුදලට සමන්විතය.

කොරෝනා වයිරසය පාලනය සහ මර්දනය, රෝගය පැතිර යෑම වැළැක්වීම සහ පෙර සූදානම, වයිරසය පිළිබඳ ජනතාව නිවැරදිව දැනුවත් කිරීම, රෝගීන් හඳුනා ගැනීම සඳහා උපකරණ මිලදී ගැනීම වැනි කාර්යයන් සඳහා මේ මුදල යොදවනු ඇතැයි බැංකුව අපේක්ෂා කරයි.

සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් සංජීව මුණසිංහ, ශ්‍රී ලංකා රතු කුරුස සංගමයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය මහේෂ් ගුණසේකර, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ සන්නාම හා අලෙවිකරණ ප්‍රධානී අනුක් ද සිල්වා යන අය මේ අවස්ථාවට එක්ව සිටියහ.

ව්‍යවසාය පෙර පෝෂණ ක්‍රියාදාමයක අවශ්‍යතාව

නිපුණතා සංවර්ධන අරමුදල මඟින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නඟා සිටුවීමට විශාල කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව ඔවුන් ඉලක්ක කරගෙන වැඩසටහන් රාශියක් මේ වන විටත් ක්‍රියාත්මක කර ඇත. එම වැඩසටහන් මාලාවේ තවත් වටිනා පියවරක් ලෙස නිපුණතා සංවර්ධන අරමුදල ලංකා ඉම්පැක්ට් ඉන්වෙස්ටින් නෙට්වර්ක් ආයතනය සමඟ එක්ව ව්‍යවසාය පෙර පෝෂණය (Incubation) වැඩසටහනක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

මේ පිළිබඳ විශේෂ සාකච්ඡාමය වැඩසටහනක් පසුගියදා (14දා) අමාත්‍යංශ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. නිපුණතා සංවර්ධන අරමුදලේ සභාපති ආචාර්ය ඉංජිනේරු ලයනල් පින්ටු, නිපුණතා සංවර්ධන අරමුදලේ සමාන්‍යාධිකාරි සද්නා ගුණවර්ධන ඇතුළු නිපුණතා සංවර්ධන අරමුදලේ වෙළෙඳ මණ්ඩලයේ නිලධාරින්, ලංකා ඉම්පැක්ට් ඉන්වෙස්ටින් නෙට්වර්ක් ආයතනයේ සභාපති චන්දුල අබේවික්‍රම ඇතුළු එම ජාලයේ නිලධාරීහු පිරිසක් මේ සඳහා සහභාගි වූහ.

ව්‍යවසායකයන් බිහිවන්නේ යම් ව්‍යාපාරික අදහසක් ක්‍රියාවට නැංවීමෙන්ය. නමුත් අදහසක් පමණක් තිබීම ඊට ප්‍රමාණවත් නොවේ. ව්‍යාපාරයක් ආරම්භ කර ඉහළ නැංවීම සඳහාත් එය ව්‍යුහගත කිරීමටත් ව්‍යාපාරික සැලසුමක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ. ව්‍යවසාය පෙර පෝෂණය (Incubation) හරහා ඊට අවශ්‍ය මූලික සහාය ලබාදෙයි. සැබැවින්ම ව්‍යවසායකයාට ජීවයක් ලබා දෙන්නේ මෙම ක්‍රියාදාමය හරහායි. නිපුණතා සංවර්ධන අරමුදල, ලංකා ඉම්පැක්ට් ඉන්වෙස්ටින් නෙට්වර්ක් ආයතන සමඟ එක්ව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන් එවැනි වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත්තේ එම අවශ්‍යතා හඳුනාගත් නිසාය. ආයතනය හරහා ව්‍යවසාය පෙර පෝෂණය වැඩසටහන ක්‍රියාත්මක වන්නේ අදියර 4ක් ඔස්සේයි.

ප්‍රථමයෙන් අයැදුම්පත් සකස් කර එම අයැදුම්පත් හරහා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසු ව්‍යවසායකයන් තෝරා ගනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගන්නා ව්‍යවසායකයන් මාස 3ක උපරිම පුහුණු ක්‍රියාවලියකට යොමු කරයි. මෙහිදී එක් එක් පුද්ගලයාගේ දැනුම හා කුසලතාව මත පුහුණු අවශ්‍යතා කාලය වෙනස් විය හැකිය.

ව්‍යවසාය පෙර පෝෂණ ක්‍රියාවලියේ වටිනාම අංගයක් වන්නේ මේ අයුරින් ස්වයංව නැඟී සිටිය හැකි තත්වයට පැමිණෙන තෙක් ව්‍යවසායකයන් විශේෂ අවධානයකට හා සැළකිල්ලකට බඳුන් කරලීම හරහා සිදුවන ක්‍රියාදාමයයි. එහිදී පෞද්ගලික අංශයේ පිළිගත් ආයතන සමඟ ජාලගත වී ව්‍යාපාර සිහින සැබෑ කර ගනිමින් රටේ ආර්ථික සංවර්ධනයේ හිමිකරුවන් බවට පත්වීමට අවැසි අභිමානවත් ව්‍යවසායකයන් පිරිසක් බිහි කිරීම නිපුණතා සංවර්ධන අරමුදලේ තවත් එක් අරමුණකි.

LP ගෑස් භාවිතය පුළුල් කිරීමේ වැඩසටහනක

ලිට්රෝ ගෑස් ලංකා සමාගම පසුගියදා ශ්‍රී ලංකා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමග විශේෂ ක්‍රමෝපායික හවුල්කාරිත්වයකට එළඹිණි. ඒ අනුව මින් ඉදිරියට තෝරාගත් සමූපාකාර අලෙවිසැල් වල ලිට්රෝ ගෑස් අලෙවි ස්ථාන විවෘත කෙරෙනු ඇත. සමූපකාර අලෙවිසැල් ජාලය විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇති බැවින් මෙය ලිට්රෝ ගෑස් සමාගමට තම වෙළඳපොළ අවකාශය තවතවත් පුළුල් කරගැනීමට ලැබෙන අවස්ථාවක් වනු නිසැකය.

ලිට්රෝ ගෑස් සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි අනිල් කොස්වත්ත කොළොන්නාව කෝප් සිටි ලිට්රෝ ගෑස් අලෙවි ස්ථාන අලෙවිසැල විවෘත කරමින්

සාමාන්‍යයෙන් ලංකාවේ දෛනික LP ගෑස් ඉල්ලුම සිලින්ඩර 80,000 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර තිබුණද තවමත් ග්‍රාමීය ප්‍රදේශවල ඉවුම් පිහුම් සඳහා දර වැනි විකල්ප ඉන්ධන භාවිත වේ. එම තත්ත්වය වෙනස් කර, LP ගෑස් යනු තවදුරටත් 'සුඛෝපභෝගී' භාණ්ඩයක් නොවන බව ජනතාවට පෙන්වා දීම සඳහා, ලිට්රෝ ගෑස් සමාගමේ නව සභාපති/ප්‍රධාන විධායක නිලධාරි අනිල් කොස්වත්තගේ දැක්ම හා නායකත්වය යටතේ එම සමාගම සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමග මෙම නව හවුල්කාරිත්වය ගොඩනංවාගෙන ඇත.

මෙම නව වැඩපිළිවෙළ යටතේ, ලිට්රෝ සමාගම අනුගමනය කරන දැඩි සෞඛ්‍ය, සුරක්ෂිතතා සහ පාරිසරික විධිවිධාන වලට යටත්ව, තෝරාගත් සමූපකාර අලෙවිසැල් වල පූර්ණ පහසුකම් සහිත අලෙවි ස්ථාන ඉදිකිරීම සඳහා ලිට්රෝ ගෑස් සමාගම මගින් ආයෝජනයන් සිදුකරනු ඇත. මෙය රටපුරා විසිරි ඇති සමූපකාර අලෙවිසැල් රාශියකට නව ආකර්ෂණීය පෙනුමක් ලැබීමටද හේතුවක් වනු නිසැක ය.

මූලික අදියරේදී මෙම වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ බහුකාර්ය සමූපකාර සේවා ලිට්රෝ ගෑස් අලෙවිසැල් 40 ක් ඉදිකර ඒවා කළමනාකරණය සඳහා ශ්‍රී ලංකා සමූපකාර දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සිදුකෙරිණි. එමෙන්ම කොළොන්නාව ප්‍රදේශයේද මේ ආකාරයේ අලෙවිසැලක් විවෘත කිරීමත් සමග කොළඹ දිස්ත්‍රික්කය තුළද මෙම වැඩසටහන නිල වශයෙන් ආරම්භ කෙරුණු අතර, අනිල් කොස්වත්ත විසින් මෑතකදී එම අලෙවිසැල විවෘත කරන ලදි.

'LAUGFS Super Family' ප්‍රවර්ධන වැඩසටහනක්

ලාෆ්ස් සුපිරි වෙළෙඳසැල් ජාලය පසුගියදා 'LAUGFS Super Family' නමින් නවතම ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරනු ලැබුවේය. LAUGFS One loyalty කාඩ්පත් හිමියන් සඳහා පමණක් විශේෂයෙන් හඳුන්වාදුන් මෙම ප්‍රවර්ධන වැඩසටහන මගින් පාරිභෝගිකයන් හට LAUGFS One loyalty කාඩ්පත් හරහා වටිනා ත්‍යාග හිමිවන දිනුම් ඇදිමේ තරගයකට ඇතුළත්ව ඉහළ ප්‍රතිලාභ රැසක් අත්කර ගැනීමේ අවස්ථාව උදාවේ. මෙම ප්‍රවර්ධන වැඩසටහන අගෝස්තු 15 දින සිට සැප්තැම්බර් 15 දක්වා ක්‍රියාත්මක වේ.

දිවයින පුරා පිහිටි ලාෆ්ස් සුපිරි වෙළෙඳසැල් 38 තුළ 'LAUGFS Super Family' ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වන අතර මෙම තරඟයට ඇතුළත් වීම සඳහා පාරිභෝගිකයන්ට සිය LAUGFS One loyalty කාඩ්පත භාවිත කර අවම වශයෙන් එක් Crimson බේකරි නිෂ්පාදනයක් සමඟ අවම රුපියල් 2,000ක වටිනාකමකින් යුත් භාණ්ඩ මිලදී ගැනීම් සිදු කළ යුතුය.

සෑම තෝරාගත් ජයග්‍රාහී පාරිභෝගිකයන් සඳහා රුපියල් 20,000/-ක ලාෆ්ස් වවුචර්පත් පිරිනැමෙන අතර නිවසටම භාණ්ඩ ගෙන්වා ගැනීමේ පහසුකමද ලබාගත හැකිය. තවද ජයග්‍රාහකයින්ට Crimson බේකරී වෙතින් රසවත් බේකරි නිෂ්පාදන මෙන්ම JADE අවන්හල් වෙතින් රාත්‍රී භෝජනය සඳහා වවුචර් පත් ද පිරිනැමෙනු ඇත.

සුපිරි වෙළෙඳසැල් සංකල්පය හඳුන්වාදීමෙහිලා පුරෝගාමී වූ ලාෆ්ස් සුපිරි වෙළෙඳසැල් ජාලය ශ්‍රී ලංකාවට පැය 24 පුරාම ක්‍රියාත්මක වන සුපිරි වෙළෙඳසැල් සංකල්පය හඳුන්වාදීමෙහිලා පුරෝගාමීන් වේ. සමාගම දැනට කොළඹ, ඒ අවට මෙන්ම කුරුණෑගල සහ හලාවත සුපිරි වෙළෙඳසැල් 38 ක් ක්‍රියාත්මක කරයි.

සමාගමේ ප්‍රධානතම වෙළෙඳ නාම වන LAUGFS Super සහ LAUGFS SuperMart හරහා මාසිකව 800,000කට අධික පාරිභෝගිකයන් පිරිසකට සේවාව සපයනු ලබයි. සුපිරි වෙළෙඳසැල් ජාලය තුළ Crimson බේකරීස් මෙන්ම Medz' ෆාමසිද පිහිටුවා ඇති අතර උපයෝගීතා බිල්පත් ගෙවීමේ පහසුකම වැනි එදිනෙදා පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරාලන සේවා රැසක් ද LAUGFS තම පාරිභෝගිකයන්හට ලබාදෙයි.

කඩා වැටුණු සංචාරක ක්ෂේත්‍රයට නව මානයක් ගෙනෙන Insel

ලොව ප්‍රථම වතාවට සංචාරක මඟ පෙන්වන්නන් හට, සිය රැකියාවේ සබඳතා ප්‍රයෝජනයට ගනිමින් නව රැකියා අවස්ථාවක් හඳුන්වා දීම, පසුගියදා මොරටුවේ Infinity Global Ventures පුද්ගලික සමාගමේ දී සිදු විය.

ඒ අනුව එහි පළමු අදියර ලෙස, Insel නව වෙළෙඳ සන්නාමය යටතේ, ශ්‍රී ලංකාවේ ඉහළම තත්වයෙන් යුතු, BOPf තේ සහ කුළුබඩු අලෙවි නියෝජිතයන් ලෙස, එම සමාගමේ මෙතෙක් සේවය කළ සංචාරක මඟ පෙන්වන්නන් පනස් දෙනකු අතරින් විසි දෙනකු පත් කෙරිණි. සංචාරක සමාගම් හිමිකරුවන් සතුව බොහෝ විකල්ප ව්‍යාපාර ඇතත්, එවැනි සමාගමක සේවය කරන මඟ පෙන්වන්නන්,සිය විකල්ප ව්‍යාපාරවල කොටස්කරුවන් ලෙස යොදා ගත් පළමු අවස්ථාව ලෙස මෙය වාර්තා වේ.

තේ කොළ හැරුණු කොට කුළුබඩු සියල්ල මිලදී ගන්නේ අනුරාධපුර , පොළොන්නරුව, ඇඹිලිපිටිය සහ තණමල්විල වැනි ඈත පළාත්වලිනි. ඒ ගම්මානවල ගොවීන්ගෙන් අස්වනු සෘජුවම මිලදී ගන්නා නිසා, අතරමැදියන්ට යන මුදල් ඉතිරි වේ. ඒ හැම වාසියක්ම අප ලබා දෙන්නේ ගොවියාගේ සහ ගමේ ආර්ථිකය නංවන්නටයි. දැන් ඔවුන්, සිය අස්වනු දෙන්න කෙනෙක් ඉන්න නිසා, සැකයකින් තොරව, අප වෙනුවෙන්ම වගා කරයි. මේ ගම්මානවල මෝල්වලම, අපේ අධීක්ෂණය යටතේ මේවා ඇඹරීම සිදු කෙරේ.

ඩ්‍රයිව්ග්‍රීන් දුම් පරීක්ෂණ සේවාවට ඉහළ පාරිභෝගික ප්‍රතිචාර

"මුලින්ම කිව යුතුයි, වාහන දුම් පරීක්ෂාව කියන්නේ ඉතාම අගය කළ යුතු වැඩක්. ඩ්‍රයිව්ග්‍රීන් ආයතනයේ මේ වැඩපිළිවෙල ඉතාම හොඳයි. හැම වාහනයක්ම දැන් දුම් පරීක්ෂණ ක්‍රියාවලියට යටත් නිසා වායුගෝලීය ගුණාත්මකභාවය සෑහෙන දුරකට දියුණු වෙලා කියලා මම හිතනවා. ඉස්සර නම් පාරෙ යන්න බැරි තරම් පාර පුරාම වාහන දුම්. දැන් නම් එහෙම තත්ත්වයක් නැහැ" එම සමීක්ෂණයට සහභාගී වූ මාවතගම පදිංචි පළපුරුදු රියැදුරකු වන එස්. එම්. එස්. සෙනෙවිරත්න (51) පැවසීය.

මෙරට වාහන දුම් පරීක්ෂණ ක්‍රියාවලියේ මූලික අරමුණ වන්නේ වායු දූෂණය අවම කරගැනීමට දායක වීම ය. එහෙත් ඒ හරහා වාහන නඩත්තුව සම්බන්ධ වැදගත් තොරතුරු රැසක් ද පාරිභෝගිකයන්ට හිමිවන බව ඩ්‍රයිව්ග්‍රීන් සිදු කළ මෙම පාරිභෝගික ප්‍රතිචාර සමීක්ෂණයේදී හෙළිවී තිබේ.

මරදාන ප්‍රදේශයේ ව්‍යාපාරිකයකු වන තස්නීම් කියාඩ් (32) පෙන්වා දෙන ආකාරයට ඩ්‍රයිව්ග්‍රීන් දුම් පරීක්ෂාවකින් අනතුරුව හිමිවන වාර්තාව මගින් වාහනයේ අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සිදුකිරීම සහ ඉන්ධන අපතේ යාම අවම කරගැනීම පිළිබඳ අගනා මාර්ගෝපදේශනයක් හිමි වේ.

"ඩ්‍රයිව්ග්‍රීන් හරහා දුම් පරීක්ෂාව සිදු කළ විට ලැබෙන වාර්තාව ඔස්සේ වාහනයේ යම් නඩත්තු අවශ්‍යතාවක් පවතිනවා නම් ඒ දේ වහාම කරගත හැකියි. මගේ වාහනය එක පාරක් දුම් පරීක්ෂණය අසමත් වුණා. මට ලැබුණු උපදෙස් අනුව මම වාහනයේ අලුත්වැඩියා සහ සීරුමාරු කටයුතු කරගත්තා. ඉන්පසු පරීක්ෂණය සමත්වුණා විතරක් නෙමෙයි මගේ වාහනයේ ඉන්ධන කාර්යක්ෂමතාවත් වැඩිවුණා. " ඔහු ප්‍රකාශ කළේය. දිවයිනේ සුප්‍රකට සුපිරි වෙළෙඳසැල් ජාලයකට අනුයුක්තව සේවය කරන, ගාල්ල ප්‍රදේශයේ පදිංචි ජේ.ඒ.ආර්.එන්. පෙරේරා (56) ද ඩ්‍රයිව්ග්‍රීන් ආයතනයේ සේවාව පිළිබඳ මෙම සමීක්ෂණයට එක්විය.

"ඩ්‍රයිව්ග්‍රීන් ආයතනයේ සෑම ශාඛාවකින්ම පාහේ අපට එක හා සමාන සේවාවක් ලබාදෙනවා. වායු දූෂණය වැළැක්වීම සඳහා ඩ්‍රයිව්ග්‍රීන් ආයතනය ගෙනයන මේ වැඩපිළිවෙල ඉතාම ප්‍රශංසා කටයුතුයි" ඔහු විස්තර කළේය.

2008 වර්ෂයේදී ආරම්භ වූ ඩ්‍රයිව්ග්‍රීන් ආයතනයේ කළමනාකාරීත්වය භාරව CleanCo Lanka සමාගම කටයුතු කරන අතර, අති නවීන උපකරණ, අන්තර්ජාතික සහතික මෙන්ම දක්ෂ, කැපවුණු සහ සුහදශීලී කාර්ය මණ්ඩලයක් ද සමගින් පාරිභෝගිකයන්ට උසස් සේවාවක් ලබාදීමට ඩ්‍රයිව්ග්‍රීන් සූදානමින් සිටී.

60 Years Celebration Uswattte සිළුමිණ

උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 74

ගුරු චිත්‍රය

ගෝල චිත්‍රය

චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මගින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය. ජයග්‍රාහකයන්ට වටිනා මුදල් ත්‍යාග පිරිනැමේ. තැපැල්පත් සැප්තැම්බර් මස 29 වැනිදාට පෙර පහත ලිපිනයට එවිය යුතු ය. ගුරුගෝල වෙනස, 'සිළුමිණ', ලේක්හවුස්, කොළඹ 10 මෙතෙක් පැවැති ත්‍යාග රටාව වෙනුවට ජයග්‍රාහකයන්ට රුපියල් 2500 බැගින් ත්‍යාග 09 ක් පිරිනැමේ. උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් ලිමිටඩ් අනුග්‍රහයෙනි.

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

රුපියල් විසිපන්දහසක තෑගි

පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කරන්න.

මහජන බැංකුවේ වැලිපැන්නගහමුල්ල සේවා මධ්‍යස්ථානය නව පරිශ්‍රයකට

මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ පීත්ත පටිය කපා නව ශාඛාව විවෘත කළ සුබ මොහොත සහ ගනුදෙනුකාර තැන්පතුවක් බාරගත් අවස්ථාව

මහජන බැංකුවේ වැලිපැන්නගහමුල්ල සේවා මධ්‍යස්ථානය නව පරිශ්‍රයක විවෘත කිරීම පසුගියදා මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ අතින් සිදුකෙරිණ.

මහජන බැංකුවේ නාත්තන්ඩිය ශාඛාවට අනුබද්ධිත මෙම සේවා මධ්‍යස්ථානය අති නවීන තාක්ෂණයෙන් සහ සුවිශේෂී සේවාවන්ගෙන් සමන්විතය.

මෙම අවස්ථාවට නාත්තන්ඩිය ප්‍රාදේශිය ලේකම් ඩී. එම්. ආර්. පී දසනායක, උඩුබද්දාව ප්‍රාදේශිය ලේකම් කුමුදු පී. විතානගේ, මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුද්ගල කේන්ද්‍රිය බැංකු කටයුතු) කේ.බී රාජපක්ෂ, සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) ඒ. යූ. ඒ අන්සාර්, සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) ආර්. රවීකරන්, පුත්තලම ප්‍රාදේශීය කළමනාකාර ලාල් පීරිස්, සහකාර ප්‍රාදේශීය කළමනාකාරිනි මහේෂා සිරිමාන්න, නාත්තණ්ඩිය ශාඛා කළමනාකාර මැක්ෂි පෙරේරා, වැලිපැන්නගහමුල්ල සේවා මධ්‍යස්ථාන කළමනාකාරිනි එම්. ආර්. ඩී ශාන්ති හා ගනුදෙනුකරුවන් විශාල පිරිසක් සහභාගී වූහ.

කොවිඩ් - 19 වසංගතයේ පන්නිපිටිය පෞද්ගලික රෝහලෙන් සහන මල්ලක්

බලපෑම හේතුකොටගෙන ජනතාව තුළ ඇතිවී තිබෙන ආර්ථික අපහසුතා සැලකිල්ලට ගනිමින්, පන්නිපිටිය පෞද්ගලික රෝහලේ සියලුම සෞඛ්‍ය සේවාවන් සඳහා වන අයකිරීම් පහළ දැමීමට එහි කළමනාකාරිත්වය තීරණය කර තිබේ. මෙම විශේෂ මිල අඩු කිරීම, රෝගීන්ගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා මෙන්ම රසායනාගාර පරීක්ෂණ සහ නේවාසික ප්‍රතිකාර පහසුකම් සඳහා ද වලංගුවේ.

මීට සමගාමීව රෝහලේ නේවාසික ප්‍රතිකාර පහසුකම්ද තවදුරටත් වැඩිදියුණු කර , නව මුහුණුවරකින් යුතුව හඳුන්වාදී ඇති අතර, තමන්ට දැරිය හැකි මිල ගණන් සහ රුචිකත්වයට අනුව කාණ්ඩ පහක් යටතේ කාමර පහසුකම් ලබාගැනීමේ අවස්ථාව රෝගීන්ට හිමිවේ. අධි සුඛෝපභෝගී පහසුකම්වලින් යුක්තව මෑතකදී විවෘත කරන ලද "Lotus Wing" කාමර සංකීර්ණයද මෙම කාමර පහසුකම් අතරට ඇතුළත්වේ. අන් කිසිදු පෞද්ගලික රෝහලකින් නොලැබෙන ආකාරයේ අඩු මිලකට මෙම අධි සුඛෝපභෝගී කාමර සංකීර්ණය රෝගීන් වෙනුවෙන් විවෘත තිබේ. දිනෙන් දින ඉහළයන ඉල්ලුමට අනුව, ඉදිරි කාලයේදී මෙම සියලුම කාණ්ඩවලට අයත් කාමර සංඛ්‍යාව තවදුරටත් ඉහළ නංවා සිය සේවාවන් තවදුරටත් පුළුල්කිරීමටද රෝහල සූදානමින් සිටී.

වසර 25කට වැඩි කාලයක් පුරා මෙරට රෝහල් ක්ෂේත්‍රයේ ගෞරවනීය නාමයක් දිනා සිටින පන්නිපිටිය පෞද්ගලික රෝහල 5D අල්ට්‍රා සවුන්ඩ් ස්කෑනින් පරීක්ෂණ ඇතුළු අධි තාක්ෂණික වෛද්‍ය පරීක්ෂණ සහ ප්‍රතිකාර රැසක් පළමු වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් රෝහල ලෙසද ප්‍රකටව සිටියි. පන්නිපිටිය පෞද්ගලික රෝහල රෝගීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම පිණිස පිරිනමනු ලබන OHSAS 18001-2007 ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සහතිකය ඇතුළු දේශීය සහ අන්තර්ජාතික ප්‍රමිති සහතික සහ සම්මාන රැසකින්ද පිදුම් ලබා ඇත. රෝහලේ රසායනාගාර සේවාව ISO තත්ත්ව සහතිකවලින්ද පිදුම් ලබා ඇති අතර, රෝහලේ රසායනාගාරය තුළදී අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සියලුම රසායනාගාර පරීක්ෂණ සිදුකෙරේ. එබැවින් රෝහල වෙත පැමිණෙන ඕනෑම කෙනකුට 100% ක් නිරවද්‍යතාවයෙන් යුතුව ඉතා කඩිනමින් තමන්ගේ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබාගැනීමට අවස්ථාව සැලසෙයි.

'Kelani Breezer' විදුලි පංකාවට පිරිනමන '2 Star' සහතිකය හිමි වේ.

zKelani BreezerZ විදුලි පංකාවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ '2 Star' ප්‍රමිති ශ්‍රේණිගත සහතිකය පිරිනැමූ අවස්ථාව- (වමේ සිට දකුණට) රෝහණ වාද්දුවගේ (අලෙවි කළමනාකරු - විදුලි හා බලශක්ති), අනිල් මුණසිංහ (අලෙවි සාමාන්‍යාධිකාරී), කැලණි කේබල්ස් සමාගමේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, මහින්ද සරණපාල, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය, සිද්ධිකා සේනාරත්න, හසිත කරුණාරත්න (සහකාර අධ්‍යක්ෂ, ඉංජිනේරු අංශය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය) හා ඇන්ජලෝ පෙරේරා (නියෝජ්‍ය අධ්‍යක්ෂ, ඉංජිනේරු අංශය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය)

ශ්‍රී ලංකාවේ අංක 1 ආරක්ෂිත විදුලි රැහන් වෙළඳනාමය වන කැළණි කේබල්ස් PLC සමාගම, තම නිෂ්පාදන පෙළ තවදුරටත් පුළුල් කරමින් පසුගිය වසරේදී මෙරට වෙළෙඳපොලට හඳුන්වාදුන් 'Kelani Breezer' විදුලි පංකාවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිරිනමනි '2 Star' ප්‍රමිති ශ්‍රේණිගත සහතිකය පසුගියදා පිරිනමනු ලැබීය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් එම නිෂ්පාදනය පිළිබඳව සුරක්ෂිතබව, වගකීම් සහතිකය, උසස් ප්‍රමිතිය හා විදුලි කාර්යක්ෂමතාව යන නිර්නායක යටතේ සිදු කළ පුළුල් පරීක්ෂණයකින් පසු එම විශේෂිත ප්‍රමිති සහතිකය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය, සිද්ධිකා සේනාරත්න විසින් කැලණි කේබල්ස් සමාගමේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, මහින්ද සරණපාල වෙත එහි ප්‍රධාන කාර්යාලයේදී පිරිනැමුණි.

දෙවසරක පූර්ණ වගකීමක් පිරිනමන zKelani BreezerZ විදුලි පංකාවෙහි ආරක්ෂික දම්වැල (Safety Chain) මගින් යම් හෙයකින් පංකාව ගැලවී ගියද එය පහළට නොවැටීම, සුළං පෙතිවල තිබෙන නියමිත ආනතයෙන් කදිම සුළං සැපයුම, ද්විත්ව බෙයාරින්ග් යොදා තිබීම එහි විශේෂත්වයකි. තවද සුළංපෙති හා මෝටරයේ ඉහළ හා පහළ කොටස් මළ නොබැඳෙන ආකාරයෙන් සම්පූර්ණයෙන් ඇළුමේනියම් ලෝහයෙන් නිපදවූ මෙරට වෙළෙඳපොලෙහි අලෙවි කෙරෙන එකම විදුලි පංකාව වන්නේද zKelani BreezerZ ය.

100%ක්ම දේශීය සමාගමකවන කැළණි කේබල්ස් සමාගම, ගෙවුණු 50වසර පුරා දෙස් විදෙස් හි පිරිනැමෙන බොහෝ තත්ත්ව සහතික රැසකට හිමිකම් කී සමාගමකි.

හේමාස් චාරිකා සහ ගුවන්සේවා සමූහය 'ACORN' නමින් ප්‍රතිසන්නාම ගතවේ

Acorn සමූහය, චාරිකා සහ ගුවන්සේවා කර්මාන්තය තුළ බහුවිධ ව්‍යාපාරයන් සහ ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර සන්නාමයන් රැසකට හිමිකම් කියනු ලබයි. මෙම සමූහයේ මූලිකත්වය හොබවන්නේ, අත්දැකීම් බහුල වෘත්තිකයන් කණ්ඩායමක් විසිනි. චාරිකා සහ සංචාරක කර්මාන්තයේදිනෙන් දින අලුත්වන වටපිටාව අනුව හැඩගැසෙමින්, අසම-සම, විශිෂ්ට සේවාවක් සැපයීම එම කණ්ඩායමේ මූලික අරමුණයි.

ප්‍රධාන විධායක
මාලිංග අර්සකුලරත්න

චාරිකා සහ ගුවන්සේවා කර්මාන්තය තුළ සාර්ථකත්වය කරා යන ගමනේ දී, ගුවන්සේවා, ගමනාන්ත කළමනාකරණය සහ විදේශ චාරිකා යන අංශ තුන හරහාවිශිෂ්ට ගණයේ සැලසුම් සහ සේවාවන් රාශියක් පිරිනමන්නට Acornකටයුතු කර ඇත. තවද, Acorn සමූහය මේ අත්දමින් සාර්ථකත්වය කරා මෙහෙයවන්නට පෙරමුණ ගෙන සිටිනුයේ, මෙම කර්මාන්තය තුළ දැවැන්තයින් ලෙස නම් දරා සිටින වෘත්තිකයන් වන මාලිංග අර්සකුලරත්න, දර්ශන පෙරේරා, හරිත් පෙරේරා, දුෂී ජයවීර, සුරංජිත් ද ෆොන්ස්කා සහ හුසේන් හබීබ් යන මහත්වරුන්ගෙන් සැදුම් ලත් කණ්ඩායමකි.

විනෝද කටයුතු සහ ආයතනික චාරිකා යන අංශ දෙක වෙතම පැකේජ වශයෙන් මෙන්ම පුද්ගලික අවශ්‍යතාවන්ට ගැළපෙන අන්දමට සැකසූ චාරිකා විසඳුම් ලබාදෙමින් ලොව පුරා අත්දැකීම් අත්විඳීමේ අවස්ථාව සිය ගනුදෙනුකරුවන් වෙත ලබාදීමේ සුවිශේෂී නාමයක් මෙම සමාගම හිමිකරගෙන ඇත. චාරිකා කර්මාන්තයේ පුරෝගාමියෙකු වශයෙන්, දේශීය හා විදේශීය ගුවන් සමාගම්, නැව් සමාගම්, බස්රථ චාරිකා, දුම්රිය චාරිකා, වීසා උපදේශන සහ ගුවන් තොටුපළ වල විවේකාගාර වෙන්කරවා ගැනීම් ඇතුලුව, සියල්ල අඩංගු චාරිකා විසඳුම් ලබාදීම අතින් ද ඉදිරියෙන්ම සිටින සමාගමකි.

වාණිජ මණ්ඩලී

පීපල්ස් ලීසිං වෝඩ් පෙදෙස ශාඛාව නව පරිශ්‍රයකට..

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ කොළඹ 07 වෝඩ් පෙදෙස ශාඛාව, ගනුදෙනුකරුවන්ට වඩාත් සුවපහසු හා කඩිනම් මූල්‍ය සේවාවක් ලබාදීමේ අරමුණෙන් නව පරිශ්‍රයක (අංක 04, බැස්ටියන් දේවස්ථාන පාර, කොළඹ 07) එම සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, සබ්‍රි ඊබ්‍රහිම්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා විවෘත කෙරුණි.

පීපල්ස් ලීසිං කොළඹ 07 නව ශාඛාව විවෘතකිරීමේ උත්සවයට එම සමාගමේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්වන සංජීව බණ්ඩාරනායක හා ලයනල් ප්‍රනාන්දු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්වන රොහාන් තෙන්නකෝන්, ලක්සඳ ගුණවර්ධන හා ප්‍රභාත් ගුණසේන, ප්‍රධාන කළමනාකරු, හසන්ත ද සිල්වා හා කොළඹ 07 පීපල්ස් ලීසිං ශාඛා කළමනාකරු, සුමුදු ප්‍රනාන්දු ඇතුළු ගනුදෙනුකරුවෝ රැසක් සහභාගී වූහ.

පීපල්ස් ලීසිං ලබාදෙන මූල්‍ය සේවාවන් අතර ලීසිං, වාහන ණය, ස්ථාවර තැන්පතු, ඉතුරුම් ගිණුම්, නිවාස හා ව්‍යාපාරික ණය පහසුකම්, ණය සාධ්‍යකරණය (Factoring), ආන්තික වෙළඳාම (Margin Trading) රන් ණය සහ ඉස්ලාමීය මූල්‍ය පහසුකම් වන අතර පීපල්ස් ඉන්ෂුවරන්ස්, පීපල්ස් මයික්‍රෝ කොමර්ස්, පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලොප්මන්ට්, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් හා පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් සහ බංගලාදේශයේ ස්ථාපිත ලංකන් එලායන්ස් ෆිනෑන්ස් යන සමාගම් එහි අනුබද්ධිත සමාගම් වෙති.

දිවයින පුරා ව්‍යාප්ත ශාඛා ජාලය හරහා තමන්ට වඩාත්ම සුදුසු මූල්‍ය සැලසුම් සුහදශීලීව, කඩිනමින් හා විශ්වාසනීය ලෙස සපුරාගැනීමට සිය ගනුදෙනුකාරභවතුන්ට අවස්ථාව සැලසීම පීපල්ස් ලීසිං සමාගමේ සුවිශේෂීත්වය වේ.

CDB මූල්‍ය වර්ෂය ජයග්‍රාහී ලෙස අවසන් වෙයි

සභාපති - රංග අබේනායක

2020/21 පළමු කාර්තුවේ සමස්ත වත්කම් රු. බිලියන 96.7 පසුගිය වසරේ පාස්කු ඉරිදා ප්‍රහාරය සහ මේ වසරේ COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ආර්ථික අභියෝග හමුවේ වුව ද සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී (CDB) ආයතනය 2019/20 මූල්‍ය වර්ෂය සඳහා රු. බිලියන 1.8 ක ශක්තිමත් බදු පසු ලාභයක්, 1.6% ක වාර්ෂික වර්ධන අනුපාතයක් අත්කර ගැනීමට සමත් විය.

ගතවූ වසරේද CDB ආයතනය අඛණ්ඩව ඇගයුමට ලක් විය. වසර 25 ක ඉතිහාසයේ පළමු වරට Business Today Top 30 ලැයිස්තුවට ඇතුළත් වූ CDB ආයතනය විශිෂ්ටත ම ආයතනික පුරවැසි තිරසාරත්ව සම්මාන උළෙලේදී විශිෂ්ටතම ආයතනික පුරවැසියන් 10 දෙනා අතරට එක් වීමට ද, ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදී බැංකු නොවන මූල්‍ය සේවා අංශයේ ජයග්‍රාහකයා වීමට ද සමත් විය.

ශ්‍රී ලංකන් තෝරාගත් ගමනාන්ත කිහිපයකට ගුවන්ගමන් අඛණ්ඩව...

August 27 2020, Colombo: ශ්‍රී ලංකන් ගුවන්සේවය විසින් තෝරාගත් ගමනාන්ත කිහිපයකට අඛණ්ඩව ගුවන් ගමන් සේවා සිදු කරයි.

ඒ අනුව ඉතාලියේ - මිලාන්, එක්සත් රාජධානියේ - ලන්ඩන්, ජපානයේ - ටෝකියෝ, මාලදිවයිනේ - මාලේ, ජර්මනියේ - ෆ්‍රැන්ක්ෆර්ට්, ප්‍රංශයේ - පැරිසිය හා ඔස්ට්‍රේලියාවේ - සිඩ්නි එම ගමනාන්ත වේ.

මෙම ගුවන්ගමන් සඳහා එක්වීමට අපේක්ෂා කරන මගීන් ශ්‍රී ලංකන් ගුවන්සේවයේ ගාල්ල, නුවර සහ කොළඹ කාර්යාල හරහා වෙන්කරවා ගැනීම් සිදුකළ හැකිය.

ප්‍රහේලිකා අංක 115 — රුපියල් පනස්දහසක තෑගි

කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 115 යනුවෙන් සඳහන් කර ඩේන්ට් මයිලේඩ් චොෆි දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට සැප්තැම්බර් 16 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය සහ දුරකතන අංකය ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම සැප්තැම්බර් 20දා සිළුමිණ පත්‍රයේ පළ වේ. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත තෑග මුදල් පිරිනැමේ. ඔබේ තෑග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය - 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ට් ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

උපකාරක පද

හරහට

1. ජල විදුලි බලාගාරයක් නිසා ම ප්‍රසිද්ධියට පත් දිය ඇල්ල
5. පාද නැති
7. නවරත්න
8. පතිව්‍රතා ධර්මය
9. 'ඇද' යන්න සමඟ වාක්ශ්ලිෂ්ටත්වය සඳහා යෙදෙන්නකි
10. රජ්ජුරුවෝ
11. ජගත් කීර්තියට පත් හිමිනමක් නිසා ප්‍රකට වූ මාතර දිසාවේ ගමකි
12. බඩුබාහිරාදිය ණයට ගැනීමේ දී ඉදිරිපත් කරන කාඩ්පත
14. ප්‍රකට වැදි ජනාවාස භූමියකි
17. තරුව
18. 'බැද්දෙගම' නවකතාවේ ප්‍රධාන චරිතය
20. මිනිත්තුවට මේවා හැටකි

පහළට

2. අහස-පොළොව ළං වී තිබෙන්නාක් මෙන් පෙනෙන ස්ථානය
3. 1818 කැරැල්ලෙන් පසු පලා ආ ජනයාගෙන් ජනාවාස වූ අම්පාර දිසාවේ වෙරළබඩ ගම්මානයකි
4. අලුත්
5. දුර්වර්ණ/ අඳුරුපාට
6. අලුයම / උදැසන
8. මෙරට ප්‍රථම ලාංකේය පුරාවිද්‍යා කොමසාරිස්
13. ලෝකෙට ..... ගෙදර මරගාතේ
15. වේගපන්දුවත් අමුතු කොණ්ඩා විලාසිතාවත් නිසා ජනාදරයට පත් ක්‍රිකට් ක්‍රීඩකයා
16. අන්ධකාරය
19. උදුන

1	2		3	4	■	5	6
■		■	7				
8				■	■	9	
10		■	11				
12		13		■	■		■
	■	14			15	■	16
17				■	18	19	
	■		■	20			

ප්‍රහේලිකා අංක 115

නම: .....

ලිපිනය: .....

අත්සන: .....

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

අම්බලන්ගොඩ ජනතාවගේ හද දිනූ ජනතා සේවකයා ඇල්. සී. ද සිල්වා

● **පියසේන වතුදුර** - දිගාමඩුල්ල සංවාරක

ලංකා සම සමාජ පක්ෂයේ ප්‍රබල ක්‍රියාකාරිකයකු වූ අම්බලන්ගොඩ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඇල්. සී. ද සිල්වාගේ ජන්ම ශත සංවත්සරය අගෝස්තු 31 වෙනිදා ට යෙදී තිබිණ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.

1970 මහ මැතිවරණයේ දී ගාලු දිස්ත්‍රික්කයේ බලපිටිය, අම්බලන්ගොඩ, බද්දේගම ආසන සම සමාජ පක්ෂයට සහ රත්ගම ආසනය කොමිනියුට්ස් පක්ෂයට අයත් විය. ඒ අතුරින් අම්බලන්ගොඩ මන්ත්‍රී එල්. සී.ද සිල්වා ජනප්‍රියම මන්ත්‍රීවරයා විය. ගාල්ල මැතිවරණ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා ලෙස එක්සත් ජාතික පක්ෂයේ ආචාර්ය විජයානන්ද දහනායක ද අක්මීමන හබරාදූව බෙන්තර ඇල්පිටිය සියලුම ආසන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සතු විය. එවකට ගාල්ල මහ දිසාපතිවරයා වශයෙන් කටයුතු කරනු ලැබුවේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියකු වූ බ්‍රැඩ්මන් වීරකෝන් ය.

වතුගෙදර සුළු නගර සභාව බලපිටිය මැතිවරණ කොට්ඨාසයට අයත් වේ. වතුගෙදර පින්නදූවේ පදිංචිව සිටි එල්. සී. ද සිල්වා නොකඩවා වාර කිහිපයක් වතුගෙදර සුළු නගර සභාවේ සභාපතිවරයා වශයෙන් පත්විය. ඉන් අනතුරුව 1965 දී කුල බේදය නොතකා බලපිටිය ආසනයේ ජනතාව ඔහු බලපිටිය මන්ත්‍රීවරයා වශයෙන් පත්කර ගනු ලැබීය. රජය සමග කොන්ත්‍රාත් පවත්වාගෙන යෑමේ හේතුව මත ඉදිරිපත් වූ ඡන්ද පෙත්සමක් නිසා 1968 ඔක්තෝම්බර් මාසයේ දී එල්.සී ද සිල්වාට අධිකරණය මගින් ආසනය අහිමි කරනු ලැබීය. 1970 දී අම්බලන්ගොඩ ආසනයට ඉදිරිපත් වී විශාල ඡන්ද සංඛ්‍යාවකින් ආසනය දිනා ගැනීමට ඒ මහතාට හැකි විය. නමුත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා බලයට පත්වීමෙන් පසුව එම නීතිය ඉවත් කිරීම නිසා අද පාර්ලිමේන්තුවට පත් වන මන්ත්‍රීවරුන්ට රජය සමග කොන්ත්‍රාත් පවත්වාගෙන යෑමට බාධාවක් නැත.

1964 දී මුදල් ඇමති ආචාර්ය එන්. එම්. පෙරේරා විසින් එල්.සී. ද සිල්වා ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබීය. ඒ සඳහා ලැබෙන දීමනා පවා ඔහු ප්‍රතික්ෂේප කරනු ලැබීය. ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ සේවක මණ්ඩලය සඳහා දිනකට දෙවතාවක් තේ පානය කිරීමට ලබා දුන්නේ සේවක සුබ සාධනය ගැන උනන්දුවක් දැක්වූ නිසාය. එමෙන්ම ඒ මහතාගේ අම්බලන්ගොඩ කාර්යාලයට පැමිණෙන හැම කෙනෙකුටම කිරි තේ එකක් නම් වැරදුණේ නැත.

එල්. සී. ද සිල්වා මෙම ලියුම්කරුට හමුවූයේ 1969 යේ අවසානයේ දීය. අම්බලන්ගොඩ මන්ත්‍රීවරයා වශයෙන් පත් වීමෙන් පසුව 1970 දී ඔහු සමග සම්බන්ධතාව වැඩි විය. ඔහු අවංක කාර්යශූර මන්ත්‍රීවරයකු මෙන්ම අවංක දානපතියකු විය. කොයි කවුරු වුවත් ඉල්ලා

ඡන්ද පෙත්සමක් නිසා 1968 ඔක්තෝම්බර් මාසයේ දී එල්.සී ද සිල්වාට අධිකරණය මගින් ආසනය අහිමි කළා

1970 දී අම්බලන්ගොඩ ආසනයට ඉදිරිපත් වී විශාල ඡන්ද සංඛ්‍යාවකින් ආසනය දිනා ගත්තා

සිටින උදව්වක් කිරීමට ඔහු පසුබට වූයේ නැත. ව්‍යාපාරිකයෙක් වුවත් මුදල් අත නොතිබුණත් තමන්ගේ මැණියන්ගෙන් ඉල්ලා හෝ මුදලක් දිය යුතු පුද්ගලයාට ලබා දීම ඔහුගේ සිරිතක් විය. තමන්ගේ මැතිවරණ කොට්ඨාසයේ දුප්පත් පුද්ගලයන්ගේ අවමංගල අවස්ථාවන් හිදී මිනී පෙට්ටිය පවා ලබා දීමට ඔහු කටයුතු කළ අන්දම ඒ මේ ලියුම්කරු දනී. ඒ වකවානුවේ දී මන්ත්‍රීවරයකුගේ වැටුප රුපියල් 1500.00 ක් යැයි ඔහු මේ ලියුම්කරුට පවසා ඇත.

'මට හම්බවෙන පඩිය රුපියල් 1500.00යි. ඒක බන් මට පැට්ටල් ගහන්නත් මදි. ආණ්ඩුවෙන් පැට්ටල් දෙනවා නම් හොඳයි' කියා ඔහු පැවසූ බව මෙම ලියුම්කරුට මතකය. රුපියල් 1500 ක් ලැබුණත් ඔවුන් කරනු ලැබූ සේවය අද සිටින පුද්ගලයන්ට ලක්ෂ ගණනක් ලැබුණත් ඉටු කරනවා දැයි සිතා බැලිය යුතුය.

ඔහු හෙක්ටර් කොබ්බෑකඩුව ඇමතිතුමාගේ ඉතා විශ්වාසවන්ත පුද්ගලයෙක් විය. බටපොළ, අලුත්වල, අම්බලන්ගොඩ, පොල්වත්ත ප්‍රදේශ වල කෘෂිකර්ම මධ්‍යස්ථාන 03 ක් ඉදි කර ලංකා බැංකු ශාඛා 03 ක් විවෘත කරනු ලැබුවේ ඒ අනුවය. අම්බලන්ගොඩ පොල්වත්ත, ගෝනාපීනුවල, අලුත්වල යන ප්‍රදේශවල කුඹුරු අක්කර

දහස් ගණනක් පුරන් වී තිබුණේ කරදිය ගැලීම සහ වතුර හිඟකම නිසාය. මෙසේ තිබුණු කුඹුරු වල අයිතිකාරයන්ට ලංකා බැංකුව මගින් ණය ලබා දී පුරන් කුඹුරු අස්වැද්දීමට පියවර ගැනීමෙන් එම පළාත් වල ජනතාවගේ ආර්ථික දියුණුව ඇති කරනු ලැබීය .

මීටියාගොඩ ප්‍රදේශයේ අක්කර දහස් ගණනක් වසර 50කට වැඩි කලක් ප්‍රයෝජනයට ගත හැකි පිඟන් මැටි ඉල්ලමක් තිබෙන බව භූ විද්‍ය සමීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබූ පරීක්ෂණයක දී හෙළි කර ගනු ලැබිය. ඒ මගින් මීටියාගොඩ පිඟන් මැටි කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට හැකියාව ලැබුණේ කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති ටී. බී. සුබසිංහගේ සමග තිබුණු සම්බන්ධතාව නිසාය. මෙසේ ලබා ගන්නා කිරි මැටි පිරිසිදු කර අගමැතිනියගේ උපන් ගම වන බලංගොඩ ආරම්භ කරනු ලැබූ පිඟන් කම්හලට ගෙන යනු ලැබවේ මීටියාගොඩ මැටි කම්හල මගිනි.

1971න් පසුව එවකට විපක්ෂ නායක ජේ. ආර්. ජයවර්ධනගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පිරිසක් ප්‍රංශයට ගිය අතර එම කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන් එල්. සී. ද සිල්වා ද එම ගමනට සහභාගි විය. 1970 යුද හමුදා සහ පොලිසියේ නිලධාරීන් විසින් මරා දමන ලැබූ කතරගම රූපසුන්දරිය පේමාවති මනම්පේරි සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වන ලෙස එහි දී චන්ද්‍රිකා බණ්ඩාරනායක ඇතුළු සෝබෝන් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් විසින් පෙළපාළි ගිය බව එල්. සී. ද සිල්වා මේ ලියුම්කරු සමග පවසා තිබුණි. පේමාවති මනම්පේරි සිද්ධිය පිළිබඳව ශ්‍රී ලංකා රජයේ පරීක්ෂණ කඩිනම් වූයේ ඉන් පසුවය.

එල්.සී. ද සිල්වාගේ දෙවන පුත්‍රයා චිත්‍රා ද සිල්වා ලංකා තුනී ලෑලි සංස්ථාවේ සේවය කරන අතරතුරදී රුමේනියාවේ වැඩිදුර අධ්‍යාපනයට ගොස් සිටිය දී එල්. සී. ද සිල්වා, සිය පුත්‍රයා හමුවීමට රුමේනියාවට ගිය අතර ඔහුට පුත්‍රයා හමු වීමට සිදු වූයේ රාජ්‍ය අමුත්තකු වශයෙන් ය. ශ්‍රී ලංකාවේ අගමැතිනිය ගමන් කරන අවස්ථාවේ දී මාර්ග වසා තැබීම ගැන අපි විරුද්ධව කතා කළත් රුමේනියාවේ ජනාධිපතිවරයා ගමන් කරන විට එම ප්‍රදේශයේ සියලුම මාර්ග පැය ගණන් වසා තබන බව ද ඔහු මෙම ලියුම්කරු සමග පවසා ඇත. කෙසේ වෙතත් එවකට බණ්ඩාරනායක අගමැතිනියට ලබා දී තිබූ ආරක්ෂාව අනුව අද රාජ්‍ය නායකයන්ට ලැබෙන ආරක්ෂාව 100% ක්ම වැඩිය. එල්. සී. ද සිල්වා අම්බන්ගොඩ මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කරන කාලයේ දී හැම මාසයකටම වරක් අම්බලන්ගොඩ ආසනයේ කිසියම් උත්සවයක් ඔහු විසින් සංවිධානයක කරනු ලැබීය. ඒ හැම දිනයකදීම පැමිණෙන සියලු මැති ඇමතිවරුන්ට, රජයේ නිලධාරීන්ට රස මසවුලින් යුත් ආහාර වේලක් සපයනුයේ එල්. සී.ද සිල්වාගේ පින්නදූව නිවසේ දී ය. බණ්ඩාරනායක අගමැතිනියගේ පවුලේ දරුවන් පවා එම අවස්ථාවන්ට සහභාගි වූහ.

සම සමාජ නායකයන් අතර මෙන්ම සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිතුමියටද එල්. සී. ද සිල්වා විශ්වාසවන්ත පුද්ගලයෙක් විය. මැතිනියගේ අලි ඇතුන් එල්. සී. ද සිල්වා ගේ දැව කර්මාන්ත වලට ගෙන විත් එම සතුන් වෙනුවෙන් ගෙවීම් කරන විට ''එල් සී මෙච්චර සල්ලි'' කියමින් බණ්ඩාරනායක මැතිනිය ද පුදුම වනවා යැයි ඔහු පවසන්නේ ඔහුගේ අවංකභාවය පිළිබඳවය.

1975 අවසානය වන විට එන් එම් පෙරේරා මුදල් ඇමතිවරයා වශයෙන් ධනපති පන්තියට එරෙහිව යෝජනා කරනු ලැබූ බදු වලට අමතරව සමාජවාදි ගමනේ දී අම්බලම් නැත යන කියමනට විරුද්ධව පීලික්ස් ඩයස් බණ්ඩාරනායක ඇතුළු ධනපති කණ්ඩායම මෙහෙයවනු ලැබූ අරගලයට මැතිනියද මැදිහත්වීම නිසා 1977 දී 6 න් 05 ක බලයන් සහිත රජයක් පිහිටුවා ගැනීමට ජේ.ආර් ජයවර්ධනට හැකියාව ලැබුණි.

එන්.එම් කොල්වින් ලෙස්ලි යන ඇමතිවරුන් ඇමති තනතුර වලින් ඉවත් වන ලෙස අගමැතිනිය විසින් බල කරනු ලැබූ අවස්ථාවේ දී මාස ගණනාවක් තිස්සේ එයට අදාළ ලිපි හුවමාරුව කරනු ලැබුවේ එල්. සී. ද සිල්වා හරහා බව ඔහු මේ ලියුම්කරු සමග පවසා ඇත.

1965 රජය කාලයේ දී රේගුව, ධීවර සංස්ථාව, දැව සංස්ථාව, නැව් සංස්ථාව තුළ සිදු වූ දූෂණ සොයා බැලීමට අගමැතිනිය විසින් පත් කළ කොමිටි වල සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබුවේ එල්. සී. ද සිල්වාය. එම කමිටු වල ලේකම්වරයා වශයෙන් ජනාධිපති නීතිඥ ඩී. එස්. විජේසිංහ කටයුතු කරනු ලැබිය.

අදට වඩා ආදර්ශවත් පරිත්‍යාගශීලීන් වශයෙන් එදා දේශපාලඥයන් කටයුතු කළ අන්දම වර්තමානයේ දී ජීවත් වන අයට දැන ගැනීම සඳහා මෙසේ සටහන් කිරීමට සිත් විය.

ජීවිතය සිල්ලර කළ මහමඟ අනතුරු

● **සකස් කළේ - නිලංකා ජයසූරිය**

ඉකුත් මාසයේ තුන්වැනි සෙනසුරාදා විසි හතර පැය තුළ දිවයින පුරා සිදුවූ මාරක රිය අනතුරු හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව එකොළහකි. රිය අනතුරු හේතුවෙන් වසරකට ලොව පුරා වෙසෙන පුද්ගලයන්ගෙන් මිලියන එකසිය විසි හතරක් මරණයට පත්වද්දී දිනකට එසේ මිය යන සංඛ්‍යාව තුන්දහස් හාරසියය ඉක්මවයි. ලොව පුරා සිදුවන මරණවලට හේතු වන ප්‍රධාන කරුණු අතර රිය අනතුරුවලට හිමිවන්නේ නව වැනි ස්ථානයයි. මැලේරියාවෙන් හා දියවැඩියාවෙන් මිය යන සංඛ්‍යාවට වඩා වැඩි පිරිසක් වාහන අනතුරු හේතුවෙන් මියයන අතර එය ලොව පුරා ඒඩ්ස් රෝගය නිසා සිදුවන මරණ සංඛ්‍යාවට ආසන්නය.

රිය අනතුරක් සිදුවූ විට හදිසියේ නින්දෙන් අවදි වූවන් සේ ඒ ගැන කම්පා වී නිහඬ වීමට වඩා රිය අනතුරු අඩු කර ගැනීමට සියලු දෙනා අවධානය යොමු කළ යුතුය. ඒ සඳහා රථවාහන අනතුරුවලට බලපාන හේතු පිළිබඳව දැනුම්වත් විය යුතුය. රථවාහන අනතුරුවලට බලපාන සැබෑ හේතු පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සෞඛ්‍ය තොරතුරු පිළිබඳ මහාචාර්ය අචල ජයතිලක මහතා මෙසේ අදහස් දැක්වීය.

" 2020 වසර වනවිට රිය අනතුරු හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාව අඩකින් අඩුකර ගැනීම එක්සත් ජාතීන්ගේ තිරසර ඉලක්කයන් අතර එක් ඉලක්කයක් වූවත් ලෝකයේ කිසිදු රටක් එම ඉලක්කයට ළඟාවීමේ සලකුණක් හෝ දක්නට නැහැ. 2018 හා 2019 දෙවසර තුළ රිය අනතුරුවලින් මිය ගිය සංඛ්‍යාව කිසිදු ආකාරයකින් පහත බැස නොතිබීම මෙයට හොඳම නිදසුනක්. පසුගිය මාස කිහිපය තුළ COVID අවදානම මත ප්‍රවාහනය සීමා වීමෙන් රිය අනතුරු හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාව අඩු වුවත් සාමාන්‍ය තත්ත්වය නම් අනතුරු හේතුවෙන් දිනකට මෙරට පුද්ගලයන් පස්දෙනකු මහමඟදී ජීවිතක්ෂයට පත්වේ.

මෙම වසරේ මාර්තු මස සිට මේ වනතෙක් COVID හේතුවෙන් ගමනාගමනයට සීමා පැනවුණ අතර ඒ තුළින් අපට අපූරු පාඩමක් ඉගෙන ගැනීමට හැකි වුණා. එනම්, තොරතුරු තාක්ෂණය හා පරිගණක යොදාගෙන කටයුතු කිරීම අප සිතා සිටි තරම් ගැටලු සහගත දුෂ්කර වෙහෙසකාරී කාර්යයක් නොවන බවයි. COVID වසංගතය ආරම්භ වනවිටත් ලෝකයේ ඇතැම් රටවල් (Online) 'අන්තර්ජාලය' මගින් වැඩ කටයුතු කිරීමට හුරු පුරුදුවී සිටියත් අප රටෙහි මිනිසුන් අතර එවැනි හුරුවීමක් හෝ ඒ පිළිබඳ දැනුවත්කමක් තිබුණේ නැහැ. බොහෝ දෙනකු සිතුවේ එය ඉතාමත් 'අසීරු' කාර්යයක් හැටියටයි. නමුත් ඒ සිතුවිලි මිත්‍යාවක් බවට පත්කරමින් මසක් වැනි කෙටි කාලයක් තුළ සමාජ දුරස්ථභාවය තබා ගනිමින් සියල්ල අන්තර් ජාලය (Online) හරහා කරන්නට හැකි බව අවබෝධ කර ගැනීමට සමත් වුණා.

රටම වසා තිබීම (Lock Down) එක් අතකින් ආර්ථික වශයෙන් විශාල පසුබැසීමකට හේතු වූ අතර මෙම කාලය තුළ සැලකිය යුතු මට්ටමේ වාහන අනතුරු සංඛ්‍යාවක් වැළකුණේ ප්‍රවාහනයට සීමා පැනවී තිබීම නිසයි. ඒ හේතුවෙන් ප්‍රවාහනය සඳහා යොදවනු ලබන වාහන සංඛ්‍යාව අඩුවීම රිය අනතුරු සංඛ්‍යාව පහත බැසීමට හේතුවක් ලෙස දැක්විය හැකියි."

ගමනක් යන්නට සූදානම් වී පාරට බසින විට තමනට එම ගමන ගොස් ආපසු එන්නට හැකිවේදැයි සිතන්නේ කවුරුන්ද? එහෙත් දිනකට පාරට බසින සිය දහස් ගණනක් පුද්ගලයන්

සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය පිළිබඳ මහාචාර්ය අචල ජයතිලක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය

අතරින් අට දෙනෙකු ආපසු නිවසට නොපැමිණෙන අතර ඉන් එක් අයෙකු ළමයකු බව ඇසුවහොත් ඇතැම් විට ඔබ මවිත වනු ඇත.

මේ අන්දමින් දිනකට ලෝකය පුරා වෙසෙන දරුවන් අතරින් නිවසින් පිටව යන දරුවන් සංඛ්‍යාවෙන් පන්සියයක් අනතුරුවලට ගොදුරුවී මරණයට පත්වීම හේතුවෙන් ආපසු නිවසට නොපැමිණීම මොන තරම් බේදවාචකයක්ද?

පසුගිය කාල සීමාව පිළිබඳ විමසිල්ලෙන් බැලුවහොත් අවමංගල අවස්ථාවන්ට සහභාගි වී ආපසු එමින් සිටියදී මාරක රිය අනතුරුවලට මුහුණ පෑවේ සුළු සංඛ්‍යාවක් නොවන බව පැහැදිලි කරුණකි. බොහෝ විට මළ ගෙවල් පිළිබඳ සිදුවීම් දැනගැනීමට ලැබෙන්නේ හදිසියේය. එබැවින් මළ ගෙදර තිබෙන්නේ මන්නාරමේද? මඩකලපුවේද? යාපනයේ ද? යන්න පිළිබඳ සිතා, සැලසුමක් සහිතව මළ ගෙදර යෑමට වඩා බොහෝ දෙනෙකු උනන්දු වන්නේ රැකියාව නිම වී එතැනින් ම මළගෙදර යෑමටයි. දවස පුරා වෙහෙස මහන්සි වී එසේ මළගෙදර ගොස් ඇතැම් විට මත්පැන් පවා ගෙන පැය කිහිපයක් අල්ලාප සල්ලාපයෙහි යෙදී හිඳ රාත්‍රියෙහි නිදිමත දැනෙන වේලාවෙහි මෙසේ දුර ගමන් යෑම ඉතා අවදානම් සහිතය. ඇතැම් විට එය මාරක අනතුරකට මුහුණ පෑමට ඉඩ ඇති ගමනක් යැයි කිසිවකු සිතන්නේ නැත.

වාහන අනතුරුවලට හේතු වන්නේ 'වාහන' නම් රිය අනතුරු සාර්ථකව මැඩ පවත්වන ස්වීඩනය, ඩෙන්මාර්කය, කැනඩාව, පින්ලන්තය මෙන් ම ආසියාතික රටක් වූ ජපානය වැනි රටවල් ගැන බැලිය හැකිය. මෙම රටවල වාහන සංඛ්‍යාව අඩු නොවන අතරම ඇතැම් විට එකම පවුලකට වාහන දෙක තුනක් තිබෙන අවස්ථාද දැකගත හැකිය. වාහන අනතුරකදී ගැටලුව වාහනය වුවත්, සැබෑ ගැටලුව වාහනය නොව, වාහනයේ තත්ත්වය සහ වාහනය පාවිච්චි කරන ආකාරයයි. මෙරට වැඩි වශයෙන් අනතුරට පත්වන්නේ ත්‍රිරෝද රථ, මෝටර් සයිකල්, පාපැදි හා පදිකයින් ය. එහිදී බාහිර ආවරණයක් නොමැති බැවින් අනතුරකදී ශරීරයට හානි සිදුවීමට මෙන් ම මරණයට පත්වීමට ඇති අවදානමද ඉහළය.

වාහන අනතුරු බහුල වීමට බලපාන කරුණු අතර වාහන පිළිබඳව පවත්නා නීති ක්‍රියාත්මක කරන ආකාරය ගැන ද විමසා බැලිය යුතුය. නීති සම්පාදනය වී තිබුණත් එම නීති පිළිපදින්නේද යන්න ගැටලු සහගතය. බොහෝ විට පොලිස් නිලධාරියකු මාර්ගයෙහි සිටින විට නීති ගරුකව පාරේ යෑමට සහ රිය පැදවීමට බොහෝ දෙනකු උනන්දු වූවත් පොලිස් නිලධාරියකු පෙනෙන්නට නොසිටින විට සමාජයෙහි හැසිරීම ඒ ආකාරයෙන් සිදු නොවන බව ප්‍රසිද්ධ කාරණාවකි. රථ වාහන පැදවීමේදී මාර්ගවල තත්ත්වය ගැනද සැලකිලිමත් විය යුතුය.

වැඩිහිටියන් වශයෙන් අප උත්සාහ කරන්නේ වඩා හොඳම දේ ඔවුනට ලබාදීමටයි. එසේ දරුවන්ට හොඳම දේ දෙන්නට සිතුවද වාහනයක ළමුන් රැගෙන යද්දී හොඳම ආරක්ෂාව සපයා දීම පිළිබඳව කල්පනා නොකිරීම ගැටලුවකි. ළමයෙකු මෝටර් රථයක ගමන් කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳව තවමත් බොහෝ දෙනෙකු කටයුතු කරන්නේ අනවබෝධයකින් මෙන් ම නොසැලිකිමත්ව යැයි පැවසුවහොත් එහි වරදක් නැහැ.

වාහනයක් පදවන විට දරුවා වම්පස ඉදිරි අසුනෙහි වාඩිවී සිටින හැටි දක්නට සුලබ සිදුවීමකි. එහෙත් වාහනයක ඉදිරිපස අසුනෙහි දරුවන් අසුන් ගන්වා ගෙන රිය පැදවීම ඉතා භයානක, අවදානම් සහිත වූවකි. වේගයෙන් ගමන් ගන්නා රථයක් අනතුරට පත්වුණ විගස වේගය බින්දුව වී නැවතුණද ඒ වනවිට වාහනයේ ගමන් කරන පුද්ගලයන් වාහනය පැමිණි වේගයෙන් ම ඉදිරියට ඇදී යයි. වාහනයක සීට් බෙල්ට් පැලඳීමෙන් සිදුවන්නේ අනතුරකදී සිදුවිය හැකි හානිය අවම කර ගැනීම වන අතර, එයින් වාහනය සමඟ එහි ගමන් ගන්නා මගීන් ඉදිරියට යෑම නැවතෙයි. නමුත් වයස අවුරුදු 14 - 15 ට වඩා අඩු දරුවන් උසින් අඩු බැවින් ඔවුනට වාහනයේ ඇති 'සීට් බෙල්ට්' පැලඳීමට නොහැකි වීම ගැටලුවකි. එවැනි දරුවකු ඉදිරි අසුනෙහි හිඳගෙන සීට් බෙල්ට් පැලඳ සිටියදී අනතුරක් සිදුවුවහොත් ඉන් සිදුවන හානිය වැඩිය. එම නිසා වාහනයක කුඩා දරුවන් රැගෙන යන විට ළමා ආරක්ෂක අසුන් තිබෙන භාවිත කිරීම හෝ පසුපස අසුනෙහි එම ආරක්ෂක අසුන මත දරුවා වාඩි කරවීම අනුමත කළ හැකිය. මෝටර් සයිකල්වල ගමන් කිරීමේදී පැලඳිය යුතු ආරක්ෂිත හිස් වැසුම් ද අවධානය යොමු කළ යුතුම අංගයකි. දරුවන් සමඟ ගමන් කරන වැඩිහිටියන් තම අවධානය ජංගම දුරකථනය වෙත යොමු කිරීම හේතුවෙන් දරුවාගේ ආරක්ෂාවට ගැටලු ඇති වන්නා සේම දරුවාට එයින් ලබාදෙන ආදර්ශයද කොතරම් අහිතකර දැයි ඔවුහු කල්පනා නොකරති. ත්‍රිරෝද රථ පදවන අතරතුර කුඩා දරුවන් ඔඩොක්කුවෙහි හිඳවාගෙන යෑමේදී ත්‍රිරෝද රථයක් අනතුරට පත්වූ විට දරුවා එළියට විසිවීමට ඇති අවදානම වැඩිය.

ජපානයේ ටෝකියෝ නගරයෙහි සිටින බොහෝ පුද්ගලයන් ගමනාගමනය සඳහා තමන්ගේ පෞද්ගලික වාහනය වෙනුවට පොදු ප්‍රවාහන සේවා පහසුකම් භාවිතයට හුරුවී සිටිති. රටක පොදු ප්‍රවාහන සේවා හොඳ මට්ටමක පවතින විටෙක ජනතාව තම පෞද්ගලික වාහන වෙනුවට පොදු ප්‍රවාහන පහසුකම් භාවිතයට උනන්දු වනු ඇත. රටක් ලෙස බලාපොරොත්තු වන තිරසර සංවර්ධන ඉලක්කයට ළඟා වීමට රටෙහි රථ වාහන අනතුරු අවම කරගත යුතුය. ඒ සඳහා මිනිසුන් තුළ ආකල්පමය හා චර්යාමය වෙනසක් ඇතිවිය යුතුය. බොහෝ විට පාසල් දරුවන් රැගෙන යන වෑන් රථවල සහායිකාවක යෑම අනිවාර්ය යැයි නීතියක් තිබුණද ඇතැම් වෑන් රථ හිමියෝ ඒ පිළිබඳ එතරම් සැලකිල්ලක් නොදක්වති. මෙහිදී 'නීතිය'ට වඩා දරුවන්ගේ රැකවරණය සැලසීම තම අවශ්‍යතාව ලෙස සලකා සහායකයකු නොමැතිව දරුවෝ ප්‍රවාහනය නොකිරීමට වෑන් රථ රියදුරන්ට බලකර සිටීමට දෙමවුපියන්ගේ අවධානය යොමුවිය යුතුය. ඒ සියල්ල අතරේ මිනිසුන් අතර ආරක්ෂාව පිළිබඳ වූ සංස්කෘතියක් (safety culture) හැදිය යුතුයි. එය කෙටිකාලීන මෙන්ම දිගුකාලීන සැලසුම් ඇතිව සැකසීම තුළින් වාහන අනතුරු වළක්වා ගැනීම අසීරු කටයුත්තක් නොවනු ඇත.

අනතුරු නිසා දිනකට මෙරට පුද්ගලයන් පස්දෙනකු මහ මඟදී මරුට බිලිවේ

රිය අනතුරු නිසා ලොව පුරා දිනකට සිදුවන මරණ ගණන 3,400 ඉක්මවයි

පිටියේ රවුමක්

23 පහළ ක්‍රිකට් තරගාවලිය 16 දා සිට

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධානය කරන වයස අවුරුදු 23න් පහළ ක්‍රිකට් තරගාවලිය 16 දා ආරම්භ වීමට නියමිතය. මීට පෙර වයස අවුරුදු 23න් පහළ තරගාවලිය දෙදින තරගාවලියක් ලෙස පැවැත්වුවද, මෙවර එය එක්දින තරගාවලියක් ලෙස පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

ගෙවී ගිය වසරේ මෙකී තරගාවලියට කණ්ඩායම් 24ක් එක්වූ අතර, මෙවර තරගාවලියට කණ්ඩායම් 26ක් දක්වා වැඩි කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් කටයුතු යොදා තිබේ.

ඒ අනුව කණ්ඩායම් 26 කාණ්ඩ 4ක් යටතේ තරග කරයි. ඒසහ බී කාණ්ඩවලට කණ්ඩායම් හත බැගින් සහ සී සහ ඩී කාණ්ඩවලට කණ්ඩායම් හය බැගින් ඇතුළත් වෙයි. ඒ අනුව ඒ සහ බී කාණ්ඩවල කණ්ඩායම් තරග හයකටත්, සී සහ ඩී කාණ්ඩවල කණ්ඩායම් තරග පහකටත් ක්‍රීඩා කිරීමට නියමිතය. ඒ ඒ කාණ්ඩවල පෙරමුණ ගන්නා කණ්ඩායම් අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබා ගනියි. අවසන් පූර්ව තරග ඔක්තෝබර් 7 වැනිදා සහ අවසන් තරග 11 දා පැවැත්වීමට නියමිතය.

නවීඩ් නවාස් බංග්ලාදේශ ක්‍රිකට් පුහුණුකරු ධුරයට

බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයේදී ප්‍රධාන පුහුණුකරු ධුරයට හිටපු ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩක දැනට එරට 19න් පහළ කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස කටයුතු කරන නවීඩ් නවාස් පත්කිරීමට බංග්ලාදේශ ක්‍රිකට් පාලක මණ්ඩලය අවධානය යොමු කර ඇතැයි වාර්තා වෙයි.

දැනට ඔස්ට්‍රේලියාවේ පදිංචිව සිටින නවීඩ් නවාස් බංග්ලාදේශ කණ්ඩායම සමඟ එක්වීමට පසුගිය සතියේ එරටට පැමිණි බවද වාර්තා වෙයි. කොවිඩ් 19 වසංගතය නිසා, දැනට බංග්ලාදේශ කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස කටයුතු කරන දකුණු අප්‍රිකාවේ රසල් ඩොමිනිඕ ශ්‍රී ලංකා සංචාරයට එක්වීම අවිනිශ්චිත තත්වයට පත්ව ඇතැයි වාර්තා වෙයි. මේ අතර බංග්ලාදේශයේ කොවිඩ් 19 අවධානම වැඩි නිසා, විදේශ පුහුණුකරුවන් එරටට පැමිණීමට අකමැත්ත පළකර ඇති බවද සඳහන්ය.

නවීඩ් නවාස් පුහුණු කරන ලද එරට 19න් පහළ කණ්ඩායම මේ වසරේ මුල පැවැති යොවුන් ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී ප්‍රබල ඉන්දියාව පරාජය කරමින් විශිෂ්ට ජයක් හිමි කර ගැනීමට සමත් තරග 3ක ටෙස්ට් තරගමාලාවකට ක්‍රීඩා කිරීම සඳහා ලබන ඔක්තෝබර් මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කරන බංග්ලාදේශ පිලේ පිතිහරඹ පුහුණුකරු ලෙස ක්‍රෙග් මැක්මිලන් පත් කර තිබේ.

මැක්මිලන් එම තනතුරට පත් වූයේ මීට පෙර එම තනතුරෙහි කටයුතු කළ නීල් මැකෙන්සි පෞද්ගලික හේතු මත ඉවත් වීමෙන් පසුවය. නවසීලන්ත පිලේ හිටපු පිතිකරුවකු වන 43 හැවිරිදි මැක්මිලන් ක්‍රීඩාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු එරට ක්‍රිකට් පිලේ පිතිහරඹ සහ පන්දු රැකීමේ පුහුණුකරු ලෙස කටයුතු කළේය.

පාසල් ක්‍රීඩාව ගොඩ ගැනිමට පියවර

ක්‍රීඩා ඇමති නාමල් රාජපක්ෂ හා අධ්‍යාපන ඇමති ජී.ඒල්. පීරිස් ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන් එක්ව ලාංකේය පාසල් ක්‍රීඩාව නගාසිටුවීමට අවශ්‍ය කරුණු සම්බන්ධව විශේෂ සාකච්ඡාවක් අධ්‍යාපන අමාත්‍යාංශයේදී පැවැත්විණි. එහිදී ක්‍රීඩා පාසල් 25ක ක්‍රියාකාරී බව හා දියුණු කළ යුතු අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබේ.

ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මාධ්‍ය වෙත දැක්වූ අදහස් දක්වමින් ප්‍රකාශ කළේ "අධ්‍යාපන අමාත්‍යාංශය හා ක්‍රීඩා අමාත්‍යාංශය ඒකාබද්ධව පාසල් ක්‍රීඩාව නගාසිටුවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපේ තිබෙන ක්‍රීඩා පාසල් 25 කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළා. මේ වන විට ක්‍රීඩා පාසල් 24 යි ක්‍රියාත්මක වෙන්නේ. තිබුණු ක්‍රීඩා පාසල් 25 ම නැවත ශක්තිමත් ලෙස ප්‍රතිව්‍යුහගත කරන්න අපි කටයුතු කරනවා. ක්‍රීඩා පාසල් සඳහා 8 වන ශ්‍රේණියේදී දරුවන් බඳවාගැනීමේ ක්‍රමවේදයේදී පැනනගින අපහසුතා මගහරවා ගන්න ප්‍රායෝගිකව අප තීන්දු තීරණ කිහිපයක් ගත්තා. ඒ සඳහා අවශ්‍ය උපදෙස් අමාත්‍යවරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වරයාට ලබා දුන්නා" ක්‍රීඩා ඇමැතිවරයා පැවැසීය.

කඹ ඇදීමේ දිස්ත්‍රික් ශූරතා කුරුණෑගලට සහ ගම්පහට

ජාතික කඹ ඇදීමේ සම්මේලනය සංවිධාන කළ අන්තර් දිස්ත්‍රික් කඹ ඇදීමේ තරගාවලියේ පිරිමි ශූරතා දිනා ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායම සමත් වූ අතර, කාන්තා ශූරතාව ගම්පහට හිමි විය.

ටොරින්ටන් ක්‍රීඩාංගණයේ දී පසුගියදා පැවැති මේ තරගාවලියට දිස්ත්‍රික් කණ්ඩායම් 31ක් සහභාගි වූ අතර, එහි දී ගාල්ල දිස්ත්‍රික් කණ්ඩායම පරාජය කරමින් ශූරතාවට හිමිකම් කීමට කුරුණෑගල දිස්ත්‍රික් පිල සමත් විය. කාන්තා අවසන් තරගයේදී ගම්පහ දිස්ත්‍රික් පිල හමුවේ පරාජයට පත් වූ රත්නපුර දිස්ත්‍රික් පිලට අනුශූරතාව හිමි විය. පිරිමි තරග අංශයේ තුන්වැනි තැන කොළඹට හිමිවූ අතර, කාන්තා තරග අංශයේ තුන්වැනි තැනට පත් වූයේ අනුරාධපුර දිස්ත්‍රික්ක කණ්ඩායමය.

සභාපති කුසලාන පාපන්දු කිරුළ කලම්බු එෆ්.සී. දිනා ගනියි

● ගීෂා මුණසිංහ

වැන්ටේජ් සභාපති කුසලාන පාපන්දු තරගාවලියෙන් බ්ලූ ඊගල්ස් කණ්ඩායම පරදා කලම්බු එෆ්.සී. කණ්ඩායම ගෝල 4 - 0ක් ලෙස විශිෂ්ට ජයක් වාර්තා කරමින් 'වැන්ටේජ්' සභාපති කුසලානය තමන් සතු කරගැනීමට සමත්විය. මිලියන 1.8ක මුදල් ත්‍යාගයක් ජයග්‍රාහී කලම්බු එෆ්.සී. පිලට හිමිවූ අතර අනුශූරතාව දිනූ බ්ලූ ඊගල්ස් කණ්ඩායමට මිලියන 1.5ක මුදලක් හිමිවිය.

මෙරට පාපන්දු ඉතිහාසයේ වැඩිම ත්‍යාග මුදලක් පිරිනමන ලද පාපන්දු තරගාවලිය ලෙස වැන්ටේජ් කුසලාන 2020 ඉතිහාසයට එක් වූ අතර ජාතික පාපන්දු කණ්ඩායමට නවක ක්‍රීඩකයින් සොයා ගැනීම වෙනුවෙන් සහ කොවිඩ්19 ව්‍යාප්තිය හේතුකොට ගෙන ගිලිහි ගිය ක්‍රීඩාශීලීත්වය නැවත නගාසිටුවීම පෙරදැරිව ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් තරගාවලිය සංවිධානය කළේය. රුපියල් මිලියන 30කට ආසන්න මුදලක් ත්‍යාග වශයෙන් තරගාවලිය නියෝජනය කළ කණ්ඩායම් වෙත පිරිනැමීමට ද ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය කටයුතු සම්පාදනය කර තිබුණි.

ගෝලීය වසංගතයක් බවට පත්වූ කොවිඩ් 19 ලෝක ව්‍යාප්තියෙන් ශ්‍රී ලංකාවද අවතැන් විය. මාර්තු මාසයේ සිට ක්‍රීඩා කටයුතුද නවතා දැමීය. ඒ හේතුව නිසා මෙරට ක්‍රීඩාව දරුණු ආගාධයකට ලක් වූ අතර නැවතත් වැටුණු තැනෙන් ගොඩා ගැනීම උදෙසා ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් මෙම තරගාවලිය ආරම්භ කරන ලදි.

ජාවාලේන්, නිව් ස්ටාර්, යුද හමුදා, රෙඩ් ස්ටාර්, සෙරන්ඩිබ්, බ්ලූ ඊගල්, කලම්බු එෆ්.සී. හා පොලීස් පාපන්දු කණ්ඩායම් අර්ධ අවසන් පූර්ව වටය නියෝජනය කරමින් තරග වැදුණු අතර කණ්ඩායම් 4ක් අර්ධ අවසන් වටය නියෝජනය කිරීමේ අවස්ථාව හිමිකරගත්තේය.

අර්ධ අවසන් වටයේදී යුද හමුදා කණ්ඩායම පරාජයට පත්කරමින් ජාවාලේන් කණ්ඩායමත්, බ්ලූ ඊගල් කණ්ඩායම පරාජය කරමින් නිව් ස්ටාර් කණ්ඩායමත් අවසන් පූර්ව වරම් දිනා ගැනීමට සමත් විය. බ්ලූ ඊගලස් කණ්ඩායම 'ඊ' කාණ්ඩයෙන් තරග වැදුණු අතර එහිදි ඔවුන් මුහුණ දුන් තරග 3ම ජයග්‍රහණය කරමින් අර්ධ අවසන් පූර්ව තරගයට පිවිසිමට සමත් විය. අර්ධ අවසන් පූර්ව තරගයේදී බ්ලූ ඊගල්ස් පිල නිව් ස්ටාර් පිල හමුවේ පරාජයට පත් වුවත් නිව් ස්ටාර් පිල ව්‍යාජ ලේඛන සකස් කොට ක්‍රීඩකයකු ඉදිරිපත් කිරීමේ විනය විරෝධී චෝදනාව ඔප්පු විමත් සමගින් අවසාන තරගය නියෝජනය කිරීමේ අවස්ථාව නිව් ස්ටාර් පිලට අහිමිව බ්ලූ ඊගල්ස් පිලට හිමිවිය.

අවසන් පූර්ව වටයේදී ජාවාලේන් කණ්ඩායම පරාජයට පත් කරමින් අවසන් මහා තරගය නියෝජනය කිරීමේ වරම් දිනා ගැනීමට බ්ලූ ඊගල්ස් කණ්ඩායම සමත් වූ අතර රෙඩ් ස්ටාර් කණ්ඩායම පරාජයට පත් කරමින් කලම්බු එෆ්.සී. කණ්ඩායම අවසන් මහා තරගයට පිවිසිමේ වරම් දිනා ගත්තේය.

මෙම ජයග්‍රාහණය පිලිබඳ කණ්ඩායමක් ලෙස අපි ඉතාමත් සතුටට පත්වෙනවා. ඒ අපි පසුබැමකට ලක්ව නැවතත් ජයග්‍රහණය කරා ඒමට හැකිවීම නිසයි. අපි පළමු වටයේදී බ්ලූ ඊගල්ස් කණ්ඩායමට පරාජය වුණා නමුත් අපිට වාසනාව තිබුණා අවසන් තරගය කරා පැමිණීමට. බ්ලූ ඊගල්ස් කණ්ඩායමෙන් පළමු තරගයේදී එල්ල වූ අභියෝග නිසි ලෙස අධ්‍යනය කරලා අවසන් තරගයට මුහුණ දුන්නා. අපි කණ්ඩායමක් ලෙස අවසන් තරගයට මුහුණ දෙන්න අලුතෙන්ම සැලැසුම් ක්‍රියාත්මක කළා එම සැලැසුම් සාර්ථක වුණා. අපිට පලමු අර්ධයේදී බ්ලූ ඊගල්ස් අභියෝගයක් වුණා. නමුත් දෙවන අර්ධයේදී එයට නිසි ලෙස මුහුණ දුන්නා. පළමු අර්ධයේ දී අහ්මඩ් ශාජ්නි ලබාගත් ගෝලය නිසා අපට ස්ථාවරව තරගයට මුහුණ දිමේ හැකියාව ලැබුණා. බ්ලූ ඊගල්ස් කණ්ඩායම ක්‍රීඩා කළේ කික් ඇන්ඩ් රන් ක්‍රමයට අපි ඊට විරුද්ධව අපේ සැලැසුම් ක්‍රියාත්මක කළා. ඒ නිසා දෙවන අර්ධයේදී අපට තවත් ගෝල තුනක් ලබාගැනීමේ හැකියාව ලැබුණා. .

ඒ වගේම සඳහන් කරන්නට ඔනේ මෙම තරගාවලිය සංවිධානය කළ ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය ගැන ඇත්තෙන්ම පසුගිය වකාවානුවේදී කොවිඩ්19 නිසා තරගයක් තියා පුහුණු වීමකවත් නිරත වීමේ හැකියාවක් අපට තිබුණේ නෑ. අපේ ශාරීරික යොග්‍ය තාවයවත් අපට නිසි ලෙස වර්ධනය කරගැනීමේ හැකියවක් අපට තිබුණේ නෑ. පාපන්දු ක්‍රීඩාව විශාල පසුබැමකට ලක්වුණා. නමුත් මෙම තරගාවලිය සමගින් නැවතත් පාපන්දු ක්‍රීඩාව කෙරේහි විශාල ආකර්ශනයක් ලබාගානිමට හැකිවුණා. එයම විශාල ජයග්‍රහනයක්. මම පුද්ගලිකවම විශ්වාෂ කරන්නේ මෙවැනි තරගාවලි වසර පුරාවටම සංවිධානය විය යුතුයි. නැතිනම් දක්ෂ ක්‍රීඩකයන්ට තම දක්ෂතා වර්ධනය කරගැනීමට වගේම දක්ෂතා ප්‍රදර්ශණය කිරීමේ හැකියවක්ද නෑ.

අද පැමිණ සිටින ක්‍රීඩා ලෝලින් දිහා බැලුවම අපට දැක ගතහැකියි පාපන්දු ක්‍රීඩාවක ඇලුම්කරන ක්‍රීඩාලෝලින් විශාල පිරිසක් සිටිනවා. ඔවුන්වත් අප රැකගත යුතුයි. ඒ නිසා අඩුම තරමින් වසරකට තරගාවලි තුනක්වත් සංවිධානය කළ යුතුයි. මේවසරේදී තවත් තරගාවලියක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය කටයුතු යොදා තිබේනවා. එය ඉතාමත් අගය කල යුතු දෙයක්. යැයි ජයග්‍රාහී කලම්බු එෆ්. සී.කණ්ඩායමේ නායක චරිත රත්නායක අප හා පැවැසිය.

ශ්‍රී ලංකා ක්‍රිකට් කෝටි 11.4 බොල් ණය කපා දැමීමෙන් උණුසුම් වෙයි

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගිණුම් සම්බන්ධයෙන් පැවැති විශේෂ මහා සභාවේදී වත්මන් ලේකම් මොහාන් ද සිල්වා සහ හිටපු ලේකම් නිශාන්ත රණතුංග අතර උණුසුම් සංවාදයක් ඇතිවී තිබේ. ඒ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබිය යුතු මුදල්වලින් රුපියල් කෝටි 11.4 ක් බොල් ණය ලෙසින් කපා හැරීමට ලිඛිත යෝජනාවක් සභාවට ඉදිරිපත් වීමත් සමඟමය. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට නොලැබෙන මුදල් ලෙස සලකා මේ මුදල කපා හැරීමට යෝජනාවීමත් සමඟම උණුසුම් තත්ත්වයක් නිර්මාණය වී තිබේ. කෙසේ වෙතත් වාර්ෂික ගිණුම් වාර්තාව ඒකමතිකව සම්මත වී තිබෙන අතර, කපා හැර ඇති බොල් ණය ප්‍රමාණය රුපියල් කෝටි 11.4 කි.

2015 සහ ඊට පෙර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබිය යුතු මුදල් ප්‍රමාණය ලෙසට රුපියල් මිලියන 114 කට අධික මුදලක් පෙන්වා තිබේ. මෙකී ප්‍රමාණය විශේෂ මහා සභාවකදී කපා හැරිය නොහැකි බව, හිටපු භාණ්ඩාගාරිකවරයකු වන නුස්කි මොහොමඩ් පෙන්වා දී තිබේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබිය යුතු මෙකී මුදල බොල් ණය ලෙස කපා හැරීම 2018 නව විගණන පනතට අනුව මෙන් ම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් හි ගනුදෙනු පිළිබඳ විනිවිදභාවය සුරක්ෂා කිරීම සඳහා සත්භාවයෙන් මෙකී පියවර ගත් බව මොහාන් ද සිල්වා සභාවට පවසා තිබේ.

2015 වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් රුපියල් බිලියන හතරක් පමණ ණය වී සිටි බවත්, තිලංග සුමතිපාල සහ ශම්මි සිල්වා සභාපති ධුරයන්ට පත්වීමෙන් අනතුරුව, මුදල් සොයා ගැනීමෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ගොඩගත් බව පැවැසීමත් සමගම විශේෂ මහා සභාව උණුසුම් සංවාදයක් බවට පෙරළී තිබේ. 2015 ක්‍රිකට් ලෝක කුසලානය දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට්හි සභාපති ධුරය ජයන්ත ධර්මදාස සහ ලේකම් වශයෙන් නිශාන්ත රණතුංග කටයුතු කර තිබේ. මෙහිදී නිශාන්ත රණතුංග 2015 න් පසු මුදල් ලැබුණු ආකාරය පිළිබඳ පැහැදිලි කරන ලෙස ද ඉල්ලීමක් කර තිබේ. මෙහිදී නිශාන්ත රණතුංග වැඩිදුරටත් පවසා ඇත්තේ අපේ පාලන කාලයේ විකාශන අයිතීන් විකිණීමෙන් සහ අයි.සී.සී. එක්ක අත්සන් කළ ගිවිසුම්වලින් ලැබුණු මුදල්වලින් තමයි පසුගිය කාලයේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පවත්වාගෙන ගියේ. නිදහස් කුසලාන තරගාවලියෙන් පමණක් රුපියල් මිලියන 600 ක් පමණ ලැබුණු බව ද මෙහිදී නිශාන්ත රණතුංග වැඩිදුරටත් පවසා තිබේ.

අයි.සී.සී. ය සමඟ පැවැති එකඟතාව මත තිලංග සුමතිපාලගේ මැදිහත්වීමෙන් වැඩි වාසියක් අත්වූ බවත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ලාභ ලබන තත්ත්වයට ගෙන ආ බවත්, ජාතික කණ්ඩායමේ අනුග්‍රහකයන්ගේ විශාල මුදල් ප්‍රමාණයක් ලැබුණු බව ද මෙහිදී මොහාන් ද සිල්වා පවසා තිබේ. මෙහිදී නිශාන්ත රණතුංග විමසා ඇත්තේ අයි.සී.සී. ය සඳහා ඉදිරිපත් කළ යෝජනාවලට සාක්ෂි තිබේද? යන්නයි. කෙසේ වෙතත් මෙහිදී මොහාන් ද සිල්වා පවසා ඇත්තේ ශ්‍රී ලංකා ක්‍රිකට්හි විශාල මුදල් ප්‍රමාණයක් සංසරණය වන බවත්, බොල් ණය කපා හැරීම ගිණුම් අවශ්‍යතාවක් බවයි.

රග්බි ක්‍රීඩාවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම විශාල අභියෝගයක්

සභාපති ඉල්යාස් පෙරළිකාර යුගයකට මුලපුරමින් කියයි

ලාංකේය රග්බි ක්‍රීඩාවේ පෙරළිකාර යුගයක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව ශ්‍රී ලංකා රග්බි සම්මේලනයේ නව සභාපති රිස්ලි ඉල්යාස් ප්‍රකාශ කරයි. ශ්‍රීලංකා රග්බි සම්මේලනයේ වාර්ෂික මහ සභාවෙන් පසු මාධ්‍යවේදීන් ඇමැතූ නව සභාපතිවරයා කියා සිටියේ වසර 2021 මෙරට රග්බි ක්‍රීඩාවේ පෙරළිකාර වසරක ඇරැඹුම සටහන් කරනු ඇති බවයි.

තුන්සියයකට ආසන්න දිස්ත්‍රික්, පළාත්, ත්‍රිවිධ හමුදා, පාසල් සහ ක්‍රීඩා සමාජ ක්‍රියාකාරීන්ගේ සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබපැතුම් මැද සභාපති තනතුරට නිල වශයෙන් පත්වූ වැල්ලවත්ත පීටර්සන් ක්‍රීඩා සමාජයේ හිටපු අංක අට ක්‍රීඩකයකු ද වූ රිස්ලි ඉල්යාස් සිය සභාපතිත්වය යටතේ මෙරට රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් සිය උපරිමයෙන් කැපවීම එකම අරමුණ බව ද පැවැසීය.

'දේශීය රග්බි ක්‍රීඩාව නගා සිටුවීම වගේම ආසියාවේ ප්‍රබලතම කණ්ඩායම බවට පත්වීම සඳහා දස්කම් සපිරි යොවුන් ක්‍රීඩකයන් සොයා ගැනීම වගේම ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් අප හමුවේ ඇති විශාල අභියෝගයක් බව පවසන ඉල්යාස්, මේ වසරේ මුල් භාගයේදීම කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අන් සියලු ක්‍රීඩා මෙන්ම රග්බි ක්‍රීඩාවත් දැඩි පසුබෑමකට ලක් වූ බවත්, ඒ නිසා නැවත අනුග්‍රාහකයන් සමග අප නැගී සිටිය යුතුයි. ඒ සඳහා නිවැරැදි සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු යැයිද පැවැසීය.

ජාතික කණ්ඩායමේ හිටපු නායකයකු වන නාමල් රාජපක්ෂ නව ක්‍රීඩා ඇමැතිවරයා ලෙස පත් වීම මෙරට රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කිරීමට රග්බි ආයතනයට විශාල ශක්තියක් වනු ඇතැයි ද පැවැසිය

'මම රග්බි ආයතනයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ කාලයේ වගේම, බස්නාහිර පළාත් රග්බි සංගමයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ කාලයේ නව ක්‍රීඩා ඇමැතිවරයා ක්‍රීඩකයකු ලෙස ක්‍රීඩාවේ නිරතවූවා. එතුමාගේ ක්‍රීඩා දස්කම් වගේම අත්දැකීම් ද, දැනුම් සම්භාරය ද මෙරට රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විශාල ශක්තියක් වන බව මට විශ්වාසයි. මෙරට කාන්තා රග්බි ක්‍රීඩාවට මෙන්ම පාසල් රග්බි ක්‍රීඩාවට ද රග්බි සම්මේලනයේ සහයෝගය සහ දායකත්වය නොඅඩුව ලබා දෙන බව පවසන ඉල්යාස් කාන්තා රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් සහ පාසල් රග්බි ක්‍රීඩාවේ ප්‍රගතිය වෙනුවෙන් හිටපු සභාපති ලසිත ගුණරත්න විසින් සිය ධුර කාලය ආරම්භයේදී පත් කරන ලද තනතුරු තව දුරටත් ඉදිරියට පවත්වාගෙන යාමට රග්බි ආයතනය පියවර ගෙන තිබේන බවද පැවැසිය. ඒ අනුව කාන්තා රග්බි ක්‍රීඩාව වෙනුවෙන් ආචාර්ය සමන්තා නානායක්කාර රග්බි විධායක කමිටුවට පත්වී සිටින අතර, පාසල් රග්බි ක්‍රීඩාව වෙනුවෙන් පසුගිය වාරයේ උපසභාපතිධුරයෙහි කටයුතු කළ පාසල් රග්බි සංගමයේ නියෝජ්‍ය සභාපති, ගල්කිස්ස විද්‍යා විද්‍යාලයේ විදුහල්පති සුසන්ත මෙන්ඩිස් නැවත එම තනතුරට පත් කර තිබේ.

මෙරට රග්බි ක්‍රීඩාව වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබා දුන් හිටපු ක්‍රීඩකයන් සහ නිලධාරීන් 11කට රග්බි ආයතනයේ යාවජීව සාමාජිකත්වය ලබාදීමට ද වාර්ෂික මහා සභා රැස්වීමේදී තීරණය කෙරිණි.

පොත් පත් පුවත්

මේ එළැඹියේ සාහිත්‍ය මාසයයි. බොහෝ ලේඛකයන්ගේ නව කෘති ජනගත වෙන්නේ ද මේ මාසයේය. අලුත් පොත් පිළිබඳව පාඨක ඔබ දැනුම්වත් කිරීම අරමුණු කර ගනිමින් මෙවර පොත් පිටුව සැකසේ. මෙම වසර ඇතුළත පළ කළ ඔබගේ නවතම කෘති සිළුමිණ පොත් පත් පුවත් වෙත යොමු කරන්න.

කෘතිය- රනිල් වික්‍රමසිංහ වගේ නෙවෙයි මම ගෙම්බන්ට ආදරෙයි

කර්තෘ-බන්දුල පද්මකුමාර
කර්තෘ ප්‍රකාශනයකි
පිටු ගණන-80
මිල- රුපියල් 220

මෙම කෘතිය දෙටු ප්‍රවීණ මාධ්‍යවේදී බන්දුල පද්මකුමාර විසින් යහපාලන යුගයේ ලියන ලද දේශපාලන සටහන්වල එකතුවකි.

එම යුගයේදී සමාජයේ කතාබහට ලක්වූ දේශපාලන, සමාජ සහ ආර්ථිකමය සිදුවීම් උපහාසාත්මක රසයක් ගෙනදෙන අයුරින් සරල බස්වහරකින් ඉදිරිපත් කිරීමට කතුවරයා සමත්ව ඇත.

කෘතිය- දෙහදක කුඩා නිවහන

කර්තෘ - කත්‍යානා අමරසිංහ
ප්‍රකාශක - සමයවර්ධන පොත්හල
පෞද්ගලික සමාගම
පිටු ගණන-256 මිල- රුපියල් 530

බටහිර සාහිත්‍යයට අයත් කැරොලයින් ඉයර්ස් කතා මාලාවේ හත්වන කෘතිය වන සිලියා විල්කින්ස්ගේ A Little House of Their Own කෘතියේ පරිවර්තනයකි.

මාධ්‍යවේදිනී කත්‍යානා අමරසිංහ විසින් මින් පෙර එම කෘතියේ කොටස් හයක්ම පළකර ඇත.

දෙහදක කුඩා නිවහන මෙම කතා මාලාවේ අවසන් කතාවයි.



කෘතිය- සරණ සොයමින

කර්තෘ-රන්ජිත් ධර්මකීර්ති
ප්‍රකාශකයාගේ නම- සබිල ප්‍රකාශන
පිටු ගණන-217 මිල- රුපියල් 430
විමසීම් - 011 2828901

රාජ්‍ය සාහිත්‍ය සම්මානලාභී ප්‍රවීණ ලේඛක රන්ජිත් ධර්මකීර්ති විසින් රචිත මෙම නවකතාව ඇත ඉතිහාසයේ සිට වර්තමානය දක්වාම කාන්තාවන් මුහුණ දෙන අරගල හා මනෝ භාවයන් පිළිබඳ විවරණය කෙරේ.

කෘතිය- ඇසළ මද්දහන

කර්තෘ-තරංගා දිසානායක
ප්‍රකාශක - තාරා ප්‍රකාශන
පිටු ගණන-264 මිල- රුපියල් 550
විමසීම් - 0714244873

ජනප්‍රිය ලේඛිකාවන වන තරංගා දිසානායක විසින් රචිත මෙම නවකතාව සත්‍ය සිදුවීමක් මුල්කර ගනිමින් නිර්මාණය කරන ලද්දකි.

ළමා අපචාර දිනෙන් දින ඉහළ යමින් තිබෙන පසුබිමක දරුවන් ආරක්ෂා කරගැනීමේ වගකීම මවුපිය, වැඩිහිටියන්ට අවධාරණය කරන්නට කතුවරිය උත්සාහ දරා ඇත.

කෘතිය- කොරෝනා කාලය

කර්තෘ- ව. අ. සරත් ලාල් කුමාර
ප්‍රකාශක - රුසියාව ප්‍රකාශකයෝ
පිටු ගණන-148 මිල- රුපියල් 400
විමසීම්-076 9005931

රජයේ මාධ්‍ය නිලධාරියකු ලෙස කටයුතු කරන ප්‍රවීණ මාධ්‍යවේදී සරත් ලාල් කුමාර මෙම කෘතිය රචනාකර ඇත්තේ කොරෝනා වසංගතය හේතුවෙන් රටම නිරෝධායනයට ලක්වෙමින් නිවෙස්වල ගතකළ කාලයේදීය. වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයම මුහුණ දුන් සහ මුහුණ දෙමින් තිබෙන සමාජ, දේශපාලන සහ ආර්ථික තත්ත්වයේ කැඩපතක් ලෙස මෙම කෘතිය සැලකිය හැකිය.

කෘතිය - නෙක්බම්ම

කර්තෘ- සුමනසිරි පන්නිලහෙට්ටි
ප්‍රකාශක - සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
පිටු ගණන-184 මිල- රුපියල් 450
විමසීම්-034-2272503

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලේඛකත්ව හා සන්නිවේදන ඩිප්ලෝමාධාරියකු වන සුමනසිරි පන්නිලහෙට්ටිගේ කුළුඳුල් නවකතාව මෙයයි.

මේ වන විට ඔහු කාව්‍ය සංග්‍රහ හතරක්, චරිත කතාවක්, කෙටිකතා සංග්‍රහ තුනක්, ළමා කතා පොත් දෙකක් සහ යොවුන් නවකතා දෙකක් පළ කර ඇත.



කෘතිය- විනිවිදිමි තල්වැට

කර්තෘ-එස්.කේ.ඒ.එස්. සේනානායක
ප්‍රකාශක -
පිටු ගණන-202 මිල- රුපියල් 400

වසර 30ක පමණ කාලයක් රේගු නිලධාරියකු වශයෙන් සේවය කළ එස්.කේ.ඒ.එස්. සේනානායක නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුර ලබා උතුරු පළාත භාරව රාජකාරී කරන කාලයේදී ලැබූ අත්දැකීම් ඇසුරින් මෙම කෘතිය රචනා කර තිබේ.

උතුරේ ජනතාවගේ ජීවන තත්ත්වය පිළිබඳ සැබෑ විවරණයක් මෙම කෘතිය තුළ අන්තර්ගතය.

කෘතිය- අමෝල්

කර්තෘ-දිළුම් නිරෝෂණී ද කොස්තා
ප්‍රකාශක - ආශිර්වාද ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්
පිටු ගණන- 259
මිල- රුපියල් 550
විමසීම්-0711866413

අමෝල් රාජ්‍යය එක්සේසත් කළ අම්බර් රජුගේ පුත් අක්ෂත් හා ගෞරී නම් තරුණිය අතර ඇතිවන ප්‍රේමය සහ ඒ හා බැඳුණු සිදුවීම් පිළිබඳ හෙළි කරන ප්‍රේමණීය කතා පුවතක් සහිත අමෝල් කතුවරියගේ 10 වැනි නවකතාවයි.



කෘතිය- ස්වරාවී

කර්තෘ-දිලූ සඳමාලි රසාංගිකා මාපා
ප්‍රකාශක - සිතැඟි ක්‍රියේෂන්ස්
පිටු ගණන-208
මිල- රුපියල් 620
විමසීම්- 071 9511868

සම ආශ්‍රිත රෝගයකින් ශාරීරිකව සහ මානසිකව පීඩා විඳින යුවතියකගේ මනෝ භාවයන් සහ ඇයගේ ජීවිතයට ආශිර්වාදයක් වන ප්‍රේමයක් ගැන කියැවෙන මෙම නවකතාව කතුවරියගේ 21 වැනි නවකතාව වන අතර ඇයගේ 53 වැනි කෘතියයි.

කෘතිය- සරා සඳ ළඟ මා

කර්තෘ-දිනූෂා වීරරත්න
ප්‍රකාශක - දෙව්මිණි පබ්ලිකේෂන්
පිටු ගණන-280 මිල- රුපියල් 650
විමසීම්-0712070275

ආදරය, විවාහය වැනි මානුෂික බැඳීම් තුළ ගැහැනිය මුහුණ දෙන දුක් දොම්නස් පිළිබඳ නවමු ආකාරයේ කියවීමකට මෙම කෘතියෙන් උත්සාහ දරා ඇත.

තම සහෝදරයා නිසා ගැබ්ගත් පෙම්වතියගේ දරුවට පියකු වෙමින් පරිත්‍යාගයක් කරන පෙම්වතකුද ජීවමාන වන මෙම නවකතාව කතුවරියගේ 7 වැනි නවකතාවයි.

කෘතිය- පායා

කර්තෘ- සුරේකා නිල්මිණි ඉලංගකෝන්
ප්‍රකාශක - දෙව්මිණි පබ්ලිකේෂන්
පිටු ගණන-232
මිල- රුපියල් 600
විමසීම් - 0712070275

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට මුහුණ දුන් පෙම්වතුන් යුවළක් පිළිබඳ අනුවේදනීය කතා පුවතක් ඇසුරින් ප්‍රතිනිර්මාණය කරන ලද මෙම නවකතාව මාධ්‍යවේදිනී සුරේකා නිල්මිණි ඉලංගකෝන්ගේ 11 වැනි නවකතාවයි.

කෘතිය- ඒ ඇස්

කර්තෘ-මනෝජ් ප්‍රසන්න අබේකෝන්
ප්‍රකාශක - කර්තෘ ප්‍රකාශනයකි
පිටු ගණන-104 මිල- රුපියල් 300
විමසීම්-071 4344045

කතුවරයාගේ පළමු කෘතිය වන මෙම කෙටිකතා සංග්‍රහයට ඇතුළත් කර ඇත්තේ කාලයක් තිස්සේ ලේඛකයා විසින් නිර්මාණය කරන ලද කෙටිකතා අතරින් 12කි. එකිනෙකට වෙනස් තේමාවන් ඔස්සේ සරල සහ සිත්ගන්නා සුලු ආකාරයකින් එම කෙටිකතා රචනා කර ඇත.

කෘතිය- ශ්‍රී දළදා පුරාණය

සංස්කරණය- හේමමාලා රන්දුනු
ප්‍රකාශක - සමයවර්ධන පොත්හල
පිටු ගණන-112 මිල- රුපියල් 350

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති පූජ්‍ය වැලිවිට සොරත හිමිපාණන් වහන්සේ සමඟ සිදුකරන ලද සාකච්ඡා ඇසුරින් බුදු සරණ පුවත්පතෙහි මාසිකව පළවූ ලිපි පෙළක් එම පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ හේමමාලා රන්දුනු මහත්මිය විසින් සංස්කරණය කොට කෘතියක් ලෙස එළිදක්වා තිබේ.

ශ්‍රී දළදා වහන්සේ සම්බන්ධ ඉතා වටිනා කරුණු රාශියක් අන්තර්ගත මෙම කෘතිය බෞද්ධයන්ට පමණක් නොව ඉතිහාසය අධ්‍යයනය කරන කාහටත් ඉතා ප්‍රයෝජනවත් කෘතියකි.



කෘතිය- බෞද්ධ උරුමය ලෝක පූජිත කළ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා

කර්තෘ-බන්දුල මානවඩු
ප්‍රකාශක - සීමාසහිත ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ(පුද්) සමාගම
පිටු ගණන-128 මිල- රුපියල් 300
විමසීම්- 0718382425

ප්‍රවීණ මාධ්‍යවේදී බන්දුල මානවඩු විසින් අනගාරික ධර්මපාලතුමාගේ 150 වැනි ජන්ම දිනය නිමිත්තෙන් කළ පර්යේෂණාත්මක නිබන්ධනය මෙසේ කෘතියක් ලෙස එළිදක්වා ඇත. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික, ආගමික සේවාව ඇගයීමට ලක්කරමින් කෘතිය සම්පාදන කොට ඇත.

කෘතිය- මේ චෙන්නායි අහසයි

කර්තෘ-ඩබ්ලිව්.සී.සෙව්වන්දි
කර්තෘ ප්‍රකාශනයකි
පිටු ගණන-160 මිල- රුපියල් 500
විමසීම්- 0771162828

ඉන්දියාවේ චෙන්නායි වෙත ගිය කෙටි සංචාරයකදී රෝපණය වූ අදහසකට අනුව ලියන ලද මෙම කෘතිය කතුවරියගේ පළමු නවකතාවයි. හින්දුස්ථානයත් තම්බපණ්ණියත් අතර පැවති අතීත සබඳතා සිහිකරමින් ලියැවුණු මෙම නවකතාව පුවත්පත් කලාවේදිනියකගේ අපූර්වතම ආදර අන්දරයක් ගැන කියැවේ.

කෘතිය-පුදවාලක්කන් කෙටිකතා සංග්‍රහය

කර්තෘ-පියසෝම රුදිගු
කර්තෘ ප්‍රකාශනයකි
පිටු ගණන-110 මිල- රුපියල් 350
විමසීම්-0777 267099

එදිනෙදා ජීවිතයේදී හමුවන සුලබ සිදුවීම් කිහිපයක් වෙනස් ආකාරයෙන් රසවත්ව සහ මටසිලුටු භාෂා විලාසයකින් යුතුව කෘතිය ඉදිරිපත් කර තිබේ. කෙටිකතා 11කින් සමන්විත මෙම කෙටිකතා සංග්‍රහයේ කතුවරයා සීතාවක සංස්කෘතික බල මණ්ඩලයේ සම සභාපතිත්වය දරන අතර මෙය ඔහු විසින් රචිත 5 වැනි කෘතියයි.

කෘතිය- හොරට කරකැවෙන මෙරට සරසවිය

කර්තෘ-වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි
ප්‍රකාශක - ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට් ලිමිටඩ්)
පිටු ගණන-80 මිල- රුපියල් 250
විමසීම්- 0713017520

ප්‍රවීණ ලේඛකයකු වන වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි විසින් රචිත මෙම කෘතිය මෙරට විශ්වවිද්‍යාල පද්ධතියේ පොදු පරිපාලන යාන්ත්‍රණය පිළිබඳ යථා ස්වරූපය විදහා පෑමට දැක්වූ ප්‍රයත්නයක් ලෙස සැලකිය හැකිය. පරිච්ඡේද 11ක් මගින් එම විවරණය සාර්ථක ලෙස ඉටු කිරීමට කතුවරයා සමත්ව තිබේ.



කෘතිය-හතරදෙනෙක් කුමාරවරු

කර්තෘ -පරාක්‍රම ඒකනායක
ප්‍රකාශක - ෆාස්ට් පබ්ලිකේෂන්
පිටු ගණන- 510 මිල :රු:800
විමසීම් - 0771897034

නූතන තාක්ෂණික මෙන්ම නිදහස් විවෘත වෙළෙඳ අවකාශය තුළ යුවතියක් තමන්ගේම සිහින ජීවිතය තුළ අත්විඳින ඛේදවාචකය මෙම නවකතාවෙන් ගම්‍ය කරවයි. රැකියාවක් සඳහා නගරයට පැමිණෙන ඇය ජීවිතයේ සිහින හඹා යන විට මුහුණ දෙන රැවටීම් සහ අත්වර්ථ නාමයකින් ජනප්‍රිය රැල්ල මත රඳවාගත් ජීවිතය අවසානයේ ඇයටම පාරා වළල්ලක් වේ.

කෘතිය- රස පොළොව

කර්තෘ-ලීලානන්ද වික්‍රමසිංහ
ප්‍රකාශකයාගේ නම- සීමාසහිත ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
පිටු ගණන-343 මිල - රුපියල් 800
විමසීම්-071 4500393

ප්‍රවීණ ලේඛක ලීලාන්නද වික්‍රමසිංහ විසින් ලියන ලද මෙම නවකතාව පිවිතුරු සිතක් සහිතව උපත ලබා වැඩිවිය පත්වීමත් සමඟ විවිධ පරිසර සාධක හා ගැටී දූෂණය වන මිනිස් සිත ගැන කරනු ලබන අපූරු විවරණයකි.

ලේඛකයාට ආවේණික සරල සුගම බස්වහරකින් අපූර්වතම රසයක් සහ ජීවිතාවබෝධයක් පාඨකයා වෙත ලබාදෙන්නට සමත් නවකතාවකි.

කෘතිය- දියණිවරු

කර්තෘ- සෙත්වේවා සිරිවර්ධන
කර්තෘ ප්‍රකාශනයකි
පිටු ගණන-634
මිල- රුපියල් 1000
විමසීම්-071 8639879

සත්‍ය කතාවක් පදනම් කරගනිමින් රචිත මෙම නවකතාව කතුවරියගේ පළමු නවකතාවයි. විෂම වූ ලෝකය හමුවේ මුහුණ දෙන්නට වන අභියෝග, ගැටලු, ප්‍රශ්න හමුවේ ජීවිතය නිසි මාවතක ගෙන යන්නට තරුණියන්ට මඟ පෙන්වන කතා පුවතක් මෙහි අන්තර්ගතය.

දීපානි

දුලනි

කිරි දරුවකුව ඔබ හඬනා හඬ ඇසුනයි
කිරි මව තුරුලෙ ඔබ නැළවුණ බව දැනුනයි
දවසින් දවස ඔබ හැඩ වුණ හැටි පෙනුනයි
මුළු නිවහනේ අසිරිය ඔබ තුළ රැඳුනයි

දිවියේ අසිරිමත් දිනයක සතුටු සිතින්
ආවෙමි බැඳුණු හින්දා මම සෙනෙහෙ දමින්
සියලුම යස ඉසුරු ලැබෙන සසර පිනින්
දිවිමග දිනන්නට පැතුවෙමි පිරුණු බැතින්

මාපිය ගුරුන් වැඳ ආසිරි ලැබගනිමින්
කාගෙත් ආදරය සෙනෙහස නිති ලබමින්
හැදුණොත් දිවිමගේ පුරවා යහ ගුණයන්
එයමයි මගෙ දුවේ ඔබ ලබනා අභිමන්

සුසිලා ඇල්ලෙගොඩ

කාලය

රිදුණු තැන් මිහිරිය පසුවට
පරවූ මල් පෙති තවම සුමුදුය
හමන සුළඟින් මතක අරගෙන
අදත් ඇවිදින් සඳක් මුඳුනට..

ගිමන් කල අග වසත් කාලය
සැඩ සුළං අග ඒය මඳනළ
වැටුණු කඳුළත් ලෙහුණු සුසුමත්
ප්‍රේමයේ නටඹුන්ය දවසක...

අරුණ නුබගැබ ඇල්මැරුණු සඳ
වේය දවසක රැයක පුරපස
ඉතින් මතකය අරන් ගුලිකර
ගලන ගඟදිය හෙළනු සොඳුරිය

වජිර කුමාරසිංහ

'කුමට ඇරයුම්...'

මල්සිනා වියැකිලා බොඳවෙලා විසිරිලා
චංචල වූ හැඟුම් පොදි නිබද නිසසල වෙලා
කාටවත් කියා නැති ආදරේ ගොළු වෙලා
දැන් ඉතිං මම හිදිමි මගේ ලොව තනිවෙලා

නොහිතන්න මගේ ගැන කිසි විටක මතු දිනේ
සෙනෙහසට නිමාවක් තබමි මම මෙලෙසිනේ
සිත මාගෙ ඔබට තව පලක් නැති බව දැනේ
බැඳෙනු කිම යළි ඇසුරේ ඔබේ ලොව ඇය ගෙනේ

නොතේරුණ සෙනෙහසට අද කුමට ගී ගයනු
වාවගත නොහැකි මු'ත් සොවයි අප හට උරුම
හිනැහෙන්නෙ මං කොහොම පැතුම් මල් මිලින විය
සිහිනයෙන් නොපතන්න කුමට ඇරයුම් තවම

මාලිකා වෙත්තසිංහ

සොඳුරු ළඳක්

දිවි මග පුබුදු කළ නොකැළැල් තුෂර පොද
කවියක් ලෙසින් සනසයි මගෙ සොඳුරු හද
අවිහිංසකව වැජඹෙන හද මඬල මැද
නිවි නිවි දිලෙයි තනි තරුවක් ලෙසට අද

සඳරැස් කිරණ ලෙස ගනඳුර මකාගෙන
සොම්නස් සිතින් ළංවී ගිනි නිවා ලන
හසරක් නොදැන යන දිවිමග ගසා ගෙන
එළියක් වුණා ඔබ පැතුමන් පුරා ගෙන

උතුරා ගලා එන මල්මඳු රසය පෙරා
මතුරා දොඩන දෙනුවන් සුව ගෙනෙන තුරා
දැරුවා මෙතෙක් කල් සෙනෙහස වැඩෙන තුරා
විඳවා ගමු ඉතින් දිවි මග තිබෙන තුරා

ගිනිගත් කතර තුළ පැතිරුණු වැහි බිංදු
මිණිමුතු වටින තරමට සිසිලස කැන්දූ
පැණි රස තරම් රසවත් මිහිරක් රැන්දූ
ලොව ඇති සියලු දෑ පරදයි ඔබ ලන්දූ

සෝමසිරි ලියනගේ

මගෙ කුමරු

රැනෙන් මිදි මුව පැංචෙක් තනිවෙනවා
හීනෙන් වගේ මගෙ දෙනෙතට මුසු වෙනවා
පානෙන් සිනා හද ගැබ තුළ කිතිකනවා
පැනෙන් නොවේ නෙතගින් කවි ලියැවෙනවා

නෙතු අග පුදන ඉගියෙන් හදවත සනසයි
සිතුවිලි දිය පහර තෙරපී වාන් දමයි
මතුරන ගීතයෙන් ඉන්නේ නුඹම තමයි
අතු අග මලේ සමනල තටු සැලෙන හැඩයි

හිරු සැඟවුණත් අඳුරක් නැහැ දැනෙන්නේ
තරු හිනැහුණත් මේ දෙස නැහැ බැලෙන්නේ
පිරු පැතුමන් වැඩියි මහමෙර ලෙසින්නේ
මෙරු ඉගිලුණා සේ සිතුවිලි සැලෙන්නේ

සිතේ තියෙන හැඟුමන් විසිරි යන්න
නෙතේ ඉගිය හසරැල්ලෙන් තේරෙන්න
අතේ දුරින් සිටි නුඹ මට ළං වෙන්න
ඇතේ පෙරුම් මගෙ කුමරුන් හිමිවෙන්න

ඕෂධී දිප්තිකා පතිරත්න

ආතුර ප්‍රේමය

ආතුර වූ ප්‍රේමයේ සිතුවිලි
සුරල් වැස්සක් සේ සෙමෙන් සැලුණා
රැයට අවනත නොවුණ දෙනයන
මුහුණු පොත මත අවදියෙන් සිටියා
උණුසුම නොලත් එක රැයක්
හැඟුම් තෙරපී නිදිවරන මුළු රැයක්...

සොයා වෙනතක් නොයා නොම ළතැවී
පුරා පෙරුමන් ආ සසර මගදී
ඔබමැ පමණයි ජීවිතය තුළදි
ළැඟුම් ගත් ඒ රාගිනිය සබැඳි...

අහෝ ඒ සැප සැපක් යැයි නොසිති
ගියේ අතහැර සියලු දේ නොසැලි
ප්‍රේමයත් රාගයත්කිම නොදැනි
බිඳුණු ඒ සිත් කුමටදෝ එක් වී..

කරුණාරත්න විජේවර්ධන

අනේ මන්දා

බැහැම කියලා
ගහම අල්ලන්
හිටපු තුරු පත්
මන්මුළාවේ....
හැළුන පසු බිම
සුළං එක්කල
යන්ට යනවා
වන්දනාවේ.....

ශාන් දිසාන්

විදවන මතක

හදවත අගුල් දා අරගෙන.ගොස් යතුර
වරදක් කළත් ඇයි තරහින් නුඹ මතුර
ඔබ හට නැතත් සිහිවෙනවා මට නිතර
මා මිය යාවි දෙනු මැන බිඳුවක් වතුර

දුක සැප ළඟදි හැමදාමත් අපි එකට
හිටියා එකම පවුලක.දරුවන් ලෙසට
සුළි සුලඟකින් නැතිවිය පෙර කළ පවට
මම ආදරෙයි සදහට ඔබගෙ නමට

ළංවි ඉදලා වෙන්වි ගිය පසු දැනෙන
ලතැවිල්ලකි සුසුමන් සලමින් හඬන
සිහිනෙන් පවා හැමදාමත් සැරිසරන
මතකය විදවමි නවතින තුරු ගමන

ආසිරි විජේසේකර

සිහිනය නුඹ

මධු සාද රාත්‍රියේ
සඳ හාදු කාන්තිදී
පවන් රැළි දිගේ
මිහිර සොයා පැමිණි වග දැනී
රත් දෙතොල් පුරා නුරා පිරී
ඉහිරිලා තියේ.....

අඳුර බිඳී යළි ඉපදෙන
නේක එළි රටා
වටා රඟන නන්දනයේ
මම විඳිමි බලා....
අසුරු සැණින් නෙතු ඇහැරී
මවිත කළ සොබා නිවා දැහැනෙ
ළෙන්ගතුවී නුඹ යන්න ගියා.....

ලලී සමරු සමරක්කොඩි

දැරිය

මා යනෙන පටුමග
මහ රබර් යායෙහි
හීල් සෙවණැලි මැද
නිති රැඳෙන එදැරිය...

බොකුටු කරගත් ගවුම් කෙටියෙහි
පිරිතිරී රතු පේර මාදං
සට සට හඬින්
ඉහිරෙත රබර් ඇට
ඉස රැඳි කිරි ඉද්ද වේලය
වමතින් සකසමින
හෙම්හිට බසින
නොගැඹුරු දොළ දියට
එගොඩ වනු රිසියෙන්
ඉන් ඔබ කමත වෙත....

එහි වැසි දණ්ඩි සුමිතුරු
ඈ මොළකැටි දෙපා
වටකොට වැරෙන් කිති කවත
මිණි ගිගිරි වැගිරෙන
රන් ටිකිරි සිනහා නැගි
බෝ හුරුපුරුදු පැටි මුහුණ
සිහිනයන් දහසක දුටු
කවුරුද ?

අමා ඔවිනි අලුත්ගේ

සොයුර පෙම

කුඩා කල සිට හොඳ නරක කියාදී
පාසල් මව වෙත යැව්වේ පාඩම් කියාදී
කළ වරදකට දඬුවම් කළේ නෑ සෑදී
සොයුරිය ඔබට වඳිමි සැමදා සිත පැහැදී

බෝසත් ගුණෙන් සොයුරන් හට සැලකුවේ
කිසිමදාක නැත කිසිවක් ඔබ පැතුවේ
මිණිමුතු ඔවදන් දී යහමග යැව්වේ
තෙරුවන් සරණින් ඔබ හට ජය අත්වේ

සුනේත්‍රා විජේරත්න

ගිණි සිසිල

අතීතයේ සිට පිච්චී පිච්චී
නැටුව නැටුමක් නෑ පුතේ
තවත් මහ රජ ඇමතිලා ළඟ
පෙරහැරට නටනවා පුතේ''
පැගිලා මහ පොළව ඇදවී
කිසිම හරයක් නෑ පුතේ
සාස්කෘතියත් කාපූ උන්දැලා
පොළවේ ඇද හොයනවා රටේ''
පන්දමට ඔය කිරි එරෙන්නේ
අඬද්දී බඩ මයේ හිතේ
ගිනි නොවෙයී ඔය ඇවිළ එන්නේ
අම්ල පිත වැහැරුණු බඩේ

දර්ශන රුවන් ජයපත්ම

මුහුණු පොතේ කවියක්

අරුත් සුන් සැඳෑවක නික්මන...

දා හළුව ගිය හේනක
මතක අඟුරෙන් තැවෙන පොළොවකි...

පොළොවෙහි නැගුණු ගිනිදලු
තාම උහුලා දැවෙන අහසකි...

පා තබා යන පොළොවට
හිමිකම් නොපෑ මගියෙකි...

සැඳෑ ඇතැමක අරුත වුව සකි
දැවුණු සුන'රුත් දිනෙක මතකෙකි.....

සනත් බාලසූරිය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.
සිළුමිණ, කවි පිටුව,
ලේක්හවුස්, කොළඹ 10.
edmediaunit@gmail.com

විදෙස් කවිය

අම්මා

අවුල්වෙන
අවුල් වී
නිතර පැටළෙන
මගේ කළු කැරළි
හිසකෙස්
මගේ කළු සම වගේ
මටම අයත්
අපේ ජානය...
තාරුණ්‍ය යේ එළිපත්ත
මත සිටින මා
ඇගේ ඇකයේ
දෙදණ අතර සිරවී
අවුල් හිස පීරා ගනිමි
මා පීරා ගන්නා ලෙසට
මුත්
ඇගේ තලෙළු
දිග ඇඟිලි තුඩු
මගේ පැටළුණු හිස
පිරා සුවපත් කරයි
සැම විට ....
එසඳ
ඇගේ ඇඟිලි ඇට
කැඩෙන හඬ
මගේ සවනත
ගැටෙන්නේ
දිව්‍ය ගීතය ක්
ලෙස ය....
මක්නිසාද යත්
ඈ මගේ අම්මාය..

Micah Daniels.

Micah daniels කළු අමෙරිකානු කිවිඳියකි. ඇය දැනට ඉලිනොයිස් විශ්ව විද්‍යාලයේ උපාධිය හදාරන 18 හැවිරිදි සිසුවියකි. වර්ණ භේද පීඩනය හා මාතෘත්වය අතර විශ්මිත සියුම් පාලමක් තනමින් ඕ නිර්මාණය කළ මේ කවිය 2020 අගෝස්තු 05 දා "පොයම් අ ඩේ" හි පළවී ය. ඇගේ මේ නිර්මාණය ඉමහත් විචාරක හා ශ්‍රාවක ප්‍රශංසාවට හා අවධානය ට ලක් වී ඇත.

අනුවාදක :
සමන් ගුණහේරත්

පාඩම් පොතට

පිණි පා කරන මුත් ඔසවා මුතු කුඩය
අනි මිස ලෝචනෙන් හඳුන විට හඬය
මිනි හා මිනිහ ළඟ පවතින පණිවුඩය
විනි විද නුදුටුවොත් ජීවිත කොට උඩය

වෙණ නද වගේ ගුත්තිල වෙණ තතින් බිඳී
කණ සනසවන මුත් උතුරන වදන් පොදී
පෙණ ගොබ තිබේ නම් හදවතෙ දළින් රිදී
හෙණ ගෙඩියක්ය හිස මුඳුනට කෙළින් රැඳී

සඳ රැස් දියෙන් නෑවෙන කිති කවන ඇඟ
කොඳ වන මුවින් සුපුරුදු වුණු බමර දඟ
හොඳ ටම සිඳී නම් පතුලට කුලුණු ගඟ
අද හස් කියයි ගිනියම් වුණු යහුණු වග

අරු ණෙන් දයා - මුදිතා ගුණ සමා දිය
උරුමෙට පුබුදුවී නොගලන අමා දිය
පිරුණත් මුතු - මැණික් ගබඩා කනා දිය
බොරු වකි ජීවිතේ පණ්ඩිත උපා දිය

මෙර මා පිණිස මිස ජීවිතෙ ඇසිල් ලක්
පර හිතකාමයෙන් අඹ මල් පියල් ලක්
සර ණක නොමැති තැන කිසි අස්වැසිල්ලක්
දෙර ණත සඳුන් වනයට - ගිනි පෙනෙල් ලක්

රණගල සමරසේන

සඳ හා මම

සඳ පිපිලා හිනාවුණු පසළොස්වක පෝයදාට
සඳ හිනැහීගෙන ආවා එළිය දෙමින් මගේ ළඟට
සඳ නාවත් පුරුදු ලෙසින් එළිය දෙන්න මගේ ලොවට
සඳ පිපෙනා පසළොස්වක සිහිවෙන විට හරිම සතුට

මගේ හදට සඳේ එළිය සතළිස් වසරක් ලැබුණා
අගේ නැතිව පායන සඳ දිහා බලා සිත පිරුණා
අගේ කියන්නට සඳ ගැන ලිව්වා බෝ කවි වරුණා
මගේ සිතට දැනුනෙම නෑ දිනයක් වෙද සඳ නොඑනා

නොපෙනෙන සඳ දිහා එබෙමි දෙනෙත්වලට මුවාවෙලා
ඉඳහිට ආවා පුරහඳ අඳුර මැදින් පමාවෙලා
වැස්ස - සුළඟ - විදුලි - අකුණු මැද අද සඳ වහන්වෙලා
හිතාගන්න බැරි තරමට අසරණකම හිතේ වෙළා

සවණට නැත මිහිරි හඬක් ඇතින්වත් ඇසෙන්නේ
හිතකට සඳ එළිය මැවූ සඳ නැත අද පෙනෙන්නේ
කවදා හෝ යළි ඒ යැයි මගෙ හිත මට කියන්නේ
එහෙම නැතත් හිතේ පිරුණු එළියෙන් දුක නිවන්නේ

කුසුමා වර්ණසූරිය

සතියේ කවි පොත

කෘතිය - රතු කොටු සහ BLACK කෝපි
කර්තෘ - හෙලනි සිල්වා
කර්තෘ ප්‍රකාශනයකි.

එළැඹීයේ පොත් වසන්තයයි. ගෙවුණ කාල සීමාව තුළ අලුත් කවි පොත් රාශියක් ම එළිදැක්විණි. ඒ අතර ප්‍රවීණයන්ගේ සහ ආධුනිකයන්ගේ ද කාව්‍ය සංග්‍රහ ද තිබිණි.

අද සතියේ කවි පොත ලෙසින් හඳුන්වා දෙනු ලබන්නේ ද නවක කිවිදියකගේ කාව්‍ය සංග්‍රහයකි. රතු කොටු සහ බ්ලැක් කෝපි කාව්‍ය සංග්‍රහ රචනා කළ හෙලනි ද සිල්වා අපට බොහෝ විට හමුවන්නේ මුහුණු පොතිනි. ඇගේ කවි මුරණ්ඩුය. හිතුවක්කාරය. විටෙක කිවිදිය සියල්ලම කියා දමයි. තවත් විටෙක ඇය කියන්නට ඇති දෙය සඟවා තබයි. මේ සියල්ල තේරුම් ගැනීමට නම්; රතු කොටු සහ BLACK කෝපි මුල සිට අගටම කිය-විය යුතු ය. බහුතරයක් කවි ලියැවී ඇත්තේ ස්ත්‍රී පුරුෂ ප්‍රේමය, බැඳීම, ලිංගිකත්වය මුල් කරගෙන ය. හැර යෑම්, අත්හැර දැමීම් මෙන් ම කඩාකප්පල්කාරි බැඳීම් ඇගේ කවිවලට විෂය වී තිබේ. ඒ කවි වලට කිසිම තැනකදී මාතෘකා නැත. අවශ්‍ය නම් අපට ඕනෑම මාතෘකාවක් ඒ සඳහා යොදාගෙන කියවා විදිය හැකි ය. මේ ඇගේ කවි පොතෙහි අපට හමුවන මාතෘකා නැති කවි අතරින් එකකි.

ගැහැනිය සුන්දරයි කියන්නේ ද, ඇය අහිංසකයි, ළද බොළඳයි යැයි කියන්නේ ද පිරිමියා ය. එවන් පිරිමියාම ඇය නපුරු යැයි ද, යක්ෂණිය කැයි ද කියන්නේය. ප්‍රේමය ඇති දා නොව ප්‍රේමය අත්හැරුණ දා එහෙමත් නැත්නම් අත හැර ගිය විට තනිවුණ ගැහැනියකගේ සිතුවිලි කිවිඳිය එය දකින්නේත්, ගැහැනියගේ සිත තුළ ඇති හැඟීම් ලියන්නේත් මෙලෙසිනි. අප දන්නා බොහෝ ගැහැනු සිත් මෙවැනි ය.

"ඉන්න තිබුණ ටිකක් අවදියෙන්
සරාගී හැඟුම් හංගලා
නෙතට බැහැ බොරු කරන්නට
නුඹ උන්නේ නැහැ පපුවට බරවෙලා
දමා මා කළුවරේ නුඹ සෙතක් වුණි නම්
මමත් ආසයි කළුවරට
දවසක නිවනක් දකී නම්
එදා නුඹ ළඟ දැනුණු උණුසුම
ගියත් යන්නට අතවනා
අදත් මං යහනතේ ඉඩ හදමි
නුඹේ වම් උරයට බරවෙලා
යක්ෂ ගෑනිය බුදුවරි කියු නුඹත්
අද ගොළු වෙලා
යන්න ගිය හැම විටම මම
යදම් ඇත මල් වෙලා
පිපෙයි නම් අලුත් මලකට
උයනේ ඉඩ හදා
හුළඟ වී මම ඇවිත් යන්නම්
නිතර දුක් සැප විමසලා"

හෙලනි සිල්වා

දුකක් දැනුන විට ගැහැනිය හඬයි. කඳුළ සලයි සුසුමිලයි. දවසක් දෙකක් නොව දිගින් දිගටම එකම දුක් තැවුල් විදින්නට සිදුවන විට ඇය ජීවිතයට මුහුණ දෙන්නේ ඒ සියල්ල විඳ දරා ගනිමිනි. අවසානයේ ජීවිතය සමඟ ගැටෙන ඇය තුළින් අපට හමුවන්නේ යකඩ ගැහැනියකි. හදවත ගලක් කරගත් ගැහැනියකි. මේ එවන් ගැහැනියක් පිළිබඳ කිවිඳියගේ සිතුවිලිය.

"කඳු වේදනාව දරා ගත්තේ
ප්‍රදීපාගාර මෙන් නොව
සයුරට රළ සේ
හිතට පවු පෙවූ අහිංසකාවිය මම
සිනිඳු ඇතිරිලි කටු හා සම වෙන්නම්
කඳුළුත් රස්නෙය නුඹ නොමැතිව
මතක
එක්ක...
පින්නට නැහැ කිසි මලක් බිය වෙන්නේ
මේ මලට පින්නමයි පරවෙන්න ඉගැන්නුවේ
කොප්‍රල් තව නැහැ රත් පැහැ වෙන්නේ
දැල්වීම තමයි කෝල බැල්මත් හමුවේ
පාමුල දෙස බලනවා නම්
කළු පාට හදවතක් ඇති ගල් ගැහුනු
එය මගේ..."

හෙලනි ගේ කවි පොතේදී අපට කෙටි කවි ද හමුවේ. ඒ කවිවල මහා අරුතක් ඇත. ඇතැම් කවි වල ඇත්තේ වාක්‍ය දෙකක් තුනක් පමණි. කිසිත් නොකියමි. ඇගේ පොතේ එන මේ කුඩා කවිය මෙහි ලියමි.

"ප්‍රේමය
එන්න දෙන්න
යන්න දෙන්න බලාගෙන..."

කිවිදිය ප්‍රේමය ගැන කියන්නට අතීත කතාවල සහ චරිත ඇදා ගනී. එක් කවියකදි අපට වැදි රජ, දූලා කුමරිය, මනමේ කුමරු හමුවේ. ඇය ඒවාට නව අර්ථකතන දෙයි. තවත් කවියකදී අපට සිංහබා හමුවේ. ඇය මේ බැඳීම් සමඟ එන චරිත ද එක්කර, අදට ගැළපෙන දේ ලියන්නට උත්සාහ දරයි. එසේ ලියන විට ඇය අද සමාජයේ ව්‍යවහාර වන වචන ද යොදා ගනී.

ගැහැනු සිත්වල තරම, ඒ හිත්වල ඇති දුක සතුට, සියල්ල හඳුනන්නේ ගැහැනුන්ම පමණි. මනමේ කුමරු සමඟ ආ කුමරිය වැද්දාට කඩුව දෙන්නටත් කුමක් හෝ වේදනා බර කතාවක් ඈ සිත තුළ තිබෙන්නට ඇත. එක්කෝ ඈ ප්‍රාර්ථනා කළ ලෝකය දකින්නට ඇයට අවශ්‍ය වන්නට ඇත. මේ කිවිඳියගේ සිතුවිලිය.

"කඩු කොපුවට නැතැයි
හිතනවද කාටවත්
කියාගන්න බැරි වුණ
කතන්දර...
කඩු මිටටත් ඇති
අප්‍රමාණ චිත්තාවේග
කුමරාට තියා වැද්දාටවත්
හරියට පෙන්වා ගන්න බැරි වුණා
දූලා කුමරියටත් තියෙන්න ඇති
මනරංජන හීන රාජ්‍යයක්
ගැහැනු කඳුළක් පිටුපස හැංගුන..."

ඇය වෙනත් විදිහට සමාජය දකින්නට උත්සාහ දරන නිර්මාණ කාරිනියක යැයි ඇගේ කවි කියවීමේදී සිතේ. රතු කොටු සහ BLACK කෝපි කාව්‍ය සංග්‍රහය කර්තෘ ප්‍රකාශනයකි.

විප්ලවීය රුසියාවේ සෝවියට් දේශ ප්‍රේමය

ග්‍රන්ථය - මගේ පුතා
පරිවර්තනය - මල්රේණු කස්තුරිරත්න
සුභාවි ප්‍රකාශකයෝ
මිල රු.435 (පිටු 214)

යෙලේනා කොෂෙවයා ලේඛිකාවක නොවේ කීර්තිමත් පුත්‍රයෙකු ලොවට දායාද කළ උදාර මාතාවකි. ඇය සිය දීප්තිමත් පුතු මනා ශික්ෂණයකින් හදා වඩා ගත්තා ය. පුතුගේ ආත්මය තුළ ට ආදරය, කරුණාව, මාතෘ භූමිය හා මානව වර්ගයා කෙරෙහි නොනැසෙන ප්‍රේමය වගා කළාය. ඉදින් මාතෘ භූමිය අනතුරට පත් අවස්ථාවේ කිසිවෙකුගේ ඉල්ලා සිටීමකින් තොරව, මවුබිම වෙනුවෙන් ඔහු පෙරට ආවේය.

කෙසේ වෙතත් ඉහතින් කියවුණ එය වනාහි හුදු උදාන වාක්‍යයක් යැයි නොසිතිය යුතුය. එය වුකලී දොස්තයෙව්ස්කි, චෙකොෆ් මෙන්ම ගෝර්කි වැනි රුසියානු මහා ලේඛකයන්ගේ උත්තුංග ප්‍රගතිශීලීත්වයෙන් වගා වුණ රුසියානු විප්ලවයේ ජයග්‍රහණයේ ලා පාදක වුණ ප්‍රගති බලවේගයක් හැටියට පැවතුණ සෝවියට් දේශ ප්‍රේමයම වන්නේ ය. යෙලේනා කොෂෙවයා සිය පුතුට සිය මව් කිරි සමඟ පෙවුයේත්, පසුව ෆැසිස්ට්වාදී ජර්මන් ආක්‍රමණය හමුවේ මාතෘ භූමිය වෙනුවෙන් ජයග්‍රාහීව සටන් වැද මරණයට පත් සිය පුතු වෙනුවෙන් ලියා තැබුවේත් ඒ දේශ ප්‍රේමයේ කතාවයි.

ඒ අකාරයට රුසියානු බසින් ලියවුණ ඇගේ ඒ මාතෘ (දේශ) ප්‍රේමයේ කතාව රුසියානු බසින්ම සිංහලට නැගීමට මල්රේණු කස්තුරිරත්න කටයුතු කොට තිබේ. "මගේ පුතා" නමින් ප්‍රකාශයට පත් වන්නේ ඇගේ ප්‍රයත්නයයි.

ඇයගේ පුතු ඔලෙග් කොෂෙවයි කුඩා වියේ සිටම සිය මවගේ නිරීක්ෂණය දිනා සිටියේ ය. මව මෙසේ පවසන්නේ ද ඒ නිසා ය.

"මගේ හොඳම සහකරුවන් වුයේ පොත් ය. පොත් කියවීමට, සවන් දී සිටීමට ඔලෙග් නිම්හිම් නැතිව සවන් දී සිටියේ ය. ඔහු සෙල්ලම් බඩු කෙරෙහි ලැදි නොවී ය. එහෙත් පොත්පත් කෙරෙහි නම් උන්හිටි තැන් පවා අමතකව යයි."

-පරිවර්තිකාව විස්තර කරන අන්දමට 1945 මැයි 9 දා සෝවියට් රතු හමුදාව ලද ෆැසිස්ට් විරෝධී ජයග්‍රහණයට ඔලෙග් හා ඔහුගේ -තරුණ ආරක්ෂකයෝ- නම් සංවිධානය ඒ මිතරු සමාගම දැක්වූ දායකත්වය ද අර කිව සෝවියට් දේශ ප්‍රේමයෙන්ම උපන්නක් වේ.

අවසානයේ දී සෝවියට් දේශයේ වීරයා සම්මානයෙන් පිදුම් ලද ඔහුගේ ඒ කෙටි ජීවිත කතාව පාසැල්වල දරුවන්ට ආදර්ශ කතාවක් ලෙසින් කියා දෙන තත්වයක් නිර්මාණය වූයේ ය. සිය පුතු ගැන මව ලියූ මෙම කතාව පාසැල්හි කියවීම් පොතක් ලෙසින් ද නිර්දේශ කෙරුණේ ය.

මවක විසින් දේශ විමුක්ති අරගලයට දිවි පිදූ සිය පුතු ගැන ලියන්නා වූ කතාවක් හැටියට එයින් මතුවන මවකගේ ලයාන්විත සෙනෙහස මෙන්ම දේශ ප්‍රේමයේ විභූතිමත් සාඩම්බරය මෙහි නිරූපණය වී ඇති ආකාරය දෙස බලන විට අනාගත පරපුර වෙනුවෙන් එය එසේ නිර්දේශ වීමේ අරුමයක් නොපෙනෙයි.

සාර්වාදී පාලනයෙන් අතිශය පරාධීනත්වයටම ඇද වැටී තිබූ රුසියාව, සෝවියට් මාතෘ භූමිය වශයෙන් විප්ලවීය ජයග්‍රහණය අත් කරගන්නා ඒ ඉතිහාස සීමාවේ දී සිදු කළා වූ බෙහෝ මානව කැප කිරීම් පිළිබඳ සාහිත්‍යයක් ඔවුන්ට ඇත.

ඒ අතරම ආත්ම ශක්තිය, බොහෝ කටුක වධ වේදනාවන් දේශ ප්‍රේමයේ නාමයෙන් විඳ දරා ගත්තා වූ ජීවමය අත්දැකීම් වලින් පොහොසත් විශිෂ්ට සාහිත්‍යයක් සෝවියට් දේශය වෙනුවෙන් නිර්මාණය වුයේ ය.

අවසානයේ දී විප්ලවීය රුසියාවක් නිර්මාණය කළ මහා රුසියානු ජාතිකත්වයෙන් උපන් ඒ සාහිත්‍යය නිසා ලද ආභාසය ගැන ලෙනින් ද කතා කොට ඇත. එක් ප්‍රකට කියමනකට අනුව සාහිත්‍යය යනු ජාතියේ හෘදය සාක්ෂියයි යන්න සෝවියට් රුසියාව තරම් සනාථ කළ තවත් රටක් ඇත්තේ දැයි සිතෙන තරම් ය.

එවැනි පසුබිමක කිසිදාක ලේඛිකාවක නොවූ ඇතැම් විට එසේ වීමට මතු බලාපොරොත්තුවක් හෝ නොතිබූ යෙලේනා කොෂෙවයා මෙසේ සිය පුතු ගැන ලිවීම අමුතු විස්මයක් ඇති නොකරයි.

"ජර්මානුවෝ අනුකම්පා විරහිතව සියලු ධාන්‍ය සහ පශු සම්පත් එකතු කොට ජර්මනියට පැටවූහ. සාගින්නෙන් මිනිසුන් මිය යමින් සිටි ක්‍රස්නදෝනයට ඉහළින් ධාන්‍ය පටවාගත් දැවැන්ත ගුවන් යානා බටහිර බලා පියෑඹීය. අනතුරුව ජර්මානු වහල් මෙහෙය උදෙසා තරුණයන් දැක්කීම ඇරඹුහ. උක්රේනියානු මහ පොළොව වැළපීමෙන් කෙඳිරියෙන් හා වේදනාවෙන් පිරී ගියේ ය."

-ජර්මානු නාසිවාදයෙන් ඇවිළුණ ෆැසිස්ට්වාදී ආක්‍රමණය මේ ආකාරයටම ප්‍රංශය ද යටපත් කළ අවස්ථාවේ දී ජාතියක් හැටියට ඔවුන් මුහුණ පෑ ඒ බේදවාචකය තවදුරටත් ඉවසනු නොහී ඊට එරෙහිව ප්‍රංශ ජාතිකත්වය අවදි වූ අයුරු ගැන කියවෙන සිමොන් ද බොවාගේ "බ්ලඩ් ඔෆ් අදර්ස්" (එය අනුන්ගේ ලේ නමින් සිංහලට ද නැගී තිබේ.) නම් කෘතිය ද මෙහිදී සිහිපත් වේ.

එය එසේම ය. සිය ජාතිය වෙනුවෙන් ඇති හැගීම ඉතාම කුඩා පක්ෂියෙකුට වුව පොදු ය. දේශ ප්‍රේමය හමුවේ කුමන බාධාවක් ද ශක්තිමත් වන්නේ? නැත එය එසේ නොවන්නේ ය.

එය වනාහි මිනිසුන්ගේ ලේ තුළම පවතින්නකි. එහෙම නැතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ පවතින්නක් නොවේ. එසේ අර්ථ නිරූපණය කළ හැක්කක් ද නොවේ. උක්ත කෘතිය ද කිසිදා ලේඛිකාවක නොවූ මවක විසින් සිය පුතු ගැන ලියුවක් වන තරමටම සාහිත්‍ය රසයෙන් ද තොර නොවන්නේ ද ඒ නිසාම යැයි සිතේ.

නිවී ගොස් ඇත්තේ එබඳු නැණ පහනකි

සරත්චන්ද්‍ර ජයකොඩි

සරත්චන්ද්‍ර ජයකොඩි

"අට මසක් පුරා පැවති ඉඩෝරය හමාර කරමින් මෝසම් වැසි සමය ඇරඹුණු සේය. සිවුපාවෝ ද පක්ෂීහු ද ජනයා ද ගලා හැලෙන වැසි දිය දහර නිසා සැනසුමක් ලදහ. මගේ සංඛ්‍යාලේඛන අනුව නියඟය නිසා මේ ප්‍රදේශයේ මියගිය ගවයන්ගේ ගණන 126 කි. මුළු දිස්ත්‍රික්කයේම ගවයන්ගේ සංඛ්‍යාව ගතහොත් දහස් ගණනක් විය හැකිය. එහෙත් ඊළඟ දෙසතිය පුරා වැසි පොදක් ගිලිහුනේ නැත. නැවත ද උෂ්ණත්වය ඉහළ නැංගේ ය. අඟලක් පමණ මෝදු වූ මල් පොහොට්ටු මලානිකව අතුරුදහන් වන්නට වන. ඉක්බිති දින කිහිපයක් පැවතියේ ශාන්ත වාතාවරණයකි. සැතපුම් 90 ක පමණ වේගයෙන් හමන "කච්චන් මාරුතය" කෙළවර දුටු සේය. හාත්පස කුතුහලය දනවන නිහැඬියාවක් වැලඳ ගති. දැරිය නොහැකි වූ උණුසුම එළෙසින්ම යළිදු පැවතිණි. සුළඟ නිශ්චල විය."

එක්දාස් නවසිය අසූව දශකය ආරම්භ වුයේ 60 -70 දශකයන්හි පෙරළිකාර මතවාද සමඟ හැදී වැඩුණු එමෙන්ම නව ලෝක දැනුමත් සමඟ මුහුකුරා යමින් සිටි බුද්ධිමතුන්ගේ දායකත්වයෙනි. අවාසනාවකට මෙන් ඒ දශකය අවසන් වුයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ඝාතකයන්ගේ භීෂණයේ රාත්‍රියක් විලසිනි. නක්සලයිට් යැයි හංවඩු ගසමින් තරුණ කොටස් නින්දනීය ලෙසින් මරා දැමුණු කාල වකවානුක් හැටියට ය. 80 දශකයේ තරුණයන් වන අපගේ තරුණ විය ගෙවී ගියේ එවන් විද්වතුන්ගේ ඇසුරත් අර කිව භීෂණයත් අතරිනි. කෙසේ වුව ඒ සමය පොහොසත් එමෙන්ම විද්වත් දෘෂ්ටිවාදයක් සහිත පුවත්පත් හා ග්‍රන්ථ සාහිත්‍යයක් ඇති කිරීමට ඒ විද්වත්හු කටයුතු කළහ.

සරත්චන්ද්‍ර ජයකොඩි යනු ද ඒ විද්වත් ප්‍රජාවගේම නියෝජනයකි. අප අතින් ඉහතින් උපුටා දැක්වුණේ විසිවන සියවස මුල් සමයේ මෙරට විසූ ඩග්ලස් රෑෆල් නම් ඉංග්‍රීසි ජාතිකයා අප රටේ දකුණු ලක වනගත පරිසරයක නේවාසිකව තමන් විඳි අත්දැකීම් අළලා ලියූ "ඉන් රුහුණු ජංගල්" නම් කෘතියේ සිංහල පරිවර්තනයෙන් කොටසකි.

එය "රුහුණු වන සැරිය" නමින් සරත්චන්ද්‍ර ජයකොඩි විසින් මුලින්ම ප්‍රධාන පෙළේ පුවත් පතකට කොටස් වශයෙන් ඉදිරිපත් කරන්නට යෙදුණි. එකල පුවත්පත් එවැනි නුදු ප්‍රවෘත්ති වාර්තාකරණයෙන් එහාට ගිය පුවත්පත් විෂයයික සාහිත්‍යමය ප්‍රවේශයක් කරා යොමු කළේ එවැනි උගතුන් ය.

"එදින දරුණු ගිගුරුම් කුණාටු හා විදුලි කෙටීම් නොකඩවාම ඇති විය. මම යහනෙන් නැගී වැස්සේ සුන්දරත්වය නැරඹීමටත්, නැවුම් පොළොවෙන් නැගෙන සුගන්ධය ආඝ්‍රාණය කිරීමටත් පැමිණියෙමි. ජලධාරා පොළොව මත හාත්පස ගලා යනු දිස් විය. කුරුල්ලෝ සියුම් මිහිරි නාද නැගූහ. වඳුරෝ පුරුදු හඬින් අඳුරේම සොම්නස පළ කළෝය. මේ ශ්‍රේෂ්ඨ අවස්ථාව රාත්‍රී ඇඳුමින් යුතුව පිළිගනිමින් නැවත නිදි යහනට පිවිසියෙමි. වේලාව අලුයම 3 ට පමණ ය. එදින රෑ ඉමක් කොනක් නැතිව වැස්සේ ය."

මෙවැනි කියවීමක් භූගෝල විද්‍යාව මෙන්ම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් උගන්නා සිසුන්ට පසුබිම් දැනුමක් නොම සපයන්නේ ද යන්න අධ්‍යාපනයක් ඇති අධ්‍යාපන බලධාරීන් කල්පනා කරන්නේ නම් මැනවි. තවද සාම්ප්‍රදායික නිර්දිෂ්ට කෘති පෙළම "පාරුකාරයාගේ උම්බලකඩය මෙන්" යළි යළිත් නිර්දේශ කරමින් භාෂා සාහිත්‍ය අධ්‍යයනය මෙලොවින් තුරන් නොකිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

මෙරට පාසැල් සිසුන්ට වනගත අත්දැකීම් මෙන්ම කුරුල්ලන් කෑ ගසන හඬ පටිගත කොට අසන්නට සැලැස්වීමෙන් ඔවුන් වඩා පොහොසත් පුරවැසියන් බවට පත් කිරීමේ හැකියාව ගැන ද මෙහිලා පෙන්වා දීමට ඩග්ලස් රෑෆල් වැනි විදේශිකයන් කටයුතු කොට තිබේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ඒ සම්බන්ධයෙන් මැදිහත් වීමේ ඉඩ කඩක් පවතින බව ද ඒත් සමගම පෙන්වා දෙනු ලැබ තිබේ. එවැනි නිර්මාණාත්මක නිර්දේශ වැනි කෘති සිය ද්වි භාෂා උගත්කමෙන් පරිවර්තනය කළ සරත්චන්ද්‍ර ජයකොඩි මෙන්ම එවැනි විරල විද්වත් ලේඛකයින් ගැන වීමංසනාත්මක හැදෑරීමක් අද නම් අවශ්‍යම ය.

"ලංකාවේ දෙමළිච්චන් සැම විටම සත් දෙනෙකුගෙන් යුත් රංචුවක් හැටියට හැසිරෙන බව ප්‍රකට කරුණකි. කවුරුත් ඒ බව දනිති. "සොහොයුරියන් සත් දෙනාගෙ රෑන" යනුවෙන් එය හැඳින්වේ. ඔවුහු සැමවිටම රෑනේ යථෝක්ත සංඛ්‍යාව එලෙසින්ම තබා ගැනීමට උත්සාහ දරති. එහෙත් ඔබ මේ කුරුලු රංචුවෙහි හැසිරීම් රටාව සියුම් ලෙස නිරීක්ෂණය කිරීමට උත්සාහ දැරුවෙහි ද? දිනපතා ඔවුන් මෙසේ රංචු ගැසී නාද නගන්නේ එකම වේලාවකට ය. එනම් පෙරවරු එකොළහේ සිට දොළහ වන තුරු ය."

සරත්චන්ද්‍ර ජයකොඩි වැන්නවුන් එකල විදෙස් කෘති සිංහල බසට නැගුවේ ජාතික මට්ටමින් යුතුකමක්, අධ්‍යාපනික කාර්යභාරයක් ලෙසින් ද එය සලකා ය. ඒ අනුව එය කොහෙත්ම හුදෙක් වෙළඳ පොළ ඩැහැ ගැනීමේ සිල්ලර අවශ්‍යතා මත සිදු වූවක් නොවීය යනුවෙන් ද දත යුතුය. එවැනි නිර්ලජ්ජිත අරමුණු එකල සිටි සාහිත්‍යකරුවන්ට තිබුණේ නැති තරම්ය. එනිසාම ඔවුහු සැබෑ ලෙසින්ම ජාතියේ බුද්ධි වර්ධනය වෙනුවෙන් කටයුතු කළ වුන් වූහ. එසේ හෙයින් කාල සීමාවකින් තොරව අදටත් ඔවුන්ගේ කෘති ජාතික මට්ටමේ බුද්ධි වර්ධනයකට සුදුසු වන්නේ ය. තවද සිය දේශයේ සමාජ සංස්කෘතියේ වෙනස්වීම් හැදෑරීමට ද සුදුසු වන්නේ ය.

"කතරගම දෙවියන්ගේ ප්‍රතිමාවක් දෙවොල තුළ දකින්නට නොලැබුණි. මේ අති පාරිශුද්ධ දේවාලය තුළ ඇත්තේ ස්වර්ණමය මංජුසාවක බහාලූ රන් පෙත්තකට සම වස්තුවක් හා යන්ත්‍රයක් පමණි. මේ යන්ත්‍රයෙහි දිව්‍යමය ශක්තිය ගැබ්කර ඇතැයි පැවසේ. දුටු ගැමුණු රජුගේ ජයග්‍රහණය හේතු කොටගෙන ඇරඹුණු ඇසළ පෙරහරෙහි පටන් වාර්ෂිකව පවත්වන පෙරහරෙහි මේ මංජුසාව කතරගම දේවාලයෙහි පටන් වල්ලි මාතා කෝවිල දක්වා රැගෙන ගියේය.

රාත්‍රියෙහි කෙරෙන මේ උපහාරයෙන් ඉක්බිති අලුයම කාලයෙහි යථෝක්ත ස්වර්ණමය මංජුසාව නැවත කතරගම දේවාලය කරා ගෙනයනු ලැබේ. අන් සියලු බලවේගයන් අබිබවා රුහුණු පුරවරයෙහි හාත්පස බල පවත්නේ කතරගම දෙවියන්ගේ බල මහිමයයි. ආඥා චක්‍රයයි. ඩී.ඩී.ටී. නිසා මැලේරියා වසංගත නිහඬ වන තුරු රෝගයන්ගෙන් ද දරුණු ව්‍යසනයන්ගෙන් ද රුහුණේ ගම්වැසියන්ගේ එකම විමුක්තිදායකයා වුයේ කතරගම දෙවිඳුන් ය. උග්‍ර නියඟය පවත්නා වූ ජූලි අගෝස්තු මාසයන්හි පැවැත්වෙන කතරගම පූජෝත්සවය සඳහා දහස් සංඛ්‍යාත ජනයා මේ පූජනීය භූමිය කරා පැමිණෙති. වන්දනාමාන කරති. පෙරහර ඔප්පු සිද්ධ කරති."

"1948 නිදහස ලබන තෙක් ලංකාවේ අගමැති සහ කැබිනට් ඇමතිවරුන් කතරගම දෙවියන්ගේ ආශිර්වාදය පතා පැමිණියේ පොදු රාජ්‍ය මණ්ඩලයේ ළාබාල රාජ්‍යයක අභ්‍යුදය හා රටේ ප්‍රගතියට අදාළ යෝජනා ක්‍රමයන්හි සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමේ අපේක්ෂා පෙරදැරිව ය. බෞද්ධ හා හින්දු යන දෙපක්ෂයෙහිම නායකයෝ එසේ පැමිණියහ."

සරත්චන්ද්‍ර ජයකොඩි සහිත්‍යකරුවෙකු වශයෙන් ගත් කල එකල පැවැති ප්‍රගතිශීලි මතවාදයන් සමඟ පැවතුණේ ඔවුන් සිය උරුමයෙන් ලද දේශ වාත්සල්‍යයේ ප්‍රගතිශීලිත්වය ද අත් නොහරින පසුබිමක ය. එසේ හෙයින් ඔවුන් හුදෙක් සීමාන්තික ඉගැන්වීම් හෝ කියැවීම් තුළ අතරමං වූ නරුමවාදීන් නොවීය. මේ ලිපිය මෙසේ ලියවුණේ ද ඒ නිසාම ය. මතු පරපුරට එවැනි මග පෙන්වීමක් ඇවැසි නිසා ය.

දෙවියන්ගේ නාමයෙන් දෙවියන් එනතුරු බලා සිටි ලැන්ස්ටන් හියුහ්ස්

ලැන්ග්ස්ටන් හියුහ්ස් (1902- 1967) අමෙරිකන් සාහිත්‍යයේ කවියෙකු, නවකතාකරුවෙකු මෙන්ම රංග පිටපත් රචකයෙකු හැටියට ලද කීර්තියක් ඇත්තෙකි. පසුව ඔහු සිය ස්ව චරිතාපදානය ලියන්නට යොමු වන අතර අප විසින් ඉහතදී මතු කරන්නට යෙදුණ කරුණට අදාළව කදිම ගද්‍ය රචනයක් ද ඔහු අතින් ලියැවී ඇත්තේ ය. ඒ වනාහි "සැල්වේෂන්" නම් ගද්‍ය රචනයයි.

ලැන්ග්ස්ටන් හියුහ්ස්

මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

ආගම යනු මිනිසා විසින් බිය, සන්ත්‍රාසය සමනය කරගනු වස් තමන්ගේ පැවැත්මට අදාළව නිර්මාණය කර ගත්තා වූ විශ්වාසයේ ඇදහිල්ලක් වශයෙන් හැඳින්වීමෙහි වරදක් නැතැයි සිතමි. එසේ ගත්කල සිය දඩයම් ගෝත්‍රික වනාශ්‍රිත පැවැත්මවල් සහිත ඒ යුගයන්හී දී මිනිසා තමන්ගේ පැවැත්ම වෙනුවෙන් නිර්මාණය කරගත්තා වූ රැකවරණයක් හා සමාන තත්වයක් ද ඒ තුළ දැකිය හැකි වේ. නමුත් පසුකාලීනව නුවණින් මුහුකුරා වැඩෙමින් ශිෂ්ටාචාරවත් වූ මිනිසා වෙනුවෙන් ආගමේ හැසිරීම කෙසේ වීද? එතැන් සිට අද දක්වාම ආගම විසින් සිය පැවැත්ම වෙනුවෙන් මිනිසාව තෝරාගත් ආකාරයක් දක්නට නොලැබේදැයි සිතා බැලීම වටී.

විශේෂයෙන්ම ඕනෑම දර්ශනවාදී ඉගැන්වීමක් ආගම නමින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේම මිනිසාගේ ලෞකික පැවැත්ම සමඟ ගනුදෙනුවක් හැටියට ය. එවැනි පසුබිමක මිනිසාගේ පැවැත්ම බිය, සන්ත්‍රාසය හමුවේ සරණ යදින අනාථ බවකට පත් කිරීම ඒ වෙනුවෙන් අවශ්‍යම කොනදේසියක් වේ. ඊට සාපේක්ෂව තෘෂ්ණාධික ඉල්ලීම් ඉටු කර ගැනීම වෙනුවෙන් ද දෙවියන් මුල්කොටගත් ආගම මාධ්‍යයක් හැටියට යොදා ගැනීම අද පවා විරල තත්වයක් නොවේ.

ලැන්ග්ස්ටන් හියුහ්ස් (1902- 1967) අමෙරිකන් සාහිත්‍යයේ කවියෙකු, නවකතාකරුවෙකු මෙන්ම රංග පිටපත් රචකයෙකු හැටියට ලද කීර්තියක් ඇත්තෙකි. පසුව ඔහු සිය ස්ව චරිතාපදානය ලියන්නට යොමු වන අතර අප විසින් ඉහතදී මතු කරන්නට යෙදුණ කරුණට අදාළව කදිම ගද්‍ය රචනයක් ද ඔහු අතින් ලියැවී ඇත්තේ ය. ඒ වනාහි "සැල්වේෂන්" නම් ගද්‍ය රචනයයි. එය ඔහුගේ ළමා විය ඇසුරෙන් ලියවුණක් වන අතර එයින් ඔබ ලද යුතු උගැන්ම වන්නේ ශිෂ්ටාචාරවත් මිනිසාව පවා තම පැවැත්ම වෙනුවෙන් අවාසනාවන්ත අයුරින් ග්‍රහණයට ගැනීමට පොදුවේ ගත් කල දාර්ශනික හරයෙන් වියුත්ත හුදු ඇදහීමෙන්ම සංයුක්ත ආගම නම් සංස්ථාපිතය කොතරම් දුරට කටයුතු කොට ඇත්තේ ද යන්නයි. කෙසේ වෙතත් ලැන්ග්ස්ටන් හියුහ්ස් එය ඉදිරිපත් කරන්නේ තමන්ගේ ආගමට අදාළව ය. නමුත් මේ විවේචනය ඒ ආකාරයේ සියළුටම අදාළ ය.

"මට වයස 13 වන තුරුත් පාපයෙන් ගැළවීමට මම කටයුතු කරමින් සිටියෙමි. එහෙත් එය කොයි ආකාරයෙන්වත් සැබෑ ගැළවීමක් නම් නොවී ය. ....මගේ නැන්දණියගේ රීඩ් පල්ලියේ දී ඒ හාස්කම සිදු විය. සතියක් පුරාම රාත්‍රීන්හී දි දිගු යාඥා මෙහෙයයන් එහිදී පැවැත්විණි. දේශනා, ගීතිකා මෙන්ම වැළැපෙන්නවුන්ගේ කෑ ගැසීම් වලින් ද තොර නොවුණි. පවුකාරයින් ක්‍රිස්තුස් ඉදිරියට පැමිණවීම බොහෝ විට එහිදී සිදු විණි. ....ළමයින් සඳහා ද වෙසෙස් රැස්වීමක් පැවැත්වුණු අතර නැන්දණිය බැටළු පෝතකයින් රැගෙන විත් (ඒ වෙනුවෙන්) ගාල් කිරීමක් ගැන දින කිහිපයකට පෙර සිට ම කතා කරමින් සිටියා ය. ඉදින් ඒ රාත්‍රිය පැමිණි කල්හි ආරක්ෂා සහිතව ඉදිරි අසුන් පෙළෙහි මා හිඳුවා තබන්නට ද ඇය කටයුතු කළාය. එහි සිටියේ වැළපෙන්නවුන් ය. ඒ වන විටත් යේසුස් ඉදිරියට පමුණුවා නැති සෙසු සියලුම පවුකාරයෝ ද ඒ පේළියේම වූහ."

"මගේ නැන්දණිය මට මෙසේ කීවා ය. -ඉදින් නුඹ ආලෝකය දකින්නේ නම් යම් දෙයක් නුඹ අභ්‍යන්තරයේ සිදු වන්නේ නම් සිතාපන්, යේසුස් නුඹගේ ජීවිතයට ඇතුළු වී සිටින්නාහ. එතැන් සිට දෙවියන් නුඹත් සමඟ ය. තවද නුඹගේ ආත්මයෙන් දෙවියන් දැකීමටත්, ඇසීමටත්, විඳීමටත් එකල්හි නුඹටත් හැකි වන්නේ ය.- මම දැවෙන සන්සුන්කමකින් හිඳ සිටියෙමි. සෙනගින් පිරුණ ඒ පල්ලියේ යේසුස් මා කරා එනතෙක් මම බලා සිටියෙමි."

"දේශකයාණෝ මනා රිද්මයක් පවත්වා ගනිමින් දෙසුම පවත්වද්දී වැළපෙන්නෝ කෑ ගැසුහ. සමහරු තනි තනිව වැළපුණෝ ය. අපායේ සිටින්නවුන්ගෙන් සැදුණාක් බඳු බේදජනක දර්ශනයක් එහි මැවිණි. කුඩා බැටළුවෙක් සීතල නොතකා එතැන මගහැර ඉවතට යනු පෙනිණි. -ඔබ නොඑන්නේ ද ජේසුනි, ඔබ නොඑන්නේ ද?- .....පසුව දේශකයා සිය දෑත් වැළපෙන්නවුන්ගේ බංකුවල සිටි කුඩා පවුකාරයන් වූ අපගේ හිස් මත තැබී ය. දැරියෝ හඬන්නට වූහ. ඒ අතරින් ඇතමෙක් පැන දිවී ය. ඒ යේසුස් එන නිවැරැදි මග සොයා ය. එහෙත් අපි බොහෝ දෙනෙක් කියපු විදිහටම හිඳගත්වනම සිටියෙමු."

තමන් ඒ මොහොතේත් යේසුස් දැක ගැනීමේ තදබල වුවමනාවෙන් සිටියේ යැයි ද ලැන්ග්ස්ටන් හියුහුස් පවසයි.

ඒ වන විට සියලු තරුණ ළමයින් අල්තාරය වෙත ගෙන යන ලදුව රැකවරණය ලබා දෙමින් කටයුතු සිදු වෙමින් තිබුණි. එහෙත් වෙස්ලි නම් තවත් පිරිමි ළමයෙකු සමඟ මම සොයුරියන් විසින් වට කරනු ලැබ පූජක සහායකයින් ද සමඟ යාඥාවේ යෙදී සිටියෙමි. පල්ලිය තුළ වූයේ තද උණුසුමකි ප්‍රමාදයේ ද කෙළවරක් නැති තරම් ය. අවසානයේ දී වෙස්ලි මා පුදුමයට පත් කරමින් මෙසේ කීය. -කමකට නැති දෙවියෙක්. මට මෙතන ඉඳගෙන ඉඳලම මහන්සියි. අපි නැගිටලා ගිහිං රැකවරණය ලබමු.- එසේ කී ඔහු නැගී ගොස් රැකවරණය ලබා ගත්තේ ය."

"මම වැළපෙන්නවුන් සමඟ ඒ බංකුවේ හුදෙකලා වුණෙමි. ඒ වන විටත් හැඬුම්බරව සිටි නැන්දණිය මා දණ ගැස්වුවා ය. මන්ද ඒ වන විටත් ගීතිකා හා යාඥා හඬ ඒ පල්ලිය තුළ සුළියක් මෙන් කරකැවෙන්නට පටන්ගෙන තිබූ හෙයිනි. සමූහයම මා වෙනුවෙන් යාඥා කරන්නට වූ අතර වැළපීම් සහ යාඥාවෝ ලතෝනියක් මෙන් නැගී එමින් තිබුණි. එහෙත් මම සන්සුන්ව යේසුස් එන තුරු බලා සිටියෙමි. එහෙත් යේසුස් නොපැමිණියේ ය. මට උන් වහන්සේ මුණ ගැසීම අවශ්‍යවම තිබිණි. එහෙත් කිසිවක් ම සිදු නොවී ය."

"දැන් නම් හොඳටම ප්‍රමාද වූවා වැඩි ය. මම මා ගැනම ලැජ්ජාවට පත් වීමි. වුවමනාවටත් වඩා කාලයක් මම සියල්ල දරාගෙන සිටියෙමි. ඒත් සමගම දෙවියන් වෙස්ලි ගැන කුමක් සිතන්නේ දැයි විස්මයෙන් යුතුව සිතුවෙමි. ඔහු යේසුස් නොදුටුවේ ය. එහෙත් බොහෝ උජාරුවන් වේදිකාව මත හිඳ සිටියි. ඒ මදිවාට කකුල් ද සොළවයි. පහළින් සිටින මා දෙස බලා විරිත්තන්නාක් මෙන් සිනාසෙයි. මේ අතර පූජක සහායකයන් සමඟ මහලු කාන්තාවෝ සමූහයක් යාඥා කරමින් සිටියෝ ය. දෙවියන් තවමත් නොපෙනෙයි. යම් හෙයකින් වෙස්ලි මිය ගියහොත් ඒ නම දේවස්ථානය තුළ අහංකාර නොඑසේ නම් බොරුව රජයන තැනක ස්ථානගත වනු ඇත්තේ ය. කෙසේ වුව මේ කරදරයෙන් ගැලවීමට මම ද තීරණය කළමි. හොඳම දේ බොරු කීම ය."

ලැන්ග්ස්ටන් හියුහ්ස් ගේ උක්ත ගද්‍ය රචනයේ ඉතිරියට අනුව තමන් යේසුස් ව දුටු බව කීම ට ඔහු ඉදිරි පත් වේ. කෙසේ වෙතත් එසේ බොරු කීම ගැන පසුව ඔහු මහත් සේ වැළපී ඇත. ඒ ගෙදර පැමිණීමෙන් පසු ය. එහෙත් ඔහුගේ නැන්දණිය සිතා ඇත්තේ ශුද්ධ වූ අවතාරය සිය දරුවා තුළට පිවිසීම නිසා ඔහු එසේ වැළපෙන බව ය. කෙසේ වුව මේ කියවීම අපට ලබා දෙන අවබෝධය ගැන නිවැරැදි සවිඥානකත්වයක් ඔබට තිබිය යුතු ය. එය වනාහි හුදු ආගම් විරෝධයකට පෙරලා ගැනීමක් වශයෙන් නොවිය යුතු ය. නමුත් මිනිස් පැවැත්මේ සැබෑ හරය පිළිබඳ ඥානනය කරනු වස් ඔබට මෙවැනි කියවීම් අවශ්‍ය ය. ලැන්ග්ස්ටන් හියුහ්ස් සිය රචනයේ ලා මෙසේ ද පවසයි.

"ඒත් ඇත්ත වශයෙන්ම මා හැඬුවේ මා කීවේ බොරුවක් බව යන්න ඇය හමුවේ කියන්නට නොහැකි නිසා ය. මම එදා පල්ලියේ සිටි සියල්ලන්වම රැවටුවෙමි. අදටත් දෙවියන් ගැන ලොකු විශ්වාසයක් මට නැත. කිසිදාක මට උපකාර කිරීමට දෙවියන් නොපැමිණෙනු ඇත.

දීපානි

සුරු චිත්‍රාලය

තිස්ස ප්‍රේමසිරි
tissa.siyana@gmail.com

පාංශු

මහ පොළොවේ කතාවක්...

විශාකේස චන්ද්‍රසේකරම්ගේ "පාංශු" ප්‍රේක්ෂකයා අවදි කරවන්නකි. එයට හේතුව කෘතියේ අන්තර්ගත ජීවන සංසිද්ධිය ප්‍රේක්ෂකායා තුළ ගැඹුරු සංවේදනාවක් ඇති කරවන ආකාරයේ සිනමා භාවිතයකින් ඉදිරිපත් වී ඇති බැවිනි. අධ්‍යක්ෂවරයා විසින් පිළිඹිඹු කරනු ලබන මෙම ශක්‍යතාවය හේතු කොට ගෙන එය සිනමා කෘතියකින් ලැබිය යුතු වින්දනය අපට ලබා දෙන්නේ මනුෂ්‍යාත්මභාවය අරබයා ළතෙත් හැඟීමක් ද අප තුළ ජනිත කරවමිනි. ඒනිසා මෙය එක් පැත්තකින් අප පය ගසා සිටින මහ පොළොවේ සංස්කෘතිය පිළිබඳව ප්‍රකාශනයක් වන අතරම සමස්ත විශ්වයටම පොදු උදාර මනුෂ්‍යත්වය ගැන විවරණයක් ද වෙයි.

අධ්‍යක්ෂ විශාකේස චන්ද්‍රසේකරම් මේ සඳහා සිය කෘතියට පාදක කර ගනු ලබන්නේ බබානෝනා නැමැති රෙදි සෝදන ස්ත්‍රියක් ජවිපෙ දෙවැනි කැරැල්ලට සම්බන්ධව අතුරුදහන් වූ සිය පුතුට සාධාරණය ඉටුකර ගැනීම සඳහා ගෙන යන අප්‍රතිහත අරගලයයි.

සිනමාකරුවා ස්වකීය තිර නාටකයේ දී එහි ප්‍රධාන භූමිකාව ලෙස බබානෝනා නැමැති මාතාවගේ චරිතය ගොඩනැගීමේ යම් විශේෂත්වයක් තිබේ.

එනම් සමාජ විද්‍යාඥයින් විසින් පෙන්වා දුන් පරිදි ජවිපෙ වටා තරුණ පරපුර ආකර්ෂණය වීමේ මූලික සාධකය වන කුල පීඩනය හා සමාජ අසමාන භාවය සංඛේතවත් කිරීමට ඇය කැපී පෙනෙන සාධකයක් වන බැවිනි.

කාලාන්තරයක් තිස්සේ පැවැති සාම්ප්‍රදායික ජීවන රටාව ඔස්සේ බබානෝනා සිය වෘත්තියෙහි යෙදෙන්නේ ස්වකීය කුලය හේතුකොටගෙන යම් යම් අසමානතා විඳ ගනිමින් වුවද, ඇයගේ සේවය ලබා ගන්නාහු සිය ජීවිත කාලය මුළුල්ලේ දන්නා කියන ඇය හා යම් යම් මානුෂීය බැඳීම් ඇත්තෝ වෙති. අන් හැම කාරණයට ම වඩා ඇය තමා ඉදිරියේ ලොකු මහත් වූ එම පවුල් වල දූ දරුවන් අරබයා මාතෘ සෙනහසකින් බලන්නියක් බවද අපි දකින්නෙමු. උසස් අධ්‍යාපනයේ යෙදෙන තම පුතු නිරත වන අරගලය පිළිබඳ ඇයට නිසි අවබෝධයක් නැති අතර ඇය දකින එකම දෙය ඔහුගේ ටියුෂන් ගුරුවරයා නිසා ඔහු භයානක විපතක පැටලී ඇති බවයි.

මේ නිසා ඔහුගේ අතුරුදහන්වීමට වගකිව යුතු යයි ඇය දකින්නේ පවතින සමාජ අසාධාරණයවත්, රාජ්‍ය ත්‍රස්ත්‍රවාදයවත් එයට පිළිතුරු වශයෙන් ජවිපෙන් උගන්වන ලද පහර දීමේ පිළිවෙතවත් නොවේ. පුතුගේ අතුරුදහන් වීමේ වගකීමේ වග උත්තරකරුවන් ලෙස ඇය විසින් නම් කරනු ලැබ ඇත්තේ ශාරීරිකව ඉදිරිපත්ව ඔහු පැහැරගත් හමුදා නිලධාරියාත්, මේ තත්ත්වයට තම පුතු යොමු කළ ටියුෂන් ගුරුවරයාත් පමණකි.

විශාකේස චන්ද්‍රසේකරම්

විශාකේස චන්ද්‍රසේකරම් නම් සිනමාකරුවාගේ විශේෂ හැකියාව ලෙස අප දකින්නේ මේ මානසික භාවය මත වික්ෂිප්තභාවයට පත් අකුරු නූගත් ගම්බද මවකගේ චරිත ඉතා සියුම් ලෙස තම කෘතිය තුළින් ඉදිරිපත් කිරීමය.

අපගේ සිනමා ඉතිහාසය දෙස බලන කල කලකට ඉහතදී වාණිජ සිනමා කෘති හරහා සිනමාවට පිවිස පසුව විවිධාකාර චරිත නිරූපණයන්හි සිය ප්‍රතිභාව ප්‍රකට කළ නීටා ප්‍රනාන්දුගෙන් බබානෝනා චරිතයට ඉටු කෙරෙන සාධරණත්වය විශාකේසගේ සිනමා ප්‍රකාශනය සාක්ෂාත් කර ගැනීමට මහඟු පිටුවහලක් වේ.

සිය තරුණ පුතුගේ ක්‍රියාකාරකම් අරබයා සැක සංකා පහළ වූ තැන් සිට අවසාන මොහොත දක්වාම කුතුහලය, සැකය, බිය, දරාගත නොහැකි සෝකය, පුතුගේ මිනීමරුවන් කෙරෙහි වූ වෛරය, දැඩි බව ආදී හැඟීම් සමුදායක් සිය පපු කුහරයේ රඳවා ගනිමින් එදිනෙදා දිවිපෙවෙත ගෙනයාමට සටන් කරන දිරිය මාතාවකගේ සංකීර්ණ හැඟීම් සමුදාය චිත්‍රපටය මුළුල්ලේ අඛණ්ඩව පවත්වා ගෙන යාමට නීටා ප්‍රනාන්දු නැමැති රංගන ශිල්පිනිය විසින් පෙන්වනු ලබන හැකියාව "පාංශු'' චිත්‍රපටයේ ජීවය බවට පත්ව තිබේ.

මේ අනුව "පාංශු" මෙතරම් ජාත්‍යන්තර සම්භාවනාවට පාත්‍රවීමට එම විශිෂ්ට ප්‍රතිභාව හේතුවක්වීම කිසිසේත්ම පුදුමයට කරුණක් නොවේ. 1989 දී තිරගත වූ ශ්‍රේෂ්ඨ මලයාලම් චිත්‍රපටයක් වන සාජී එන්. කරුන්ගේ "පිරවි" චිත්‍රපටයේ මෙන් මෙහිදී ද අප දකින්නේ සිදුවූ සිද්ධියට වඩා එහි ප්‍රතිඵලය සංවේදී හදවතක් මත ප්‍රතිනිර්මාණය වන ආකාරයයි.

සවසට මහත් බැතියෙන් බුදු පහන දල්වන තමා අත්දුටු දහම අනුව හිතේ සැනසීමෙන් ජීවත් වූ ගම්බද අම්මා කෙනෙකුගේ හදවත දැඩි අවුලකට පත්ව ඇති අයුරු "පාංශු'' තුළ අප දකින්නේ කුප්පි ලාම්පුව දල්වා ගෙන සිය තරුණ පුතු එනතුරු පිළමත වාඩි වී සිටින බබානෝනා තුළිනි. විප්ලව වාදීන්ගේ අත් පොතක් වූ ගෝර්කිගේ "අම්මා'' කතාවේ මවට වඩා බබානෝනා වෙනස් වන්නේ ඉහළින් හෝ පහළින් සිටිමෙන් නොවේ.

> සවසට මහත් බැතියෙන් බුදු පහන දල්වන තමා අත්දුටු දහම අනුව හිතේ සැනසීමෙන් ජීවත් වූ ගම්බද අම්මා කෙනෙකුගේ හදවත දැඩි අවුලකට පත්ව ඇති අයුරු "පාංශු'' තුළ අප දකින්නේ කුප්පි ලාම්පුව දල්වා ගෙන සිය තරුණ පුතු එනතුරු පිළමත වාඩි වී සිටින බබානෝනා තුළිනි.

තව කෙනෙකුගේ පර පණ නසන ගිනි අවිය තමාගේ චරිතයට අනන්‍යව සිතා බලා වැව් පතුලක අතුරුදහන් කරන සුවිශේෂී චරිතයක් බවට පත්වීමෙනි.

ආරම්භයේ දී අපට වටහා ගත නොහැකි තරම් වූ බස් රථයක ඇතුළත සමීප රූපයකින් පටන් ගන්නා චිත්‍රපටය අවසානයේ වැව් දිය ගැඹරේ තුවක්වක් ද රැගෙන බබානෝනා පීනායන දර්ශනය තෙක් අපව ඇඳ බැඳ තබා ගැනීමේ හැකියාව "පාංශු" චිත්‍රපටයේ පදනම වූ තිර රචනය තුළම ගැබ්වී තිබේ.

එහෙත් සිය පුතුට සාධරණය ඉටුකර ගැනීම සඳහා අඛණ්ඩ අරගලයක යෙදෙන බබානෝනා, වූදිතයාගේ ගැබිනි බිරිඳගේ දුක් ගැනවිල්ල ඉදිරියේ වෙනසකට පත්වීම යම් පමණකට එහි විශ්වසනීයත්වය බිඳ හෙළන්නකි.

එසේ වුවද සමස්ත චිත්‍රපටයේ බබානෝනා ගොඩනැගෙන ආකාරය බලන කළ ඇය සතු මානසිකත්වය හමුවේ එවැනි තීරණයක් ගැනීම සිනමා පටයට එතරම් අවධැක් සිදුකරන බව පෙනෙන්නට නැත.

නමුත් "පාංශු'' යනු බබානෝනාගේ චරිතාපදානය ගොඩනැගීමෙන් ඔබ්බට ගිය විශාල සිනමා මෙහෙවරකි.

එහි අමාරුම කාරණය ලෙස ඉස්මතු වී පෙනෙන්නේ පැවැති සමාජ හා දේශපාලන ප්‍රපංචයන් පරිණතව වටහා ගනිමින් මෙවැනි තිර නාටකයක් ගොඩනැගීමයි. මේ සමගම කෘතියේ තේමාවට සරිලන කැමරා අධ්‍යක්ෂණයක යෙදෙන දිමුතු කාලිංගගේ රූප නිර්මාණයද, සිතුම් සමරජීවගේ සංස්කරණය ද, චින්තක ජයකොඩිගේ සංගීතය හා මෙහි කලා අධ්‍යක්ෂවරයාගේ කාර්ය භාරයද පාංශු සඳහා ලබාදී ඇති සහයෝගය විශිෂ්ටය.

පසුගිය කාලය මුළුල්ලේ අප රටෙහි නව පරපුරේ සිනමාකරුවන් වැඩිදෙනෙකු තම නිර්මාණ උදෙසා සම්මානයට පාත්‍ර වූයේ අන්තර්ජාතික උලෙළවලදී ඇගයීමට ලක්වීමෙන් විනා මෙරට පොදු ජනතාවගේ ආකර්ෂණය දිනා ගැනීමෙන් නොවේ.

නමුත් විශාකේස චන්ද්‍රසේකරම් එසේ අන්තර්ජාතික සම්මානයට පාත්‍රව සිටින අතරම පොදු ජන ආකර්ෂණය දිනා ගන්නා සිනමා කෘතියක් බිහිකිරීමේ ජයග්‍රහණයට ද හිමිකම් කියයි.

මෙරට අනුව නම් එය දේශීය වශයෙන් ලබා ගන්නා අන් හැම සම්මානයකට ම වඩා වටිනා දෙයකි.

> සිනමාකරුවා ස්වකීය තිර නාටකයේ දී එහි ප්‍රධාන භූමිකාව ලෙස බබානෝනා නැමැති මාතාවගේ චරිතය ගොඩනැගීමේ යම් විශේෂත්වයක් තිබේ. එනම් සමාජ විද්‍යාඥයින් විසින් පෙන්වා දුන් පරිදි ජවිපෙ වටා තරුණ පරපුර ආකර්ෂණය වීමේ මූලික සාධකය වන කුල පීඩනය හා සමාජ අසමාන භාවය සංඛේතවත් කිරීමට ඇය කැපී පෙනෙන සාධකයක් වන බැවිනි.

දීපානි

කැලෑහඳ ලීඩ් එක වීම

සාමාන්‍යයෙන් දිනපතා පුවත්පතකට වඩා ඉරිදා පත්තරයකට "ලීඩ්" එකක් නොහොත් මුල් පුවතක් සොයා ගැනීම අසීරුය. අද මෙන්ම පණහේ දශකයේද එය එසේ-මය.

නමුත් මේ යුගයේ පාඨකයා සහ අද දවසේ පාඨකයා අතර ලොකු වෙනසක් තිබුණේය. මෙදවස පාඨකයා පුවත්පත මිලදී ගැනීමට මුල් වන්නේ දරුණු අපරාධ හෝ බරපතළ දේශපාලන අර්බුද ගැන ශීර්ෂ පාඨ වලින් කියවෙන්නේ නම් පමණි. නමුත් පෙර දවස එසේම වූයේ නැත.

එවකට එක්තරා ප්‍රකට පුවත්පත් ආයතනයක ප්‍රධාන කතුවරයා වූ ඩී.බී. ධනපාල මහතාද හැම විටම උත්සාහ කළේ අපරාධ, දේශපාලන අර්බුද සහ අනතුරු පිළිබඳව කියවෙන පුවත්වලින් බැහැරව මහ ජනතාවට කිසියම් සතුටක් ගෙන දෙන පුවතක් ඉරිදා පුවත්පතෙහි ප්‍රධාන පුවත ලෙස ඉදිරිපත් කිරීමටය.

මෙන්න මේ කාලයේ සතියේ දිනක එහි සේවය කල තරුණ පුවත්පත් කලාවේදීන් දෙදෙනෙකු තමන්ගේ ලොක්කා බලාපොරොත්තු වූ ආකාරයේ පුවතක් රැගෙන ආවෝය.

ඒ දෙදෙනා ජයවිලාල් විලේගොඩ සහ කරුණාසේන ජයලත්ය.

පුවත කියවාගෙන යමින් මඳ සිනාවක් මුවඟට නංවා ගත් ධනපාල මහතා" ළමයිනේ , අපට මේ කතාව ඉරිදා වෙනකම් තියා ගන්න පුළුවන් වෙයි නේද?" කියා ඇසීය.

"කොහොම වුණත් මේක වටින්නේ ඉරිදා පත්තරේට. තමුසෙලා කට හොල්ලන්න එපා"

මෙසේ පැවසූ ධනපාල මහතා අදාළ ප්‍රවෘත්තියත් , ඒ සමඟ වූ ඡායාරූප කීපයත් තම ලාච්චුවේ තැම්පත්කර යතුර දැමීය.

1952 දෙසැම්බර් 14 වෙනි ඉරිදා ඒ දවසට මහා ආඩම්බරයක් වූ එපුවත ඔහු සිය ඉරිදා පුවත් පතෙහි මුල් පිටුවේ පළ කරනු ලැබුවේ ප්‍රධාන ප්‍රවෘත්තිය ලෙස තීරු අටම ආවරණය වන පරිද්දෙනි.

ඒ අන් කිසිවක් නොව සාහිත්‍ය චක්‍රවර්ති ඩබ්ලිව්. ඒ. සිල්වා සූරීන්ගේ "කැලෑහඳ" නවකතාව එනමින්ම රිදී තිරයට නැංවීමට යන පුවතයි.

සිරස්තලයෙන් කියවුණේ " ප්‍රථම වතාවට සිංහල නව කතාවක් චිත්‍රපටයක් වේ. වියදම රුපියල් 5,00,000 ක්" යනුවෙනි. බස් රථයේ හැතැක්මකට සත පහේ ටිකට් කැඩූ මේ කාලයේ පන් ලක්ෂයක් යනු විශාල මුදලක් විය.

මේ වන විට දෙමළ සහ හින්දි චිත්‍රපට නැරඹීමට පුරුදුව සිටි සිංහල ප්‍රේක්ෂකයා වෙනුවෙන් සිංහල චිත්‍රපට තැනුණේ වසරකට එකක් දෙකක් පමණක් වූ අතර තමන්ගේ ප්‍රියතම ලේඛකයාගේ කෘතියක් ඇසුරින් චිත්‍රපටයක් බිහිවීමේ ආරංචිය ඔවුන් අමන්දානන්දයට පත් කරවන්නක් වූයේය.

ඒ සඳහා වූ ඔවුන්ගේ පිළිගැනීම කෙතෙක්ද යත් එදින උදය වරුවේම සියලුම පුවත් පත් අලෙවි වී අවසන් වූ අතර දහවල් වන විට විශේෂ මුද්‍රණයක්ද නිකුත් කරන ලදී.

පුවත්පත් පාඨකයින් තරමටම සාහිත්‍ය හා චිත්‍රපට ලෝලීන්ගෙන්ද පිරුණු එවන් යුගයක් මේ මධුර චාරිකාවේදී චිත්‍රපටයකින් හෝ දැක ගන්නට ලැබේවායි පතමි!

විද්‍යා ප්‍රබන්ධ සිනමා කලාවේ මහා පිපුරුම (big bang)



ප්‍රකට හොලිවුඩ් චිත්‍රපට අධ්‍යක්ෂ ස්ටීවන් ස්පිල්බර්ග් ආතර් සී ක්ලාක්ගේ අජටාකාශ වීර කතාවෙන් තැනූ "2001 - අ ස්පේස් ඔඩිසි" චිත්‍රපටය ගැන පැවසූවේ මෙසේ ය.

"මගේ පරම්පරාවේ මහා පිපුරුම එයයි"

එමෙන් ම "ස්ටාස් වෝර්ස්" තැනූ ජෝර්ජ් ලූකස් "2001- අ ස්පේස් ඔඩිසි'' ගැන හැඳින්වූයේ එය ලෝකයේ පරිසමාප්ත විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපටය ලෙසය. එය පසුකර යාම දුෂ්කර බව ද ඔහුගේ අව්‍යාජ හැඟීම විය.

මහා සිනමාවේදී ස්ටැන්ලි කුබ්රික් විසින් නිර්මාණය කරන ලද" 2001- අ ස්පේස් ඔඩිසි" සඳහා මූලික පදනම දමනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ශ්‍රීමත් ආතර් සී ක්ලාක් වෙත එවන ලද කේබල් පණිවිඩයකිනි. ඉන් කියවුණේ තමාගේ ඊළඟ චිත්‍රපටය සඳහා ආතර් සී ක්ලාක්ගේ "ද සෙන්ටිනල්" නම් කෘතිය තෝරාගෙන ඇති බවයි. ඒ අනුව 1964 දී ඇමෙරිකාවේ නිව්යෝර්ක් නුවරදී මේ දෙදෙනා විසින් චිත්‍රපටයේ කටයුතු සැලසුම් කළහ. මුලින් ම එම කෙටි කතාව ඇසුරින් නව කතාවක් ලිවිය යුතු වූ අතර ඒ සඳහා වසර දෙකක කාලයක් ගතවිය. චිත්‍රපටයේ තිර රචනය ලියනු ලැබුවේ එම කතාව මුල්කර ගනිමිනි.

මෙම චිත්‍රපටය නිර්මාණය කිරීම පිළිබඳව පළමුවෙනි ප්‍රවෘත්ති නිවේදනය නිකුත් කරනු ලැබුවේ 1965 පෙබරවාරි මාසයේ 23 වනදා ය. එම නිවේදනය "ජර්නි බියොන්ඩ් ද ස්ටාර්ස්" නම් මාතෘකාව යටතේ විය.

එතැන් සිට නිර්මාණකරුවන් තිස්පස් දෙනෙකු යොදා ගනිමින් අජටාකාශ යානා වල ආකෘති සිය ගණනාවක් නිර්මාණය කෙරුණු අතර, 1965 දෙසැම්බර් මාසයේ දී රූපගත කිරීම් ඇරඹිණි. ඒ සඳහා එංගලන්තයේ චිත්‍රගාරයක් යොදා ගැණිනි. ඇමෙරිකාවේ "මෙට්රෝ ගෝල්ඩ්වින් මෙයර්ස්" සමාගම විසින් නිෂ්පාදනය කොට "වෝනර් බ්‍රදර්ස්" සමාගම මඟින් ලෝ පුරා බෙදා හරින ලද මෙය මේ මොහොතවන තුරු විචාරකයින් පමණක් නොව, සිනමාවේ දැවැන්තයින් විසින් පවා සලකනු ලබන්නේ , විද්‍යා ප්‍රබන්ධ සිනමාවේ අග්‍රඵලය ලෙස ය.

1991 ඇමෙරිකානු කොන්ග්‍රස් පුස්තකාලීය ජාතික චිත්‍රපට නාමවලියට ඇතුළත් කරනු ලැබූ මෙම සිනමා කෘතිය යුග උරුමයක් ලෙස සුරැකීමට තීරණය කර තිබේ. විචාරකයින්ගේ අදහසට අනුව මෙම චිත්‍රපටය තුළ සුවිශේෂතා හතරක් දක්නට ලැබේ.

එනම් විද්‍යාත්මක නිර්වද්‍යතාවය, පූරෝගාමී විශේෂ ප්‍රයෝග, අවම සංවාද භාවිතය සහ අධි යථාර්ථවාදී විග්‍රහකට ඇරයුම් කරන රූපාවලිය යන කරුණු ය.

සමස්ත චිත්‍රපටය මුළුල්ලේ සංවාද සඳහා වෙන් වී ඇත්තේ විනාඩි 45 ක තරම් කාලයක් වීමද මෙහි දක්නට ලැබෙන විශේෂත්වයකි.

වෂී 2020ක් වූ සැප්තැම්බර් මස 06 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

ශ්‍රී ලංකා ටෙලිකොම්
Number Portability සේවාව සමග එක්වෙයි

ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය වෙනුවෙන් පත් වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය සිය ප්‍රථම කාර්යය ලෙස සලකා තවත් ජාතික මෙහෙවරක කොටස්කරුවන් බවට පත්වෙමින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් අරඹන්නට නියමිත, භාවිත කරනු ලබන ජංගම දුරකථන අංකය වෙනස් නොකර එකම දුරකථන අංකය ඕනෑම විදුලි සංදේශ ක්‍රියාකරුවෙකුගෙන් ලබාගැනීමට හැකි වන Number Portability දුරකථන අංක සේවාව ලබාදීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී තිබේ.

ශ්‍රී ලංකාව - ලෝකය සමග එකිනෙක සම්බන්ධ කරමින් ගම් නියම්ගම් සිසාරා ආවරණ කලාපය පුළුල් කළ ශ්‍රී ලංකාවේ වේගවත්ම සන්නිවේදන තාක්ෂණික සේවා සැපයුම්කරුවා වන ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය, සිය ජාතික සන්නිවේදන සේවා මෙහෙවර වෙනස් වන ලෝකයේ නවීනත්වය හා මුසු කරමින් ගම ලෝකය වෙත රැගෙන යාමේ දැක්ම මේ සමග වඩාත් සාක්ෂාත් වේ.

ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය මෙම ජාතික මෙහෙවර හා එක්වීම අතිගරු ජනාධිපතිතුමන්ගේ"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළෙත් තාක්ෂණික, කාර්මික හා කර්මාන්ත ක්ෂේත්‍ර දියුණු කිරීමේ ජාතික වැඩසටහන තවදුරටත් ශක්තිමත් කිරීමකි.

ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහයේ සභාපති රොහාන් ප්‍රනාන්දු, මේ පිළිබඳ අදහස් දක්වමින්,

"ජාතික සන්නිවේදන සේවා සැපයුම්කරුවා විදිහට ලෝකයේදියුණු තාක්ෂණය සමග ශ්‍රී ලංකාව යාවත්කාලීන කිරීම අපේ මෙහෙවරයි. ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල් සන්නාම දෙක සමගින් අප මෙතෙක් සෑම තරාතිරමකම ශ්‍රී ලාංකිකයන්ගේ සන්නිවේදන අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කරමින් ශ්‍රී ලාංකිකයන්ගේ විශ්වාසය දිනාගන්නට සමත් වුණි. TRCSL සමග අභිමානයෙන් යුතුව තවත් ජාතික මෙහෙවරක පෙරගමන්කරුවන් වන්නට ලැබීම අප ලද භාග්‍යයක්." යැයි පැවසීය.

ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී ලලිත් සෙනෙවිරත්න අදහස් දක්වමින්,

"භාවිත කරනු ලබන ජංගම දුරකථන අංකය වෙනස් නොකර දුරකථන අංකය ඕනෑම විදුලි සංදේශ ක්‍රියාකරුවකුගෙන් ලබාගැනීමට හැකි වන Number Portability දුරකථන අංක සේවාව අපගේ පාරිභෝගිකයන් වෙත හඳුන්වා දෙන්නට ලැබීම පිළිබඳ අප බෙහෙවින් සතුටු වෙනවා. දේශීය ව්‍යවසායකයන් සවිබලගන්වන්නට අපි ක්‍රියාත්මක කරනු ලබන සේවාවන් අතරට මෙම සේවාවත් එක්වනවා. අපගේ පසුගෙවුම් පාරිභෝගිකයන්ට අධිවේගී 5G අන්තර්ජාල සබඳතාවක් ලබාදෙන්නටත් අප ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා." යැයි පැවසීය.

TRCSL අධ්‍යක්ෂ ජනරාල් ඕෂධ සේනානායක, ප්‍රමුඛ කණ්ඩායම විසින් කාලීන අවශ්‍යතාවක් පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා දියත්කරනු ලබන Number Portability වැපිළිවෙළ වෙත ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහයේ ප්‍රශංසා මුසු පූර්ණ සහයෝගය එක්කොට තිබේ.

ක්‍රියේටිව් අයිල් හා කොළඹ සිටි සෙන්ටර් වෙතින් 'සති අග අත්කම්' වෙළෙඳපොළක්

ක්‍රියේටිව් අයිල්, කොළඹ සිටි සෙන්ටර් (CCC), සමඟ එක්ව අත්කම් වෙළෙඳ ප්‍රදර්ශනයක් (Ceylon Artisan Network (CAN) Market) 2020 අගෝස්තු මස 28 දින සිට කොළඹ සිටි සෙන්ටර් (CCC) ඒට්‍රියම් ශාලාවේදී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වනුයේ ජ්‍යෙෂ්ඨ ක්‍රිකට් ක්‍රීඩක, මුත්තයියා මුරලීදරන්ය.

මෙම අත්කම් වෙළෙඳපොළ දිවයින පුරා සිටින කුඩා පරිමාණ ව්‍යවසායකයන් හට මනා පන්තරයක් හා සහයෝගයක් ලබාදීමේ වේදිකාවක් ලෙස නිර්මාණය කර ඇති අතර, මෙය සෑම සිකුරාදා,

සෙනසුරාදා හා ඉරිදා දිනයන්හි උදෑසන 10.30 සිට රාත්‍රී 9.00 දක්වා පැවැත්වීමට කටයුතු සලස්වා ඇත.

සති අන්ත වෙළෙඳපොළ තුළින් ශ්‍රී ලංකාව වටා සිටින අපනයන වෙළෙඳ නියෝජිතයන් හට ඔවුන්ගේ ගුණාත්මක අපනයන නිෂ්පාදන තොග මිල ගණන් යටතේ ප්‍රදර්ශනය කිරීමට නියමිත අතර, මේ තුළින් අපනයන වෙළෙඳ නියෝජිතයන් අතර හා තොග ගැනුම්කරුවන් අතර නව වෙළෙඳ සබඳතාවයන් ගොඩනැගීමට අවස්ථාව හිමි වේ. තිරසාර නිෂ්පාදන හා ප්‍රජාවෙහි දැඩි ආකර්ෂණයක් ලැබෙන ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කරමින් මෙම වෙළෙඳ ප්‍රදර්ශනයට ගෘහ හා එදිනෙදා ජීවන් වීමේදී අවශ්‍ය කරන බඩු භාණ්ඩ ආදිය මෙන්ම, කාලයට ඔබිත නවීන විලාසිතා හා ආභරණ, ආහාර නිෂ්පාදන, ශාකසාර තේ, ආයුර්වේද රූපාලංකරණ ආලේපන, සබන් වර්ග, සුවඳ විලවුන් ආදිය මෙන්ම තවත් බොහෝ දෑ ඇතුළත් වේ.

සිංගර් සහ මැලේසියානු Signature සමූහ ව්‍යාපාරය අත්වැල් බැඳ ගනියි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාරිභෝගික භාණ්ඩ බෙදා හරින්නා වන සිංගර්, මැලේසියාවේ විශාලතම පැන්ට්‍රි කබඩ් නිෂ්පාදකයා වන Signature සමූහ ව්‍යාපාරය සමගින් අත්වැල් බැඳගෙන තිබේ. ලොව ප්‍රමුඛ පෙළේ මෙවැනි සමාගම් හා අත්වැල් බැඳ ගනිමින්, සිංගර් කලක් තිස්සේම, ඉහළම අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරන ලද විශිෂ්ටතම තත්ත්වයේ කල්පවතින භාණ්ඩ දේශීය පාරිභෝගිකයින් වෙත ලබා දීමට කටයුතු කරයි. එම උත්සාහයේ තවත් එක් පියවරක් ලෙසින් මෙලෙස Signature සමූහ ව්‍යාපාරය සමග අත්වැල් බැඳ ගැනීම මගින් ජාත්‍යන්තර වෙළෙඳ පොළේ නවතම මෝස්තර හා අද්විතීය නිමාව රැගත්,පැන්ට්‍රි කබඩ් ස්වකීය පාරිභෝගිකයින් හට තිළිණ කිරීමට සිංගර් කටයුතු යොදා තිබේ.

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන මෙම Signature නිෂ්පාදන,පළමු වරට රත්මලාන Singer Homes ප්‍රදර්ශනාගාරයෙහි ප්‍රදර්ශනයට තැබෙන අතර, නුදුරේදීම රටපුරා අනෙකුත් සිංගර් ප්‍රදර්ශනාගාරවලදී ද දැකබලා ගැනීමට සිංගර් පාරිභෝගිකයින්ට හැකියාව ලැබේ.

සිංගර් හා අත්වැල් බැඳ ගනිමින් මෙරට පාරිභෝගිකයින් අතරට එන Signature නිෂ්පාදන ලොවට ඉදිරිපත් කරන මැලේසියාවේ Signature සමූහ ව්‍යාපාරය ලොව ප්‍රකට FORBES සඟරාව වෙතින් Billion commendationයන වර්ගීකරණය යටතේ කළ තේරීමේදී හොඳම ආසියානු සමාගමට හිමි සම්මානයද දිනා සිටින සමාගමකි. එමෙන්ම,2016 වසරේදී, MSWG-ASEAN Corporate Governance Excellence සම්මානයෙන් සේම, ඉකුත් වසර ගණනාව පුරා සම්මාන ගණනාවකින්ද එම සමාගම පිදුම් ලැබ තිබේ.

මෙම නවතම අත්වැල් බැඳ ගැනීම පිළිබඳ අදහස් දක්වමින්, සිංගර් ශ්‍රී ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී මහේෂ් විජේවර්ධන සඳහන් කළේ, මෙවැන්නකි.

"ගෘහ උපකරණ සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයින්ට වඩාත් සමීප සන්නාමයක් වන සිංගර්, Signature සන්නාමය සමගින්, පැන්ට්‍රි කබඩ් නිෂ්පාදනයට මෙලෙස පියවර තබා තිබෙනවා.එය අපට ඇත්තටම ආඩම්බරයට කරුණක්."

"මෙම අත්වැල් බැඳ ගැනීම සඳහා සිංගර් සුදුසුම සන්නාමය බවට අපට වැටහුණේ, එය ඉතාමත් තරගකාරී ලෙසින් ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්තව තිබීම හා එහි නිෂ්පාදනයේ ශක්තිමත්භාවය තිසයි. නවෝත්පාදන හා නිර්මාණශීලීත්වය සමගින් නිෂ්පාදන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට සිංගර් වෙත සහය වීමට

Signature කණ්ඩායම කටයුතු කරනවා. ඒ වගේම,පැන්ට්‍රි කබඩ් සම්බන්ධයෙන් ජාත්‍යන්තර අත්දැකීම් ශ්‍රී ලංකාවට විවෘත කරවන මෙම අත්වැල් බැඳ ගැනීම පිළිබඳ අප ඉමහත් බලාපොරොත්තු තබා සිටිනවා." බෙර්හාද්, Signature International සමාගමේ සමූහ කළමණාකාර අධ්‍යක්ෂ, ටන් කී චොන්ග් මහතා සඳහන් කළේය.

The Body Shop 'Tea Tree' වෙතින් තෙල් සහිත සමට සුවිශේෂී සත්කාරයක්

The Body Shop යනු කවර වර්ගයේ සමකට වුවද ගැළපෙන සුවිශේෂී නිෂ්පාදන නිරන්තරයෙන් හඳුන්වා දීමට කටයුතු කරන සමාගමකි. එම සමාගම මේ වන විට Tea Tree නමින් නවතම නිෂ්පාදන එකතුවක් හඳුන්වා දී ඇත. මෙම නිෂ්පාදනවල, ලොව විශිෂ්ටතම ස්වාභාවික සත්කාරයක් වන, සුවකිරීමේ ගුණයත් සමට තෙතමනය සැලසීමේ ගුණයත් කැටිකරගත් Tea Tree කොළ සාරය ඇතුළත් වී තිබේ. දිලීර හා වෛරස නැසීමේ බලය ඇති Tea Tree පත්‍රවල සාරයෙන් තිපදවන ලද තෙල් සමේ ලප කැළැල් අවම කරන මනා විසඳුමකි.

The Body Shop හි Tea Tree Oil නිෂ්පාදනය පැමිණෙනුයේ, Tea Tree පත්‍ර 15,000 ක සාරය සහිත 0.67 fl oz බෝතල් ලෙසිනි. බලවත් පවිත්‍රකාරක ගුණ සහිත මෙම සංයෝගය සමේ කැළැල් අවම කිරීම සඳහා ඉක්මන් ප්‍රතිඵල දෙන විසඳුමක් ලෙස භාවිත කළ හැක.

Tea Tree Mattifying Lotion නිෂ්පාදනය ද ඔබේ දෛනික චර්ම සත්කාරයට එක්කරගත හැකි අගතා නිෂ්පාදනයකි. Community Trade tea tree oil ඇතුළත්, ඉක්මනින් සමට උරාගන්නා, සැහැල්ලු ආලේපනයක් වන මෙම ලෝෂන් වර්ගය රෝම කූප අවහිර නොකර සහ සම මතුපිට ඇලෙනසුළු බවක් ඇති නොකර සමට තෙතමනය ලබාදෙයි. Tea Tree නිෂ්පාදන පෙළ ඇතුළුව සියලුම The Body Shop නිෂ්පාදන 100% ක් ශාකමය නිෂ්පාදන වන අතර, ඒවා සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තිරසාර ක්‍රමවේදයන් මගින් සපයා ගැනේ. නව නිෂ්පාදන පෙළ සඳහා කෙන්යාවේ කඳුකර ප්‍රදේශවලින් සපයාගත් Community Trade Tea Tree Oil යොදාගෙන ඇත. Tea Tree ස්වභාවයෙන්ම පවිත්‍රකාරක ගුණවල යුක්ත නිසා කෘමි උවදුරු වැළැක්වීමට කෘෂි රසායන යෙදීම අවශ්‍ය නොවේ. තවද The Body Shop අනුගමනය Community Trade ක්‍රමවේදයන් නිසා, කෙන්යාවේ විරැකියාව බහුල ග්‍රාමීය ප්‍රදේශවල KOOFA(Kenyan Organic Oil Farmers Association) ගොවි සංවිධානයේ සාමාජිකයන් වන ගොවීන් සිය ගණනකට සාධාරණ මිලක් හා ස්ථාවර ආදායමක් හිමිවී ඇත.

BN බිස්නස් නිවුස්

JASTECA 2019 සම්මාන උළෙලේදී ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත රන් සම්මානයක්

වමේ සිට : SLT හි තිළිනි අමරසිංහ මිය (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු) හා තන්දන නියන්ගම මහතා (කළමනාකරු) සම්මානය ලබාගත් අයුරු.

ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සැපයුම්කරු ශ්‍රී ලංකා ටෙලිකොම්, JASTECA 2019 සම්මාන උළෙලේදී රන් සම්මානයක් දිනාගන්නට සමත් විය. කුරුණෑගල බාහිර රෝපණ තඩත්තු මධ්‍යස්ථානය (OPMC) Taiki Akimoto 5S' රන් සම්මානයක් (මධ්‍ය ප්‍රමාණය සඳහා) හිමිකර ගත්තේය. මෙම සම්මාන උළෙල මෙවර සංවිධානය වූයේ අඛණ්ඩව 24 වැනි වරටය.

JASTECA 2019 සම්මාන උළෙල යනු ජපාන - ශ්‍රී ලංකා තාක්ෂණික හා සංස්කෘතික සංගමය විසින් ආයතනයන්හි සමස්ත කාර්යසාධක විශිෂ්ටත්වය ඇගැයීමට ලක්කිරීම සඳහා වාර්ෂිකව සංවිධානය කරනු ලබන සම්මාන උළෙලකි. පසුගිය වසරවලදී මෙන්ම 2019 සම්මාන උළෙල සඳහාද ආයතන රාශියක් සහභාගි විය.

මිසුමි හා චැම්පියන් සබන් විදේශීය වෙළෙඳපොළට

ඉහළම TFM අගයකින් යුතුව, කෘත්‍රිම පිරිසුදුකාරක ඇතුළත් කිරීමෙන් තොරව උසස්ම තත්ත්වයෙන් තිපැයූ 'මිසුමි' සහ 'චැම්පියන්' සබන් ඉතා කෙටි කලකදී දේශීය වෙළෙඳපොළ ජයගැනීමෙන් අනතුරුව විදේශීය වෙළෙඳපොළද සාර්ථකව ජයගැනීමට සමත්ව සිටී. එහි තවත් පියවරක් ලෙස මිසුමි සහ චැම්පියන් ඇණවුමක් පසුගියදා වියට්නාමය බලා නැව් ගත කරන ලදී.

ඇඟ ගල්වන සබන් සඳහා නිර්දේශිත TFM ප්‍රමිතිය වන 76.5% ටත් වැඩි වූ TFM අගයෙන් යුතු සබන් කැටයක් 'මිසුමි' සන්නාමය යටතේ 2017 වසරේදී හඳුන්වා දුන්නේ නේචර්ස් සීක්‍රට්ස් නිෂ්පාදන මගින් පාරිභෝගික විශ්වාසයක් දිනා සිටින නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් (NBC) ආයතනයයි.

මිසුමි සබන්වල උසස්ම තත්ත්වය කෙරෙහි විශ්වාසය තැබූ පාරිභෝගික ඉල්ලීම මත පදනම්ව වෙළෙඳපොළෙහි අඩුවක්ව පැවති විෂ බීජ නාශක නියම සබන් කැටයක් NBC ආයතනය විසින් 2019 වසරේදී 'චැම්පියන්' නමින් TFM 76.5% ක අගයකින් යුතුව හඳුන්වා දෙන ලදී. 2017 වසරේදී දේශීය සබන් වෙළෙඳපොළට පිවිස, 2020 වනවිට විදේශීය සබන් වෙළෙඳපොළද ජයගැනීමට ලැබීමේ ප්‍රමුඛතම සාධකය NBC ආයතනයේ නිෂ්පාදනවල උසස්ම තත්ත්වයයි.

NBC ආයතනය, නේචර්ස් සීක්‍රට්ස් සහ පැන්ඩා බේබි නිෂ්පාදන මේ වන විටත් රටවල් ගණනාවකට අපනයනය කරමින් රටට අත්‍යාවශ්‍ය විදේශ විනිමය වසර ගණනාවක සිට ගෙන එමින් සිටී. එයට අමතරව ඉහත මිසුමි සහ චැම්පියන් සබන් අපනයනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 24ක් වන ගෝලීය ඇඟ ගල්වන සබන් වෙළෙඳපොළට පිවිසීමට හැකි වීම, විශාල ප්‍රමාණයෙන් විදේශ විනිමය ඉපැයීමට බෙහෙවින් ඉවහල් වනු ඇති බව, NBC ආයතනයේ සභාපති සමන්ත කුමාරසිංහ මහතා පැවසීය.

දේශීය සබන් කර්මාන්තකරුවන් හට පසුගිය වසර 20 ක පමණ කාලයක් පුරා ඇති වී තිබූ අසාධාරණ තත්ත්වයන් නිරාකරණය කරමින් සම තත්ත්වයන් යටතේ බහුජාතික සමාගම් සමග කරට කර තරග කිරීමට වත්මන් ජනාධිපතිතුමාගේ ආර්ථික ප්‍රතිපත්ති මගින් ඉඩ සලසා දීම නිසා දේශීය සබන් කර්මාන්තයේ නව පිබිදීමක් ඇතිකර දී ඇති බව ඔහු පැවසීය. එම ශක්තියෙන් තම ආයතනයට මෙන්ම අනෙකුත් දේශීය සබන් නිෂ්පාදකයින් හටද විදේශීය වෙළෙඳපොළවල් පවා ජය ගැනීමට හැකිවනු ඇති බවද ඔහු තවදුරටත් සඳහන් කරයි.

දේශීය ව්‍යාපාරිකයින් දිරිගන්වමින් කොවිඩ් 19 වසංගතය හමුවේ කඩා වැටුණු දේශීය ආර්ථිකයට නව පණක් ලබාදීමට අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ගෙන ඇති අනෙකුත් ක්‍රියාමාර්ගද දේශීය කර්මාන්ත දියුණුවට අත්වැලක් වනු ඇති බවද සමන්ත කුමාරසිංහ මහතා පැවසීය.

ශ්‍රී ලාංකීය ඡායාරූප ශිල්පීන්ගේ ආයතනයේ මහා සභා රැස්වීම

ශ්‍රී ලාංකීය ඡායාරූප ශිල්පීන්ගේ ආයතනයෙහි 26 වැනි වාර්ෂික මහා සභාරැස්වීම අගෝස්තු මස 22 වැනි සෙනසුරාදා සවස කොළඹ7 මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවතේ වෘත්තීය ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ හිටපු සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් රියර් අද්මිරාල් වෛද්‍ය ලලිත් ඒකනායක මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස උත්සවයට සහභාගි වූ අතර, වනජීවී ඡායාරූපකරණය යන තේමාව යටතේ ආරාධිත දේශනය පවත්වන ලදී. මෙම උත්සව අවස්ථාවේදී විල්ප්‍රඩ් හේමවන්ද සහ රංජිත්දසිල්වා යන මහත්වරු ඡායාරූප ශිල්පීන්ගේ ආයතනයේ ගෞරව සභාගී සම්මානයෙන් පිදුම් ලැබූහ. මෙම උත්සවයට සහභාගිවූවන් අතර ආයතනයේ සාමාජිකයන් ඇතුළු ඡායාරූප ක්ෂේත්‍රය තුළ සිටින ජ්‍යෙෂ්ඨ ශිල්පීන් සහ අනුග්‍රාහක භවතුන්ද වූහ.

2020-2021 වර්ෂ වෙනුවෙන් සභාපති ධුරය සඳහා ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා නැවතත් තේරී පත්විය. විධායක සභාව සඳහා වරුණ කාරියකරවන, අරුණ කීර්තිසිංහ, ට්‍රෙවිස්බවෝ, දනේෂ් තමින්ද, බන්දු ගුණරත්න, මිත්‍ර විරකෝන්, රොහාන් ෆොන්සේකා, ෆීලික්ස් පෙරේරා, අයි. ඒ. සෙනෙවිරත්න, අතුලජයසුන්දර, අරෝෂ අමරසේකර සහ ප්‍රසාද ගුණරත්න යන මහත්වරු තේරීපත් වූහ.

ආර්ථිකයට ශක්තියක් වූ රථවාහන අඩුවීම

● තාරක වික්‍රමසේකර

මෝටර් රථ ආනයනය මාස කිහිපයක් සීමා කරන්නට රජය තීරණය කළේ රටේ ආර්ථිකයෙන් විදෙස් කරා ඇදී යන මුදල් සීමා කිරීම උදෙසාය. දිනපතා යතුරු පැදි 1400ක් හා මෝටර් රථ 350කට ආසන්න සංඛ්‍යාවක් අලුතින් මහාමාර්ගයට එකතු වන සිළුමිණ මඟින් අපිද වරෙක අනාවරණය කෙළෙමු. දිනකට එතරම් වාහන සංඛ්‍යාවක් අලුතින් මහා මාර්ගයට එකතු වනවා යනු එතරම් ප්‍රමාණයක් අලුතින් ආනයනය කිරීමය. ඒ තත්ත්වය මැඬ පවත්වා රටේ මුදල් රට තුළම සංසරණය වීම පිණිස වාහන බලපත්‍රලාභී හිමියන්ට පවා තම වාහන බලපත්‍රය වාහන අලෙවි සමාගමකට ලබා දී මෙරට දැනට පවතින රථ වාහනවලින් වාහන මිලදී ගැනීමට පහසුකම් සලසා තිබේ.

2018 වසරේ පමණක් යතුරු පැදි 339,763 ක් හා මෝටර් රථ 80,773 ක් අලුතින් මහා මාර්ගයට එක්වී ඇත. එම වසරේ පමණක් මහාමාර්ගයට එක්වූ සමස්ත වාහන සංඛ්‍යාව 480,799 කි.

මෙරට දිනකට අලෙවි වන වාහන සංඛ්‍යාව 3,300 ඉක්මවන අතර දිනකට සාමාන්‍ය වශයෙන් මිලියන 9,000ක පමණ මුදල් නුවමාරුවක් වාහන මිලදී ගැනීම වෙනුවෙන් සිදු වන බව ප්‍රවාහනයට සම්බන්ධ ආර්ථික විශේෂඥයින් විසින් සිදු කළ සමීක්ෂණයකදි හෙළි විය.

2017 වසරේ දෙසැම්බර් මස සිදු කළ සමීක්ෂණයකට අනුව ශ්‍රී ලංකාව තුළ දිනකට රුපියල් මිලියන 8,800කට අධික වටිනාකමකින් යුතු වාහන අලෙවි වන බව හෙළි විය. මෙරටට ආනයනය කරන ලද නවීනතම හා විදේශ රටවල භාවිත කළ මෝටර් වාහනවලට වඩා මෙරට භාවිත කළ මෝටර් වාහන වැඩි වශයෙන්ම රට තුළ අලෙවි වන බව ද එහිදී හෙළිව තිබේ.

ඒ වන විට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව දිනකට සාමාන්‍ය වශයෙන් වාහන 1,268ක් පමණ අලුතින් ලියාපදිංචි කර ඇති අතර, මෙරට භාවිත කළ වාහන 2,000කට ආසන්න සංඛ්‍යාවක් දිනකට පැවරුම් සිදු කරගෙන තිබේ.

ත්‍රිරෝද රථ වැඩි ප්‍රමාණයක්

ප්‍රවාහන ආර්ථික විශේෂඥයින් විසින් සිදු කළ ඒ සමීක්ෂණය කළ එම වසරේ (2017) පළමු මාස 9ක කාලසීමාව තුළ මෙරටට ගෙන්වා අලුතින් ලියාපදිංචි කළ වාහන සංඛ්‍යාව 342,215ක් වූ අතර, එයින් 262,012ක්ම යතුරුපැදි විය.. එසේම මෝටර් රථ 29,684ක් මුල් මාස 9 තුළ අලුතින් ලියාපදිංචි කර තිබුණි. පළමු මාස 9 දෙස බලන විට වාහන පැවරුම් සිදු කිරීමේදී වැඩි වශයෙන් පැවරුම් සිදු කර ඇත්තේ ත්‍රිරෝද රථ වන අතර, ඒ සංඛ්‍යාව 164,509ක් විය. යතුරුපැදි 134,416ක් හා, මෝටර් රථ 99,294ක් අදාළ කාලය තුළ පවරාගෙන තිබුණි.

කෙසේ වුවත් මේ වන විට අලුතින් රථ වාහන ලියාපදිංචියේ හා භාවිත කළ රථ වාහන පවරා ගෙන ලියාපදිංචි කිරීමේදී අඩුවීමක් මේ වන විට සිදුව ඇත. එසේ වීමට හේතුවී ඇත්තේ රජය විසින් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ලෙස සලකා මෝටර් රථ ඇතුළු පෞද්ගලික පරිහරණය පිණිස ගැනෙන භාණ්ඩ ආනයනය සීමා කිරීමට පියවර ගැනීමයි. රටේ මුදල් විදෙස් කරා ඇදී යාම වළක්වා ගැනීම පිණිස ගත් මේ පියවර ඉතා සාර්ථක වී ඇති බවද අපට මෙහිදී පැවසිය හැකිය.

වසරකට මිලියන 72,00,000ක් විදෙස් කරා යයි

දිනකට වාහන ගනුදෙනු මිලියන 9000ක් නම් එයින් අවම වශයෙන් රුපියල් මිලියන 5000ක් හෝ එනම් රුපියල් කෝටි 500ක් විදෙස් කරා ඇදී යනු ඇත. එය මාසිකව ගණනය කළහොත් රුපියල් මිලියන 150,000කි. ඒ අනුව මෝටර් වාහන සඳහා වාර්ෂිකව අවම වශයෙන් රුපියල් මිලියන 72,00,000ක් හෙවත් රුපියල් කෝටි 720,000ක් විදේශ කරා ඇදී ගියේය. එය ශ්‍රී ලංකාව වැනි රටකට දැරිය හැකි ප්‍රමාණයක්ද නොවේ.

පසුගිය වසරේ පළමු මාස 6 තුළදී අලුතින් ලියාපදිංචි කරන ලද රථ වාහන සංඛ්‍යාව 192,441ක් වූ නමුත් මේ වසරේ පළමු මාස 6ක කාල සීමාව තුළ අලුතින් ලියාපදිංචි කරන ලද වාහන සංඛ්‍යාව 130,815කි. ඒ අනුව රථ වාහන ලියාපදිංචියේ සැලකිය යුතු අඩුවක් හෙවත් 32%කට අධික පහළ යාමක් පෙන්නුම් කෙරේ.

ඒ අනුව පසුගිය වසරට වඩා මේ වසරේ පළමු මාස 6ක කාලය තුළ වාහන ලියාපදිංචිය 61,626කින් පහළ බැස ඇත.

හම්බන්තොට වරායේ ගොඩ බා තිබූ මෝටර් රථ තොගයක්

නව ලියාපදිංචිය අඩුවීම

මේ වසරේ ජනවාරි මාසයේ නව මෝටර් රථ 3,753ක්, පෙබරවාරි මාසයේ 3,139ක් හා මාර්තු මාසයේදී මෝටර් රථ 1,710ක් අලුතින් ලියාපදිංචි කර තිබේ. එමෙන්ම මැයි මාසයේ අලුතින් මෝටර් රථ 2,929ක් හා ජූනි මාසයේ 3,177ක් අලුතින් ලියාපදිංචි කර ඇත.

ජනවාරි මාසයේදී අලුතින් ලියාපදිංචි කළ යතුරුපැදි සංඛ්‍යාව 29,903ක් වන අතර එය පෙබරවාරි මාසයේදී දැක්වුණේ 24,375ක් ලෙසිනි. මාර්තු මාසයේදී එම සංඛ්‍යාව 9908ක් දක්වා අඩුව ඇති අතර මැයි මාසයේදී එම සංඛ්‍යාව 22,942ක් දක්වා වැඩි වී ඇති අතර ජූනි මාසයේදී එම සංඛ්‍යාව 25,382ක් දක්වා ඉහළ ගොස් ඇත.

එහෙත් මෙරට වැඩි වශයෙන් දිනෙන් දින ඉහළ යන ත්‍රිරෝද රථ සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවක් මේ කාල සීමාවේදී පෙන්නුම් කර ඇත. ජනවාරි මාසයේදී 1,618ක් වූ නව ත්‍රිරෝද රථ සංඛ්‍යාව පෙබරවාරි මාසයේදී 1,488ක් දක්වාත් මාර්තු මාසයේ 768ක් දක්වාත් අඩුවී ඇත. මැයි මාසයේදී අලුතින් ලියාපදිංචි කළ ත්‍රිරෝද රථ සංඛ්‍යාව 773ක් වන අතර එම සංඛ්‍යාව ජූනි මාසයේදී දැක්වුණේ 1,107ක් ලෙසිනි.

කොරෝනා බලපෑම

කොරෝනා වසංගතය නිසා අප්‍රේල් මාසයේදී කිසිදු වාහනයක් ලියාපදිංචි කර නොමැත.

මේ සංඛ්‍යා ලේඛන දෙස බැලූ විට අපට පෙනී යන්නේ රජය විසින් වාහන ආනයනයට තාවකාලිකව හෝ වැට බැඳීම මෙරට සම්පත් විදේශ කරා ඇදී යාමට ගත් කාලෝචිතම පියවරක් බවයි.

මාසයකට පමණක් වාහන ආනයනයට විදෙස් කරා ඇදී යන මුදල රුපියල් මිලියන 150,000ක් බව අපි සඳහන් කෙළෙමු. එය රට තුළ සැරිසැරුවේ නම් ග්‍රාමීය රෝහල් සැලකිය යුතු සංඛ්‍යාවක් තනන්නට අපට හැකියාව ලැබෙනු ඇත. මෝටර් රථ හෝ වෙනත් රථ වාහන ආනයනය සීමා කළ බවක් මෙරට කිසිවකුට හෝ දැනී නැත. (එම ක්ෂේත්‍රය සෘජු ජීවනෝපාය කරගත් අතළොස්සකට හැර)

පසුගිය වසර හා සැසඳෙන කල මේ වසරේ සිදුව ඇති වාහන ආනයනය මෙන්ම ලියාපදිංචියේ අඩුවෙන් පෙන්නුම් කෙරෙන්නේ එම මුදල් රට තුළ සංචරණය වන බවයි. ඇතැම් විට එම මුදලෙන් සැලකිය යුතු කොටසක් මෙරට භාවිත කළ වාහන මිල දී ගැනීමට වැය කළා විය හැකිය. එසේම මෙරටට මේ වන විට ආනයනය කර ඇති, මේ වන විටත් වාහන අලෙවිසල්හි අලෙවිය පිණිස තබා ඇති වාහන මිලදී ගැනීමට වැය කරන්නට ඇත. මුදල් අමාත්‍යාංශ්‍ය පෙන්වා දෙන්නේ රට තුළ දැනට පවතින වාහන තොග ඉදිරි වසර එකහමාරක කාලයට ප්‍රමාණවත් බවයි.

දුම්රිය බස් රථ මෙරටදීම

එමෙන්ම මේ සියලු වාහන නඩත්තුව හා අලුත්වැඩියාව පිණිස අමතර කොටස්ද විදේශ රටවලින් ආනයනය කිරීම පිණිස සැලකිය යුතු මුදලක් වැය කෙරේ. අපේ රටේ අවාසනාවට මෙරට දී මෝටර් රථ අමතර කොටස් නිෂ්පාදනය කරන්නට සුදුසුකම් ලත් පුද්ගලයන් හා ආයතන සිටියද ඒ සඳහා පහසුකම් තිබුණද ඔවුන්ට ඉදිරියට එන්නට නිසි අවස්ථාවක් ක්‍රමවේදයක් නොමැත.

> **පසුගිය වසරේ පළමු මාස 6 තුළදී අලුතින් ලියාපදිංචි කරන ලද රථ වාහන සංඛ්‍යාව 192,441ක් වූ නමුත් මේ වසරේ පළමු මාස 6ක කාල සීමාව තුළ අලුතින් ලියාපදිංචි කරන ලද වාහන සංඛ්‍යාව 130,815කි. ඒ අනුව රථ වාහන ලියාපදිංචියේ සැලකිය යුතු අඩුවක් හෙවත් 32%කට අධික පහළ යෑමක් පෙන්නුම් කෙරේ.**

එසේ වුවහොත් විදේශ කරා ඇදී යන අතිවිශාල මුදලක් ඉතිරි කර ගැන්මට අපට හැකියාව ලැබෙනු ඇත. එය සාමාන්‍ය මුදලක් ලෙසින් ඇතැමකුට පෙනුණද අමතර කොටස් මිල හා සන්සන්දනය කිරීමේදී පැහැදිලි වන්නේ අපට අහිමි වන අතිවිශාල සම්පත් ප්‍රමාණයයි.

උදාහරණයක් ලෙස නිසාන් ප්‍රිමේරා 2009 වර්ෂයේ නිෂ්පාදිත මෝටර් රථයක ඉදිරිපස තිරිංග පලු (බ්‍රේක් පෑඩ්) යුගලක් වෙළෙඳ පොළේ (ආනයනික) මිල රුපියල් 24,000කි එය දේශීයව නිපදවා ගන්නේ නම් වැය වන්නේ රුපියල් 2000ක මුදලකි. සුපිරි අවුන්ලෑන්ඩර් වර්ගයේ මෝටර් රථයක එය රුපියල් 42,000කි. දේශීයව එම ප්‍රමිතියට සමනාවම එය නිපදවන්නේ නම් ඒ සඳහා වැය වන්නේ රුපියල් 3900ක් පමණ වූ මුදලකි.

මේ අනුව අපට පැහැදිලි වන්නේ මෝටර් රථ අලුතින් ලියාපදිචිය අඩුවීම කුමන පැත්තෙන් බැලුවද රටට වාසනාවන්ත බවකි. වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම ඇමැතිවරයා විසින් මේ වන විට ප්‍රකාශ කර ඇති පරිදි දුම්රිය මැදිරි දේශීයව නිපදවීම මෙන්ම ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන බස් රථ චැසිවලට මෙරටදී බොඩි සෑදීම මඟින් විදෙස් කරා ඇදී යන විශාල මුදලක් ඉතිරි කර ගත හැකිවාක් මෙන්ම රැකියා අවස්ථාද දහස් ගණනක් උදා වනු ඇත. මෝටර් රථ සඳහා අවශ්‍ය අමතට කොටස්ද දේශීයව නිපදවීමට අමාත්‍යාංශයේ අවධානයක් මේ වන විට යොමුව තිබෙන හෙයින් එයත් රටේ ආර්ථිකයට ශක්තියක් වනු ඇත.

ලංකා සතොස දැන් ඔබේම තැනක්

● ඉනෝකා පෙරේරා බණ්ඩාර

මෙරට පොදු ජනතාවගේ සමීපතම සහ විශාලතම සිල්ලර වෙළෙඳ අලෙවි ජාලය වන ලංකා සතොස, පසු ගිය ජනවාරි මාසයේ සිට ජූනි දක්වා කාලය තුළ රුපියල් මිලියන 17.62 ක වාර්තා ගත ආදායමක් උපයා තිබේ. එසේ බලද්දී, 2019 සිට 2020 දක්වා වසර තුළ, සතොස පෙන්නුම් කළ විකුණුම් වර්ධන වේගය 23%කි. ලංකා සතොස ඉතිහාසයේ අත්පත් කරගත් වාර්තාගත ආදායම සහ මෙතෙක්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයක් අත්පත් කරගත් සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස, එය හැඳින්විය හැකි බව සතොස සභාපති, නුෂාඩ් එම්. පෙරේරා පවසයි.

කොවිඩ් වසංගත සමයේ ආරම්භ වූ මෙම වර්ධනීය අවස්ථාව, පියවරෙන් පියවර අද දක්වාම පවත්වාගෙන ඒම විශේෂත්වයකි. price advantages හෙවත්, 'මිල වාසිය..', අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ප්‍රමුඛතාව සහ අඩුම මිලට ගුණාත්මක බවින් යුතු භාණ්ඩ ලබා දීම යන, සංකල්ප දිගින් දිගටම ක්‍රියාත්මක කළ නිසා, අද වන විට සතොස වටා රොද බැඳී පාරිභෝගික පිරිස කිහිප ගුණයකින් වැඩිවී ඇති බවත්, ඒ නිසාම පාරිභෝගිකයාට වඩාත් අවශ්‍ය දේ අඩුම මිලට ලබා දීමේ සංකල්පය තව තවත් පුළුල් කළ බවත්, සභාපතිවරයා පවසයි.

"උදාහරණවලින් කිව්වොත්, නාඩු හාල්, පාලන මිල රුපියල් 90ක් ව පවතිද්දී අපි දුන්නේ, රුපියල් 85ට. වෙළෙඳපොළේ සුදු සීනි රුපියල් 145ක් ව පවතිද්දී, සතොස මිල රුපියල් 127යි. ගෙවුණු දුෂ්කර කාලය පුරාමත්, ඉදිරියටත් අපි මිල වාසිය දෙන්නේ, අනවශ්‍ය භාණ්ඩවලට නෙවෙයි, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට.

ඒ වගේම, අපි සතොස හරහා අලෙවි කරන ආහාර ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය පිළිබඳ විශේෂ වැඩපිළිවෙළක් සකස් කළා.

ඒ අනුව, අපේ පරිප්පු ගෙන්වන්නේ කැනඩාවෙන් සහ ඕස්ට්‍රේලියාවෙන්. කවුපි, රුසියාවෙන්. ලූනු සහ සීනි ඉන්දියාවෙන්. ඒ සීනි කැටවල ප්‍රමාණය පවා අපි අධීක්ෂණයට ලක් කරනවා. අඩුම මිලට දෙනවා කියා අපි දැන් තත්ත්වයෙන් බාල ආහාර ද්‍රව්‍ය කිසිවක් සතොසට මිලදී ගන්නේ නැහැ.

ඒ නිසාම,මේ දිනවල සතොසේ හාල්මැස්සන් හිඟයි. හේතුව, තායිලන්ත හාල්මැස්සන් සාම්පල පෙන්වා, ඉරානයෙන් ගෙන්වන දුඹුරු පැහැති, බෙලිකටු ගල් සහ රොඩු සහිත දිරා ගිය හාල් මැස්සන් විශාල වශයෙන් සතොසට දී තිබුණා. ඒ නිසා, අපි වහාම හාල්මැස්සන් මිල දී ගැනීම නැවැත්වූවා. දැනට සතොසේ තිබෙන්නේ, පැකට් කළ හාල්මැස්සන් පමණයි.

ඒ වගේමයි ලොකු ලූනුත්. ඕලන්දයෙන් ගෙන්වන ලොකු ලූනු කහ පැහැතියි. රසයෙන් අඩුයි. නමුත් මිලෙන් අඩුයි. හොඳ ලූනු පොතු ගැලවෙන ආකාරයෙන් සොයා ගන්නට පුළුවන්. ඒවා රෝස පැහැයෙන් යුක්තයි. මිල තරමක් වැඩි වුවත් රසයෙන් යුක්තයි. ඒ නිසා, ඉන්දියාවෙන් ගෙනෙන ලොකු ලූනුවලටයි අපි දැන් ප්‍රමුඛතාව දෙන්නේ.

සමහර සතොසවල මේ කියන තත්ත්වයෙන් නොවන ලූනු තිබෙනවා නම්, පාරිභෝගිකයන්ට පුළුවන්, ඒ බව අපිට දැනුම් දෙන්න. මොන තරම් ටෙන්ඩර් පටිපාටි ක්‍රියාත්මක කළත්, ටෙන්ඩරයේදී එක සාම්පලයක් පෙන්වා, භාණ්ඩ භාර දෙන විට, බාල තත්වයේ ඒවා දෙන සැපයුම්කරුවන් කොතෙකුත් සිටිනවා. මින් ඉදිරියට ඒ කිසිවකුටත් සතොසේ ඉඩ නැහැ. අවුරුදු ගණනක් රුපියල් 800 ක්ව එකම ආකාරයකට තිබුණු පාරිභෝගිකයන්ගේ භාණ්ඩ මිල දී ගැනීමේ උපයෝගීතාව හෙවත්, basket price එක, දැන් රුපියල් 1,100 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. එය විශාල සාධනීය පියවරක්. එයට බලපෑ හේතු අතර, සතොස ආහාර ද්‍රව්‍යවල ගුණාත්මක භාවය දක්වන්නට පුළුවන්.

මේ සාධනීය තත්ත්වයන් දිගටම පවත්වාගෙන යෑම සඳහා, සහල් මිලදී ගනිද්දි, නවීන තාක්ෂණය ඇසුරෙන් ඒවායේ තෙතමනය පවා පරීක්ෂාවට ලක් කරනවා. මොකද, තෙතමනය වැඩි නම් ඒ සහල් පුස් කෑමේ සම්භාවිතාව වැඩියි.

ඉස්සර අපගේ අලෙවිසල් වෙත බඩු භාණ්ඩ රැගත් ලොරි ගියේ සතියට වතාවයි. දැන් අවශ්‍යතාව අනුව, දින දෙකෙන් දෙකට ලොරි පිටත් වෙනවා. රාජ්‍ය අංශයේ ප්‍රගති දර්ශක සඳහා පූර්වාදර්ශයක් වෙමින් ලංකා සතොස ඉතිහාසයේ, අපි තවත් සුවිශේෂී සලකුණක් සටහන් කළා. එනම්, www.lankasathosa.lk වෙබ් අඩවියෙන් පාරිභෝගිකයන්ට අන්තර්ජාලය ඔස්සේ ගනුදෙනු කිරීමට අවස්ථාව සැලැස්වූවා.

ඒ වගේම ලංකාවේ වේගයෙන් වර්ධනය වන ඔන්ලයින් සේවා වෙළෙඳපොළ තුළ තරඟකාරීත්වය ජයගනිමින් පාරිභෝගිකයන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම අරමුණු කරගෙන ලංකා සතොස මෑතකදී ඔරුගොඩවත්තේදී, නවතම අංග සම්පූර්ණ ගබඩා සංකීර්ණයක් ද විවෘත කළා."

සතොස ප්‍රදර්ශනාගාරයක්

සභාපතිවරයා පවසන පරිදි, සතොස නව පිබිදීමත් සමඟ පසුගිය ජනවාරි මාසයේ සිට නව ශාඛා 16ක් විවෘත කොට තිබේ. ඉදිරියේදී තවත් ශාඛා 25ක් විවෘත කිරීමට නියමිත අතර, ඒවා දුෂ්කර ගම්මාන පවතින ප්‍රදේශවලට අදාළව විවෘත කෙරෙන බවද සභාපති වරයා පවසයි.

" හුග දෙනෙක් මගෙන් අහනවා, ඇයි මේ, ප්‍රධාන සුපර් මාර්කට් දෙක තුන එක්ක තරග නොකරන්නේ කියලා. ඇත්තටම මට තියෙන්නේ ඊට වඩා ලොකු අභියෝගයක්. ජාතික වගකීමක් ඉටු කිරීම සඳහා වන කාර්ය භාරයයක්. සුපර් මාර්කට් වෙත යා නොහැකි පහළ මැද පන්තියේ මිනිස්සුයි, මේ රටේ මිලියන ගණනක් සිටින්නේ. අපේ ඉලක්කය වන්නේ ඔවුන්.

ඔබ හිතන්න, හෙට සිට ලංකාවේ සතොස ජාලයක් නැහැ කියලා. පුළුවන් මිනිස්සු සුපිරි වෙළෙඳසල්වලට යාවි. ඒත් දුප්පතුන් මොකද කරන්නේ. පිටකොටුවට සිල්ලර කඩවලට විතරක් නෙවෙයි, ඕනෑම වෙළෙඳසලකට පුළුවන් හිතු හිතු මිලට බඩු විකුණන්න. බඩු මිල ඉහළ දමන්න. කවුද අභියෝග කරන්නේ. අපිව අභියෝගයක් නිසා තමයි, අනෙක් අයට කළු කඩ මිලට බඩු විකුණන්න බැරි.

සතොස නිසා තමයි, තවමත් මේ රටේ පාලන මිලක් ඇතිව, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ටිකවත් අලෙවි වන්නේ. අපි ජනාධිපතිතුමා ගේ රට නංවන දැක්මට අනුගත වූ නිලධාරීන්. ඒ නිසා, නිවැරැදි දේ කරන්න අපි බැඳී ඉන්නවා. එතුමා අපිට අවශ්‍ය තරම් බලය සහ නිදහස දී තිබෙනවා. සතොස තිබෙන්නේ මහජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන්. අපි ඇවිත් ඉන්නේ, ඒ ජාතික වගකීම ඉටු කරන්න..."

සභාපති - නුෂාඩ් පෙරේරා

ඒ නිදහස හා බලය තුළ,ගත යුතු දැඩි තීන්දු තීරණ ගන්නට සතොස සභාපතිවරයා දෙවරක් සිතා නැත.

මෙතෙක් සිදුවෙමින් පැවතුණා වූ, සතොස මහා පරිමාණයේ වංචා දූෂණ සඳහා, ඔහු නෛතික වැට බඳින්නට පියවර ගෙන තිබේ. අවුරුදු ගණන් හොඳින් පදම් ව, විවිධ පුද්ගලයන් කරගෙන ගිය ඒ වාංචනික සහ දූෂිත ක්‍රියා මුලිනුපුටා දැමීම මේ වන විට ඔහු ආරම්භ කොට තිබේ.

ඒ අනුව, සෑම සතොස ශාඛාවකමත් විශේෂයෙන් මූල්‍ය අංශය වැනි වැදගත් අංශ ආවරණය වන පරිද්දෙන් සතොස මූලස්ථානයේත් සෑම මහලක් ම ආවරණය වන පරිදි සී සී ටීවී කැමරා සවි කිරීම ආරම්භ කොට තිබේ. අමාත්‍යවරයා විසින් සියල්ල සෘජුව අධීක්ෂණය කරනු ලබයි.

එතෙකින් නොනැවතී, ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා යොදා ගන්නා සියලුම ලොරි, භාණ්ඩ පැටවීමෙන් පසු සීල් තබන අතර, ප්‍රදර්ශනාගාරවලට නැවත බඩු බාන අවස්ථාවේදී සියලුම කිරුම් මිණුම් කටයුතු ඩිජිටල් තරාදි මගින් සිදු කරයි. ලොරි රථ සීල් තැබීම සහ තරාදි ඩිජිටල්කරණය කිරීමෙන් විශාල වශයෙන් සිදුවූ වංචා දූෂණ අවම කරගන්නට හැකියාව ලැබුණු බව සභාපතිවරයා පවසයි.

'මහජනතාවට වඩාත් සමීප, සිල්ලර අලෙවිසල් ජාලය ලෙස ක්‍රියාත්මක වන්නේ, ලංකා සතොසයි.1949 පාර්ලිමේන්තු පනතින් පිහිට වූ සතොස, එකල ලක්සෙට කොඩි දැමූ රාජ්‍ය ආයතනයක්. සළුසල, ලංකා මිල්ක් ෆුඩ්ස් CWE ලිමිටඩ් හෙවත් ලක්ස්ප්‍රේ,රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව (STC) සහ ඔබරෝයි හෝටලය යන එකල අතිශය ලාභ ලැබූ ව්‍යාපාර බිහි වුණේ, සතොස මව් සමාගමේ ලාභයෙන්.

විවෘත ආර්ථිකයට කලින් ලංකාවට අවශ්‍ය සෑම ආහාර ද්‍රව්‍යයක්ම ආනයනය කොට බෙදාහැරීමට බලය තිබුණේ සතොසට පමණයි. විවෘත ආර්ථිකයේ පැමිණීමත් සමග සතොස ට තිබූ බලය සහ ඉල්ලුම ටිකෙන් ටික අඩු වුණා. සළුසල වැහිලා ගියා. ලක්ස්ප්‍රේ සමාගම පුද්ගලික අංශයට විකිණුනා.

ඔබරෝයි හෝටලයේ අයිතියත් ගිළිහී ගියා. ඒත්, සතොස කියන්නේ, යුගයක් එකලු කළ දැවැන්ත ව්‍යාපාරයක්. මේ ස්වර්ණමය යුගයම නැති වුණත් අදත් සතොස සේවකයන් 4,000 කගේ බඩවියත රකිනා දැවැන්ත ආයතනයක්.

අලෙවිසල් 400ක් හරහා, රටේ පහළ මධ්‍යම පාන්තික ජනතාවගේ කුසගින්න නිවනා ඔවුන්ගේ ම ආයතනයක්. තවමත් සම්පත් ඉතිරිව තිබෙන ආයතනයක්. සතොස සතුව ලොරි 87ක් තිබෙනවා. පන්නෙගමුව සහ හිඟුරක්ගොඩ එදා සහල් කෙටූ දැවැන්ත හාල් මෝල් දෙකත් නිරූපද්‍රිතව තිබෙනවා.

මේ තරම් කාලයක් මේ හාල් මෝල් දෙක, සහල් මාෆියාකරුවන් මුදල් දී වසා දමා තිබූ බවයි, මට දැනගන්නට ලැබුණේ.ඒ මෝල් දෙක පටන් ගන්න හදනකොට මටත් විවිධ බලපෑම් ආවා. නමුත් මම සැලුණේ නැහැ.

අක්කර තිහක භූමියක යකඩ ගොඩක් වගේ තිබූ ඒ මෝල් දෙක දැන් වැඩ. වී අලෙවි මණ්ඩලය හරහා වී මිලදී ගෙන, අපි දැන් ඒ මෝල්වල සහල් කොටනවා. දැන් මෝල් දෙකක්ම තියෙන නිසා, දිසාපතිවරු හරහා, සෘජුවම කුඩා පරිමාණ සහල් මෝල් හිමියන්ගෙන් සහ ගොවීන්ගෙන් වී මිල දී ගැනීමේ වැඩපිළිවෙළකුත් අප ක්‍රියාත්මක කර තිබෙනවා. දැන් අපිට අතරමැදියන් අවශ්‍ය නැහැ. දවසකට මෙට්‍රික් ටොන් විස්සක ධාරිතාවක් ඇති මේ මෝල් දෙක, 1997 ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු තෑග්ගක්. අවුරුදු හතරක්වත් යන්න කලින් 2001 වන විට මේක වසා දමලා. නමුත් වසා දමන්නට ඕනෑ මේ සහල් මෝල් නෙවෙයි.

කිසිදු සොයාබැලීමකින් හෝ ක්‍රමවේදයකින් තොරව පහුගිය කාලයේ විවෘත කොට තිබූ, අලෙවිසල් විශාල ප්‍රමාණයක් තිබුණා. ඒවා මෙපමණ කලක් තිබුණේ පාඩු පිට. සමහර අලෙවිසල් කුලී පදනම මත අරගෙන, කවදාවත් විවෘත නොකරපු ඒවා. නමුත් මුදල් ගෙවමින් පැවතුණා. අපි ඒ සියල්ල වහා ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවූවා. ඒ අනුව, නැගෙනහිර පළාතේ සතොස අලෙවිසල් 14ක් මං වසා දැමුවා. මින් ඉදිරියට,අලෙවිසල් ආශ්‍රිත සියලු ඉදිරි සැලසුම් ක්‍රියාත්මක වන්නේ, අප පත් කළ නව ගොඩනැගිලි කමිටුව හරහායි. "

සතොස ගබඩා සංකීර්ණයන්හි සේවකයන් ගේ කැපවීම

සිළුමිණ රැකියා අවස්ථා

පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත අමාත්‍යාංශය

NLDB

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර :

1. **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික මෙහෙයුම්)** HM **1-3-2016**

   සුදුසුකම් : කෘෂිකර්ම / වැවිලි කළමනාකරණ / පශු වෛද්‍ය විද්‍යා / සත්ත්ව පාලනය / කළමනාකරණ / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලන / වාණිජ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය හෝ ICASL / CIMA/ACCA ආයතනයක අධිසාමාජික / ආශ්‍රිත සාමාජිකත්වය සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ඇතුළත්ව අවම වශයෙන් වසර 18 ක කළමනාකරණ තලයේ පළපුරුද්ද.

2. **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පශු සම්පත් හා වැවිලි සංවර්ධන)** HM **1-3-2016**

   සුදුසුකම් : විද්‍යා / කෘෂිකර්ම / වැවිලි කළමනාකරණ / පශු වෛද්‍ය විද්‍යා / සත්ත්ව පාලනය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ ඉහත ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ, සුදුසුකම් ලැබීමෙන් පසු වසර තුනක (03) පළපුරුද්ද ඇතුළත්ව අවම වශයෙන් වසර 18 ක කළමනාකරණ තලයේ පළපුරුද්ද.

   වැටුප් : HM 1-3-2016: රුපියල් 86,865/- - 15X2,270/- - රුපියල් 120,915/-

3. **සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රාදේශීය)** HM **1-1-2016**

   සුදුසුකම් : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, කෘෂිකර්ම / වැවිලි කළමනාකරණ / පශු වෛද්‍ය විද්‍යා / විද්‍යා ප්‍රථම උපාධියක් සමග පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ අදළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, ගොවිපළ / වැවිලි හා සත්ත්ව පාලන කාර්යයන් සම්බන්ධව, ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක / රජයේ ආයතනයක වසර 15 ක කළමනාකරණ තලයේ තනතුරක පළපුරුද්ද.

   වැටුප් : HM 1-1-2016: රුපියල් 80,295/- - 15X2,270/- - රුපියල් 114,345/-

   වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 50 ට නොවැඩි විය යුතුය.

ඉහත වැටුපට අමතරව, රජය විසින් අනුමත කළ දීමනාද ගෙවනු ලැබේ.

අයදුම් කරනු ලබන අවස්ථාව වන විට සමාන තනතුරුවල සේවය කොට ඇති / සේවය කරනු ලබන අයදුම්කරුවන්හට ප්‍රමුඛතාව හිමිවේ.

අමතර ප්‍රතිලාභ :

i) අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

ii) පෞද්ගලික ධාවන දුර 960 ක් සමග පැවරූ වාහනයක්.

සියලුම අයදුම්කරුවන් :

i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ii) තනතුරට අදළ රාජකාරී නියමාකාරයෙන් ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකිවන පරිදි මනා ශාරීරික හා මානසික සුවතාවයකින් යුක්ත විය යුතුය.

iii) ඉතා හොඳ චරිතයකින් යුක්ත විය යුතුය.

ජීවදත්ත, ලිපිනය හා දුරකථන අංක සහිත අයදුම්පත්, සහතිකවල පිටපත් සමග, 2020 සැප්තැම්බර් 24 වන දිනට පෙර, **සභාපති, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. කරුණාකර, අදළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කරන්න.

රජයේ ආයතනවල දැනටමත් සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත්, අදළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

සභාපති,
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,
අංක 40, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

තේ පර්යේෂණ සභාව

වතු අධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

ශාන්ත කූම්බිස් වතුයාය, තලවකැලේ

ඉහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

තලවකැලේ පිහිටි ශාන්ත කූම්බිස් වතුයාය සහ කර්මාන්තශාලාව භාරව උසස් ලෙස සුදුසුකම්ලද විද්‍යඥයන් කණ්ඩායමක් සහිත පරිසරයක කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් කාර්යශූර වැවිලිකරුවකු සොයයි. මෙම තනතුර, තේ පර්යේෂණ ආයතනයේ විද්‍යඥයන් සමග කටයුතු කරමින් තේ කර්මාන්තයේ පිළිගැනීමක් ලබාගනිමින් ස්වකීය වෘත්තීය කටයුතු වැඩිදියුණු කර ගැනීම සඳහා සුදුසු පරිදි සුදුසුකම් ලබා ඇති අයෙකුට කදිම අවස්ථාවකි.

රැකියා විස්තරය

තේ වතුයාය සහ කාර්යාලය තේ කර්මාන්තශාලා කළමනාකරණය කිරීමේ සියලුම කටයුතු සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකීම දැරීම සහ කළමනාකාරීත්වයට උපචිත තොරතුරු ලබාදීම.

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ භාෂාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන හතරක් (4) සමග එක්වර විෂයන් හයකින් (6) සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු ප්‍රශ්නපත්‍රය හැර) සමත් වී තිබීම.

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 05 මට්ටමට (NVQ Level 05) නොඅඩු වැවිලි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

කඳුරට තේ වතුයායේ සහ කර්මාන්තශාලාව වතු අධිකාරී ලෙස වැවිලිකරුවෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් අපේක්ෂක සතුව තිබිය යුතු අතර, තේ කොළ මිලදී ගන්නා තේ කර්මාන්තශාලාවක මෙහෙයුම් පිළිබඳ පළපුරුද්ද ද අවශ්‍යවේ.

විශිෂ්ට අන්තර් පුද්ගල සම්බන්ධතා, කණ්ඩායම් හැඟීම සහ ජාලගතකිරීමේ නිපුණතා අමතර සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමේ දැනුම සහ දෙමළ භාෂාව කථා කිරීමේ හැකියාව ඉතා වැදගත් වේ.

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත වන අතර, මූලික වසර 03 ක් සඳහා වාර්ෂිකව අලුත් කිරීමේ පදනම මත වේ.

වැටුප :

දළ වශයෙන් රු. 125,000/- ක පමණ සියලුදේ ඇතුළත් මාසික වැටුප් පැකේජයක් ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අපේක්ෂකයාට තේ පර්යේෂණ ආයතනය විසින් නියම කරන ලද පරිදි මෙම තනතුරට අදළ අමතර පහසුකම් ලබා දෙනු ලැබේ.

සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පත උප්පැන්න සහතිකයේ පිටපතක්, අදළ අධ්‍යාපන හා අනෙකුත් වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්, සේවා සහතික හා අදළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ නිපුණතා හා දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග 2020 සැප්තැම්බර් 21 වෙනි දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් අදළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,
ශාන්ත කූම්බිස්, තලවකැලේ.

ඇබෑර්තු

කාඩ්බෝඩ් නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියමු ආයතනයක් වන ඉකොනොපැක් ඉන්ඩස්ට්‍රිස් (පුද්ගලික) සමාගමේ පහත පුරප්පාඩු සඳහා සුදුස්සන් බඳවාගැනේ.

1. **නිෂ්පාදන සුපරීක්ෂක** (Production Supervisor)
2. **ලේඛන සහයක (නඩත්තු අංශ)** (Documentation Assistant - Maintenance)
3. **කාර්මික ශිල්පී** (Mechanic)
4. **ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු** (Offset Printing Operator)
5. **ගිලටින් යන්ත්‍ර ක්‍රියාකරු** (Guillotine Operator)
6. **යන්ත්‍ර සහයක** (Machine Helper)

අංක **01-05** දක්වා තනතුරු සඳහා වසර **03**ක පළපුරුද්ද අනිවාර්යය වන අතර අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛත්වය හිමිවේ. අංක **06** සඳහා පමණක් පළපුරුද්ද අනිවාර්යය නොවේ.

සේවාමූර ක්‍රමය අනුව සේවය කිරීමට හැකි වයස අවු.20-40 අතර අයදුම්කරුවන් වහාම අයදුම් කරන්න.

ක්ෂේත්‍රයේ ඉහළම වැටුප් හා දීමනා සහ මිලියනයක හවිසි අනතුරු රක්ෂණාවරණයක් හා වෙනත් සුබසාධන පහසුකම් ඔබට හිමිවේ.

මානව සම්පත් කළමණාකරු,
ඉකොනොපැක් ඉන්ඩස්ට්‍රිස් (පුද්ගලික) සමාගම
නො. **101**, නව ගාලුපාර, ගල්තුඩේ, බණ්ඩාරගම.
E-mail - hr@econopackltd.com
විමසීම් - 076-6887998

ඇබෑර්තු

කළුතර - බණ්ඩාරගම පිහිටා තිබෙන කාඩ්බෝඩ් නිෂ්පාදන ආයතනයක් සඳහා සේවකයින් බඳවාගැනේ.

යන්ත්‍ර සහයක (Machine Helper)

මාසික වැටුප රු.40,000/-

විමසීම් - 076-6887998

ROOFMART

යන්ත්‍ර ක්‍රියාකරු හා කර්මාන්තශාලා සහයකයින් සඳහා රැකියා ඇබෑර්තු.

කුරුණෑගල ප්‍රදේශයේ පිහිටි
සෙවිලි තහඩු නිෂ්පාදන ආයතනයක
රැකියා සඳහා පුරප්පාඩු පවතී.

- අවම වශයෙන් අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබීම.
- වයස අවුරුදු 18-30 අතර ක්‍රියාශීලී තරුණයෙකු වීම.
- කුරුණෑගල අවට පදිංචිකරුවකු වීම.

තෝරාගනු ලබන අයදුම්කරුවන් හට සුවිශේෂී වැටුප් හා දීමනා.

ඉහත සුදුසුකම් ඔබ සපුරා තිබේ නම්, අගහරුවාදා දිනවල හා සිකුරාදා දිනවල උදෑසන 9 හා 12 අතර කාලයේ දී ආයතනයට පැමිණ විමසන්න.

මානව සම්පත් අංශය
රුෆ්මාට් පෞද්ගලික සමාගම
රත්කරවිව, මාස්පොත, කුරුණෑගල.

076 5466387 | 077 5790952

සංචාරක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා අධ්‍යාපනය ලබාදෙනු ලබන ප්‍රමුඛතම රාජ්‍ය ජාතික පුහුණු ආයතනය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයයි.

තනතුර - සහකාර අධ්‍යක්ෂ නඩත්තු

(MM 1 - 2 කාණ්ඩය)

සුදුසුකම් සහ පළපුරුද්ද

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම පිළිගත්, (සිවිල් හෝ විදුලිබල) ඉංජිනේරු උපාධිය

සහ

රාජ්‍ය සේවා, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මාණ්ඩලික ශ්‍රේණියේ ක්ෂේත්‍රයට අදාලව එක් වසරක අවම පළපුරුද්ද.

වැටුප් තලය:

MM 1 - 2 රු.54,500/= - 10 x රු.1,375/= - 15 x රු.1,910/= - රු.96,950/=

ආරම්භක වැටුප් පියවර-රු.54,550/- + ජීවන වියදම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව රජය අනුමත කළ දීමනා. මෙයට අමතරව මාසිකව වෘත්තිමය දීමනාව රු.3,000/=ක් සහ ප්‍රවාහන දීමනාව ලෙස මාසිකව රු.4000/= ගෙවනු ලැබේ.

වයස:

අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

තනතුර - සහකාර කළමනාකාර තාක්ෂණික

(MA 2 - 2 කාණ්ඩය)

සුදුසුකම්

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව තෘතීය හා වෘත්තිය පුහුණු කොමිසම පිළිගත්, තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කළ, ජාතික වෘත්තිය පුහුණු අදියර 5කට නොඅඩු වෘත්තීය නිපුණතා සහතිකය සතුවීම.

වැටුප් තලය:

MA 2 - 2 රු.30,310/= - 10 x රු.300/= - 7 x රු.350/= - 4 x රු.600/= - 20 x රු.7100/=- 52 x රු.360/= (2016/02 චක්‍රලේඛනයට අනුකූලව)

ආරම්භක වැටුප් පියවර-රු.30,310/- + ජීවන වියදම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව රජය අනුමත කළ දීමනා. මෙයට අමතරව මාසිකව ප්‍රවාහන දීමනාව ලෙස රු. 4000/= ක් ගෙවනු ලැබේ.

වයස:

අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

පොදු කරුණු

- අර්ථසාධක ගෙවීම් : සේවකයා මාසික වේතනයෙන් 10% ක්ද සේව්‍යයා 15% ක්ද අරමුදලට බැර කරනු ලැබේ.
- සේවක භාරකාර අරමුදල : සේව්‍යයා විසින් 3% ක ප්‍රමාණයක් අරමුදලට බැර කරනු ලැබේ.

සේවකයා සහ ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයින් ආකර්ෂණීය සෞඛ්‍ය රක්ෂණාවරණයකට හිමිකම් ලබනු ඇත.

ඉල්ලුම් කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන්කොට ඉල්ලුම්පත සමග අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සහතික පත්වල සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ඇතුළුව ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහිතව සකස් කළ අයදුම්පත **2020 සැප්තැම්බර් මස 30** වැනි දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,
අංක 78, ගාලු පාර, කොළඹ 03.
විමසීම් - 011 220 8360

දිනමිණ රැකියා අවස්ථා

කඩුවෙල පළතුරු වෙළඳසැලකට සේවක සේවිකාවන් අවශ්‍යයි.

කෑම නවාතැන් ඇත. ඉහළ වැටුප්. පළපුරුදු සේවකයන්ට විශේෂයි.
පළතුරු බීම සෑදීමට දක්ෂ අයත්.

011-7900996, 011-2407507, 071-6245807

21 වැනි සියවසට එළඹෙන යෞවනයට

නිරවුල් ගමන් මග

බුදුසරණ

පුරප්පාඩු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - කුලියාපිටිය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන හා පරිපාලන තනතුරුවල පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා ඇති විදූර්ථීන්ගෙන් 2020.09.28 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා 2020.09.06 දින Sunday Observer පුවත්පත බලන්න.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.
2020.09.03

මහන යන්ත්‍ර අලුත්වැඩියා කාර්මික DIALTEX

කටුනායක වෙළඳ කලාපයේ පිහිටි ඩයල් ටෙක්ස් ඇඟලුම් කර්මාන්ත ශාලාව සඳහා පළපුරුදු මහන යන්ත්‍ර අලුත්වැඩියා කාර්මිකයින් අවශ්‍ය වේ.

ආකර්ශනීය වැටුප් / ආහාරපාන / ප්‍රවාහන පහසුකම් සහිතයි. සම්මුඛ පරීක්ෂණ සඳහා සියලු ලිපිලේඛන රැගෙන සතියේ දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා පහත ලිපිනයට පැමිණෙන්න.

වැඩි විස්තර සඳහා අමතන්න.
මානව සම්පත් කළමනාකරු
ඩයල් ටෙක්ස් පෞද්ගලික ආයතනය
කටුනායක ආයෝජනා ප්‍රවර්ධන කලාපය, කටුනායක.
011-2252447 / 2258293-4 / 0773222715

UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

විශ්වවිද්‍යාල රෝහල

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

පුරප්පාඩු

හෙද සොහොයුරි සහ හෙද නිලධාරි

(පැයකට ගෙවීමේ පදනම මත)

සුදුසුකම්:

හෙද සොහොයුරිය (I වන ශ්‍රේණියේ හෙද නිළධාරි)

i. I වන ශ්‍රේණියේ නිළධරයෙකු වීම.

සහ

ii. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව හදාරා ඉන් සමත් වූ නිලධරයෙකු වීම.

හෙද නිළධාරි

i. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව හෝ ගණිතය හෝ කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂය නිර්දේශය යටතේ එම විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

සහ

iii. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

iv. අවම වශයෙන් වසර පහක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

පොදු කොන්දේසි:

1. එක් පැයක් සඳහා සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ **2017.06.02** දිනැති චක්‍රලේඛ අංක **TA/G/PSM/13/2016** අනුව ගෙවීම් සිදුකරනු ලැබේ.

2. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2020.09.21** දිනට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කරන්න. ලියුම් කවරයේ ඉහල වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

3. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

4. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමුකරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. අයදුම්පත්‍ර සහ අදාළ අනෙකුත් විස්තර භාගත කිරීම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

www.kdu.ac.lk

දිනමිණ සිලුමින The Silumina ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

රත්මලාන කාර්මික දේපළක් විකිණීමට

(01) කර්මාන්ත ශාලාවකට / කාර්යාල සංකීර්ණයකට ඉහළ පරිමාණයේ දේපළ සංවර්ධනයකට යෝග්‍යයි.

(02) දේපළ ගාලු පාරට මීටර් 500 දුරින් තෙලවල පාරට මායිම්ව පිහිටි 738 ක ඉඩමකි.

(03) ඉඩමේ ව.අඩි. 58469 එකතුවක කාර්යාල ගොඩනැගිලි හා ගබඩා පහසුකම් ඇත.

(04) මිල සාකච්ඡා කරගත හැක.

අමතන්න - ධනුෂ්ක
ජංගම දුරකථනය : 076-6714333

BE BETTER INFORMED!

Dinamina | Daily News | Thinakaran

News you can trust now free on your mobile phone.

Visit - apps.lakehouse.lk

DOWNLOAD TODAY!



AVAILABLE AT

LAKE HOUSE

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

ප්‍රසම්පාදන දැන්වීම සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

01. ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුද මූලස්ථානය විසින් 2020 අගෝස්තු මස 09 දින පහත සඳහන් දෑ මිලදී ගැනීම සඳහා පළකරන ලද පුවත්පත් දැන්වීම හා සබැඳේ.

අනු අංකය	ටෙන්ඩර් අංකය	භාණ්ඩ නාමාවලිය	අවශ්‍ය ප්‍රමාණය	
	පහත දක්වා ඇති අංක 01 සිට 09 අයිතමයන් සඳහා ටෙන්ඩර් පත්‍රිකා			
	නිකුත් කරනු ලබන අවසාන දිනය 2020/09/08			
	ටෙන්ඩර් විවෘත කරන දිනය 2020/09/09 දින 1100 පැයට වන අතර, පසුව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකා භාරගනු නොලැබේ.			
01	1256	රෙදි කොටින් ඩ්‍රිල් තේවි බ්ලූ 58"/60"	මීටර්	175,000
02	1257	ජර්සි කොටන් සුදු අත්දිග	ගණනින්	20,000
03	1258	තුවා තාන සුදු	ගණනින්	10,412
04	1259	මේස් පොලියෙස්ටර් කොටින් රට වෙරළු පැහැති නිලධාරී මාදිලිය	යුවල්	38,000
05	1286	රෙදි කොටන් ඩ්‍රිල් බ්ලූ 58"/60"	මීටර්	20,000
06	1287	සංග්‍රාමික බැතියම් (රවුම් කර)	ගණනින්	150,000
07	1288	බැතියම් රට වෙරළු පැහැති (රවුම් කර)	ගණනින්	275,000
08	1289	මේස් පොලියෙස්ටර් කොටින් (ටෙරි) රට වෙරළු පැහැති	යුවල්	660,000
09	1290	ස්ටොකින්	ගණනින්	5,000

02. එම මිල දැන්වීමේ සඳහන් වගන්තිවලට අමතරව පහත සඳහන් වගන්තිද ඇතුළත් කරනු ලැබේ.

අ. මෙම මිලගණන් කැඳවීම දේශීය තරගකාරී මිල ගණන් කැඳවීම යන ක්‍රමය මගින් සිදුකරනු ලබයි.

ආ. මිල ගණන් පත් භාරගැනීම 2020 සැප්තැම්බර් මස 09 වැනි දින පෙ.ව. 1100 පැයට අවසන් වන අතර, ඊට පසු ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඇ. විස්තරාත්මක ලංසු තැබීමේ කොන්දේසි යුධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිකුත් කිරීමේ කවුළුවෙන් මිලදී ගත යුතු ප්‍රසම්පාදන ආකෘති පත්‍රයෙහි ඇතුළත් කර ඇත.

ඈ. අවශ්‍ය ලංසු ඇප බැඳුම්කර වටිනාකම එක් එක් අයිතමයන්හි ඇස්තමේන්තු වටිනාකම අනුව වෙන් වෙන්ව ලංසු ලේඛනයේ දක්වා ඇත.

ඉ. තෝරාගත් ජාත්‍යන්තර සැපයුම්කරුවන් වෙත ණයවර ලිපි මගින්ද, තෝරාගත් දේශීය සැපයුම්කරුවන් වෙත ණය පදනම මත චෙක්පත් මගින්ද සතුටුදයක ලෙස භාණ්ඩ මිලදී ගැනීමෙන් පසු ගෙවනු ලබයි.

වැඩි විස්තර සඳහා දුරකථන අංක : 011 2987537, 011 2987532, 011 2987534

යුද්ධ හමුදාධිපති
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

SriLankan Catering

ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනය

ශ්‍රීලංකන් කේටරින් සමාගමේ උද්‍යාන නඩත්තු සේවා සඳහා

SLC/PRO/SER/2020/013

ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් 2020/2022 වර්ෂය සඳහා උද්‍යාන නඩත්තු සේවා සැපයීම සඳහා මුද්‍රා තබන ලද ලංසු ඉදිරිපත් කරන මෙන් සුදුසු ලංසුකරුවන් වෙත මෙයින් ආරාධනය කර සිටී. ලංසු ලියවිලි ශ්‍රීලංකන් කේටරින් සමාගමේ නිල වෙබ් අඩවියේ ප්‍රචාරණය කරනු ලැබේ.

ලංසු ලියවිලි සහ වැඩිදුර විස්තර 2020 සැප්තැම්බර් 08 දින සිට http://www.srilankancatering.com/procurement-notices යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

මුද්‍රා තබන ලද ලංසු 2020 සැප්තැම්බර් 22 දින ප.ව.12.30ට පෙර ශ්‍රීලංකන් කේටරින් සමාගමේ ප්‍රධාන විධායක නිළධාරි වෙත භාරදිය යුතුය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සම්බන්ධයෙන් වැඩිදුර විස්තර,

තිළිණ thilina.siriwardana@srilankancatering.com හෝ 0197334241

රොහාන්- rohan.silva@srilankancatering.com හෝ 0197334140 තුළින් ලබාගත හැකිය.

ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රීලංකන් කේටරින් සමාගම,
ගුවන්සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක, ශ්‍රී ලංකාව.

සිළුමිණ The Silumina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

අඩු මිලට බෙඩ් ෂීට් ලස්සන ඩිසයින් වලින් ඩබල් බෙඩ් ෂීට් අපේ මිල රු.290/-යි වෙළඳපළේ මිල රු.600/-යි, ඩබල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.390/-යි වෙළඳපළේ මිල රු.800/-යි, ට්‍රිපල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.490/-යි වෙළඳපළ මිල රු.950/-යි, තවත් බෙඩ් ෂීට් වර්ග 70ක්, තුවා, ලේන්සු, සරොන්, නයිට්ඩ්‍රස්, පාසල් ළමුන්ගේ මේස් රු.40/-, Cotton මේස් රු.90/-, සර්වියට් රු.30/- සිට, කොට්ට රු.350/- සිට, මෙට්ට කවර 3x6- රු.490/-, 4x6-රු.590/-, 5x6-රු.690/-, 6x6-රු.790/-, තොග මිලට ලබා ගත හැක
සැමිරිච්චා ක්ලෝතින් අවුට්ලට් ගුරුගේ නේචර් පාර්ක් අසල, ජා-ඇල.
0771 964 341 / 0117 902 278

ලංසු කැඳවීම

අංක LPA/06/2020

ලේක්හවුස් ආපනශාලාව

සේවකයින් 1500 කට පමණ ආහාරපාන සපයනු ලබන ලේක්හවුස් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පළපුරුදු ආපනශාලාකරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

ආපනශාලාව භාවිත කරන සංඛ්‍යාව රඳා පවතින්නේ, ආපනශාලාකරුවන් විසින් සපයනු ලබන සේවාවේ ගුණාත්මකභාවය මතය.

ආපනශාලාව දිවා රාත්‍රී විවෘතව තැබෙන අතර, (පැය 24) තෝරාගනු ලබන ආපනශාලාකරු විසින් තත්ත්වයෙන් උසස් ගුණාත්මක බවින් යුත් ආහාරපාන නියම කරන ලද මිලට සැපයීම කළ යුතු වනු ඇත.

මුළුතැන්ගෙයි උපකරණ, ආපනශාලාවේ ගෘහ භාණ්ඩ, විදුලිය, ජලය සහ මාසයකට (කි.ග්‍රෑ. 37.5) ගෑස් සිලින්ඩර් 20 ක් බැගින් නොමිලේ සපයනු ලබන අතර, කුලී අයකරනු නොලැබේ.

ලංසු අයදුම්පත්‍ර සහ කොන්දේසි 2020 **සැප්තැම්බර්** 07 **සිට** 18 **දින තෙක්** සතියේ දිනවල **පෙ.ව.** 9.00 **සිට ප.ව.** 3.30 **දක්වා** ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවෙන් රු. 5000/- ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් හා **රු.** 1000/- **ක** ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීම මත ලබාගැනීමට පුළුවන.

සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා, මුද්‍රා තබන ලද ලිපි කවරයක ඇතුළත් කර **"ආපනශාලාව සඳහා ලංසු කැඳවීම" යනුවෙන් ලිපි කවරයේ ඉහළ වම් කෙළවර සළකුණු කොට ප්‍රධානි - ප්‍රසම්පාදන, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම"**, යනුවෙන් යොමුකොට 2020 **සැතැම්බර්** 21 **ප.ව.** 2.30 **ට** ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

2020 **සැප්තැම්බර්** 21 **දින ප.ව.** 2.30**ට** ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ දී ලංසු විවෘත කරනු ලැබේ.

කෙසේ වෙතත් කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම ලංසුපතක් හෝ සියලුම ලංසුපත් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සතුය.

LAKE HOUSE

ප්‍රධානි - ප්‍රසම්පාදන
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
අංක. 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.
දුර.ක. 2429422, 2429451.

21 වැනි සියවසට එළඹෙන යෞවනයට
නිරවුල් ගමන් මග
ඉදුසරණ

මහජනතාව වෙත දැනුම් දීමයි

B. ර්වොන් නිලුෂිකා පිසාන්ති
(NIC: 797450291V)

විරසිංහ මුදියන්සේලාගේ චමින්ද සම්පත් බණ්ඩාර
(NIC: 771742920V)

අධිකාරි අප්පුහාමිලාගේ අනුෂා දමයන්ති
(NIC: 795983350V)

ඉහත ඡායාරූපවල දැක්වෙන අය තව දුරටත් අප ආයතනයේ සේවකයන් ලෙස කටයුතු නොකරන බවත්, වහාම බලපැවැත්වෙන පරිදි ඔවුන් සමග කෙරෙන කිසිදු ගණුදෙනුවකට හෝ ව්‍යාපාර කටයුත්තකට අප ආයතනය කිසිදු වගකීමක් භාර නොගන්නා බවත්, සියළු මහජනතාව වෙත සහ අපගේ ගණුදෙනුකාර හවතුන් වෙත මෙමගින් දැනුම් දෙනු ලැබේ.

ස්ටාර් ග්‍රැනයිට් (පුද්) සමාගම
දිවුලපිටිය පාර, බෝට්යාවත්ත, මිනුවන්ගොඩ

මිල ගණන් කැඳවීමයි

නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

සී/ස ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ (පෞද්ගලික) සමාගම

නිනිති තාක්ෂණ හා විද්‍යා උද්‍යානයෙහි ස්ථාපිත නිනිති තාක්ෂණ විශිෂ්ටත්ව මධ්‍යස්ථානයේ අදියර 1B සඳහා ගොඩනැගිලි කළමනාකරණ පද්ධතියක් සැපයීම, සවි කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සහ දෝෂ සඳහා පිළියම් යෙදීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමේ ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් අංක : MSTR/TRD/SLINTEC/15-02

i. නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටු සභාපති විසින්, යෝග්‍ය හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ මුද්‍ර, තැබූ මිල ගණන් කැඳවනු ලබන අතර, බදු රහිත ඇස්තමේන්තුගත පිරිවැය රු.36,000,000.00 හා ඉදිකිරීම් කාලසීමාව කැලැන්ඩර් දින 119 ක් වේ.

ii. මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු පිණිස අදාළ සාර්ථක ලංසුකරු,
   i. අසාධු ලේඛනගත වී නොසිටිය යුතුය ; සහ
   ii. පහත අයිතම iii හි සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.
   iii. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

අවශ්‍යතාවය	සීමාව
පූර්ව පළපුරුද්ද	පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව ඇතුළත රු.මිලියන 30.00ක් හෝ ඊට ඉහළ වටිනාකමකින් යුක්ත වූ ස්වභාවයෙන් හා සංකීර්ණත්වයෙන් මේ හා සමානත්වයක් දක්වන ගොඩනැගිලි කළමනාකරණ පද්ධතියක් සැපයීමේ හා සවිකිරීමේ කාර්යයන් ඇතුළත් අවම වශයෙන් එක් ව්‍යාපෘතියක් (හෝ රුපියල් මිලියන 30.00 ක මුළු වටිනාකමෙන් යුතු වූ ව්‍යාපෘති තුනක උපරිමයක්) හෝ සම්පූර්ණ කර තිබිය යුතුවීම.
සාමාන්‍ය වාර්ෂික ධාරිතාව	පසුගිය වසර තුන තුළ රු.මිලියන 50 ක අවමයක්
වැට් බදු	එකතු කළ අගය මත බද්ද (VAT) එකතු කර ගැනීම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.
1987 අංක 03 දරන රාජ්‍ය කොන්ත්‍රාත් පනත	මෙම ලංසුව සඳහා ලියාපදිංචි වී තිබිය යුතුය.

iv. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, දුරකථන අංක 011-4650504 සහ ෆැක්ස් අංක 011-4650532 සහ විද්‍යුත් තැපැල sunandag@slintec.lk හරහා **තාක්ෂණික සේවා සහ යටිතල කළමනාකරණ ප්‍රධානී, ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය, පිටිපන, හෝමාගම** හා සම්බන්ධවීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීමට හැකි අතර, 2020 සැප්තැම්බර් මස 07 සිට 2020 සැප්තැම්බර් 21 දක්වා දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව 3.30 දක්වා කාලසීමාව තුළ පහත සඳහන් ලිපිනයේ දී ලංසු ලේඛන පරීක්ෂා කළ හැක.

v. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් 2020 සැප්තැම්බර් මස 07 දින සිට 2020 සැප්තැම්බර් මස 21 දින දක්වා දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව.3.30 දක්වා කාලසීමාව තුළ ප්‍රධාන ගණකාධිකාරී, නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන හා පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය, තුන් වන මහල, සෙත්සිරිපාය, 1 අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රුපියල් දස දහසක (රු.10,000.00) නැවත නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවීම හරහා ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරනු ලැබූ සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.මේ සඳහා ගෙවීම් කිරීම සිදුකළ යුත්තේ මුදල් වලින් පමණි.

vi. ලංසු ලේඛන ලබාගත්තා අවස්ථාවේදී සියලු චිත්‍රණ සටහන්හි ඩිජිටල් දත්තයන් මෙම නිශ්චිත ව්‍යාපෘතිය සඳහා පමණක් භාවිතයට ගනු ලබන බවට ලිඛිතව සහතික වීමට ලංසුකරුවන්ට සිදුවනු ඇත.

vii. පිටපත් දෙකකින් යුක්තව සකස් කරනු ලැබූ ලංසු (මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන්ව හා පැහැදිලිව සටහන් කර වෙන් වෙන්ව මුද්‍ර, තබනු ලැබූ) 2020 ඔක්තෝබර් 05 දින පෙ.ව.11.30 ට හෝ ඊට පෙර **ප්‍රධාන ගණකාධිකාරී, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය, තුන්වන මහල, සෙත්සිරිපාය, 1 අදියර, බත්තරමුල්ල** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.ලංසුව භාරගත්තා වෙලාව ඉක්ම වූ වහාම ලංසු විවෘත කිරීම සඳහා සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී, ලංසුව විවෘත කෙරෙනු ඇත.

viii. මෙම ලංසුව 2021පෙබරවාරි 01 දින දක්වා වලංගු විය යුතුය.

ix. රුපියල් පන් ලක්ෂ හතළිස් දහසක (රු.540,000.00) ලංසු සුරක්ෂණයක් සහිතව සියලු ලංසු ලේඛන ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය 2021 මාර්තු 01 දක්වා වලංගු විය යුතුය.

x. හෝමාගම, පිටිපන ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනයේ ශ්‍රවණාගාරයේ දී 2020 සැප්තැම්බර් 15 දින ප.ව 2.30 ට පූර්ව ලංසු හමුවක් පැවැත්වෙනු ඇත.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය,
තුන්වන මහල, සෙත්සිරිපාය, අදියර 1,
බත්තරමුල්ල.

සෞඛ්‍ය අමාත්‍යාංශය

ජාතික පෝෂණ ප්‍රතිපත්තිය 2020 - 2030 පිළිබඳ කෙටුම්පත

ඉහත ප්‍රතිපත්ති කෙටුම්පත මාසයක කාලයක් සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි මහජන අදහස් සඳහා විවෘතව පවතී.

මෙම කෙටුම්පත ගැන ඔබට යම් අදහසක් හෝ පැමිණිල්ලක් තිබේ නම් කරුණාකර සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අංශයට දන්වන්න.

අධ්‍යක්ෂ,
පෝෂණ අංශය,
555/5, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථන අංක : 011-2368320

ෆැක්ස් අංකය : 011-2368320

විද්‍යුත් ලිපිනය : nutritiondivisiongov@gmail.com

ඉහත ප්‍රතිපත්ති කෙටුම්පත පහත වෙබ් ලිපිනයෙන් බාගත කළ හැක.

http://www.health.gov.lk/moh final/english/public/elfinder/files/publications/publishpolicy/2020/NNP-2020-30-S.pdf

කුරුණෑගල ව්‍යාපාරික ස්ථානයක් වහාම විකිණීමට ඇත

පර්චස් 46.8 විශාලත්වයෙන් යුත්, වර්තමානයේ ගබඩාවක් ලෙස පවත්වාගෙන යන, වෙළඳ ගොඩනැගිල්ලකි.

ලිපිනය: අංක 107, උතුරු වටරවුම් පාර, (උඩවල්පොල පාර) කුරුණෑගල.
අමතන්න : 0117640451
0768894519

CargillsBank
BANKING ON THE HUMAN SPIRIT
කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්

කෙන්ගල්ල - කුන්ඩසාලේ පදිංචියට හෝ ව්‍යාපාරයකට සුදුසු ඉඩමක් වහාම විකිණීමට ඇත.

දිගන කර්මාන්ත පුරයට,ගොල්ෆ් ලින්ක් සහ පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයට සමීපව, පර්චස් 185 ක ඉඩම.

මෙම සම්පූර්ණ ඉඩම විකිණීමට ඇත.

ලිපිනය: කුරුවෙකොටුව වත්ත, සහ අඹගහවත්ත.

අමතන්න : 0117640451
0768894519

CargillsBank
BANKING ON THE HUMAN SPIRIT
කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

අභිලාෂය ප්‍රකාශ කිරීම් සඳහා ආරාධනය

නියාමනය හඳුන්වා දුන් පසු යම් කර්මාන්තයක පාර්ශ්වකරුවන්ට ඇතිවිය හැකි බලපෑම, නියාමනය හඳුන්වාදීමට පෙර, විශ්ලේෂණය කිරීමට මාර්ගෝපදේශයක් සැකසීම

මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් හඳුන්වාදීමට නියමිත කිසියම් නියාමන ක්‍රියාවලිය හඳුන්වා දීමෙන් පසු යම් කර්මාන්තයක පාර්ශ්වකරුවන්ට සිදුවිය හැකි බලපෑම, නියාමනය හඳුන්වාදීමට පෙර විශ්ලේෂණය කිරීමට ක්‍රියාපටිපාටියක් (මාර්ගෝපදේශයක්) සකස් කිරීමේ ක්‍රියාවලියට සහයවීමට සහ එම ක්‍රියාපටිපාටිය ක්‍රියාවට නැංවීම සඳහා කොමිෂන් සභාවට සහයවීමට සුදුසුකම්ලත් පාර්ශ්වකරුවන්ගෙන් අභිලාෂයන් මෙසේ කැඳවනු ලැබේ.

අභිලාෂ ප්‍රකාශ කිරීම් ඉදිරිපත්කිරීම සඳහා පරිශීලනය කළ යුතු මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් බාගත හැකිය. (www.pucsl.gov.lk)

අභිලාෂයන් 2020 සැප්තැම්බර් 21 පස්වරු 3.00 ට පෙර ඉදිරිපත් කළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව,
6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුලුන,
අංක 28, සාන්ත මයිකල් පාර, කොළඹ 3

දුරකථන : + 94-112392607/8 ෆැක්ස් : +94-112392641
ඊමේල් : regulate@pucsl.gov.lk
පිටපත් pucsl.regulate@gmail.com

දිනය : 2020.09.06

බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය

ප්‍රසම්පාදන දැන්වීමයි

අවන්හලක් සඳහා සේවාව සැපයීම

කොළඹ 07,ස්ටැන්ලි විජේසුන්දර මාවතෙහි අංක 275/74 දරන ස්ථානයෙහි පිහිටි බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පරිශ්‍රයේ වර්ග අඩි 1840 ක භූමි ප්‍රමාණයක් කේන්ද්‍ර කර ගනිමින් අවන්හලක් ආරම්භ කිරීම සඳහා සුදුසුකම්ලත් ලියාපදිංචි පළපුරුදු ආයතන හි පුද්ගලයන් වෙතින් මුදු, තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

ආපසු නොගෙවන රු.1,000.00 ක ප්‍රසම්පාදන ගාස්තුවක් රු.5,000.00 වූ ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පත් මුදලක් ලංකා බැංකුවේ බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරියේ **ජංගම ගිණුම් අංක 71005744** ගිණුමට බැරකොට අදාළ රසිදිපත සෞන්දර්ය නිකේතනයෙහි කර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2020.09.07 දින සිට 2020.09.18 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.2.00 අතර කාලය තුළ ලංසුපත් ලබා ගත හැකිය.

සම්පූර්ණ කරන ලද ලංසුපත් 2020.09.18 දින ප.ව.2.30 හෝ ඊට පෙර ලැබෙන ලෙස **සභාපති,සෞන්දර්ය නිකේතනය (බස්නාහිර පළාත) අංක 275/74, ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07** යන ලිපිනයට තිසිලෙස මුදු, තබා ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම කළ හැක. ලංසුපත් සහිත කවරයේ වම්පස ඉහළ කෙළවර "අවන්හල සඳහා ලංසුපත්"යනුවෙන් සඳහන් කළ යුතුය.

සභාපති,
සෞන්දර්ය නිකේතනය (බ.ප.)
275/74,ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ 07.

ප්‍රසම්පාදන දැන්වීම

2021 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාවර මිල ක්‍රමය යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත භාණ්ඩ හා සේවා ලබාගැනීම.

01. ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2021 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ස්ථාවර මිල ක්‍රමය මත පහත සඳහන් සැපයුම් හා සේවා සඳහා යෝග්‍යතාපූර්ණ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා සබන ලද ලංසු සැඳවනු ලැබේ.

අනු අංක.	ටෙන්ඩර් අනන්‍යතා අංකය	විස්තරය	ටෙන්ඩර් නිකුත් කිරීමේ දිනය	ටෙන්ඩර් අවසන්වන දිනය හා වේලාව	ආපසු නොගෙවනු ලබන මුදල (රු.)
1	AHQ/20/PUB/B&CE/1001	තීන්ත	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	6,000.00
2	AHQ/20/PUB/B&CE/1002	කම්බි ඇණ / ස්කුරුප්පු ඇණ, J සහ L කොකු සහ වීවටි ඇණ	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	3,500.00
3	AHQ/20/PUB/B&CE/1003	ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	3,500.00
4	AHQ/20/PUB/B&CE/1004	උසර වානේ කම්බි සහ මිදු වානේ කම්බි Rib Steel & Mild Steel Rod	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	6,000.00
5	AHQ/20/PUB/B&CE/1005	රසායනික හා ජල රෝධක ද්‍රව්‍ය (Chemical and Water Proofing Materials)	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	2,000.00
6	AHQ/20/PUB/B&CE/1006	GI පයිප්ප වර්ග	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	2,000.00
7	AHQ/20/PUB/B&CE/1007	තාර	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	2,000.00
8	AHQ/20/PUB/B&CE/1008	සනීපාරක්ෂක උපාංග	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
9	AHQ/20/PUB/B&CE/1009	ඇස්බැස්ටස් තහඩු	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	2,000.00
10	AHQ/20/PUB/B&CE/1010	පී.අයි.(GI) තහඩු / ඇලුමිනියම් තහඩු / වර්ණ ගැල්වූ තහඩු වර්ග	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
11	AHQ/20/PUB/B&CE/1011	දැව වර්ග	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	3,500.00
12	AHQ/20/PUB/B&CE/1012	විවිධ වූ ද්‍රව්‍ය (Miscellaneous Items)	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	6,000.00
13	AHQ/20/PUB/B&CE/1013	ඇලුමිනියම් කෙරවුම් අයිතමයන්	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	3,500.00
14	AHQ/20/PUB/B&CE/1014	යකඩ හා වානේ Angle Iron, Flat Iron, Box Iron, "C" Channel & MS Plate	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
15	AHQ/20/PUB/B&CE/1015	ගැල්වනයිස්ඩ් ෂීට් සහ ගැල්වනයිස්ඩ් දොරවල්	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
16	AHQ/20/PUB/B&CE/1016	ජල නල උපාංග (Plumbing Items)	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	3,500.00
17	AHQ/20/PUB/B&CE/1017	වාහන තීන්ත සහ තීන්ත ආශ්‍රිත ද්‍රව්‍ය	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	6,000.00
18	AHQ/20/PUB/B&CE/1018	මෙලමයින් බෝඩ් සහ උපාංග	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
19	AHQ/20/PUB/M&E/1001	විදුලි පංකා	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	2,000.00
20	AHQ/20/PUB/M&E/1002	GI පයිප්ප උපාංග	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	2,000.00
21	AHQ/20/PUB/M&E/1003	වායුසමීකරණ අමතර සොටස්	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	2,000.00
22	AHQ/20/PUB/M&E/1004	වෙල්ඩින් සූරු වර්ග	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	2,000.00
23	AHQ/20/PUB/M&E/1005	ගන්ඩියුට් බට හා උපාංග	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	2,000.00
24	AHQ/20/PUB/M&E/1006	විදුලි අයිතම	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	2,000.00
25	AHQ/20/PUB/M&E/1007	වයර් සහ කේබල් වර්ග	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	3,500.00
26	AHQ/20/PUB/M&E/1008	විදුලි අයිතම (Switch Gears)	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	2,000.00
27	AHQ/20/PUB/M&E/1009	විදුලි අයිතම (Switches)	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	2,000.00
28	AHQ/20/PUB/M&E/1010	විදුලි ග්‍රාම්පු හා උපාංග	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	2,000.00
29	AHQ/20/PUB/D/1001	තෙල් සහ ග්‍රීසිඩ් තෙල්	2020 සැප්තැම්බර් 11	2020 ඔක්තොම්බර් 02 දින පස 10.30	3,500.00
30	AHQ/20/PUB/D/1002	පොලිෂ් සහ වැක්ස්	2020 සැප්තැම්බර් 11	2020 ඔක්තොම්බර් 02 දින පස 10.30	3,500.00
31	AHQ/20/PUB/D/1003	පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය	2020 සැප්තැම්බර් 11	2020 ඔක්තොම්බර් 02 දින පස 10.30	6,000.00
32	AHQ/20/PUB/D/1004	Fabric අමු ද්‍රව්‍ය	2020 සැප්තැම්බර් 11	2020 ඔක්තොම්බර් 02 දින පස 10.30	3,500.00
33	AHQ/20/PUB/BRK/1004	බිර රෙදි හා උපාංග	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	3,500.00
34	AHQ/20/PUB/BRK/1005	බුමු කුරුණු (Loop Pile/ Cut Pile) සහ උපාංග	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	2,000.00
35	AHQ/20/PUB/MIS/1003	නිල ඇඳුම් සහ රෙදිපිළි මේපිම සහ ඩ්‍රයික්ලීන් කිරීම	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	2,000.00
36	AHQ/20/PUB/MIS/1004	අශ්වයින් සඳහා ආහාර	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	2,000.00
37	AHQ/20/PUB/MIS/1005	සුනඛයින් සඳහා ආහාර	2020 සැප්තැම්බර් 03	2020 සැප්තැම්බර් 23 දින පස 10.30	6,000.00
38	AHQ/20/PUB/MIS/1006	කොළඹ සහ දියතලාව ගුවන් හමුදා රෝහල් සඳහා පූර්ණ පවිත්‍රතා සේවය ලබා ගැනීම	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
39	AHQ/20/PUB/ST/1001	මුද්‍රණ ද්‍රව්‍ය	2020 සැප්තැම්බර් 11	2020 ඔක්තොම්බර් 02 දින පස 10.30	2,000.00
40	AHQ/20/PUB/ST/1002	ලිපි ද්‍රව්‍ය	2020 සැප්තැම්බර් 11	2020 ඔක්තොම්බර් 02 දින පස 10.30	2,000.00
41	AHQ/20/PUB/MT/1003	වාහන ටයර්, ට්‍යුබ් සහ ටයර් කොලර්	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	6,000.00
42	AHQ/20/PUB/E/1005	වාහන බැටරි	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
43	AHQ/20/PUB/E/1006	කාර්මික, වෛද්‍ය සහ බැහුන් වායු වර්ග	2020 සැප්තැම්බර් 04	2020 සැප්තැම්බර් 24 දින පස 10.30	3,500.00
44	AHQ/20/PUB/DEN/1001	දන්ත වෛද්‍ය ද්‍රව්‍ය	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	2,000.00
45	AHQ/20/PUB/MED/1001	කෘමිනාශන	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 28 දින පස 10.30	3,500.00
46	AHQ/20/PUB/MED/1002	හදිසි වෛද්‍ය උපකරණ	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	2,000.00
47	AHQ/20/PUB/MED/1005	ඖෂධ හා වෛද්‍ය උපකරණ	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	3,500.00
48	AHQ/20/PUB/MED/1006	ඇස් කණ්ණාඩි සාච	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	2,000.00
49	AHQ/20/PUB/MED/1007	රසායනාගාර අයිතම	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	3,500.00
50	AHQ/20/PUB/MT/1001	වාහන ඇන්ජින් සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරීම (Engine overhaul)	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	6,000.00
51	AHQ/20/PUB/MT/1002	වාහන ඇන්ජින් නැවත සැකසීම (Engine Rework)	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	3,500.00
52	AHQ/20/PUB/MED/1003	විකලාංග සැත්කම් සඳහා අවශ්‍ය වන වෛද්‍ය උපකරණ කුලියට ලබාගැනීම.	2020 සැප්තැම්බර් 09	2020 සැප්තැම්බර් 29 දින පස 10.30	2,000.00
53	AHQ/20/PUB/MED/1004	CT සහ Coronary Angiogram සේවය ලබාගැනීම.	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	2,000.00
54	AHQ/20/PUB/MED/1008	පෙදේශීය අංශයේ රෝහල් වෙතින් හදිසි වෛද්‍ය පරීක්ෂණ සිදුකර ගැනීම.	2020 සැප්තැම්බර් 10	2020 සැප්තැම්බර් 30 දින පස 10.30	3,500.00

02. ලංසු සැඳවීම ජාතික ලංසුකරණ පටිපාටිය අනුව සිදුකෙරෙන අතර පළමු ඡේදයේ සඳහන් අනු අංක 50 සිට 54 දක්වා ඇති ප්‍රසම්පාදන සඳහා ද්විත්ව මුද්‍රිත කවර ක්‍රමය භාවිතා කළ යුතු වේ. තවද 2020 සැප්තැම්බර් මස 02 වන දින ඩේලිනිවිස් සහ දිනමිණ පුවත්පත්වල පළවූ දැන්වීමේ පළමු ඡේදයේ අනු අංක 29, 30, 31, 32, 39, 40 යන ප්‍රසම්පාදනයන්ගේ ටෙන්ඩර් විවෘත කිරීමේ දිනය 2020 ඔක්තෝම්බර් මස 02 ලෙස සංශෝධනය විය යුතුය.

03. මෙම ප්‍රසම්පාදන පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ශ්‍රී ලංකා ගුවන් හමුදා www.airforce.lk වෙබ් අඩවියෙහි පළකර ඇති ලංසු ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත පළමු ඡේදයේ සඳහන් පරිදි ලංසු භාරගත් දින සිට වැඩකරන දිනවලදී **1000 පසේ** සිට **1300 පස** දක්වා කාලය තුළ එක් එක් ප්‍රසම්පාදනයන් අවසන් වන දිනට පෙර නැවත නොගෙවනු ලබන ලංසු ගාස්තු, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ සරත් අංශයට ගෙවීමෙන් පසු ලැබෙන ලදුපත ප්‍රසම්පාදන අංශයට ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු පත්‍රයක් ලබාගත හැක. ගෙවීම් සිදුකිරීමෙන් පොරොව් එවනු ලබන ලංසු භාරගනු නොලබන අතර ලංසු ගාස්තු ගෙවීමෙන් පසු ලැබෙන ලදුපත ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී ලංසු ලේඛනයට අමුණා තිබිය යුතුය.

04. නිසැලෙස සම්පූර්ණකර **මිටපත් දෙකකින්** යුක්තව මුද්‍රා තබන ලද ලංසු නියමිත දිනට හා වේලාවට පෙර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයෙහිම පිහිටි ප්‍රධාන ආරක්ෂක මැදිරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ද බහාලීම කළ හැක. පමාවී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එසේ ලංසු විවෘත කරනු ලැබේ. ජාතික හැඳුනුම්පත සහ සේවයාගේ ඛලය පැවරුම් ලිපියක් ඉදිරිපත්කිරීම මත ටෙන්ඩරකරුවන්ට හෝ ඔවුන්ගේ බලලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ. ලංසු විවෘත කරන වේලාවට පසුව පැමිණෙන කිසිදු ටෙන්ඩරකරුවකුට හෝ ඔවුන්ගේ නියෝජිතයකුට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි විය නොහැක.

05. එක් එක් ලංසු මියරිමි තුළ ප්‍රසම්පාදනයට අදාළ විශේෂ කොන්දේසි සහ භාණ්ඩ / සේවා ලැයිස්තුගත කර ඇති අතර, සැපයුම් හා සේවාවන් වෙනුවෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලැයිස්තුගතකර තිබෙන අයිතමයන්/ සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් සපයා ඇති මිල ලේඛනයෙහි (Price Schedule) පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කළ මිල ගණන් **2021 දෙසැම්බර් 31** වන දින දක්වා වලංගු විය යුතු අතර කිසිම හේතුවක් මත වෙනස් නොවිය යුතුය.

06. රෙදිපිළි සේදීම හා ඩ්‍රයික්ලීන් කිරීම, කාර්මික වායු, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ අශ්ව ආහාර යන සැපයුම්/ සේවාවන් ලබාදීම පමණක් ලැයිස්තු ගතකොට ඇති ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු වලට සැපයිය යුතු අතර, එක් එක් කඳවුරු වෙත කරනු ලබන සැපයීම් වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සැලකිල්ලට ගෙන ලංසු ඉදිරිපත් කළ යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේදී අදාළ කඳවුරේ නම, අදාළ ලංසුවල සහ මුද්‍රා තබන ලද ලිපිකවරයෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. කීට අමතරව අනෙකුත් සියලුම සැපයුම්/ සේවා ප්‍රසම්පාදන වල අයිතමයන් සැපයීම කළ යුත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුනායක කඳවුරට වේ. ලංසුකරුවන් තමන්ගේ සියලු වියදම්, වැට් සහ අනෙකුත් බදු ද ඇතුලත් කර තම මිල ගණන් ඉදිරිපත් කිරීමට වගබලාගත යුතුය.

ගොඩනැගිලි ද්‍රව්‍ය
කොළඹ, TTS වීතල, කටුනායක, බණ්ඩාරනායක ජාතාන්තර ගුවන් තොටුපොළ - කටුනායක, රත්මලාන, කටුකුරුන්ද, පලාලි, මීරිගම, අනුරාධපුර, හිඟුරක්ගොඩ, සීගිරිය, කොග්ගල, දියතලාව, පිදුරුතලාගල, වීරවිල, වව්නියාව, අම්පාර, මඩකලපුව, වීන වරාය, RTS වන්නි, මොරවැව, පාලවී - (පුත්තලම්), ඉරණමඩු, මුලතිව්, DSCSC බටලන්ද.

ඇඳුම් සහ රෙදිපිළි ඇපිල්ලීම
කටුනායක, රත්මලාන, අනුරාධපුරය, වීන වරාය, හිඟුරක්ගොඩ, කොළඹ, TTS වීතල, මඩකලපුව, පලාලි, අම්පාර, මොරවැව, වීරවිල, සීගිරිය, කොග්ගල, කටුකුරුන්ද, පාලවී (පුත්තලම්), බණ්ඩාරනායක ජාතාන්තර ගුවන් තොටුපොළ - කටුනායක, මීරිගම, RTS වන්නි, ඉරණමඩු සහ මුලතිව්.

කාර්මික වායු
කටුනායක, රත්මලාන, අනුරාධපුර, හිඟුරක්ගොඩ සහ වීන වරාය.

සුනඛ ආහාර
ගුවන් හමුදා කඳවුර - කටුනායක

අශ්ව ආහාර
කටන් පුහුණු පාසල - දියතලාව

07. මේ පිළිබඳ වැඩිදුර විස්තර පහත දුරකථන අංක වලට අදාළ බලධාරීන් ඇමතීමෙන් ලබාගත හැක. ප්‍රධාන ප්‍රසම්පාදන බලධාරී - දුරකථන - 011-2325468 හෝ ප්‍රසම්පාදන බලධාරී (ටෙන්ඩර්) 011-2441553 හෝ 011-2441044 දිගුව 23569 අංක 140, සර් චාල්ස්මිපලුම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 2 හි පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදාව (ෆැක්ස් අංක: 011-2441553 සහ 011-2347694)

08. ඉහත සියලු කරුණු සඳහා පහත දැක්වෙන ලිපිනය භාවිතා කළ හැක.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව
අංක 140,
සර් චාල්ස්මිපලුම් ඒ ගාඩිනර් මාවත,

ගුවන් හමුදා මූලස්ථානය
තැ.පෙ. 1592,
කොළඹ 2.

ගුවන් හමුදාධිපති

www.adz.lk
it's what you want

ටෙන්ඩර් කැඳවීම

වාහන සේවා කිරීම - 2021 වසර

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

යුද්ධ හමුදාව සතු වාහන 2021 වසර තුළදී ණය පදනම මත සේවා කිරීම සඳහා මිල ගණන් පත් කැඳවනු ලැබේ.

කොන්දේසි :

01. යුද්ධ හමුද වාහන සේවා කිරීමේ කාලසීමාව 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා වේ. මේ සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගණන් 2021 සම්පූර්ණ වර්ෂය සඳහාම වලංගු වී යුතු අතර, එම මිල ගණන් අදළ කාලසීමාව තුළදී කිසිදු අයුරකින් වෙනස් කළ නොහැක.

02. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ සහ 2002.09.30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයට අනුව වැට් යටතේ ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි අංකයද හා ඔබ ආයතනය මේ වන විට සක්‍රියව වැට් බදු ගෙවන බවට දේශීය ආදයම් කොමසාරිස් ජනරාල් වෙතින් ලබාගත් ලිපියක්ද, වැට් සඳහා ලියාපදිංචි වී නොමැති නම් ඒ සඳහා දේශීය ආදයම් කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් සහතිකයද ටෙන්ඩර් පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතු වේ.

03. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී අදළ ප්‍රදේශය තුළ පිහිටි සේවා ස්ථානයක් වෙතින් පහත සඳහන් මූලස්ථානයන්හි ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතු වේ.

මිල ගණන්පත් ඉදිරිපත් කළ යුතු ස්ථානයන්

(අ)	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති, යුද්ධ හමුද කඳවුර, සෙලින්කෝ ගොඩනැගිල්ල, අංක 167/30. අව්ස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත	- කොළඹ ආර්ථික කොමිෂන් බලප්‍රදේශය තුළ පිහිටි සේවා ස්ථානයන්
(ආ)	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය), යුහ කඳවුර, පලාලි	- යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි සේවා ස්ථානයන්
(ඇ)	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි), යුහ කඳවුර, වව්නියාව	- අනුරාධපුරය, වව්නියාව, මන්නාරම හා පුත්තලම, දිස්ත්‍රික්කයන් තුළ පිහිටි සේවා ස්ථානයන්
(ඈ)	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (තැගෙනහිර), යුහ කඳවුර, වැලිකන්ද	- පොළොන්නරුව, මඩකලපුව, අම්පාර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන් තුළ සහ දඹුල්ල, නාඋල නගර අවට පිහිටි සේවා ස්ථානයන්
(ඉ)	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි), යුහ කඳවුර, කිලිනොච්චිය	- කිලිනොච්චි දිස්ත්‍රික්කයන් තුළ පිහිටි සේවා ස්ථානයන්
(ඊ)	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්), යුහ කඳවුර, නන්දිකඩාල්, මුලතිව්	- මුලතිව් දිස්ත්‍රික්කය තුළ පිහිටි සේවා ස්ථානයන්
(උ)	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර), යුධ හමුද ජනපදය, පනාගොඩ, හෝමාගම.	- කොළඹ (මහා කොළඹ ආර්ථික කොමිෂන් බලප්‍රදේශ හැර) කෑගල්ල, ගම්පහ, කළුතර, රත්නපුර, පුත්තලම, කුරුණෑගල, ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයන් තුළ පිහිටි සේවා ස්ථානයන්.
(ඌ)	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම), යුහ කඳවුර, දියතලාව	- මහනුවර, මාතලේ, බදුල්ල, නුවරඑළිය, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන් තුළ පිහිටි සේවා ස්ථානයන්.

04. ඒ ඒ වාහන කාණ්ඩයන් වෙනුවෙන් එක් වාහනයක් සේවා කිරීම සඳහා වැයවන මුදල වැට් රහිතව සහ වැට් මුදල වෙන් වෙන් වශයෙන් පහත සඳහන් කර ඇති උදහරණයේ පරිදි අදළ ටෙන්ඩර් අයදුම්පතේ එම වාහන කාණ්ඩයට ඉදිරියෙන් පැහැදිලි ලෙස මිල ගණන් සඳහන් කළ යුතුවේ.

උදා :

	සේවා කිරීම		ඔයිල් ෆිල්ටර් මාරුකිරීම		එන්ජින් ඔයිල් මාරුකිරීම	
	වැට් රහිත මුදල	වැට් මුදල (8%)	වැට් රහිත මුදල	වැට් මුදල (8%)	වැට් රහිත මුදල	වැට් මුදල (8%)
ටොයෝටා හයිලක්ස් 4X2 ඩබල් කැබ්	1500.00	120.00	2500.00	200.00	4500.00	360.00

05. මිල ගණන්පත සූරා හෝ මකා වෙනස් කරන ලද මිල ගණන් පත් ටෙන්ඩර් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. සම්පූර්ණ කරන ලද මිල ගණන් පතට ටෙන්ඩර්කරුගේ අත්සන හා නිල මුද්‍රාව අනිවාර්යයෙන්ම තැබිය යුතු වේ.

07. ආකෘති පත්‍රයේ සඳහන් සේවාවන් නිසි පරිදි ඉටුකිරීමට ඇවැසි පහසුකම් ඔබ ආයතනය සතුවිය යුතු වේ.

08. **සේවාව අවසානයේදී යුධ හමුද නියෝජිතයෙකු විසින් අදළ වාහනයන් පරීක්ෂා කරනු ලබන අතර, එම සේවාව නිසි අයුරු ඉටුවී නොමැති බවට නිරීක්ෂණය වුවහොත් අදළ සේවාව නැවත නොමිලේ ඉටුකර දිය යුතු වේ.**

09. ඔබ ආයතනය විසින් සිදුකරනු ලබන සේවාවන් අසතුටුදයක වේ නම් අදළ ටෙන්ඩරය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

10. ටෙන්ඩර්කරු විසින් සතියේ ඕනෑම දිනයක යුහ වාහන සේවා කිරීම සඳහා එකඟ විය යුතුය.

11. ටෙන්ඩර්කරු බිල්පත නිකුත් කළ දින සිට මාස 03 ක කාලයක් සඳහා යුද්ධ හමුදාව වෙත ණය පදනම මත සේවාවන් සැපයීමට එකඟ විය යුතුය.

12. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුවල ටෙන්ඩරය අනුමත වීමෙන් පසුව අප විසින් නිකුත් කරනු ලබන කාර්යය නියෝගයේ සඳහන්වන සේවාව පමණක් ඉටුකළ යුතු වේ. ඊට අමතරව ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන අමතර ඇස්තමේන්තු සඳහා කිසිදු මුදලක් ගෙවනු නොලැබේ.

13. මිල ගණන්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා ඇවැසි ආදර්ශ මිල ගණන්පත්‍රය හා ටෙන්ඩර්කරුගේ විස්තරය ඇතුළත් කරනු ලබන පෝරමය යුධ හමුද වෙබ් අඩවිය ඔස්සේ පහත සඳහන් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළඇණි වෙතින් ලබාගත හැකි වේ.

(අ)	යුධ හමුද වෙබ් අඩවිය	www.army.lk/tenders.php
(ආ)	සේනාවිධායක, ශ්‍රීලවියාඉ මූලික වැඩපල - කොළඹ, පාර්සන් පාර, කොළඹ 02. දුරකථන අංකය - 0112 436477 ෆැක්ස් - 0112 436477	මහ කොළඹ ආර්ථික ප්‍රදේශයට අයත් සේවා ස්ථානයන්
(ඇ)	අණදෙන නිලධාරී, 1 ශ්‍රීලවියාඉබ, යුහ ජනපදය, පනාගොඩ, හෝමාගම. දුරකථන අංකය - 0112 855463 ෆැක්ස් - 0112 855463	කොළඹ (මහා කොළඹ ආර්ථික කොමිෂන් බල ප්‍රදේශය හැර) කෑගල්ල, ගම්පහ, කුරුණෑගල, රත්නපුර, කළුතර, පුත්තලම, ගාල්ල, මාතර දිස්ත්‍රික්කයන්ට අයත් සේවා ස්ථානයන්.
(ඈ)	අණදෙන නිලධාරී, 3 ශ්‍රීලවියාඉබ, මහසෙන්පුර, මින්නේරිය දුරකථන අංකය - 027 2247322 ෆැක්ස් - 027 2247322	පොළොන්නරුව, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, බලප්‍රදේශයන් සහ දඹුල්ල, නාඋල නගර අවට අයත් සේවා ස්ථානයන්.
(ඉ)	අණදෙන නිලධාරී, 4 ශ්‍රීලවියාඉබ, කන්කසන්තුරය. දුරකථන අංකය - 021 3213036, 021 3212937 ෆැක්ස් - 021 3215177	යාපනය දිස්ත්‍රික්කයට අයත් සේවා ස්ථානයන්
(ඊ)	අණදෙන නිලධාරී, 5 ශ්‍රීලවියාඉබ, සාලියපුර, අනුරාධපුර. දුරකථන අංකය - 025 2220935 ෆැක්ස් - 025 2222898	අනුරාධපුරය, වව්නියාව, මන්නාරම හා පුත්තලම දිස්ත්‍රික්කයන්ට අයත් සේවා ස්ථානයන්
(උ)	අණදෙන නිලධාරී, 6 ශ්‍රීලවියාඉබ, යුහ කඳවුර, මුලතිව් දුරකථන අංකය - 024 3244673	මුලතිව් දිස්ත්‍රික්කයට අයත් සේවා ස්ථානයන්
(ඌ)	අණදෙන නිලධාරී, 7 ශ්‍රීලවියාඉබ, යුහ කඳවුර, කිලිනොච්චි දුරකථන අංකය - 025 3242790	කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් සේවා ස්ථානයන්
(එ)	අණදෙන නිලධාරී, 2 (සෙව්) ශ්‍රීලවියාඉරෙ. යුහ කඳවුර, උඩවැව, කහගොල්ල, දියතලාව. දුරකථන අංකය - 057 2224633	මහනුවර, මාතලේ, බදුල්ල, නුවරඑළිය, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට අයත් සේවා ස්ථානයන්.

14. වැඩි විස්තර සඳහා අමතන්න. මාණ්ඩලික නිලධාරී 1, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුද මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර. දුරකථන අංකය : 011 3133154

15. සම්පූර්ණ කරන ලද මිල ගණන්පත් මුල්පිටපත සමග පිටපත් 03 කින් යුතුව මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර, **2020 ඔක්තෝබර් මස 05 දින පෙ.ව. 10.00** ප්‍රථම ඡේද අංක 03 හි ස්ථානයෙහි ටෙන්ඩර් පෙට්ටි වෙත බහාලීමට කටයුතු කළ යුතු වේ. තවද මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලිපියෙහි වම්පස ඉහළ කෙළවරේ **"යුද හමුද වාහන සේවා කිරීම - 2021 වසර"** යනුවෙන් සඳහන් කර ආයතනයේ නිල මුද්‍රාව තැබිය යුතු අතර, නියමිත දින දක්වා ඇති වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පත් විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ වහාම එම ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ටෙන්ඩර්කරුට හෝ ටෙන්ඩර්කරු විසින් බලය පවරනු ලබන වෙනත් අයකුට ඉදිරිපත් විය හැකිය

.....

යුද්ධ හමුදාධිපති - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

ටෙන්ඩර්කරුගේ විස්තරය

(සේවා ආයතනයේ නම සහ ලිපිනය)

.....

.....

.....

වියාඉ/අම/සේවා/ටෙන්ඩර්/04( )
සභාපති - ටෙන්ඩර් මණ්ඩලය

.....

.....

.....

දුරකථන අංකය : 2020/ / දින

වාහන සේවා කිරීම සඳහා මිල ගණන්පත් ඉදිරිපත් කිරීම - ..... ප්‍රදේශය 2021 වසර

01. ටෙන්ඩර්කරුගේ නම : .....
02. ජාතික හැඳුනුම්පත් අංකය : .....
03. ලිපිනය : .....
04. සේවා ආයතනයේ වෙළඳ නාමය : .....
05. මාගේ සේවා ආයතනය පිහිටා ඇත්තේ : ..... මහනගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේය.
06. දුරකථන අංකය : : ..... 07. ෆැක්ස් අංකය : .....
08. වෙළඳ ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර ඇත්නම් ලියාපදිංචි අංකය : .....
09. වැට් සඳහා ලියාපදිංචි වී ඇත්නම් එහි අංකය : .....
(වැට් සඳහා ලියාපදිංචි වී නොමැතිනම් දේශීය ආදයම් කොමසාරිස් ජෙනරාල් වෙතින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් ඇමිණිය යුතුයි)
10. මාගේ සේවා ආයතනයේ සිට බලයලත් යුහ කඳවුරට ඇති දුර ප්‍රමාණය කි.මී. : .....
11. සැපයුම්කරුවෙකු වශයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇත / නැත : .....
ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි වූ අංකය : .....
12. ඔබ ආයතනයේ ඇති හොයිස්ටර් ප්‍රමාණය සහ ධාරිතාවය : .....
13. දිනකට සේවා කළ හැකි සියලුම වාහන ගණන : බර වාහන ..... සැහැල්ලු වාහන .....
14. දිනකට සේවා කළ හැකි යුද හමුද වාහන ගණන : බර වාහන ..... සැහැල්ලු වාහන .....
15. ඔබ ආයතනයේ වැඩ කරන සේවකයන් සංඛ්‍යාව : .....
16. මෙම අයදුම්පත සමග ලබාදුන් කොන්දේසි කියවා බැලූ අතර, එහි සඳහන් කොන්දේසි හා එකඟ වන බැව් මින් පොරොන්දු වෙමි. තවද ..... බල ප්‍රදේශයේ යුද හමුද කඳවුරුවලට අයත් පහත දක්වා ඇති මාදිලියේ යුද හමුද වාහන 2021/01/01 සිට 2021/12/31 දක්වා සේවා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පහත දක්වා ඇති අතර, මෙම මිල ගණන් කුමන හේතුවක් නිසාවත් අදළ වර්ෂය තුළදී සංශෝධනය නොකරන බවත්, ණය පදනම යටතේ සේවා කිරීමට කැමති බවත්, මා මෙයින් ප්‍රකාශ කරමි.

ටෙන්ඩර්කරුගේ අත්සන : .....
නම : .....
නිල මුද්‍රාව : .....

2020 / / දින

ප්‍රසම්පාදන දැන්වීම

ශ්‍රී ලංකා නාවික හමුදාව

2021 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාවට පොදු ගබඩා ද්‍රව්‍ය සැපයීම සඳහා නිෂ්පාදකයන්ගෙන්/ ආනයනකරුවන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ මිල ගණන් කැඳවීම

01. ශ්‍රී ලංකා නාවික හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත 2021 ජනවාරි මස 01 වන දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා, පහත දක්වා ඇති වෙන් වෙන් මිල ගණන් කැඳවීම්වලට අයත් පොදු ගබඩා ද්‍රව්‍යයන් එක් මිල කැඳවුමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ සැපයිය හැකි නිෂ්පාදකයන්, ආනයනකරුවන්, සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. ඉදිරිපත් කරන මිල ගණන්වල වලංගු කාලය 2021 ජනවාරි මස 01 වන දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතුයි.

අ. තෝරා ගන්නා කොන්ත්‍රත්කරුවන් නාවික හමුදාව විසින් ඇණවුම් කරනු ලබන ගබඩා ද්‍රව්‍යයන් මාර්ගස්ථ ගබඩාව ශ්‍රීලංනානෞ "මහසෙන්" වැලිසර, රාගම වෙත සැපයුම් කළ යුතුය.

ආ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් එක් එක් කාණ්ඩයන් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2,000.00 ක අයදුම්පත් ගාස්තුව මුදලින්, අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 වෙත ඉදිරිපත් කර අයදුම්පත් **2020 සැප්තැම්බර් මස 10 වන දින සිට 2020 ඔක්තෝබර් මස 06 වන දින දක්වා** සතියේ වැඩකරන දින 1000 පැයේ සිට 1400 පැය දක්වා ලබා ගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත දක්වා ඇති පරිදි ඉදිරිපත් කළ යුතුය.

02. 2021 වර්ෂය සඳහා අවශ්‍ය පොදු ගබඩා ද්‍රව්‍යයන්වල විස්තර සහ දළ අවශ්‍යතා ප්‍රමාණයන් එක් එක් මිල ගණන් කැඳවුම් අනුව අයදුම්පත් සමඟ නිකුත් කරනු ලැබේ.
විෂයය කාණ්ඩයන් සහ අංකයන්

මිල ගණන් කැඳවුම් කාණ්ඩ අංකයන්	විෂයය කාණ්ඩ විස්තරය	මිල ගණන් කැඳවීම අවසන් වන දිනය හා විවෘත කරන වේලාව
එස්එල්එන්/එල්ඕජී/01/ආර්සී/2021	සියලුම බැටරි වර්ග	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/02/ආර්සී/2021	එතුම් කම්බි	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/03/ආර්සී/2021	ගෘහස්ථ විදුලි රැහැන්	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/04/ආර්සී/2021	ස්විච, එම්සීබී, එම්සීසීබී, ආර්සීසීබී	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/05/ආර්සී/2021	නාත කාමර කට්ටල	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/07/ආර්සී/2021	ටයර් සහ ටියුබ්	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/08/ආර්සී/2021	කන්ඩියුට් සහ උපාංග	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/09/ආර්සී/2021	වානේ කම්බි (ගොඩනැගිලි ඉදිකිරීම්)	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/10/ආර්සී/2021	කාර්මික කටයුතු සඳහා යොදා ගන්නා වායු වර්ග	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/11/ආර්සී/2021 (ලිපිගොනු අංක. 01)	ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා විෂයයන් – මෘදු වානේ සහ ගැල්වනයිස් කරන ලද අයිතම	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/11/ආර්සී/2021 (ලිපිගොනු අංක. 02)	ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා විෂයයන් – දෙර කවුළු භාවිතා කරන අයිතමයන් සහ උපාංග	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/11/ආර්සී/2021 (ලිපිගොනු අංක. 03)	ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා පොදු විෂයයන්	2020 ඔක්තෝබර් 07, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/12/ආර්සී/2021	පිරිසිදු කිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා සනීපාරක්ෂක අයිතමයන්	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/13/ආර්සී/2021	දුරකථන රැහැන් වර්ග (ගෘහස්ථ) ඩ්‍රොප් වයර් සහ දුරකථන උපකරණ.	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/14/ආර්සී/2021	කාර්යාලීය ලිපි ද්‍රව්‍ය	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/15/ආර්සී/2021	මුද්‍රණ කඩදාසි හා පොත් පත්	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/16/ආර්සී/2021	දේශීය ලී වර්ග	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/17/ආර්සී/2021 (ලිපිගොනු අංක. 01)	පොදු ඉංජිනේරු විෂයයන්	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/17/ආර්සී/2021 (ලිපිගොනු අංක. 02)	පොදු ඉංජිනේරු විෂයයන්	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/17/ආර්සී/2021 (ලිපිගොනු අංක. 03)	පොදු ඉංජිනේරු විෂයයන්	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/18/ආර්සී/2021	පැස්සුම් කූරු	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/19/ආර්සී/2021	පීවීසී ජල නළ සහ උපාංග	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/20/ආර්සී/2021	තුනී ලෑලි දේශීය සහ විදේශීය	2020 ඔක්තෝබර් 08, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/21/ආර්සී/2021	පොදු තීන්ත වර්ග	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/22/ආර්සී/2021	තාර වර්ග	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/23/ආර්සී/2021	බෙයාරිත් වර්ග	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/24/ආර්සී/2021	විදුලි බුබුළු වර්ග	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/25/ආර්සී/2021	සෙවිලි තහඩු වර්ග	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/26/ආර්සී/2021	මෝටර් රථ තීන්ත	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/27/ආර්සී/2021	මුද්‍රණ කටයුතු සඳහා යොදාගන්නා අයිතමයන්	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/28/ආර්සී/2021	විදේශීය ලී වර්ග	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/29/ආර්සී/2021	සවිගන්වන ලද විදුරු කෙඳි (GRP)	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/30/ආර්සී/2021 (ලිපිගොනු අංක. 01)	වාහන අමතර කොටස්	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/30/ආර්සී/2021 (ලිපිගොනු අංක. 02)	වාහන ඇතුලත භාවිතා කරනු ලබන කාපට්, කවර සහ රෙදි	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/33/ආර්සී/2021	ජල පිරිපහදු යන්ත්‍ර සඳහා යොදා ගන්නා අමතර කොටස් සහ උපාංග	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/34/ආර්සී/2021	සිමෙන්ති කිලෝ 50	2020 ඔක්තෝබර් 09, 1000 පැය
එස්එල්එන්/එල්ඕජී/36/ආර්සී/2021	කළු ගල් සහ වැලි	2020 ඔක්තෝබර් 09, 1000 පැය

03. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය (මිල ගණන් ඇගයීමේදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ)

අ. පොදු ගබඩා ද්‍රව්‍යයන් සමාන ධාරිතා බලයක් සහිතව රජයේ / පෞද්ගලික ආයතන වෙත සැපයීම පිළිබඳව වර්ෂ 02ක සතුටුදායක කාර්ය සාධනයක් තිබෙන බවට වාර්තා

ආ. ස්ථිර මූල්‍යමය හැකියාව

ඇ. බදු ගෙවීම පිළිබඳ සතුටුදායක වාර්තා

ඈ. ප්‍රමාණවත් පරිදි පණිවිඩ හුවමාරු පහසුකම් තිබීම. (දුරකථන, ජංගම දුරකථන, ෆැක්ස් යන්ත්‍ර, විද්‍යුත් ලිපින)

ඉ. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් තිබීම

ඊ. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් සිටීම සහ කාර්යාල පහසුකම් තිබීම

උ. ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් තිබීම

ඌ. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ සංස්ථාපිත සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ලියාපදිංචි වීමෙන් පසු ආසන්න වසර 03ක කාලය තුළ අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල යෙදී සිටි බවට වාර්තා ඉදිරිපත් කළ යුතුය.

04. අයදුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වැට බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබීම අනිවාර්ය වේ. වැට බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් වැට බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සනාථ කරන සහතිකයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. තවද, ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති මිල ගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා නාවික හමුදාවට 2021 වර්ෂය සඳහා පොදු ගබඩා විෂයයන් සැපයීම සඳහා කොන්ත්‍රාත් මිල ගණන් ඉදිරිපත් කිරීම"** (විෂයය කාණ්ඩය) එස්එල්එන්/එල්ඕජී/...../ආර්සී/2021 ටෙන්ඩර්පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් බහාලුම් පෙට්ටියේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා නාවික හමුදාව,
නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ 593, කොළඹ 01.

06. මිල ගණන් භාරගන්නා අවසාන දිනය හා වේලාව පසුවූ වහාම ලද අයදුම්පත් විවෘත කරනු ලැබේ. අයදුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හට මිල ගණන් විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

07. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, නිසි පරිදි සහතික නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

08. තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙත ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

09. ටෙන්ඩර් අයදුම්පත් කිසිඳු ගෙවීමකින් තොරව අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 යන ස්ථානයේ පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩි විස්තර සඳහා මාණ්ඩලික නිලධාරී (ඒකක කොන්ත්‍රාත්) දු.ක. 011 7192326, අධ්‍යක්ෂ නාවික සැපයුම් දු.ක 011 7192321 සහ අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 වෙතින් ලබා ගත හැක.

11. මෙම ඒකක කොන්ත්‍රාත් මිල ගණන් කැඳවීම සම්බන්ධ විස්තර නාවික හමුදා වෙබ් අඩවිය www.navy.lk මඟින් ද ලබා ගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා නාවික හමුදාව,
කොළඹ 01 .

ADZ
ඔබගේ ලුහුඬු දැන්වීම් ලාභම සිටින අපගේ
පුවත්පත් නියෝජිත මහත්වරුන් වෙත භාරදෙන්න
රු. 300/- රු. 500/- රු. 650/-
දිවයින පුරා
මොනරාගල
මොනරාගල 076 6 565 653
මාතර
මාතර 047 2 230 093
අනුරාධපුර
තඹුත්තේගම 025 2 276 431
අනුරාධපුර 025 2 221 441
අනුරාධපුර 025 2 222 806
අනුරාධපුර 025 2 222 575
රත්නපුර
රත්නපුර 071 2 900 35
රත්නපුර 045 2 223 883
හම්බන්තොට
මිද්දෙනිය 047 2 27 245
තංගල්ල 047 2 240 402
හම්බන්තොට 077 0 051 975
අම්බලන්තොට 047 2 223 152
තිස්සමහාරාම 047 2 239 088
මඩකලපුව
කාත්තන්කුඩි 077 7 435 566
මඩකලපුව 065 2 226 034
ADZ HOTLINE - 011 2 429 369
CLASSIFIEDS HOTLINE 011 2 445 445

ADZ
ඔබගේ ලුහුඬු දැන්වීම් ලාභම සිටින අපගේ
පුවත්පත් නියෝජිත මහත්වරුන් වෙත භාරදෙන්න
ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු...
රු. 300/- රු. 500/- රු. 650/-
කොළඹ දිස්ත්‍රික්කය
පුංචිබොරැල්ල 011 2 268 251
කොළඹ 071 0 748 900
කිරුළපන 071 5 439 396
මිහිකොල 078 5 200 648
ගෑන්ඩිපාස් 071 2 321 968
වැල්ලවත්ත 071 7 182 900
කොල්ලුපිටිය 011 2 341 502
මිරිටක්කුලිය 011 2 520 602
බොරැල්ල 011 2 679 032
නාවින්න 071 4 252 138
කොට්ටේ 077 9 878 933
කහතුඩුව 011 2 753 836
කඩුවෙල 011 2 579 609
රාවතාවත්ත 011 2 642 038
කටුබැද්ද 011 2 605 026
ගල්කිස්ස 011 2 724 820
නුගේගොඩ 077 3 458 785
WATAPITA HOT LINE - 011 2 429 342
CLASSIFIEDS HOTLINE 011 2 445 445

ලෙඩුන් රවටා කොල්ල කෑ හොර දොස්තර

● ලලිත් චාමින්ද

කරාපිටිය ශික්ෂණ රෝහලේ නේවාසික ප්‍රතිකාර ලබන තම පියා බැලීම සඳහා පුතකු තම මව සමග රෝහලට පැමිණියේය. මව සිය දැත්වල රන්මුදු මුදු කිහිපයක් හා ගෙල රන් මාලයක් පැළඳ සිටියාය. ජැන්ඩියට ඇද පැළඳ සිටි තරුණයකු රෝහලේ වාට්ටුව තුළ ඒ මේ අත ගමන් කරමින් සිටියේය. මොහු ප්‍රියමනාප තරුණයකු වූ අතර වාට්ටුවේ සිටි කොයිකවුරුත් මොහු වෛද්‍යවරයකු යැයි සිතුවේය. කාන්තාව පැළඳ සිටි රන්මාල හා මුදු දෙස එකවරම මොහුගේ නෙත ගැටුණි. මොහු මෙකී මව හා පුතු පැත්තකට කැඳවාගෙන යනු ලැබීය. ඔයගොල්ලෝ දන්නවාද තාත්තාට තියෙන රෝගය. තවම රෝගය හඳුනාගෙන නැහැ. ඉතා භයානක රෝගයක් තමයි තාත්තාට තියෙන්නේ ලේ ඥාතීන් නිසා රුධිර පරීක්ෂයක් කරන්න වෙනවා; මොහු පුතුට කීවේය.

හරි එහෙනම් ඔයා එන්න එසේ කී මෙකී තරුණයා නේවාසික ප්‍රතිකර ලබන රෝගියාගේ පුතු සායනයක් වෙත කැඳවාගෙන ගොස් එතැන සිටින ලෙස කීවේය. තරුණයා ඒ අසල තිබූ ශල්‍යාගාරයට දමා ඔහු දෙස බලා මොහු කඩිමුඩියේ මව සිටින තැනට ගියේය. අම්මේ මෙතනට එන්න, එසේ කී මොහු මව ඇදක හාන්සි කරවා ලේ පරීක්ෂණයක් කිරීමට තිබෙන බව කීවේය. මව පැළඳ සිටි රන් භාණ්ඩ ගලවා බෑගයක දමන ලෙස කී තරුණයා හෙමින් සිරුවේ ඒ රන්භාණ්ඩ රැගෙන මාරුවී ගොස් තිබුණි. තමන් වංචාකාරයකුට හසුවී ඇති බව මෙකී මවට හා පුතුට පසුව අවබෝධ විය. ඒ වනවිට සියල්ල සිදුවී හමාරය.

මෙකී මව හා පුතු ගාල්ල පොලිසියේ අපරාධ විමර්ශන අංශය වෙත ගොස් මේ ගැන පැමිණිලි කරනු ලැබීය. මෙය මිට මාස කිහිපයකට පමණ පෙර වූ සිද්ධියකි. පසුගිය දින 10වැනිදින ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ වකුගඩු සායනයට තම සැමියාට ප්‍රතිකාර ගැනීම සඳහා පැමිණි කාන්තාවක් මෙවැනිම ඉරණමකට ගොදුරු වුවාය. ඕ 70 හැවිරිදි වියේ පසුවූ අක්මීමන ප්‍රදේශයේ පදිංචි කාන්තාවකි. ඉකුත් 10 වැනි දින වකුගඩු රෝගියෙන් පෙලෙන තම සැමියාට ප්‍රතිකාර ගැනීම සඳහා ඇය ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ වකුගඩු සායනය වෙත පැමිණියේය. වකුගඩු රෝගියා වූ සැමියා 75 හැවිරිදි වියේ පසුවිය. සැමියා රුධිර කාන්දු පෙරණයට ලක්කළ යුතු නිසා උදේ රැයින්ම මොවුන් වකුගඩු රෝග සායනයට පැමිණ සිටියහ. මෙම යුවළ වකුගඩු සායනයේ දොරටුව අසල සිටියදී ජැන්ඩියට හැඳ පැළඳගෙන සිටි තරුණයකු වකුගඩු සායනය වෙත පැමිණියේය. මෙකී අඹුසැමි යුවළ අසලට කිට්ටු වූ මෙම තරුණයා ලොකු දොස්තර මහත්තයා එනතෙක් ඔය දෙන්නාට පරීක්ෂණයක් කරන්න තියෙනවා යැයි කියා කීවේය. මොහු වකුගඩු ඒකකයේ වෛද්‍යවරයකු යැයි වයස්ගත යුවළද සිතන්නට වූහ.

මෙකී වයස්ගත යුවළ රෝහලේ භෞතික චිකිත්සක කාමරය වෙත කැඳවාගෙන යනු ලැබීය. කාන්තාව ඇදක හාන්සි කරනු ලැබිය. අම්මාට පී. සී. ආර්. පරීක්ෂණයක් කරන්න තියෙනවා. ඒ නිසා එම පරීක්ෂණය කරන්න ඉස්සෙල්ලා අම්මා පැළඳ සිටින රන්භාණ්ඩ ටික ගලවන්න ඕන. තියෙන රන්භාණ්ඩවල තොරතුරු කොළයක ලියලා බෑගයක දමලා මහත්තයාට දෙන්න තරුණයා කීවේය. ඒ අනව කාන්තාව පැළඳ සිටි මුදු තුනක් ගෙලබැඳි රන්මාලය හා සුරය ගලවා සැමියාට දුන්නේය. හරි මහත්තයාත් අතන තියෙන ඇඳේ හාන්සි වෙන්න තරුණයා කීවේය. ඔහු ඇඳේ හාන්සි විය. තව පොඩි වෙලාවකින් පරීක්ෂණය කරනවා තරුණයා කීවේය. මෙකී යුවළට එසේ පැවසූ ජැන්ඩියට හැඳපැළඳ සිටි තරුණයා හෙමින් සිරුවේ මෙකී යුවළට නොපෙනෙන ලෙස ස්වර්ණාභරණ දමා තිබූ බෑගය රැගෙන වකුගඩු සායනයෙන් මාරුවී ගියේය. රන්භාණ්ඩවල වටිනාකම තුන්ලක්ෂ විසිපන්දහසක් විය.

ඉකුත් වසරේ අගෝස්තු මාසයේ සිට මේ දක්වා කාලය තුළදී මේ අයුරින් රන්භාණ්ඩ වංචා කිරීමේ සිද්ධි සම්බන්ධයෙන් පැමිණිලි 08ක් ගාල්ල පොලිසිය වෙත වාර්තා වී තිබුණි. මින් පැමිණිලි 07ක් ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහල තුළදී වූ රන් භාණ්ඩ වංචා කිරීමේ සිද්ධීන් වන අතර එක් පැමිණිල්ලක් ලැබී තිබුණේ ගාල්ල මහමෝදර රෝහල තුළදී වූ රන් භාණ්ඩ වංචා කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙනි. වෛද්‍යවරකු ලෙස පෙනී සිටිමින් මොහු රෝහලට පැමිණෙන රෝගින්ගේ රන්භාණ්ඩ වංචාකොට තිබුණි.

ආරක්ෂක නිලධාරියකුගේ පරීක්ෂාවට

මේ ආකාරයට රෝගීන්ගේ රන් භාණ්ඩ වංචා කිරීම පිළිබඳ පැමිණිලි ලැබීම පොලිසියට ද මහත් ප්‍රශ්නයක් විය. එක් අවස්ථාවකදි මෙකී තරුණයා කරාපිටිය ශික්ෂණ රෝහලේ ගෙට්ටුවේ සිටි ආරක්ෂක නිලධාරියකුගේ පරීක්ෂාවට ලක්විය. මම වෛද්‍ය සිසුවෙක් තරුණයා කීවේය. එහෙනම් කෝ බලන්න ඔයාගේ හැඳුනුම්පත ආරක්ෂක නිලධාරියා විමසන්නට විය. මහත්තයෝ රෝහලට එනවිට කවුද හැඳුනුම්පත් අරගෙන එන්නේ ඒක කාමරයේ තියෙනවා. ඔයාට පෙන්වන්න අවශ්‍ය නම් එන්න කාමරයට යන්න මොහු කීවේය. හරි එහෙනම් යමු ආරක්ෂක නිලධාරියා කීවේය. ඔහු මොහුගේ පිටුපසින් ගියේය. නමුත් මෙකී පුද්ගලයා ඉක්මන් ගමනින් ගොස් ආරක්ෂක නිලධාරියා මග හැරයන්නට ගියේය.

රෝහලේ ආරක්ෂක අංශ මගින්ද සායන සඳහා පැමිණෙන රෝගින්ගේ රන්භාණ්ඩ ආරක්ෂා කරගන්න ලෙස නිරන්තරයෙන් රෝගීන් දැනුවත් කිරීමට කටයුතු කර තිබුණි. එක් දිනක් ආරක්ෂක අංශයේ නිලධාරියකු විසින් මේ ගැන රෝගීන් දැනුවත් කරමින් සිටියදි තරුණයකු ඔහු අසලට පැමිණියේය. මහත්තයාගේ බැජ් එකේ අයෙක් ඉන්නවා නේද කොළඹ ඔහු නමක් සඳහන් කොට කීවේය. මට හරියට මතක නැහැ, ආරක්ෂක නිලධාරියා කීවේය. එදින මොහු ඒ අයුරින් ආරක්ෂක නිලධාරියා වෙත කථා කර ඇත්තේ තමන් ගැන ආරක්ෂක අංශවලට ඉව වැටී ඇති බවට සැකහැර දැනගැනීම සඳහාය.

මොහු තැනට උචිත ලෙස විවිධ උපක්‍රම අනුගමනය කරමින් ඉතා සුක්ෂම ලෙස රෝහලට පැමිණෙන රෝගී කතුන්ගේ රන්භාණ්ඩ වංචා කිරීම සිදුකරගෙන ගියේය. මේ අතර ගාල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විකුම් ගිණිගේ, ගාල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක කපිල සේනාපතිද සිල්වා යන නිලධාරීන් විසින් මේ පිළිබඳ විමර්ශනය කොට සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ගාල්ල පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඩී.ජී ආනන්ද මහතා වෙත උපදෙස් ලබා දුන්නේය. පොලිස් පරීක්ෂක ආනන්ද අපරාධකරුවන් පසුපස හඹගොස් ඔවුන් කොටු කරගැනීමට සමත් දක්ෂ නිලධාරියෙකි.

ඔහු මේ පිළිබද විමර්ශන කටයුතු ආරම්භ කරනු ලැබීය. මෙකී සැකකාර තරුණයාට ඇඹිලිපිටිය රෝහලට පැමිණි කාන්තාවකගේ රන්භාණ්ඩ වංචා කිරීමේ සිද්ධියක් සම්බන්ධව ඇඹිලිපිටිය අධිකරණයේ නඩුවක් පැවතියේය. පොලිස් පරීක්ෂක ආනන්ද ඇතුළු පොලිස් නිලධාරීහු සැකකරු කොටු කරගැනීම සඳහා එදින අධිකරණය වෙත ගියහ. නමුත් මොහු එදින අධිකරණය වෙත නොපැමිණියේය. ඔහුට අධිකරණය මගින් සිතාසි නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. පසුව පොලිස් පරීක්ෂක ආනන්ද ඇතුළු පොලිස් නිලධාරීන් මොහුගේ නඩුගොනු පිරික්සමින් සැකකරුගේ තොරතුරු ලබා ගත්තේය. මොහු හෝමාගම පිටිපන ප්‍රදේශයේ කුලී නිවසක පදිංචිව සිටින බවට පොලිසිය විසින් තොරතුරු අනාවරණය කරගනු ලැබිය. ඒ විතරක් නොව මොහු පිළිබඳ දුරකථන විශ්ලේෂණ වාර්තා පොලිසිය මගින් ලබාගෙන තිබුණේය. පොලිස් පරීක්ෂක ආනන්ද පොලිස් නිලධාරීන් කණ්ඩායමක් සමග පසුගිය දිනෙක සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා හෝමාගම පිටිපන ප්‍රදේශයට ගියහ. එහෙත් ඔහු නිවසේ නොසිටියහ. මොහු නිවසට එන තෙක් පොලිස් නිලධාරීන් මගරැක සිටියහ. අලුයම 5.00ට පමණ සැකකාර තරුණයා නිවසට පැමිණි අතර ඒ සමග ඔහු පොලිස් අත්අඩංගුවට පත්විය.

සැකකාර තරුණයා පොලිස් අත්අඩංගුවට පත්වීමෙන් පසු වසර තුන හතරක පමණ කාලයක සිට තමන් සිදු කළ රන්භාණ්ඩ වංචාකිරීමේ ජාවාරම් පිළිබඳ මොහු එකින් එක වැමැරියේය. සැකකාර තරුණයා වෛද්‍යවරයකු ලෙස පෙනී සිටිමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝහල් සඳහා ප්‍රතිකාර ගැනීමට පැමිණි කතුන් රවටාගෙන රන්භාණ්ඩ වංචා කළ බව පරීක්ෂණවලදි අනාවරණය විය. සැකකාර තරුණයා 30 හැවිරිදි වියේ පසුවන විවාහකයෙකි. ඔහු අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මොහු පවුලේ එකම පිරිමි දරුවාය. මොහු වාණිජ්‍ය අංශයෙන් අ.පො.ස උසස්පෙළ හදාරා තිබේ. මොහුට සහෝදරියන් තිදෙනෙකි. එක් සහෝදරියක් ඔස්ට්‍රේලියාවේ පදිංචිව සිටින අතර අනික් සහෝදරියන් දෙදෙනා රැකියාවල නිරතව සිටිති. මොහු කුඩා කාලයේ සිටම නාහෙටනාහන දඩබ්බරයෙකි. තම එකම පුතුගේ දඩබ්බර වැඩ නිසා පියා තම බිරිඳ පුතු හා ඔහුගේ බිරිඳ සමග අනුරාධපුරයේ තිබූ ඉඩකඩම් විකුණා 2013 වර්ෂයේදී හෝමාගම ප්‍රදේශයට පැමිණි කුලී නිවසක පදිංචිව සිටියහ. පියා කරවල අලෙවි කිරීමේ ව්‍යාපාරයක් කරගෙන ගියේය. හෝමාගමට පැමිණියද පුතුගේ දඩබ්බර වැඩවල අඩුවක් නොවීය.

පී. සී.ආර්. පරීක්ෂණ මුවාවෙන් රෝගීන් රවටලා

සැකකාර තරුණයා විවාහ වී සිටියේ පවුලේ ඥාති කාන්තාවක් සමගය. මොහුන් දෙපළට දරුවන් නොමැති අතර වංචා කරනු ලැබූ රන්භාණ්ඩ උකස්කොට ලබාගන්නා මුදල් වියදම් කොට මොහු සල්ලාල ජීවිතයක් ගත කළේය. හේ නිරතුරුව රාත්‍රී සමාජ ශාලා වෙත ගියේය. කැසිනෝ සුදුවට ද යොමු විය. ඒ විතරක් නොව හේ ගණිකාවන් ඇසුරු කළේය. වංචා කරනු ලැබූ රන්භාණ්ඩ උකස්කොට දිනකට රුපියල් ලක්ෂ 05ක මුදලක් ලබා ගත්තද එක රැයකින් සියල්ල වියදම් කළේය. හේ අතදිගහැර මුදල් වියදම් කළේය. මොහු වසර තුන හතරක කාලයක සිට ඉතා සුක්ෂ්ම අයුරින් මෙකි ජාවාරම කරගෙන ගියේය. ඔහු මේ සඳහා විවිධ උපක්‍රම භාවිත කරනු ලැබීය. රෝගීන් සායන සඳහා අලුයම සිට පැමිණෙන අතර මොහුද මෙකී ජාවාරම කරගෙන යෑම සඳහා උදේ රැයින්ම රෝහල් වෙත පැමිණියේය. එක් අවස්ථාවකදි වෛද්‍යවරයකු ලෙස පෙනී සිටින මොහු තවත් අවස්ථාවකදි වෛද්‍ය සිසුවකු ලෙස පෙනී සිටින්නේය. රෝහලේ උපස්ථායකවරයකු හෙදියක ඇතැම් අවස්ථාවලදි මොහු ගැන තොරතුරු විමසීමේ දි මොහු පෙනී සිට ඇත්තේ වෛද්‍ය සිසුවෙක් නැතහොත් වෛද්‍යවරයකුගේ ඥාතියකු බව පවසමිනි.

සැකකාර පුද්ගලයා ජැන්ඩියට හැඳපැළඳ රෝහල්වෙත ගොස් හෙදියන් සාත්තු සේවකයන් නොමඟ යවා වයස්ගත රෝගීන් ඉතා සුක්ෂම අයුරින් රවටා පරීක්ෂණයක් සිදු කිරීමට බව පවසා රැගෙන ගොස් රන් භාණ්ඩ වංචාකොට ඇති බව විමර්ශනවලදී අනාවරණය වී ඇත. පසුගිය කාලයේ මෙකී සැකකරු විසින් පී. සී.ආර්. පරීක්ෂණ පවත්වන මුවාවෙන් රෝගීන් රැගෙන ගොස් රන්භාන්ඩ වංචාකොට ඇති බව විමර්ශනවලදි අනාවරණය වී තිබේ. සැකකාර පුද්ගලයා වෛද්‍යවරයකු ලෙස පෙනී සිටිමින් ඇඹිලිපිටිය, නුවරඑළිය, රත්නපුර ඇහැලියගොඩ පුත්තලම කැගල්ල , රාගම, හැටන් හම්බන්තොට කුරුණෑගල ආදි ප්‍රදේශවල රෝහල්වලට ගොස් මේ අයුරින් රෝගීන් රවටා රන්භාණ්ඩ සොරකම්කොට ඇති බව විමර්ශනවලදි අනාවරණය වී ඇත.

සැකකාර පුද්ගලයා විසින් 2019 වර්ෂයේ සිට ගාල්ල කරාපිටිය, මහමෝදර රෝහල්වලදි රන්භාණ්ඩ වංචා කිරීම් සිද්ධි 08කට සම්බන්දව වංචාකරණු ලැබූ රන්භාණ්ඩ හා පුත්තලම ප්‍රදේශයේ රෝහලක දි වංචාකරනු ලැබූ රන්භාණ්ඩ ගුලි පවුම් 15ක් ගෙලබැඳි රන්මාලයක් හා අත්පළඳනාවක් නුවර රජින විදියේ ස්වරණාභරණ හලකට අලෙවිකොට තිබියදී පොලිසිය මගින් සොයාගනු ලැබිය. දැනට සොයාගත් රන් භාණ්ඩවල වටිනාකම රුපියල් ලක්ෂ 20ක අධික බව පොලිසිය පවසයි. මෙකී රන්භාණ්ඩ උණුකොට තිබූ අතර එකි ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියාද පොලිස් අත්අඩංගුවට ගනු ලැබීය.

ගාල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විකුම් ගිණිගේ, ගාල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක කපිල සේනාපතිද සිල්වා යන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ගාල්ල පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඩී.ජී ආනන්ද.උ පො ප උමයංගන උ පොප සංජීව පො සැ 58970 බණ්ඩාරිගො පො සැ31951 රෝහණ පො කො 778258 ගිතප්‍රිය යන නිලධාරීන් විසින් සැකකරුවන් අත්අඩංගුවට ගනු ලැබීය.

සොරාගත් රන් භාණ්ඩ පොලිසියේ තබා ඇති අයුරු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ඇබෑර්තු

තත්කාර්ය පදනම මත අභ්‍යන්තර විගණක (තාක්ෂණ) තනතුර සඳහා බඳවා ගැනීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉදිකිරීම් සහ තාක්ෂණික ව්‍යාපෘතීන්හි තාක්ෂණික සහ ඉංජිනේරු අංශ කේන්ද්‍රගත කර ගනිමින් අභ්‍යන්තර තාක්ෂණික විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකුගේ සේවාව ලබා ගැනීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තීරණය කර ඇත.

මෙම පත්වීම 2020 නොවැම්බර් සිට තත්කාර්ය පදනම මත වසරක කාලසීමාවක් සඳහා වේ.

01. විෂය පථය

මෙම තනතුරේ විෂය පථයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉදිකිරීම් සහ තාක්ෂණ ව්‍යාපෘති ඇතුළුව එහි බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගන්නා සේවා සඳහා අභ්‍යන්තර තාක්ෂණ විගණන සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ආවරණය වේ. එහි පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍රයේ ඇගයීම සහ නිසි ප්‍රමිතියක් සකස් කිරීම මෙන්ම නීති හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලබන්නේදැයි සොයා බැලීම සඳහා වූ කටයුතු පරීක්ෂා කිරීම ඇතුලත් වේ. මෙමගින් ප්‍රශස්ත වටිනාකම් සැලසුම් සහ අනුමත අයවැය තුල අපේක්ෂිත අවශ්‍යතාවයන් සහ අරමුණු වලට අනුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට වගබලා ගැනීම පිණිස ව්‍යාපෘතියේ පිරිවැය විගණනය සහ පිරිවැය අධීක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. එමෙන්ම මෙම විෂය පථයෙන් ලංසු ලියකියවිලි කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී සක්‍රීය සහභාගිත්වය ආවරණය වේ. එමෙන්ම කොන්ත්‍රාත්තුවේ සඳහන් කර ඇති පරිදි අදාළ පිරිවිතර සහ තාක්ෂණික විස්තර ප්‍රකාරව අනුකූලතාවය සහතික කිරීම පිණිස අමුද්‍රව්‍ය සහ උපකරණ ප්‍රසම්පාදනය පිළිබද විගණනය මෙන්ම අදාළ ක්‍රියාපටිපාටීන්ට අනුව අභ්‍යන්තර අනුකූලතාවය ඇගයීම පිණිස ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු වලට අදාළ විගණනය සිදු කිරීම අභ්‍යන්තර විගණකගෙන් (තාක්ෂණ) බලාපොරොත්තු වේ.

02. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්

ඔහු/ඇය රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රාජ්‍ය ව්‍යාපෘතියක ඉංජිනේරුවකු ලෙස වසර 15 කට වඩා වැඩි සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධිය සහිත වරලත් ඉංජිනේරුවරයෙකු හෝ ඒ හා සමාන අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහිත වෘත්තිකයකු වීම.

සහ

ඔහු/ඇයට මෙම පැවරුමට සමාන තාක්ෂණ හෝ ඉංජිනේරු විගණනය පිළිබද අවම වශයෙන් පැවරුම් දෙකක් සිදු කර පළපුරුද්ද තිබිය යුතුය.

03. වැටුප :- එක් මසකට රු.200,000.00 දීමනාවක් ගෙවනු ලැබේ. (සාකච්ඡා කර ගත හැක)

04. බඳවා ගැනීමේ පටිපාටිය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිපල මත

05. අයදුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනය :- 2020.09.25

06. අයදුම්පත්‍රය එවිය යුතු ක්‍රමය

පහත සඳහන් පිළිවදත්ත ඇතුලත් අයදුම්පත්‍රය අදාළ ලේඛනවල පිටපත් සහිතව 2020 සැප්තැම්බර් 25 හෝ එදිනට පෙර කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක. 276, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "අභ්‍යන්තර විගණක තනතුර (තාක්ෂණ)" යනුවෙන් සඳහන් කරන්න.

1. සම්පූර්ණ නම :
2. මුලකුරු සමග නම :
3. ස්ත්‍රී, පුරුෂ භාවය :
4. උපන් දිනය : ජාතික හැඳුනුම්පත් අංකය :
5. වර්තමාන තනතුර :
6. ලිපිනය :
7. විද්‍යුත් තැපෑල :
8. දුරකතන අංක : ජංගම දු.ක. :
9. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :
10. පළපුරුද්ද :
11. වෙනත් තොරතුරු :

දිනය : අයදුම්කරුගේ අත්සන :

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ "අභ්‍යන්තර විගණක (තාක්ෂණ) තනතුර" ලෙස සඳහන් කළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

සති අන්තයේ රාත්‍රී 7.30 ට
පටගැම්කාරයෝ
රචනය, අධ්‍යක්ෂණය සහ නිෂ්පාදනය
නිස්ස අබේසේකර
සති අන්තයේ රාත්‍රී 8.00 ට
සඛිතාය
තණමල්විල අහස අතහැර... ඔහු ආයෙමත්...
අධ්‍යක්ෂණය
චරිත් අබේසිංහ
තිර රචනය
නාමල් ජයසිංහ
සති අන්තයේ රාත්‍රී 8.30 ට
හිරිදේවි
යහපනියක වූ හැහැණියකගේ ස්වයංවරය
අධ්‍යක්ෂණය
ඉන්දික ධර්මතිලක
තිර රචනය
සමන්ත කුමාර ගමගේ
නිෂ්පාදනය
ශ්‍රීනාත් පෙරේරා
2017 වසරේ විශිෂ්ටතම නවකතාව ලෙස රාජ්‍ය සම්මානය දිනූ
ස්වර්ණ පුස්තක දෙවන ස්ථානය දිනූ
සිරිපති වැලිසරගේ ගේ ගරුඩ මුතුර්තය නවකතාව ඇසුරෙන්
ගරුඩ මුතුන
සති අන්තයේ රාත්‍රී 9.00 ට
තිර රචනය සහ අධ්‍යක්ෂණය
ප්‍රියාල් වීරසිංහ
නිෂ්පාදනය
අජාන් කන්නන්ගර
ITN
සවාධීන රූපවාහිනී
SriLanka
සුභාවිත වෙලි පෙළහරක පෙරහමන්කරුවා

සැප්තැම්බර් 05 සිට

සෑම සෙනසුරාදා හා ඉරිදාවකම සවස 6.00 ට

tv දෙරණ

දිනමිණ
වෙළඳ

වහාම විකිණීමට
නාත්තන්ඩිය
නගර සීමාවට අයත් වටිනා
පොල් අක්කර 6ක් සහ
A/C මිට්සුබිෂි
බේබි රෝසා බස්රථය
072 8214169

BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

විවිධ අයිතම විකිණීම

ටෙන්ඩර් අංකය MSI/2020/06

පහත දැක්වෙන විවිධ අයිතමයන් 2020 ඔක්තෝබර් මස 01 වෙනි දින සිට 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලය තුළ විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

	අයිතමය		ආපසු ගෙවනු ලබන තැන්පතුව (රු).
01	අතිරික්ත පුවත්පත් සහ මුද්‍රණය නොවූ හිස් කඩදාසි	(කිලෝ ග්‍රෑම්)	400,000/-
02	කපා ඉවත් කළ මුද්‍රණ කඩදාසි සහ බට් එන්ඩ් (ඉතිරි වූ මුද්‍රණ කඩදාසි රෝල) ඝනකම් 2" අඩු	- එම -	50,000/-
03	පාවිච්චි කළ ඕෆ්සෙට් ප්ලේට් (ඇලුමිනියම් තහඩු)	- එම -	25,000/-
04	හිස් ඊල් කෝර් (මදය)	- එම -	1,000/-
05	කාඩ්බෝඩ් (මිශ්‍ර)	- එම -	10,000/-
06	ඉවතලන ලිපි ලේඛන (File Covers, Computer Stationery, Tabloids, Periodicals)	- එම -	10,000/-
07	දැව් තෙල්	ලීටර්	1,000/-
08	ඉවතලන කඩදාසි සහ භාවිතයෙන් ඉවත් කළ කඩදාසි	(කිලෝ ග්‍රෑම්)	50,000/-
09	හිස් ප්ලාස්ටික් කෑන් (ලීටර් 20)	(ඒකක)	1,000/-
10	පැලට් (දැව)	(ඒකක)	1,000/-
11	අබලි යකඩ	(කිලෝ ග්‍රෑම්)	1,000/-
12	Strapping West	(කිලෝ ග්‍රෑම්)	1,000/-
13	Empty Strapping Reel Cores	(කිලෝ ග්‍රෑම්)	1,000/-

ආපසු නොගෙවනු ලබන රු. 250.00 ක මුදලක් හා ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල ගෙවා ටෙන්ඩර් අයදුම්පත් ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක. ඔබගේ මිල ගණන් "විවිධ අයිතම විකිණීම" යනුවෙන් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කොට 2020.09.21 දින ප.ව. 3.00 ට පෙර පහත සඳහන් අය වෙත එවිය යුතුය. එදිනම එසැනින් ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ටෙන්ඩර් පත්‍රිකා විවෘත කෙරේ.

ටෙන්ඩරය හිමිවන ටෙන්ඩර්කරු තමන්ට ලැබෙන අයිතමයන් සඳහා ඉදිරිපත් කර ඇති මුදලට බද්ද (වැට්) 8% ගෙවිය යුතුය. ටෙන්ඩර්කරු විසින්ම භාණ්ඩ පටවා ගැනීම සිදුකර ගත යුතුය.

පෙර දැනුම් දීමකින් තොරව ටෙන්ඩරය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් ඉවත් කිරීම හෝ පිළිගැනීමේ පූර්ණ අයිතිය ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සතුව ඇත.

LAKE HOUSE

ප්‍රධානී - ප්‍රසම්පාදන,
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
ලේක්හවුස්,
නො. 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ-10.
දුරකථන අංක - 2429422/ 2429429 දිගුව - 451, 452

සැප්තැම්බර් 7 සඳුදා
මිහිර

චිත්‍ර ඇඳලා සතිපතා රුපියල් 7500ක් වටිනා තෑගි දිනාගන්න

ප්‍රවීණ ආචාර්යවරයකු ගෙන එන 5 ශිෂ්‍යත්ව පාඩම් මාලාව

පාසල් ව්‍යාපෘතිවලට අවශ්‍ය තොරතුරු, ඡායාරූප සමඟ සතුට විනෝදය හා තෑගි ගෙනෙන තරග

පොතක අගේ මුහුද වගේ

දියගොඩ වෙසෙන තර්ජනයට ලක්ව සිටින කැස්බෑවෝ

ගස් වැල් උපදින හැටි

රට රටවල ජාතික ක්‍රීඩා ඇතුළත් ඔප කඩදාසියේ මුද්‍රිත වර්ණ පෝස්ටරය

නව ලොවට සරිලන, නව දැනුමෙන් පිරිපුන් පරාජය කළ නොහැකි මිනිසකු බිහි කරන්න ඔබේ දරුවාට සතිපතා කියවන්න මිහිර අරන් දෙන්න

රුපියල් 30/-කට දැනුම සාගරයක්

සෑම සඳුදාවකම නිකුත් වේ

සෙනසුරාදා සහ ඉරිදා දිනවල රාත්‍රී 7.30 ට ජාතික රූපවාහිනියෙන්

වෂී 2020ක් වූ සැප්තැම්බර් මස 06 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.